249 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 249 - இல. 8
Volume 249 - No. 8

2016 නොවැම්බර් 28 වන සඳුදා
2016 நவம்பர் 28, திங்கட்கிழமை
Monday, 28th November, 2016


# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

පොලිස් විශේෂ කාර්ය බලකායේ හිටපු අණ දෙන නිලධාරි කේ.එල්.එම් සරත්චන්ද්‍ර මහතා අත් අඩංගුවට ගැනීම

ශ්‍රී ලංකාවට මත් ද්‍රව්‍ය ගෙන ඒමට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග

**විසර්ජන පනත් කෙටුම්පත, 2017 – [දහහතරවන වෙන් කළ දිනය]:**

[ශීර්ෂ 122, 210, 211 (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය); ශීර්ෂ 114, 306, 307 (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා); ශීර්ෂ 176 (වරාය හා නාවික කටයුතු) ]- කාරක සභාවේදී සලකා බලන ලදි.

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

பொலிஸ் விசேட அதிரடிப்படையின் முன்னாள் கட்டளை அதிகாரி கே.எல்.எம். சரத்சந்திரவின் கைது

இலங்கைக்கு போதைப் பொருள் கடத்தல் தடுப்பு நடவடிக்கைகள்

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2017 [ஒதுக்கப்பட்ட பதினான்காம் நாள்] :**

[தலைப்புகள் 122, 210, 211 (பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் ஊடகத்துறை); தலைப்புகள் 114, 306, 307 (போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள்); தலைப்பு 176 (துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள்)] – குழுவில் ஆராயப்பட்டது.

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Arrest of Former Police Special Task Force Commandant K.L.M. Sarathchandra

Steps taken to Combat Trafficking of Drugs to Sri Lanka

APPROPRIATION BILL, 2017 – [Fourteenth Allotted Day]:

Considered in Committee – [Heads 122, 210, 211 (Parliamentary Reforms and Mass Media); Heads 114, 306, 307 (Transport and Civil Aviation); Head 176 (Ports and Shipping)]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2016 නොවැම්බර් 28 වන සඳුදා***
*2016 நவம்பர் 28, திங்கட்கிழமை*
*Monday, 28th November, 2016*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)

ගරු කථානායකතුමනි, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) අනුරාධපුර, තිසාවැව, පැරණි පුත්තලම් පාර, අංක 126/18 දරන ස්ථානයේ පදිංචි බී.වී.ඩී.ජී. නිරංජන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ඇතුල්කෝට්ටේ, කොටුබැම්ම හරස් පාර, අලකේෂ්වර මාවත, අංක 11/3 දරන ස්ථානයේ පදිංචි දිනීෂා එදිරිවීර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(3) මාතර, මඩිහ, මිහිරි උයන, අංක 36 දරන ස්ථානයේ පදිංචි එන්.එස්.පී.ඒ. ධර්මපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මහනුවර, අම්පිටිය පාර, අංක 63 දරන ස්ථානයේ පදිංචි පී.බී.ආර්. මුල්ලේගම මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) අකුරැස්ස, පරදූව, මහමාවත වත්ත යන ස්ථානයෙහි පදිංචි ආර්.කේ. අනුර මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

ප්‍රශ්න ඇසීමේදී සහ පිළිතුරු දීමේදී කාලය ගැන අවධානය යොමු කරන්න කියා ගරු මන්ත්‍රීවරුන්ගෙන් සහ ඇමතිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ප්‍රශ්න සඳහා වැඩිපුර කාලයක් ගතවීම නිසා පසු ගිය දින කිහිපය තුළම අපට ප්‍රධාන විවාදය සඳහා වූ කාලය හුඟක් අඩු කරන්න සිද්ධ වුණා. ඒ නිසා සමහර මන්ත්‍රීවරුන්ට කථා කරන්න ලැබුණේ විනාඩි 3ක කාලයක් පමණයි. ඒ වාගේම, අදාළ අමාත්‍යවරුන්ට පිළිතුරු දෙන්නවත් වෙලාවක් නැති වන නිසා ඒ කාරණය ගරු සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1-539/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 873/'16-(2), ගරු චමින්ද විජේසිරි මහතා

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කහතුඩුව - කෝරළඉම දක්වා මාර්ගය පුළුල් කිරීම : ඉඩම් සඳහා වන්දි
### கஹதுடுவ - கோரளஇம வரையான வீதி விஸ்தரிப்பு: காணிகளுக்கான நட்டஈடு
### BROADENING OF KAHATHUDUWA- KORALAIMA STRETCH OF ROAD: COMPENSATION FOR LANDS

874/'16

**3. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) මාර්ග අංක 120 මාර්ගයේ, කහතුඩුව සිට කෝරළඉම දක්වා කොටස පුළුල් කිරීම සඳහා පවරාගත් ඉඩම්වලට ගෙවූ වන්දිය ඉඩම්වල සැබෑ වටිනාකමට සාපේක්ෂව ප්‍රමාණවත් නොවූ බවත්;

(ii) සමහර ඉඩම්වලට ගෙවා ඇත්තේ ගෙවීමට එකඟ වූ වන්දියෙන් කොටසක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් පවරා ගැනීමෙන් පීඩාවට පත් ඉඩම් හිමියන් වෙත සාධාරණ වන්දි මුදලක් ගෙවීමටත්;

(ii) දැනට වන්දි මුදලින් කොටසක් පමණක් ගෙවන ලද ඉඩම් හිමියන්ට ඉතිරි වන්දි මුදල ගෙවීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி இலக்கம் 120 வீதியில், கஹதுடுவ தொடக்கம் கோரளஇம வரையிலான பகுதியை விஸ்தரிப்பதற்காக கையேற்கப்பட்ட காணிகளுக்கு செலுத்திய நட்டஈடு காணிகளின் உண்மையான பெறுமதிக்கு ஒப்பீட்டளவில் போதுமானதாக இருக்கவில்லை என்பதையும்;

(ii) சில காணிகளுக்கு செலுத்தப்பட்டிருப்பது உடன்பட்ட தொகையில் ஒரு பகுதி என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) காணிகளை கையேற்றதினால் பாதிக்கப்பட்ட காணி உரிமையாளர்களுக்கு நியாயமான நட்டஈட்டுத் தொகையை செலுத்துவதற்கும்;

(ii) ஏற்கனவே நட்டஈட்டின் ஒரு பகுதி மாத்திரம் செலுத்தப்பட்ட காணி உரிமையாளர்களுக்கு மீதி நட்டஈட்டுத் தொகையை செலுத்துவதற்கும் நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Is he aware that-

(i) the compensation paid for the lands that had been acquired to broaden the stretch of road from Kahathuduwa to Koralaima on the Route No. 120 has not been adequate relatively to the real value of the lands; and

(ii) only a part of the compensation that was agreed to pay has been paid in respect of certain lands?

(b) Will he inform this House whether he will take steps to-

(i) pay a reasonable sum in compensation to the owners of lands, who have been affected by the acquisition; and

(ii) pay the balance of the compensation payable to the owners of lands who have been paid only a part of the compensation?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ල - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (1) කහතුඩුව සිට කෝරළඉම දක්වා මාර්ග කොටස පුළුල් කර සංවර්ධනය කිරීම වෙනුවෙන් රජයට පවරා ගනු ලබන ඉඩම් හා දේපොළ සඳහා වන්දි ගෙවීම තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන තක්සේරු වටිනාකම්වලට අනුකූලව සිදු කරනු ලබයි. හානිවන දේපොළ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ව්‍යවස්ථාපිත වන්දි මුදලට අමතරව, ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන ලාර්ක් කමිටු පරීක්ෂණ සඳහා හානියට පත්වන සියලුම පුද්ගලයන් කැඳවා සාකච්ඡා කොට ඔවුන්ගේද එකඟත්වය මත අවසන් වන්දි මුදල තීරණය කරනු ලබයි.

කිසියම් පුද්ගලයෙකු ව්‍යවස්ථාපිත වන්දි මුදල සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම්, ඒ සම්බන්ධයෙන් වන්දි සමාලෝචන මණ්ඩලය වෙත හෝ ලාර්ක් කමිටු තීරණය සඳහා එකඟ නොවන්නේ නම් අමාත්‍යාංශ ලාර්ක් අභියාචනා කමිටුව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. එම අභියාචනා, අභියාචකගේ සහභාගිත්වයෙන් නැවත සලකා තවදුරටත් සංශෝධනය කළ හැකි නම් සංශෝධන සිදු කර අවසන් වන්දි මුදල තීරණය කරනු ලබයි. මෙම අවසන් වන්දි මුදලේ අගය වර්තමාන වෙළෙඳ පොළ වටිනාකම අනුව සැසඳීමේ දී ඉතා ඉහළ අගයක් වේ.

(ii) ඉහත පරිදි තීරණය කළ අවසන් වන්දි මුදලින් පළමුව සියයට70ක් හානියට පත්වූවන් සඳහා ලබා දෙන අතර, ඉතිරි සියයට 30 අදාළ ඉදිකිරීම් කොටස් ඉවත් කරන තුරු රඳවා ගනු ලැබේ. මෙම රඳවා ගත් මුදල අදාළ ඉදිකිරීම් කොටස් ඉවත් කළ බව දැනුම් දුන් විගස නිදහස් කරනු ඇත. මුළු වන්දි මුදල එකවර ලබා දුන් පසු අදාළ ඉදිකිරීම් කොටස් ඉවත් කිරීම ඉඩම් හිමියන් විසින් පැහැර හැර ඇති බැවින් මෙලෙස වන්දියෙන් යම් ප්‍රමාණයක් පසුව ගෙවීම සඳහා රඳවා ගැනීම සිදු කර ඇත.

(ආ) (i) අදාළ නැත.

(ii) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පාමංකඩ සිට පොකුණුවිට දක්වා මාර්ගයේ -අංක 120 දරන මාර්ගයේ- ඉඩම් අහිමි වෙන ජනතාව විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමක් මා සතුව තිබෙනවා. ඔවුන් එමඟින් ඉදිරිපත් කරන පළමුවෙනි කරුණ මේකයි. ඔබතුමන්ලා ඒ ප්‍රදේශයේ පර්චස් එකක් තක්සේරු කරලා තිබෙන්නේ රුපියල් ලක්ෂ තුනත්, ලක්ෂ තුනහමාරත් අතර ප්‍රමාණයකට. නමුත්, සාමාන්‍යයෙන් ඒ ප්‍රදේශයේ පර්චස් එකක් රුපියල් ලක්ෂ පහකට ආසන්න වෙනවා. එම නිසා මේ පරස්පරතාව සම්බන්ධව ඔබතුමාගේ අමාත්‍යාංශයේ ස්ථාවරය මොකක්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මේ වන්දි ගෙවීම සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරීක්ෂණය පවත්වනවා. ඊට පසුව අමාත්‍යාංශයේ Super LARC කමිටුව මඟින් පරීක්ෂා කරනවා. ඊට පසුව සමාලෝචන මණ්ඩලයට යනවා. ආයතන තුනකින් පරීක්ෂා කරලයි මේ තීරණය එන්නේ.

අනෙක් කාරණය, තක්සේරු දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශය යටතේ නොවෙයි තිබෙන්නේ. ඒක තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය යටතේයි. නමුත්, අපි ඒ අයත් එක්ක ඉතාමත් කිට්ටුවෙන් වැඩ කරනවා. ඔබතුමා කියපු කාරණය හරි. ලක්ෂ දෙකයි, ලක්ෂ පහයි අතර තමයි වටිනාකම තිබෙන්නේ. ඒ පාරේ හැම තැනම එකම වටිනාකමට නැහැ. ලක්ෂ දෙකයි, ලක්ෂ පහයි අතර තමයි වටිනාකම තිබෙන්නේ. හැම කෙනෙකුටම ලක්ෂ දෙකත්, ලක්ෂ පහත් අතර වන්දි හම්බ වෙලා තිබෙනවා. බිම් කැබැලි 1318ක් තිබෙනවා. 20ක් තමයි ප්‍රශ්න ඇති කරගෙන තිබෙන්නේ. අනෙක් ඔක්කෝම ඒ වන්දි මුදල පිළිගෙන කටයුතු

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

කරලා තිබෙනවා. අපි සියයට 70ක් වන්දි ගෙවලා තිබෙනවා. ඉතිරි ගණන ගෙවන්නේ ගොඩනැඟිලි ඉවත් කර ගත්තායින් පසුවයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ප්‍රශ්න ඇති කරගෙන තිබෙන ප්‍රමාණය 20යි කියලා ඔබතුමා කිව්වාට, මා අතේ තිබෙන මෙම ලේඛනයේ සඳහන් වන විධියට 50කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. මෙම ලේඛනය මා ඔබතුමාට දෙන්නම්. ගරු ඇමතිතුමනි, මේ අය වැය විවාද කාලය තුළ ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ රැඳී සිටින නිසා මේ කණ්ඩායමේ නියෝජිතයන් පිරිසකට ඔබතුමා සහ නිලධාරින් මුණ ගැසී මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්න අවස්ථාවක් දෙන්න පුළුවන්ද කියලා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මුණ ගැසීම නම් ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, කමිටු තුනකින් මේක පරීක්ෂා කර තිබෙනවා ගරු කථානායකතුමනි. පළමුවෙන්ම ප්‍රාදේශීය ලේකම් මේ ගැන පරීක්ෂා කර තක්සේරු කර තිබෙනවා. ඊට පසුව අමාත්‍යාංශයේ Super LARC කමිටුව පරීක්ෂා කරනවා. ඊට පස්සේ සමාලෝචන මණ්ඩලය පරීක්ෂා කරනවා. ඇත්ත වශයෙන්ම මට බලයක් නැහැ. මොකද, තක්සේරු දෙපාර්තමේන්තුව තමයි මේක තීරණය කරන්නේ. ඒක තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය යටතේ. ඔබතුමා කියාපු විධියට ඒ අයව හමු වෙන්න මා කැමැතියි. නමුත්, ඒකෙන් වැඩක් වේවිද කියන එක ගැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් සුදුසු විධියට කටයුතු කරන්න. අවසාන අතුරු ප්‍රශ්නය.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

දැන් ඇමතිතුමා එහෙම ප්‍රකාශ කරනවා නම්, ඇමතිතුමාට ඒ ගැන විශ්වාසයක් නැත්නම් ඒ අයව මුණ ගැහිලා තේරුමක් නැහැ නේ, ගරු කථානායකතුමනි. නමුත් මම කියන්න කැමැතියි, ඒ කිසිම කෙනෙකුට ලක්ෂ පහක් ලැබිලා නැති බව.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ලක්ෂ 1 - 5 අතර මුදලක් ලබා දීලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒ අතර මුදලක් කියලා කිව්වාට, ලක්ෂ පහක් ලැබිලා නැහැ. මේ සියලු දෙනාම කියන්නේ, ඒ අයට ලක්ෂ තුන, තුනහමාර අතර මුදලක් තමයි ලැබී තිබෙන්නේ කියලායි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේක විසඳන්න මැදිහත් වෙන්න කියලායි. ඒක ඔබතුමාගේ වග කීම.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

උත්සාහ කරන්නම්. ඇත්ත වශයෙන්ම අවසන් තීරණය තක්සේරු දෙපාර්තමේන්තුවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්න තුනම ඉවරයි. මොකක්ද, ඔබතුමාගේ ප්‍රශ්නය?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ ඊළඟ ප්‍රශ්නය වෙලාවේදී මම අතුරු ප්‍රශ්න අහන්නේ නැතුව ඉන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ ප්‍රශ්නයට සම්බන්ධ ප්‍රශ්නයක්ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මේ ප්‍රශ්නයටම අදාළ කාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කෙටියෙන් අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මා ඉතාම කෙටියෙන් අහන්නම්. ගරු කථානායකතුමනි, මේ අධිවේගී මාර්ගවල ඉඩම් පරවා ගැනීමේදී මේ වාගේ දේවල් වෙනවා. මම උදාහරණයක් කියන්නම්. මගේ තාත්තා නැති වෙලාත් දැනට මාස හතරක් වෙනවා. තාත්තාගේ නමට ලියුමක් එනවා, රුපියල් 25ක මුද්දර දෙකක් අරගෙන වන්දි ගන්න එන්න කියලා. වන්දි මුදල රුපියල් 1.50යි. මටයි, නංගිටයි ලියුමක් එනවා, ශත 50ක වන්දි මුදල ගන්න රුපියල් 25ක මුද්දර දෙකක් අරගෙන එන්න කියලා. ඒ දක්ෂිණ අධිවේගී මාර්ගයේ හම්බන්තොට දක්වා දිගු කිරීමේ දී අදාළ ඉඩම් කොටසට. අපට හම්බ වෙන මුදල නොවෙයි, මෙතැන තිබෙන කතන්දරය. ඒක විහිළුවක්. විකාරයක්. ශත 50ක් ගන්න රුපියල් 25ක මුද්දර දෙකක් අරගෙන එන්න කියලා රෙජිස්ටර් තැපෑලෙන් ලියුමක් එනවා. මම හිතන්නේ, රෙජිස්ට්‍රර් තැපෑලෙන් ලියුමක් එවන්නත් රුපියල් 28ක් විතර යන්න ඇති කියලායි. ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කරන්න ඕනෑය කියලායි මම කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ඇමතිතුමා බලන්න ඒ ගැන මොනවාද වෙලා තිබෙන්නේ කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

තක්සේරු දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශය යටතේ නොවෙයි තිබෙන්නේ. ඒක මුදල් අමාත්‍යාංශය යටතේයි තිබෙන්නේ.

## අලි-මිනිස් ගැටුම සහ විදුලි වැට ඉදි කිරීම : විස්තර
## யானை - மனித மோதலும் மின்சார வேலியமைப்பும்: விபரம்
## HUMAN-ELEPHANT CONFLICT AND CONSTRUCTION OF ELECTRIC FENCES: DETAILS

946/'16

**4. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂය තුළ සහ 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා, අලි - මිනිස් ගැටුමෙන් මියගිය වනඅලි සංඛ්‍යාව, මියගිය මිනිසුන් සංඛ්‍යාව සහ තුවාල ලැබූ මිනිසුන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආණමඩුව, කලාවැව, බළලුවැව, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, සිලාවතුර සහ පූකුලම් යන ප්‍රදේශවල 2015 අගෝස්තු 18 දින සිට 2016 සැප්තැම්බර් 30 දින දක්වා ඉදි කරන ලද අලි වැටවල්වල දිග කිලෝමීටර් කොපමණද;

(iii) ඉහත සඳහන් එක් එක් ප්‍රදේශයේ අලි වැට සම්පූර්ණ වීම සඳහා තවදුරටත් ඉදි කළ යුතු දිග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කිලෝමීටර් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 ஆம் ஆண்டினுள் மற்றும் 2016.01.01 ஆம் திகதி முதல் 2016.09.30 ஆம் திகதி வரை, யானை - மனித மோதலில் உயிரிழந்துள்ள யானைகளின் எண்ணிக்கை, உயிரிழந்துள்ள மனிதர்களின் எண்ணிக்கை மற்றும் காயமடைந்துள்ள மனிதர்களின் எண்ணிக்கை, ஒவ்வொரு ஆண்டின் அடிப்படையில் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(ii) ஆனமடுவ, கலாவெவ, பளளுவெவ, மதவாச்சி, கெபிதிகொல்லேவ, சிலாவத்துறை மற்றும் பூக்குளம் ஆகிய பிரதேசங்களில் 2015 ஆகஸ்ட் மாதம் 18 ஆம் திகதி முதல் 2016 செப்தெம்பர் மாதம் 30 ஆம் திகதி வரை நிர்மாணிக்கப்பட்டுள்ள யானைகளுக்கான வேலிகளின் நீளம் எத்தனை கிலோமீற்றர்கள் என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பிரதேசத்திலும் யானைகளுக்கான வேலியை பூர்த்தி செய்வதற்கு மேலும் நிர்மாணிக்க வேண்டியுள்ள நீளம் தனித்தனியே எத்தனை கிலோ மீற்றர்கள் என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife:

(a) Will he state-

(i) separately on per year basis the number of wild elephants that were killed, the number of persons who died and the number of persons injured in year 2015 and from 01.01.2016 to 30.09.2016 as a result of the human-elephant conflict;

(ii) in kilometres the extent of the electric fences that were built in Anamaduwa, Kalawewa, Balaluwewa, Medawachchiya, Kebithigollewa, Silawathura and Pookulam areas during the period from 18 August 2015 to 30 September 2016; and

(iii) separately in kilometres the extent of the aforesaid electric fence that have to be built further in order to complete building the fence in each of the aforesaid areas?

(b) If not, why?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2015 වර්ෂයට අදාළ වනඅලි මරණ සංඛ්‍යාව 205

2015 වර්ෂයට අදාළ මියගිය මිනිසුන් සංඛ්‍යාව 63

2015 වනඅලි පහරින් තුවාල වූ මිනිසුන් සංඛ්‍යාව 52

2016.01.01 සිට 2016.09.30 දක්වා වනඅලි මරණ සංඛ්‍යාව 213

2016.01.01 සිට 2016.09.30 දක්වා මිනිස් මරණ සංඛ්‍යාව 64

2016.01.01 සිට 2016.09.30 දක්වා වනඅලි පහරින් තුවාල වූ මිනිසුන් සංඛ්‍යාව 42

(ii)

| ප්‍රදේශය | **2015.08.18 සිට 2016 සැප්තැම්බර් 30 දක්වා ඉදි කර ඇති විදුලි වැට කි.මී. ගණන** |
|---|---|
| කලා වැව | කි.මී. 3ක් ශුද්ධ කර ඇත. ඉඩම් ආරාවුල් නිසා ඉදි කිරීම නැවතී ඇත. |
| බළලුවැව | |
| මැදවච්චිය | 1.0 |
| කැබිතිගොල්ලෑව | නැත. |
| සිලාවතුර | |
| පූකුලම | |
| ආණමඩුව | |

කැබිතිගොල්ලෑව, සිලාවතුර, පූකුලම, ආණමඩුව ප්‍රදේශවල දැනට විදුලි වැට පිළිබඳව ඉල්ලීම් කරලා නැහැ. ඉදිරියේ දී ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් එය ඉටු කිරීමේ කිසි ප්‍රශ්නයක් නැහැ; බාධාවක් නැහැ. එය කර දෙන්න පුළුවන්, අලි ප්‍රශ්නය තිබෙනවා නම්.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

(iii)

| ප්‍රදේශය | ඉදි කළ යුතු විදුලි වැට ප්‍රමාණය කි.මී. |
|---|---|
| ආණමඩුව | විදුලි වැට යෝජනා වී නැත. නමුත් මහ ජනතාවගේ ඉල්ලීමක් ඉදිරිපත් වුවහොත් ඉදිරියේදී එම ඉල්ලීම ඉටු කිරීමට කටයුතු කරනු ඇත. |
| කලාවැව බළලුවැව | කි.මී. 12 |
| මැදවච්චිය | 48 (ගම්මාන වටා) ගලෙන් බිඳුණු වැව, මහදිවුල්වැව, කිරිගල්ලෑව, හැලඹගස්වැව |
| කැබිතිගොල්ලෑව | විදුලි වැටවල් පිළිබඳ හඳුනාගැනීමට දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් දී ඇත. |
| සිලාවතුර | |
| පූකුලම | |

අපි ගමේ ජනතාවත් සහභාගි කරවාගෙන තමයි මේ විදුලි වැට ඉදිකරන්නේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙහිදී මා කියන්න ඕනෑ, වන්දි ගෙවීමට විශාල මුදලක් අනුමත කරගැනීමටත් අපි කටයුතු කර තිබෙන බව. නමුත් මම මේ වන්දි ප්‍රමාණය ගැන සෑහීමකට පත් වෙන්නේ නැහැ. කැබිනට් මණ්ඩලය අනුමත කළ සංඛ්‍යාව රුපියල් මිලියන 60ක්, 65ක්. නමුත් මට තිබෙන ප්‍රශ්නය මේකයි, CITES සමුළුවත් අහනවා කවුද අලින්ට වන්දි ගෙවන්නේ කියලා. අපි මිනිසුන්ට වන්දි ගෙවනවා, ගෙවල් කැඩුණාම වන්දි ගෙවනවා. නමුත් අලින්ට වන්දි ගෙවන්නේ කවුද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න නම් බොහොමයි. නමුත් තුනක් විතරක් අහන්නම්.

මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා සඳහන් කළා ආනමඩුව, සිලාවතුර, පූකුලම් වාගේ ප්‍රදේශවල අලි වැටවල් සම්බන්ධයෙන් ඉල්ලීම් ලැබිලා නැහැ, ඉල්ලීම් ලැබුණොත් ඉදි කරන්න සූදානම් කියලා.

ගරු ඇමතිතුමනි, නමුත් තමුන්නාන්සේලා පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 06වෙනි පිටුවේදී කියනවා ආනමඩුව, කලාවැව, බලලුවැව, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, සිලාවතුර, පූකුලම් සහ විල්පත්තු සීමා යන ප්‍රදේශවල කඩිනමින් විදුලි වැට ස්ථාපිත කරනු ලැබේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පළමුවෙනි අතුරු ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
විල්පත්තුව කියන්නේ පොඩි භූමියක් නොවෙයි, අලින්ගේ රැස්වෙන තැනක්. අලි හැම තැනම ගහන්නේ නැහැ, ගහන්න පටන් ගත්තොත් ගහනවා. අලියා කියන සතා එහෙමයි. අලියා ගැන අපේ හිටපු කථානායක ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් දන්නවා. ඒ කාලයේ විපක්ෂයේ සිටින විට අපිට කථා කරන්නවත් දුන්නේ නැහැ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ලා. ඒ කාලයේ අපිට අලියා වාගේ සැර දැම්මා. [බාධා කිරීමක්] ඒ කාලයේ අපිට සැනෙන් වාඩි වෙන්න කියනවා. [බාධා කිරීමක්] මේ පැත්තේ ඉඳලා එතුමා අපිට සැනෙන් වාඩි වෙන්න කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. තමුන්නාන්සේලාගේ පොරොන්දුවයි, තමුන්නාන්සේලා කරලා තිබෙන දේයි මම පෙන්වූවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මේ අලි මිනිස් ගැටුම විසඳන්න රජයේ නියෝජිතයන්, ගැමියන් සහ වනජීවී සංවිධානවල නියෝජිතයන්ගෙන් යුත් කමිටු පිහිටුවනවාය කියා තමුන්නාන්සේලා පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී පොරොන්දුවක් දුන්නා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා අහගෙන ඉන්නකෝ. මම කථා කරන වෙලාවේ ඔබතුමාත් කථා කරනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, අතුරු ප්‍රශ්නය අහලා පිළිතුරු දෙන්න. Hon. Minister, let him raise his Supplementary Question first. After that, you can answer it.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
Hon. Minister, you first listen. We have two ears and one mouth.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මේ අලි මිනිස් ගැටුම විසඳන්න රජයේ නියෝජිතයන්, ගැමියන් සහ වනජීවී සංවිධානවල නියෝජිතයන්ගෙන් යුත් කමිටු පිහිටුවනවාය කියා මෙතුමන්ලාගේ පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වෙනවා. වනජීවී සංවිධාන කිව්වාම, අලින්ගේ සංවිධාන, කොටින්ගේ සංවිධාන, වලසුන්ගේ සංවිධාන තිබෙනවාද කියා මා දන්නේ නැහැ. කෙසේ වෙතත් ගරු ඇමතිතුමනි, මේ කමිටු දැනට පිහිටුවා තිබෙනවාද, ඒවා අලි මිනිස් ගැටුම විසඳීමට කොයි තරම් දුරට යොදාගෙන තිබෙනවාද කියා මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

[බාධා කිරීමක්] පුරවැසියන් දෙන්නෙක් මෙතැනම ඉන්නවා. ඔබතුමන්ලා ඇහැටුවැවට යන්න එන්න. මමත් එක්ක යන්න එනවාද? නැත්නම් මගේ නිලධාරියෙක් එවන්නද? ඔබතුමන්ලා එන දවස කියන්න. එහාට ගිහින් බලන්න. අප දැන් මේවා කරන්නේ ජනතාවගේ මාර්ගයෙන්. දේශපාලකයන්, නිලධාරින් ඒ සඳහා ගාවා ගන්නේ නැහැ. මතක තියාගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமி கு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු කථානායකතුමනි, මම ඒ කාරණය කියලාම ඉන්න ඕනෑ. එදා මට වෙලාව දුන්නේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාට මම අමතර වේලාවන් ලබා දුන්නා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මට දැන් උත්තර දෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

රැස්වෙහෙර පැත්තේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

එහේ තමයි.

පසුගිය ආණ්ඩුව කාලයේ, අලින්ගෙන් සිදුවන හිරිහැර නිසා පවුල් 62ක්ම ඒ ගම්මානය අත්හැර ගොස් තිබෙනවා. ගල්ගමුවේ, ඇහැටුවැව ගමේ පවුල් 22යි දැන් ඉන්නේ. මම ගිහින් කම්බි දුන්නා. මේ පවුල් විසිදෙක පුහුණු කෙරෙව්වා. ග්‍රාම නිලධාරි තරුණයා හොඳ නායකයෙක්. ඔහුව මම අපේ දේශනවලට ගත්තා, අපේ නිලධාරින් එක්ක. පවුල් 22ක් එකතු වෙලා කම්බි ගැහුවා. ඒ අය අපට පින් දුන්නා. ජනතාව මාර්ගයෙන් අප ඒ ප්‍රශ්නය විසඳුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවාද, ප්‍රශ්න අහලා අවසානද? මේ අවස්ථාවේ අපට කාලය ඉතිරි කර ගන්න අවශ්‍යයි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න අහලා වැඩක් නැහැ. අහන ප්‍රශ්නයට නොවෙයි ඇමතිතුමා උත්තර දෙන්නේ. කොහොම නමුත්, ඇමතිතුමා කල් නොගෙන අනික් ඇමතිවරුන්ට ආදර්ශයක් දෙමින් ප්‍රශ්නය ඉදිරිපත් වුණු පළමුවෙනි වතාවේදීම පිළිතුරු දීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 6-582/'16-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7-928/'16-(1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවෙනි වටය.

ප්‍රශ්න අංක 5-982/'16-(1), ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23.(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

මා නැවත වරක් වේලාව කෙරෙහි ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු කරනවා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පොලිස් විශේෂ කාර්ය බලකායේ හිටපු අණ දෙන නිලධාරි කේ.එල්.එම්. සරත්චන්ද්‍ර මහතා අත් අඩංගුවට ගැනීම
### பொலிஸ் விசேட அதிரடிப்படையின் முன்னாள் கட்டளை அதிகாரி கே.எல்.எம். சரத்சந்திரவின் கைது
### ARREST OF FORMER POLICE SPECIAL TASK FORCE COMMANDANT K.L.M. SARATHCHANDRA

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ජාතික වශයෙන් වැදගත් වන මෙම ප්‍රශ්නය ස්ථාවර නියෝග 23.(2) යටතේ ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මෙම ප්‍රශ්නය යොමු කරන්නේ ගරු අගමැතිතුමා වෙතයි.

(1) 2016.11.23 දින පොලිස් විශේෂ කාර්ය බලකායේ - Police Special Task Force - හිටපු අණ දෙන නිලධාරි - the former Commandant - කේ.එල්.එම්. සරත්චන්ද්‍ර මහතා අත් අඩංගුවට ගෙන remand කිරීමේ ක්‍රියාව සම්බන්ධව ගරු අගමැතිතුමා දන්නේද?

(2) පොලිස් විශේෂ කාර්ය බලකායේ හිටපු අණ දෙන නිලධාරි කේ.එල්.එම්. සරත්චන්ද්‍ර මහතා මේ රටෙත්, ජනතාවගේත්, අපේ පාර්ලිමේන්තුවේත් ආරක්ෂාව වෙනුවෙන් විශිෂ්ට සේවාවක් ඉටු කළ ඒ වාගේම ජන ජීවිතය වෙනුවෙන් හා රාජ්‍ය දේපොළ විනාශයන්ගෙන් වළක්වා ගැනීම වෙනුවෙන් ක්‍රියාකළ පොලිස් විශේෂ කාර්ය බලකායේ හිටපු ප්‍රධානියා බව ඔබතුමා පිළිගන්නේද?

(3) මෙම නිලධාරි මහතා අත් අඩංගුවට ගෙන ඇත්තේ රජයේ වාහනයක් අවභාවිතකොට රුපියල් එක්ලක්ෂ හතලිස් හයදහසක අලාභයක් රජයට සිදුකළා යැයි චෝදනා කරමිනි. කිසිදු තේරුමක් නැති පියවරක් ගනිමින් ඔහු අත් අඩංගුවට ගෙන රිමාන්ඩ් කර ඇත. මුළු STF එකටම අපහාසයක් වූ මේ ක්‍රියාව ඉවත් කර ඒ නිලධාරි මහතා නිදහස් කිරීමට රජය වහා කටයුතු කරනවාද? ඒ පිළිබඳ පැහැදිලි පිළිතුරක් ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කරන්නේද?

**ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)
ගරු කථානායකතුමනි, මෙහිදී දේශපාලන තීන්දුවක් නොවෙයි, අරගෙන තිබෙන්නේ. නීතිය ක්‍රියාත්මක වීම සිදුවෙලා තිබෙනවා. ඒ තුළ සිදුවූ සිදුවීමක්. The law has taken its course.

There was no political interference at all in this matter. කේ.එල්.එම්. සරත්චන්ද්‍ර මහතා 2008.03.24 දින සිට 2011.03.19 දින දක්වා කාලය තුළ විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරි වශයෙන් රාජකාරි කටයුතු කර ඇත. කේ.එල්.එම්. සරත්චන්ද්‍ර මහතා පොලිස් විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරි වශයෙන් කටයුතු කර 2011.03.19 වන දින සේවයෙන් විශ්‍රාම ලබා ඇති අතර, එසේ විශ්‍රාම ලැබීමෙන් පසුවද විශේෂ කාර්ය බලකායට අයත් අංක GB-5548 දරන ජීප් රථය පාවිච්චි කර ඇත.

එසේ එම ජීප් රථය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් විමර්ශනයක් පවත්වා ඇත. එම විමර්ශනයේදී පොලිස් විශේෂ කාර්ය බලකායට අයත්, දැනට සේවයේ යෙදී සිටින සහ විශ්‍රාමික නිලධාරින් 13දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ඇත. නියෝජ්‍ය පොලිස්පති සරත්චන්ද්‍ර මහතා 2011.03.19 දින විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරි ලෙස කටයුතු කර විශ්‍රාම ලැබීමෙන් අනතුරුව, ඒ මහතා එවකට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු ලෙස පත්වීමක් ලබා ඇති බවටත්, එම සම්බන්ධීකරණ ලේකම්ධුරය 2015.01.08 දින දක්වා දරා ඇති බවටත්, එම කාලය තුළදී සරත්චන්ද්‍ර මහතා විශේෂ කාර්ය බලකායට අයත් අංක GB-5548 දරන ජීප් රථය සහ ආරක්ෂක නිලධාරීන්ද ලබාගෙන ඇති බවටත් එම පරීක්ෂණ කටයුතුවලදී කරුණු අනාවරණය වී ඇත. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසූ විට පවසා ඇත්තේ, එම කාලය තුළ මෙම ජීප් රථයවත්, ආරක්ෂක නිලධාරීන්වත් භාවිත කිරීම සඳහා අවසරයක් ලබාගෙන නැති බවයි. එනමුත්, උසාවියේදී ඒ පිළිබඳව කරුණු වාර්තා කර නැහැ.

කරුණු වාර්තා වෙලා තිබෙන්නේ පසු කාලීනවයි. 2015.01.08 වන දින පැවැති ජනාධිපතිවරණයෙන් පසුව සරත්චන්ද්‍ර මහතා දැරූ සම්බන්ධීකරණ ලේකම් ධුරය අහිමි වී ඇත. එසේ තිබියදීත් 2015.08.21 වන දින දක්වා එම ජීප් රථය විශේෂ කාර්ය බලකාය වෙත භාර නොදී ඔහුගේ පෞද්ගලික කටයුතු සඳහා පාවිච්චි කර ඇත. ඒ අනුව විශ්‍රාම ලැබීමෙන් පසු 2011.03.19 වන දින සිට

2015.08.21 වන දින දක්වා වසර හතරකුත්, මාස පහක කාලයක් එම ජීප් රථය පාවිච්චි කර තිබෙනවා. සම්බන්ධීකරණ නිලධාරි ධුරය දරපු නිසා ආරක්ෂක නිලධාරින් පාවිච්චි කිරීමට අවසරයක් නොතිබුණත් ඒ සම්බන්ධයෙන් ඒ අවස්ථාවේ කරුණු වාර්තා වෙලා නැහැ. කරුණු වාර්තා වෙලා තිබෙන්නේ ඉන් පසු කාල සීමාව තුළයි. උසාවියේදී කරුණු වාර්තා කරද්දී රුපියල් 140,000ක මුදල ගණනය කරලා තිබෙන්නේ විශේෂ කාර්ය බලකායෙන් සැපයූ ඉන්ධන සඳහායි. සැපයූ නිලධාරින් සඳහාවත්, ඒ රථය සඳහාවත් ගණනය කිරීමක් සිදුකර නැහැ. 2016.11.23 වන දින විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති කේ.එල්.එම්. සරත්චන්ද්‍ර මහතා පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකයට කැඳවා ඒ පිළිබඳව විමර්ශනය කිරීමෙන් පසු රජයට මූල්‍යමය වශයෙන් අලාභයක් සිදු කිරීම සම්බන්ධයෙන් වරද කියා දී අත් අඩංගුවට ගෙන, කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවියේ බී/62615 යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එහිදී සැකකරු අධිකරණය විසින් 2016.12.06 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කර ඇත.

විත්ති පාර්ශ්වය විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද මෝසමකට අනුව 2016.11.25 දින නැවත නඩුව කැඳවා විත්තියේ නීතිඥවරුන් විසින් කේ.එල්.එම්. සරත්චන්ද්‍ර මහතාට ඇප ලබා දෙන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් කර ඇත. එතුමා කරපු සේවය සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව දැක්විය හැකි සහායක් ලබා දෙන මෙන් විමර්ශන ඒකකයෙන් රජය ඉල්ලීමක් කළා. ඒ අනුව ඇප ලබා දීම සම්බන්ධයෙන් පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් වූ විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරින් විසින් විරෝධතාවක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මහෙස්ත්‍රාත් විසින් සැකකරුට ඇප ලබා දීම සඳහා අවශ්‍ය ලේඛන 2016.11.28 දින නැවත අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියෝගයක් ලබා දී ඇති අතර, එදිනට අධිකරණයේ අභිමතය පරිදි සැකකරුට ඇප ලබා ගැනීමට හැකියාව ඇත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන විවාද කරන්න දෙන්න අමාරුයි. අවශ්‍ය නම් පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අධිකරණයේ නඩුවක් පවතිනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උසාවියේ නඩුවක් පවතින නිසා අගතියක් කරන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ. ගරු ඇමතිතුමා පොඩ්ඩක් ඉන්න.

අතිගරු ජනාධිපතිතුමා විසින් පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිළිබඳව මීට ඉස්සෙල්ලා මුළු රටටම ප්‍රකාශයක් කළා, විවිධ හේතුන් මත පළිගැනීමේ ක්‍රියාවලිය සඳහා පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය යොදා ගන්නා බවට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the Hon. Minister take appropriate action. The Hon. Prime Minister is here. He will clarify it.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, මෙය පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන අංශයෙන් යොමු කරපු නඩුවක් නොවෙයි. මේ ගැන පත්තරේ පළවෙලා තිබෙනවා මමත් දැක්කා. මම හොයලා බැලුවා. ඒක සාමාන්‍යයෙන් පොලීසිය කරපු විභාගයක්. ගරු ඇමතිතුමා කරුණු කිව්වා. යුද්ධ කරලා, සටන් කරලා රටට සේවයක් කරපු අය හිරේ දාන එක හොඳ නැහැ කියලා ඇමතිතුමා කිව්වා. ප්‍රතිපත්තියක් හැටියට මමත් ඒක පිළිගන්නවා. ඕක නේ වුණේ, සරත් ෆොන්සේකාටත්. එතුමාට මොකක්ද කළේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා බිම දිගේ ඇදගෙන ගියා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එතුමා ඇදගෙන ගියා.

මෙතැන අපි කවුරුවත් කිව්වේ නැහැ, මේ සිද්ධියට අදාළව එහෙම කරන්න කියා. පොලීසියයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මම හිතන්නේ වාහනයක් ගැනයි චෝදනාව තිබෙන්නේ. මමත් සොයා බැලුවා. ඒ ගැන සොයා බලා අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒ ගැන ක්‍රියා කරන්න අපි බලමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අගමැතිතුමාගේත්, ජනාධිපතිතුමාගේත් අවධානය ඒ ගැන යොමු වෙලා තිබෙනවා. දැන් ඒ සම්බන්ධයෙන් ඇප ලබා දෙනවා නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

සටන් කරපු අයට මේ විධියට කරන්න එපාය කිව්වත් සරත් ෆොන්සේකා හිරේ දැම්මා. තවත් කිහිප දෙනෙක් හිරේ දැම්මා. අනික් අය හමුදාවෙන් අයින් කරලා දැම්මා. ගුවන් හමුදාවෙන් අයින් කළා, නාවික හමුදාවෙන් අයින් කළා. ඒ අය ගැන කථා කරන්න එදා කවුරුවත් හිටියේ නැහැ, ගරු කථානායකතුමනි. අපි ඒ ගැනයි බලන්න ඕනෑ.

මමත් කිව්වේ මේ සම්බන්ධයෙන් අසාධාරණයක් වෙලා තිබෙනවාද කියා කරුණාකර සොයා බලන්න කියායි. මට අද පොලිස්පතිතුමා හම්බ වෙනවා. මට මේ ගැන අහන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක අවධානය යොමු විය යුතු දෙයක්. අපි ඒක එතැනින් නවත්වමු, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එතුමාගේ අදහස් පිළිබඳව මම විවාදයක් කරන්න යන්නේ නැහැ. නමුත් ඇමතිතුමා පිළිගත්තා, මෙහි සැබෑ තත්ත්වය වාහනය කඩින් කඩ පාවිච්චි කළාය කියන එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක පැහැදිලි කළා නේද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ රටම ආරක්ෂා කරපු නිලධාරියෙක් ගැනයි මම කථා කරන්නේ. මම මේ අවස්ථාවේදී කථාවක් කරන්න යන්නේ නැහැ, මේ පැහැදිලි කිරීමකුයි කරන්නේ. එතුමා මගේ ප්‍රශ්නයට පිළිතුරක් දුන්නා. වාහනයේ එහාට මෙහාට ගියා කියා ඉන්ධන වෙනුවෙන් රුපියල් 140,000ක් අවශ්‍ය වෙලා මෙහෙම ගෙනියලා තිබෙනවාය කියලායි කියන්නේ. ඇයි ගරු ඇමතිතුමනි, එහෙම ප්‍රශ්නයක් තිබුණා නම් මේ නිලධාරි මහතාට එවෙලේ කිව්වා නම් "සුමානයක් ඇතුළතදී මේ මුදල ගෙවන්න" කියා හරි නේ. රිමාන්ඩ් කරලා එස්ටීඑෆ් එකටම අපහාසයක් කරන්න ඕනෑ නැහැ නේ. ඔබතුමන්ලා මෙහෙම හැසිරෙන්නේ ඇයි? මම අහන ප්‍රශ්නය ඒකයි. මේ මනුස්සයා උතුරේ, දකුණේ, වයඹ -හැම තැනම- කොපමණ මහජන ජීවිත, පාර්ලිමේන්තුව ඇතුළු ගොඩනැඟිලි ආරක්ෂා කර තිබෙනවාද? ඉන්ධන වෙනුවෙන් එක්ලක්ෂ හතළිස්දහසක මුදලක අඩුවක් තිබෙනවා කියා ආණ්ඩුවකට ලජ්ජා නැද්ද-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා ඒ සඳහා අවධානය යොමු කර තිබෙනවා. ඊළඟට, ගරු අනුර දිසානායක මැතිතුමා.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සාගල රත්නායක මැතිතුමා.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට ඇහෙන්නේත්, කඩින්-කඩ. ඒකයි තිබෙන ප්‍රශ්නය. මම මේ හැම දෙයක්ම පැහැදිලිව කිව්වා. දින වකවානු එක්කම මම එතුමාට කිව්වා. අද දිනයේදී උසාවියේ මෙය විභාග වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

This is what I told in Sinhala, "කඩින්-කඩ භාවිතාව". ඔබතුමාට එකඟ වෙන්න බැරි නම් මම මොනවා කරන්නද?

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

ඒකයි මම කිව්වේත්, ඔබතුමාට කඩින්-කඩ ඇහෙන්නේ කියා. එතුමා මෙය 2015.08.21 - මම ඔබතුමාට පැහැදිලිව කිව්වා, මේක දේශපාලන තීන්දුවක් නොවෙයි කියා. The law has taken its course. The sad thing is, none of you spoke up when Field Marshal Fonseka was arrested. All of you were very quiet.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Anyway it will be taken up in courts today. ගරු අනුර දිසානායක මැතිතුමනි, දැනටම වේලාව පෙර වරු 10.00යි. මම එය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම නතර කරන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, ඒක ඔබතුමාගේ අයිතියක්.

# II

## ශ්‍රී ලංකාවට මත් ද්‍රව්‍ය ගෙන ඒමට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග
## இலங்கைக்கு போதைப் பொருள் கடத்தல் தடுப்பு நடவடிக்கைகள்
## STEPS TAKEN TO COMBAT TRAFFICKING OF DRUGS TO SRI LANKA

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකාවේදී අත් අඩංගුවට පත් දෙවැනි විශාලතම මත් ද්‍රව්‍ය තොගය වන කොකේන් කිලෝග්‍රෑම් 200ක් අත් අඩංගුවට ගැනීමත් සමඟ මහජනතාව තුළ පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

පසු ගිය 24 වැනි දින ඔරුගොඩවත්ත රේගු අංගණයේදී බ්‍රසීලයේ සිට ආනයනය කරන ලද සීනි කන්ටේනරයක් තුළ තිබී රුපියල් කෝටි 200ක් පමණ වටිනා කොකේන් කිලෝග්‍රෑම් 200ක් අත් අඩංගුවට ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, ආසන්න වශයෙන් ගත්තොත්, එය පිටි මිටි 4ක විතර ප්‍රමාණයේ කොකේන් ප්‍රමාණයක්. වාර්තාවන අන්දමට මෙය අත් අඩංගුවට ගන්නා ලද දෙවැනි විශාලතම මත්ද්‍රව්‍ය තොගයයි. මීට පෙර 2013 වසරේ නොවැම්බර් මාසයේදී පාකිස්ථානයේ සිට ගෙන්වන ලද හෙරොයින් කිලෝග්‍රෑම් 250ක් අත් අඩංගුවට ගනු ලැබ තිබුණා. එය ශ්‍රී ලංකාවේදී අල්ලා ගත් විශාලතම මත් ද්‍රව්‍ය තොගය බවද වාර්තා වුණා. එම මත් ද්‍රව්‍ය තොගය සඟවා තිබූ කන්ටේනරය සඳහා වරාය බදු සහන ලබා දෙන ලෙස ඉල්ලා එවකට අග්‍රාමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු විසින් වරාය සමාගමකට යොමු කරන ලද ලිපියක් හේතුවෙන් එම සිදුවීම මහත් ආන්දෝලනයට ලක් වුණා. එසේම, එය මෙබඳු ජාවාරම් පිටුපස වූ දේශපාලන සබඳතාවන් මහ ජනතාව හමුවේ අනාවරණය කිරීමට ද හේතු වුණා. එසේම ලංකාව, ආසියාවේ මත් ද්‍රව්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත්වී ඇති බවටද කරුණු අනාවරණය වුණා. මෙවැනි තත්ත්වයක් තුළ නැවත වරක් ආනයනය කරන ලද මෙතරම් විශාල මත් ද්‍රව්‍ය තොගයක් අත් අඩංගුවට පත්වීම තුළ පැන නඟින ගැටලු කිහිපයක් තිබෙනවා. ඉන් එකක් නම්, මෙවැනි තොග කොපමණ ප්‍රමාණයක් අත් අඩංගුවට පත් නොවී මෙරටට ළඟා වී ඇත්ද යන්නයි. මොකක්ද? ගෙනෙන සියලුම මත් ද්‍රව්‍ය අහුවෙනවා නම්, මත් ද්‍රව්‍ය ගෙනෙන්නේ නැහැ. මේ අහුවෙන්නේ ගෙනෙන ඒවායින් කුඩා ප්‍රමාණයක් පමණයි. ගරු කථානායකතුමනි, ඒ නිසා මේකෙන් තේරුම් ගන්න පුළුවන්, කොපමණ මත් ද්‍රව්‍ය ප්‍රමාණයක්, කොපමණ මත්කුඩු ප්‍රමාණයක් ලංකාවට ගලාගෙන එනවාද කියලා. මන්ද, ආනයනය කරනු ලබන සියලු මත් ද්‍රව්‍ය තොග අත් අඩංගුවට පත් වන්නේ නම්, කිසිදු ජාවාරම්කාරයකු ඒවා ආනයනයට උත්සාහ ගනු ඇතැයි සිතිය නොහැකි බැවිනි. අනෙක, බලවත් දේශපාලන සබඳතාවන් සහිත වළල්ලක රැකවරණය නොමැතිව මෙවැනි ජාවාරම් හුදකලාව පවතිනු ඇතැයි සිතිය නොහැකිය. මෙය කිසිසේත්ම තනි ව්‍යාපාරිකයකු හෝ තනි පුද්ගලයකුගේ හෝ පුද්ගල අධිකාරිත්වයක් යටතේ පමණක් සිදු වෙච්ච කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. අනිවාර්යෙන්ම දේශපාලනයේත්, විවිධ ක්ෂේත්‍ර කණ්ඩායම්වලත් මැදිහත්වීම මත තමයි මේ කුඩු ජාවාරම ලංකාව තුළ සිදු වෙමින් පවතින්නේ.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. මීට කලින් ද විශාල මත් ද්‍රව්‍ය තොගයක් අඩංගු කන්ටේනරයක් මෙරටට ආනයනය කර හසුවීමෙන් පසු කන්ටේනර් පරීක්ෂාව සඳහා විශේෂ ක්‍රියාමාර්ගයක් ගනු ලැබ තිබිණි ද?
2. විශේෂ පරීක්ෂණ ක්‍රමවේදයක් තිබුණේ නම්, මෙවැනි මත් ද්‍රව්‍ය තොග ආනයනය නැවත-නැවත සිදුවන්නේ කෙසේද?
3. මෙම මත් ද්‍රව්‍ය ආනයන ජාවාරම හා දේශපාලන බලවතුන් අතර සබඳතාවක් තිබේද?
4. ඉදිරියේදී මෙවැනි මත් ද්‍රව්‍ය තොග ආනයනය නොකරනු ඇති බවට සහතික වන්නේද? ඒ සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද?

ගරු කථානායකතුමනි, බරපතළ වෙන්නේ, මේ පළමුවැනි අවස්ථාව නොවන නිසායි. අවස්ථා ගණනාවකදී කුඩු තොග පිටින් විශාල වශයෙන් ගොඩ බාන මධ්‍යස්ථානයක් බවට ලංකාව පත්වී තිබෙනවා. විශේෂයෙන්ම, කුඩු අහුවුණාට, කුඩු ගෙනෙන කෙනෙක් අහුවෙන්නේ නැහැ. ඒකයි මෙතැන තිබෙන බරපතළම ප්‍රශ්නය. කුඩු අහුවෙනවා, ගෙනෙන කෙනා අහුවෙන්නේ නැහැ. ඒ නිසා, මෙතෙක් සොයා ගත් විශාල කුඩු තොගයන්ට වග කිව යුතු කිසිවකු අත් අඩංගුවට ගෙන අධිකරණය හමුවට පමුණුවන්නට අසමත් වෙලා තිබෙනවා. මෙම කුඩු තොගය පිළිබඳවත්, මීට පෙර ගෙන එන ලද කුඩු තොගය පිළිබඳවත් කරන ලද පරීක්ෂණයන්ගේ ප්‍රතිඵල කවරේද කියා ගරු ඇමතිතුමාගෙන් දැනගන්නට කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க )
(The Hon. Sagala Ratnayaka )

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අසන ප්‍රශ්නය මුදල් අමාත්‍යතුමාටත් අදාළ වන ප්‍රශ්නයක්. විශේෂයෙන් එතුමා කියූ පරිදි, 2013.08.30වැනි දිනයේ තමයි විශාලතම හෙරොයින් ප්‍රමාණය වන කිලෝග්‍රෑම් 261ක් අහු වුණේ. වරාය තුළදී ඒ කන්ටේනර් පරීක්ෂාවේ වගකීම තිබෙන්නේ ශ්‍රී ලංකා රේගුවටයි, ගරු කථානායකතුමනි. මා දන්නා තරමට ඒ සඳහා PNB - Police Narcotic Bureau - එකේත්, නාවික හමුදාවේත් සහාය ලැබෙනවා. විශේෂයෙන්, මේ දිනවල ශ්‍රී ලංකා රේගුවේ කටයුතුවලට උදව් උපකාර කරන්නට විශේෂ කාර්ය බලකායේ නිලධාරිනුත් ලබා දී තිබෙනවා.

X-ray වැනි නවීන පන්නයේ උපකරණ ප්‍රසම්පාදනය සඳහා කටයුතු ආරම්භ කර තිබෙනවා. අපි ඇමෙරිකාව වාගේ දියුණු රටවල් එක්කත් මේ ගැන නිතර කථා කරනවා. මේවා අපට කරන්න පුළුවන් දේවල්. ඔවුන් කියන්නේත්, මේ කටයුතු නවත්වන්න පුළුවන් උපකරණ තිබෙනවා නම්, වරායක් හරහා නැත්නම් ගුවන් තොටු පොළක් හරහා මේ ජාවාරම කරන්න අමාරුයි, එතකොට වෙරළ තීරුවෙන් අනවසර නෞකාවලින් තමයි ගෙනෙන්න වෙන්නේ කියලා. අපි කොයි තරම් තාක්ෂණය දියුණු කළත්, මේ ගැටලුව අපට දිගින් දිගටම තියෙයි. ජාත්‍යන්තර සබඳතා තවත් ශක්තිමත් කරගෙන, ජාත්‍යන්තරය එක්ක එකට

[ගරු සාගල රත්නායක මහතා]

වැඩ කරලා තමයි අපට මේ කටයුතු නතර කරන්න පුළුවන් වෙන්නේ. සාර්ක් කලාපයේ ඇමතිවරුන් හමු වුණු අවස්ථාවේදී අපි මේ සම්බන්ධව සාකච්ඡා කළා. මේ සම්බන්ධව අපි සංවිධානයකුත් පිහිටුවාගෙන තිබෙනවා, STOMD කියලා. ඒක අපි ලංකාවේ තමයි ස්ථාපිත කරලා තිබෙන්නේ. මේ ගැන වැඩි දුරටත් කථා කරන්න අපි මේ රටවල් අතරේ සම්බන්ධීකරණ කටයුතු කරනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාටත් මතක ඇති, මීට මාස හතර පහකට කලින් නාවික හමුදාවත්, Police Narcotic Bureau එකත් එකතුව අනවසර නෞකාවක තිබුණු මත් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් හොයා ගත්ත බව. ඔබතුමා අහපු ප්‍රශ්නයට මම පැහැදිලිම පිළිතුරක් ලබා දීලා නැහැ. නමුත් මේක තමයි තිබෙන තත්ත්වය. ඒවාට තිබෙන දේශපාලන සම්බන්ධතා ගැන අපේ විමර්ශනවල තොරතුරු නැහැ. මත් ද්‍රව්‍ය විශාල ප්‍රමාණ ගෙනැල්ලා, ඒවා වෙනත් තැන්වලට යවන්න ලංකාව මධ්‍යස්ථානයක් හැටියට පාවිච්චි කරන එක නතර කරනවා විතරක් නොවෙයි, ලංකාව තුළ මත් ද්‍රව්‍ය භාවිතය නැති කරන්නත් අපේ අවධානය යොමු කරනවා. මේ හැම කටයුත්තක්ම ලේසි පහසු නැහැ. නමුත් අපි ඒ සඳහා පුළුවන් උත්සාහ ගන්නවා. ඒ වාගේම මේ කටයුතු කරන්න තිබෙන අපේ සංවිධාන ශක්තිමත් කරනවා. මේ පිළිබඳව තව විශේෂ ප්‍රශ්න තිබෙනවා නම්, නිලධාරින් කැඳවලා ඔබතුමා දැනුවත් කිරීම සඳහා කටයුතු කරන්න මට පුළුවන්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ප්‍රධාන කටයුතුවලට යන්න කලින් මම කාරණයක් කියන්න කැමතියි. මන්ත්‍රීවරුන්ට ලැබෙන දීමනා සියල්ලම වැඩි කරන්න යනවා කියලා අද "Daily Mirror" පත්තරයේ පළවෙලා තිබෙනවා මම දැක්කා. විශේෂයෙන්ම අපි රුපියල් ලක්ෂයක් දෙන්න කියලා යෝජනා කරලා තිබෙන්නේ, මන්ත්‍රීතුමන්ලාගේ ඡන්දදායකයන් එක්ක කරන වැඩ කටයුතුවලට වියදම් කිරීම සඳහායි. එහෙම නැතිව ගෙදර කටයුතුවලට වියදම් කරන්න නොවෙයි.

සාමාන්‍යයෙන් මන්ත්‍රීවරයෙක් කාර්යාලය පවත්වා ගෙන යන්න සහ වෙනත් වැඩ කටයුතු සඳහා රුපියල් ලක්ෂ දෙකක් තුනක් වියදම් කරනවා. ග්‍රාමීය ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට එක එක දේවලට මුදල් දෙන්න, විවාහ මංගල උත්සවවලට ගියාම තෑගි දෙන්න තිබෙනවා. අපට ඒවා නැහැ. ඒ නිසා ඒ වැඩ කටයුතු කර ගෙන යන්න හැම මන්ත්‍රීවරයකුටම එක ගණනක් -රුපියල් ලක්ෂයක්- දෙන්න කියලා යෝජනා කරලා තිබෙනවා. මේක ඒ අයට වෙනම දෙන දීමනාවක්. ඒ අයගේ දීමනාත් වැඩි කරලා තිබෙනවා.

මගේ මතය නම් පඩිත් වැඩි කරන්න ඕනෑ කියන එකයි. නමුත් දැනට එහෙම යෝජනා කරලා නැහැ. තවමත් අපේ මන්ත්‍රීතුමන්ලාට ලැබෙන පඩිය, මේ "Daily Mirror" පත්‍රයේ කර්තෘතුමාටත්, අනෙක් පත්‍රවල කර්තෘතුමන්ලාටත් ලැබෙන පඩියටත් වඩා අඩුයි කියලා මම කියනවා. මම ඒ ගොල්ලන්ට දෙන පඩියත් දන්නවා. ඒගොල්ලෝත් දීමනා වැඩි කරන්න කියලා ඉල්ලා තිබෙනවා. මම හිතන විධියට දැනට අවුරුද්දකට විතර කලින් ඒගොල්ලොත් දීමනා වැඩි කරන්න කියලා ඉල්ලුවා. ඒගොල්ලන් කියන විධියට ඒ දීමනා වැඩි කරන එක හරි. මන්ත්‍රීවරුන්ගේ දීමනා වැඩි කරන එක වැරදියි. ඒක නේ කියන්නේ. ඕනෑ නම් මම මේ ඔක්කොම විස්තර කියන්නම්.

මේ අය ඉස්සරවෙලාම කියන්න තිබුණේ, "මන්ත්‍රීතුමන්ලාගේ ගෙදර වියදම් සඳහා නොවෙයි, ඡන්දදායකයන් එක්ක වැඩ කටයුතු කරන අවස්ථාවල වියදම් කරන්න තිබෙනවා. ඒවාට මුදල් දෙන්නේ කොහොමද?" කියන එකයි. එතුමන්ලාට ඒ වියදම් කරන්නේ නැතිව ඉන්න බැහැ. එහෙම නම්, කාගෙන් හරි ඉල්ලා ගන්න ඕනෑ. ඒ නිසා ඒකද හොඳ, මේකද හොඳ කියලා ඉස්සරවෙලා මාධ්‍ය තුළින් ප්‍රකාශ කරන්න. ඒ ගණන වැඩිද, අඩුද කියන එක ඊට පස්සේ කියන්න පුළුවන්. වුවමනා දේ කියන්නේ නැතිව නිකම්ම, "allowances to double" කියලා දැම්මාට වැඩක් නැහැ. ඒක කියන හැම වෙලාවේම පාර්ලිමේන්තුවේදී අපි පිළිතුරක් දෙන්නම්. මම කියන්නේ මේ පැරණි ක්‍රමය ගෙන යන්න එපා කියලායි. මන්ත්‍රීතුමන්ලාටත් මුදල් ඕනෑ. වුවමනා ප්‍රමාණයට වැඩියෙන් දීලා තිබෙනවා නම් ඒක කියන්න. ඔයගොල්ලන්ටත් මුදල් ඕනෑ. ඒවා බලාගෙන අපි වැඩ කටයුතු කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ප්‍රධාන කටයුතු. විසර්ජන පනත් කෙටුම්පත 2017- කාරක සභා අවස්ථාව.

## විසර්ජන පනත් කෙටුම්පත, 2017
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2017
## APPROPRIATION BILL, 2017

**කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදි.-**
**[ප්‍රගතිය: නොවැම්බර් 26]**
**[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]**

குழுவில் மேலும் ஆராயப்பெற்றது. -
[தேர்ச்சி : நவம்பர் 26]
[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]

Considered further in Committee.- [Progress: 26th November]
[THE HON. SPEAKER in the Chair.]

**122 වන ශීර්ෂය.- පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.909,384,000

**தலைப்பு 122.- பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01. - செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 909,384,000

HEAD 122.- MINISTER OF PARLIAMENTARY REFORMS AND MASS MEDIA

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 909,384,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - ශීර්ෂ අංක 122, 210, 211, සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 12.30 දක්වා. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා

අමාත්‍යාංශය - ශීර්ෂ අංක 114, 306,307, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය - ශීර්ෂ අංක 176. සලකා බැලීම අපර භාග 1.00 සිට අපර භාග 6.30 දක්වා.

ගරු අනුර දිසානායක මැතිතුමා.

[පූ.භා. 10.10]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු සභාපතිතුමනි, "2017 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 122, 210 සහ 211 දරන වැය ශීර්ෂවලින් සාම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මා යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ වන අද විවාදයේදී "ජනමාධ්‍ය" කියන කොටස ඉතා වැදගත් කියලා අපි කල්පනා කරනවා. වර්තමාන යුගයේ ජන මතය හැසිරවීමේදීත්, ජනතාව අතර මතයක් ප්‍රබලව ස්ථාපිත කිරීමේදීත් මාධ්‍යයට සුවිශේෂී කාර්ය භාරයක් සහ වගකීමක් තිබෙනවා. මොකද, එක්තරා යුගයකට වඩා අද රූපවාහිනී නාලිකා වැඩි වෙලා තිබෙනවා. ඒවායින් ආවරණය වන ප්‍රදේශ වැඩි වෙලා තිබෙනවා. එක්තරා යුගයකට වඩා අද රේඩියෝ නාලිකා වැඩි වෙලා තිබෙනවා. ඒවායින් ආවරණය වන ප්‍රදේශ වැඩි වෙලා තිබෙනවා. එක්තරා යුගයකට වඩා අද පුවත් පත් වැඩි වෙලා තිබෙනවා. පුවත් පත් අළෙවි වන ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා, ජනතාවගේ මතය හැසිරවීමේදී මේ මාධ්‍ය ආයතන විසින් ප්‍රබලතම කාර්ය භාරයක් ඉටු කරන බව අපි කවුරුත් දන්නවා.

ගරු සභාපතිතුමනි, මෙම මාධ්‍ය ආයතනවලින් සහ මාධ්‍යවේදීන්ගෙන් නිරපේක්ෂ ශුද්ධවන්තභාවයක් අපි කිසිසේත්ම බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙම බලාපොරොත්තු විය යුතුත් නැහැ. මොකද, රාජ්‍ය මාධ්‍ය ආයතන පමණක් නොවෙයි, පෞද්ගලික මාධ්‍ය ආයතන පවා තමන්ගේම වූ දේශපාලන වුවමනාවක් මත හැසිරෙමින් තිබෙන නිසා.

ගරු සභාපතිතුමනි, යම් මාධ්‍ය ආයතනයක ප්‍රවෘත්ති දෙස විමසා බැලුවොත්, අපට ඉතා හොඳින් තේරුම් ගන්න පුළුවන්කම තිබෙනවා, එම මාධ්‍ය ආයතන කවර දේශපාලන අරමුණක් වෙනුවෙන්ද මෙහෙය වන්නේ, කටයුතු කරන්නේ කියලා. ඒ නිසා, අපි මේ මාධ්‍ය දෙස බලන්නේ නිරපේක්ෂ ශුද්ධවන්තභාවයකින් නොවෙයි. ඔවුන්ට, ඔවුන්ටම වූ, ඔවුන්ම අපේක්ෂා කරන්නා වූ දේශපාලන අරමුණක් තිබෙන බව අපි පිළිගන්නවා. මෑත කාලයේ අලුතින් බිහි වූ පුවත් පත් දෙස බැලුවත්, පැරණි පුවත් පත් දෙස බැලුවත්, රූපවාහිනී නාලිකා දෙස බැලුවත්, යම් දේශපාලන න්‍යාය පත්‍රයකට අනුව ඔවුන් මෙහෙයවන බව අපට හොඳින්ම තේරුම් ගන්න පුළුවන්. ඒක එහි අයිතිකරුවන්ගේ දේශපාලන දෘෂ්ටිය වෙන්න පුළුවන්. එහෙම නැත්නම්, ඒ ප්‍රධාන නිලධාරින්ගේ දේශපාලන දෘෂ්ටිය වෙන්න පුළුවන්. එය කවරාකාරයේ වුණත්, මේ මාධ්‍ය ආයතනවල තිබෙන්නේ නිරපේක්ෂ ශුද්ධවන්තභාවයක් නොවෙයි. ඔවුන් ඔවුන්ටම ආවේණික වූ, ඔවුන්ටම අනන්‍ය වූ දේශපාලන අරමුණක් සහිතව කටයුතු කරනවා. නමුත් අපි ඒක ප්‍රශ්නයක් කර ගන්නේ නැහැ. හැබැයි, ඒ ගැන මේ රටේ ජනතාව දැන ගත යුතුයි.

මෙම මාධ්‍ය ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් යම් දූෂිත වළල්ලක කොටස්කරුවන් බවට පත් වී තිබෙන බව අපි දන්නවා. මා උදාහරණයක් හැටියට ඇවන්ට්ගාඩ් ප්‍රශ්නය ගැන කියන්නම්. අපි පාර්ලිමේන්තුවේදී ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළ අවස්ථාවේ දී පුවත් පත් එකක් දෙකක් හැරුණු කොට, අනෙක් කිසිදු පුවත් පතක් ඒ ගැන වාර්තා කළේ නැහැ.

ඒ වෙනුවට සෑම මාධ්‍ය ආයතනයක්ම පෙළඹුණේ ඇවන්ට් ගාර්ඩ් සමාගම විසින් ලබා දෙන ලද පුවත් පත් දැන්වීම් ප්‍රකාශයට පත් කරන්නයි. ඒ වකවානුවේ පුවත් පත් ටික හාරා අවුස්සා බැලුවොත්, සතිපතා පිටු දෙකේ දැන්වීම් පළ කරන ලද මාධ්‍ය ආයතන තිබෙන බව පෙනෙනවා. ඒ නිසා දූෂිතයන් ආරක්ෂා කිරීමේ සහ දූෂණවල යෙදීමේ වළල්ලේ කොටස්කරුවන් බවටත් මේ මාධ්‍ය ආයතන පත්වී තිබෙනවා.

මෑත කාලයේ ආරම්භ කරන ලද සමහර මාධ්‍ය ආයතනවල මූල්‍ය ප්‍රභව තිබෙන්නේ කොහෙද කියලා බැලුවොත්, අපට ඉතා හොඳින් දැක ගන්න පුළුවන්, මහජනයාගේ ධනය අයථා ලෙස උපයා ගන්නා ලද මූල්‍ය ප්‍රභව විසින් ඒ මාධ්‍ය ආයතන පටන් ගෙන තිබෙන බව. ඒ නිසා ඒ පිළිබඳවත් අපට අදහසක් තිබෙනවා. ඔවුන්ට දේශපාලන අරමුණක් තිබෙන එක පිළිබඳවත් අපට අදහසක් තිබෙනවා. ඔවුන්ගේ මූල්‍ය ප්‍රභව පිළිබඳවත් අපට අදහසක් තිබෙනවා. ඒ ආයතන පමණක් නොවෙයි, ඒ ආයතනවල වැඩ කරන අය පවා යම් මූල්‍ය වුවමනා අනුව කටයුතු කරන බව අපි දන්නවා. උදාහරණයක් හැටියට කිව්වොත්, වරාය අධිකාරියේ වැටුප් ලබමින් මාධ්‍ය ආයතනයක වැඩ කරන අය හිටියා. ඒ අය පසු ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ 7වැනි දායින් පස්සේ වරාය අධිකාරියේ වැඩට ඇවිල්ලා නැහැ. ඒ පුද්ගලයන් වරාය අධිකාරියෙන් පඩි ලබනවා, පෞද්ගලික මාධ්‍ය ආයතනයක වැඩ කරනවා. නිවාස අමාත්‍යාංශයෙන් පඩි ලබමින්, එහි වාහන ලබමින් මාධ්‍ය ආයතනවල වැඩ කරපු අය හිටියා.

ඒ විතරක් නොවෙයි. රාජ්‍ය ආයතනවල පමණක් නොවෙයි, යම් දේශපාලන පක්ෂවලත් එවැනි අය ඉන්නවා. සිරිකොත පඩි ලැයිස්තුවේ මාධ්‍යවේදීන් හිටපු බව මා ඉතා වගකීමෙන් කියනවා. ඒක ඇත්ත කථාවක්. ඒ නිසා අපි මේ මාධ්‍යවේදීන්ගේ ශුද්ධවන්තභාවයක් බලාපොරොත්තු වන්නේත් නැහැ. ගරු සභාපතිතුමනි, මුළු සමාජයක් කුණු වෙලා තිබෙන තැනක, මාධ්‍ය ආයතන විතරක් ප්‍රභාවත්භාවයෙන් යුතුව බැබළේවි කියන අදහසක් අපට නැහැ. මුදල්, ලාභය, පෞද්ගලික අපේක්ෂා, අධිපරිභෝජනය හඹාගෙන යන, විකෘති කරන ලද මිනිස් සමාජයකින් පිවිතුරු මාධ්‍යවේදීන් අපි බලාපොරොත්තු වන්නේත් නැහැ. ඒ නිසා ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳ මාධ්‍ය ආයතනය පිළිබඳ මේ විවාදයට අපි එළැඹෙන්නේ, ඒ පිළිබඳ කටුක යථාර්ථය, සත්‍ය යථාර්ථය ඉතා හොඳින් තේරුම් ගනිමින්.

ඒ වාගේම, මේ සියල්ල මධ්‍යයේ මාධ්‍ය ආයතන අපේ රටට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් තිබෙනවා. ඒ නිසා හැම දාමත්, ඕනෑම ආණ්ඩුවක මර්දනයේ පළමු පියවර එල්ල වෙන්නේ මාධ්‍ය ආයතනවලට. මාධ්‍ය ආයතනවලට එල්ල වෙන ඒ පියවර තමයි පසුව කලා නිර්මාණ ක්ෂේත්‍රයට, තවත් විටෙක දේශපාලන ක්ෂේත්‍රයට අවතීර්ණ වෙන්නේ.

ඒ නිසා මේ මාධ්‍ය ක්ෂේත්‍රයට එල්ල වෙච්ච මහා බරපතළ තර්ජනයන් අපි ඉතිහාසයේ දැකලා තිබෙනවා. මේවා ඉතිහාසයේ වැලි තලාවෙන් වැසී යාමට ඉඩ නොදී ඒ අපරාධකරුවන් එළිදරවු කොට දඬුවම් ලබා දීම ඒ ජනතාවගේ අපේක්ෂාව බවට පත් වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පසු ගිය කළු දශකයේ අපේ රටේ මාධ්‍යවේදීන් ගණනාවක් ඝාතනයට ලක් වුණු බව අපි දන්නවා.

[ගරු අනුර දිසානායක මහතා]

ලසන්ත වික්‍රමතුංග, එක්නැලිගොඩ, ඒ වාගේම "උදයන්" පුවත් පතේ මාධ්‍යවේදීන් ආදී විවිධාකාර මාධ්‍ය ආයතනවල වැඩ කළ - මාධ්‍ය ආයතන 26කට ආසන්න ප්‍රමාණයක වැඩ කළ- මාධ්‍යවේදීන් ඝාතනයට ලක් වෙලා තිබෙනවා. මාධ්‍යවේදීන්ගේ ඝාතනයේ කෙළිබිමක් බවට මේ ශ්‍රී ලංකා රාජ්‍ය පත් වී තිබෙනවා. හැබැයි, අදත් මොකක්ද සිදු වී තිබෙන්නේ? ඒ කිසිදු ඝාතනයක් පිළිබඳව පරීක්ෂණ අවසන් කොට, නිවැරදි ලෙස හඳුනාගෙන, දඬුවම් ලබා දීමට තමුන්නාන්සේලාගේ පාලනය අසමත් වෙලා තිබෙනවා. මාධ්‍යවේදීන් ඝාතනය කළා පමණක් නොවෙයි, මාධ්‍යවේදීන්ට පහර දීමත් සුලභ දසුනක් බවට පරිවර්තනය වෙලා තිබුණා.

සතියක්, දෙකක් යන්නට මත්තෙන් තවත් එක් සිදුවීමක් මතු වෙන තරමට හඹාගෙන ගොස් මාධ්‍යවේදීන්ට පහර දීමේ යුගයක් නිර්මාණය වෙලා තිබුණා. පෝද්දල ජයන්ත, කීත් නොයාර්, උපාලි තෙන්නකෝන් ආදී ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් විශාල ගණනාවක් අපේ රටේ මේ කළු දශකයේ තර්ජනයට ලක් වී තිබුණා; පහර කෑමට ලක් වී තිබුණා. මහ දවාලේ ජාතික රූපවාහිනී නාලිකාවට පැනපු ඇමතිවරු එහි මාධ්‍යවේදීන්ට කරන ලද තර්ජනය නිසා ඒ මාධ්‍යවේදීන්ගෙන් ඇති වෙච්ච ප්‍රතිප්‍රහාර මධ්‍යයේ ඔවුන්ගේ නම් හොය හොයා, හඹාගෙන ගොස් ඇලි පිහියෙන් කපන, බ්ලේඩ්වලින් කපන, ගෙවල්වලට ගල් ගහන යුගයක් නිර්මාණය වෙලා තිබුණා. ඒ නිසා තමුන්නාන්සේලාට වග කීමක් තිබෙනවා, ඒ යුගයේ මේ මාධ්‍යවේදීන්ට පහර දෙන ලද සැබෑ වග උත්තරකරුවන් සොයන්න.

ගරු සභාපතිතුමනි, එපමණක් නොවෙයි. මාධ්‍ය ආයතනවලටත් පහර දුන්නා. "සිරස" ආයතනයට බෝම්බ ගැහුවා. අදත් කවුද ඒක කළේ කියලා හොයා ගන්න නැහැ. "සියත" ආයතනය ගිනි තිබ්බා. අදත් ගිනි තිබ්බේ කවුද කියලා හොයා ගන්න නැහැ. රත්මලානේ අධිආරක්ෂිත කලාපයේ පිහිටුවා තිබුණු "සන්ඩේ ලීඩර්" මාධ්‍ය ආයතනයේ කාර්යාලයටත්, මුද්‍රණාලයටත් පහර දුන්නා. අදටත් කිසිවෙක් හොයා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. පසු ගිය කළු දශකය ගත්තොත් මාධ්‍යවේදීන් ප්‍රබලම තර්ජනයකට සහ මර්දනයකට ලක් වුණු යුගයක්. මේ මාධ්‍යවේදීන් පිළිබඳවත්, මේ මාධ්‍ය ආයතන පිළිබඳවත්, පහර කෑමට ලක් වූ මාධ්‍යවේදීන්ටත් සාධාරණය ඉටු කිරීම තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයේ වග කීමක්. එය පරීක්ෂණ හැටියට ගත්තොත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරෙන්න පුළුවන්. එහි නඩු විභාග ගත්තොත්, අධිකරණ අමාත්‍යාංශයට පැවරෙන්න පුළුවන්. හැබැයි, තමුන්නාන්සේලා තමයි එම ආයතනවල, එම මාධ්‍යවේදීන්ගේ පාලකයන්; මෙහෙයවන්නන්; අයිතිකරුවන්.

තමුන්නාන්සේලාගේ ජනමාධ්‍ය අමාත්‍යාංශයට තමයි ඒ දුක්ගැනවිලි ඉදිරිපත් කරන්න තිබෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාට මේ කාරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මත හෝ අධිකරණය මත හෝ පමණක් පටවා නිදහස් වීමට අයිතියක් නැහැ. මේ කළු දශකයේ ඇති කරන ලද මාධ්‍ය මර්දනයට එරෙහිව තමුන්නාන්සේලාගේ ප්‍රබල මෙහෙයුමක් අවශ්‍ය වී තිබෙනවා. නමුත් තවමත් එවැනි තත්ත්වයක් නිර්මාණය වන බවක් පෙන්නුම් කරමින් නැහැ. ඒ වෙනුවට සිදුවෙමින් තිබෙන්නේ මොකක්ද? ගරු සභාපතිතුමනි, ඒ වෙනුවට මාධ්‍ය වෙත යළි යළිත් අනිසි තර්ජන ක්‍රමානුකූලව දියත් කරමින් තිබෙන බවක් පෙන්නුම් කරමින් තිබෙනවා.

මා ළඟ තිබෙනවා, 2016 ජූලි මාසයේ 23වන දා ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මහනුවරදී කරන ලද කථාවක කොටසක්. "ඒ 'ඩේලි මිරර්' කර්තෘ මම දන්නවා" - ඒ කර්තෘ ගැන එතුමා නොකියා කිව්වේ එහෙමයි. එතුමා කියා තිබෙනවා, "ඒ 'ඩේලි මිරර්' කර්තෘ මම දන්නවා. එක කාලෙක එයා මටත් අයින් වෙන්න කිව්වා. දැන් එයත් අයින් වෙන්නේ නැත්නම් අපට බලන්න වෙයි මොනවාද කරන්නේ කියලා. අපේ ඇමතිවරුන්ට යන්න කියනවා නම්, ඊට ඉස්සෙල්ලා මුන්ට හොඳ පාඩමක් අපි උගන්වමු කියලා මම කියන්න කැමැතියි. සෙල්ලම් කරන්න එන්න එපා, මේ ආණ්ඩුව එක්ක. අපි අවුරුදු පහක් යනවා" කියලා. මොකක්ද මේ කියන්නේ? මෙය තර්ජනයක් නොවෙයිද?

ගරු සභාපතිතුමනි, මාධ්‍ය පිළිබඳව අපටත් විවේචන තිබෙනවා. ඔවුන්ගේ භාවිතයන් පිළිබඳව විවේචන අපට තිබෙනවා. හැබැයි ඒ විවේචන ඉදිරිපත් කිරීමේ ස්වභාවයයි, ඒකට එල්ල කරන ලද තර්ජනයයි අප තේරුම් ගත යුතුව තිබෙනවා. ගරු සභාපතිතුමනි, "ඩේලි මිරර්" කර්තෘවරයා ඉවත් විය යුතුයි, ඉවත් වන්නේ නැත්නම් ඉවත් කරන ආකාරය අපි දන්නවා, මුන්ට පාඩමක් උගන්වනවා, අපි අවුරුදු පහක් ඉන්නවා කියලා අග්‍රාමාත්‍යවරයා කියනවා නම්, "බලය අප සතුව තිබෙනවා, ඒ නිසා කරුණාකර අපට ඕනෑ විධියට හැසිරෙන්න ඉගෙන ගනිල්ලා" කියන පණිවුඩය නොවෙයිද මේ දෙන්නේ? මේක මාධ්‍ය මර්දනයේ තවත් නව ආකෘතියක් නොවෙයිද? පැහැර ගෙන ගියේ නැතිවාට, සුදු වෑන් එව්වේ නැතිවාට, පහර දීම් සිදු වී නැතිවාට මේක අග්‍රාමාත්‍යවරයා හැටියට එල්ල කරන ලද ප්‍රබලම තර්ජනයක් කියා අපි කල්පනා කරනවා. මෙය, කවර ආකාරයෙන් කුමන දිසාවටද? අගමැතිවරයා මෙසේ ප්‍රකාශ කරන කොට, ඔහුගේ ගෝල බාලයන් කවර ආකාරයෙන් හැසිරේවිද කියා අපි දන්නේ නැහැ. මොකද, ආණ්ඩුවේ උඩින්ම සංඥාව දීලා තිබෙනවා, මාධ්‍ය පිළිබඳ තමන්ගේ ප්‍රතිපත්තිය ගැන.

ඒ විතරක් නොවෙයි. ජනාධිපතිතුමා කිව්වේ මොකක්ද? "මාධ්‍යයට ඕනෑ ආණ්ඩු පෙරළන්න, තිබෙන ආණ්ඩුව අප්‍රසාදයට ලක් කරන්න, දේශපාලනඥයන් අලුතින් හදන්න, දේශපාලනඥයන් බලයෙන් පහ කරන්න" කියලායි. එතුමා කියා තිබෙනවා, "මුල් පිටුව තමයි රට නැති කරන පිටුව වෙලා තියෙන්නේ" කියලා. මේක ඇත්තද? අපි දන්නවා, පත්තරවල මුල් පිටුවල විවිධ දේ වාර්තා වනවා කියා. හැබැයි, ඒ වාර්තා වන්නේ රටේ සිදු වන දේයි. සමහර මාධ්‍ය ආයතන, අපරාධ වැඩිපුර එකතු කර තිබෙන්න පුළුවන්; සමහර මාධ්‍ය ආයතන ආණ්ඩුවේ ගුණ වර්ණනා වැඩියෙන් එකතු කර තිබෙන්න පුළුවන්; තවත් මාධ්‍ය ආයතනයක්, ආණ්ඩුවට එරෙහිව විවේචන වැඩිපුර එකතු කර තිබෙන්න පුළුවන්. හැබැයි ඒ මුල් පිටුව ආවරණය වී තිබෙන්නේ, විශාල ප්‍රමාණයක් රටේ සිදු වන සත්‍ය තොරතුරු මතයි. අසත්‍ය තොරතුරුත් තිබෙනවා. ඒවා පිළිබඳව අපිත් ප්‍රතිචාර දක්වා තිබෙනවා. අසත්‍ය තොරතුරු ප්‍රතික්ෂේප කරන ආකාරයක් තිබෙනවා. එයට එරෙහිව ක්‍රියා මාර්ග ගත යුතු ආකාරයක් තිබෙනවා.

ඒ පිළිබඳව අපිත් ස්ථාවරයක ඉන්නවා. හැබැයි මේ මුල් පිටුවල තිබෙන්නේ සමාජයේ සත්‍ය. අපරාධයක් සිදු වෙනවා නම් අපරාධය වාර්තා නොකර ඉන්න කියලාද කියන්නේ; සොරකම් සිදු වෙනවා නම් ඒවා වාර්තා නොකර ඉන්න කියලාද කියන්නේ? එම නිසා රට නැති කරන්නේ පත්තරවල මුල් පිටු කියන එක සාධාරණ නැහැ.

රට නැති කරන්නේ පත්තරවල මුල් පිටු නොවෙයි, රට නැති කරන්නේ පාලකයෝ. ඔවුන්ගේ වංචාවන් ගැන ලියන්නට එපාද, ඔවුන්ගේ අපරාධ ගැන ලියන්නට එපාද, ඔවුන් කරුංගා ජාවාරමට හවුල් වෙන විධිය ගැන ලියන්නට එපාද, ඔවුන් ප්‍රාඩෝ රථ නිදහස්

කිරීම ගැන ලියන්නට එපාද, ඔවුන්ගේ ගල් අඟුරු වංචා ගැන ලියන්නට එපාද, මහාමාර්ග අමාත්‍යාංශයේ සිද්ධ වෙන ගනුදෙනු ගැන ලියන්නට එපාද? අපි අහන්නේ එපමණයි. ඒවා ලියන විට "රට නැති කරන්නේ මුල් පිටු" කියලා කියන්නේ වෙනත් අදහසකින්.

ඒ වාගේම කියනවා, "ආණ්ඩු පෙරළන දේශපාලකයන්ට ගහන්න මිසක් මේ රටේ මාධ්‍යවලට රට ගැන හැඟීමක් නැහැ" කියලා. ඒක වෙන්න පුළුවන්. හැබැයි රට ගැන හැඟීම නැත්තේ මාධ්‍ය ආයතනවලට සහ මාධ්‍යවේදීන්ට විතරක්ද? මේ රටේ පාලකයන්ට රට ගැන හැඟීමක් තිබෙනවාද? ඔවුන් රටේ දේපොළ ආරක්ෂා කරනවාද, රටේ සම්පත් ආරක්ෂා කරනවාද, මහ ජනයාගේ ධනය ආරක්ෂා කරනවාද, මහ ජනයාගේ ධනය නාස්ති නොකර පාවිච්චි කරනවාද? මේ කිසිවක් කරන්නේ නැතිව මාධ්‍යවලට ඇඟිල්ල දිගු කරන්නට තමුන්නාන්සේලාට සාධාරණ අයිතියක් නැහැ, රට ගැන හිතන්නේ නැහැ කියලා. එහෙම කියන්න පුළුවන්කම තිබෙන්නේ රට ගැන හිතන ආණ්ඩුවක් තිබෙනවා නම්. මහ ජනයාගේ ධනය නාස්ති කරන ආණ්ඩුවක් නම්, මහ ජනයාගේ ධනය අවභාවිතයේ යොදන ආණ්ඩුවක් නම්, - [බාධා කිරීමක්] පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ගැන කථා කරද්දී මම ඒක කියන්නම්. ඔබතුමාගේ අමාත්‍යාංශයට කැබිනට් පත්‍රිකාවක් ආවා නේ, ලක්ෂ 7කට වාහන ගන්න කියලා. ඒක සමාජ සාකච්ඡාවකට බඳුන් විය යුතුයි. මාසයකට ලක්ෂ 7ක කුලියකට මන්ත්‍රීවරයකුට වාහනයක් අරගෙන දෙනවා කියන එක ගැන අප විසින් හඬ නඟනවා, මාධ්‍ය ඒක වාර්තා කරනවා. ඒක සමාජ මතයක් බවට පත් වෙනවා. ඒ විධියට සමාජ මතයක් බවට පත් වුණේ නැත්නම් තමුන්නාන්සේලා ඒක කරනවා. ඒක කරන්න තමයි කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ගත්තේ.

මේක මුදල් අමාත්‍යවරයාගේ යෝජනාවක් පමණක් නොවෙයි. මුදල් අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනවා, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනවා. කැබිනට් මණ්ඩලය විසින් දුන් අනුමැතිය නේ මේ තිබෙන්නේ. එම නිසා එය වසා තැබීම කිසිසේත්ම සාධාරණ නැහැ, එය එළිදරවු කළ යුතුව තිබෙනවා. වාහනයක් කුලියට ගන්න මාසයකට ලක්ෂ 7ක් වැය වීම නතර වෙන්නේ ඒ විධියට. එවැනි අවස්ථාවල අපට කියන්න පුළුවන්ද මාධ්‍ය මේවා එළිදරවු කරනවා, රට ගැන හිතන්නේ නැහැ කියලා. පාලකයා රට ගැන හිතන්නට ඕනෑ. පාලකයා රට ගැන හිතමින්, ජනතාව ගැන හිතමින් තමයි අනෙකාට ඇඟිල්ල දිගු කළ යුතු වන්නේ. පාලකයා රට ගැන හිතන්නේ නැතිව, මහජන ධනය ගැන කල්පනා කරන්නේ නැතිව, අනෙක් පැත්තට ඇඟිල්ල දිගු කිරීම එතරම් සාධාරණ නැහැ කියලා අපි කල්පනා කරනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමැතියි CSN නාලිකාව පිළිබඳව. CSN නාලිකාව අන්ත දූෂිත ධනයෙන් ගොඩනඟන ලද ආයතනයක්. ඒ පිළිබඳව අපට විවාදයක් නැහැ. CSN නාලිකාව ඇති කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩම ගනු ලැබුවේ මහින්ද රාජපක්ෂ සංස්කෘතික, සමාජ, ආධාර, උපකාර සංගමයට. මේ විධියට කියන්න පුළුවන් ඔක්කොම දාලා තමයි ගත්තේ. එම ඉඩම රූපවාහිනී නාලිකාවකට පවරා තිබෙනවා. මේ ඉඩම පැවරීමම නීති විරෝධියි. එම නිසා නාගරික සංවර්ධන අධිකාරිය පනත අනුව යළි එම ඉඩම පවරා ගැනීමේ හැකියාව තිබෙනවා.

මෙම නාලිකාව දියත් කිරීමේදී ඒ සඳහා ජාතික රූපවාහිනියේ අංගෝපාංග විශාල ප්‍රමාණයක් උපයෝගී කරගෙන තිබෙනවා. එයත් රාජ්‍ය දේපොළ අවභාවිතයේ යෙදවීමක්. ඒ විතරක් නොවෙයි, මෙම රූපවාහිනී නාලිකාව ආරම්භ කිරීම සඳහා යම් මුදල් ප්‍රමාණයක් උපයා ගත්තේ කොයි ආකාරයටද කියා අයිතිකරුවන්ට ඔප්පු කරන්න බැරිවී තිබෙනවා.

ඊළඟට, CSN රූපවාහිනී නාලිකාව පවත්වාගෙන යාමේදී විශේෂ රාජ්‍ය අනුග්‍රහය ලබාදී තිබෙනවා. එම නිසා CSN කියන්නේ, දූෂිත නාලිකාවක් බව ඇත්තයි. එහෙම නම් මොකක්ද කළ යුතු වන්නේ? ඒ දූෂිත නාලිකාවේ දූෂිත ගනුදෙනු පිළිබඳව පරීක්ෂණ කොට, යළි අත්පත් කරගැනීම හෝ ඒ මුදල් දූෂණයට ලක් කරන ලද පුද්ගලයන්ට දඬුවම් ලබාදීම සඳහා පරීක්ෂණ දියත් විය යුතුව තිබෙනවා. නමුත්, ඒ ප්‍රශ්න එසේ තිබියදී, තමුන්නාන්සේලා එම නාලිකාව තහනම් කරන්න ක්‍රියාමාර්ග ගන්නේ එම දූෂිත ගනු-දෙනු මත පදනම් වෙලා නොවෙයි. එයයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. එම නාලිකාව දූෂිතයි. ඒ පිළිබඳව අපට විවාදයක් නැහැ.

ගරු සභාපතිතුමනි, CSN නාලිකාවත් සමඟ Singha FM, Red FM, Tamil FM කියා තවත් radio නාලිකා තුනක් ගොඩනැඟුණා. දැන් ඒවායේ නම් මාරු කර තිබෙන්නේ. මේ radio නාලිකා තුනත් මේ විධියටම තමයි ආරම්භ කළේ. එම නිසා ඒවායේ දූෂිතභාවය පිළිබඳව, මහජනයාගේ ධනය යොදවලා එම මාධ්‍ය ආයතන තමන්ගේ පවුලේ වුවමනාව සඳහා මෙහෙයවීමට කටයුතු කළ ආකාරය පිළිබඳව අපට විවේචනයක් තිබෙනවා. එම විවේචන එසේ තිබියදී, තමුන්නාන්සේලා ඒ නාලිකාවේ බලපත්‍ර අහෝසි කරන්න අරගෙන තිබෙන්නේ කවර ක්‍රියාමාර්ගද?

විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, සුනිල් එස්. සිරිසේන මහත්මයා විසින් CSN නාලිකාව වෙත යවන ලද ලිපිය මා ළඟ දැන් තිබෙනවා. "විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට පිටපතක් සහිතව ඔබ වෙත පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ අංක - අංකය තිබෙනවා.- දිනැති ලිපිය හා බැඳේ." යනුවෙන් සඳහන් කර, උක්ත ලිපිය මඟින් ඔබ ආයතනය වෙත නිකුත් කර තිබූ භෞමික රූපවාහිනී විකාශන බලපත්‍ර අවලංගු කරනවාය කියා එම ලිපියෙන් කියා තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද?

"විදුලි සන්දේශ පනතේ 22වන වගන්තිය යටතේ විදුලි සංඛ්‍යාත පාවිච්චි කිරීම සඳහා බලපත්‍ර නිකුත් කර ඇත්තේ ඔබ වෙත තිබූ...."

ඒ කියන්නේ, රූපවාහිනී නාලිකාවත් එක්ක තමයි මේවාත් වුණේ. හැබැයි, තහනම පිළිබඳව ලිපියේ සඳහන් වෙනවා.

"ශ්‍රී ලංකාව තුළ භෞමික රූපවාහිනී විකාශන මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා ඔබ ආයතනය වෙත 2011.03.03 දින නිකුත් කරන ලද විකාශන බලපත්‍රයේ සඳහන් වගන්ති උල්ලංඝනය කරමින් ඔබ විසින් එම නාලිකාව පවත්වාගෙන යන බව ඊට අදාළව පැවති පරීක්ෂණවලින් තහවුරු වී ඇත. එබැවින් උක්ත බලපත්‍රයේ 3. iii, 11 හා 14 වන වගන්ති උල්ලංඝනය කර තිබීම හේතු කොටගෙන 3. i වගන්තිය ප්‍රකාරව වහාම ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රය අවලංගු කරමි. නිමල් බෝපගේ, ලේකම්, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය." එහෙමයි ලිපියේ සඳහන් වන්නේ.

මම කියන්නේ මේ කාරණයයි, ගරු සභාපතිතුමනි. එම නාලිකාවේ විකාශන කටයුතුවල යම් දුබලතාවක් මතු වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳ පරීක්ෂණයක් කොට, කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලබා දී-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට කොපමණ කාලයක් තිබුණාද, ගරු සභාපතිතුමනි?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
විනාඩි 20යි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විනාඩි 20ද තිබුණේ?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අද විනාඩි 10ක් ප්‍රමාද වෙලායි විවාදය පටන් ගත්තේ. තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න. මා ඒ පිළිබඳව කනගාටු වනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, මගේ කථාව මොහොතකින් අවසන් කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය මා ඉහතින් සඳහන් කළ කරුණු කෙරෙහි යොමු කරනවා.

ඊළඟට, මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා, "දෙරණ" නාලිකාවේ විකාශනය වූ ප්‍රවෘත්තියක් පිළිබඳව. නාලිකා පිළිබඳව විවිධ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ ප්‍රවෘත්තියෙන් කථාවක් විකෘති කළා යැයි කියලා සතියකින් කරුණු විමසා සිටීමක් කරනවා. මේ තුළ තිබෙන්නේ මොකක්ද? මේ තුළින් අනියමින් මාධ්‍ය වෙත එල්ල කරන ලද තර්ජනයේ ස්වභාවයක් තමුන්නාන්සේලා දියත් කරමින් තිබෙනවා. ඒ වාගේම තවත් ප්‍රවෘත්තියක් තිබෙනවා. "සියලු මාධ්‍යවේදීන් මධ්‍යම පළාත් සභාවෙන් පිට මං කරයි, ඉහළින් ලැබුණාම සංඥාව. ඔන්න පළාත් සභාව. හේතුව, රුසියානු සංචාරය ගැන හෙළි කරයි." කියලා මධ්‍යම පළාත් සභාව මොකද කරන්නේ? මාධ්‍යවේදීන් එතැන වාරණයට ලක් කරනවා. ඒ නිසා මාධ්‍ය පිළිබඳ ක්‍රමානුකූලව -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න වනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විනාඩි දෙකත් අවසන්ද?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අන්තිම විනාඩියට ඇවිල්ලා තිබෙන්නේ. පෙර වරු 10.28ට තමයි මම ඔබතුමාට එය කිව්වේ. දැන් 10.30යි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, මාධ්‍යවේදීන් පිළිබඳව මට එක කරුණක් කියන්න තිබෙනවා. ගරු සභාපතිතුමනි, කවුරු වුණත් පත්තරයේ නම දමා ගන්න කැමැතියි, රූපවාහිනියේ මුහුණ පෙන්වා ගන්න කැමැතියි. ඒ සඳහා පොඩි කැමැත්තක් තිබෙනවා. ඒකට සමාජ වටිනාකමක් හැදෙනවා. ඒ නිසා ඔවුන් මේවාට යන්න පෙලඹීමක් තිබෙනවා. හැබැයි, ඔවුන්ගේ වැටුප් පිළිබඳව විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා freelance වැඩ කරන අය, සමහර රූපවාහිනී නාලිකාවල වැඩ කරන අය වැටුප් පිළිබඳව විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. රුපියල් 2,500 වැටුප් වැඩි කිරීමවත් ඔවුන්ට හිමි වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මාධ්‍යවේදීන්ගේ වැටුප් පිළිබඳව මතු වී තිබෙන ගැටලුව පිළිබඳව ඔබතුමාගේ අවධානය මා යොමු කරනවා. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ගොඩක් ප්‍රවෘත්ති එවන්නේ Internet එක හරහා email මඟින්. Internet ගාස්තු ඉහළ යෑම නිසා ඔවුන්ට දැන් ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. මේ ප්‍රවෘත්ති පළ වුණොත් පමණයි ඔවුන්ට මුදල් හම්බ වන්නේ. සමහර විට මේ ප්‍රවෘත්ති පළ වන්නේත් නැහැ. හැබැයි, මේ සඳහා ඔවුන්ට වියදමක් දරන්න සිද්ධ වී තිබෙනවා. ඒ නිසා විශාල ගැටලු ගණනාවකට මාධ්‍යවේදීන් මුහුණ දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අග්‍රාමාත්‍යතුමා.

[පූ.භා. 10.31]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
මා පිළිබඳව සඳහන් කළ නිසා මාධ්‍යය නිදහස පිළිබඳවත්, මේ ආණ්ඩුව පිළිබඳවත් කථා කරන්නයි මම අදහස් කරන්නේ. පළමුවෙන්ම අද කිව්ව එකයි, Daily Mirror පුවත් පතේ කර්තෘ ගැන හැම දාම කියන එකෙයි එක වචනයක්වත් ඉවත් කරන්නේ නැහැ. මම මාධ්‍යය මර්දනය කරලා නැහැ. මට මොකක්ද කරන්න කියන්නේ? මම මිනිස්සු ගෙනියලා Daily Mirror පුවත් පත් කාර්යාලය වන Wijeya Press එක ගිනි තබන්නද? ගිනි තැබුවොත් මොකක්ද වෙන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මාමාගේ දේපළ නේ?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මාමාගේ දේපළ. මොනවාද කියන්නේ? මිනිහා උස්සා ගෙන යන්නද? ඒක කරන්නත් බැහැ නේ? මිනිහා උස්සා ගෙන යන්නත් බැහැ නේ? මට කියන්න තිබෙන දේ මම කියන්නම්. ඒක වෙන දෙයක්. මට හැම දාම සිරසෙන් බණිනවා, කිලී මහරාජා. පරණ යාළුවෙක්. මම එතැනට ගිහිල්ලා ගල් ගහන්නේත් නැහැ. ඒ පුද්ගලයා උස්සා ගෙන යන්නේත් නැහැ. ඔහුගේ ආයතනයත් පසුගිය කාලයේ ගිනි තැබුවා. ඒක මම පිළිගන්නවා. ඒ අය යම් ස්ථාවරයක ඉඳලා ගිනි තැබුවා. මේවාට මට ඕනෑ නම් පිළිතුරු දෙන්නම්, නැත්නම් නොදී ඉන්නම්.

ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය මෙතැන මතු වුණේ නැත්නම් මට ලොකු ප්‍රශ්නයක්. මොකද, එතකොට වස් දොස් යන්නේ නැහැ. අඩු ගණනේ ප්‍රශ්නයක් මෙතැනට ආවාම වස් දොස් යන්න ඒ ගැන කියන්න ඕනෑ. මේ අය ගැන අපිත් කථා කරලා තිබෙනවා. මාධ්‍ය නිදහස ගැන මම සටන් කරලා තිබෙනවා. මම හිතනවා, මාධ්‍ය නිදහස ගැන කථා කරන්න මේ හුඟක් අයට වඩා මට අයිතියක් තිබෙනවාය කියා. අපි දශක ගණනාවක් තිස්සේ කථා කරලා තිබෙනවා. අපේ මාධ්‍ය ආයතන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවෙනුත් අරගෙන තිබෙනවා; එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙනුත් අරගෙන තිබෙනවා. ඒකේ වෙනසක් නැහැ. ඒක අතහැරියේ නැහැ. ඒවා කරගෙන යන්න.

මෙතැනදී විශේෂයෙන්ම කර්තෘවරු දැන ගන්න ඕනෑ, තමන්ගේ ස්ථාවරය මොකක්ද කියලා. එදා හැමදාම කඩේ ගියා. ඔය පත්තරෙන් තමයි ජාතිවාදය වැඩියෙන්ම මතු කළේ. මගෙන් අහන්න එපා, මෙතැන මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. අන්තිමට ඉල්ලා අස් වෙන්න කියලා මටත් කිව්වා. මොකද, මම ජාතිවාදියෙක් නොවන නිසා. ඒක කිව්ව පුද්ගලයාට මම කියන්නේ ඒක මිනිසුන් ප්‍රතික්ෂේප කළා නේ; ඉතින් ඔබතුමා ඉල්ලා අස්වෙන්න කියලයි. අපි මාධ්‍යය උස්සන්න යන්නෙත් නැහැ. මාධ්‍යයත් බලනවා නම් අපට තදින් පහර ගහන්න, අපටත් ඒ වාගේ පහර ගහන්න පුළුවන්. මොකක්ද, ස්ටැන්ලි බෝල්ඩ්වින් කිව්වේ, ඔහුට දේශපාලනයෙන් ඉවත් වෙන්න කියනකොට? ස්ටැන්ලි බෝල්ඩ්වින් එදා පුවත් පත් කර්තෘවෙදීන්ට කිව්වේ මොකක්ද? එතුමා කිව්වා, "This is the privilege of harlots." එතුමා එහෙම කිව්වේ බෙවර්බෲක්ට සහ රොතමියර්ටයි. ඔවුන් එදා හිටපු ප්‍රධානම පුවත් පත් අයිතිකරුවන්. පුවත් පතක් ගැහුවොත් අපිත් ගහන්න ඕනෑ. එදා අපෙන් අහනකොට, අපිත් අහනවා, දැන් කිව්වා නම් මොකක්ද, වෙන්නේ කියලා. ඒ නිසා වැරැද්ද පිළිගන්න. මට මේ කරුණු දෙන්නේ අපිත් එක්ක එකට සටන් කරපු පුවත් පත්වෙදීන්. වෙන කවුරුවත් නොවෙයි. ඒ නිසා මට නිකම් කථා කරලා මිනිසුන් තරහ කරගන්න අවශ්‍ය නැහැ. මම මේ වතාවේ මේ කාරණය මතු කළේ නැහැ. මම මේ වතාවේ මතු කළේ අපේ මන්ත්‍රීතුමන්ලා කිව්ව නිසයි. උස්සාගෙන යන්නේ නැත්නම් වචනයෙන් කිව්වාට කමක් නැහැ නේ. ඒ ගොල්ලනුත් ගහනවා නම් අපිත් ගහන්න ඕනෑ. නමුත් අන්තිමට රට දැන ගන්නවා කවුද, හරි තැන ඉන්නේ කියන එක.

මමත්, අතිගරු ජනාධිපතිතුමාත්, "දෙරණ" නාලිකාවේ ප්‍රශ්නය ගැන අවධානය යොමු කරලා තිබෙනවා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට සහ මට කවුරුවත් යවන්න ඕනෑකමක් නැහැ. එතුමාත් මම වාගේම කියන දේ ප්‍රසිද්ධියේ කියනවා. එතුමා ගිහින් ගිනි තියන්නේ නැහැ; කාටවත් යන්න කියන්නේත් නැහැ; ඔය විධියට ලියූ එක්කෙනෙක්වත් උස්සාගෙන යන්න කියලා කිව්වේ නැහැ; හමුදාව යොදවා ගෙනියන්න කිව්වේත් නැහැ; ගෙනිහින් කොහේ හරි තියලා මරන්න කිව්වේත් නැහැ. ඒ නිසා කථා කරන එක කියන එක වෙනම කාරණයක්. අපි ඔක්කෝම යහ පාලනයයි ඇති කළේ. අපි කවුරුවත් එතැනින් ඉවත් වෙන්නේ නැහැ. ඒ නිසා බය වෙන්න එපා.

[மு.ப. 10.34]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ தவிசாளர் அவர்களே, இன்று பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சின் நிதியொதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் பேசுவதற்கு அனுமதியைத் தந்தமைக்காக முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்று இந்த நாட்டிலே ஊடகத்துறை என்பது மிகவும் முக்கியமான ஒரு துறையாக இருக்கின்றது. ஊடகவியலாளர்கள் பக்கச்சார்பற்ற முறையில் சரியாகவும் நியாயமாகவும் இன, மத, வேறுபாடுகளுக்கு அப்பால் தகவல்களை வெளிப்படுத்தினால், அது இந்த நாட்டில் சமாதானம் முன்னகர்ந்துகொண்டு செல்வதற்கான ஓர் அறிகுறியாக விளங்கும்.

கடந்த காலங்களில் இந்த ஊடகத்துறைக்குப் பலதரப்பட்ட அச்சுறுத்தல்கள் ஏற்பட்டிருக்கின்றன. ஊடகவியலாளர்கள் பலர் படுகொலை செய்யப்பட்டனர், சிறையிலே அடைக்கப்பட்டனர், தாக்கப்பட்டனர். அத்தோடு, ஊடக நிறுவனங்களும் பல உடைக்கப்பட்டிருக்கின்றன. அந்த வகையிலே தமிழ் ஊடகவியலாளர்கள் 37பேர் இதுவரையில் படுகொலை செய்யப்பட்டிருக்கிறார்கள்; 87 பேர் தாக்கப்பட்டிருக்கிறார்கள்; 20 பேர் கைது செய்யப்பட்டிருக் கிறார்கள்; 5 ஊடக நிறுவனங்கள் தாக்கப்பட்டிருக்கின்றன. இந்த வகையிலே இந்த நாட்டில் எமது தமிழ் ஊடகவியலாளர்கள்தான் கூடுதலாகப் படுகொலை செய்யப்பட்டிருக்கிறார்கள். 3 சிங்களவர்கள், ஒரு முஸ்லிம் உட்பட மொத்தமாக 41பேர் கொல்லப்பட்டிருக்கிறார்கள். அதிலே முக்கியமாக நடேசன், சிவராம், செல்வராஜா நிமலராஜன், லசந்த விக்ரமதுங்க போன்றோரைக் குறிப்பிடலாம்.

இந்த ஊடக சுதந்திரமானது கடந்த அரசாங்க காலத்திலே மறைக்கப்பட்டிருந்தது; மறுக்கப்பட்டிருந்தது. பெரும்பாலான ஊடகங்கள் சிங்களவர்களையும் சர்வதேச சமூகத்தையும் ஏமாற்றும் முகமாகவே செயற்பட்டன. அவ்வாறான ஊடக நிறுவனங்களுக்குப் பரிசில்களும் வழங்கப்பட்டிருந்தன. ஆனால், இந்த நல்லாட்சியிலே ஊடக சுதந்திரமானது சரியான முறையில் பிரயோகிக்கப்படுவதற்கான ஓர் அத்தாட்சி இருக்கின்றது. இங்கு யாரும் தங்களது கருத்துக்களைச் சுதந்திரமாக வெளியிட முடியும்; தங்களது தேவைகளை வெளியிட முடியும். அப்படியொரு சுதந்திரம் இந்த நாட்டிலே இப்பொழுது இருக்கிறது. அதேவேளையில், இந்த உயரிய சபையின்மூலம் தகவல் அறியும் சட்டமூலமும் நிறைவேற்றப்பட்டிருக்கின்றது. ஊடகவியலாளர்கள் தங்களது செயற்பாடுகளை இன, மத வேறுபாடுகளற்று பக்கச்சார்பற்ற விதத்திலே மேற்கொள்கின்றபோதுதான் ஊடக சுதந்திரம் என்பது சரியான முறையில் பேணப்படும்; ஊடக தர்மமும் சரியான முறையிலே கைக்கொள்ளப்படும். அந்த வகையிலே இந்த நல்லாட்சி அரசு ஊடகவியலாளர்களுக்கு சகல விதமான வசதிகளையும் வழங்கியிருக்கின்றது.

ஆயினும், எமது மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு முக்கியமான ஒரு குறைபாடு காணப்படுகின்றது. SLBC - Sri Lanka Broadcasting Corporation என்ற நிறுவனத்தில் எமது மாவட்டத்தைச் சேர்ந்த தமிழ் ஊடகவியலாளர்கள் எவரும் உள்ளடக்கப்படவில்லை. அது மிகவும் மனவேதனைக்குரிய விடயமாக இருக்கின்றது. அதுபோல் அங்கு தமிழ் ஊடகவியலாளர்கள் இருக்கின்றபோதுதான் தமிழ் மக்கள் சம்பந்தப்பட்ட செய்திகளை வெளிப்படையாக

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

வெளியுலகிற்குக் கொண்டுவர முடியும். ஆனால், இவ்வாறான நிறுவனங்களிலே புறக்கணிப்புக்கள் நடக்கின்றன. அண்மையில்கூட பல நேர்முகப்பரீட்சைகள் நடத்தப்பட்டன. ஆனால், அதில் எமது தமிழ் ஊடகவியலாளர்கள் எவரும் தெரிவு செய்யப்படவில்லை. வடக்கு, கிழக்கிலே இருக்கின்ற ஊடகவியலாளர்கள் பலதரப்பட்ட பிரச்சினைகளை எதிர்நோக்கியவர்கள்; யுத்த காலத்திலே பலதரப்பட்ட அநீதிகளைச் சந்தித்தவர்கள்; பலதரப்பட்ட இழப்புக்களைச் சந்தித்தவர்கள். அவர்கள் வாழ்ந்த வீடுகளை, வாழ்வாதாரங்களை இழந்து நிர்க்கதியாக நிற்கின்றார்கள். எனவே, அந்த ஊடகவியலாளர்களுக்கு நிச்சயமாக அனைத்து வசதிகளும் செய்துகொடுக்கப்பட வேண்டும். அவர்கள் பொருளாதாரத்திலே மிகவும் பின்தங்கப்பட்டவர்களாகக் காணப்படுகின்றார்கள்.

அவர்களுக்குரிய motorbike வழங்கும் செயற்பாட்டை நீங்கள் தொடர்ந்து செய்யவேண்டும். அவர்களுக்கு மானிய அடிப்படையிலோ அல்லது அரைவாசி மானியமாகவும் அரைவாசி கடனாகவும் motorbike வழங்கும் செயற்பாட்டை மேற்கொள்ள வேண்டும். அந்தவகையிலே, கிழக்கு மாகாணத்திலே வாகனத்தினைப் பெறுவதில் கடுமையான நடைமுறைச் சிக்கல்கள் காணப்படுகின்றன. எனவே, அவற்றைத் தளர்த்தி நீங்கள் அவர்களுக்குரிய வாகன வசதியைச் செய்துகொடுக்கவேண்டும். அதுமட்டுமல்ல, 25 வருடங்களுக்கு மேற்பட்ட அனுபவமுடைய ஊடகவியலாளர் களுக்கு தீர்வைச் சலுகையுடனான வாகனக் கொள்வனவு வசதியை நீங்கள் பெற்றுக்கொடுக்க வேண்டும். மேலும், வீட்டுத்திட்டங்கள் போன்ற வசதிகளையும் அவர்களுக்குச் செய்துகொடுத்தால், மிகவும் மோசமாகக் காணப்படுகின்ற அவர்களின் பொருளாதார நிலைமை முன்னேற்றமடையும். வீட்டுத்திட்ட வசதிகளை இலங்கையிலிருக்கின்ற அனைத்து ஊடகவியலாளர்களுக்கும் நீங்கள் செய்துகொடுக்க வேண்டும். இவ்வாறு செய்துகொடுக்கின்றபோதுதான் அவர்கள் சரியான துல்லியமான தகவல்களை, பக்கச்சார்பற்ற நியாயமான செய்திகளை வெளியிடுவதற்குரிய சந்தர்ப்பம் உருவாகும்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have three more minutes.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
மேலும், கிழக்கு மாகாணத்திலே ஊடகம் சம்பந்தமான கருத்தரங்குகளை வைத்து ஊடகவியலாளர்களை ஊக்குவிக்கின்ற நடவடிக்கைகளை நீங்கள் மேற்கொள்ள வேண்டும். அந்தவகையில், அங்கு அரசாங்க தகவல் திணைக்களமானது எந்தவொரு கருத்தரங்கையும் நடத்தவில்லையென்று நான் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். மேலும், நாட்டிலே நடைபெறுகின்ற ஒவ்வொரு அபிவிருத்தித் திட்டங்கள் தொடர்பிலும் மாவட்ட ரீதியாக ஊடகவியலாளர்கள் அனைவரையும் அழைத்து ஒரு சந்திப்பை நடத்தவேண்டும். ஒரு மாவட்டத்திலே என்ன நடக்கின்றதென்பதை வெளிப்படையாகத் தெரியப்படுத் தவேண்டும். அவ்வாறு தெரியப்படுத்துகின்றபோதுதான் உண்மைத் தகவல் மக்களுக்குச் சென்றடையக்கூடிய நல்ல நிலைமை காணப்படும். அதனால், இந்த 'நல்லாட்சி' அரசாங்கமானது செயற்படுத்திக்கொண்டிருக்கின்ற அபிவிருத்தித் திட்டங்களைத் துரிதப்படுத்துவதோடு, ஊடகவியலாளர்களுக்கான அனைத்து வசதிகளையும் செய்துகொடுக்கும் என்ற நம்பிக்கையுடன் எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

[පූ.භා. 10.42]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)
ගරු සභාපතිතුමනි, ඉතාම සීමිත කාලයක් තුළයි මට කථා කරන්න සිදුවී තිබෙන්නේ. එම නිසා කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මා ප්‍රථමයෙන්ම කියන්න කැමැතියි, අතිගරු ජනාධිපතිතුමා ජනාධිපති වෙනකොට, ගරු අගමැතිතුමා අගමැති වෙනකොට, මම ජනමාධ්‍ය ඇමතිකම භාරගන්න කොට අපේ රටේ ජනමාධ්‍ය නිදහස සම්බන්ධව මේ රට තුළ තිබුණේ බොහොම ලොකු කළු පැල්ලකමක්. අද සමහරු ඒවා අමතක කරලා කථා කරන්න උත්සාහ කරන හැටි අපි නොයෙක් අවස්ථාවල දකිනවා. නමුත් 2006 ජනවාරි සිට 2015 ජනවාරි කාලය ඇතුළත පමණක් අපේ රටේ ජනමාධ්‍යවේදීන් 13දෙනෙක් ඝාතනය වුණු බව අපට අමතක නැහැ. මාධ්‍යවේදීන්ට පහරදීම් 87ක් වාර්තා වුණා. බොරු චෝදනා ඉදිරිපත් කරලා මාධ්‍යවේදීන් 20දෙනෙකුට වැඩි පිරිසක් අත් අඩංගුවට ගත්තා. මාධ්‍ය ආයතන 4කට පස්වතාවක් පහර දුන්නා, ගිනි බත් කළා. ඒ කාලයේ තමයි ප්‍රගීත් එක්නැලිගොඩලා අතුරුදහන් වුණේ. ජීවිත තර්ජන නිසා තමන්ගේ ජීවිතය බේරාගන්න මාධ්‍යවේදීන් 80දෙනෙකුට වැඩි පිරිසකට රට හැරයන්න සිද්ධ වුණා. නමුත් අගමැතිතුමා කිව්වා වගේ අද අපේ යහපාලන ආණ්ඩුව යටතේ ඒ සියල්ලෙන්ම මාධ්‍ය නිදහස් කරගෙන තිබෙනවාය කියන එක මට භය නැතුව ප්‍රකාශ කරන්න පුළුවන්. තව අවුරුදු ගණනක් ගියාට පසුව වුණත් එවැනි දෙයක් ගැන ඇඟිල්ල දිගු කරලා කියන්න පුළුවන්කමක් නැහැ. කොහේ හරි මතයක් ප්‍රකාශ කරපු එකක් ගැන අහන්න පුළුවන්, එහෙම නැත්නම් පැහැදිලි කර ගැනීමක් සඳහා යවපු ලිපියක් ගැන අහන්න පුළුවන්. අපේ ආණ්ඩුව කාලය තුළ සිදු වූ එවැනි දෙයක් ගැන මිස කිසිම පහරදීමක් හෝ වෙනත් කිසිම දෙයක් ගැන අහන්න පුළුවන්කමක් නැති එක ගැන මා සතුටු වෙනවා.

ගරු සභාපතිතුමනි, "Reporters Without Borders" කියන දේශ සීමා රහිත මාධ්‍යවේදීන් මඟින් වාර්ෂිකව නිකුත් කරන "World Press Freedom Index - 2016" වාර්තාව දිහා බලන්න. අපේ රට, මාධ්‍ය නිදහස පැත්තෙන් රටවල් 180ක් අතරින් දැන් 141වැනි තැනට පත්වෙලා තිබෙනවා. 2014දී අපි හිටියේ 165වැනි තැනයි. එදා දකුණු ආසියානු කලාපයේ අවම මාධ්‍ය නිදහස තිබුණු රට වුණේ අපේ රටයි. නමුත්, මේ කෙටි කාලය තුළ රටවල් 24ක් අභිභවා මාධ්‍ය නිදහස පැත්තෙන් අපි ඉදිරියට ගිහින් තිබෙනවා. මාධ්‍ය මර්දනය නැති කරලා, මාධ්‍ය නිදහස ඇති කළ නිසයි අපේ ඒ ඉහළට යෑම සිදු වුණේ. අපි ඉදිරියේදී ඇති කරන ප්‍රතිපත්ති සම්පාදන යෝජනා ක්‍රියාත්මක කළාම අපට ඒ දර්ශකයේ තව තවත් ඉදිරියට යන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ ඇත්ත වශයෙන්ම මා කියන්න කැමැතියි, අපට පසු ගිය කාලයේදී

ඔබතුමාගේ සිහිනයක් සැබෑ කරන්න පුළුවන් වුණු බව. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත කියන්නේ ඔබතුමා තුළ තිබූ සිහිනයක්. ඔබතුමා අවස්ථා ගණනාවකදී ඒ සඳහා උත්සාහ කළා. ගරු සභාපතිතුමනි, ලෝකයේ හත්වන හොඳම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරලා කාගේත් සහයෝගයෙන් අපි එය සම්මත කර ගත් බව මා මතක් කරන්න කැමැතියි. එම ඓතිහාසික පනත ක්‍රියාත්මක කිරීමේ අභියෝගය මාගේ අමාත්‍යාංශය භාරගෙන තිබෙනවා. අපි දැනටමත් තොරතුරු නිලධාරීන් හඳුනාගෙන පුහුණු කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. පෙබරවාරි මාසයේ හතරවන දා වන විට අපට ඒ කටයුත්ත යථාර්ථයක් බවට පත් කරන්නට පුළුවන් කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා වාගේම යහ පාලන රජයේ නිල මුද්‍රාව තමයි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත කියලා මම කියන්න කැමැතියි. රජයක් හැටියට අපි උසස් මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීමත්, මාධ්‍ය නිදහස තහවුරු කිරීමත් වචනයෙන් විතරක් නොවෙයි, ක්‍රියාවෙන්ම ඔප්පු කරනවා කියන එක මා කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවේ අවසාන කොටසේදී එතුමා මාධ්‍යවේදීන්ගේ වැටුප් ගැන සඳහන් කළා. අපි ඒ ගැන දැනටමත් අවධානය යොමු කර තිබෙනවා. මාධ්‍යවේදීන්ට අවම වැටුපක් සහිත සුභසාධන ක්‍රම ඇති කිරීම නීතියේ මාර්ගයෙන්ම කරන්න පුළුවන් ක්‍රම ගැන අපි අධ්‍යයනය කරනවා. විශේෂයෙන්ම අපේ අල්ලපු රට වන ඉන්දියාවෙන් අපි ආදර්ශ ගන්නවා. ඉන්දියාව එවැනි පනත් කෙටුම්පත් සම්මත කරගෙන තිබෙනවා. මාධ්‍යවේදීන්ට අවම වැටුපක් සහිත, සුභසාධන කටයුතු ක්‍රියාත්මක කරන්න පුළුවන් පනත් කෙටුම්පත් ඉදිරි කාලයේදී මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, පසු ගිය සතියේ මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, ස්වාධීන මාධ්‍ය නියාමන කොමිසමක් ඇති කිරීම සඳහා සමාජ කතිකාවතක් සම්බන්ධයෙන්. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් ඉතාමත් කැමැත්තෙන් ඒක අනුමත කළා. ගරු සභාපතිතුමනි, ඉන් අපි අදහස් කරන්නේ මාධ්‍යවේදීන්ගේ නිදහස තවදුරටත් තහවුරු කරන්නයි. උසස් ප්‍රමිතියකින් යුතු ගුණාත්මක ප්‍රවෘත්ති ජනතාවට ලබා දෙන්න අපි ඒ තුළින් උත්සාහ කරනවා. ශීලාචාර, ආචාර ධර්ම සුරකින මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීමට තමයි අපි මේ ස්වාධීන කොමිෂන් සභාව ඇති කරන්න බලාපොරොත්තු වෙන්නේ. හැම තිස්සේම මුව හමට තළනවා වාගේ මාධ්‍යයට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. කාට හෝ අසාධාරණයක් වුණාම ඒ ගැන පැමිණිලි කරන්න තැනක් තිබෙන්න ඕනෑ. සාධාරණය ඉටු කරගන්න පුළුවන් වටපිටාවක් ඇති කිරීම අපේ බලාපොරොත්තුවයි කියන එක මා කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අපි රජයක් හැටියට මේ කිසිවක් බලෙන් පටවන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ ගැන සියලු දෙනාගේම අදහස්, යෝජනා, මතවාද යන සියල්ලම සැලකිල්ලට ගෙන තමයි අපි එය කෙටුම්පත් කරන්නේ. දෙසැම්බර් මාසයේ 31වනදා දක්වා අපි ඒ පිළිබඳව ජනතාවට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. අපි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත ගෙනාවේත් එහෙමයි, ගරු සභාපතිතුමනි.

අපි මහා සංඝ රත්නය ඇතුළු සියලුම ආගමික නායකයන්ට, විද්වතුන්ට, මාධ්‍ය ආයතන හිමිකරුවන්ට, මාධ්‍ය සංවිධානවලට හා මේ රටේ සාමාන්‍ය ජනතාවට මේ ගැන තමන්ගේ අදහස් ලබා දෙන්න අවස්ථාවක් දෙනවා. ඊට පස්සේ තමයි අපි එය කෙටුම්පත් කරන්නේ. ගරු සභාපතිතුමනි, අපි හැම විටම රජයක් විධියට පිළිගන්නවා, යහපත් මාධ්‍ය කර්මාන්තයක් ඇති කරනවා වාගේම මාධ්‍ය වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් කියලා.

දැන්වීම් කර්මාන්තය සහ වැඩසටහන්වල ගුණාත්මකභාවය කියන කාරණය එකකට එකක් බද්ධ වෙලා කියලායි මම නම් විශ්වාස කරන්නේ. අපි දන්නවා මේවා තීරණය කරන්නේ වැඩසටහන් ශ්‍රේණිගත -rating - කරන ක්‍රියාදාමය මත බව. දැනට ක්‍රියාත්මක වන rating system එකේ තිබෙන යම් යම් අඩු පාඩු ගැන බොහෝ දෙනෙක් කථා කරනවා. එම නිසා ඒ ගැන අධ්‍යයනය කරලා වාර්තා කිරීමට ආචාර්යවරු, මහාචාර්යවරු, ඒ වාගේම වෘත්තිකයන්ගෙන් සමන්විත කමිටුවක් මම පත් කළා. එම කමිටුවට මම උපදෙස් දුන්නා, මාධ්‍ය ආයතන, දැන්වීම් ආයතන, ශ්‍රේණිගත කරන ආයතන කියන අදාළ සියලු පාර්ශ්ව ගෙනැල්ලා කථා කරලා තමයි මේ වාර්තාව අපට දෙන්න ඕනෑ කියලා. දැනට මාස 4ක් තිස්සේ ඔවුන් අදහස් ලබා ගෙන මේක වඩාත් විද්‍යාත්මකව සහ විධිමත් ක්‍රමයකට කරන්න පුළුවන් නිර්දේශ සහිත වාර්තාවක් මට ලබා දීලා තිබෙනවා. අදාළ සියලු පාර්ශ්වවලට එම වාර්තාව අධ්‍යයනය කිරීමට යම් කාල සීමාවක් දීලා මම බලාපොරොත්තු වනවා, ඒ සියලුදෙනාගේම නිර්දේශ මත යමක් කරන්න පුළුවන්ද කියලා බලා කටයුතු කරන්න.

ගරු සභාපතිතුමනි, මාධ්‍ය ආයතන අතර තරගකාරීත්වයක් අවශ්‍යයි. හැබැයි, එය ගුණාත්මක වැඩසටහන්වලින් සහ නිවැරදි තොරතුරු මත පදනම් කරගත් තරගයක් විය යුතුයි කියලායි අපි කල්පනා කරන්නේ. නමුත් අවාසනාවකට ගරු සභාපතිතුමනි, අද බොහෝ විට මාධ්‍ය තුළ අපට දකින්න ලැබෙන්නේ වාණිජ න්‍යාය පත්‍ර හෝ දේශපාලන න්‍යාය පත්‍රවලට කොටු වුණු බලු පොරයක් වාගේ තරගයක්. හැම විටම මාධ්‍යයක න්‍යාය පත්‍රය විය යුත්තේ, මහජන ශුභ සිද්ධිය කියලායි මම විශ්වාස කරන්නේ. Public interest තමයි න්‍යාය පත්‍රය විය යුත්තේ. අපි එතැනට මාධ්‍ය තල්ලු කිරීමට රජයක් හැටියට දිය හැකි උපරිම සහයෝගය ලබා දීමට ඉදිරියේදීත් බලාපොරොත්තු වනවා කියලා මම මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අපේ මාධ්‍යවේදීන්ට ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවක් ලබා ගන්නට පුළුවන් විධියේ ජාත්‍යන්තර මට්ටමේ මාධ්‍ය ඇකඩමියක් ඇති කිරීම කෙරෙහි අපේ අවධානය දැන් යොමු කර තිබෙනවා. ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ ආශීර්වාදය අපට ඒකට ලැබෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු දැන් ක්‍රියාත්මක කරන්න ආරම්භ කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි 3ක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරු කීපදෙනෙක් අද ඇවිත් නැහැ. ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට වෙන් වූ කාලයත් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එතුමාගේ වෙලාවත් ඇතුළත්ව. ඕනෑ නම් දිවා ආහාරයෙන් පසුව නැති වූ කාලය cover කර ගන්න පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු සභාපතිතුමනි, එහෙම හෝ ගනිමු.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හැබැයි, සභාවේ එකඟත්වය අනුව.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි එකඟයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මම ඉතා ඉක්මනින් මේ ටික කියන්නට බලාපොරොත්තු වෙනවා. මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ අය වැයෙන් අපට රුපියල් මිලියන 50ක් අමරදේව සංගීත අසපුව සඳහා වෙන් කර තිබෙනවා. හෙළයේ මහා ගාන්ධර්වයාණන් වන පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව මැතිතුමාගේ අවසාන උපන් දිනය දවසේ මම එතුමා මුණ ගැහෙන්න ගියාම එතුමා අභිසංක ඉල්ලීමක් ඉදිරිපත් කළා. "මම බොහෝ දෙනෙකුට කිව්වත් කෙරුණේ නැහැ. ඔබතුමන්ලා ගැන අපට විශ්වාසයක් තිබෙනවා. මගෙන් පසුව මතු පරපුරේ යහපත වෙනුවෙන් ඩබ්ලිව්.ඩී. අමරදේව සංගීත අසපුවක් ඇති කරන්නට ක්‍රියා කරන්න"ය කියන එක තමයි එතුමාගේ ඉල්ලීම වුණේ. ජනාධිපති තුමා, අගමැතිතුමා ඒකට පූර්ණ ආශීර්වාදය පළ කළා. දැන් අපේ ජනාධිපතිතුමා කියා තිබෙනවා, එතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් තියලා අදාළ ඉඩම තීරණය කරමුය කියා. අපට මුදල් වෙන් වෙලා තිබෙනවා. අපි ඒ කටයුත්ත ඉතා ඉක්මනින් ආරම්භ කරලා, එතුමාගේ නමින් අපි ඒක ජාතියට දායාද කරනවා.

කාලය හරස් වුණත් ගරු සභාපතිතුමනි, අපේ ආයතන ගැන වචනයක් දෙකක් කියන්න අවස්ථාව උදා කර ගත යුතුව තිබෙනවා. දේශීය කලාකරුවන්ගේ උන්නතිය වෙනුවෙන් අප හැම විටම පෙනී සිටිනවා. ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් විදේශ ටෙලි නාට්‍ය සඳහා අය කරන රුපියල් 90,000ක බද්ද රුපියල් 300,000 දක්වා වැඩි කරන්නට මුදල් ඇමතිතුමා ක්‍රියා කර තිබෙනවා. ඒක දේශීය ටෙලි නාට්‍යකරුවන්ගේ විශේෂ ඉල්ලීමක් හැටියට කාලයක් තිස්සේ තිබුණා. අද මේ අය වැයෙන් ඒක ඉෂ්ට කරන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. පසුගිය රජය කාලයේදී සිනමා ශාලා ඩිජිටල් කිරීම කථාවට පමණක් සීමා වෙලා තිබුණා. නොයෙක් අවස්ථාවල ඒ ගොල්ලන් ගෙන්වනවා, කියනවා, කරනවාය කිව්වත් අන්තිමට කළේ නැහැ. ඒක අත්‍යවශ්‍ය කාරණයක් බව අපි වටහා ගත්තා. නමුත් දැන් අපි ඒක යථාර්ථයක් කරන්න කටයුතු කරනවා. ලබන ජනවාරි 1 වැනි දා සිට දිවයිනේ සෑම සිනමා ශාලාවකටම 2K තාක්ෂණය යටතේ ඩිජිටල් ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මිල දී ගැනීමට හැකි වන ක්‍රමවේදයක් අපි සකස් කළා. අපේ චිත්‍රපට සංස්ථාවේ සභාපතිතුමා ඒකට අවශ්‍ය ගැසට් නිවේදනය අත්සන් කර තිබෙනවා. ජනවාරි මාසයෙන් පසුව ඒක කරන බව මම ඉතා සතුටින් කියනවා. බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා ඒ ගැන බොහොම සතුටු වන බව මම අවංකවම දන්නවා.

ජනාධිපති සම්මාන උළෙල අවුරුදු 10කින් පවත්වන්න තමුන්නාන්සේලාට බැරි වුණා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමනි, විනාඩි 11 නම් අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
තව විනාඩි 5ක් ඇතුළත අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

තව මාස තුනක් ඇතුළත ලබන අවුරුද්දදේ අපි ජනාධිපති සම්මාන උළෙල පවත්වන්නට බලාපොරොත්තු වෙනවා. සිනමා ශාලා ඩිජිටල් කරනවා වාගේම මෙවර අය වැයෙන් සිනමා පාසලක් ඇති කරන්නට මිලියන 50ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම චිත්‍රපට සංරක්ෂණයට මිලියන 50ක් වෙන් කර තිබෙනවා. ඉදිරියේදී අපි ඒ කටයුතු කරනවා. ලෙස්ටර් ජේම්ස් පීරිස් ශූරීන් වැනි කලාකරුවන්, ඒ වාගේම සිය සිනමා දිවියේ 50 වන වසර සමරන්නට සූදානම් වන අපේ ප්‍රවීණ නිළි ස්වර්ණා මල්ලවාරච්චි මහත්මිය වෙනුවෙන් ඉදිරියේදී උපහාර උත්සව පවත්වන්නට කටයුතු කරනවා. ගරු කථානායකතුමාත් සහභාගි වෙලා අපට උදවු කළා වාගේම ලතා වල්පොල, සී.ටී. ප්‍රනාන්දු, අයිවෝ ඩෙනිස් වැනි ප්‍රවීණ කලාකරුවන් ඇගයෙන ප්‍රසංග විටින් විට පවත්වනවා.

ඊළඟට "ලේක් හවුස්" ආයතනය ගැනත් යමක් කියන්න ඕනෑ. අවුරුදු 8කට පසුව සරසවි සම්මාන උළෙල ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, අපි දෙසැම්බර් 15 වැනි දා පවත්වන්නට සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ සඳහා අපි ඔබතුමාටත් ආරාධනා කරනවා.

අපි "ලේක්හවුස්" ආයතනය භාර ගන්නකොට, රුපියල් මිලියන 800 ගණනක ණයබරක් සමඟයි භාර ගත්තේ. වත්මන් පාලනය යටතේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය සමත් වෙලා තිබෙනවා, එය මිලියන 300 දක්වා අඩු කර ගන්නට. ණයබර අඩු කර ගත්තා වාගේම දැන් වෙනකොට එම ආයතනය මිලියන 150ක ලාභ ලබන තත්ත්වයටත් පත්වී තිබෙනවා. මේ වසර අවසානයේදී එය රුපියල් මිලියන 200 දක්වා වර්ධනය කර ගන්නත් අපේක්ෂා කරනවා. "ලේක්හවුස්" ආයතනය දේශපාලන මඩ ගොහොරුවක් බවට පත් කරලායි තිබුණේ. නමුත් මේවා සමබර කරපු නිසා දැන් පත්තර අළෙවියත් සියයට 10කින් වැඩි වෙලා තිබෙනවා. පසුගිය පාලන කාලය තුළදී "ලේක්හවුස්" ආයතනය නිතරම අපහාස නඩුවලට වන්දි ගෙවීම් ගැන තමයි අවධානය යොමු කළේ. එම ආයතනයට නීතිඥයෝ වෙනුවෙන් මුදල් වියදම් කරන්න වුණා. වන්දි හැටියට රුපියල් බිලියන 1.5ක් ඉල්ලා තිබුණා. නමුත් මම කියන්න කැමැතියි, අපේ පාලනයේ තිබෙන "යහ පාලනය" නිසා අපි මෙම ආයතනයේ පාලනය භාර ගත්තාට පසුව එකම අපහාස නඩුවක්වත් "ලේක්හවුස්" එකට වැටී නැහැ කියන එක. මම ඒකත් මතක් කරන්න ඕනෑ. සේවක වැටුප් පවා රුපියල් 3,500කින් වැඩි කර මූලික වැටුපට එකතු කළා. ලබන අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඳලා තවත් රුපියල් 300ක් මූලික වැටුපට එකතු වෙනවා. "දිනමිණ", "ඩේලි නිවුස්", "ද සන්ඩේ ඔබ්සර්වර්" කියන පත්තරවල සියලුම පිටු වර්ණ ගන්වා, ඒවාට අදාළව අලුතින් ඊ-මේල් පද්ධතියක් පවා ඇති කර තිබෙනවා.

මේ විධියේම තවත් දේශපාලන මඩ ගොහොරුවක් තිබුණා. ඒ තමයි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව. 2015 වර්ෂයේදී අපි එම සංස්ථාව භාර ගත්තේ, රුපියල් මිලියන 374ක පාඩුවක් සමඟයි. 2016 වර්ෂය වෙනකොට බොහොම අමාරුවෙන් එම ප්‍රමාණය

මිලියන 102 දක්වා අඩු කරගෙන තිබෙනවා. රජයේ සේවකයින්ට රුපියල් 10,000කින් කළ වැටුප් වැඩි කිරීම රූපවාහිනී සංස්ථාවේ සේවකයින්ටත් එලෙසම සිදු කළා. එහෙම නොගෙව්වා නම් මෙලහකටත් රූපවාහිනී සංස්ථාව ලාභ ලබනවා කියා මම කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, රූපවාහිනී සංස්ථාවේ ලයිට් බිල මාසයකට මිලියන 10ක් වෙනවා. මේ වනවිට විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙලා රූපවාහිනී සංස්ථාව තුළ සූර්ය බලශක්තියෙන් විදුලිය නිපදවීමටත්, ආසියාවේ ප්‍රථම හරිත මාධ්‍ය ආයතනය බවට එය පත් කිරීමටත් අවශ්‍ය කටයුතු කරගෙන යනවා. එවිට green media institute එකක් බවට රූපවාහිනිය පත් වෙයි. ජනවාරි 08 වැනි දා, ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය වෙනුවෙන් එහි ශිවිසුම් අත්සන් කරන්න බලාපොරොත්තු වෙනවා. රූපවාහිනී වැඩසටහන් සම්බර කර ගුණාත්මකභාවය ඉදිරියට ගත් නිසා රූපවාහිනියට සම්මාන ගණනාවක් ලැබී තිබෙනවා. රූපවාහිනී සංස්ථාව, මෑතකදී පැවැති සුමති ටෙලි සම්මාන උළෙලේදී සම්මාන 12ක් ලබා ගත්තා; රයිගම් ටෙලි සම්මාන උළෙලේදී සම්මාන 15ක් ලබා ගත්තා. මම මෙම අමාත්‍යාංශයේ ඇමතිවරයා විධියට පත් වුණාට පසුව මම ඉදිරිපත් කරපු පළමුවැනි කැබිනට් පත්‍රිකාව තමයි, රූපවාහිනී සංස්ථාවට නැවත ක්‍රිකට් විකාශනය ලබා දීමේ කැබිනට් පත්‍රිකාව. එය රූපවාහිනී සංස්ථාව ලැබූ ලොකු ජයග්‍රහණයක් කියා මම විශ්වාස කරනවා.

අපේ ජනාධිපතිතුමා සහ අගමැතිතුමා නිතරම ජාතික සංහිඳියාව වෙනුවෙන් පෙනී සිටිනවා. උතුරේ මන්ත්‍රීවරයෙක් දැන් ඒ පිළිබඳව කථා කළා. අපි පසු ගිය දවසක උතුරු-දකුණ යා කරන සංහිඳියාවේ චාරිකාවක් සඳහා යාපනයට ගියා. අවුරුදු ගණනාවකට පසු ජනමාධ්‍ය ඇමතිවරයෙක් යාපනයට පැමිණියා කියා ඔවුන් උණුසුම් විධියට අප පිළිගත්තා. දේශපාලන නායකයන්, ආගමික නායකයන් හමු වන්න විතරක් නොවෙයි, යාපනයේ සෑම මාධ්‍ය ආයතනයකටමත් අපි දෙදෙනා -නියෝජ්‍ය ඇමතිතුමාත්, මමත්- ගියා. ඒ සංචාරය නිසා ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ආරක්ෂක අංශ සමඟ විශේෂ සාකච්ඡාවන් සඳහා පවා නිරන්තරයෙන් සම්බන්ධ කරන්නට අපට හැකියාවක් ලැබුණා. සියයට 25ක් පමණ වූ අපේ රටේ දෙමළ කථා කරන ජනතාව වෙනුවෙන් සංහිඳියාවේ නාලිකාව ලෙස "නේත්‍රා" නමින් දවස පුරා විකාශනය කෙරෙන වෙනම නාලිකාවක් ආරම්භ කිරීමට අපේ අවධානය යොමු කර තිබෙනවා. ඊට අවශ්‍ය සංඛ්‍යාත ජනාධිපතිතුමා විසින් ලබාදී තිබෙනවා. ඊට අවශ්‍ය කරන උපකරණ මිලට ගැනීමට රුපියල් මිලියන 180ක් මනෝ ගනේෂන් ඇමතිතුමාගේ අමාත්‍යාංශයට වෙන්කළා. 2017 ජනවාරි 8වැනි දා ගිවිසුම් අත්සන් කරලා අපි ඒ මුදල් ලබා ගන්නවා. මේ සංහිඳියාවේ නාලිකාව -"නේත්‍රා" නාලිකාව- ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් දවස පුරා විකාශය කරන්න අපි ක්‍රියා කරනවා.

අපි බලයට පත්වනකොට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේත්, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේත් ටෙලි නාට්‍ය ප්‍රදර්ශනය කර ගැනීමට අල්ලස්දීම් හා අනෙකුත් අශීලාචාර ක්‍රම තිබුණු බව තමුන්නාන්සේලා අපි කාටත් රහසක් නොවෙයි. අපි ඒක සම්පූර්ණයෙන්ම නැති කර තිබෙනවා. දැන් ලැබෙන පිළිවෙළට, විනිවිද ක්‍රමයට, ලකුණු ක්‍රමවලට බලපෑම්වලින් තොරව ස්වාධීන විද්වත් මණ්ඩලයක් තමයි මේවා තීරණය කරන්නේ. ITN එක පවුලේ නාලිකාව ලෙසයි හඳුන්වන්නේ. නමුත් පසු ගිය කාලයේ නම් එක පවුලක නාලිකාවක් බවට ඒක පත්වෙලායි තිබුණේ. නමුත් දැන් සම්බර, ගුණාත්මක, උසස් වැඩසටහන් විකාශය කරනවා. පක්ෂ විපක්ෂ කාටත් ඒවායේ දොරටු විවෘත කර තිබෙනවා. රුපියල් මිලියන 200ක වියදමින් වර්ග අඩි 2,500ක ප්‍රමාණයේ HD මැදිරියක් ඉදිකරලා දැන් භාවිතයට ගන්නවා. රුපියල් මිලියන 175ක් වැය කරලා HDTV cameras 8කින් සමන්විත OB bus එකක් භාවිතයට ගන්නවා. මෙවැනි OB bus එකක් තිබෙන එකම තැනත් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයයි. ලක් හඬ ගුවන්විදුලිය ITN එකට බරවා කකුලක් වාගේ වෙලා තිබුණා. ලක් හඬ ගුවන්විදුලිය ප්‍රතිව්‍යුහගත කරන්න -relaunch කරන්න- 14 වතාවක් උත්සාහ කරලා බැලුවා. ඒත් හරි ගියේ නැහැ. හැබැයි අපි ITN TV, ITN News, ITN FM, ITN Website මේ සියල්ලම එකම ආයතනයක් යටතට ගෙනැවිත් පරිපාලන වියදම් අඩු කරලා තිබෙනවා. දැන් ඒක සාර්ථක වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙමින් පවතිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න, මා අවසන් කරන්නම්.

අපි සමාජ සත්කාර සේවා කරනවා, ගෙවල් ගණනාවක් හැදුවා, තැලසීමියා රෝගයෙන් පෙළුණු ගම්පහ පවුලකට ගෙයක් ලබා දුන්නා. පසු ගිය කාලයේ පොළොන්නරුවේ අලි ප්‍රහාරය වාර්තා කරන්න ගිය මාධ්‍යවේදියා ඝාතනය වුණා. ඔහු වෙනුවෙන් ගෙයක් හදලා තිබෙනවා. ලබන මාසයේදී ජනාධිපතිතුමා අතින් ඒ ගෙය විවෘත කරනවා.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ගත්තාම, "රට යන අත" වැඩසටහනින් උදේ පටන් ගත්තාම දේශපාලන වශයෙන් අශික්ෂිත වැඩසටහන් තමයි මුළු දවසේම විකාශය වුණේ. සෝභිත හාමුදුරුවෝ අපවත් වෙන්න ඉස්සෙල්ලා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වෙනස ගැන ප්‍රසාදයෙන් කථා කරපු හැටි මට මතක් වෙනවා. රාවය පුවත් පතේ කතුවැකියකිනුත් ඒ ගැන අගය කරලා ලියා තිබුණා. කොත්මලේ ප්‍රජා ගුවන්විදුලි මධ්‍යස්ථානය ආශ්‍රිතව SLBC මාධ්‍ය ඇකඩමියක් අපි ආරම්භ කළා. මේ කෙටි කාලය ඇතුළතදී මාධ්‍යවේදීන් 100ක් පුහුණු කරලා තිබෙනවා.

අවසාන වශයෙන් මා කියන්න ඕනෑ, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේත්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේත් අද විශාල පරිවර්තනයක් සිදුවෙලා තිබෙන බව. අපි බලයට පත්වනකොට ඉවතලන කඩදාසි විකුණන්න කිසිම ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඒවා එක එක්කෙනා ගත්තා. සල්ලි කීයක්වත් ලැබුණේ නැහැ. මා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ඒ කඩදාසි ටෙන්ඩර් ක්‍රමයට දෙන්න කටයුතු කළා. 2015 වර්ෂයේ රුපියල් මිලියන 20කුත්, 2016 රුපියල් මිලියන 11කුත් ඒ තුළින් ලබාගෙන, ඒ මුදලින් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ සේවකයින්ට රුපියල් 10,000ක bonus එකකුත් දුන්නා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම රුපියල් මිලියන 800ක පමණ ණයක් තිබිලා, එය රුපියල් මිලියන 500 දක්වා අඩු කර ගන්නත් වර්තමාන පාලනය සමත් වෙලා තිබෙනවා. මේවා ගැන කියන්න මට කාල වේලාව මදියි. ජාතික ලොතරැයි මණ්ඩලය එක්ක කථා කරලා, කාර්යක්ෂමව ලොතරැයි මුද්‍රණය කිරීම සඳහා අලුත් මුද්‍රණ යන්ත්‍රයක් ගෙන්වනවා. පසු ගිය කාලයේ ශතයක්වත් නොලැබුණු, ඉවතලන කඩදාසිවලින් රජයේ මුද්‍රණාලය දැනට රුපියල් මිලියන 17ක් අමතරව උපයා ගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මා ඉතාමත් ස්තුතිවන්ත වනවා, මේ කෙටි කාලය තුළ මට මේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබාදීම ගැන.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මේ වසර තුළ ක්‍රියා කරද්දී මගේ නියෝජ්‍ය ඇමතිතුමා සෙවණැල්ල වාගේ සිටිමින් අපේ අමාත්‍යාංශයට විශාල ආදර්ශයක් ලබා දුන්නා. ඇමතිවරයා සහ නියෝජ්‍ය ඇමතිවරයා බයිසිකලයේ ටයර් දෙක වාගේ එකට ගමන් කරන බව අපි හැම තිස්සේම ඔප්පු කරනවා. මගේ ලේකම්තුමා, අතිරේක ලේකම්වරු, අපේ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සියලුමදෙනා, ඒ වාගේම ආයතන ප්‍රධානීන්, ඉහළ නිලධාරියාගේ පටන් සුළු සේවකයා - කාර්යාල කාර්ය සහායකයා- දක්වා, රියැදුරු මහත්මයා දක්වා අප සියලුදෙනාම ඉතාම මිත්‍රශීලීව, ඉතාම ආදර්ශවත් විධියටයි මේ කටයුතු කර ගෙන යන්නේ. අප සියලු දෙනාම එකතු වෙලායි, මේ අමාත්‍යාංශය දියුණුවට පත් කරන්නේ කියන එක ප්‍රකාශ කරනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ උදව්යටත් මගේ ස්තුතිය පුද කරමින්, මට මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට යළි-යළිත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු නිරෝෂන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමා - නැත.
ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා - නැත.
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.01]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු සභාපතිතුමනි, අද දවසේ විවාදය ආරම්භ කරන වේලාවේ පළමුවෙන්ම, අපේ ජීවිත කාලය තුළ මිහි මත විසූ පරමාදර්ශී නායකයකු වන; මානව හිතවාදියකු වන, කියුබානු හිටපු ජනාධිපති ෆිදෙල් කස්ත්‍රෝ මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් මා සිත තුළ මතු වන කනගාටුව, වේදනාව ප්‍රකාශ කරන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ අවස්ථාවේදී සිහිපත් කරන්නටම ඕනෑ. ඒකාබද්ධ විපක්ෂය විධියට දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, පුළුවන් නම්, සියලුම පක්ෂවලට සහභාගිවීමට හැකි වන ආකාරයට පැයක විතර ශෝක -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන අවධානය යොමු වෙලා තිබෙනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඒ ගැන බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

මේ අවස්ථාවේදී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මා, ජනමාධ්‍ය ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව කර ගෙන යන්නට අවශ්‍ය ශක්තිය ලැබේවා කියා ශුභ පතනවා. නියෝජ්‍ය ඇමතිතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයකු වශයෙන් සිටි කාලයේ මා නීති විද්‍යාලයේ ශිෂ්‍යයකු සහ වෘත්තීය පත්‍ර කලාවේදියකු විධියට කටයුතු කරන කාලයේදීයි එතුමා හඳුනා ගත්තේ. මාධ්‍යයේ පරමාදර්ශ වෙනුවෙන් එදා එතුමා තුළ වූ උනන්දුව සහ කැප වීම එසේම පවත්වාගෙන යන්නට එතුමාට හැකියාව ලැබෙයි කියා මට හිතන්නට අවස්ථාවක් ලබා දෙන්නටය කියා මා ඉතාමත් කාරුණිකව ඉල්ලීමක් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කිරීමේදී, මෙවර අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන ප්‍රධාන යෝජනා කිහිපයක් ගැන මගේ සහ අපේ ස්තුතිය ප්‍රකාශ කරන්නට මා කැමතියි. එකක් තමයි, "පණ්ඩිත් අමරදේව සංගීත ආශ්‍රමය" පිහිටුවීම සඳහා රුපියල් මිලියන 25ක් වෙන් කිරීම. ඒක හොඳ වැඩක්. නමුත් ඇමතිතුමනි, රුපියල් මිලියන 25 ප්‍රමාණවත් වෙයිද දන්නේ නැහැ. නමුත් එය හොඳ ආරම්භයක්. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම චිත්‍රපට සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ඒකකයක් ජාතික චිත්‍රපට සංස්ථාවේ ආරම්භ කිරීමට රුපියල් මිලියන 50ක් වෙන් කරන අතරේ ජාතික චිත්‍රපට අධ්‍යයන ආයතනයක් පිහිටුවීම සඳහා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට රුපියල් මිලියන 50ක් වෙන් කරනවා. තමුන්නාන්සේලා මැතිවරණ කාලයේදී මොනවා කිව්වත්, අමාත්‍යාංශ වෙන් කිරීමේදී මතුවෙලා තිබෙන ගැටලුව, ඒ හිරවීම මේ තුළ පෙනෙනවා. මා දන්නේ නැහැ, එකම මාතෘකාව යටතේ අමාත්‍යාංශ දෙකකට අයත් ආයතන වෙනුවෙන් මුදල් වෙන් කරන්නේ ඇයි කියලා. ඒ ගැටලුව ලිහා ගන්නය කියන ඉල්ලීමත් මේ අවස්ථාවේදී කරන්නට කැමතියි.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. අය වැය යෝජනා 345 යටතේ, මාධ්‍යකරුවන්ට වෘත්තීය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා සියයට සියයක සහන පොලියක් යටතේ රුපියල් ලක්ෂ තුනක උපරිම ණය මුදලක් ලබාදීම සඳහාත්, අනෙකුත් මාධ්‍යකරුවන්ට - අනෙකුත් මාධ්‍යකරුවන් කියන්නේ කවුද කියා වර්ගීකරණයක් කරලා නැහැ- වෘත්තිය සඳහා අවශ්‍ය උපකරණ වැඩිදියුණු කරගැනීම සඳහා සියයට පණහක සහන පොලියක් යටතේ ණය මුදලක් ලබාදීම සඳහාත් රුපියල් මිලියන 25ක් වෙන් කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ යටතේ උපරිම රුපියල් ලක්ෂ තුනක ණය මුදල ලබා ගත්තොත් ඔබතුමාට මේ ණය දෙන්නට පුළුවන් වන්නේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී සිටින මාධ්‍යවේදීන් අතරින් අසූතුන්දෙනෙකුට පමණයි. එම නිසා මෙය ප්‍රායෝගික දෙයක් විධියට මා විශ්වාස කරන්නේ නැහැ. සාමාන්‍යයෙන් අය වැය ලේඛනවල මේ ආකාරයෙන් බොහොම ආකර්ෂණීය කරුණු සඳහන් කරනවා. නමුත් මේවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරගන්න පුළුවන් යෝජනා නොවෙයි. ඒ වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 25ක් වෙන්කර තිබෙනවා. ඒකත් හොඳ කටයුත්තක් කියා මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, මා යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. තාක්ෂණය වේගයෙන් දියුණුවන අවස්ථාවේ ඒ ක්ෂේත්‍රය තුළ වේගයෙන් සිදුවන පෙරළිකාර වෙනස්කම්වලට සාපේක්ෂව මාධ්‍යවේදීන්ට අවශ්‍ය දැනුම, තාක්ෂණය හා අත්දැකීම් ලබාගැනීම වෙනුවෙන් මේ මුදල් වෙන්කරනවා නම් මීට වඩා ප්‍රායෝගිකයි කියා මා හිතනවා. විශේෂයෙන්ම අපේ මාධ්‍ය ක්ෂේත්‍රයේ සිටින අතිබහුතරයක් කොළඹ electronic media ආශ්‍රිතව ඉතා කුඩා සංඛ්‍යාවක් හැරෙන්නට අනෙක් බොහෝදෙනා ප්‍රාදේශීය මාධ්‍යවේදීන්. ඒ අයගේ තාක්ෂණික දැනුම වර්ධනය කර ගත යුතු තත්ත්වයකයි තිබෙන්නේ. එම නිසා විෂය පිළිබඳ දැනුම, ශාස්ත්‍රීය අවබෝධය දියුණු කර ගැනීම සඳහා තමුන්නාන්සේලා නිතරම පහර ගහන මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, ඒ කාලයේ යෝජනාවක් කළා, ගරු සභාපතිතුමනි. මේ මාධ්‍යවේදීන්ට වෘත්තීය අධ්‍යාපනය ලබා ගන්නට -[බාධා කිරීමක්] -කරුණාකර ඇහුම් කන් දෙන්න- උපාධි පාඨමාලාවක් පටන් ගන්න, Z-score එක හරහා විශ්වවිද්‍යාලයට යන්න තිබෙන පාර වෙනුවට අලුත් ladder එකක් හදා දෙන්න කියා එතුමා කිව්වා. ඒ අනුව අපි වෙනම විශ්වවිද්‍යාලයක් ආරම්භ කළ බව ඔබතුමා දන්නවා. ඒ විශ්වවිද්‍යාලය ඇතුළේ වෙනම පාඨමාලාවක් පටන් ගත්තා. ඒ පාඨමාලාව තමයි, Film and Television Production

Technology කියන පාඨමාලාව. මේ වනකොට 60දෙනෙක් ඒ පාඨමාලාව හදාරනවා, ගරු ඇමතිතුමනි. ඒ පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම් නොවෙයි සෙව්වේ; වෘත්තිය සුදුසුකම් තමයි සෙව්වේ. එවැනි පාඨමාලා කිහිපයක් electronic media එකට අදාළව පමණක් නොවෙයි, print media එකට අදාළවත් ආරම්භ කරන්න. ගරු ඇමතිතුමනි, ඒ ආකාරයෙන් මාධ්‍යවේදීන්ගේ අනාගතය වෙනුවෙන් ඔවුන්ගේ වෘත්තිය දැනුම, ශාස්ත්‍රීය දැනුම වැඩිදියුණු කර ගැනීම සඳහා ඔබතුමාට මැදිහත්වෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන්, සුමිත්‍රා පීරිස්, ධර්මසේන පතිරාජ, ඩී.බී. නිහාල්සිංහ වැනි ප්‍රවීණයන් එකතුවෙලා තමයි ඒ පාඨමාලාව නිර්මාණය කළේ. ඒ කටයුත්ත ඉන් ඔබ්බට ගෙනයෑම සඳහා අවශ්‍ය කටයුතු කරන්න තමුන්නාන්සේලා උත්සාහ ගනියි කියා මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. මේ රටේ ශ්‍රවණාබාධයෙන් පෙළෙන ප්‍රජාව මුළු ජනගහනයෙන් සියයට දශම පහකට වැඩියි. ඒ ප්‍රජාවට රූපවාහිනී ප්‍රවෘත්ති දැනගැනීම සඳහා තිබෙන මාර්ග ඉතාම අඩුයි. ඒ කාලයේ කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ හෝ ඊට පෙර කාලයේ -මට හරියට මතක නැහැ- ජාතික රූපවාහිනියේ sign language එක ආරම්භ කළා.

අනිකුත් සියලු මාධ්‍යවලිනුත් එසේ කටයුතු කරන ලෙස අපි ඉල්ලීමක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ලෝකයේ දියුණු රටවල "closed captioning" කියලා දෙයක් තිබෙන බව ඔබතුමා දන්නවා. මේ කටයුත්ත සඳහා තාක්ෂණික වෙනසක් විතරයි කරන්න තිබෙන්නේ. අපේ ඒ සහෝදර ජනතාව කොන් කරන්නේ නැතිව එවැනි අවස්ථාවක් ලබා දීමට කටයුතු කරන්න ඕනෑය කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව දැන් ජාතික සංහිඳියාව ගැන වැඩිපුර කථා කරනවා. ඒක හොඳයි. හැබැයි, පුවත් පත් ශීර්ෂ, පුවත් පත් තොරතුරු විග්‍රහ කරන සියලුම නාලිකා දිහා බැලුවාට පස්සේ අපට පෙනෙනවා, සිංහල නාලිකා, සිංහල ප්‍රවෘත්ති, සිංහල කාටූන්, සිංහල විශේෂාංගවලට අමතරව ඉංග්‍රීසි මාධ්‍ය ගැන කථා කරන බව. දමිළ ප්‍රවෘත්ති, දමිළ භාෂාවෙන් පළ වන මාධ්‍යවලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වන මාධ්‍ය ගැනත් දෙමළ මාධ්‍ය කථා කරනවා. හැබැයි, සිංහල මාධ්‍ය තුළින් දමිළ සහෝදර ජනතාවගේ සිතුම් පැතුම්, ආකල්ප පිළිබඳව සිංහල ජනතාවට හැඟීමක් ඇතිවන විධියට කටයුතු කරන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් සියලු මාධ්‍ය දැනුවත් කරලා කටයුතු කරන එක රජයේ වගකීමක් කියලා මම හිතනවා.

මෙවර අය වැයෙන් අන්තර්ජාල ගාස්තුවලට සියයට 25ක බද්දක් පනවලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. මේක සහස්‍රකයන්ට - millennials - තරුණ පරම්පරාවට එල්ල වෙච්ච බරපතළ ප්‍රහාරයක් බව අපි අය වැය විවාදයේදීත් කිව්වා. මේ බද්ද මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළව ගත්තොත්, ඒ නිසා විශේෂයෙන්ම ප්‍රාදේශීය මාධ්‍යවේදීන් විශාල අර්බුදයකට ගොදුරුවෙලා සිටිනවා, ගරු සභාපතිතුමනි, ඔවුන්ට news item එකක් upload කරන්න, download කර ගන්න තිබුණු ඉඩට මේ බද්ද විශාල බාධාවක්. මේ වෙනුවෙන් විශාල ගාස්තුවක් ගෙවන්න සිද්ධ වනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි, මාසිකව upload කරන්න, download කර ගන්න ධාරිතාව අඩු ගණනේ ගිගාබයිට්ස් 10ක තරම් දත්ත පැකේජයක්වත් ඒ අයට පිරිනමන්න කටයුතු කරන්න කියලා. තමුන්නාන්සේලා එහෙම කටයුතු කළොත් ඒක ඉතාම වැදගත් දෙයක් බවට පත් වේවි.

මම මේ අවස්ථාවේදී පුවත් පත් මණ්ඩලය ගැන තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි. ඊයේ පුවත් පත්වල තමුන්නාන්සේලා දැන්වීමක් පළ කරලා තිබුණා, "උසස් මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහා ජනමාධ්‍ය අයිතීන් හා ප්‍රමිතීන් ස්ථාපිත කිරීම වෙනුවෙන් මහජන අදහස් ලබා ගැනීම" කියලා. එය ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් පළ කරපු දැන්වීමක්. ඒ දැන්වීමේ කරුණු හතක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, එම කරුණු හතෙන් මුල් කරුණු පහට අමතරව අවසාන කරුණු දෙකේ සඳහන් වෙලා තිබෙනවා, "පිළිගත් වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය කඩ කිරීම, ප්‍රතික්ෂේප කරන ජනමාධ්‍යවේදියෙකුට හෝ සංස්කාරවරයෙකුට දඬුවම් කිරීම හෝ සේවය අවසන් කිරීම හෝ නීති විරෝධී ක්‍රියාවක් වශයෙන් සැලකීම" කියලා. මෙන්න මේ කාරණයට සම්බන්ධ වෙන්නේ කොහොමද කියන අදහසයි අපෙන් ඉල්ලන්නේ. ඒ වාගේම, මාධ්‍ය ආයතනවලට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව වෘත්තීය ආචාර්ය ධර්ම සංග්‍රහයක් පිළිගෙන එය ක්‍රියාත්මක කිරීමට, අධීක්ෂණය කිරීමට අවශ්‍ය බලතල සහිත ස්වාධීන මණ්ඩලයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අදහස් පළ වෙනවා.

දැන් පුවත් පත් මණ්ඩලයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. ගරු ඇමතිතුමා මේ සම්බන්ධව ගරු සභාවට පැහැදිලි කරන්න ඕනෑ. නමුත් එතුමා මේ විවාදයේදී කථා කරලා අවසානයි. ඒ නිසා නියෝජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධව පැහැදිලි කරයි කියලා මම විශ්වාස කරනවා. නමුත් එතුමාටත් කථා කරන්න විනාඩි හතරක හෝ පහක පමණ කාලයක් වෙන් වෙලා තිබෙන බවයි මම දැක්කේ. ඒ කෙසේ වෙතත්, පුවත් පත් මණ්ඩලයට මේ සියලු කාරණා සම්බන්ධයෙන් බලතල තිබෙන වෙලාවක මේ යෝජනාවෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලා මම දන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, පුවත් පත් මණ්ඩලය සම්බන්ධයෙන් සංශෝධන ඉදිරිපත් කරන්න අවශ්‍ය නම් ඒක කරන්න පුළුවන්. පුවත් පත් මණ්ඩලයේ සාමාජිකයන් හත් දෙනායි ඉන්නේ. ඒ හත් දෙනාගෙන් හය දෙනෙක් පත් කරන්නේ ජනාධිපතිවරයා විසින්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ඒ නිසා ඒ සම්බන්ධ සංශෝධනයක් කරන්න තමුන්නාන්සේලා උත්සාහයක් ගන්න. සැබැවින්ම අවශ්‍ය නම් මේ පුවත් පත් මණ්ඩල ස්වාධීන කරන්න. වෘත්තීය මාධ්‍යවේදීන්ගේ සංවිධානය විසින් හත් දෙනෙක් නම් කළාම, එක් කෙනෙක් ජනාධිපතිතුමා තෝරා ගන්නවා. කර්මාන්ත සේවකයන් වෙනුවෙන් තුන් දෙනෙක් නම් කළාම, එක් කෙනෙක් ජනාධිපතිතුමා තෝරා ගන්නවා. ඒ ආකාරයට එතුමා හය දෙනෙක් පත් කර ගන්නවා. මේ සම්බන්ධයෙන් ඉන්දියාවේ හොඳ උදාහරණයක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඉන්දියාවේ පුවත් පත් මණ්ඩලයේ විසි හය දෙනෙක් තමයි ඉන්නේ. හැබැයි, ඒ විසි හය දෙනාගෙන් දහතුන්දෙනෙක් -හරි අඩක්- තෝරන්නේ වෘත්තීය පුවත් පත් කලාවේදීන් අතරින්. කවුද ඒ අය තෝරන්නේ? ජනාධිපතිවරයාද? අගමැතිවරයාද? නැහැ. අග්‍රවිනිශ්චයකාරවරයා, කථානායකවරයා සහ පාර්ලිමේන්තුවේ ඒකාබද්ධව ඇති කර ගත් කමිටුවකින් තමයි ඒ තෝරා ගැනීම කරන්නේ. කථානායක, අගවිනිසුරු, සෙනෙට්

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

මණ්ඩලයේ සභාපතිවරයා තමයි ඒ අය තෝරන්නේ. අන්න ඒ වාගේ පරමාදර්ශයක් ඔබතුමන්ලාත් ගනීවි කියලා මා විශ්වාස කරනවා. මේ මණ්ඩලයට අදාළ කරුණු සඳහන් 16වැනි වගන්තියේ, 12වැනි වගන්තියේ ගැටලු තිබෙන බව අපි පිළිගන්නවා. ඒ ගැටලු නිරාකරණය කර ගන්න ඕනෑ. හැබැයි, පුවත් පත් මණ්ඩලයට නිල වශයෙන් සම්බන්ධ වෙන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විතරයි. හැබැයි, එතුමා මේ කටයුත්තට සහභාගි වෙන්නේ නැහැ. අපේ මිත්‍රයා - රංග කලංසූරිය මැතිතුමා - මේ අවස්ථාවේදී අද මේ ස්ථානයට ඇවිල්ලා ඇති. මම වෙබ් අඩවිය පරීක්ෂා කළා. නමුත් අඩු ගණනේ එතුමාගේ පින්තූරයවත් වෙබ් අඩවියේ නැහැ.

ඒ ඇයි කියලා මා දන්නේ නැහැ. එතැන ප්‍රතිපත්තිමය ගැටලුවක් තියෙන්නත් බැහැ. ඒක එහෙම වෙන්න බැහැ. මොකද, ඒක මේ පාර්ලිමේන්තුවට වග කියන ආයතනයක් නිසා. හැබැයි, එතුමා ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමාගේ නායකත්වයෙන් ආරම්භ කළ ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයේ - ඒ ආයතනයේ නම මට හරියට මතක නැහැ- CEO විධියට පත් කළා. එතුමා ඒ ආයතනයේ CEO වශයෙන් කටයුතු කරන බව අපි දන්නවා. තමුන්නාන්සේලා මීට වඩා වගකීමෙන් මේ ආයතනයේ කටයුතු කරන්න ඕනෑ. තමුන්නාන්සේලා ඒ ගැන පාර්ලිමේන්තුවට වගකියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඊට අමතරව අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. ඉතිහාසය පුරාම අපේ රටේ බිහි වුණු හැම ආණ්ඩුවකටම මාධ්‍ය එක්ක ඇති කර ගත් ගැටීමෙන් තමයි අවසන් ගමන් යන්න සිද්ධ වුණේ. තමුන්නාන්සේලාත් දැන් ඒ ගැටීම ආරම්භ කර ගෙන තිබෙනවා. CSN නාලිකාවට තමුන්නාන්සේලා මොකක්ද කළේ ? 2016 අය වැය ලේඛනය මේ ගරු සභාව ඉදිරිපත් කරමින් එදා ගරු මුදල් ඇමතිතුමා කිව්වා, sports channels වලට රුපියල් බිලියනයක බද්දක් පනවනවා කියලා. මොනවාද ඒ නිර්ණායක? මොනවාද ඒ දර්ශක? Transmitters තුනකට වැඩි sports channels වලට ඒ බද්ද පනවනවා කිව්වා. ඒ වාගේ ඒවා එකයි තිබුණේ. MTV Sports Channel එක තිබුණා. ඒකට තිබුණේ transmitter එකක් විතරයි. Transmitters තුනක් සහිතව ලංකාවේ තිබුණ එකම sports channel එක තමයි CSN. තමුන්නාන්සේලා ඒ නාලිකාවට ප්‍රහාර එල්ල කරන්න පටන් ගත්තා. ජනමාධ්‍ය ලේකම්තුමා මගේ මිත්‍රයා. තමුන්නාන්සේගේ නියෝගයෙන් දුන්න ඒ බලපත්‍රය අහෝසි කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වෙනුවෙන් ඉදිරිපත් කළ කාරණාව මොකක්ද? Audited accounts ටික ලේකම්වරයාට යැව්වේ නැහැයි කියන එකයි කාරණාව. නමුත් එහෙම එකක් කරන්න ඕනෑ නැහැ. ඒවා යවන්න ඕනෑ Auditor-Generalටයි. ඒ ස්ථානයේ address මාරු කළ බව දැනුම් දුන්නේ නැහැයි කියනවා. ඒත්, ඒ මාරු කළ address එකට තමුන්නාන්සේලා යවපු ලියුම් ඕනෑ තරම් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවේ පළමුවැනි, දෙවැනි, තුන්වැනි පේළි ගත්තොත්, සෘජුවම මාධ්‍යයට සම්බන්ධ - මම නියෝජ්‍ය කථානායකතුමා ගැන නොවෙයි කියන්නේ, එතුමා හිනාවෙවී හිටියාට- පවුල් අටක් තිබෙනවා. ගරු අගමැතිතුමාගේ පවුල් සම්බන්ධතාව එතුමා පිළිගත්තා. තමුන්නාන්සේලා ඉතාම අශීලාචාර විධියට "දෙරණ" නාලිකාවත් එක්ක පටන් ගත් අරගළය ගැන සියලු ලේඛන මේ පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. මේක මාධ්‍ය දඩයමක්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
"හිරු" නාලිකාව සම්බන්ධවත් එහෙමයි. දැන් හිරු වටා මෙරු කැරකෙන බව අපට පෙනෙනවා. ගරු සභාපතිතුමනි, අපි කියන්නේ මාධ්‍යවල පළ වන සියලු දේවල් ඇත්ත කියලා නොවෙයි. අමෙරිකානු සාහිත්‍යයේ පියා යැයි කියන මාර්ක් ට්වේන් ගැන ඔබතුමා දන්නවා ඇති. ගරු සභාපතිතුමනි, එතුමා මෙසේ කියා තිබෙනවා:

"If you don't read the newspaper, you're uninformed. If you read the newspaper, you're misinformed."

මේ කියමන ඇතුළේ තිබෙන අදහස මේ රටේ මාධ්‍යවේදීන් තේරුම් ගනු ඇතැයි මා විශ්වාස කරනවා.

අවසාන වශයෙන්, මම එක ඉල්ලීමක් කරන්න කැමැතියි. තොරතුරු දැන ගැනීමේ පනත ගෙන ඒමට නායකත්වයක් දෙන්න කටයුතු කළ ඔබතුමා මූලිකත්වය දරන සභාවකදී ගරු අගමැතිතුමා දිගින් දිගට මාධ්‍ය ආයතනවල නම් කියලා, මාධ්‍යවේදීන්ගේ නම් කියලා දරුණු ප්‍රහාරයක් එල්ල කර තිබෙනවා. මාධ්‍ය නිදහස සුරක්ෂිතයි කියලා ඔබතුමා කිව්වාට අපි මේ පාර්ලිමේන්තුව තුළ ඒක දැකලා නැහැ; අපට ඒක පෙනෙන්නේ නැහැ. ඒක invisible. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ අපි මේ රටේ මාධ්‍ය නිදහස වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ. අපි අතින් වැරදි වෙන්න පුළුවන්. ඒවා නැහැයි කියලා මම කියන්නේ නැහැ. අපි සර්වතෝභද්‍ර නොවෙයි. අපි ඒ අඩුපාඩු පිළිගන්නම්. ගරු සභාපතිතුමනි, වෙච්ච වැරදි හදා ගෙන හොඳ මාධ්‍ය සංස්කෘතියක් වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව නායකත්වය දිය යුතුය කියා මා යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

[පූ.භා. 11.16]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
ගරු සභාපතිතුමනි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත නීතියක් කරන්න කැප වුණු ගරු කථානායකතුමා, ඒ යෝජනාව ප්‍රායෝගිකව භූමිය මත ක්‍රියාත්මක කළ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා, ඒ නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලු

දෙනාට මගේ ස්තුතිය පිරිනමනවා. මේ රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදයේ අයිතිය භාවිත කරන්නට තිබෙන අවස්ථාව නිසි ලෙස පාවිච්චි කරන්න නම්, සත්‍ය දැන ගත යුතුයි. සත්‍ය දැන ගන්න නම් මාධ්‍ය ස්වාධීන වෙන්න ඕනෑ; ශක්තිමත් වෙන්න ඕනෑ. ඒ වාගේම මාධ්‍යවලට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය සනාථ කරන්න ඕනෑ. ඒ නිසා මෙම අමාත්‍යාංශය විසින් මාධ්‍ය නිදහස තහවුරු කිරීම සඳහා නීතියක් ගෙනැල්ලා, අපේ යහපාලන රජය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා, තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් බවට පත් කරලා, මේ රටේ භූමිය තුළ නිදහස ඇති කර තිබෙනවා. ඒක නැහැයි කියලා කවුරු හරි කියනවා නම්, ඒ අන්ධයෙක් හෝ බිහිරෙක් පමණයි. මේ රටේ උත්තරීතර නීතිය සංශෝධනය වුණා.

ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා නීතියක් ඇති වුණා. ඒ නීතිය අද අපේ ඇහැට පේනවා. ජාතික රූපවාහිනියේ සෑම පක්ෂයකම සෑම මත වාදයක්ම නියෝජනය වනවා. ස්වාධීන රූපවාහිනියේ සෑම පක්ෂයකම සෑම මත වාදයක්ම නියෝජනය වනවා. ITN එකේ සෑම පක්ෂයකම සෑම මතවාදයක්ම නියෝජනය වනවා. අද, Lake House එක ඒ අවස්ථාව හැමෝටම ලබා දීලා තිබෙනවා. ඒක නොපෙනෙනවා නම්, කෙනෙකු අන්ද වී සිටිනවා; නැත්නම් බිහිරෙකු වී සිටිනවා; නැත්නම් එලෙස හැසිරෙනවා.

ගරු සභාපතිතුමනි, මට කථා කිරීමට ඉතාම කෙටි කාලයක් ලබා දී තිබෙන මොහොතේ මම ඉතාම වැදගත් කාරණයක් කියන්න අවශ්‍යයි. අපේ රටේ රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍යන්ගේ, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් දෙකේදීම අද අපි කවුරුත් කථා කරන social media හැසිරවීමේදී වගකීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපි මාධ්‍ය නිදහස මෙරට භූමියේ සනාථ කර තිබෙන අවස්ථාවක, තමන්ගේ මාධ්‍යය හැසිරවීම වගකීමකින් යුතුව, සාධාරණව, සත්‍යගරුකව කරන්නට සෑම මාධ්‍යයක්ම සහ සෑම මාධ්‍යකරුවෙක්ම කටයුතු කළ යුතුයි. එදා තිබුණු මරණ බිය දැනෙන යුගය අපි දැන් අවසන් කරලා තිබෙනවා; සිරගත වීමේ අවදානම අවසන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, හැබැයි අපට අලුත් වගකීමක් තිබෙනවා. ඒ වගකීම තමයි, අපි පසු ගිය දවස්වල දැක්කේ. අධිකරණය පිළිබඳ විවේචන කරනවා. අධිකරණය පිළිබඳ විවේචනය කළ හැකියි; අධිකරණයේ ස්වාධීනත්වය කෙරෙහි තිබෙන ප්‍රශ්නය පිළිබඳව විවේචනය කළ හැකියි. මේ රටේ ජනමාධ්‍යවේදීන් "රාවය" පුවත් පතේ හිටපු කතෘ වික්ටර් අයිවන් මහතාගෙන් මේ පිළිබඳව ඉගෙන ගත යුතුව තිබෙනවා. අධිකරණයේ ක්‍රියාදාමය සහ එහි දූෂිත විනිශ්චයකාරවරුන් පිළිබඳ කරුණු ඇතිව, සාක්ෂි ඇතිව හෙළිදරව් කරන්න පුළුවන්. හැබැයි, එසේ නොමැතිව වගකීම් විරහිතව කටයුතු කළොත් එහි ඵලවිපාක ලැබෙන්නේ රටේ ජනතාවටයි. ඔවුන්ට අධිකරණය පිළිබඳ විශ්වාසය නැති වෙනවා.

ගරු සභාපතිතුමනි, මා මෙම ප්‍රශ්නය මතු කරන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් විශාල කැප කිරීමක් කරපු දූෂිත, මිනීමරු රාජපක්ෂ පාලනය අවසන් කිරීමට දායක වුණු Lanka-e-News ගැන කියන්නයි. Lanka-e-News තමන්ගේ යුතුකම ඉටු කරපු මාධ්‍යයක්. සියලුම රාජ්‍ය මාධ්‍ය එක මතයක් ගනිද්දී, විරුද්ධ පක්ෂයට කිසිම හඬක් නැතිව තිබෙද්දී Lanka-e-News මේ රටේ සාමාන්‍ය පොදු ජනතාවගේ අයිතිය වෙනුවෙන් පෙනී සිටියා. Lanka-e-News විසින් ඔවුන්ගේ මාධ්‍යකරණයේ වගකීම සියයට සියයක්ම සාධාරණව, සියයට සියයක්ම නිවැරදිව කරනවා කියන්න මම ලැහැස්ති නැහැ. ඔවුන් අතිනුත් යම් යම් අඩු-පාඩු සිදු වන බව අපි නිරීක්ෂණය කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු සභාපතිතුමනි, තවත් එක් දෙයක් කියන්න තිබෙනවා. එදා ජනමාධ්‍යවලට විරුද්ධ වෙමින්, මාධ්‍යකරුවන් මරා දමන විට; ලසන්ත වික්‍රමතුංග මරා දමන විට අහක බලාගෙන හිටපු පුද්ගලයන් තමයි අද අධිකරණයේ කපටි ආරක්ෂකයන් ලෙස පෙනී සිටින්නේ. අධිකරණයේ අයිතිය, අධිකරණයේ ස්වාධීනත්වය, විනිශ්චයකාරවරුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් මේ රජයේ අපි පෙනී සිටිනවා. හැබැයි, අධිකරණයේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටින කපටි ආරක්ෂකයන්ගෙන් අධිකරණය ප්‍රවේසම් විය යුතුයි.

ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාවට "ජනමාධ්‍ය" අත්‍යවශ්‍ය දෙයක්. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, රටේ සංවර්ධනය වෙනුවෙන් මාධ්‍ය කරන මෙහෙය අගය කරන අතර, මාධ්‍ය වගකීමෙන් යුතුව භාවිත කිරීම පිළිබඳව වූ වගකීමත් මතක් කර සිටිනවා. රජය මෙම අයිතිවාසිකම ආරක්ෂා කිරීම පිළිබඳ යුතුකම ඉදිරියේ දී ඉටු කරනවා කියන කාරණය මතක් කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

[மு.ப. 11.21]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தவிசாளர் அவர்களே, முதலில், மனித நேயத்தினதும் உரிமைப் போராட்டங்களினதும் வழிகாட்டியாக, தலைவராக வாழ்ந்து மடிந்த தோழர் பிடெல் கஸ்ரோ அவர்களுக்கு எனது மக்கள் சார்பாக ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இலங்கையிலே எமது ஊடகத்துறையானது தொடர்ந்தும் ஒரு சர்ச்சைக்குரிய துறையாக இருந்து வருவதையே காணக்கூடியதாக இருக்கிறது. அந்த வகையில் எமது ஊடகத்துறையானது அதனது அடிப்படைப் பண்புகளை இழந்து நிற்பதாகவும் அதற்குரிய சுதந்திரத்தை அளவுக்கதிகமாக எடுத்துக்கொண்டு அனுபவித்து வருகின்றது என்றும் அதன் மீதான எதிர்ப்புக் கருத்துக்களைத் தெரிவித்து வருகின்றவர்கள் குறிப்பிட்டு வருகின்றனர். இங்கே பல ஊடகங்கள் பக்கச்சார்பு என்ற நிலைக்கு உட்பட்டுச் செயற்பட்டு வருவதாகவும் ஒரு விமர்சனம் தொடர்ந்து முன்வைக்கப்படுகின்றது. இதற்குப் பலர் நிறையவே உதாரணங்களையும் முன்வைத்து வருகின்ற நிலையில், இதே ஊடகங்களே அதனை வெளியிட்டும் வருகின்றன. என்னைப் பொறுத்தவரையில் ஊடகங்கள் பக்கச்சார்பற்ற வகையில் செயற்பட்டு, எமது மக்களுக்கு உடனுக்குடன் உண்மையான செய்திகளை வெளிப்படுத்தி, அம்மக்களை நேர்வழிப்படுத்த வேண்டுமென்பதையே இங்கு நான் தெளிவுபடுத்த விரும்புகின்றேன்.

தகவல்களைச் சந்தைப்படுத்துவதன் ஊடாக அதனது விற்பனைப் பெறுமதியை அதிகரித்துக் கொள்ளமுடியும் என்ற நோக்கில் மாத்திரமே செயற்படுகின்ற சில ஊடகங்கள் மக்களை அடிக்கடி ஒருவித பதற்றத்துடனும் குழப்பத்துடனும் வைத்துக்கொள்ளும் நிலைப்பாட்டினையே கொண்டிருக்கின்றன. இவ்வாறான சில ஊடகங்கள் உறுதிப்படுத்தல்கள் இன்றிய நிலையில் நுகர்வுச் சந்தையை மாத்திரம் கருத்திற்கொண்டு செய்திகளை வெளியிடுவதால், எது உண்மை? எது பொய்? என்பதை அறிய முடியாத நிலையில் எமது மக்கள் கைவிடப்படுகின்றனர். இந்த

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

நிலையிலிருந்து விடுபட்டு மக்களுக்குப் பொறுப்புக்கூறுகின்ற அதிமுக்கிய களமாக இந்த ஊடகத்துறை அமைய வேண்டும் என்பதே எமது எதிர்பார்ப்பாகும்.

அதேநேரம், கௌரவ அமைச்சருடைய தலைமையில் கடந்த மார்ச் மாதம் தென் பகுதியிலிருந்து வடக்கிற்குச் சென்ற ஊடகவியலாளர் குழுவொன்று அங்கே யுத்தத்தால் பாதிக்கப்பட்ட ஊடகவியலாளர்களைச் சந்தித்து அவர்களுக்கு வீட்டுத் திட்டங்களை வழங்குவதாகத் தெரிவித்திருக்கின்றது. அந்த வகையில் அங்கு மூன்று ஊடகவியலாளர் தெரிவுசெய்யப்பட்டு 10 இலட்சம் ரூபாய் பெறுமதியான வீடுகள் அமைத்துத் தருவதாகக் கூறப்பட்டு, ஒரு வீட்டுக்கான அடிக்கல்லும் நாட்டப்பட்டது. அதனுடைய நிலைமை எவ்வாறிருக்கின்றது என்பது தெரியவில்லை. கௌரவ அமைச்சர் அவர்கள் அது குறித்துத் தெளிவுபடுத்துவார் என்று நான் நினைக்கின்றேன். *[இடையீடு]* බොහොම ස්තුතියි.

அடுத்தது தென் பகுதி ஊடகவியலாளர்களுக்கு வழங்கப்பட்டிருப்பதுபோன்று எமது வட மாகாண ஊடகவியலாளர்களுக்கும் மடிக் கணனிகள், கையடக்கத் தொலைபேசிகள் போன்றவற்றைப் பெறுவதில் சலுகைகளைப் பெற்றுக் கொடுக்க நடவடிக்கை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். எமது ஊடகவியலாளர்களது பொருளாதார நிலைமையைக் கருத்திற்கொண்டு அவர்களுக்குக் கடன் அடிப்படையிலன்றி, வரிச் சலுகைகளுடன்கூடிய 'மோட்டார் சைக்கிள்'களை வழங்குவதற்கு விசேட திட்டமொன்றை முன்னெடுக்க நடவடிக்கை எடுக்குமாறும் கேட்டுக் கொள்கின்றேன்.

லசந்த விக்கிரமதுங்க மற்றும் பிரகீத் எக்னெலிகொட போன்ற ஊடகவியலாளர்களது கொலை தொடர்பில் விசாரணைகள் ஆரம்பிக்கப்பட்டு முன்னெடுக்கப்பட்டு வருவதைப்போன்று, கொல்லப்பட்ட, படுகாயமடைந்த ஏனைய அனைத்து ஊடகவியலாளர்கள் தொடர்பிலும், தாக்குதல்களுக்குள்ளான ஊடக நிறுவனங்கள் தொடர்பிலும் உரிய விசாரணைகளை மேற்கொண்டு குற்றவாளிகள் இனங்காணப்பட்டுத் தண்டிக்கப்பட நடவடிக்கை எடுக்குமாறும் வடக்கு, கிழக்கு மாகாணங்களில் உயிரிழந்த ஊடகவியலாளர்களது குடும்பங்களுக்கு அவர்களது வாழ்வாதாரத்தை ஈட்டிக்கொள்ளக்கூடிய வகையில் விசேட திட்டம் என்ற அடிப்படையில் ஒரு நிதியுதவித் திட்டத்தை முன்னெடுக்குமாறும் நான் கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரத்தில் யுத்தம் காரணமாக உயிரிழந்த உறவுகளுக்கு நினைவேந்தல்களை முன்னெடுப்பதற்கு இந்த அரசு சுதந்திரமாக வழிவிட்டிருப்பது தொடர்பில் எமது மக்கள் சார்பாக இந்த அரசுக்கு நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அந்த வகையில் உயிரிழப்புகளுக்கு உட்பட்ட எமது உறவுகளை நினைவுகூர முழுமையாக வழியேற்படுத்திக் கொடுத்ததைப்போல், தற்போது அரைகுறை உயிருடன் தடுப்புக் காவலில் வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகளையும் பொது மன்னிப்பின் அடிப்படையில் விடுதலை செய்ய இந்த அரசு முன்வரவேண்டும் என்ற கோரிக்கையை மீண்டும் மீண்டும் இங்கு முன்வைக்க விரும்புகின்றேன்.

அதேநேரத்தில் அரச தமிழ் தொலைக்காட்சிச் சேவையிலும் அரச தமிழ் வானொலிச் சேவையிலும் தேசிய கீதத்தை இசைக்கின்றபோது தமிழ் மொழியில் இசைக்குமாறும் கேட்டுக்கொண்டு, வாய்ப்பளித்ததற்கு நன்றி கூறி விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු නිරෝෂන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.26]

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

ගරු සභාපතිතුමනි, සභාවට ආපු මොහොතේම අහඹු ලෙස මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ගිය වර අය වැය විවාදයටත් මා එකතු වුණා. හැබැයි, මට අද පෙනුණු විධියට - තමුන්නාන්සේත් දකින්න ඇති- පරණ තැටියේම තමයි රොටි ටික පෙරළා පෙරළා තිටියේ. අලුත් දේවල් මොනවත් තිබුණේ නැහැ. පරණ සාතන ටික ගැන කිව්වා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ පට්ටපල් බොරු දෙකකුත් කිව්වා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මොනවාද?

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

මා මගේ කථාව අතරතුර කියන්නම්. ඒවා සංඛ්‍යා ලේඛනත් එක්ක කිව්වාම පැහැදිලියි.

ගරු සභාපතිතුමනි, ජනවාරි 08වැනිදාට කලින් මේ රටේ මිනිස්සු හරි අමුතු සිහින ලෝකෙක හිටියා. ඒ සිහින ලෝකය ඇතුළේ තමුන්නාන්සේලා, "මෛත්‍රී පාලනයක්... ස්ථාවර රටක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් මොකක්ද කිව්වේ? එහි මෙසේ සඳහන් වනවා:

> "රජයේ ජනමාධ්‍ය, රට පාලනය කරන දේශපාලන පක්ෂයේ ප්‍රචාරක අවියක් බවට පත් කිරීම වහාම නවතා සමබර සේවාවක් රටට සැපයීමට අවශ්‍ය පසුබිම සකස් කරමි. ජනමාධ්‍ය නිදහස තොරතුරු දැන ගැනීමේ අයිතිය උපරිම ලෙස තහවුරු කරමි."

මේක තමයි ජනවාරි 08 වැනිදා බලයට පත් වුණු තමුන්නාන්සේලාගේ රජයේ "මෛත්‍රී පාලනයක්... ස්ථාවර රටක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ "අර්ථවත් හරවත් මාධ්‍ය නිදහසක්" තේමාව යටතේ තිබුණේ. හැබැයි, අවුරුදු එකහමාරක විතර පොඩි කාලයක් ගත වන කොට ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට මතක් වෙනවා, මුල් පිටුව තමයි ආණ්ඩු පෙරළන කාර්ය භාරය කරන්නේ කියන එක. රටේ සංවර්ධනයක් නැහැ කියලා කියන්නේ, මුල් පිටුව කියලා තේරෙනවා. හැබැයි, ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමනි, මට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. අපි ඉන්න කාලයේ රට වෙනුවෙන් මොනවාද කරන්න පුළුවන් කියන පොදු කාරණය මිනිස්සු විධියට අපට හිතන්න පුළුවන් නම් විතරයි මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒක තමයි මගේ තර්කය. එහෙම නැති වුණොත් මේ රට ඉදිරියට ගෙන යන්න බැහැ.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේට මතක ඇති, මේ අවුරුද්දේ ජනවාරි 28 වැනිදා ගරු අගමැතිතුමා මාධ්‍යවේදීන්ට සතුන්ගේ නම් කිව්වා. "කීර්ති වර්ණකුලසූරිය කියන්නේ මොන

ගෙම්බෙක්ද" කියලා ඇහුවා. චතුර අල්විස්ලාට "යක්කු" කියලා කිව්වා. හැබැයි, ගරු සභාපතිතුමනි, මමත් මාධ්‍යකාරයෙක් විදියට, මගේ පරම්පරාවේ මිනිහෙක් වන චතුරගෙන් මා ඉල්ලන්නේ, "ඊළඟ ආණ්ඩු බලයට කවුරුන් පත් වුණත්, කොන්ද කෙළින් තියාගෙන ඒ ආණ්ඩුවෙන් වන වැරදිත් විවේචනය කරපන්" කියන එකයි. ඒක තමයි ඇත්ත. ඒක තමයි වෙන්න ඕනෑ මේ රට ඉස්සරහට ගෙන යන්න නම්.

ඊළඟට ගරු සභාපතිතුමනි, අද පාර්ලිමේන්තුවේ කථා කළේ "සන්ඩේ ලීඩර්", "උදයන්" මාධ්‍ය ආයතනවලට ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වග කියන්න ඕනෑ කවුද, මේවාට උත්තර හෙව්වාද කියන ඒවා ගැනයි. හැබැයි, තමුන්නාන්සේලාට මතක ඇති, මීට පෙර ලසන්තලාගේ, ප්‍රගීත්ලාගේ ඝාතන ගැනත් කථා කළා. කලින් මාධ්‍ය ආයතනලට පහරදීම් ගැන ලොකු මතයක් හැදුණේ, මේ රටේ හිටපු කුප්‍රකට ඇමතිවරයකු සම්බන්ධයෙනුයි. ඒ තමයි ජාතික රූපවාහිනියට ගිහිල්ලා රතු ලේ වාගේ තීන්තවලින් නැහැවී ආපු ඇමතිවරයා. ජනවාරි 08 වැනිදා යහපාලන ආණ්ඩුව හදන කොටත් නිල්ම නිල් පාට ඇඳුමක් ඇඳගෙන දිවුරුම් දෙන ස්ථානයට එතුමා ඇවිල්ලා ඉන්නවා මා දැක්කා. මා මේ කියන්නේ, මේ පාලනයට ගොම වැටෙන්න පටන් ගත්ත දවස.

ඊළඟට, දෙවැනි ගොම බින්දුව වැටෙන්නේ 2010 අවුරුද්දේ. මා එහෙම කියන්නේ ඇයි? ඊට පෙර එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කළ ගරු ජෝශප් මයිකල් පෙරේරා මහත්මයා තමයි, කෙළින්ම ඇඟිල්ල දිගු කළේ, එදා ලසන්තගේ, ප්‍රගීත්ගේ ඝාතන ගැන සෘජුව වගකීම ගන්න ඕනෑ සරත් ෆොන්සේකා මහතා ඇතුළු කල්ලියයි කියලා. 2008 ජූලි 08 වැනිදා හැන්සාඩ් වාර්තාවල ඒවා තිබෙනවා. හැබැයි, එදා ඒ චෝදනාව කරපු අය 2010 අවුරුද්ද වන කොට ඔහුව වට කරගෙන පොදු අපේක්ෂකයා කරගෙන මේ රටේ ජනාධිපති කරවන්න මේ හැමෝම එකතු වුණා.

ජනතා විමුක්ති පෙරමුණත් ඒකට එකතු වුණා. ගරු සභාපතිතුමනි, 2010 අවුරුද්දේ සිදු වුණු ඒ කතන්දරයෙන් පස්සේ, පසු ගිය මහ මැතිවරණයෙන් මනාප ඡන්ද පන්දාහක්වත් ගන්න බැරි වුණු සරත් ෆොන්සේකා මහත්තයා අගමැතිතුමාගේ පිටුපස අසුනේ තියලා, ලක්ෂ 700කට වැඩි වාහනයකුත් දීලා, රාජපක්ෂවරුන්ට චෝදනා කරන නිකම්ම නිකම් මැෂිමක් බවට පත් කරගෙන ඉන්නවා. ඒ එක්කම මම තමුන්නාන්සේලාට මේ කාරණයත් කියනවා. මේ වෙන කොට රට ඇතුළේ තිබෙන මාධ්‍ය නිදහස කොයි තරම්ද කියනවා නම්, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා -බෝපගේ මහත්තයා- මාධ්‍ය ආයතනවලට අනවශ්‍ය විදියේ උපදෙස් දෙන්නෙකු බවට පත් වෙලා, අනවශ්‍ය විදියේ ගුරුවරයෙකු බවට පත් වෙලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵල පසු ගිය කාලයේම තිබුණා.

මේ රටේ මාධ්‍යවේදීන්ට මම මේ කාරණය කියනවා. සමහර වෙලාවට අපට හිතෙන්නේ, ගහන්නේ මේ අයට විතරයි කියලා. හැබැයි, එක අවස්ථාවක් ඒවි, ඔබටත් පහර දෙන. නිහඬව බලා සිටීමේ අවසාන ප්‍රතිඵලය වන්නේ ඒකයි. ස්වාධීන රූපවාහිනී සේවයට රුපියල් 180ක පඩියට ආපු මිනිහෙක් මම. මේ සභාවේ මාධ්‍යවේදීන්ට වෙන් වෙලා තිබෙන පුටුවල ඉන්න මාධ්‍යවේදීන්ගෙන් අහන්න, අදටත් දවසේ පඩිය කීයක් වෙනවාද කියලා. තමුන්නාන්සේලා ඒක අහලා බලන්න.

ගරු ඇමතිතුමනි, මේ වෙලාවේ මම මේ කාරණයත් මතක් කරනවා. ජනමාධ්‍යවේදීන්ට හැම දාම හීනයක් තිබුණා, ගෙයක් හදා ගන්න ඕනෑ කියලා. අවුරුදු 11ක් මාධ්‍ය ආයතනයක වැඩ කරද්දී මටත් හිතුණා, ගමේ ඉඩමට තවම ඔප්පුවක් නැති අපට, ජනමාධ්‍යවේදියෙකු විදියට ඉන්න කාලයකදීවත් ගෙයක් හම්බ වෙයි කියලා. ඒ හීනය අවුරුදු 11ක් තිස්සේ ඉටු කර ගන්න බැරි වුණා. හැබැයි, මේ මාධ්‍යවේදීන්ට පුළුවන්කමක් තිබෙනවා නම් තමන්ටම කියලා නිවසක් ලබා ගන්න, ඒක හරිම වටිනවා. සරුංගල් කීපයක් අස්සේ හරි නූලකින් සරුංගලයක් උඩට යවනවා වාගේ ඒ මිනිස්සු උඩට තියන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා මේ වෙලාවේ මතක් කළා, ස්වාධීන රූපවාහිනියේ අලුත් මැදිරි සංකීර්ණය ඉදි කළේ ඔබතුමන්ලා කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ ආණ්ඩුව කාලයේ පටන් ගත්තා. දැන් ඒක ක්‍රියාත්මක වෙනවා. ඒ කාලයේ කරපු ඝාතන, පහරදීම් විතරක් අපි නවත්වලා තිබෙනවා. දැන් ඒවා කරන්නේ නැහැ.

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

ගරු ඇමතිතුමනි, මිනිහෙක් මරනවාට වඩා ජීවත් වෙලා ඉන්දෙද්දී දෙන වද වේදනා හරි ප්‍රබලයි. තමුන්නාන්සේලාට මම ඒක කියනවා. ඒක හරි ප්‍රබලයි. ස්වාධීන රූපවාහිනී සේවයට මම ඇවිල්ලා අවුරුදු දෙකකට පස්සේ මිත්‍රයෙක් ආවා, කසුන් කියලා. කසුන් ගැන කියද්දී තමුන්නාන්සේලාට මේ කාරණය මතක් කරන්න ඕනෑ. යුද්ධය තිබුණු කාලයේ ඉදිරි ආරක්ෂක වළල්ලට පොලීසිය යන්නේත් නැහැ. පොලීසියේ සේවය කළ අම්මා කෙනෙක් හිටියා. ඒ අම්මාගේ පුතා තමයි, මේ කසුන්. පවුලේ ඉන්න එකම කොල්ලා. ඒ කාලයේ ජනමාධ්‍යවේදීන් යුද්ධය වාර්තා කරන්න යන කොට, සමහරු පස්ස ගැහුවා. ඒ වෙලාවේ ඉදිරියට ගිය සහෝදරයෙක් තමයි, කසුන්. කසුන්ට අත් වෙච්ච ඉරණම තමුන්නාන්සේ දන්නවාද කියලා මම දන්නේ නැහැ. කසුන්ට අත් වෙච්ච ඉරණම තමුන්නාන්සේට දැන ගැනීම සඳහා මම මෙම ලියවිල්ල **සභාගත*** කරනවා.

යුද්ධය කාලයේ රටට ප්‍රවෘත්ති කියන්න, යුද්ධය දිනන්න රට ඇතුළේ මහා ජන බලවේගයක් හදන්න කොන්ද කෙළින් තියාගෙන උතුරට ගිය අපේ මාධ්‍ය මිත්‍රයා අද ගෙදර නවත්වලා; සේවයෙන් පහකර දාලා. ඒ විස්තර ඔබතුමාට දැන ගන්න මම ඒ විස්තර සඳහන් ලියවිල්ල සභාගත කළා. ඔහු සෞඛ්‍ය හේතූන් මත රෝහලක ප්‍රතිකාර ලබා ගන්න කොට, ඔහු ඒ සේවයෙන් පහකරලා.

ගරු ඇමතිතුමනි, මේ වෙලාවේ ස්වාධීන රූපවාහිනිය ratingsවලින් අංක හය ස්ථානයේ තිබෙන්නේ. තමුන්නාන්සේ ලාභදායකයි කියලා කොච්චර කිව්වත් අංක හය ස්ථානයේ ඉන්නේ. ලාභ නම්, සේවකයන්ට බෝනස් ටික දෙන්න. පව්. අපේ කාලයේ දුන්නා, රුපියල් 90,000ක බෝනස් එකක්. ගිය සැරේ දුන්නේ, රුපියල් 45,000යි. මේ සැරේ තවම දෙන වගක්වත් නැහැ. ඒ නිසා ලාභ තිබෙනවා නම්, ආයතනය හොඳයි නම් ඒ බෝනස් ටික දෙන්න කියලා මම මතක් කරනවා. සේවකයන්ගේ overtime කපලා. ඒ overtime පහසුකමත් ලබා දෙන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. ඒ වාගේම සමහර සේවකයන් අයින් කළා, නඩු තිබෙනවා කියලා. සුදර්මන් රදලියගොඩ එහෙම කෙනෙක්. නඩුවක් තිබෙනවා කියලා ඔහුව සේවයෙන් අයින් කළා. ඒ නඩුවෙන් ඔහු නිර්දෝෂියි කියලා නීතිපතිවරයාගේ තීරණය ඇවිල්ලා තිබෙනවා. ඒක නිසා ඒ අයට සාධාරණය ඉෂ්ට කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් මේ වෙලාවේ බොහොම ගෞරවයෙන් ඉල්ලනවා.

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

තමුන්නාන්සේලාට මතක ඇති, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, එතුමා මරන්න ආපු එල්ටීටීඊ තරුණයාටත් අභයදානය දුන්නා; මරණයෙන් නිදහස් කළා. හැබැයි, ජනාධිපතිතුමාගේ ප්‍රවෘත්තියක එක අකුරු පේළියක් වැරැදියට විකාශනය වුණා කියලා -එක වචනයක් නැති වුණා කියලා- සේවකයෙක් ගෙදර යවලා තිබෙනවා. ස්වාධීන රූපවාහිනියේ සේවය කරපු අසංක කියන සේවකයා ගෙදර යවලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාට මම කියනවා, තමුන්නාන්සේලා රටට එවැනි ආදර්ශ දෙනවා වාගේම මෙවැනි වැඩත් නතර කරන්න කියලා තමුන්නාන්සේගේ ආණ්ඩුවට කියන්න කියලා.

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කළා. එතුමා කථා කරන විට කිව්වේ, පසු ගිය ආණ්ඩු දෙක තුළ වූ ඝාතන ගැන විතරයි. මම එතුමාගෙන් අහනවා, "ආදරයේ උල්පත වූ අම්මා...." ගීතය ලියූ ප්‍රේමකීර්ති ද අල්විස් මරණ කොට, 'ඔහු මාධ්‍යවේදියෙක්' කියා සිතුණේ නැද්ද කියලා; සාගරිකා ගෝමස්ලා මරණ කොට 'ඒ අය මාධ්‍යවේදින්' කියා සිතුණේ නැද්ද කියලා. මා ද්වේශසහගතව නොවෙයි මෙය අහන්නේ. මා කියන්නේ, වරදක් වුණා නම් පිළිගැනීමේ හැකියාව අපට තිබෙන්න ඕනෑ කියායි. ඒ වරද පිළිගැනීමේ හැකියාව තමුන්නාන්සේලාට නැහැ. තමුන්නාන්සේලාට තිබෙන්නේ, විවේචන විතරයි. ඒ අතරත් තිබෙන්නේ, රාජපක්ෂ මේනියාව තමයි. ඒ භීතිකාව බොහොම ඉක්මනට සනීප වේවි කියා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ එක්කම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් පසු ගිය කාලයේ තිබුණා කියන එක තමුන්නාන්සේට මතක ඇති, ගරු අමාත්‍යතුමනි. ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය නැවත ඇති කරන්න කියා ඉල්ලීමක් කරලා ඔවුන් ලිපියක් භාර දී තිබෙනවා. මා ඒ ලිපියත් මේ වෙලාවේ භාර දෙනවා. ඒ ඉල්ලීම සඳහාත් සාධාරණය ඉෂ්ට කරන්න කියා මම තමුන්නාන්සේගෙන් බොහොම ගෞරවයෙන් යුක්තව ඉල්ලනවා, ගරු අමාත්‍යතුමනි.

ගරු සභාපතිතුමනි, මාධ්‍යයට තමයි මේ රට නිසි මාර්ගයකට හරවන්න පුළුවන්, නිසි දිශානතියට රට යොමු කරන්න පුළුවන් කාර්ය භාරය ඉටු කිරීමේ කාර්යයට උපරිමයෙන් දායක විය හැකි වන්නේ. නමුත් මාධ්‍ය ආයතනවල අද තත්ත්වය මොකක්ද? රූපවාහිනියෙන්, පුවත් පතින්, ගුවන් විදුලියෙන් නරඹන්නන්, කියවන්නන්, අසන්නන් ඇත් වෙමින් තිබෙන කාලයක්, මෙය. ඒ නිසා මාධ්‍යවේදින්ගෙන් මා ඉල්ලීමක් කරනවා, මාධ්‍ය හැසිරවීමේදී මිනිසාගේ රුචිකත්වය තේරුම් ගෙන නිසි ආකාරයෙන් කටයුතු කරන්න කියා. එවිට අපේ අරමුණ කරා රට ගෙන යන්නත් හැකියාව ලැබේවි. ඒ කටයුත්ත කරන්න මාධ්‍යකරුවාට හයිය ලැබෙන්නේ, ඔවුන්ට නිදහස් මනසක් ඇතිව කටයුතු කරන්න ලැබුණොත් විතරයි කියා මා විශ්වාස කරනවා. [බාධා කිරීමක්] 'මාධ්‍යකරුවාට නිදහසේ වැඩ කරන්න දෙනවා' කියා දුන් පොරොන්දුව ඉටු කරන්න කියා තමුන්නාන්සේලාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලනවා, ගරු අමාත්‍යතුමනි. මම ඒ ගෞරවනීය ඉල්ලීම කරනවා. ගරු අමාත්‍යතුමනි, ජාතික රූපවාහිනී සංස්ථාවේ ලාභයක් ගැන තමුන්නාන්සේ කිව්වා. මිලියන 120ක් කියා කිව්වා. එහි පාඩුව මිලියන 378ක්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ගරු සභාව නොමඟ යවන්න එපා. පාඩුව අවම කරගන්න විතරයි තවම ලැබුණේ. රාජ්‍ය සේවකයන්ට වැඩි කළ රුපියල් 10,000 වැටුප් නොගෙව්වා නම් තමයි ලාභ ලබන්න තිබුණේ. ඉදිරියේදී ලාභ ලබනවා කියා තමයි මා කිව්වේ. එය විකෘති කරන්න එපා.

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ඔබතුමා කිව්වා, මිලියන 120ක් විතර-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මම, එහෙම බොරු කියන කෙනෙක් නොවෙයි. මම කවදාවත් ඉල්ලා අස් කරගන්න වචන කියන්නේ නැහැ.

**ගරු එස්. ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ගරු අමාත්‍යතුමනි, මේ අවුරුද්දේ පාඩුව පසු ගිය අවුරුද්දටත් වඩා මිලියන ගණනක් වැඩි වෙලා තිබෙනවා. රුපියල් මිලියන 378ක් විධියට ඒ පාඩුව සටහන් වෙනවා. ස්වාධීන රූපවාහිනිය, ජාතික රූපවාහිනිය ස්වාභාවික මරණයකට ලක් කරන්න එපා කියන ඉල්ලීමත් මා කරනවා. ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේට මතක ඇති ස්වාධීන රූපවාහිනිය අංක 7 ස්ථානයේ තිබිලා අංක 1ට ආ බව. ඒ එන කොට මුළු රටේම පැවැති අවධානය වෙනත් පැත්තකට යොමු කළා, "බට්ටි" ටෙලි නාට්‍ය හරහා. "බට්ටි" ටෙලි නාට්‍ය කවුද කළේ කියා තමුන්නාන්සේ සොයාගන්න. ඒ වාගේම "පබා" ටෙලි නාට්‍ය හරහාත් ඒ වෙනස කළා. "පබා" ටෙලි නාට්‍ය කරපු අය අද ආයතනවලට වෙලා නිදහසේ නිකම් ඉන්නවා. ඔවුන්ගෙන් ප්‍රයෝජන අරගෙන ආයෙත් සැරයක් ITN එක හරි මඟට යොමු කරවන්න තමුන්නාන්සේට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු සභාපතිතුමනි, "පට්ට පල් බොරු දෙකක් කිව්වා" කියා එතුමා කිව්වා. ඒවා මොනවාද දන්නේ නැහැ?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එතුමා කියන්නේ, හිටපු අය ඔබතුමා එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන්න කැමැතියි කියලායි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒක මිසක්! ඒත් මම බැලුවා, මොකක්ද කියා!

[පූ.භා. 11.39]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු සභාපතිතුමනි, සෙනසුරාදා "දිවයින" පුවත් පතේ උදය විමලසිරි මැතිතුමා ඇඳපු කාටූන් එකක මම දුටුවා, "මීඩියා" කියන එක කාර් එකකට උපමා කරලා, ඒ කාර් එක service station එකකට දාලා තිබෙනවා. මා හිතන විධියට එයින් එතුමා අදහස් කරන්න ඇති, මෙතෙක් කල් මාධ්‍ය ගෙන ගිය විධිය වෙනස් කරලා යහ පාලන ක්‍රමවේදය මත මාධ්‍ය අලුත් ගමනක් යා යුතුයි

කියන එක. කොහොම වුණත් ඒ කාටූන් ශිල්පියා දැකපු ඇඟින් අද සමාජයත් දකිනවා. මාධ්‍ය නියාමනයක් එහෙම නැත්නම් ආචාර ධර්ම පද්ධතියක් පැවතිය යුතුය කියන කතිකාව අද සමාජයේ පවතිනවා.

ගරු සභාපතිතුමනි, මාධ්‍ය වාර්තාකරණයේදීත් විශාල ප්‍රශ්න රාශියකට මාධ්‍ය ආයතන මුහුණ දෙනවා. ඒකට හේතුව මොකක්ද? "ඉස්සර වෙලාම වාර්තා පළ කරන්නේ කවුද? ඉස්සර වෙලාම ලියන්නේ කවුද?" ආදි වශයෙන් තරගයක් මාධ්‍ය ආයතන අතර තිබෙනවා. ඒ වාගේම, එක් පැත්තකින් පෞද්ගලික ආයතනයක් ratings කරනවා. ඒ අය ලකුණු දෙනවා, එක් එක් වැඩසටහන්වලට. ඒ ratings දිහා බලායි මාධ්‍ය ආයතනවලට වෙළඳ දැන්වීම් එන්නේ. වෙළඳ දැන්වීම් නැතිව මාධ්‍ය ආයතනයක් ගෙන යන්න බැහැ. මාධ්‍ය ආයතන ගෙන යන්න බැරි වුණාම, ratingsවලට ගැළපෙන්න මාධ්‍ය ආයතනය ගෙන යන්න සිද්ධ වෙනවා. එවිට මාධ්‍යයෙන් කෙරෙන්න ඕනෑ යුතුකම ඉෂ්ට වනවාද කියන ප්‍රශ්නය අපට ආපසු පැන නඟිනවා.

විශේෂයෙන්ම මේ වාගේ රේස් එකක යනවිට මාධ්‍යයෙන් රජයක් බලාපොරොත්තු වන, ජනතාව බලාපොරොත්තු වන සමාජ ප්‍රගමනයට දායක වෙන්නට පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. මාධ්‍ය තුළින් අපේක්ෂා කරන ප්‍රමිතිය නිර්මාණය කළ හැකිද කියන ප්‍රශ්නයත් තිබෙනවා.

විශේෂයෙන්ම අද මේ සභාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් ලොකු ආන්දෝලනයක් ඇති කළේ, "මාධ්‍යවේදීන්ට බැන්නා, මාධ්‍යවේදීන්ට දොස් කිව්වා." කියලා. "පාර්ලිමේන්තුව ඇතුළතදී මාධ්‍යවේදීන්ට බැන්නා, නම් කියලා බැන්නා." කිව්වා. පසුගිය කාලයේ ලසන්ත වික්‍රමතුංග මහ දවල් පාරේදී ඝාතනය කරන විට, එතුමා ඇතුළු මාධ්‍යවේදීන් 13 දෙනෙකු මරන විට මේ අය නිදාගෙනද හිටියේ කියලා මම අහනවා. මාධ්‍යවේදීන්ට බැනපු එක ගැන ලොකුවට කථා කරනවා, තමුන් කළ මිනී මැරුම් -ඝාතනය- ගැන කථා කරන්නේ නැහැ. මේ රටේ ප්‍රගීත් එක්නැලිගොඩ වාගේ මාධ්‍යවේදීන් කී දෙනෙකු අතුරුදහන් වුණාද? පෝද්දල ජයන්ත, උපාලි තෙන්නකෝන් වාගේ මාධ්‍යවේදීන් 86 දෙනෙකු රට හැර ගියා. ඒවා ගැන කථා කරන්නේ නැහැ. බැන්නා, බැන්නා කිය කියා ලොකුවට කථා කරනවා. දැන් ලොකුම ප්‍රශ්නය බැණපු එක, මරන එක නොවෙයි, ගිනි තියන එක නොවෙයි.

මේ තැනට මාධ්‍ය පත් කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සැබෑ වෙනසක් ඇති කිරීමට ක්‍රියා කිරීම ගැන මම ජනමාධ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම ඕස්ට්‍රේලියානු ජාතික පෝල් කැඩ්මික් මාධ්‍යවේදීන්ගේ ආචාරධර්ම පිළිබඳව ලබා දෙන පොතේ මෙසේ සඳහන් කරනවා. රටක සාරධර්ම ආරක්ෂා කර ගැනීම, ප්‍රමිතීන් රැක ගෙන ප්‍රමිතීන් වර්ධන කර ගැනීමට කටයුතු කිරීම, වඩාත් නිවැරදි මාධ්‍ය වාර්තාකරණයක යෙදීම සහ විනිවිද පෙනෙන සුළු මාධ්‍ය භාවිතයක් ඇති කිරීම මාධ්‍යයේ වගකීමක් වෙන බව.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම ප්‍රමිතිය රැක ගැනීම ගැන කථා කරන විට-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී තිබූ කාලය අවසානයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
කථා කරන්නට වෙලාවක් නැහැ. කෙසේ වෙතත් මාධ්‍යවේදීන්ට ස්වාධීනව කටයුතු කිරීමේ අයිතියක් ලබා දෙන්නට ඕනෑ. ඒක මාධ්‍ය හිමිකරුවන් මුදල් යෙදවූවා කියන එකට යට වෙන්නට බැහැ. එහෙම නැත්නම් මාධ්‍යවේදීන් සුදු වැන්වලට යට වෙන්නට බැහැ. ජනමාධ්‍ය අමාත්‍ය ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාටත්, - ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා දක්ෂ ඇමතිවරයෙක්.- නියෝජ්‍ය ඇමතිතුමාටත් තිබෙන ලොකුම අභියෝගය තමයි වර්තමාන රජයේ යහ පාලන ක්‍රමවේදය තුළ මාධ්‍ය තුළින් සමාජ ප්‍රගමනයක් එන විධියට කටයුතු සලසා ගැනීම.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, නියෝජ්‍ය කාරක සභාපති ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මැතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, you may commence your speech.

[පූ.භා. 11.43]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබාදීම ගැන ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් ගණනාවක්ම දැඩි ලෙස බර දීලා විශාල වශයෙන් පෙන්නුම් කරන්නට උත්සාහ කළේ 2005 - 2014 කාලය තුළ මාධ්‍යවේදීන්ට සිදු වුණු අකරතැබ්බයන් සහ ඝාතනයන් ගැන. ඒ ඝාතනයන් සම්බන්ධයෙන් විශාල විග්‍රහයක් කළා. ජනමාධ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, "ඒ කාල පරිච්ඡේදය තුළ මාධ්‍යවේදීන් 13 දෙනෙකු ඝාතනය වෙලා තිබෙනවා." කියලා. ඒක වැරදියි. 13 දෙනෙකු නොවෙයි 26 දෙනෙකු ඝාතනය වෙලා තිබෙනවා. ඒ 26 දෙනාගෙන් 21 දෙනෙකු ද්‍රවිඩ මාධ්‍යවේදීන්. ඒ අය යුද්ධයේ උච්චම අවස්ථාවේදී යාපනය සහ කිලිනොච්චි ප්‍රදේශවලදී තමයි ඝාතනය වෙලා තිබෙන්නේ. ඉහතින් සඳහන් කළ කාලය තුළ 5 දෙනෙකු ඝාතනය වෙලා තිබෙන බව පිළිගන්නවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වමින් යනවා.

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් අපි මේ ගැන කථා කරන විට කොතරම් අසාධාරණද කියලා බලන්න. දේශපාලන වශයෙන් ඉලක්ක කර ගත්ත වැඩ පිළිවෙළකට පමණක් අවතීර්ණ වීම කොපමණ සාධාරණද කියලා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මේ ඝාතන 1981දී ආරම්භ කරන්නේ. මාධ්‍යවේදීන්ගේ ඝාතන සංස්කෘතිය ආරම්භ කරන විට, 1981 ජූනි මාසයේ 03වෙනි දා නවරත්නම් කියන ඡායාරූප මාධ්‍යවේදියා ඝාතනය වෙනවා. ඒක තමයි අපේ ඉතිහාසයේ පළමුවෙනි මාධ්‍යවේදී මිනී මැරුම - ඝාතනය- හැටියට සැලකෙන්නේ. දෙවෙනි ඝාතනය හැටියට සැලකෙන්නේ 1981 ඔක්තෝබර් 26වෙනි දින විමල් එස්. සුරේන්ද්‍ර කියන ඡායාරූප මාධ්‍යවේදියා ඝාතනය වීම.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ළඟ යම් විස්තරයක් තිබෙනවා. එය කියවන්න මට අවසර ලබාදෙන්න. මේකයි, ඒ විස්තරය:

"ඝාතනයක් බවට සැක කරන ලද දෙවැනි ඡායාරූප මාධ්‍යවේදියා ලෙස වාර්තා වන විමල් එස්. සුරේන්ද්‍ර මහතා 'දිවයින' පුවත් පතේ ඡායාරූප ශිල්පියෙකු වූ අතර, 'දවස', 'සිරිලක', 'ජනදින' සහ 'ඇත්ත' යන පුවත් පත්වල ද සේවය කොට ඇත. බොරැල්ලේ ක්‍රිෂාන්ත නම් ස්ටුඩියෝ එක පවත්වාගෙන ගිය ඔහු තවත් මාධ්‍යවේදී මිතුරන් කිහිපදෙනෙකු සමඟ එහි කාමරයක නතර වී සිටියේය. 1981 ඔක්තෝබර් මස 21වැනි දා එවකට රජයේ ප්‍රබල ඇමතිවරයකුගේ - මම නම කියන්නේ නැහැ. -

ඒ මහතාගේ කඳානේ පිහිටි නිවස අසල මහ පාරේ ඔහු ඝාතනයට ලක් විය. මෙය හදිසි අනතුරක් ලෙස පෙන්වීමට උත්සාහ කළද, එම ඝාතනය සැක සහිත විය. යතුරුපැදියක ගමන් කරමින් සිටි විමල් එස්. සුරේන්ද්‍ර රිය අනතුරකට ලක් වී ඇති බව ප්‍රකාශ කළද, ඔහුගේ යතුරුපැදිය පාර අයිනේ සාමාන්‍යයෙන් නවත්වන ආකාරයට පාරට මුහුණ ලා නවතා තිබුණේය. ඔහුගේ හිස් වැස්ම -හෙල්මට් එක- හමු වූයේ අදාළ දේශපාලනඥයාගේ නිවසෙනි. එමෙන්ම එදින රාත්‍රියේ ඔහු මිය ගිය පසු ඔහුගේ කාමරයට ගිය පොලීසිය උපාලි පුවත් පත් ආයතනය ඔහුට ලබාදී තිබූ නවතම කැමරා සහ සියලු ඡායාරූප -ප්‍රබල දේශපාලනඥයෙකුගේ බිරිඳක් අශ්වයෙකු පදින photograph එකක්ද ඇතුළුව- රැගෙන ගොස් තිබිණි"

ඒ අදාළ දේශපාලනඥයා -චූදිතයා වුණු එක්කෙනා- දැන් පාර්ලිමේන්තුවේ ඉන්නවා. පසු ගිය කාලයේදී දේශපාලන ඝාතන සිදු වුණා කියා හුවා දක්වන්න හදන එක මිථ්‍යාවක්. යම් ආකාරයේ ඝාතන පසු ගිය කාලයේ සිදු වුණා. හැබැයි, ඒ සිදු වූ දේවල් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනවා. එසේ පරීක්ෂණ පවත්වා නැති ඝාතන -මිනීමැරුම්- ගණනාවක් තිබෙනවා. ඒවා සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. 1981 සිට 1994 දක්වා කාලය තුළ -එවකට පැවතියේත් ඔබතුමන්ලාගේ රජයක්.- හැටදෙදෙනෙක් ඝාතනය වෙලා තිබෙනවා. මට ඒ අයගේ නම් කියන්න පුළුවන්. 1994 සිට 2005 දක්වා කාල පරිච්ඡේදය තුළ 37දෙනෙක් ඝාතනය වී තිබෙනවා. 2006 සිට 2010 දක්වා කාල පරිච්ඡේදය තුළ 26දෙනෙක් ඝාතනය වී තිබෙනවා. එයින් 21දෙනෙක් යාපනයේයි. 2010න් පසුව මේ වන තෙක් කිසිම ඝාතනයක්, එවැනි සිදුවීමක් වාර්තා වී නැහැ. එම නිසා ඔබතුමන්ලා ඉදිරිපත් කරන ඔය වාර්තා සාධාරණ නැහැ.

රිචර්ඩ් ද සොයිසා ගැන චිත්‍රපටයක් හදන්න කටයුතු සූදානම් කළ බව අප කවුරුත් දන්නවා. බන්දුල ගුණවර්ධන නිෂ්පාදකවරයා ඒ සඳහා සියල්ල සූදානම් කරන කොට තිබියදී, එය හදන්න එපාය කියා තහනමක් පැනවූවා. එම නිසා මේ ඝාතන ගැන කථා කරන එක හරි අමිහිරියි; අසික්කිතයි. හැබැයි, 2005 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය "ඝාතන යුගය" කියා හඳුන්වන එක සම්පූර්ණයෙන්ම මිථ්‍යාවක් කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ සඳහන් වන කාරණයක් ගැනයි මම ඊළඟට කියන්නේ. අපේ යුගයේදී එම පනත ගේන්න බැරි වුණා. අප ඒ ගැන සාකච්ඡා කළා. නමුත්, ඒ කටයුතු අවසන් කරගන්න බැරිව ගියා. කථානායකතුමාත් එවකට මන්ත්‍රීවරයකු වශයෙන් විටින් විට ඒ සම්බන්ධව හඬක් නැඟුවා. මේ පනත ගෙන ඒම සම්බන්ධව අමාත්‍යවරයාට මා ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මෙම පනතේ සඳහන් වන යම් යම් දේවල් පිළිබඳව අපට ප්‍රශ්න කීපයක් තිබෙනවා. එහි සඳහන් වන, ප්‍රවේශවීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා ගැන අපට ගැටලුවක් තිබෙනවා. මේ අවස්ථා යටතේ ඉතා වැදගත් කාරණා කීපයක් තිබෙනවා. මම ඒවා කියවන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5. (ආ) (ii) උපවගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "එම තොරතුරු යම් රජයක් හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් විසින් රහසිගතව ලබා දුන් ...."

මේ "රහසිගත ගිවිසුම්" කියන්නේ මොනවාද කියා විග්‍රහයක් කර නැහැ. අප දන්නා තරමින් පාර්ලිමේන්තු සම්ප්‍රදායක් තුළ රහසිගත ගිවිසුම් කියා දෙයක් තිබෙන්න විධියක් නැහැ. හැබැයි, එම පනතේ 5. (ඇ) උපවගන්තියේ මීටත් වඩා එහා ගිය තව කතන්දරයක් තිබෙනවා. මෙන්න මේ තොරතුරු හෙළිදරවු කිරීම තහනම් කියා සඳහන් වෙනවා.

එම පනතේ 5. (ඇ) උපවගන්තියේ සඳහන් වන අන්දමට:

(i) විනිමය අනුප්‍රමාණ හෝ විදේශ හුවමාරු ගනුදෙනු පාලනය කිරීමට;

(ii) බැංකු කටයුතු හෝ ණය කටයුතු විධිමත් කිරීමට;

(iii) බදු පැනවීමට;

(iv) භාණ්ඩ හා සේවාවල මිල ස්ථාවරව පවත්වා ගැනීම, ...

(v) විදේශ වෙළඳ ගිවිසුම්වලට ඇතුළත් වීමට, ...."

මෙහි තිබෙන, "විදේශ වෙළඳ ගිවිසුම්වලට ඇතුළත් වීමට" කියන කාරණය බලන්න. ඔබතුමන්ලා දැන් ETCA ගිවිසුම අත්සන් කරන්න සූදානමින් ඉන්නවා. මේ ගැන විවිධ මත, අදහස් තිබෙනවා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතින් ඒ සම්බන්ධව නීත්‍යානුකූලව ලබා ගැනීමට තිබෙන අයිතිවාසිකම අහවර කරලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව නැවත වරක් මා හිතනවා. සද්භාවයෙන් කරන මේ වැඩ පිළිවෙළට සැබෑ වටිනාකමක් දෙන්නට නම්, මේ දේවල් ඉදිරියට ගෙන යා යුතුයි. මොකද, විශේෂයෙන්ම මේ පිළිබඳව විශාල සැකයක් ඇතිවනවා. බැඳුම්කර ගනු-දෙනුවත් එක්ක බද්ධ වන කොට විනිමය පාලනය විශාල ප්‍රශ්නයක් බවට පත්වනවා. ඒ විනිමය පාලනය වසා ගැනීමට මෙය ගෙනාවාදෝ කියලා සාධාරණ සැකයක් අපට ඇතිවනවා. මොකද, ඒ කරුණු ටික පනතින් ආවරණය වෙනවා.

අද වනකොට ස්වර්ණවාහිනී ආයතනයේ අයිතිකරුවන් මාරු වෙලා තිබෙනවා. අයිතිකරුවන් මාරු වෙලා තිබෙන්නේ බැඳුම්කර ගනු-දෙනුවේ ලාභදායකත්වය තිබෙන උදවිය මේ වනකොට ගනුදෙනුව අවසාන කරමින් යන නිසාය කියන එක බොහොම පැහැදිලිව පෙනෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, you have five more minutes.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Thank you.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ තිබෙන කරුණු සම්බන්ධව මීට වඩා සැලකිලිමත් විය යුතුයි කියන එක මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

2015දී මෙම අමාත්‍යාංශයට ලබා දීලා තිබෙන මුදල්වලින් - allocations- පාවිච්චි නොකරපු ප්‍රමාණය -unutilized amounts - සියයට 40.7යි. මේ තොරතුරු මට එවා තිබෙන්නේ National Budget Department එකෙන්. මේ තොරතුරුවල තිබෙන සත්‍යතාව මම දන්නේ නැහැ. National Budget Department එකෙන් එවැනි වැරදි දත්ත දෙනවාද කියන එක මම දන්නේ නැහැ. සමස්තයක් හැටියට ගත් කල සියයට 40.7ක් මේ අමාත්‍යාංශය පාවිච්චි කරලා නැහැ. මේක ඒ තරම් හොඳ තත්ත්වයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මාධ්‍යවේදීන්ට උපකරණ ලබා දීම වැනි විශාල වැඩ පිළිවෙළවල් ගණනාවක් ඔබතුමා තුළ තිබෙනවා. Recurrent Expenditure යටතේ තිබෙන මේ මුදල් Capital Expenditureවලට දමන්න පුළුවන්. එහෙම යොදා මේ ඉදිරි මාස කිහිපය තුළ හෝ මාධ්‍යවේදීන්ගේ තිබෙන අඩු පාඩුකම් සකස් කිරීමට ඒ මුදල පාවිච්චි කරන්නය කියලා මා ඉතා වුවමනාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ස්වාධීන රූපවාහිනී ජාලය සම්බන්ධයෙනුත් ඔබතුමා සඳහන් කළා. නාලිකාවක පැවැත්ම සහ නාලිකාවක අරමුණ ඉෂ්ට කර ගැනීමට නම්, එය ලාභදායීව දුවන්න නම් rating කියන එක වැදගත් වනවා කියලා ඔබතුමාත් දන්නවා. අපේ කාලයේත් මේකට විවිධ කතන්දර තිබුණා. Ratings සම්බන්ධව නොයෙකුත් මතවාදයන් තිබුණා. හැබැයි, ඒක ලොකු ආයෝජනයක්. ඒ ආයෝජනය කරන්න පෞද්ගලික අංශය කොයි තරම් දුරට උත්සාහ කරනවාද කියන එක පිළිබඳව මට නම් විශ්වාසයක් නැහැ. ඔය කියන විද්වතුන් සියල්ල අරගෙන ඔබතුමාට එය කරන්න පුළුවන් නම් හොඳයි. භාණ්ඩාගාරයෙන් ඒකට වෙනම allocation එකක් ඉල්ලා ගන්න පුළුවන් නම්, ඒක ඉතාමත් සාධනීය කරුණක් හැටියට සලකන්න ඕනෑ.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 2013දී රුපියල් මිලියන 48ක් ලාභ ලැබුවා. 2014දී රුපියල් මිලියන 182ක් පාඩු ලැබුවා. 2015දී රුපියල් මිලියන 375ක් පාඩු ලබා තිබෙනවා. ස්වාධීන රූපවාහිනී ආයතනය විශාල වැඩ කොටසක් කළා. මූලධන වියදමින් - Capital Expenditure වලින්- විශාල ශාලා හදා විශාල වැඩ පිළිවෙළක් එදා ක්‍රියාත්මක කළා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව පිළිබඳව කථා කළා. ඒකේ කඩදාසි පිළිබඳවත් කථා කළා. මට මතක විධියට ඔබතුමා කිව්වා, ඉවත ලන කඩදාසිවලින් රුපියල් මිලියන 17ක් ද කොහෙදෝ හොයා ගන්න පුළුවන් වුණා කියලා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒ සකසුරුවම සම්බන්ධව මේ අවසාන ඉලක්කම් එතරම් සාධාරණයක් ඉෂ්ට නොකිරීමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආයතනය 2005දී රුපියල් මිලියන 21ක් ලාභ ලබා තිබෙනවා; 2013දී රුපියල් මිලියන 78ක් ලාභ ලබා තිබෙනවා; 2014දී රුපියල් මිලියන 71ක් ලාභ ලබා තිබෙනවා; කොළ කැලි පිට කාට හරි අච්චිමත් විධියට දීපු කාලයේ රුපියල් මිලියන 71ක් ලාභ ලබා තිබෙනවා. ඉවත ලන කඩදාසිවලින් රුපියල් මිලියන 17ක් අමතරව හොයා ගත් අවුරුද්දේ ලාභ ලබා තිබෙන්නේ රුපියල් මිලියන 3යි. ඔය කඩදාසි කැල්ලෙන් ලාභ ලැබීම කොයි ආකාරයෙන්ද අනික් ඒවායෙන් share වෙලා තිබෙන්නේ කියන එක සම්බන්ධයෙන් අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ, මා ළඟ තිබෙන්නේ 2015 වර්ෂයේ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Yes, Hon. Minister.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ කාලයේ තමයි සභාපතිවරයා දූෂිතයි, ඒ නිසා ඒ පුද්ගලයා ඉවත් කරන්න කියලා COPE එකෙන් කියපු කාලය. ඒකත් පොඩ්ඩක් කිව්වා නම් හොඳයි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඔව්, හරි. ඒක මේකට අදාළ නැහැ. මොකද, මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ ඔබතුමාගේ-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සමහර දවස්වල ශතයක්වත් ලැබිලාත් නැහැ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
හරි. එසේ තිබිලාත් රුපියල් මිලියන 71ක ලාභයක් ලබා තිබෙනවා. ඒකයි මගේ තර්කය. 2014 වර්ෂයේ රුපියල් මිලියන 71ක ලාභයක් ලබා තිබෙනවා. ඔබතුමා ඔය කියන හැම සකසුරුවමක්ම කරලා, ඔය කියන ඉතිරි කිරීම් කරලා රුපියල් මිලියන 71ක්ව තිබුණු ලාභය රුපියල් මිලියන 68කින් අඩුවෙලා තිබෙනවා. මොකද, රුපියල් මිලියන 3යි ලාභ ලබන්නේ.

ගරු ඇමතිතුමනි, මා මේ අවස්ථාවේදී ඔබතුමාට කියන්නේ, දත්ත ලබා ගන්නකොට බොහෝදුරට එක්කෝ ජාතික අය වැය දෙපාර්තමේන්තුවෙන්, එහෙම නැත්නම් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් දත්ත ලබාගෙන මේ පාර්ලිමේන්තුව නිවැරදි කරන්න උත්සාහ කළොත් හොඳයි කියන එකයි.

අවසාන වශයෙන්, මේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට වට්නාකමක් ලබාදෙන්න අවශ්‍ය නම්, මේ තහනම් කරලා තිබෙන, ලබා ගන්නට බැහැයි කියන අංශ දෙක සම්පූර්ණයෙන්ම නිවැරදි කරන්නය කියන ඉල්ලීම කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Karunarathna Paranawithana. You have six minutes.

[පූ.භා. 11.57]

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා ( පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Parliamentary Reforms and Mass Media)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාදයට ගන්නා අවස්ථාවේදී, පසු ගිය වසර පුරාවටම මේ රටේ නිදහස් මාධ්‍ය සම්ප්‍රදාය ආරක්ෂා කරන්නටත්, මාධ්‍යයේ අභිවර්ධනය වෙනුවෙන් වැඩ කටයුතු කරන්නටත් අපට සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් යුතුකමක් හැටියට අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලයටත්, අපේ ආයතනවල සභාපතිවරුන්, අධ්‍යක්ෂ ජනරාල්තුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටමත් පළමුවෙන්ම මාගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක මන්ත්‍රීවරයෙකු මේ සභාවේ කථා කරමින් ප්‍රකාශ කළා, අපේ ගරු ඇමතිතුමා පට්ටපල් අසත්‍ය දෙකක් ප්‍රකාශ කළාය කියලා. හැබැයි ඒ අසත්‍ය දෙක මොකක්ද, කියලා එතුමාගෙන් ඇහුවාම ඒ ගැන කිව්වේ නැහැ. මේකත් ජනමාධ්‍යයේ වාර්තා වෙන්න පුළුවන්. ඒ ගැන අහනකොට කියන්නේ නැහැ. ඒ විධියට විරුද්ධ පාර්ශ්වයේ වැඩිදෙනෙක් මේ විවාදයේදී ඉතාමත් බංකොළොත් මට්ටමට වැටුණාය කියන එක මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමාට මා ප්‍රකාශ කරන්නට කැමැතියි, තොරතුර දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ තොරතුරු දැනගැනීමේ අයිතිය සීමා වන අවස්ථාවන් පිළිබඳව එනම් පස්වන වගන්තිය පිළිබඳව අපි මේ සභාවේදී විවාද කළා. එවැනි සීමාවන් ගෙනෙන්නේ ඇයි කියා ඉතාම සාරගර්භ විවාදයක් අපි එදා කළා. එසේ විවාද කරලා තමයි ඒ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කරලා තිබෙන්නේ. ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමනි, එය මේ සභාවේ නැවත වතාවක් විවාදයට ගත යුතුයි කියලා තමුන්නාන්සේ කල්පනා කරනවා නම්, ඒකට අපි විධිමත්ව සූදානම් බව කියන්න කැමැතියි. ඒ සීමාවන් ගෙනැවිත් තිබෙන්නේ මහජන අධිකාරියක කිසිම දෙයක් වසා දමන්න නොවෙයි. ඒ පනතේ අවසානයේ සඳහන් කරලා තිබෙනවා, පුළුල් මහජන අවශ්‍යතාවක් විසින් සාධාරණීකරණය කරනු ලබන අවස්ථාවකදී ඒ සීමා කර තිබෙන තොරතුරු පවා දෙන්න අවශ්‍යයි කියලා. ඒ සම්බන්ධයෙන් තොරතුරු කොමිසමට බලය පැවරෙන බවත් මේ අවස්ථාවේදී කියන්න පුළුවන්. ඒ නිසා ඒ පනත ගැන ලොකුවට වාද විවාද කිරීම අවශ්‍ය වන්නේ නැහැ.

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා අදහසක් ඉදිරිපත් කළා, ප්‍රවෘත්ති විකාශය පිළිබඳ ස්වාධීන නියාමන යන්ත්‍රණයක් ඇති කරගැනීම සම්බන්ධයෙන් අපි ඉදිරිපත්කර තිබෙන යෝජනාව ගැන. එතුමා අහන්නේ, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රමාණවත් නැත්තේ මොකද කියලායි. මෙහිදී, ලංකාවේ මුද්‍රිත මාධ්‍යය නියාමනය සම්බන්ධයෙන් අඩු පාඩුකම් සහිතව හෝ වැඩපිළිවෙළක් තිබෙන බව විශේෂයෙන් මා කියන්නට ඕනෑ.

පසුගිය විවාදයේදීත් මා මේ ගැන සඳහන් කළා. ඒ තමයි, පුවත් පත් මණ්ඩල නීතිය සහ ශ්‍රී ලංකාවේ පුවත් පත් ආයතනය, පුවත් පත් පැමිණිලි කොමිසම. ඒවා අඩු පාඩුකම් සහිතව හෝ තිබෙනවා. නමුත් විද්‍යුත් මාධ්‍ය සම්බන්ධයෙන් කිසිම නියාමන නීතියක් ලංකාවේ නැහැ. එම නිසා අද වඩාත්ම ප්‍රශ්නකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ, විවාදයට තුඩු දීලා තිබෙන්නේ, ආන්දෝලනයකට පත්වෙලා තිබෙන්නේ විද්‍යුත් මාධ්‍යවල ක්‍රියාවලිය සම්බන්ධයෙනුයි. ඒ නිසා තමයි අමාත්‍යාංශය හැටියට අපි කල්පනා කළේ, සියලුම පාර්ශ්වයන්ගේ දායකත්වයෙන් -ආණ්ඩුවේ අදහසක් හැටියට නොවෙයි- එනම්, මාධ්‍ය ආයතනවල, මාධ්‍ය සංවිධානවල සහ මාධ්‍යවේදීන්ගේ දායකත්වයෙන් අදහස් ඒකරාශි කරලා, ලංකාවට ගැළපෙන සමස්ත ප්‍රවෘත්ති විකාශන නියාමන යන්ත්‍රණය මොකක්ද, අපි එකඟ වෙන්නේ මොන වාගේ නීතියකට ද, අපි බැඳී සිටින්නේ මොන වාගේ වග කීමකටද  කියන එකඟතාවක් අපි ඇති කර ගනිමුයි කියලා. ඒ වෙනුවෙන් තමයි ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා පසු ගිය දවසක කැබිනට් මණ්ඩලයට මේ සංකල්ප පත්‍රිකාව ඉදිරිපත් කළේ. දැන් ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි දැන් අපි අදහස් එකතු කරන්නේ. අපි බලන්නේ, සමස්ත ක්ෂේත්‍රයම ආවරණය වන ආකාරයේ නියාමන යන්ත්‍රණයක් සකස් කර ගැනීමටයි.

හැම ආණ්ඩුවක්ම ජනමාධ්‍යයත් එක්ක රණ්ඩු වෙනවාය, මේ ආණ්ඩුවත් ඒ රණ්ඩුව පටන්ගෙන තිබෙනවාය කියලා අපට චෝදනාවක් එල්ල කළා. ඒ සඳහා උදහරණයක් හැටියට පෙන්නුවේ, අගමැතිතුමා කරපු කථාව, ජනාධිපතිතුමා කරපු කථාව හා අමාත්‍යාංශ ලේකම්තුමා යවා තිබෙන ලිපි යනාදියයි. මා මේ අවස්ථාවේ ඉතා වැදගත් කාරණයක් කියනවා. කවුරු හෝ කෙනෙකුට මේ රටේ ව්‍යවස්ථාදායකය විවේචනය කරන්න පුළුවන් නම්, කවුරු හෝ කෙනෙකුට මේ රටේ අධිකරණය විවේචනය කරන්න පුළුවන් නම්, මේ රටේ විධායකය දිනපතා විවේචනය කරනවා නම්, තවත් අයට මේ රටේ ජනමාධ්‍ය සම්බන්ධයෙනුත් විවේචන තිබෙන්නට පුළුවන්. අග්‍රාමාත්‍යතුමා අහුමුළුවල කථා නොකර මේ පාර්ලිමේන්තුව තුළ, එහෙම නැත්නම් ප්‍රසිද්ධ සභාවක ඒ ඉදිරිපත් කළේ ජනමාධ්‍යය සම්බන්ධයෙන් තමන්ට තිබෙන විවේචනයයි. [බාධා කිරීමක්] එළියේදීත් කියලා තිබෙනවා නේ. ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව ඇතුළේදී විතරක් නොවෙයි, මහනුවරදීත් ඒ ගැන කියලා තිබුණාය කියලා නේ කිව්වේ. අගමැතිතුමා එතුමාට කරන්න තිබෙන කථාව, අහුමුළුවල කියන්නේ නැතුව, telephone කරලා කුණුහරුපයෙන් බණින්නේ නැතුව, කකුල් දෙකෙන් හිටගෙන මහා සභාවක් ඉදිරියේදී කෙළින්ම කිව්වා. ඒක නරකද? අගමැතිතුමා තමන්ට තිබෙන විවේචනය ප්‍රසිද්ධ සභාවක ඉදිරිපත් කළා. ජනාධිපතිතුමා තමන්ට තිබෙන විවේචනය ප්‍රසිද්ධ සභාවක ඉදිරිපත් කළා.

අමාත්‍යාංශ ලේකම්තුමා "දෙරණ" ආයතනය සම්බන්ධයෙන් ලියුමක් යවලා තිබෙනවා. එම නාලිකාව විකාශය කළ ප්‍රවෘත්තිය විකෘති කර තිබෙනවාද, නැද්ද කියලා අපි සොයා බලනවා. නීතියට අනුවයි අපි කටයුතු කරගෙන යන්නේ. ඒ වාගේම CNS නාලිකාව සම්බන්ධයෙන් යවා තිබෙන ලිපිය පිළිබඳව අධිකරණයේ නඩුවක් ගොනුවෙලා තිබෙනවා. අපි අධිකරණයේ තීන්දුවට ඉඩ දෙනවා. ඔය කථා කරන සමහර නාලිකාවල ඇත්ත චෝදනා මොනවාද කියලා අපි බලන්න ඕනෑ. ඒවා තමයි සමාගම් පනත උල්ලංඝනය කිරීම, මුදල් විශුද්ධිකරණය, ව්‍යාජ -forged documents හදන එක. සමහර අය එවැනි බරපතළ සාපරාධී ක්‍රියා කරපු ආයතන වෙනුවෙන් මේ සභාවේ පෙනී සිටීම ගැන අපට ලජ්ජයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මා තවත් කාරණයක් සඳහන් කරන්න කැමැතියි. පසු ගිය ජනාධිපතිවරණයේදී සහ මහා මැතිවරණයේදී අපට ජන වරමක් ලැබුණේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍ය අංගයක් වන මාධ්‍ය නිදහස තහවුරු කරන්නටයි. අපි උපරිම ආකාරයෙන් මාධ්‍ය නිදහස තහවුරු කරලා තිබෙනවා. අපි ඒකෙන් අඟලක්වත් පස්සට යන්නේ නැහැයි කියන එක මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි.

මාධ්‍ය සහ දේශපාලනය අතර නොනවතින ගැටුමක් තිබෙන බවත් මා කියන්න ඕනෑ. අනුර දිසානායක මැතිතුමා පෙන්වා දුන් ආකාරයට, සමහර විට ඒ ගැටුම අත්‍යවශ්‍ය ගැටුමක්. ඒකෙනුත් සමාජයට යහපතක් සිද්ධ වෙන්න පුළුවන්. ඒ අතර දේශපාලනය කරන උදවියත්, මාධ්‍යකරණයේ යෙදී සිටින උදවියත්, ඒ දෙගොල්ලන්ම නීතියේ පාලනයට එකඟ වුණු, වග කීමට එකඟ වුණු ශිෂ්ට සම්පන්න ප්‍රමිතීන් අත් පත් කරගත යුතුයි. එතකොටයි රටක් ඉදිරියට යන්නේ. ඒ සඳහා තමයි අපි මේ නියාමන යන්ත්‍රණය ආදී මෙම යෝජනා ටික ඉදිරියට ගෙන එන්නේ. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය මාධ්‍ය ආයතන පිළිබඳව බොහෝ වේලාවක් මේ ගරු සභාවේ කථා කළා. අපි සතුටු වෙනවා, එදා පඩි ගෙවාගන්න බැරුව, වසා දැමීමට ඔන්න මෙන්න තිබුණු ආයතන ටික අපි නැවත ගොඩ නඟලා තිබීම ගැන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ITN ආයතනය ගැන මේ ගරු සභාවේ කථා කළා. මාධ්‍යවේදියකු ගෙදර යැව්වාය කියලා එක් මන්ත්‍රීවරයෙක් කථා කළා. ගරු මන්ත්‍රීතුමනි, යහ පාලනය කියන්නේ, "පාලනයක් නැහැ"යි කියන එක නොවෙයි. සමහර අය මේක වරදවා වටහාගන්න හදනවා. මාධ්‍යවේදියෙකුට තමන්ගේ සේවා කටයුතු පිළිබඳව දිගින්-දිගටම අවවාද කරමින් ලියුම් ලියලා, නියමිත වේලාවට සේවයට වාර්තා කරන ලෙසට ලියුම් යවලා, ඊට පසුවත් ඒවා පිළිගන්නේ නැත්නම් අදාළ විනයානුකූල ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. එහෙම නැතුව මේ ආයතන පවත්වාගෙන යන්න විධියක් නැහැ. ITN ආයතනයේ වැටීමක් ගැන කථා කළා. ඔව්, සාමාන්‍ය මූල්‍ය පසු බෑමක් තිබුණා. එය පටන් ගත්තේ 2013දීයි; 2015දී නොවෙයි; 2016දී නොවෙයි. කළමනාකරණ මණ්ඩලය ඒ සම්බන්ධයෙන් නැවත වතාවක් විධිමත් ක්‍රියාමාර්ග ගෙන, නාස්තිය, දූෂණය අවම කරගෙන තිබෙනවා. වර්තමානයේ තිබෙන ratings අනුව සලකා බලන කොට, මේ වන විට ITN ආයතනය 4වැනි ස්ථානයට පත්වෙලා තිබෙනවා. ඒ ratingsවලත් ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා මේ කර්මාන්තය තුළ සියලුදෙනාටම එකඟ වෙන්න පුළුවන් ආයතනයක් හැටියට අපි ඒවා නැවත සකස් කරන්න උත්සාහ ගනිමින් සිටින බව මේ වේලාවේ සඳහන් කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාධ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරනකොට මේ කාරණයත් කෙටියෙන් හෝ සඳහන් කරන්නට ඕනෑ. අද ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය කියලා දෙකක් තිබෙනවා. ඒ දෙක අතර තිබෙන බෙදුම් ඉර මොකක්ද කියලා බොහෝ අයට වටහාගන්න බැරිවෙලා තිබෙනවා. සමාජ මාධ්‍යයත් ජනමාධ්‍ය තුළට දමලා කථා කරනවා. සමහර ප්‍රවෘත්ති වෙබ් අඩවි ඇත්තෙන්ම ප්‍රධාන පෙළේ ජනමාධ්‍ය හැටියට හැසිරෙන වෙලාවලුත් තිබෙනවා. තනිකරම පෞද්ගලික වග කීමක් තිබෙන සමාජ මාධ්‍ය හැටියටත් වැඩ කරගෙන යනවා. එම නිසා මේවා අතර ප්‍රශ්න සමුදායක් මතුවෙලා තිබෙනවා. ඒ වාගේම සමාජ මාධ්‍ය භාවිත කරන අපි, සමාජයක් හැටියට පරිණතවෙලා තිබෙනවාද කියලා මේ අවස්ථාවේදී සොයාබලන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම, සමාජ මාධ්‍ය බොහොමයක් ජාතික රාජ්‍යයේ නීති පරිමාව ඇතුළේ නියාමනය කර ගැනීමේ හැකියාව ඇත්තේත් නැහැ. අපේ දැනුමේ හැටියට, තාක්ෂණය කොච්චර වර්ධනය වෙලා තිබුණත් මාධ්‍ය භාවිත කරන ප්‍රජාවගේ සංස්කෘතික තත්ත්වය දියුණු වෙලා නැහැ. ඒ නිසා තමයි ලිංගික අපරාධ ඇතුළු අපරාධ වර්තාකරණයට, ජාතිවාදය, වර්ගවාදය අවුස්සන්න සමාජ මාධ්‍ය පෙළැඹී තිබෙන්නේ. ජනමාධ්‍ය භාරව වැඩ කරන අපට, ඒවා "සමාජ මාධ්‍ය" කියලා පැත්තකට දමලා නිකම් ඉන්න පුළුවන්කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Hon. Deputy Minister, please wind up.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

Okay. එම නිසා සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් වගකීම් සහගතව, ලොකු අවබෝධයකින් වැඩ කරන පරම්පරාවක් අද බිහි කරගත යුතුව තිබෙනවා. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයත්, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයත්, ජනමාධ්‍ය අමාත්‍යාංශයත්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයත් එකතු වෙලා වැඩ කටයුතු කරන බව සඳහන් කරමින්, නැවත වතාවක් මේ රටේ විශිෂ්ට අන්දමේ නිදහස් ජනමාධ්‍ය සම්ප්‍රදායයක් බිහි කිරීම සඳහා අපට සහයෝගය ලබා දුන් සියලු පාර්ශ්වවලට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙතැනින් අවසන් කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාරණයක් පැහැදිලි කරන්න තිබෙනවා.

මීට කලින් කථා කරපු ගරු මන්ත්‍රීවරයෙක් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ ලාභ පාඩු ගැන ඇහුවා. ඒ ආයතනය 2003-2014 දක්වා රජයට ගෙවන්න තිබුණු බදු මුදල්වලින් ශතයක්වත් ගෙවා තිබුණේ නැහැ. එතැන රුපියල් මිලියන 270ක් තිබුණා. එයින් රුපියල් මිලියන 199ක් අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙව්වා. ඊළඟට, රුපියල් 10,000ක දීමනාවත් අපි ගෙව්වා. මා ඒකත් මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The next speaker is the Hon. Anura Priyadharshana Yapa. You have eight minutes.

[අ.භා. 12.07]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඕනෑම රටක ඉතාම වැදගත් අමාත්‍යාංශයක් හැටියට සලකන ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳව ඉතාම කෙටියෙන් වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා. දීර්ඝ කාලයක් එම අමාත්‍යාංශය භාරව ක්‍රියා කරපු කෙනකු හැටියට මා ප්‍රථමයෙන්ම අපේ ගරු ඇමතිතුමාට සුබ පතන්න කැමැතියි. ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීනුත් මේ රටේ මහජනතාවගේ බලාපොරොත්තු ඉටු කරමින්, රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් විතරක් නොවෙයි, සාමාන්‍ය තොරතුරු සම්බන්ධයෙනුත් ජනතාව දැනුවත් කරමින් ඉතාම වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා.

ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ප්‍රධාන ආයතන කිහිපයක් තිබෙනවා. ඒ අතුරින් ජාතික රූපවාහිනිය සහ 'අයිටීඑන්' එක ප්‍රධාන හැටියට සලකන්න පුළුවන්. ඒ වාගේම ගුවන් විදුලි

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

සංස්ථාවත් දිගු කායක සිට ප්‍රවෘත්ති සහ වැඩසටහන් ඉදිරිපත් කරනවා. එම ආයතන තුනම ඉතාම විශිෂ්ට ආයතන තුනක් බව මා ප්‍රධාන වශයෙන්ම කියන්න කැමැතියි. ගුවන් විදුලි සංස්ථාව සතුව තිබෙන සම්පත් මිල කළ නොහැකියි. අද ලෝකයේ කිසිම රටක නැති 'තැටි' සංඛ්‍යාවක් ගුවන් විදුලි සංස්ථාවේ තිබෙනවා. මා ජනමාධ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ ඒ 'තැටි', 'සීඩී' බවට පත් කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. මා හිතන විධියට ඒක දැනටත් කෙරෙනවා ඇති. ඒක කළොත් ලංකාවේ දැන් ඉන්න අසන්නන්ට පැරණි ගීත රාශියක් ශ්‍රවණය කරන්න ඉඩ ප්‍රස්ථාව සලසා දෙන්න පුළුවන්.

මේ ආයතන පවත්වාගෙන යනවාය කියන එක හරි අමාරුයි. ඒක මමත් දන්නවා, අපේ කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිතුමාත් දන්නවා, අපි දෙදෙනාම ඒ වගකීමට උර දුන් අය නිසා. අපේ කාලයේදීත් යම් යම් ප්‍රශ්න තිබුණා. සමහර සභාපතිවරු වැඩ කළේ ඇමතිවරුන්ට උඩින්. එහෙම වැඩ කරපු අවස්ථා තිබුණා. ඒක මටත් වුණා, කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිතුමාටත් වුණා. [බාධා කිරීමක්] "ලේක්හවුස්" ආයතනය. [බාධා කිරීමක්] ඔව්. අසත්‍ය කියන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] ඔව්. ඒ යුගයේ ඔවුන් අපට ඉහළින් තමයි හිටියේ. ඒ නිසා කරන්න තිබුණු සමහර දේවල් අපට කර ගන්න බැරිව ගියා. [බාධා කිරීමක්] දැන් තත්ත්වය මා දන්නේ නැහැ. ඉදිරියේදී කියන්නම්, දැන් කොහොමද වෙන්නේ කියලා. ඒක දැන් කියන්න මට අමාරුයි.

මම කියන්නේ, ඒ ආයතන පවත්වාගෙන යෑමේදී රජයත් සමඟ තිබෙන සම්බන්ධතාව වාගේම, මහජනයාගේ රස වින්දනය සඳහා වන වැඩසටහන් සහ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී යම් ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ කියලායි. ඇත්තටම මා ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදීත් උත්සාහ කළා, සමහර නාලිකාවලට ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගෙන්වන්න. නමුත් මට ඒ වෙලාවේ ඒක කර ගන්න බැරුව ගියා. මම ඒක විවෘතව පිළිගන්නවා. රාජ්‍ය මාධ්‍ය සියලුම මන්ත්‍රීවරුන්ට සිය අදහස් ප්‍රකාශ කිරීම සඳහා විවෘත විය යුතු බව මම එදාත් ඇදහුවා, අදත් අදහනවා, හෙටත් මා එය විශ්වාස කරනවා. අපි අතර අඩුපාඩු තිබෙනවා. නමුත් පොදුවේ බලනකොට අපි සියලු දෙනාම බලාපොරොත්තු වෙන්නේ මේ රටේ ජනතාව අතරට හොඳ ප්‍රවෘත්තියක් ගෙන යන්නයි.

අද මාධ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට මා දකින්නේ, 'විවේචනය' හුඟක් දුරට ඉස්සර වී තිබීමයි. විවේචනය අවශ්‍යයි. නමුත් ඒ වාගේම, සංවර්ධන කාර්යයක තොරතුරු නිවැරදිව ඉදිරිපත් කිරීමත් අවශ්‍යයි. එතකොට තමයි රජය කරන කාර්යය ගැන බොහෝ දුරට කරුණු සොයා ගන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විශ්වාස කරන ලිබරල් ප්‍රජාතාන්ත්‍රික ක්‍රමවේදය අනුව මාධ්‍ය මොන විධියකටවත් ස්වාධීන වෙන්නේ නැහැ. පැහැදිලිවම රාජ්‍ය මාධ්‍යයෙන් නම්, රජයේ මතය යම් යම් ආකාරයකට ප්‍රකාශ වනවා. පෞද්ගලික මාධ්‍ය නම්, ඒ අයිතිකරුවන්ගේ මතය අනුව තමයි හැසිරෙන්නේ. මේක තමයි අපි දැකපු දේ. එහෙම නැහැ කියලා කවුරු හෝ කියනවා නම්, මුළුමනින්ම ස්වාධීන මාධ්‍ය ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න පුළුවන් කියනවා නම්, ඒක පිළිගන්න බැහැ. මේ ලෝකේ කොහේවත් එහෙම දෙයක් ක්‍රියාත්මක කරන්න බැහැ. මොකද, පවතින තත්ත්ව යටතේ තමයි මාධ්‍ය ආයතන ක්‍රියාත්මක වෙන්නේ. එක තැනක විතරක් නොවෙයි, ලෝකයේ හැම තැනම එහෙමයි. CNN ගත්තත්, BBC ගත්තත් මේවා යම් තරමකට ස්වාධීන බව ඇඟවුණත්, ඒවා ඒ ඒ රාජ්‍ය තුළ තිබෙන ආර්ථික ක්‍රමය බිඳ වැටීම සඳහා කොයි වෙලාවකවත් වැඩ කරන්නේ නැහැ. ධනපති ලෝකයේත් එහෙමයි. සමාජවාදී ලෝකයේත් එහෙමයි. මේක තමයි මම දකින ප්‍රධානම දේ.

මාධ්‍ය පෞද්ගලික වෙන්න පුළුවන්, රාජ්‍ය වෙන්න පුළුවන්, අපි ඒ මාධ්‍යකරුවා ආරක්ෂා කරන්න ඕනෑ. ඒ වාගේම මාධ්‍යකරුවාට දැනුම ලබා දෙන්න ඕනෑ. මම එදාත් විශ්වාස කරපු දෙයක් තමයි, අපේ රටේ මාධ්‍යකරුවා ද්වි භාෂා දැනුමක් ඇති අයෙක් විය යුතු බව. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, භාෂා දෙකක්. සිංහල දන්න කෙනෙක් දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගත යුතුයි. භාෂා තුනම ඉගෙන ගන්නවා නම් වඩා හොඳයි. එහෙම නැත්නම් මාධ්‍යකරුවා දැනුමෙන් පෝෂිත වෙන්නේ නැහැ. මේ දේ අපි තේරුම් ගන්න අවශ්‍යයි.

අපි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කර ගෙන අද ඉතාම හොඳ වැඩක් කරලා තිබෙනවා. මෙම පනත ගෙන ඒ ගැන දීර්ඝ කාලයක් කථා වුණා. නමුත්, විවිධ හේතු නිසා ඒක කල් ගියා. ඒකට විවිධ ප්‍රශ්න ඇති වුණා. අද වන කොට ඒක ක්‍රියාත්මක කරලා තිබෙනවා. මහ ජනයාට, රජයේ තොරතුරු දැන ගැනීමට, තොරතුරු ලබා ගැනීමට අවශ්‍යයි. අපි සියලු දෙනා අත ඔසවලා එම පනත සම්මත කළා. එම පනත සම්මත කිරීම ඉතාම විශිෂ්ට කාර්යයක් ලෙසයි මම සලකන්නේ.

වර්තමාන ඇමතිතුමාට ප්‍රශ්න තිබෙන බව මම දන්නවා. මොකද, රූපවාහිනී සංස්ථාව අපේ ආණ්ඩුව අවසාන කාලයේත් අලාභ ලැබුවා. ITN ආයතනය ලාභ ලැබුවා. ලේක්හවුස් ආයතනය බරපතළ ලෙස පාඩු වින්දා. දැන් ඔබතුමාට තිබෙනවා එම ආයතන ඉදිරියට ගෙන යන්න. ඒක අසීරු කාර්යයක් වුණත් මම දන්නවා, "ලේක්හවුස්" ආයතනය ආදියේ වර්තමාන සභාපතිතුමන්ලා ඒ ආයතන ඉදිරියට ගෙනයන්න විශාල උත්සාහයක් දරන බව. ඇත්තටම මම දන්නවා මේ අලාභය පටන් ගත්තේ අපේ රජයේ අවසාන භාගයේ බව. විවිධ පුද්ගලයන්ගේ විවිධ අත පෙවීම් නිසා ඒක සිදු වුණු බව මම මේ අවස්ථාවේදී අවංකව පිළිගන්නවා. අද මේ ආයතන ඉදිරියට ගෙන යමින්, අපේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය පුළුල් ලෙස විකාශනය කරමින්, අපේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය ජාත්‍යන්තර තත්ත්වයට ගෙන ඒමට ඔබතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් විශාල මහන්සියක් ගන්න බව අපි දන්නවා. ඒ සම්බන්ධව මම ඔබතුමන්ලාට ස්තුතිවන්ත වනවා. අපේ රටේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය අද හුඟක් පුළුල්, හුඟක් දියුණුයි. ඒ වාගේම මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

දැන් පාර්ලිමේන්තු විවාද රූපවාහිනියේ සජීවීව පෙන්වනවා. අදත් උදේ 9.30 - සවස 6.30 දක්වා ප්‍රචාරය වනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මමත් වාහනයේ යන කොට ගුවන් විදුලියට සවන් දෙනවා. ඒක හොඳ දෙයක්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔව්, ගුවන් විදුලියෙනුත් ප්‍රචාරය කරනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

අපි බොහෝ විට වාහනයේ යන කොට සවන් දෙනවා. ඒ වාගේ ලොකු වෙනසක්ම හුඟක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තව එක කාරණාවක් කියලා කථාව අවසන් කරනවා.

ලංකාවේ තිබෙන වෙබ් අඩවි පුද්ගලයන්ට ප්‍රහාර එල්ල කරනවා; මඩ ප්‍රහාර. මම හිතන හැටියට ඒක අසාධාරණයි. තමන්ට උත්තර දෙන්න බැරි පුද්ගලයන්ට මඩ ප්‍රහාර එල්ල කරනවා. මම මේ පාර්ලිමේන්තුව තුළත් ඒක දැකලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ උත්තර දෙන්න බැරි නිලධාරින්ට අපේම සමහර මන්ත්‍රීවරු විවිධාකාර චෝදනා එල්ල කරනවා. අපි මේවායෙන් ඉවත් විය යුතුයි. අපි සම්ප්‍රදායයක් ඇති කරනවා නම් පළමුව ඒක පාර්ලිමේන්තුවෙන් ඇති කරමු. ඒ ඇති කරන සම්ප්‍රදාය අනිවාර්යයෙන්ම අපේ සමාජය හොඳින් වැලඳ ගනීවි. සමාජය, අපි කරන හොඳ දේ ඒ විධියටත්, නරක දේ ඒ විධියටත් දකින්න පුරුදු වෙයි. "විවේචනය" නරක දෙයක් නොවෙයි. විවේචන උහුලන්න අපි පුරුදු වෙන්න ඕනෑ. වැරැද්ද අපි පිළිගන්න ඕනෑ. වැරදි නිවැරදි කිරීමට අපි උත්සාහ කරන්න ඕනෑ. මුළු සමාජ ක්‍රමයම නිවැරදි කරමින් මෙම අමාත්‍යාංශය ගෙන යන වැඩ පිළිවෙළ ඉතාම වැදගත් බව මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 12.15]

**ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment and Welfare)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති විෂය යටතේ ඉතාම කෙටි කාලයක් තිබෙන නිසා මම ඉතාම වේගයෙන් මගේ විෂයට බහින්නම්. මෙම විෂය ගැන කථා කරද්දී මුලින්ම ගයන්ත කරුණාතිලක හා කරුණාරත්න පරණවිතාන මැතිතුමන්ලා ගැන වචනයක් කියන්නට ඕනෑ. මම අල්ලස් හා දූෂණය පිළිබඳව ඉතාම විමසිල්ලෙන් සිටින කෙනෙක්. තවම මා ඔවුන් පිළිබඳව එවැනි දෙයක් සොයා ගන්නට අසමත් වෙලා තිබෙනවා.

අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමා නිළි මස්, දඩ මස් ඉල්ලන්නේ නැති, ටෙලි නාට්‍යවලින් පනස් දහස් ගණන් ගන්නේ නැති, ඇවන්ට් ගාඩ් වැනි ආයතනවලින් මුදල් ගත්තේ නැති චරිතවත් කැබිනට් ඇමතිවරයෙක් යටතේ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කියන විෂයට අදාළ ආයතන පිහිටා තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. මට කථා කිරීමට තිබෙන කාලය අඩු නිසා හැන්සාඩගත කිරීම සඳහා මා ලිපියක් ලියාගෙන ආවා.

මගේ කථාව පටන් ගන්න ඉස්සෙල්ලා මම මේ කාරණය ගැන කියන්න ඕනෑ. අද අන්තර්ජාලය තුළිනුයි මා මෙම ප්‍රවෘත්තිය දැනගත්තේ. ජනමාධ්‍ය නිදහස ඇති රටවල්වලින් ශ්‍රී ලංකාව අංක 24කින් ඉදිරියට ඇවිල්ලා කියලා සඳහන් වෙලා තිබුණා. 2015 ජනවාරි 8 වැනිදා සිට 2016 මේ කාල පරිච්ඡේදය දක්වා කිසිම මාධ්‍යවේදියකු ඝාතනය වෙලා නැහැ; කිසිම මාධ්‍ය ආයතනයකට ගිනි තියලා නැහැ; පැහැරගෙන ගිහිල්ලා නැහැ. ඒ නිසා අංක 24කින් අපේ රට ඉදිරියට ඇවිල්ලා තිබෙනවාය කියන ඒ ආරංචිය මා මුලින්ම කියන්නට ඕනෑ.

අද ජනමාධ්‍ය නිදහස ගැන කථා කරද්දී පොදු විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ අදහස් ප්‍රකාශ කළා. නමුත් ඒ අය කර තිබෙන දේවල් අනුව දිට්ඨ ධම්මවේදනීය කර්මය පළිසන් දීලා තමයි අවුරුදු දෙකකට කලින් ඒ අයට ගෙදර යන්න වුණේ. අපේ අනුර කුමාර සහෝදරයා ඔහුගේ කථාවේදී කිව්වා, ජනමාධ්‍යවේදීන් 26 දෙනෙක් පහුගිය යුගයේ දී ඝාතනය වුණාය කියලා. මාධ්‍ය ආයතන ගණනාවක් ගිනි තිබ්බාය කිව්වා. ඒවාට තමයි ජනතාවගෙන් නිසි දඬුවම් ලැබිලා, අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ඒගොල්ලන්ට ගෙදර යන්න සිද්ධ වුණේ කියන එක අපි කවුරුත් දන්නා දෙයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රජය විසින් ජනමාධ්‍ය නිදහස ලබා දී තිබෙනවා. අපි දැක තිබෙනවා, ඉස්සර මාධ්‍ය සාකච්ඡාවලට ගියාම, මාධ්‍යවේදියෙකුට ප්‍රශ්නයක් අහන්න කොන්දක් තිබුණේ නැහැ කියන එක. එහෙම ඇහුවා නම් ඔවුන්ට වෙන්නේ ලසන්ත වික්‍රමතුංගට වෙච්ච දෙයමයි. නමුත් අද අපි දකිනවා, කැබිනට් මණ්ඩල මාධ්‍ය හමුවලත් ජනතාව වෙනුවෙන් මාධ්‍යවේදීන් ප්‍රශ්න කරන ආකාරය. ඒ අතර හොරුන්, මිනීමරුවන් වෙනුවෙන් කඩේ යන මාධ්‍යවේදීනුත් ඉන්නවා. ජනතාව ඒ අය හඳුනා ගන්නට ඕනෑ. පහුගිය අවුරුදු දහයටම අපි දැකලා නැහැ, ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්තුමාව ඇඳපු කාටූන් එකක්. දාස හපුවලාන, සුමතිපාල ජෝතිපාල, පංකජ රුවින්ද වාගේ ඔය කියන හැම කාටූන් ශිල්පියෙක්ම ගෝඨාභය රාජපක්ෂ මහත්මයාව අඳින්න බය වුණා. එහෙම ඇන්දා නම් පහුවදාම සුදු වෑන් එකකින් යන්න ලැබෙනවාය කියන එක ඒ අය උපකල්පනය කර ගෙන තිබුණා. ඔන්න දැන් තමයි අඳින්නේ. ජනවාරි 8 වැනිදායින් පසුව තමයි අඳින්නේ. ඒක ගැනත් මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

යහපාලන ආණ්ඩුවේ ජනමාධ්‍ය නිදහසට එල්ල වූ බරපතළම කැළල තමයි Lanka-e-News වෙබ් අඩවියේ කතුවරයා අත්අඩංගුවට ගන්න ජාත්‍යන්තර වරෙන්තුවක් නිකුත් කිරීම. අපේ පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. තිලක් මාරපන මන්ත්‍රීතුමාත් ඉන්නවා. එතුමාත් මේ ගැන පැහැදිලි කරාවි. එවැනි අවස්ථාවක සාමාන්‍යයෙන් මොකක්ද කෙරෙන්නේ? නොතීසියක් එවනවා. නොතීසිය එවීමෙන් පසුව මොකක්ද වෙන්නේ? එම නොතීසිය භාර දුන් බවට තහවුරු වෙන්නට ඕනෑ. එහෙම තහවුරු වුණාට පසුව මොනවාද වෙන්නේ? සිතාසි යවන්න ඕනෑ. ඊටපසුව සිතාසිය ලැබුණු බවට තහවුරු වෙන්න ඕනෑ. ඊටපසුව වරෙන්තු යවන්න ඕනෑ. ඊටත් පසුව තමයි INTERPOL යන්නේ. එහෙමයි වෙන්නේ, නමුත් අද fast track ගිහිල්ලා අර විනිසුරුතුමිය එක පාරට steps තුන හතරක් පැනලා කෙළින්ම INTERPOL යනවා. නමුත් උදයංග වීරතුංගට වුණේ එහෙම නොවෙයි. මෙතැනදි අපට බරපතළ සැකයක් ඇතිවෙනවා, සඳරුවන් කියන මේ Lanka-e-News වෙබ් අඩවියේ කතුවරයාට මෙහෙම කරන්න හේතුව මොකක්ද කියලා. එතුමාගේ මාධ්‍ය භාවිතය ගැන මම පෙනී හිටින්නේ නැහැ. එතුමා අපටත් ගහලා තිබෙනවා. මෙතැන ඉන්න සියලු දෙනාටම ගහලා තිබෙනවා. ඒක වෙනම කථාවක්. නමුත් පසුගිය යුගයේ මේ ආණ්ඩුව පිහිටුවන්න සහාය දීපු, මේ ආණ්ඩුවට පක්ෂ, විපක්ෂ, හොර පොල් විපක්ෂය යන සියලු දෙනාගේම හොරකම්, මැරකම්, දූෂණ ගැන විවෘතව කියපු වෙබ් අඩවියක් තමයි Lanka-e-News වෙබ් අඩවිය.

ඒක තමයි තිත්ත ඇත්ත. රාජපක්ෂලාට එරෙහිව කථා කරන්න ලංකාවේ බොහෝ මාධ්‍ය ආයතන බිය වෙද්දී, අද අපේ ආණ්ඩුවේත් ඇමතිවරුන් වෙලා සිටින බොහෝ ඇමතිවරුන් බිය වෙද්දී, ඔවුන්ගේ දූෂණ හා මිනී මැරුම් හෙළි කරලා යහ පාලන ආණ්ඩුව හදන්න විශාල කාර්ය භාරයක් කළේ, Lanka-e-News ඇතුළු සමාජ ජාලා වෙබ් අඩවි බව කියන්න අපි ලජ්ජා වෙන්න ඕනෑ නැහැ. කරුණාකර මෙම ලිපිය හැන්සාඩගත* කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

Lanka-e-News ජාත්‍යන්තර වරෙන්තුව හරි අපූරු එකක්. එහි පිටුපස දෙදෙනෙක් ඉන්නවා. මෙන්න අහගන්න. කනගාටුයි කියන්න, එක්කෙනෙක් අපේ ආණ්ඩුවේම අධිකරණ ඇමතිතුමා. එතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැහැ නේද? අනෙක්

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු රන්ජන් රාමනායක මහතා]

කෙනා තමයි, මරණ දණ්ඩනයට නියම වූ දුමින්ද සිල්වාගේ නීතිඥ, හේමන්ත වර්ණකුලසූරිය. මේ දිනවල තිරගතවෙන "උසාවිය නිහඬයි" කියන චිත්‍රපටයේ කියනවා, එම දූෂිත විනිසුරුවරයා බේරා ගන්න "The Sunday Times" පුවත් පතට "Mudliar" කියා අන්වර්ථ නාමයකින් ලිපි ලියපු කළු චරිතයක් ගැන. අන්න ඒ කළු චරිතය වෙන කවුරුවත් නොවෙයි, දුමින්ද සිල්වාගේ නීතිඥ -අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ මාමණ්ඩියා වන- හේමන්ත වර්ණකුලසූරියයි කියන එක රන්ජන් රාමනායක වන මම අද ප්‍රකාශ කර සිටිනවා.

පසු ගිය සතියේ මෙන්න මෙහෙම අපූරු දෙයක් සිදු වුණා. ලංකා ඉතිහාසයේ පළමු වැනි වතාවට විනිසුරුවරියක් රාත්‍රියක හොරෙන් මරණ දණ්ඩනය නියම වූ death row එකේ ඉන්න දුමින්ද සිල්වා හිටපු මන්ත්‍රීතුමා හමු වෙන්න ගියා. ඊට පසුව ලංකාවේ නීතිය විහිළුවක් කරමින් මරණ දණ්ඩනය නියම වූ පුද්ගලයා ප්‍රතිකාර ගැනීමට පෞද්ගලික රෝහලකට ඇතුළත් කිරීම සඳහා එළියට ගෙනෙනවා. කෙසේ හෝ රෝහලට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කළ නිසා ඔහුට ආපසු යන්න සිදු වෙනවා. රටේ නීතිය විහිළුවක් කළ මෙම සිදුවීම ගැන මුලින්ම හෙළි කළේ, Lanka-e-News වෙබ් අඩවියයි. ඒ නිසා අද අධිකරණ සේවා කොමිසමෙන් එම විනිසුරුවරියගේ වැඩ තහනම් කර තිබෙනවා.

පුවත් පත් කිහිපයක් හැරෙන්න ලංකාවේ බහුතර මාධ්‍යයට මේක පුවතක් වෙන්නේ නැහැ. මහ බැංකුවේ බැඳුම්කර වංචාවට චෝදනා ලද අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා දින කිහිපයකට විදෙස් ගතවීම ගැන අපේ JVP මන්ත්‍රීවරුන් රටම පෙරළන්න කෑ ගැසුවා. මේ වේලාවේ අපේ ගරු බිමල් රත්නායක සහෝදරයා මේ ගරු සභාවේ සිටිනවා. ගරු අනුර දිසානායක සහෝදරයා මෙතැන ඉඳලා ගියා. විනිසුරුවරියක් death row එකට ගිහිල්ලා දුමින්ද සිල්වා මහත්මයා හමු වුණු එක ගැන එතුමන්ලාවත් කථා කෙරුවේ නැහැ. ඇයි, මොකද? "හිරු" නාළිකාවේ publicity හම්බ වෙන එකක් නැහැ කියන බයටයි එහෙම නොකළේ. ඇත්ත කථාව ඒක නේ. "බලය" වැඩසටහනට එන්න කියන්නේ නැහැ. "විමසුම" වැඩසටහනට එන්න කියන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව.

අද රටේ දේශපාලනඥයෝ පාලනය කරන්නේ කවුද? නාලිකා නේ. නාලිකාවලට ගියාම, අපට හොරෙන් මොනවාද කියන්නේ? සමහර නාලිකාවලට ගියාම, ගෙන්වපු එක්කෙනා කියනවා, "අනේ, රන්ජන් අයියේ, මේකට ආවා නම් කරුණාකරලා stock market ගැන කථා කරන්න එපා" කියලා. තව සමහර එකකට ගියාම කියනවා, "කරුණාකරලා, ඔබතුමා අර මරණ ගැන, කුඩු ගැන කථා කරන්න එපා, උකස් බඩු ගැන කථා කරන්න එපා" කියලා. මෙන්න මේ වාගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. සමහර මාධ්‍යවලට ගියාම කියනවා, race ගැන කථා කරන්නත් එපාය කියලා. මෙන්න මේ වාගේ ප්‍රශ්න හරියට තිබෙනවා. මෙවැනි ප්‍රශ්නත් එක්ක තමයි අද දේශපාලනඥයන් ඉන්නේ. දේශපාලනඥයන්ව මෙල්ල කරන්නේ, පාලනය කරන්නේ මේ ආයතනයි. මෙම ආයතනවල ඉන්න ප්‍රධානියා -proprietor- කරන business එක අනුව තමයි අපි ගිහින් එතැන හැසිරිය යුත්තේ.

මම එක නාලිකාවකට ගියා. එතැනට ගිහින් වාඩි වුණු ගමන් කිව්වා, "රන්ජන් අයියේ, එතනෝල් ගැන කථා කරන්න එපා" කියලා. එතකොට මම ඇසුවා, "හේතුව මොකක්ද?" කියලා. මලකෙළියයි. ඒකෙ අයිතිකාරයා එතනෝල් ගෙන්වනවා ලු. මේ වාගේ තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. මේ restrictions සියල්ලටම යටත් වෙලා තමයි, අපිට අද කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට පෞද්ගලික නාලිකාවල මාධ්‍ය නිදහස මොකක්ද? Stock market ගැන කථා කරන්න බැහැ, උකස් ගැන කථා කරන්න බැහැ. අද නාලිකාවලට මුලින්ම ඇවිල්ලා රටට සත්‍ය කියන්නේ කවුද? එක්කෝ හක් ගෙඩිකාරයෝ. එහෙම නැත්නම් "පෞෂුයි" අය. එක එක ජාතියේ කවටයෝ, සාස්තරකාරයෝ ඉන්නවා.

JVP සහෝදරයෝ එක්ක මම දිගටම වැඩ කරනවා. මම ඔවුන්ට හුඟක් ගරු කරනවා. මෙම ආණ්ඩුව ගෙන එද්දී දූෂිතයන් ගැන සංඛ්‍යා ලේඛන පිටින් ඉදිරිපත් කළේ ඔවුන්. මේ නාළිකාවල මාෆියාව ගැන බය නොවී, airtime එකට බය නොවී ජනතාව වෙනුවෙන් අපි කවුරුත් එකතු වෙලා මේ මාධ්‍යවල මාෆියාව ගැන කථා කරමු. අපිට දැන් facebook තිබෙනවා. බය වෙන්න දෙයක් නැහැ, අපි කෙළින් කථා කරමු. මේ නාලිකාවල ඉන්නා අයට මිනී මැරුම් චෝදනා තිබෙනවා. අපි ඒවා ගැන කථා කරමු.

ඒක තමයි වෙන්න ඕනෑ. මොකද, අපි මේ පාර්ලිමේන්තුවට ආවේ නාලිකාවලින් නොවෙයි. අපට ඡන්දය දුන්නේ ගමේ ජනතාවයි. ගමේ ජනතාව අපට ඡන්දය දීලා තිබෙන්නේ ඇත්ත කියන්නයි. නාලිකාවල තිබෙන ඒවා ඒ නාලිකාවේ ඇතුළටම ගිහින් නිවේදකයා හොල්මන් වෙන්න කියන්න පුළුවන් ශක්තියක් අපට තිබෙන්න ඕනෑ. මගේ කථා අදින් පස්සේ එක නාලිකාවකවත් දමන එකක් නැහැ. ඒක වෙනම කථාවක්. නමුත්, අපේ රටේ ලක්ෂ හයක් විතර භාවිත කරන Facebook ජාලයක් තිබෙනවා. මම ඇත්ත කියලා මැරුණාට කමක් නැහැ.

හිතලා බලන්න, මරණ දඬුවම හිමි වුණු කෙනෙක් පෞද්ගලික රෝහලකට ඇතුළත් කිරීම සහ විනිසුරුවරියක් පෞද්ගලිකව මුණගැසීම වාගේ දෙයක් සම්බන්ධයෙන් අනුර කුමාර දිසානායක සහෝදරයා කථා කරන්නේ කොහොමද කියලා. අපි නිකම් හිතමු, එතුමා ඒ ගැන කථා කළා නම් කොහොමද කථා කරන්නේ කියලා. “ලජ්ජයි, deal තිබෙනවා. අම්මපා මේ දෙගොල්ලෝ අතරම deal තිබෙනවා” සාමාන්‍යයෙන් එතුමා එහෙම නේ කියන්නේ. “අම්මපා උනුත් එකයි, මුනුත් එකයි. මුන් එක්ක deal තිබෙනවා.” මම කියනවා, මාධ්‍ය නාලිකා එක්ක මේ අයගෙත් deal තිබෙනවා කියලා. ඒ deal කියන්නේ වැරදි දෙයක් නොවෙයි. Publicity සම්බන්ධව ඒ අයට ප්‍රචාරය අවශ්‍යයි. මහ පක්ෂ දෙකේ deal තියෙනවාමනේ. ඒක කවුරුත් දන්නවා නේ. ඒක ඇත්ත. එතකොට මේ අයටත් deal තිබෙන්න බැහැ නේ. අපිට බණින අයට deal තිබෙන්න බැහැ. ඇයි මේ "හිරු" නාලිකාවේ, - ආ! ඒ නාලිකාවේ නම කියවුණා නේද? ඇයි ඒ නාලිකාවේ මේ දේවල් ගැන කථා කරන්න බැරි? ඒකත් පුළුවන් වෙන්න ඕනෑ නේ. ඒක තමයි නිර්භීත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ යුතුකම වෙන්න ඕනෑ. මෙයට එකම හේතුව මොකක්ද? ඒ පුද්ගලයාගේ පවුල මේ රටේ ප්‍රධාන මාධ්‍ය ජාලයක හිමිකරුවන් වීම. "ඕක ගැන කථා කළොත් අපේ news එක ඒ channel එකේ දාන්නේ නැහැ; අපිට බලයේ ඉන්න chance එකක් දෙන්නේ නැහැ." කියලා හිතනවා. එහෙම හිතන ප්‍රධාන පක්ෂ දෙකම මේ ගැන කථා කරන්නේ නැහැ. ඒකේ ඉන්න අය මේක හඳුන්වන්නේ "smart politics" කියලායි. මේකට "smart politics" කියලා කියනවා ලු. අනේ මන්දා, මට නම් මේ "smart politics" තේරෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Hon. Deputy Minister, you have only two more minutes.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

Sir, can you please give me a few more minutes?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
No. We have to suspend the Sittings at 12.30 p.m. for lunch.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Okay.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක "smart politics" කියන්නේ කොහොමද? කට්ටිය මට කියනවා, මේ වාගේ දේවල් කරලා මෝඩ වෙන්න එපා; channelsවල කට්ටියම "ෂේප්" කරගෙන "ෂේප්" එකේ වැඩේ කරගෙන යන්න කියලා. "හැමෝම 'ෂේප්' කර ගන්න; මේකට හොඳ මොත්තයක් තිබෙන්න ඕනෑ; පානිය තිබෙන්න ඕනෑ. ඒ හින්දා එක එක channelsවලට ගියාම ඒ ඒ විධියට ඉන්න" කියලා සමහර අය මට කියනවා. "ඒ ඒ බනිස් ගෙඩියට ඒ ඒ කෙසෙල් ගෙඩි." ඒ හින්දා ඒ ඒ තැන්වලට ගියාම ඒ ඒ විධියට set වෙන්න. කියමනක් තිබෙනවා නේ "වච්ලාගේ ගෙදර ගියා නම් එල්ලී ඉන්න ඕනෑ." කියලා. මට නම් ඒක තේරෙන්නේ නැහැ. මිනිස්සු ඡන්දයෙන් පරද්දලා ගෙදර යැව්වත් මේ වාගේ හොරුන්ගෙන් ඡන්දය එපා. මම කියන්නේ, කියන්න තිබෙන ඇත්ත කියන්න ඕනෑ කියලයි. දැන් බලන්න, පසු ගිය ටිකේ මේ අය මේ විධියට තමයි තමුන්ගේ දේශපාලනය කරලා තිබෙන්නේ.

දැන් මේ Lanka-e-News වරෙන්තුව පිටිපස්සේ ඉන්නේ කවුද? දුමින්ද සිල්වා ඉදිරියේ විනිසුරුවරිය. තමුන්ට චෝදනා කළ වෙබ් අඩවියට එරෙහිව තීන්දුව දෙන්නේත් මේ විනිසුරුතුමියමයි. එතුමියගේ වෙබ් එකේ තිබෙනවා, "අලි සොරකම් කළ විනිසුරුට ක්‍රියා කළා කියලා නීතිපතිතුමාට බැනලා තිබෙනවා" කියලා. ඒ හෙළිදරව්ව ගැන කිව්ව එක තමයි මේ විනිසුරුවරියට තිබුණු එකම ප්‍රශ්නය. මම හිතනවා, මෙවැනි දේවල් කරන්න හොඳ නැහැ කියලා. ජනාධිපතිතුමායි, අගමැතිතුමායි මේ වාගේ වෙලාවට- [බාධා කිරීමක්] ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කියන්නේ ලංකාවේ ජනතාවගේ ඔළු හදන, ඉදිරි මතය හදන, මනස හදන විෂයයක්. කරුණාකර මට තව පොඩි වෙලාවක් දෙන්න.

අපි දැක්කා, පසු ගිය කාලයේ මැක්රේ, පිලිපීනයේ ජනාධිපතිතුමාගෙන් අහනවා,- [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Deputy Minister, we have to suspend the Sittings at 12.30 p.m. for lunch. So, please wind up your speech now.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉක්මනින්ම අවසන් කරනවා.

අපේ මාධ්‍යවේදීන් මීට වඩා නිර්භීත විය යුතුයි කියලා මම මේ මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටිනවා. පසු ගිය කාලයේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා හිටපු "Top Ten" කියලා දූෂිතයන් හෙළිකරන programme එකක් තිබුණා. ඒ ගොල්ලන් මේ සේරම programme කරන්නේ අමාත්‍යාංශවල. කරුණාකරලා ඒ මාධ්‍යවේදීන්ට කියන්න, පුළුවන් නම් ඒ ඇමතිවරුන්ගේ ගෙවල් පොඩ්ඩක් පෙන්වන්න කියලා. මේ අයට තමන්ගේ ගෙවල් පෙන්වන්න බැහැ. මොකද, මේ ගෙවල්වල swimming pools දෙක දෙක තිබෙනවා. ඒ හින්දා ඔය මාධ්‍ය සාකච්ඡා, "Top Ten" හරි මොනවා හරි වැඩසටහනකින් දූෂිතයෝ හෙළිකරන්න නම්, කරුණාකරලා ඒ press conference මේ අයගේ ගෙවල්වල තියන්න කියන්න. මැක්රේ පිලිපීනයේ ජනාධිපතිගෙන් කෙළින් ප්‍රශ්න ඇසුවා වාගේ මෙහේ ඉන්න මාධ්‍යවේදීනුත් අද නිර්භීතවෙලා තිබෙනවා.

අද හොඳ මාධ්‍යවේදීන් ඉන්නවා. වික්ටර් අයිවන් ඉන්නවා; අසාම් අමීන් ඉන්නවා. "රාවයේ", ජනරංජන ඉන්නවා. ලසන්ත රුහුණගේලා ඉන්නවා. මෙවැනි හොඳ මාධ්‍යවේදීන් ඉන්නවා. තවත් හොඳ මාධ්‍යවේදීන් බිහි කරන්න. හිටපු ජනාධිපතිතුමා ඇවිල්ලා වුණත්, "අද මාධ්‍ය නිදහසක් නැහැ" කියලා කියද්දී, "ලසන්ත මැරුවේ ඔබතුමා නේද?" කියලා එතුමාගේ මුහුණට අහන්න පුළුවන් කොන්දක් තිබෙන මාධ්‍යවේදියෝ ඉන්න ඕනෑ. ඒ නිසා මම මේ අහ ගෙන ඉන්න මාධ්‍යවේදීන්ට කියනවා, දැන් ඝාතනය කරන්නේ නැහැ; සුදු වෑන් නැහැ; පුච්චන්නේ නැහැ; මරන්නේ නැහැ; ඒ නිසා නිර්භීතව අපෙන් වුණත් කෙළින්ම අහන්න පුළුවන් මාධ්‍ය කලාවක් ලංකාවේ බිහි කරන්න කියා. තමුන්නාන්සේලාට තමයි ලංකාව ඉදිරියට ගෙන යන්න පුළුවන්. තමුන්නාන්සේලා ඉදිරියේ දේශපාලනඥයෝ භය වෙන්න ඕනෑ; තැති ගන්න ඕනෑ. ඒ තත්ත්වයට ගෙනෙන්න. එතකොට තමයි ලංකාව හැදෙන්නේ කියන එක මේ අවස්ථාවේ කියමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Thank you. The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**114 වන ශීර්ෂය.- ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.288,575,000

**தலைப்பு 114. - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 288,575,000

HEAD 114.- MINISTER OF TRANSPORT AND CIVIL AVIATION
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 288,575,000

**176 වන ශීර්ෂය.- වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා**
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 255,255,000

**தலைப்பு 176.- துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்**
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 255,255,000

HEAD 176.- MINISTER OF PORTS AND SHIPPING
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 255,255,000

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The Votes of the Ministry of Transport and Civil Aviation, Heads 114, 306 and 307 and the Ministry of Ports and Shipping, Head 176 will be taken up now. The Hon. Sunil Handunnetti to move the cut, please.

[අ.භා. 1.00]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "2014 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ දී අද දින -2016 නොවැම්බර් 28වන සඳුදා- විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 114, 306, 307, 176 දරන වැය ශීර්ෂයන්ගෙන්, සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දින සාකච්ඡාවට ලක් කරන ආයතන අතරින්, "ශ්‍රී වරාය අධිකාරිය" වැදගත්ම ආයතනයක් කියා මා හිතනවා. ඒ නිසා, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය පිළිබඳව මුලින්ම අදහස් දක්වන්නට මා බලාපොරොත්තු වනවා. ගරු අමාත්‍යතුමාත් සභාවේ ඉන්න වේලාවේම ඒ ගැන කථා කරන්නට ලැබීම ගැනත් මා ඉතාම සන්තෝෂ වනවා.

අපේ රටේ භූමියේ පිහිටීම පිළිබඳව, අපේ රට ස්වාභාවිකව පිහිටා තිබෙන ආකාරය පිළිබඳව අප දන්නවා. අප කැමැති වුණත් අකමැති වුණත්, වාසනාවට හෝ අවාසනාවට අපට තිබෙන්නේ ලෝක සිතියමේ ඉතා වැදගත් ස්ථානයක්. ප්‍රධාන වශයෙන්ම වරායන්හි පිහිටීමත් එක්කයි වැදගත් වන්නේ. දෙවැනි ලෝක යුද්ධයේදී අපේ වරායන්ගෙන්, විශේෂයෙන්ම ත්‍රිකුණාමල වරාය ලෝක සිතියමේ ලකුණු වුණේ ඓතිහාසික වශයෙන් හා යුධමය වශයෙනුත් වැදගත් ස්ථානයක් හැටියටයි. ඒ වාගේම, අද ලෝකයේ බෙදී තිබෙන ආර්ථික කලාප අනුව ගත්තොත්, එක පැත්තකින් චීනය ආසියාවේ ආර්ථික බලවතෙක් වෙලා ඉන්නවා.

ඉන්දියාව අනෙක් පැත්තෙන් ආර්ථික වශයෙන් අපේ කලාපයේ ශක්තිය වර්ධනය කර ගන්න කටයුතු කරමින් ඉන්නවා. ලෝක ආර්ථිකයේ ඇමෙරිකාවට යුරෝපයට තිබෙන පංගුව අද ආසියාවට කේන්ද්‍රගත වෙමින් තිබෙනවා. ඒ ලෝක ආර්ථිකයේ පංගුව ආසියාවට කේන්ද්‍ර ගත වෙද්දී අපට හිමි කොටස අත්පත් කර ගන්න අපට තිබෙන ප්‍රධාන ස්ථාන තමයි වරාය සහ ගුවන් තොටුපොළ. මොකද, අපි දන්නවා අපේ තේ, රබර්, පොල් වෙන්න පුළුවන්; ඇඟලුම් කර්මාන්ත වෙන්න පුළුවන්; සුළු අපනයන භෝග කර්මාන්ත වෙන්න පුළුවන්; ඒවායින් අපේ ආර්ථිකයට එකතු කරන පංගුව ඉතා සුළු ප්‍රමාණයක් බව. හැබැයි, වාණිජමය වශයෙන් ගත්තොත්, අපේ වරාය පුළුල් වන තරමට, අපේ ගුවන් තොටුපොළවල් පුළුල් වන තරමට, ඒවායේ කාර්යක්ෂමතාව වර්ධනය වන තරමට වෙළෙඳ හුවමාරුවේදී ආර්ථික වශයෙන් අපට විශාල පංගුවක් අත්පත් කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා තමයි අපේ ආර්ථිකයේ හදවත වරාය හැටියට අපි සලකන්නේ. නමුත්, දැන් තිබෙන ප්‍රශ්නය ගත්තොත් අපට පෙනෙනවා, ලෝකයේ කන්ටේනර් -බහලු- මෙහෙයුම් කටයුතුවලදී අපි 26 වැනි ස්ථානය හිමි කරගෙන සිටියත් වරායේ පංගුව, අපේ රාජ්‍ය පංගුව, එහෙම නැත්නම් වරාය අධිකාරියේ පංගුව ගත්තොත් ක්‍රමානුකූලව ප්‍රතිශතාත්මකව කඩා වැටීමකට ලක් වෙලා තිබෙන බව. සංඛ්‍යාත්මකව කිව්වොත් 2001දී වරාය අධිකාරියට තිබුණු, බහලු මෙහෙයුම්වල පංගුව සියයට 86ක්. එතකොට පෞද්ගලීකරණය කරපු SAGT කොටසට සියයට 14යි තිබුණේ.

චීන වරාය පර්යන්තය හැටියට හඳුන්වන, Chinese-built port terminal හැටියට හඳුන්වන "CICT" කියන එක තිබුණේ නැහැ. 2010 වන කොට අපේ පංගුව සියයට 86 සිට සියයට 52 දක්වා අඩු වෙනවා. මෙහෙයුම් ගත්තොත්, විසිඑක්ලක්ෂ හැටහත්දහස් එකසිය හැත්තෑතුනකුයි තිබෙන්නේ. SAGT එක සියයට 48 දක්වා වර්ධනය වනවා. ඔවුන් සියයට 14 සිට සියයට 48 දක්වා වර්ධනය වනවා. 2015දී වරාය අධිකාරියේ පංගුව සියයට 44 දක්වා අඩු වෙනවා. SAGT එක සියයට 26 බවට පත් වෙනවා. අලුතින් ආරම්භ වුණු Chinese-built port terminal එක සියයට 30ක කොටසක් අත්පත් කර ගන්නවා. බරපතළම දේ, ඔවුන් ඒ සියයට 30 කොටස අත්පත් කර ගන්නේ අවුරුදු තුනක් ඇතුළත වීමයි. 2016 ජූනි වන කොට තත්ත්වය ගත්තොත්, අපේ පංගුව එහෙම නැත්නම් වරාය අධිකාරියේ පංගුව අද පාර්ලිමේන්තුවේ අපි කථා කරන පංගුව, කොටස සියයට 38 දක්වා අඩු වෙනවා.

2001දී සියයට 86ක්ව තිබුණු වරායේ බහලු අධිකාරිත්වය, අපේ බලය සියයට 38 දක්වා අඩු වෙලා තිබෙනවා. SAGT එක සියයට 28යි. චීන කොටසට, Chinese-built port terminal එකට සියයට 34ක් යනවා. එතකොට අපේ කොටස සියයට 38යි. මේක තමයි අපේ පංගුව. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොටස ගත්තොත් සියයට 38යි. දැන් මේකේ අපේ පංගුව වැඩි කර ගන්නේ කොහොමද? ඒක අත්පත් කර ගන්නේ කොහොමද? ප්‍රශ්නයක් තිබුණු බව ඇත්ත. ගරු ඇමතිතුමා අමාත්‍යාංශය භාර ගන්න කොටත් ප්‍රශ්නයක් තිබුණා. ඒක එතුමා මේ පාර්ලිමේන්තුවේත් කිව්වා. මොකද, අපේ වරාය අධිකාරියට තිබෙන කොටසේ විශාල නැව් ගෙනැල්ලා, කන්ටේනර් බාන්න පුළුවන්කමක් නැහැ. අපට තිබෙන කොටසේ ගැඹුර අඩුයි. ඒ නිසා කුඩා, කුඩා නැව් ගොඩක් ගෙනෙනවාට වඩා විශාල නැව් ගෙනැල්ලා අපේ මෙහෙයුම් කටයුතු වර්ධනය කර ගන්න ලොකු ගැඹුරක් සහිත ජැටියක් අපට ඕනෑ වුණා. එහිදී මිලියන 10,800ක් වියදම් කරලා මීටර් 18ක් ගැඹුරට සකස් කරපු නැඟෙනහිර පර්යන්තය ඒකට හොඳටම ප්‍රමාණවත්. ඇත්තටම අප කළ යුතුව තිබුණේ, Chinese-built port terminal එක පටන් ගන්න කලින්, චීන වරාය පර්යන්තය පටන් ගන්න කලින් නැඟෙනහිර පර්යන්තය තරගකාරී විධියට මෙහෙය වීමයි, ඒ කටයුතු ආරම්භ කිරීමයි. එහෙම නම් අපට වඩා වැඩි සාර්ථකත්වයක් අත්පත් කර ගන්න තිබුණා. නමුත්, එවකට තිබුණු අකාර්යක්ෂම පාලනය විසින් ඒකට අවශ්‍ය කරන දොඹකර -cranes- සවි කර ගන්නවත් බැරිව කටයුතු කරපු නිසා ඒක සාර්ථක කර ගන්න බැරි වුණා.

කෙසේ වුණත්, අද තිබෙන නැඟෙනහිර පර්යන්තය, මීටර් 18ක් ගැඹුර තිබෙන ඒ කොටස අපට සාර්ථක කර ගන්න පුළුවන් නම් අපේ පංගුව ශක්තිමත් කර ගන්න පුළුවන්. හැබැයි, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? අපි චීනයට දීලා තිබෙනවා කොටසක්. චීන වරාය පර්යන්තය SAGT එකට කලින්ම පෞද්ගලීකරණය කළා. දැන් ඉතිරි වෙලා තිබෙන එක ඉන්දියාවට දෙන්න යනවා. ඒකෙදි අපේ භාරය, වරාය අධිකාරියේ භාරය, අපේ පංගුව වෙන්නේ සියයට 15යි.

අප මොන වචනයෙන් කිව්වත්, දකුණු ආසියාවේ කෙනෙක් කිව්වත්, ආසියාවේ කෙනෙක් කිව්වත් අවසානයේ එන්නේ ඉන්දියාව. එතකොට අපට ඉතිරි වන්නේ මොකක්ද? වරාය අධිකාරියට සියයට 86ක් තිබ්බ බහාලූ මෙහෙයුම් කටයුතුවල හයිය, ශක්තිය අප දැන් සියයට 38ට බස්සාගෙනයි තිබෙන්නේ. එහි ප්‍රතිඵලය මා ඔබතුමාට පෙන්නුම් කරන්නම්. ඔබතුමා මේ කාරණා හොඳින්ම දන්නවා. විශේෂයෙන් මේ වෙනකොට වරාය අධිකාරියේ ආදායමට මොකද වෙලා තිබෙන්නේ? වරාය අධිකාරියේ ආදායම් තත්ත්වය මොකක්ද? ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ආදායම 2015දී මිලියන 40,164යි. මෙහෙයුම් වියදම මිලියන 30,377යි. එම නිසා බදුවලට පෙර පාඩුව මිලියන 14,169යි. අපි දැන් මොකද කරන්නේ? අප සේවකයෝ විශාල ප්‍රමාණයක් බඳවා ගෙන තිබෙනවා. විශාල ප්‍රමාණයක් නඩත්තු කරනවා. අප දැන් සේවකයෝ නඩත්තු කරනවා. අපේ මෙහෙයුම් වියදම මිලියන තිස්දාහක්. අපේ operationsවලින් ලැබෙන ආදායම එන්න එන්න අඩු වෙලා තිබෙනවා. ඇත්තටම වරාය අධිකාරිය පාඩු ලබන තත්ත්වයකින් පවත්වා ගෙන යන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඇයි හේතුව? අපි වරායක් හදා තිබෙනවා. ජැටි හදාගෙන ඉන්නවා. ඒකේ ඵලදාව බුක්ති විඳීමේ අයිතිය අද අපි ඉන්දියාවටයි චීනයටයි භාර දෙමින් තිබෙනවා. ඔවුන්ට පහසුකම් සැපයීම, ඔවුන්ට පහසුකම් සපයන සේවාවන් සැපයීම, ඔවුන්ට සේවකයින් සැපයීම, පඩි නඩි ගෙවීම, නඩත්තු කිරීම, කෑම බීම කොටස අපි භාර ගෙන තිබෙනවා. ඵලදාව නෙළීමේ කොටස ඒ අය කර ගෙන යනවා. මේකයි තිබෙන තත්ත්වය. ඉතාම බරපතළ තත්ත්වයකටයි අද අපේ වරාය ගමන් කරමින් ඉන්නේ කියන එක මා මුලින්ම අවධාරණය කරන්නට ඕනෑ. ආදායම් තත්ත්වය, නැව් පැමිණීමේ ප්‍රමාණය සඳහන් ලේඛනය මා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නැව් පැමිණීමේ ප්‍රමාණයේදී අපට පැහැදිලි ලෙස පෙනීයනවා, පැමිණි නැව් වැඩි පංගුව දැන් ගමන් කරමින් තිබෙන්නේ, වරාය අධිකාරියට වඩා SAGT සහ CICT කියන ජැටිවලට බව. 2014 වර්ෂයේදී වරාය අධිකාරියට නැව් 1926ක් ආවා. හැබැයි, 2015දී එය 1616යි. වරාය අධිකාරියට එන නැව් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. 2014දී SAGT එකට නැව් 855ක් ආවා. 2015දී එය 1026යි. වැදගත් දෙය මේකයි. 2014දී චීන වරායට -CICT එකට- නැව් 458යි ආවේ. 2015 වර්ෂයේදී නැව් 1101ක් ඇවිත් තිබෙනවා. සමස්තයක් හැටියට ගත්තොත් කොළඹ වරායට නැව් ඇවිත් තිබෙනවා. නැව් ආ ප්‍රමාණය වැඩියි. නමුත් එයින් වරාය අධිකාරියට ලැබිච්ච ඵලදාව -වරාය අධිකාරියට ලැබිච්ච ආදායම, වරාය අධිකාරියට ආව ප්‍රමාණය- අඩුවෙලා තිබෙනවා. මේ කාරණාවට මා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා. මෙයයි, වරාය අධිකාරිය මුහුණ දෙන ප්‍රධානම ගැටලුව වන්නේ. 2015 වර්ෂයේ මිලියන 14,156 ක් පාඩු ලබන තත්ත්වයකට මේ වරාය අධිකාරිය පත්වෙලා තිබෙනවා. මේක බරපතළ තත්ත්වයක්.

විශේෂයෙන්ම ශිවිසුම පිළිබඳව අපි දකිනවා. නැඟෙනහිර ජැටිය පෞද්ගලීකරණය කිරීම. නැඟෙනහිර ජැටිය අළෙවි කිරීම පිළිබඳව අදාළ විෂය භාර අමාත්‍යතුමාගේ ස්ථාවරය මොකක්ද? වරාය අධිකාරියේ ස්ථාවරය මොකක්ද? මේක දේශපාලනය වශයෙන් අල්ලස් දීමක්ද? චීනයට කොටසක් දෙනකොට අපි ඉන්දියාවට කොටසක් දෙන්න ඕනෑය කියා බලපෑමක් තිබෙනවාද? එතකොට අපේ ස්වාධීනත්වය මොකක්ද? ශ්‍රී ලංකා වරායේ ස්වාධීනත්වය මොකක්ද? ශ්‍රී ලංකා රජයේ ස්වාධීනත්වය මොකක්ද? විෂයභාර අමාත්‍යතුමා හැටියට ගරු අර්ජුන රණතුංග මැතිතුමා තමන්ගේ කථාවේදී හෝ තමන්ගේ ස්ථාවරය පැහැදිලි කරාවිය කියා විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා. මෙය වරාය අධිකාරියේ තීරණයක්ද? විෂය භාර අමාත්‍යතුමා හැටියට අර්ජුන රණතුංග අමාත්‍යතුමා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව තිබෙනවා.

ඒ කැබිනට් පත්‍රිකාවලට අනුව පළමුවැනි එකඟතාව තිබුණේ මෙහෙම නොවෙයි. මේ ආකාරයේ අළෙවි කිරීමක් කරන්න එකඟතාවක් තිබුණේ නැහැ. නමුත් අවසානයේ අද ඒ ක්‍රියාවලිය නතරවෙලා තිබෙන්නේ විෂයභාර අමාත්‍යතුමාගේ එකඟත්වය අනුවවත්, එහෙම නැත්නම් වරාය අධිකාරියේ අවශ්‍යතාව අනුවවත් නොවෙයි. ඊට ඉහළින් තිබෙන දේශපාලන ක්‍රියාවලියක් ඇතුළේ, දේශපාලන හස්තයක් විසින් මේක අළෙවි කිරීමට යොමු කර තිබෙනවා. ඒ නිසා මා ඉතා පැහැදිලි ලෙස විශ්වාස කරනවා, මේක බරපතළ තත්ත්වයක් බව. මේ ආර්ථිකය මෙහෙයවන්නේ කවුද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ මෙවැනි ක්‍රියාවලියන් පිළිබඳ තීන්දු තීරණ ගන්නේ කොහොමද කියන එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා. බරපතළ කාරණාවක් නිසා මේ ගැන මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. නැඟෙනහිර ජැටියේ වැඩ අවසන් කරන්න අපට තිබෙන්නේ දොඹකර ටික සවි කර ගන්න එක විතරයි. එහි පතුලේ ප්‍රශ්නයක් නැහැ; ගැඹුරේ ප්‍රශ්නයක් නැහැ. වරායේ වෙනත් ප්‍රශ්නයක් නැහැ. ඒ දොඹකර ටික සවි කර ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය හැටියට තරගකාරී ලෙස මෙහෙයවන්න පුළුවන්කම තිබෙද්දී මේක මේ ආකාරයට වෙන්දේසියට ලක් කරන්නේ ඇයි කියන එක අපට පැහැදිලි කර ගන්න තිබෙන කාරණයක්.

ඊළඟ කාරණය, පසු ගිය කළු දශකයේ වරායේ ක්‍රියාත්මක වුණු ගනුදෙනු විශාල ප්‍රමාණයක් තිබෙන බව ඔබතුමා දන්නවා. අදටත් ඒවා සම්බන්ධයෙන් කිසිම වග විභාගයක් නැහැ. විශේෂයෙන්ම සූරියවැව ජාත්‍යන්තර ක්‍රීඩාංගණය ඉදි කිරීම සම්බන්ධයෙන් ගනුදෙනු ගැන බලන්න. ගරු ඇමතිතුමනි, ලංකාවට කීර්තියක් ගෙනැවිත් දුන් ක්‍රීඩකයකු හැටියට ඔබතුමාට මේ පිළිබඳව විශේෂ වගකීමක් තිබෙනවා. අද සිදු වෙලා තිබෙන දේ බලන්න.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොන්ත්‍රාත්කරු China Harbour Engineering Company Limited ආයතනය පොලී සහිතව 2015 ජූලි මාසය වන විට රුපියල් මිලියන 5,027ක් ඉල්ලනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හම්බන්තොට වරාය හදන කොට ඒකට තෑග්ගක් හැටියට තමයි, මේ සූරියවැව ක්‍රීඩාංගණය හදන ගනුදෙනුව සිද්ධ වෙලා තිබෙන්නේ. අපි දැන ගන්න කැමැතියි, සූරියවැව ක්‍රීඩාංගණය හදන්න තිබුණු ශක්‍යතා අධ්‍යයන වාර්තාව මොකක්ද කියලා. මොන ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් අනුවද මේ කටයුතු කර තිබෙන්නේ? අද මේ ක්‍රීඩාංගණය කාගේ අයිතියේද තිබෙන්නේ? මේක ක්‍රිකට් ආයතනයේ වගකීමක් යටතේ තිබෙන එකක්ද; එහෙම නැත්නම් වරාය අධිකාරිය යටතේ තිබෙන එකක්ද; ඒක පාලනය වන්නේ කොතැනින්ද, කොහොමද කියන එක ගැන කිසිම වග විභාගයක් නැහැ. හැමදාම පොලිය එකතු කරමින් අද වන විට රුපියල් බිලියන 5ක් ඉල්ලනවා. China Harbour Engineering Company Limited එක දැන් පොලී එකතු කරනවා. මෙහිදී කිසිම පැවරීමක් හරියාකාරව සිද්ධ නොවී තමයි මුලින්ම ක්‍රිකට් ආයතනය ගෙවීමක් කළේ. ඒ වෙලාවේ ඒ ක්‍රියාවලිය කර ගෙන ගියේ එහෙමයි. ඒ විධියට තමයි ගනුදෙනුව සිද්ධ වෙලා තිබෙන්නේ. අද මේකට ක්‍රිකට් ආයතනය වගකියන්නේත් නැහැ; ශ්‍රී ලංකා වරාය අධිකාරිය වගකියන්නේත් නැහැ. ඒ නිසා ඇත්තටම අපි පැහැදිලි කර ගන්න කැමැතියි, මේ රුපියල් මිලියන 5,027ට වග කියන්නේ කවුද කියලා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනවාද, නැත්නම් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වග කියනවාද? සූරියවැව ක්‍රීඩාංගණය වෙනුවෙන් අවසානයේ මේ වන්දිය ගෙවන්නේ කවුද? ඒක ගෙවන්නේ මේ රටේ ජනතාවද කියන එකයි අපට පැහැදිලි කර ගන්න අවශ්‍යතාව තිබෙන්නේ.

---

*** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඔබතුමා දන්නවා, 2015 අවුරුද්දේ අවසානය වන විට රුපියල් මිලියන 37,186ක සමුච්චිත පාඩුවක් ලබමින් තිබෙද්දී, bunkering කටයුතු කරන්න සමාගමකට පැවරුවා කියලා. ඒ වෙනුවෙන් පෞද්ගලික බැංකුවකින් ඩොලර් මිලියන 28ක ණය මුදලක් ගන්න ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇප වුණා. පෞද්ගලික බැංකුවකින් ඩොලර් මිලියන 28ක ණය මුදලක් ගන්න ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇප වුණේ කාගේ අධිකාරයක් යටතේද? ඒ සඳහා තිබුණ බලතලය මොකක්ද? විශේෂයෙන් පාඩු ලබන bunkering ක්‍රියාවලියක් වෙනුවෙන් ඒ විධියට ඇප වෙන්න තිබුණු එකඟතාව මොකක්ද කියලා පැහැදිලි කර ගන්න කැමැතියි. ඔබතුමාගේ කථාවේදී ඒක පැහැදිලි කරාවිය කියලා බලාපොරොත්තු වෙනවා.

පසුගිය කළු දශකය තුළ මෙවැනි විශාල ප්‍රමාණයේ ගනු-දෙනු ගණනාවක් සිද්ධ වුණා. ඩෙන්මාර්කයේ 'නෝඩියා' බැංකුව ණයක් හැටියට දුන් යුරෝ මිලියන 46.9කුත් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් රුපියල් මිලයන 531කුත් වැය කරලා ඔලුවිල්වල නාවික වරායක් විවෘත කළ බව ඔබතුමා දන්නවා. ඒක කළේ ඉතා පැහැදිලිවම දේශපාලන වුවමනාවකටයි. ඒ සඳහා වෙන කිසිදු වුවමනාවක් තිබුණේ නැහැ. ඒ මුදල්වලින් ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කරන්න තිබුණා; ගාලු වරාය සංවර්ධනය කරන්න තිබුණා; කොළඹ වරාය පුළුල් කරන්න තිබුණා; අද විකුණන්න දමා තිබෙන නැඟෙනහිර ජැටිය පුළුල් කරන්න තිබුණා. අන්තිමට මොකක්ද වුණේ?

2013 විවෘත කළ ඔලුවිල් වරාය අද ක්‍රියාත්මක වෙනවාද? ඔලුවිල්වල වරායක් තිබෙනවා කියලා අද මේ රටේ මිනිසුන් දන්නවාද? ඔලුවිල්වල වරායට නැව් එනවාද? ඒක පාවිච්චි කරනවාද? එහෙම වරායක් තිබෙනවා කියලා සිතියමේවත් තිබෙනවාද? හේතුව මොකක්ද කියලා කල්පනා කර බලන්න. දැන් කියනවා, ඒ වරායේ මෝය කටේ, මුව දොරේ, වැලි පිරෙන නිසා වරාය පාවිච්චි කරන්න බැහැයි කියලා. සුළු පටු ගණනක් නොවෙයි, අපි ණයට ගත් යුරෝ මිලියන 46ක් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු මුදල් රුපියල් මිලියන 531ක් - රුපියල් කෝටි 53ක් - වැය කරලා හදලා විවෘත කළ වරාය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අඩු තරමින් අද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කමක් හැටියටවත් ඔලුවිල් වරාය සලකන්නේ නැහැ. ඔබතුමා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වත්කම් ලැයිස්තුව අරගෙන බලන්න, ඔලුවිල්වල වරාය වරායක් හැටියට තිබෙනවාද කියලා. ශ්‍රී ලංකා වරාය අයිති කාටද? ඔලුවිල්වල වරායක් හදලා තිබෙනවා. ඒ වරාය මේ රටට අයිතියිද? දේශපාලන වුවමනාවලට වරායවල් හදන්න බැහැ. තමන්ගේ නම් ගහ ගන්න එක් පැත්තකින් මාගම්පුර වරාය හදනවා; අනෙක් පැත්තෙන් ඔලුවිල්වල වරාය හදනවා. ගරු අර්ජුන රණතුංග අමාත්‍යතුමනි, ඔබතුමා ගම්පහ පැත්ත නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ආවේ හොඳ වෙලාවටයි. ඔබතුමාත් මුහුදක් තිබෙන ප්‍රදේශයකින් පාර්ලිමේන්තුවට ආවා නම්, ඔබතුමාගේ නම දාලා "රණතුංග වරාය" කියලා වරායක් කොහෙන් හෝ හදාවි. ඔබතුමා නම් එලෙස වරායක් හදයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මම කියන්නේ, දැන් එහෙම තමයි මේවා කෙරෙන්නේ කියන එකයි.

**ගරු මනෝ ගනේසන් මහතා (ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා )**
(மாண்புமிகு மனோ கணேசன் - தேசிய சகவாழ்வு, கலந்துரையாடல் மற்றும் அரசகரும மொழிகள் அமைச்சர்)
(The Hon. Mano Ganesan - Minister of National Co-existence, Dialogue and Official Languages)
ගම්පහටත් මුහුද තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගම්පහටත් අයිතියි නේද? ගම්පහ දිස්ත්‍රික්කයේ කොටසක් වන මීගමුව ප්‍රදේශයට මුහුදෙන් කොටසක් අයිති වෙනවා. ඔබතුමා එවැනි දෙයක් කරලා ඒ පාපකර්මයට හවුල් වෙයි කියලා, මම විශ්වාස කරන්නේ නැහැ. ඉතින්, මේක තමයි තිබෙන තත්ත්වය.

පසුගිය කාලයේ වුණු සිදුවීම් දෙස බලද්දී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය දේශපාලන වුවමනාවලට කටයුතු කරන ආයතනයක් හැටියටයි තිබුණේ. එහි දේශපාලන පළි ගැනීම් සිදු වුණා, නිලධාරින්ගෙන් පළිගැනීම් සිදු වුණා, වැඩ කරන මිනිසුන්ගෙන් පළිගැනීම් සිදු වුණා. එපමණක් නොව, දේශපාලන වේදිකා හදන, ඒ වේදිකාවලට බට සපයන, රැස්වීම්වලට සෙනඟ සපයන ආයතනයක් බවට පත් වෙලා තිබුණා. අද ඒ තත්ත්වය නැති එක ගැන අපි සතුටු වනවා. නමුත් මම කියනවා, ඒ අයුරින් සිදු වුණු දේ ලියැවිලා වෙලා තිබෙන ඉතිහාසයේ පිටුව එහෙම් පිටින්ම වහලා දාන්න බැහැ කියලා. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, මම ඉතා පැහැදිලි ලෙස ඔබතුමාට කියා සිටින්නේ, මේ ආර්ථිකයේ සවිය, ශක්තිය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය අද එය පාඩු ලබන තැනක් බවට පත් වෙමින් තිබෙන බවයි. මෙය ගොඩගැනීමට යම් ක්‍රියාමාර්ගයන් ගැනීමට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව වැඩි වැඩියෙන් දැනෙන කාලයක තමයි අද අපි මෙවැනි විවාදයකට සම්බන්ධ වෙලා තිබෙන්නේ. මම ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිළිබඳ මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත්, ඇමතිතුමාගේ විශේෂ අවධානය මේ කාරණය කෙරෙහි යොමු වෙයි කියලා මම බලාපොරොත්තු වනවා. මේ ජැටිය විකිණීම සම්බන්ධයෙනුත්, දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙනුත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව අවධාරණය කරමිනුයි මම කථා කළේ.

ඒ විතරක් නොවෙයි, පසුගිය කාලයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවිධිමත් විධියට විශාල වශයෙන් සේවකයන් බඳවා ගන්නවා අපි දැක්කා. එවැනි අවිධිමත් බඳවා ගැනීම් විශාල ප්‍රමාණයක් සිදු වුණා. ඒක නිසා අවසානයේ සිදු වුණේ, ඉන්න නිලධාරින්ව වැඩ බලන, වැඩ ආවරණය කරන තත්ත්වයට පත්වුණු නිලධාරින් වැඩි ප්‍රමාණයක් සිටීමයි. නමුත් වැඩ බලන අයට, වැඩ ආවරණය කරන අයට නිසි පරිදි උසස්වීම් ලැබිලා නැහැ. ඒ නිසා හැම ක්ෂේත්‍රයකම සේවය කරන නිලධාරින්ට කලකිරීමක් ඇති වෙලා තිබෙනවා. මම හැම අංශයක් ගැනම වෙන වෙනම කියන්න යන්නේ නැහැ. ඒ නිසා, අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වනවා, මේ බඳවා ගැනීම් පිළිබඳව, උසස්වීම් පිළිබඳව ක්‍රමවත් පටිපාටියක් හදයි කියලා. මොකද, ක්‍රමවත්ව හදපු වැඩ පිළිවෙළක් තවම ක්‍රියාත්මක වන්නේ නැහැ. ගරු අර්ජුන රණතුංග අමාත්‍යතුමනි, මෙම විෂය භාර ඇමතිතුමා හැටියට ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු වෙයි කියලා මම බලාපොරොත්තු වනවා.

ඔබතුමා මෙම තනතුරේ වැඩ භාර ගත්ත ගමන් මුලින්ම කිව්වෙත්, "පක්ෂ භේදයකින් තොරව පසු ගිය කාලයේ සිදු වූ දේශපාලන පළිගැනීම් පිළිබඳව කාටත් සාධාරණයක් ඉෂ්ට කරනවා" කියලායි. ඒ නිසා මෙම දේශපාලන පළිගැනීම් පිළිබඳව ක්‍රියා කරන කමිටුවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෘත්තීය සමිතිවලින් බලාපොරොත්තු වුණා. නමුත්, වෘත්තීය සමිති පැත්තෙන් අපිට ආරංචි වෙන්නේ තවමත් ඒක නිසියාකාරව සිදු වෙන්නේ නැති බවයි. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු වෙයි කියලා මම බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ අමාත්‍යාංශය වන ප්‍රවාහන අමාත්‍යාංශය පිළිබඳව

කරුණු කාරණා කිහිපයක් අවධාරණය කරන්න බලාපොරොත්තු වනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමනි, දුම්රිය ධාවනය සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙන බව ඔබතුමා දන්නවා. හැබැයි, මේ සියලු දෙයක් සම්බන්ධයෙන්ම කථා කරන කොට අපට කියන්න වෙලා තිබෙන්නේ ඉන්දියාව ගැනයි, චීනය ගැනයි. ඒක තමයි කනගාටුව. අද ප්‍රවාහන අමාත්‍යාංශය ගැනත්, වරාය ගැනත් කථා කරන කොට කථා කරන්න වෙලා තිබෙන්නේ අපේ රට ගැන නොවෙයි.

ඔබතුමා දන්නවා, මහව සිට අනුරාධපුර දක්වා දිවෙන රේල් පාර කිලෝමීටර් 67කුත්, අනුරාධපුර සිට වවුනියාවට කිලෝමීටර් 29කුත් රේල් පාරවල් නවීකරණය කිරීම සඳහා ඉන්දියානු සමාගම්වලට දෙන්න කටයුතු කරමින් ඉන්නා බව. නමුත්, මේ වන විට මහව-අඹන්පොළ රේල් පාර කිලෝ මීටර් 70ක් අපේ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් හැදුවා කියලා ඔබතුමා දන්නවා. ඒ සඳහා රුපියල් මිලියන 700ක් පමණ වියදම් වුණා. නමුත්, හැදුවා. අද වන විට වෙලා තිබෙන්නේ මොකක්ද? කිලෝ මීටරයක් පමණ වන දුම්රිය මාර්ගයක් හදන්න දළ වශයෙන් රුපියල් කෝටි 34ක් පමණ වැය කරනවා. මේ වන විට, මහව සිට අඹන්පොළ දක්වා රේල් පාර පැයට කිලෝ මීටර 70ක, 80ක වේගයෙන් ධාවනය කරන්න පුළුවන් වන පරිදි ඉතා හොඳ ප්‍රමිතියට දුම්රිය සේවකයන්ම හදලා තිබෙනවා. දුම්රිය මාර්ග නවීකරණය කිරීමෙන් අපේක්ෂා කරන්නේ, පැයට කිලෝ මීටර් 80ක වේගයෙන් යන්න කියලායි. දුම්රිය දෙපාර්තමේන්තුව විසින්ම මහව සිට අඹන්පොළට හදලා තිබෙන රේල් පාර වෙනස් කරලා, නැවත මහව සිට වවුනියාවටම රේල් පාර හැදීමේ කටයුත්ත ආරම්භ කරන්න හදනවා. මෙම ව්‍යාපෘතිය ඉන්දියානු සමාගම්වලට ඔබතුමන්ලා දෙන්න හදනවා. ඉතින්, අපට අහන්න තිබෙන්නේ, "ඇයි මේක ඉන්දියාවටම දෙන්න යන්නේ?" කියලායි.

මොකද, මහව සිට වවුනියාවට යනකොට අඩි 100, අඩි 120 දිග පාලම් දහයකට වැඩිය තිබෙනවා; බෝක්කු සිය ගණනක් තිබෙනවා. හැබැයි, මේ මොනවාවත් එම ටෙන්ඩරයට අදාළ වන්නේ නැහැ. එහෙම ටෙන්ඩරයට අදාළ වෙන්නේ නැතිව, මේ හරස් මාර්ග විශාල සංඛ්‍යාවක් එහෙමම තිබෙද්දී මෙම ව්‍යාපෘතිය ඉන්දියාවට දීලා මේ කටයුත්ත ඉන්දියාවෙන් පමණක් කර ගන්න ඔබතුමන්ලා අපේක්ෂා කරනවා. එලෙස ඉන්දියානුකරණය වීමේ හේතුව මොකක්ද යන්න පිළිබඳව අපි පැහැදිලිව ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. විශේෂයෙන්ම මහව-අනුරාධපුරය දක්වා රේල් පාරේ දිග කිලෝ මීටර් 67යි, අනුරාධපුර-වවුනියාව රේල් පාරේ දිග කිලෝ මීටර් 29යි, සම්පූර්ණ රේල් පාරේ දිග කිලෝ මීටර් 96යි. මේ සඳහා ඩොලර් මිලියන 226කට ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ කියන්නේ, දළ වශයෙන් රුපියල් මිලියන 33,900ක්. මේ විධියට ගත්තොත් එක කිලෝ මීටරයකට රුපියල් මිලියන 353ක් යනවා.

එක කිලෝමීටරයක් හදන්න රුපියල් කෝටි 35ක් යනවා. අපි ඔබතුමාගෙන් අහන්නේ, ඉන්දියාව පැත්තෙන්ම බලන්නේ නැතුව -උතුරු පළාත ඉන්දියාවට කිට්ටු නිසා එහෙම කරනවාද කියලා මා දන්නේ නැහැ- මීට වඩා විවෘත ක්‍රියාවලියකට යන්න බැරි ඇයි; මීට වඩා විවෘත ක්‍රමවේදයකට යන්න බැරි ඇයි; මීට වඩා සාධාරණ ක්‍රමයකට යන්න බැරි ඇයි කියලායි. අපේ රටේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන්ට, දුම්රිය දෙපාර්තමේන්තුවේ අනෙකුත් සේවකයන්ට පැයට කිලෝමීටර් 70ක වේගයකින් යන්න පුළුවන් විධියට රේල් පාර හදන්න හැකියාව, ශක්තිය තිබෙනවාය කියලා ඔප්පු කරලා තිබියදී, ඔබතුමන්ලා ඉන්දියාව දිහා බලාගෙනම මේ කටයුතු කරන්නේ ඇයි කියලා අපට තේරෙන්නේ නැහැ. ඇත්තටම මේක අපේ රටට විශාල ප්‍රමාණයක වැය බරක්; ණය බරක් ගෙනෙන ව්‍යාපෘතියක් බවට පත් වෙනවා.

ඒ විතරක් නොවෙයි. මාතර - කතරගම දුම්රිය මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් දැනටම අපට අත් දැකීමක් තිබෙනවා. මාතර - කතරගම දුම්රිය මාර්ගය ඉදිකිරීමේ දුර කිලෝමීටර් 26.75යි. ව්‍යාපෘතියේ වියදම ඇමෙරිකන් ඩොලර් මිලියන 278යි. ව්‍යාපෘතිය අවසන් කරන්න කාලය ගතවුණේ මාස 36යි. ඒ ව්‍යාපෘතිය ආරම්භ කළේ 2013 ජූලි මාසයේයි. එය අවසන් කරන්න තිබුණේ 2016 ජූලි මාසයේයි. දීලා තිබෙන සහන කාලය දෙසැම්බර් මාසයේ 24වැනි දායින් අවසන් වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මාතර - කතරගම රේල් පාර හදන්න දීලා තිබෙන සහන කාලය දෙසැම්බර් මාසයේ 24වැනි දායින් අවසන් වෙනවාය කියලා. හැබැයි නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුව අවසන් නොකිරීම නිසා අදාළ කොන්ත්‍රාත් සමාගමෙන් අය වෙන්න ඕනෑ, ඇමෙරිකන් ඩොලර් මිලියන 28ක්. ඒ කියන්නේ, ආසන්න වශයෙන් ගත්තොත්, රුපියල් මිලියන 4,200ක් අය වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, විෂය භාර අමාත්‍යතුමා හැටියට ඔබතුමාගෙන් මා දැන ගන්න කැමැතියි, 2016 වර්ෂයේ මේ පමා කාලය වෙනුවෙන් අය විය යුතු ඇමෙරිකන් ඩොලර් මිලියන 28 -ආසන්න වශයෙන් රුපියල් මිලියන 4,200- මේ වෙන කොට අය කරගන්න කටයුතු කරලා තිබෙනවාද කියලා. මාතර සිටින අපට දකින්න තිබෙන විධියට මේ ව්‍යාපෘතිය අඩු ගණනේ 2017 අවුරුද්දේවත් අවසන් කරන්න බැහැ. මේ චීන කොම්පැනියට -චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සහ අපනයන ආයතනයට- 2017 වර්ෂයේදීවත් මේ රේල් පාර හදලා අවසන් කරන්න බැහැ. ඒකේ සිදුවන අක්‍රමිකතා ගැන කියලා වැඩක් නැහැ. ඒක හදලා අවසන් කරන්න බැරි මට්ටමක් තමයි අද වෙන තුරුත් තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවට රේල් පාරවල් හදන්න පුළුවන් කියලා ඔප්පු කරලා තිබෙනවා. සුනාමි ව්පත නිසා විනාශ වුණු අපේ රටේ දකුණු පළාතේ දුම්රිය මාර්ගය, අපේ දුම්රිය නිලධාරින්, ඉංජිනේරුවන් හා සේවකයන් දින 57ක් තුළදී හදලා අවසන් කළා. අදත් දුම්රිය ධාවනය කරන්නේ ඒ රේල් පාරේ. ඒක පැහැදිලියි. ඒකට තව තාක්ෂණය ඕනෑ නම්, නවීකරණය කරන්න ඕනෑ නම්, ඒ හැකියාව ඕනෑ නම් ඒ තාක්ෂණය ගන්න එක ගැන කිසි විවාදයක් අපට නැහැ. නමුත් අපේ රටේ ඉංජිනේරුවන්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින්, වැඩ කරන කාර්මිකයින්, ශිල්පීන් ඔප්පු කරලා තිබෙනවා, අපේ රටේ සල්ලිවලින් පමාවකින් තොරව අපට මේ කටයුත්ත කරන්න පුළුවන්ය කියලා. එසේ ඔප්පු කරලා තිබියදී, අපි මේ තරම් වධ විඳින්නේ ඇයි? මම මේ උදාහරණය ගත්තේ, ඔබතුමන්ලා චීනයෙන් කන බැටකෑම, වවුනියාව රේල් පාර හදන්න ගිහින් අනිවාර්යයෙන්ම ඉන්දියාවෙන් කන නිසායි. ඒක තමයි පැහැදිලි වන්නේ. ඒක ඉතා පැහැදිලියි.

ගරු ඇමතිතුමනි, මා මේ කාරණය ගැනත් ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. දැනටමත් දුම්රිය දෙපාර්තමේන්තුව දුම්රිය මාර්ග නඩත්තු කිරීමට යොදා ගන්න tamping machine එක, දුම්රිය දෙපාර්තමේන්තුවේ වැඩ නතර කරලා චීන කොන්ත්‍රාත් කොම්පැනියට දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ සඳහා කිසිදු මුදලක් අය කරන්නේත් නැහැ. ඒ සඳහා කිසිදු මුදලක් අය කරන්නේත් නැතුව, ඒ යන්ත්‍රය චීන කොම්පැනියට ලබාදෙන්න කටයුතු කරමින් ඉන්නවා. අපි කියන්නේ, එහෙම ලබාදිය යුතු නැහැයි කියන එකයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මාතර - කතරගම දුම්රිය මාර්ගයේ දුම්රිය ස්ථාන හතරක් තිබෙනවාය කියලා. ඒ දුම්රිය ස්ථාන හතර තමයි, වෙහෙරහේන, කැකණදුර, දික්වැල්ල හා බෙලිඅත්ත. මේ දුම්රිය ස්ථාන දෙකක් අතර දුම්රිය දුර සංඥා පද්ධති සවි කරන්න දුම්රිය දෙපාර්තමේන්තුවට වැය වන්නේ රුපියල් මිලියන 200ක මුදලක්. හැබැයි රුපියල් මිලියන 800කින්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

සවි කළ හැකි සංඥා පද්ධතිය, රුපියල් මිලියන 2,000ක් වැය කරලා ඒ කටයුත්ත කරන්න චීන සමාගමටම දෙන්න ඔබතුමන්ලා කටයුතු කරමින් ඉන්නවා. දුම්රිය ස්ථාන දෙකක් අතර සංඥා පද්ධති සවි කරන්න රුපියල් මිලියන 200යි වැය වන්නේ. මාතර - කතරගම දුම්රිය මාර්ගයේ දුම්රිය ස්ථාන හතරයි තිබෙන්නේ. එතකොට රුපියල් මිලියන 800කින් කරන්න පුළුවන් කටයුත්ත, රුපියල් මිලියන 2,000ක් වැය කරලා කරන්න ඔබතුමන්ලා ඒ චීන කොම්පැනියටම දෙන්න උත්සාහ කරමින් ඉන්නවා. එතකොට ඔබතුමන්ලා මේ මොකක්ද කරන්නේ? අපට දැන් "චීන සරණං ගච්ඡාමි, ඉන්දියන් සරණං ගච්ඡාමි" හැරෙන්න වෙන ක්‍රමයක් ඇත්තේම නැද්ද? අපේ ඉංජිනේරුවන්, අපේ කාර්මිකයන් රේල් පාරක් හදලා ඔප්පු කර තිබියදීත්, පාර හදා ගන්න, රේල් පාර හදා ගන්න, වරාය හදා ගන්න, ජැටිය නඩත්තු කරගන්න, හදපු ජැටිය නඩත්තු කරගන්න තමුන්නාන්සේලා අපට "චීන සරණං ගච්ඡාමි, ඉන්දියන් සරණං ගච්ඡාමි" හැරෙන්න වෙන ක්‍රමයක් නැහැ.

මේකද, දුම්රිය දෙපාර්තමේන්තුවේ තත්ත්වය? මේකද, වරායේ තත්ත්වය? ඉතා පැහැදිලිව අපි කියනවා, මේ තත්ත්වය රටට ඉතාම අයහපත් තත්ත්වයක් බව. ගත වෙච්ච කළු දශකය තුළ ඒගොල්ලන් සියල්ල ණය බරට හිලවු කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ දායකත්වයෙන් ඇති වෙච්ච ඒ තත්ත්වය වෙනස් කරනවා වෙනුවට, අද අපේ රට තව ණය කරන්න කටයුතු කරමින් තිබෙනවා. මේ හැම ණය මුදලක්ම - මේ හැම මිලියනයක්ම - අපේ රටේ ජනතාවට ගෙවන්න වෙන්නේ වැට් බදුවලින්. මේ හැම මිලියනයක්ම අපේ රටේ ජනතාවට ගෙවන්න වෙන්නේ ජාතිය ගොඩ නැඟීමේ බද්දෙන්. මේ හැම මිලියනයකටම දායක වෙන්න වෙන්නේ අපේ රටේ ජනතාවට.

චීනයෙන් මේ වැඩ පිනට කරන්නේ නැහැ. ඉන්දියාවෙන් මේ වැඩ පිනට කරන්නේ නැහැ. මේ ඔක්කොම ණය අපි ගෙවන්න ඕනෑ. හැබැයි, අඩුම තරමින් ඒ සඳහා අපට ශක්‍යතාවක් තිබෙන්න ඕනෑ, හැකියාවක් තිබෙන්න ඕනෑ, මේ ව්‍යාපෘතිවලින් ලැබෙන ඵලදාව - ප්‍රතිඵලය - යුක්ති සහගත කර ගන්න. එහෙම යුක්ති සහගත කිරීමක් සිදු වෙන්නේ නැහැ කියලා ඉතා පැහැදිලිව පෙනෙනවා, මාතර - කතරගම රේල් පාර හදන වැඩ පිළිවෙළින්. අඩු තරමින් ඔබතුමන්ලා සාකච්ඡාවක් පවත්වලා, අපේ කාර්මිකයන්ගේ, අපේ ඉංජිනේරුවන්ගේ, අපේ දක්ෂ මිනිසුන්ගේ හැකියාව පිළිබඳව විශ්වාසය තැබුවාද කියලායි අපි ඔබතුමන්ලාගෙන් අහන්නේ. එහෙම විශ්වාසය තැබුවා නම්, මාතර - කතරගම පාරෙන් බැට කාපු අපට, මහව - වව්නියාව පාර හදන්නත් මේ විධියට පිටරට සමාගමකට දෙන්න සිද්ධ වෙන්නේ නැහැ. මීට කලින් කිලිනොච්චි පාර හදන්න ගිහිල්ලා මොන තරම් වන්දියක් ගෙවලා තිබෙනවාද කියලා අපි දැක්කා. "අපි ඉක්මනට වැඩ කරනවා. වේගයෙන් වැඩ කරනවා" කියලා ඔබතුමන්ලාට කියන්න පුළුවන්. නමුත් එහෙම වෙලා නැහැ.

2016 දෙසැම්බර් මාසයේ 24වැනි දා අවසන් කරන්න තිබුණු මේ ව්‍යාපෘතිය චීන කොම්පැනිය අද වනතුරු අවසන් කරලා නැහැ. ඒකට හේතු කියන්න පුළුවන්. ඒ හේතු අපේ ඉංජිනේරුවන්ටත් කියන්න පුළුවන්. ඒ හේතුම අපේ කාර්මිකයන්ටත් කියන්න පුළුවන්. ඉතින්, මේ කාරණය ඉතාම පැහැදිලියි. ඒ නිසා මම මේ කාරණාව ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

දුම්රිය දෙපාර්තමේන්තුව භාරව මීට කලින් හිටපු ඇමතිවරු විසින් ආදේශක, අනියම්, තාවකාලික පදනමින් බඳවා ගත් සේවකයන් 2,000ක් විතර ඉන්නවා. ඒ අයගේ ඉරණම මොකක්ද කියලා අපි ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඒ අය මොන පදනමින් බඳවා ගත්තත්, මොන තත්ත්ව යටතේ බඳවා ගත්තත් ඒ අයගේ ඉරණම මොකක්ද? ඒවා දේශපාලන පත් වීම් වෙන්න පුළුවන්; දේශපාලන බඳවා ගැනීම් වෙන්න පුළුවන්. නමුත් අද වනකොට අනියම්, ආදේශක පදනමින් බඳවා ගත් කම්කරුවන් 2,000ක් විතර ඉන්නවා. ඔවුන් ස්ථිර කිරීමට කටයුතු කරනවාද නැද්ද කියලා දැනගන්න කැමතියි. විශේෂයෙන් කාර්යාල කාර්ය සේවයේ තුන්වැනි ශ්‍රේණියේ ස්ථිර කළ හැකි, සුදුසුකම් සම්පූර්ණ කරලා තිබෙන අනියම්, ආදේශක සේවකයන් 2,000ක් විතර සිටියදී ඔවුන් ස්ථිර නොකර, එම සේවය සඳහා ස්ථිර සේවකයන් හැටියට තව 152ක් බඳවා ගන්න ආයතන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලැබී ඇතත්, 210කට ආසන්න සේවක පිරිසක් බඳවා ගෙන තිබෙන්නේ කොහොමද කියලා අපි දැනගන්න කැමැතියි. ආයතන අධ්‍යක්ෂවරයා අනුමත කරන්නේ තනතුරු 152යි. ඒ සුදුසුකම්ම තිබෙන තව විශාල පිරිසක් ඉන්නවා. එහෙම විශාල පිරිසක් සිටියදී තව 210 දෙනෙක් බඳවාගෙන තිබෙනවා. එසේ බඳවා ගන්න දැන්වීම් පළ කරලා තිබෙන්නේ වෙබ් අඩවියේ විතරයි.

දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පමණක් ඒ සඳහා දැන්වීමක් පළ කරලා තිබෙනවා. එහෙම දැන්වීම් පළ කරලා ඒ අය බඳවාගෙන තිබෙනවා. බඳවා ගත් පිරිස බඳවා ගත්තේ කොයි ප්‍රදේශයෙන්ද කියලා මම අහන්නේ නැහැ. මොකද, ඔබතුමා දන්නවා ඒක කොහොමද සිද්ධ වුණේ කියලා. එවැනි කාරණා ගණනාවක් මම අවධාරණය කරන්න ඕනෑ.

ආර්ථික වශයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ ඵලදාව - ආදායම - ලබන්න පුළුවන් මාර්ග ගණනාවක් අද නැති කරගෙන තිබෙන බව ඔබතුමා දන්නවා. විශේෂයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවට ආදායම් ලබා ගන්න පුළුවන් ක්‍රමවේද හැටියට තමයි දැන්වීම් පුවරු පළ කිරීම, ප්‍රදර්ශනය කිරීම තිබුණේ. නමුත් Scalene Holdings (Pvt) Limited සමාගම දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මිලියන 500ක පමණ මුදලක් මේ වනකොටත් ගෙවලා නැහැ. ඒ වාගේම දුම්රිය මැදිරි වෙනුවෙන් Expo Lanka සමාගම මිලියන 70ක්, Rajadhani Express කියන සමාගම මිලියන 30ක් මේ වනකොටත් ගෙවලා නැහැ. ඒ විතරක් නොවෙයි, ඔබතුමාගේ ගජ මිතුරෙක් ඉන්නවා, JF Tours & Travels සමාගම කියලා. ඒ සමාගමේ "Viceroy" කියන විශේෂ දුම්රිය ධාවනය කිරීම වෙනුවෙන් අත්සන් කරපු ගිවිසුම් ප්‍රකාරව, -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
මගේ ගජ මිතුරෙක්?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, නැහැ. මහජන බැංකුවේ සභාපතිතුමා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
එහෙම කියන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මහජන බැංකුවේ සභාපතිතුමා. "Viceroy" කියන විශේෂ දුම්රිය ධාවනය කිරීම වෙනුවෙන් අත්සන් කරලා තිබෙන ගිවිසුම් ප්‍රකාරව ඔවුන් මිලියන ගණනක් ගෙවන්න ඕනෑ. නමුත් මේ වනතුරු ඒ මුදල් ගෙවලා නැහැ. විශේෂයෙන්ම JF Tours &

Travels කියන සමාගම එක්ක ඔබතුමන්ලා දැන් ටෙක්නිකල් හන්දියේ දුම්රිය මූලස්ථානයට යාබදව තිබෙන දුම්රිය ගබඩා අධිකාරිය කාර්යාලය පිහිටි භූමියේ තිබෙන කාර්යාල වෙනත් ගොඩනැගිලිවලට මාරු කරමින් ඉතා අධික වියදමක් දරලා කෞතුකාගාරයක් හදන්න යනවා. දුම්රිය කටු ගෙයක් හදන්න යනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
එහෙම එකක් නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම එකක් නැද්ද? එහෙම එකකට වැඩ කරගෙන යන්නේත් නැද්ද? අපට ආරංචි වෙලා නම් තිබෙන්නේ එහෙම තමයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
බොරු ආරංචියක්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දුම්රිය දෙපාර්තමේන්තුවට කටු ගෙයක් හදන්න දැන්ම ඉක්මන් වෙන්න එපා කියලා මා ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
එහෙම හදිස්සියක් නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම හදිස්සියක් නැද්ද? හැබැයි, මෙහෙම ගියොත් එහෙම කරන්න සිද්ධ වෙනවා. දැනටමත් දුම්රිය දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර කීපයක් කඩුගන්නාව, මරදාන, රත්මලාන සහ බණ්ඩාරවෙල පිහිටුවා තිබෙනවා. තවත් එහෙම එකක් හදන්නේ නැහැ කියලා ඔබතුමා කියනවා නම්, මට ඒක පිළිගන්න සිද්ධ වෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ නිල නිවාස කැඩිලා තිබෙද්දී, ඒවායේ උළු කැටයක්වත් මාරු කරගන්න මුදල් නැහැ කියද්දී, මිලියන 300ක් විතර වැය කරලා, විශේෂයෙන් මහජන බැංකුවේ සභාපතිතුමා එක්ක එකතු වෙලා -එතුමාගේ JF Tours & Travels කියන එකත් ඔය කියන ආකාරයේ විශේෂ දුම්රිය ක්‍රියාවලියට සම්බන්ධ එකක්- ටෙක්නිකල් හන්දියේ අර කියපු කාර්යාල අයින් කරලා එවැනි කටයුත්තක් කරන්න දැන් යනවා නම්, එය අනාර්ථික කටයුත්තක්. එවැන්නක් කරන්නේ නැහැ කියලා ඇමතිතුමා කියනවා නම් මා ඒක පිළිගන්නවා, ගරු අමාත්‍යතුමනි. හැබැයි එහෙම දෙයක් කරනවා නම්, එය අනාර්ථික කටයුත්තක් හැටියට තමයි හඳුන්වන්න වෙන්නේ. එයින් ලැබෙන ආර්ථික ඵලදායිතාව මොකක්ද කියලා අපි ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. මා කියපු ඒ කාරණා කෙරෙහි ඔබතුමාගේ අවධානය විශේෂයෙන් යොමු කරවන්න කැමැතියි.

ගරු අමාත්‍යතුමනි, තවත් කාරණාවක් මා ඔබතුමාට අවධාරණය කරවනවා. ඒ, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේම තිබෙන RMV එක ගැන. RMV එකේ තත්ත්වය මම දන්නවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ගරු සභාපති ලසන්ත අලගියවන්න මැතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා පූර්ණ වාර්තාවක්, පසු ගිය කාලය තුළ ඒ දෙපාර්තමේන්තුවේ සිද්ධ වූ කටයුතු පිළිබඳව. අපේ ඉරාන් වික්‍රමරත්න ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඉන්නවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ. ඒ වාර්තාව හරියට අධ්‍යයනය කළොත් පැහැදිලි වනවා, පසුගිය කාලයේ අපේ රටේ වාහන හා සම්බන්ධ ක්‍රියාවලියේ මොන තරම් ජාවාරමක් සිද්ධ වෙලා තිබෙනවාද කියන එක. මම කනගාටු වෙනවා, තවම ඒ පිළිබඳ පූර්ණ විවාදයක් පාර්ලිමේන්තුවේ හරියාකාරව නොපැවැත්වීම ගැන. ඒ වාර්තාව අධ්‍යයනය කළොත් තේරෙනවා, පාරේ දුවන මේ හුඟක් වාහන ඇත්ත වාහනද, නැත්නම් ව්‍යාජ වාහනද කියන එක. විවිධ අවශ්‍යතා වෙනුවෙන් විවිධ නම් ගහගෙන වාහන ගේනවා. නමුත් ඊට පසුව ඒ අවශ්‍යතාව වෙනුවෙන් නොවෙයි ඒ වාහනය තිබෙන්නේ.

ගරු අමාත්‍යතුමනි, දැන් ඔබතුමන්ලා RMV එකට අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න උත්සාහ කරමින් තිබෙනවා. ඒ තමයි, prototype system එක. නමුත් ගරු අමාත්‍යතුමනි, වාහනයක් පරීක්ෂා කිරීමේදී කළ යුතු ප්‍රධාන කටයුත්ත තමයි තාක්ෂණික වශයෙන් පරීක්ෂා කිරීම. අප විශ්වාස කරන හැටියට RMV එකේ තිබිය යුතු මූලික වුවමනාව තමයි, වාහනය තාක්ෂණික වශයෙන්, භෞතික වශයෙන් -ඒ හැකියාව, ඒ දක්ෂතාව තිබෙන අය ලවා- පරීක්ෂා කරවන එක. වාහනයේ පොත ගෙනැල්ලා, පොත මාරු කර ගන්න එක ඕනෑම කෙනෙකුට කරන්න පුළුවන්. "පොත දාලා" පොත මාරු කරනවා. ඒ සඳහා ජීවත් වන මිනිසුන්ගේ නොවෙයි, මැරුණු මිනිසුන්ගේ නම් පවා යොදාගන්නවා. බලාගෙන ගියාම, භෞතික වශයෙන් ඒ වාහන නැහැ. භෞතික වශයෙන් නැති වාහනවලට පොත හදනවා. ඒක තමයි ඇත්ත ක්‍රියාවලිය.

ගරු අමාත්‍යතුමනි, RMV එකේ 2001 වර්ෂයේදී තාක්ෂණික වශයෙන් සහකාර කොමසාරිස්වරුන් සිටියේ එක්කෙනායි තාක්ෂණික වශයෙන් සහකාර කොමසාරිස්වරුන් සිටියේ එක්කෙනායි. හැබැයි, පරිපාලන වශයෙන් සිටින ප්‍රමාණය 5යි. 2015 වර්ෂය වන කොටත් තාක්ෂණික වශයෙන් සහකාර කොමසාරිස්වරුන් ඉන්නේ එක්කෙනායි. හැබැයි පරිපාලන වශයෙන් -පරිපාලන සේවයෙන්- සිටින ප්‍රමාණය 20යි. නමුත් RMV එකේ ඇත්තටම වැඩි කරන්න ඕනෑ තාක්ෂණික කොමසාරිස්වරුන්. තාක්ෂණික වශයෙන් සිටින පිරිස තමයි වැඩි කරන්න ඕනෑ. මොකද, ඒ අයට තමයි එකී පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය ඇත්ත වශයෙන්, භෞතික වශයෙන් කරන්න පුළුවන් වන්නේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මේ පිළිබඳව විශේෂ, විධිමත් නිර්දේශ ලබා දීලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කිරීම තුළ විතරයි මේ සිද්ධ වන මහා දැවැන්ත වංචා නවත්වන්න පුළුවන්කම ලැබෙන්නේ; ඒ ක්‍රියාවලිය නතර කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ හින්දා මා ඔබතුමාගේ විශේෂ අවධානය ඒ කෙරෙහි යොමු කරවනවා, ගරු අමාත්‍යතුමනි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ස්තුතිවන්ත වෙනවා, ඒ පෙන්වා දීම ගැන. අපි දැන් වැඩ කටයුතු කරගෙන යනවා, ඒ නියාමන අනුව අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු අමාත්‍යතුමනි, විවිධ අංක සහිතව මාර්ගයේ ධාවනය කරන, ලියා පදිංචි නොකළ ජීප් රථ ඇතුළු වාහන විශාල

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ප්‍රමාණයක් තිබෙනවා. ඔබතුමාගේ කථාවේදී හෝ ඒ ගැන පැහැදිලි කරාවි කියා මම බලාපොරොත්තු වෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලා දැන් දඩ ගහන්න උත්සාහ කරනවා නේ. දඩ ගහන්න හදන්නේ වමෙන් ඉස්සර කරනවාටයි. දැන් ඔබතුමා තමයි ඒ දඩයේ බිල්ලට අහුවෙලා ඉන්නේ. මොකද, අප දකින හැටියට මුදල් අමාත්‍යතුමා කොයි වෙලාවේත් මාධ්‍යවල කියන්නේ, මා නොවෙයි ප්‍රවාහන අමාත්‍යතුමායි ඒක කරන්නේ කියලායි. අර, "බස් ගැමුණු" ඉස්සරහින් තියාගෙන පෙන්වන්නේ? නමුත් ඒ නාට්‍යයේ තිර රචනය සම්පූර්ණයෙන් අසාර්ථකයි. ඇත්තටම ඒ නාට්‍යයේ තිර රචනය අසාර්ථකයි; රඟපෑම අන්තිම දුර්වලයි.

විශේෂයෙන්ම බස් ගැමුණුගේ රඟපෑමෙන් නම් ඔබතුමන්ලාට ගොඩ යන්නම බැහැ. බස් ගැමුණු එකක් කියනවා, ඇමතිතුමා තව එකක් කියනවා. ඔබතුමා ළඟ නැති නිසා රවි කරුණානායක ඇමතිතුමා හැම තිස්සේම ඔබතුමාගේ නම කියනවා. 25,000 දඩයක්කාරයා වෙලා ඉන්නේ ඔබතුමා තමයි. ඒක ඇත්තද? ඇත්තටම රුපියල් 25,000 දඩයක්කාරයා ඔබතුමාද කියලා දැන ගන්නට කැමැතියි. මොකද, ඔබතුමාගේ නම තමයි කොයි වෙලාවේත් කියන්නේ. "මුදල් අමාත්‍යාංශයෙන් නොවෙයි, ප්‍රවාහන ඇමති" කියලායි කියන්නේ. ඒ නිසා රුපියල් 25,000 දඩයක්කාරයා ඔබතුමාද කියලා දැනගන්නට කැමැතියි. ඇත්තටම විය යුතු දෙය ඒක නොවෙයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා අපේ රටේ තිබෙන මාර්ග තදබදය ගැන. වාහන තදබදය ඇති වෙලා තිබෙන්නේ ඇයි කියලා. පාරේ වැඩිපුරම තිබෙන්නේ ත්‍රීවිලර්, මෝටර්බයිසිකල්, සහ පෞද්ගලික වාහන. හේතුව මොකක්ද? ලෝකයේ අපිට වඩා දියුණු රටවල් තිබෙනවා, අපට වඩා ජනගහනය වැඩි රටවල් තිබෙනවා, අපට වඩා වාහන වැඩි රටවල් තිබෙනවා. නමුත් ඒ හැම රටකම පොදු ප්‍රවාහන සේවය ශක්තිමත්. එහෙම නැත්නම් අඩු තරමින් ඒ අයගේ සැලැස්මක් තිබෙනවා පොදු ප්‍රවාහන සේවය දියුණු කරන්නට.

ගරු ඇමතිතුමනි, පෞද්ගලික වාහනයක් පාවිච්චි කරන ඕනෑම කෙනෙක් තමන්ගේ ළමයි ඉස්කෝලයට එක්කගෙන යන්න, තමන්ගේ කාර්යාල කටයුතුවලට යන්නට, වෙනත් ගනුදෙනු කටයුතුවලට යන්නට පොදු ප්‍රවාහන සේවය හරියට ක්‍රියාත්මක වෙනවා නම් කැමැතියි. ඔබතුමන්ලා ඕනෑ තරම් ලෝකයේ රටවල ඇවිදින්නට ගිහින් තිබෙනවා. ඒ රටවල බස් එක වෙලාවට bus stand එකට එනවා. නියමිත විනාඩියට, තත්පරයට බස් එක එනවා. එතකොට මිනිස්සුන්ට විශ්වාසයක් තිබෙනවා, මම වෙලාවට bus stand එකට ගියොත් බස් එක වෙලාවට එනවා කියලා. එතකොට මොකද වෙන්නේ? මිනිස්සු පෞද්ගලික වාහනවලින් මොළය කොලොප්පම් කරගෙන පාරේ යන්නේ නැහැ. එම නිසා අපි පොදු ප්‍රවාහන සේවය ගැන විශ්වාසය ඇති කරන්නට ඕනෑ.

දැන් ඔබතුමන්ලා දුම්රිය සේවය ගැන පොදු ප්‍රවාහන සේවයක් විධියට විශ්වාසය ඇති කරලා තිබෙනවාද? SLTB එක ගැන ඒ විශ්වාසයක් ඇති වෙලා තිබෙනවාද? රාජ්‍ය ප්‍රවාහන සේවය ගැන විශ්වාසයක් ඇති කරලා තිබෙනවාද? පෞද්ගලික ප්‍රවාහන සේවය ගැන එහෙම විශ්වාසයක් ඇති වෙන විධියට නියාමනය කරලා තිබෙනවාද? නැහැ. අද මිනිසුන්ගේ විශ්වාසය තිබෙන්නේ බස් එක යන්නේ ඩ්‍රයිවර්ගේ වෙලාවට කියලා, බස් එක යන්නේ බස් එකේ වෙලාවට, කෝච්චිය යන්නේ කෝච්චියේ වෙලාවට. ඒ වෙලාවට අපට බෙහෙත් ගන්නට යන්න බැහැ; ඒ වෙලාවට වැඩට යන්නට බැහැ. එම නිසා පොදු ප්‍රවාහන සේවය පිළිබඳව විශ්වාසය අද බිඳ වැටිලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 5යි තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා අවසන් කරනවා.

ගරු ඇමතිතුමනි, ඇත්තටම ගොඩ නැඟිය යුත්තේ පොදු ප්‍රවාහන සේවය පිළිබඳ විශ්වාසයයි. නමුත් එහෙම ක්‍රියාවලියක් සිදු වෙලා නැහැ. දඩ ගැහිල්ල නොවෙයි උත්තරය. ඕක ලෙහෙසි උත්තරයක්. ඕක මුදල් අමාත්‍යාංශයේ උත්තරයක්, ප්‍රවාහන අමාත්‍යාංශයේ උත්තරයක් නොවෙයි. දඩ ගහන්නේ මේ අවුරුද්දේ ණය බේරා ගන්න, මේ අවුරුද්දේ ආර්ථික අර්බුදයෙන් බේරෙන්න. නමුත් පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කළොත් මේ වාහන තදබදය අඩු කර ගන්නට පුළුවන් වෙනවා. එතකොට දඩ ගහන්න අවශ්‍ය වෙන්නේ නැහැ. එතකොට මෙපමණ මාර්ග අනතුරු වෙන්නෙත් නැහැ.

දැන් ඔබතුමන්ලා තර්කයක් විධියට කියන්නේ රිය අනතුරු වැඩියි කියලා. රිය අනතුරු වැඩි හේතුව මොකක්ද? මතක තියා ගන්න 2020 වන විට ලංකාවේ සෑම නගරයකම වාහන නතර වෙන තත්ත්වයට පත් වෙනවා, වාහන යන්න බැරි තත්ත්වයට පත් වෙනවා. පාරවල්වල මේ විධියට ගමන් කළොත් සිදු වන්නේ ඒකයි. නමුත් ඔබතුමන්ලා උත්තරය සොයන්නේ වැරදි පැත්තෙන්. කළ යුතු වන්නේ පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කරලා මිනිසුන්ට ඒ ගැන විශ්වාසය ඇති කිරීමයි. වෙලාවට බස් එක එනවා, වෙලාවට කෝච්චිය එනවා, පෞද්ගලික බස් රථය වුණත් වෙලාවට එනවා කියලා විශ්වාසයක් තවම ඇති වෙලා නැහැ. ඒක ගොඩ නඟන්නට ගහලා තිබෙන දඩය මොකක්ද, ඒක ගොඩ නඟන්නට යෝජනා කරලා තිබෙන ක්‍රමය මොකක්ද?

දැන් ඔබතුමන්ලා කියන්නේ වමෙන් ඉස්සර කළොත් 25,000යි, ඉර කැපුවොත් 25,000යි කියලා. බලන්නකෝ ඕක ක්‍රියාත්මක කරලා මොකක්ද වෙන්නේ කියලා. අපි අභියෝග කරනවා, පුළුවන් නම් ක්‍රියාත්මක කරලා බලන්න මොකක්ද මේකේ ප්‍රතිඵලය කියලා. දඩ හම්බ වෙනවාද, ආණ්ඩුවට දඩ හම්බ වෙනවාද? ආණ්ඩුවට දඩ හම්බ වෙන්නෙත් නැහැ. මේකේ ප්‍රතිඵලය වන්නේ ඔබතුමන්ලා තවත් අපකීර්තියට පත්වීම විතරයි. එහෙම නැතිව මේකෙන් වෙන කිසි දෙයක් වෙන්නේ නැහැ. ආණ්ඩුව බලාපොරොත්තු වන ඔය දඩ ඉලක්කවලට යන්නත් බැහැ. මොකද, ජනතාව පීඩාවට පත් කරලා දඩ ගන්නවා කියන එක ආණ්ඩුවක අවසානය මිසක එයින් වෙනත් මොකුත් ඇති වෙන්නේ නැහැ.

අපිට තේරෙන්නේ නැහැ, ඔබතුමන්ලාට මේ වාගේ යෝජනා ගෙනෙන්න උපදෙස් දුන්නේ කවුද කියලා. විධිමත් යෝජනා විධියට මේවා ඉදිරිපත් කරන්න උපදෙස් දුන්නේ කවුද? ගරු ඇමතිතුමනි, අපට නම් ඒ පිළිබඳව තේරෙන්නේ නැහැ. විශේෂයෙන් මම ඔබතුමාට කියා සිටිනවා, මේ ක්‍රියාවලිය මීට වඩා විධිමත් විය යුතුයි කියලා.

ඊළඟට, මම ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව ගැනත් කියන්නට ඕනෑ. පසුගිය කාලයේ ජාතික ප්‍රවාහන කොමිසම කරලා තිබෙන කටයුතු පිළිබඳව FCID එකක් නොවෙයි, පහක් හයක් දාලා සොයන්නට ඕනෑ.

ජනාධිපතිවරණ රැස්වීම්වලට එක දවසට රුපියල් අසූ ලක්ෂයක් වියදම් කර තිබෙන බව ඔබතුමන්ලා දන්නවා නේ. ඒවා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වැඩ කටයුතු නොවෙයි.

දුරගමන් බස් රථවල යන මිනිසුන් අද මොන තරම් දුක් විඳිනවාද කියා අප දන්නවා. මේ බස්වල seat අතර තිබෙන පරතරය කොහොමද කියා අප ඇහුවා. ජාතික ගමනාගමන කොමිෂන් සභාව ගෙන්වලා අප එහි සභාපතිතුමාගෙන් ඇහුවා, ඔබතුමන්ලා දුර ගමන් යන බස් රථයක seat අතර පරතරය තිබෙන්නේ කොහොමද කියලා නැහලා බලලා තිබෙනවාද කියලා. ගරු ඇමතිතුමනි, අද බස්වල seat ගොඩක් දමලා මිනිසුන් වැඩි ප්‍රමාණයක් වාඩි කරගෙන, බස් එක මැද මිනිසුන්ට ඇවිදින්න තිබෙන තැනත් තව seat එකක් හයි කරලා ඒ ඉඩ ප්‍රමාණයත් ඇහිරිලායි තිබෙන්නේ. කාන්තාවකට කොහොමවත් යන්න බැහැ. හිටගෙන යන එක්කෙනාටවත් යන්න බැරි මට්ටමකට තමයි අද මේවා හදලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, අද බස් එකකින් උතුරට ගිහින් එන එක ඉන්දියාවට ගිහින් එනවාටත් වඩා අමාරුයි. ඇත්තටම මේකයි අද තත්ත්වය. ඒවා ගැන නියාමනයක් නැහැ. ඒවා නියාමනය කිරීම මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් සිද්ධ වෙන්න ඕනෑ. නමුත්, ඒවා ගැන නියාමනය කිරීමක් අද එම අධිකාරියෙන් සිද්ධ වන්නේ නැහැ කියන එක තමයි මට අවධාරණයෙන් යුතුව කියන්න තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඊළඟට මෙන්න මේ කාරණා කෙරෙහි මම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. මා ළඟ ලිපිලේඛන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. නමුත්, මම කෙටියෙන් හෝ මේ කාරණා කියන්න ඕනෑ. පළමුවැනි කාරණය තමයි, මේ අංක තහඩු වංචාව. UTSCH කියන ආයතනයේ -අපේ කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා මේ ගැන දන්නවා. - ශ්‍රී ලංකාවේ agent හැටියට ඉන්නේ Access Group එකයි. 2010දී මේ අංක තහඩු ලබාදීමේ කටයුත්ත ටෙන්ඩර් ක්‍රමවේදයෙන් තොරව කරගෙන ගියා. 2008දී මේ Access Group එකේ ලියා පදිංචි ලියකියවිලි ලබාගෙන ඒ කටයුත්තට මැදිහත් වෙලා තිබෙන්නේ, ඒ අවධියේ සිටි සහකාර කොමසාරිස්වරයෙක්. එම ලේඛනය මා සභාගත කරන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
රුපියල් 550කට වාහන හිමියන්ට සපයපු මේ අංක තහඩුව රුපියල් 1,110ක් දක්වා වැඩි කළා. ඒ ගණන වැඩි කරලා, ආයෙත් එම කාර්ය කරන්න දුන්නෙත් එම සමාගමටයි. ඔබතුමන්ලා ඒක අහෝසි කරලා, නැවත දීලා තිබෙන්නේත් ඒ සමාගමටමයි. එතැන ඉන්නෙත් එකම පුද්ගලයා තමයි. 2015 අප්‍රේල් මාසයේදී මේ සඳහා නැවත tender call කළා. මැයි 13වැනිදා ටෙන්ඩරය අවසන් කළා. ප්‍රසම්පාදන කමිටුවේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කරලා, එම ක්‍රමවේදය අනුව Access Group එකට විතරයි ආයෙත් මේ සඳහා අයදුම් කළ හැක්කේ. ඒ කියන්නේ, ඒ අයට විතරක්ම අයදුම් කරන්න පුළුවන් වන විධියට ඔබතුමන්ලා නියමෙටම ක්‍රමවේදය හැදුවා. මේ තහඩු කෑල්ලේ මහා රසායනික ද්‍රව්‍යයක් නැහැ; ටයිටේනියම් නැහැ. ලංකාවේ නැති, හදන්න බැරි, වෙනත් රටකින් ගෙන්වපු විශේෂ දෙයක් මෙහි නැහැ. නමුත් සිදු වුණේ මොකක්ද? ඔය UTSCH කියන සමාගම ඉන්දියාවෙන් සහ වෙනත් රටවල් ගණනාවකින් ban කර තිබෙන්නේ. එම රටවලින් තහනම් කරපු මේ සමාගමටම මේ කටයුත්ත නැවත ලබාගන්න පුළුවන් විධියට කටයුතු සකස් කළා. සිදු වුණු වෙනස මොකක්ද? රුපියල් 550කට දෙන්න පුළුවන් අංක තහඩුව රුපියල් 1,110ක් බවට පත් වුණා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ගරු මන්ත්‍රීතුමනි, මට ඒ දිනය කියන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
2015 අප්‍රේල් මාසයේ. මට කාල වේලාව නැති නිසා මම ඔබතුමාට ඒ සියලු ලියකියවිලි දෙන්නම්, ගරු ඇමතිතුමනි. Invoice අංක ඇතුළුව ඒ විස්තර සියල්ල සහිත ලිපිලේඛන ටික මා ළඟ තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අවසාන වශයෙන් රියැදුරු බලපත්‍ර සම්බන්ධයෙනුත් මා යමක් කියන්න ඕනෑ. රියැදුරු බලපත්‍රයට ඔබතුමන්ලා වෙන අලුත් smart ක්‍රමයක් හැදුවා නේ. ඒ smart ක්‍රමයේදී chip එක සම්බන්ධයෙනුත් මේ වාගේම ප්‍රශ්නයක් තිබෙනවා. ඔය chip එක කාටද, කොහේදීද check කරන්න පුළුවන් වන්නේ? වෙන මොකුත් ඕනෑ නැහැ. මේකේ විශේෂයක් තිබෙනවා කියලා, ඔය chip එක තාක්ෂණික වශයෙන් check කරන්න පුළුවන් ක්‍රමවේදයක් ශ්‍රී ලංකා පොලීසියේ හෝ වෙනත් තැනක තිබෙනවාද? එහෙම තත්ත්වයක් තිබේද්දිත් මෙයින් විශාල මූල්‍ය වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ පිළිබඳ විස්තරත් ලියකියවිලි, invoice සහිතව මා සභාගත කරන්නම්. ඒකත් ඒ ආකාරයෙන්ම සිදු වුණු මහා පරිමාණයේ මගඩියක් විතරයි. විශේෂයෙන්ම මේ අංක තහඩු වංචාව ගැන, මේ විධියට ටෙන්ඩර් මාරු කළේ ඇයි කියන එක පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Palitha Range Bandara. You have eight minutes.

[අ.භා. 1.46]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - திறன் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Skills Development and Vocational Training)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටට වැඩදායක, ඵලදායක ඒ වාගේම මහජනතාවට සෘජුවම බලපාන අමාත්‍යාංශ දෙකක් වන වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය සහ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ යටතේ කථා කරන්න මට පුංචි වෙලාවක් තමයි ලැබී තිබෙන්නේ.

පළමුව මම වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ගැන කථා කරන්නම්. වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ඉතාම අමාරු අවධියක පසුවන මොහොතක තමයි වර්තමාන අමාත්‍යතුමාට එය

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

භාර ගන්න සිදු වුණේ. රුපියල් මිලියන 233,149ක ණය බරකුත් එක්ක තමයි ගරු අමාත්‍යතුමා ඇතුළු කණ්ඩායමට මෙම අමාත්‍යාංශය භාරගෙන වැඩකටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එහි මාසික ණය වාරිකය රුපියල් මිලියන 10,851ක් වෙනවා.

එහි පොලිය පමණක් රුපියල් මිලියන 6,083ක්. මේ වාගේ අතිවිශාල ණය කන්දක් එක්ක තමයි මේ අමාත්‍යාංශය ඉදිරියට ගෙන යන්න වෙලා තිබෙන්නේ. ප්‍රතිඵල කොහොම වෙතත්, හම්බන්තොට වරාය ඉදි කිරීමට වැය වූ සමස්ත මුදලෙන් සියයට 67ක්ම අධික පොලියට ගත් ණය. එහෙම නම්, ඒ ණය බර දරාගෙන අද කොළඹ වරාය තුළින් උපයා ගන්නා මුදල්වලින් හම්බන්තොට වරායත් ඇදගෙන යන්න සිද්ධ වෙලා තිබෙනවා. බදුලු කෝච්චියට නම් මහදී තව engine එකක් සවි කරලා double engines වලින් ධාවනය කරනවා. නමුත් වරාය හා නාවික කටයුතු ඇමතිතුමාට දැන් තනි engine එකකින් මේ දෙකම - වරායන් දෙකම- අදින්න සිදු වෙලා තිබෙනවා. එහෙම නම්, මේ කටයුත්ත කොපමණ අමාරු කටයුත්තක්ද කියලා මේකෙන් හිතාගන්න පුළුවන්කම ලැබෙනවා.

දැන් වරාය අධිකාරියේ බොහෝ දේවල් අලුත් කරන්නට; නවීකරණය කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඉදිරි කාල පරිච්ඡේදයේදී මේ අභියෝගය ජයග්‍රහණය කිරීමට ගරු ඇමතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමාට, කාර්ය මණ්ඩලයට ලොකු වග කීමක් තිබෙනවා. පෞද්ගලික අංශයේ ජැටි, පර්යන්ත අද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවලට වඩා වේගවත්ව වැඩ කරන ස්ථාන බවට පත් වෙලා තිබෙනවා. මොකද, අලුත් උපාංග සවි නොකර කාලාන්තරයක් තිස්සේ පැරණි උපාංගවලින් ක්‍රියාත්මක වීම නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල ඵලදායීතාව අද ටිකක් අඩු වෙලා තිබෙනවා. එහෙම නම්, මේවා පෞද්ගලික අංශය අභිභවා යන තැනට ගෙන එන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ සඳහා ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් විශාල කාර්ය භාරයක් තිබෙනවා කියලා මම සඳහන් කළේ ඒකයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අර්ජුන රණතුංග අමාත්‍යවරයා කියන්නේ අභියෝග භාර ගත් අමාත්‍යවරයෙක්. එතුමා අමාත්‍ය ධුර දරන කාලයේදී පමණක් නොවෙයි, දේශපාලනයට ප්‍රථම ශිෂ්‍යයෙකු වශයෙන් සිටි යුගයේත්, ක්‍රීඩකයෙකු වශයෙන් සිටි යුගයේත් අභියෝග ජය ගත් කෙනෙක්. එතුමා 1989 අවුරුද්දේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ Captain බවට පත් වුණා. කෙටි කාලයකදී එතුමාව නායකත්වයෙන් නැවත ඉවත් කළා. 1991දී ක්‍රිකට් ලෝක කුසලානයට - Cricket World Cup එකට - ඉදිරිපත් වනකොට එතුමා ක්‍රිකට් කණ්ඩායමේ නායකයෙකු වශයෙන් නොවෙයි, ක්‍රීඩකයෙකු වශයෙනුයි සිටියේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ඒ තරගාවලියේ පළමුවෙනි වටයේදීම පරාජය උරුම කර ගන්න සිදු වුණා. නැවත 1991දී පැවැති Cricket World Cup එකෙන් පස්සේ අර්ජුන රණතුංග මහතාව ජාතික ක්‍රිකට් කණ්ඩායමේ Captain වශයෙන් පත් කළා. එතැන ඉඳලා 1996 අවුරුද්ද වනකොට, අවුරුදු 5ක් වාගේ කෙටි කාලයක් තුළදී ලෝක කුසලානය දිනාගෙන ලංකාවට විශේෂ ආශිර්වාදයක්, ප්‍රසිද්ධියක් ගෙනැල්ලා දෙන්න අර්ජුන රණතුංග මහතා සමත් වුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ඔබතුමාට තව විනාඩි 5ක් තිබෙනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
Thank you.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය අවුරුද්දේ තමයි වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය අර්ජුන රණතුංග මැතිතුමාට භාර ගන්න සිද්ධ වුණේ. එතකොට තවම ගත වෙලා තිබෙන්නේ අවුරුද්දයි. එහෙම නම්, තව අවුරුදු 4ක් එතුමාට මේ අමාත්‍යාංශය ඉදිරියට ගෙන යන්න තිබෙනවා; වැඩ කරන්න තිබෙනවා. වැටිලා තිබුණු ජාතික ක්‍රිකට් කණ්ඩායම Cricket World Cup එක දිනන්න පුළුවන් මට්ටමට අවුරුදු 5ක් ඇතුළත ගෙනාවා වාගේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියත්, විශේෂයෙන්ම අපට ආදායමක් නැතිව තනි වෙලා තිබෙන හම්බන්තොට වරායත් ලෝකයේ කුමන හෝ රටක ව්‍යාපාරිකයෝ අල්ලා ගෙන රාජ්‍ය - පෞද්ගලික ව්‍යාපාරයක් විධියට හරි ශක්තිමත් කරලා ඉදිරියට ගෙන යන්න අර්ජුන රණතුංග මැතිතුමාට හැකියාව තිබෙනවාය කියන එක අපේ විශ්වාසයයි.

මේ රටේ ඉතාමත් වැදගත් තැනක්, ආර්ථික මර්මස්ථානයක් වන වරාය ශක්තිමත් කරන්න අර්ජුන රණතුංග මැතිතුමාට තව තව ශක්තිය හා ධෛර්යය ලැබෙන්න කියලා මම විශේෂයෙන්ම සුබ පතනවා, ආශිර්වාද කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වැඩි කාලයක් නැති නිසා මම වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය පිළිබඳව වැඩිපුර යමක් කථා කරන්න යන්නේ නැහැ.

ඊළඟට, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය පිළිබඳවත් වචන කීපයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමනි, ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබ දෙදෙනාගේ හොඳ සංකලනයකින් යුක්තව මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු රාශියක් සිද්ධ වනවා. මේ අමාත්‍යාංශය තුළ විවිධ කටයුතු අලුතෙන් ආරම්භ කිරීමට ඔබ දෙපළ සමත් වෙලා තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාත්, අපත් එක්කාසු වෙලා පුත්තලම, පාලවිය ගුවන් තොටුපොළ අභ්‍යන්තර - domestic - ගුවන් තොටුපොළක් විධියට වැඩිදියුණු කරන්න පසු ගිය වසරේදී අපි බලාපොරොත්තු වුණා. ඒ සඳහා සියලු කටයුතු සූදානම් කළත්, ගුවන් හමුදාවේ විරුද්ධත්වයක් නිසා ගරු අමාත්‍යතුමාට ඒ පිම්ම පැන ගන්න හැකියාවක් ලැබුණේ නැහැ.

කොහොම වුණත් ඉදිරියේදී අපි ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි කියන කාරණය කියනවා. මොකද, මේ ප්‍රදේශය සංචාරක ව්‍යාපාරය දියුණු කළ හැකි ප්‍රදේශයක්; දියුණු කරන්න තිබෙන ප්‍රදේශයක්. ඒ වාගේම දූපත් විශාල ප්‍රමාණයක් තිබෙන එකම ප්‍රදේශය කල්පිටිය, පුත්තලම නිසා මේ අවස්ථාව අපි ඉතා ඉක්මනින් උදා කර ගත යුතුයි කියන එක ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට සිහිපත් කරනවා. ඒ වාගේම පාලවිය සිට මහව දක්වා දුම්රිය මාර්ගය දැනටමත් යෝජනා වෙලා තිබෙනවා. දැනටමත් ඔබතුමන්ලා ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා කියන කාරණය මම පෞද්ගලිකව දන්නවා. පාලවිය සිට මහව දක්වා වන දුම්රිය මාර්ගයේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීම වටිනවා. මොකද, ත්‍රිකුණාමලයේ ඉඳලා කල්පිටිය නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු ගෙනෙන්නේ ලොරිවලින්. අනික් පැත්තෙන් ගල් අඟුරු ගෙනෙන්නේ නැවෙන්. නමුත් වාරකන් කාලයට මුහුදේ තිබෙන කැළඹිලිකාරී තත්ත්වයත් එක්ක කල්පිටිය නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු ගෙනෙන්න පුළුවන්කමක් නැහැ. ඒ අනුව අපට තිබෙන පහසුම ක්‍රමය තමයි ත්‍රිකුණාමලයේ ඉඳලා දුම්රිය මඟින් ගල් අඟුරු

ප්‍රවාහනය කිරීම. නමුත් බාධාවක් වශයෙන් තිබෙන්නේ මහව ඉඳලා පාලවියට තිබෙන කෙටි දුර සම්බන්ධ වෙන දුම්රිය මාර්ගයක් නොමැතිකමයි.

මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා මේ වැඩසටහන පුළුවන් තරම් කඩිනම් කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඊට අවශ්‍ය සහයෝගය ලබා දීමට ප්‍රදේශයේ දේශපාලනඥයන් වශයෙන් අපි නිරතුරුව කැපවී සිටින බවත් සිහිපත් කරනවා. මොකද, මෙය ඉදි කර ගත්තොත් අපට ගල් අඟුරු ප්‍රවාහනයට පහසු වනවා. ඒ වාගේම ලංකාවේ ප්‍රධානතම සිමෙන්ති කම්හල හෝල්සිම් සමාගම පිහිටා තිබෙන්නේ පුත්තලමේ නිසා සිමෙන්ති ප්‍රවාහනයටත් එය පහසු වනවා. ඒ වාගේම හම්බන්තොට සහ පුත්තලම ලංකාවේ ලුණු නිෂ්පාදනය කරන ප්‍රදේශ දෙකක්. එයින් පුත්තලම ප්‍රදේශයේ සිට ලුණු ප්‍රවාහනයට ද එම දුම්රිය මාර්ගය යොදාගත හැකි වනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, රටට අවශ්‍ය සම්පත් වර්ග තුනක් ප්‍රවාහනය කිරීමට මේ දුම්රිය මාර්ගය කඩිනම් කිරීම කියන කාරණය අතිශය වැදගත් වන බව මා ඔබතුමාට සිහිපත් කරනවා.

ගරු ඇමතිතුමනි, මම විශේෂ කාරණයක් ඔබතුමාට සිහිපත් කරන්න කැමැතියි, දඩ මුදල් වැඩි කිරීම පිළිබඳව අද විවිධ මත තිබෙනවා. මුදල් අමාත්‍යාංශයට කියනවා; එහෙම නැත්නම් ප්‍රවාහන අමාත්‍යාංශයට කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විනාඩියකින් අවසාන කරන්නම්.

ගරු ඇමතිතුමනි, එහෙම නැත්නම් රජයේ ආදායම වැඩි කර ගන්න එසේ කළා කියා කියනවා. නමුත් රජයේ මුදල් වැඩි කර ගැනීමට නොවෙයි, දඩ මුදල් වැඩි කළේ. ප්‍රවාහනය හේතුවෙන් දවසකට අවම වශයෙන් පුද්ගලයන් 8 දෙනෙකුවත් මිය යනවා. ඒ වාගේම පුද්ගලයන් 20-30කට වැඩි ප්‍රමාණයකගේ අත පය කැඩිලා අහිමි වෙනවා. ඒ උදවිය ආරක්ෂා කර ගැනීම සඳහා නීති පැනවීමට මිස එහෙම නැතුව බදු මුදල් අය කර ගැනීම සඳහා නොවෙයි, දඩ මුදල් වැඩි කළේ.

ගරු ඇමතිතුමනි, මේ කාරණයත් ඔබතුමාට සිහිපත් කරමින් මම කථාව අවසන් කරන්න බලාපොරොත්තු වනවා. ත්‍රීරෝද රථ සංඛ්‍යාව අද පහළොස් ලක්ෂය ඉක්මවා ගිහින් තිබෙනවා. පහළොස් ලක්ෂයක තරුණ ශ්‍රමයක් ත්‍රීරෝද රථ ධාවනය සඳහා යොදා තිබෙනවා. මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, මඟී ප්‍රවාහන ත්‍රීරෝද රථ සඳහා රියදුරු බලපත්‍රය ලබා දීමේදී ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා. වයස් සීමාව අවුරුදු 40 දක්වා ඉදිරියට ගෙන යන්න. පවුලේ ප්‍රවාහන කටයුතු සඳහා පාවිච්චි කරන ත්‍රීරෝද රථයට පැරණි නීතිය එසේම ක්‍රියාත්මක කරද්දී මඟී ප්‍රවාහන ත්‍රීරෝද රථ - taxi - සඳහා රියදුරු බලපත්‍ර ලබාදීමේදී එය වයස අවුරුදු 40 සීමාවට ගේන්න. එතකොට තරුණ ජවය රටේ ශ්‍රම බලකායට එකතු කර ගන්න පුළුවන් වනවා. ඒ වාගේම සිදුවන අනතුරු ප්‍රමාණය අඩු කර ගන්නත් පුළුවන් වනවා. ඒ වාගේම ශබ්ද විකාශන යන්ත්‍ර සවි කරගෙන කරන ශබ්ද දූෂණය වළක්වා ගැනීමේ එක උපක්‍රමයක් බවටත් එය පත් කරගත හැකියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමතිතුමන්ලා දෙපළගේ අවධානයට මේ කරුණු ඉදිරිපත් කරන්න ලැබීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමන්ලාගේ විශේෂ අවධානය මේ කාරණා කෙරෙහි යොමු කර ඉදිරි වසරේ කටයුතු කරයි කියා මම විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is, the Hon. Chamal Rajapaksa. You have 20 minutes.

[අ.භා. 1.56]

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේත්, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව කාරක සභා අවස්ථාවේදී අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට මා බලාපොරොත්තු වනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Order, please! The Hon. (Mrs.) Sriyani Wijewickrama will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ කාර්යභාරය අද වේග පන්දු යැවීම, දඟ පන්දු යැවීම. අපේ වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය භාර ඇමතිතුමාට නම් හොඳට bat කරන්න; පහර දෙන්න පුළුවන්. නමුත් ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමාට wicket keep කරන්න පමණයි පුළුවන් වන්නේ.

ගරු අර්ජුන රණතුංග ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව කරුණු දක්වන්න ප්‍රවිෂ්ට වෙන්න ඉස්සෙල්ලා විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. ඔබතුමාගේ පියාණන්, ගරු රෙජී රණතුංග මැතිතුමා වරාය සංවර්ධන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ධුරය දැරුවා. ඒ වාගේම මට මතකයි, එතුමා 1985දී මුල්කිරිගල අතුරු මැතිවරණය වෙලාවේ මාස 3ක පමණ කාලයක් පක්ෂය වෙනුවෙන් කැපවෙලා ඡන්දය දවසේ ඡන්ද පොළට ගියා. එතුමාට පහර දීලා, ඡන්ද පොළෙන් එළවලා තමයි එදා ඡන්දය දමාගත්තේ. ඒක ඉතිහාසය. අද දේශපාලනයේ සදාකාලික මිතුරොත් නැහැ,

[ගරු චමල් රාජපක්ෂ මහතා]

හතුරොත් නැහැ. ඒක නිසා ඔබතුමා ඔය පැත්තේ ඉන්නවා, අනිත් සහෝදරයා මේ පැත්තේ ඉන්නවා. කොහොම වුණත්, මේ අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යන්න අපි ඔබතුමාට ආශිර්වාද කරනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳවත් මම කෙටියෙන් වචන ස්වල්පයක් කථා කරනවා. හැබැයි, වරාය ගැන තමයි වැඩියෙන් කථා කරන්නේ. 2000 අවුරුද්දේ රොනී ද මැල් මහත්මයා වරාය සංවර්ධන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. ඒ අවුරුද්දේ මම එම අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමති. ඒ කාලයේත් කරන්න හදපු දේවල්, කථා කරපු දේවල් කරන්න එතුමන්ලාටත් බැරි වුණා. 2007 සිට 2010 දක්වා වරාය හා ගුවන් සේවා ඇමතිවරයා හැටියට කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. මම එම අමාත්‍යාංශය භාරගන්න වෙලාවේ එදා රටේ තිබුණු තත්ත්වය වෙනස්. යුද්ධය හා ත්‍රස්තවාදය නිසා වරායත්, ගුවන් තොටුපළත් තමයි මරමස්ථාන වෙලා තිබුණේ. එම ස්ථාන තමයි කොටින්ගේ ප්‍රහාරක ඉලක්ක වෙලා තිබුණේ. ඒවා ආරක්ෂා කරගැනීම තමයි එදා ප්‍රධාන කාර්ය වුණේ. අපි දන්නවා, ගුවන් තොටුපළට ගහපු වෙලාවේ කෝටි 6,000ක විතර පාඩුවක් වුණ බව. වරාය බොහොම අමාරුවෙන් තමයි ආරක්ෂා කරගත්තේ. ආරක්ෂක හේතූන් නිසා වරායේ උතුරු පිවිසුම සම්පූර්ණයෙන්ම වහන්න සිද්ධ වුණා. ඒ වාගේම ත්‍රස්තවාදයෙන් බේරාගන්න අවදානම් කලාපයක් වශයෙන් නම් කරලා තිබුණා. එම නිසා නැව් ඒජන්තවරුන්ට විශාල රක්ෂණ භාරයක් ගෙවන්න සිද්ධ වුණා. ඒ කාලයේ වරායේ ආදායම විශාල වශයෙන් අඩු වුණා. 2014 විගණකාධිපතිවරයාගේ වාර්තාව බලන්න. මට පෙර කථා කළ මන්ත්‍රීවරයාත් ඒ පිළිබඳව ප්‍රකාශ කළා. ආදායම අඩුවෙලා තිබෙනවා. නමුත් 2010 සිට ක්‍රමානුකූලව handle කරන containers ප්‍රමාණය වැඩිවීම නිසා ආදායම වැඩිවෙලා තිබෙනවා.

ත්‍රස්තවාදය නිසා රටට සිදුවුණු අලාභය, පාඩුව, ඒ කාලයේ ණය ගත් ප්‍රමාණය ගැන හුඟ දෙනෙක් කථා කරන්නේ නැහැ. ඒ කාලයේ බිලියන 200කට වැඩි ප්‍රමාණයක් ණය අරගෙන තිබෙනවා. අපි අද කථා කරන්නේ බිලියන 1ක්, 2ක් වශයෙන් ගත් ණය ගැනයි. 2009න් පස්සේ ත්‍රස්තවාදය සම්පූර්ණයෙන් නතර වුණා. ඒ මුදල් අනෙක් සංවර්ධන කටයුතු සඳහා ඉතිරිවෙලා තිබුණා. එදා අය වැය ලේඛනයක් ඉදිරිපත් කළාම, එහි වැයවලින් සියයට 30කටත් වැඩිය වියදම් කරන්නේ යුද්ධයට අවශ්‍ය අවි ආයුධ ගැනීම සඳහායි. අද එවැනි තත්ත්වයක් නැහැ. ඒ නිසා අද හොඳ වාතාවරණයක් තිබෙනවා. අද වැඩ කටයුතු හොඳින් කරගෙන යන්න පුළුවන්. ඒ වාගේම 2007 සිට 2010 දක්වා මම මේ අමාත්‍යාංශයේ අමාත්‍යධූරය දැරුවා. 2005 ජනාධිපතිවරණයේදී ජනතාවටත්, රටටත් බලාපොරොත්තු රාශියක් දුන්නා. ඒවා ඉටු කිරීම ඒ අමාත්‍යවරයාගේ සහ අමාත්‍යාංශයේ වග කීමක් වුණා. අපි ඒක හැකි පමණින් ඉටු කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ඔලුවිල් වරාය ගැන කථා කළා.

1999දී, දිවංගත එම්.එච්.එම්. අෂ්රොෆ් අමාත්‍යතුමාගේ කාලයේදී, එතුමා තමයි ඔලුවිල් වරාය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබෙන්නේ. ඒ වාගේම ඒ අධ්‍යයනයෙන් පස්සේ -2004 වර්ෂයේදී- ඔලුවිල් වරාය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවලා තිබුණා. ඊට පස්සේ ඒ ටෙන්ඩරය ලබා දුන්නා. ඒකත් ඩෙන්මාර්ක රජයෙන් ගත් mixed credit ණයක්. ඒවා කරන්න බැරි බාධාවන් කිහිපයක් තිබුණා. ඒ ප්‍රදේශයේ ධීවරයන් සමඟ ඇති වුණු ප්‍රශ්න, ඉඩම් අත් පත් කරගැනීමේ ප්‍රශ්න වාගේම ගල් කොරියක් පිළිබඳ ප්‍රශ්නයකුත් ඇතිවෙලා තිබුණා.

ඒ වාගේ ප්‍රශ්න නිසා ඒ කටයුත්ත ප්‍රමාද වුණා. නමුත් එතුමා ඔලුවිල් වරාය ධීවර වරායකින් හා වෙළෙඳ වරායකින් සමන්විත වෙන ආකාරයට හදන්න තමයි කටයුතු කළේ.

එතුමාගේ කාලයේදීම එතුමා කල්මුණේ lighthouse එකක් හදලා තිබෙනවා. මහපොළ විශාල පුහුණු මධ්‍යස්ථානයක් හදලා තිබෙනවා. ඊට කලින් අඩු සැලකිල්ලක් දක්වා තිබුණු නිසා එතුමා විශේෂයෙන්ම නැගෙනහිර පළාත ගැන කල්පනා කර බලන්න ඇති. ඒ කාලයේ නැගෙනහිර පළාතේ තරුණ තරුණියන් භාරදහසකට විතර ඔලුවිල් වරායේ රක්ෂා ලබා ගන්න අවස්ථාව ලැබුණා. එතුමා සද්භාවයෙන් ඒ වැඩේ කරන්න ඇති. එතුමාට කරන්න බැරි වුණු දේ කරන්න මට පුළුවන්කම ලැබුණා, අදාළ ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේදී. ඒ ප්‍රශ්න විසඳාගෙන වැඩ කටයුතු ආරම්භ කරන්න මට පුළුවන්කම ලැබුණා. විශේෂයෙන්ම ඔලුවිල් වරායේ ධීවර වරාය ආශ්‍රිතව කර්මාන්ත පිහිටුවා නැවුම් මත්ස්‍යයින් ඉතා ඉක්මනින් මත්තල ගුවන් තොටුපොළ හරහා විදේශ රටවලට අපනයනය කිරීමටත්, එමඟින් විශාල විදේශ විනිමයක් අත්පත් කර ගැනීමටත්, ධීවර කර්මාන්තය ඉහළ නැංවීමෙන් එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමටත් එමඟින් අපේක්ෂා කළා. ඒක තමයි ඔලුවිල් වරායේ තත්ත්වය.

ඊළඟට, හම්බන්තොට වරාය ගැන කියන්න ඕනෑ. ඒක ගැන නේ හැම එක් කෙනාම කථා කරන්නේ; හැම එක් කෙනාම දෝෂාරෝපණය කරන්නේ. ඒ ගැනත් 2005 වසරේ මැතිවරණ පොරොන්දුවල තිබුණා. ගරු ඇමතිතුමනි, මට මතක හැටියට 2005 වසරේ ඔබතුමා අපේ පාර්ශ්වයේයි හිටියේ. ඉතින් එදා පක්ෂ 30ක් විතර එකතු වෙලා කාගේත් එකඟතාවෙන් තමයි ඒ මැතිවරණ ප්‍රකාශනය හැදුවේ. මට මතකයි, 1999 ජනාධිපතිවරණයට ජනතා විමුක්ති පෙරමුණෙන් නන්දන ගුණතිලක මහත්මයා තරග කළා. රූපවාහිනී සංවාදයකදී - එතුමාගේ කථාවේදී- එතුමා පැහැදිලිව කිව්වා, එතුමාට රට භාර දුන්නොත් මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න, රැකී රක්ෂා ඇති කරන්න හම්බන්තොට, මොණරාගල, අම්පාර දිස්ත්‍රික්ක ශීඝ්‍රයෙන් දියුණු කරන්න, හම්බන්තොට වරාය හදනවා කියලා. එතුමා එහෙම ප්‍රකාශ කළා.

මා දන්නේ නැහැ, අද තිබෙන්නේ මොන ප්‍රතිපත්තියද කියලා. නමුත් එදා එහෙම කිව්වා. ඉතින් ඒක විශ්වාස කරලා අපිත් ටිකක් ඒ ගැන අධ්‍යයනය කළා, කොහොමද ඒක හදන්නේ; අපට ඒකෙන් වාසියක් ලැබෙයිද කියලා. එහෙම බලන්නේ නැතුව නිකම්ම හැදුවේත් නැහැ. 1994 වසරේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය බලයට පත් වුණාට පස්සේ එතුමියගේ ප්‍රතිපත්ති අනුව, වැඩ පිළිවෙළ අනුව ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල, ඇඹිලිපිටිය වාගේ ප්‍රදේශවල විශාල ව්‍යාපෘති ඇති කරන්න කටයුතු කළා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාටත් මතක ඇති, මටත් මතකයි, 'දක්ෂිණ සංවර්ධන අධිකාරිය' කියලා අලුත් අධිකාරියක් හැදුවා. ඒ අධිකාරිය විවිධ ව්‍යාපෘති පිළිබඳව අධ්‍යයනය කළා. එහි සභාපති වශයෙන් හිටියේ නවීන් ගුණරත්න මහත්මයා. Master Divers එකේ ආරියසීලි වික්‍රමනායක මහත්මයා, නැව් අයිති අය, ඒ ක්ෂේත්‍රයේ වැඩ කරපු හුඟක් දෙනෙක් -ඔබතුමාත් කිව්වාද දන්නේ නැහැ- හම්බන්තොට වරායක් හදන්න ඕනෑ කියලා යෝජනා කළා. හොඳ ශක්‍යතා අධ්‍යයනයක් කරලා, විමර්ශනයක් කරලා, දැන් හදලා තිබෙන තැන හම්බන්තොට වරාය හදන්න නිර්දේශ වුණා. එතකොට ගුවන් තොටුපොළත් ඒ ආසන්නයේම හදන්න යෝජනා වුණා. ඒ පිළිබඳව පොත් මිටි ගණන් තිබෙනවා. අහස් යාත්‍රා ගොඩ බස්වනවා, නැව් එනවා; පින්තූරත් තිබෙනවා. ඒ ඔක්කෝම අය මහා විශාල campaign එකක් ගෙන ගියා.

ඊළඟට, 2001 වසරේදී රවුෆ් හකීම් මැතිතුමා වරාය භාර ඇමතිතුමා වශයෙන් පත් වුණා. එතකොට අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටියේ ආනන්ද කුලරත්න මන්ත්‍රීතුමා. ජේවීපී එකේ විජිත රණවීර මන්ත්‍රීතුමා හිටියා. ඒ සියලු දෙනාටම අවශ්‍ය වුණා, ඒ වරාය හදවන්න. 2002 වසරේදී යූඑන්පී ආණ්ඩුව බලයට පත් වුණාම එක පාරටම ඔය හම්බන්තොට වරාය හදපු ස්ථානය -ඒ කළපුව- කුරුලු අභය භූමියක් බවට පත් කළා. එදා රෑ 12ට ගැසට් කළා. පසුවදා උදේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා කථා කළා. එවිට ආනන්ද කුලරත්න මහත්මයායි, මමයි ගිහිල්ලා වර්තමාන අගමැතිතුමාට කථා කළා. අගමැතිතුමා ඉතාම සාවධානව ඇහුම් කන් දීලා, එම ගැසට් නිවේදනය අවලංගු කරන්න එවෙලේම නියෝග කළා. හැබැයි, එම ගැසට් නිවේදනය අවලංගු නොකළා නම්, අදත් ඒ ගැන කථා කරන්න වනවා. එතැන වරායක් හැදෙන්නේ නැහැ. ඒක ගොඩබිම තුළ හදපු විශේෂිත වරායක්. ඒ ගැන අපි අගමැතිතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතැන ඊට පස්සේ වරායක් හැදුවා. අද එතුමාට විකුණ ගන්නත් හැකි වෙලා තිබෙන්නේ එදා වරාය හදපු නිසා. හැබැයි, ඒ වරාය සාධාරණව විකුණුවාට කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හම්බන්තොට වරාය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අදියර දෙකකින් නිම කිරීමට යෝජනා කළා. දෙවැනි අදියරේ අරමුණ වූයේ, හම්බන්තොට වරාය ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානයක් ලෙස කොළඹ වරායට ශක්තියක් වන්නට අතිරේක වරායක් වශයෙන් ගොඩ නැඟීම හා ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ බහලුම් කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථාපනය කිරීමයි. ඒ වාගේම හම්බන්තොට වරායේ පළමු අදියර සාර්ථක ලෙස නිම කළා. එම වරායේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ, එය ගොඩබිමේ ඉදිකරන ලද වරායක් වීමයි. හම්බන්තොට වරාය ප්‍රධාන ඊශාන දිග ජාත්‍යන්තර ගමන් මාර්ගයට ඉතා ආසන්නව පිහිටි සුවිශේෂ ගැඹුරු ජල ප්‍රදේශයකින් පිහිටි නවීන කාර්යක්ෂම වරායක් ස්ථාපිත කිරීම සඳහා යෝග්‍ය ස්වාභාවික අංග ලක්ෂණවලින් සමන්විත වෙනවා.

මීට සමගාමීව මත්තල ගුවන් යානා අංගණයක් ස්ථාපනය කිරීමෙන් හම්බන්තොට මුහුදු හා ගුවන් කේන්ද්‍රස්ථානයක් - sea-air hub එකක්- ලෙස දියුණු කිරීමට සැලසුම් කර තිබුණා. හම්බන්තොට වරායේ පිහිටීමේ ඇති වාසිදායක තත්ත්වය රටේ ආර්ථික සංවර්ධනයෙහිලා උපයෝගී කර ගනිමින් වරාය හා ගුවන් සේවා ආශ්‍රිත ව්‍යාපෘති දියුණු කිරීම මෙම ව්‍යාපාරයේ තවත් අරමුණක් වුණා.

තෙල් සැපයීමේ පහසුකම වෙනුවෙන් හම්බන්තොට වරායේ තෙල් අංගණය සැකසුවා. මේ හැම ව්‍යාපෘතියකටම ණය අරගෙන තිබෙනවා. නැව් තෙල් සැපයීම අධික ප්‍රාග්ධනයක් පදනම් කර ගත් ව්‍යාපාරයක් වන අතර, වැඩි පරිමාවක් විකිණීම තුළින් පමණක් ලාභ ඉපයීම කළ හැකිය. ආසියානු රටවල ශීඝ්‍ර ආර්ථික වර්ධනය හමුවේ හම්බන්තොට වරායේ කේන්ද්‍රීය පිහිටීම හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ දකුණු තීරු හරහා දෛනිකව ගමන් කරන 200කට අධික නෞකාවලට තෙල් සැපයීම මඟින් විශාල ආර්ථික වාසියක් ලබා ගත හැක.

ඒ විතරක් නොවෙයි. Suez Canal එක වාගේ තායිලන්තය හරහා Kra Canal එක කැපීමෙන් හම්බන්තොට සේද මාවතක් එක්ක එක්කහු වනවා. ඒ ගැන සාකච්ඡා වනවා; සැලසුම් සකස් කරලා තිබෙනවා. එතකොට චීනය, තායිවානය, ජපානය, වියට්නාමය වැනි රටවලට තම නිෂ්පාදන නැඟෙනහිරට ගෙනි යන්න වෙන්නේ මේ මාර්ගයෙන්. තායිලන්තය හරහා Kra Canal එක කැපුවාම එතැන ඉඳන් හම්බන්තොට වරායට තිබෙන්නේ නාවික සැතපුම් 1,250යි. එතකොට යුරෝපයට යන කොට නාවික සැතපුම් 1,250ක විතර දුරක් අඩුවෙනවා. බලන්න ආර්ථික වාසිය. අනාගතයේදී මේ සැලසුම් ක්‍රියාත්මක වේවි. ඉතින්, අපිත් අනාගතය දිහා බලලා මේ කටයුතු සැලසුම් කරන්න ඕනෑ. එහෙම නැතුව විවේචනය කළාටම මදි. හැබැයි, වැරදි දේවල් විවේචනය කරන්නත් ඕනෑ; පෙන්වලා දෙන්නත් ඕනෑ. වැරදි පෙන්වලා දුන්නාම හදා ගන්න එක ඒ අයගේ යුතුකම. මම දීර්ඝ වශයෙන් හම්බන්තොට වරාය ගැන කියන්නේ නැහැ. තව කාරණා ටිකක් විතරක් කියන්නම්.

ඉන්දියාවේ වල්ලපඩම් වරාය හදලා අවුරුදු දෙකක් ගියා, එක නැවක් එන්න. හම්බන්තොට එහෙම නොවෙයි නේ. හම්බන්තොට වරාය හදලා අවුරුදු තුනක් වන කොට මාසයකට නැව් 70ක් විතර ආවා. හරි නේද, ඇමතිතුමා? තෙල් ගහගන්නත් නැව් ආවා. මම හිතන විධියට තෙල් ගහගන්න නැව් 68ක් විතර ආවා. මම හරියට ගණන නම් දන්නේ නැහැ. හැබැයි, ජනවාරි 08වැනි දායින් පස්සේ ගත්ත තීන්දුව හරහා නම් පෙබරවාරි වන කොට ඇවිල්ලා තිබෙන්නේ නැව් දෙකයි. මේකේ වෙන වෙන අඩු පාඩු තිබෙන්න ඇති.

අමාත්‍යාංශයේ 2015 ප්‍රගති වාර්තාවේ හම්බන්තොටට ආපු නැව් -ship arrivals- ගණන සඳහන්ව තිබෙනවා. 2014දී ඇවිත් තිබෙනවා, නැව් 335ක්. 2015දී ඇවිත් තිබෙනවා, නැව් 295ක්.

ඊළඟට, 2004 bunkering ආරම්භ කළාට පස්සේ ආදායම කීයද බලන්න. ආදායම ගණන් බැලුවාද, ආදායම දන්නවාද කොච්චරද කියලා.

අනික් කාරණය තමයි, මේක නිදහස් වරායක් බවට පත් කරලා තිබුණා. 2011 වනකොට ආයෝජකයන් කැඳවා තිබුණා. - මේ මම දන්නා තොරතුරු. 2010 විතර වනකම් විතරයි මම හිටියේ. ඊටපසු ඒ ගැන වැඩිය දන්නේ නැහැ.- 2014දී එයින් 11දෙනෙක් තෝරාගෙන තිබුණා. එයින් 5 දෙනෙක් සමඟ ගිවිසුම්ගත වෙලා තිබුණු බව මම දන්නවා. මොකද, මේක ආරම්භ කරන්න මුල් ගල තියන්නත් ඒ කාලයේ ලෑස්ති වෙලායි හිටියේ.

දැන් මම ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එදා අත්සන් කරපු ගිවිසුම් කරන්න පුළුවන්ද, ඒවා හොඳද, ඒවායින් වාසිද කියා ටිකක් බලන්නය කියා. කර්මාන්ත ඇති කරන්න නේ මේ හම්බන්තොටින් අක්කර 15,000ක් විකුණන්න හදන්නේ. ඒක කරන්න යන්නේ සද්භාවයෙන් වෙන්න පුළුවන්. රැකියා දස ලක්ෂයක් සපයන්න කර්මාන්තශාලා ඇති කරන්න ඕනෑ නේ. එතකොට ගොවි බිම්වලට මොනවාද වෙන්නේ කියන එකත් සොයන්න වෙනවා. අපේ මිනිසුන් පුරුදු කැත්ත, උදැල්ලට නේ. ඒ මිනිසුන්ගේ ඉඩම් ටික ගන්නකොට ටිකක් අනුකම්පා සහගතව බලන්න ඕනෑ. මේ සඳහා සුදුසු බිම් තිබෙනවා. හැබැයි ඉතින් ඒ සුදුසු බිම් තිබෙන්නේ කොහේද?

අගමැතිතුමාම කියනවා, විශේෂයෙන්ම දකුණු පළාතේ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑය කියා. තිස්සමහාරාමයේ පමණක් හෝටල් 300ක් විතර තිබෙනවා. මේ එන අයට යාල විතරද, බලන්න තිබෙන්නේ? මේ අයට තව entertainment ඕනෑ නේ. එතකොට නේ දවසක් දෙකක් ඒ ප්‍රදේශයේ ගත කරලා ඒ අයගේ මුදල් වියදම් කරන්නේ. එතකොට ගමේ ඉන්න කෘෂි කර්මාන්තයෙන් ජීවත් වෙන අනික් අයටත් ඒ ආදායම් බෙදී යනවා. අධිවේගී මාර්ගය හැදුවාම කතරගම යනවා එනවා මිසක් ඒ අය නවතින්නේ නැහැ. ඒ, බලන්න දෙයක් නැති නිසා.

ඊයේ නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා කිව්වා, නිවාස හදන්න racecourse එකේ අක්කර 100ක් බෙදා දෙනවාය කියා. අගමැතිතුමා දකින මේ සිහිනය සැබෑ වෙන්නේ කොහොමද, ඒ ප්‍රදේශවල ඉන්න ඇමතිවරුන්ට ඒක තේරෙන්නේ නැත්නම්? ඉතින් මේවා ගැන හිතන්න වෙනවා. වන වගාවන් පෙනෙන්න

[ගරු චමල් රාජපක්ෂ මහතා]

බැහැ. ඒවා ඩෝසර් කරනවා. මිනිසුන්ගේ සමාජ ප්‍රශ්න, සමාජ අවශ්‍යතාවන් තිබෙනවා. ඒවාත් ඉෂ්ට කරන්න ඕනෑ. නමුත් මේවාට සුදුසු බිම් තිබෙනවා. ඉතින් මේවා කොහොමද කරන්නේ? ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට විශේෂයෙන්ම කියනවා, සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ නම්, කර්මාන්තශාලා ඇති කරන්න නම් මේවාත් තිබෙන්න ඕනෑ කියන එක. මේවා විනාශ කරන්න දෙන්නත් එපා. මේවා ගැනත් බලන්න. මේ ගිවිසුම් ගැන බලන්න. ඒ වාගේම මේ විකුණන සම්පත්වලට වාණිජ තක්සේරුවක් දෙන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
තිබෙන දෙයක් විකුණන්නේ නැහැ, මන්ත්‍රීතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
විකුණුවත් කමක් නැහැ. ඒක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය නේ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
විකුණන්නේ නැහැ, මන්ත්‍රීතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
හොඳයි, බොහොම හොඳයි.

SAGT, CICT කළා වාගේ කළාට නම් ප්‍රශ්නයක් නැහැ. වාණිජ තක්සේරුවක් කරලා තිබෙනවාද කියා මුලින් බලන්න. මොකද, මෙතැන ඉඩම ඇති වෙච්ච දූපතක් තිබෙනවා. ඒ කාලයේ ආයෝජකයෙක් මේ දූපත මිලියන 600කට ඉල්ලුවා. දන්නේ නැද්ද, අපේ මිනිස්සු අරවා මේවා හිත හිතා ඉන්නවා නේ. වරායට නිශ්චිත වශයෙන් ලැබෙන වාර්ෂික royalty එක, ඉඩමට ලැබෙන බිම් කුලිය ගැනත් බලන්න ඕනෑ. එක පාරටම දීලා දැම්මොත් එහෙම -මම දන්නවා, ඔබතුමා එහෙම කරන්නේ නැති බව. මේ outright විකිණීම කෙරෙන්නේ නැහැ කියන විශ්වාසය අප තුළ තිබෙනවා. ඒ වාගේම වරායේ container terminal එකක් තිබුණා. චීන සමාගමක් සමඟ හවුල් ව්‍යාපාරයකට ඒ සම්බන්ධයෙන් ගිවිසුම්ගත වෙලා තිබුණා. එහි සියයට 35ක් අපටත්, සියයට 65ක් ඒ සමාගමටත් වශයෙනුයි පොරොන්දු වෙලා තිබුණේ. ඒකට මොනවා වෙලාද කියා මම දන්නේ නැහැ. ඒ ගැන ටිකක් බලන්න. එතකොට මේවා විකුණන්න ඕනෑත් නැහැ. බලන්න, SAGT එකෙන් සහ CICT එකෙන් වරාය අධිකාරියට රුපියල් බිලියන හතක විතර ආදායමක් එනවා නේ. CICT එකෙන් ගිය අවුරුද්දේ රුපියල් බිලියන හතරක විතර ආදායමක් ලැබී තිබුණා. දැනට තිබෙන විධියට හම්බන්තොට වරායේ නැව් 12ක් විතර මෙහෙයවන්න පුළුවන්.

අවසානයේදී නැව් 34ක් විතර එක විට මෙහෙයවන්න හැකිවන තත්ත්වයකට හදන්නයි බලාපොරොත්තු වුණේ. එකවර නැව් හතරක් හරවන්න පුළුවන් බහලු පර්යන්තයක් එහි තිබෙනවා. සම්ප්‍රදායික බඩු මෙහෙයුම් පර්යන්තයේ නැව් තුනක් එක වර මෙහෙයවන්න පුළුවන්. වාහන මෙහෙයවන පර්යන්තයේ නැව් තුනක් එක වර මෙහෙයවන්න පුළුවන්.

නැව් සඳහා ඉන්ධන සැපයීමේ පර්යන්තයේ නැව් දෙකක් හරවන්න පුළුවන්. ඉතින් මේවායෙන්ම ආදායම සොයාගන්න පුළුවන් නේ. ණය සුළු ගණනක් නේ. යුද්ධයට වියදම් කරපු රුපියල් බිලියන 200 දිහා බලනකොට, 1.35ක් කියන්නේ සුළු ප්‍රමාණයක්. මේවා ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

කර්මාන්ත ඇති කරන්න ගිවිසගත් ගිවිසුම් අනුවම විතරක් ඒකේ වටිනාකම -විකුණන්න හදන මුදල- ඩොලර් බිලියන 1,100යි. සද්භාවයෙන් කටයුතු කරන්න. අපේ රටේ සම්පත් ආරක්ෂා කරන්න. අනාගත පරම්පරාවට මේවා අහිමි වෙන්න දෙන්න එපා. අපි මේ රටේ භාරකාරයෝ පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට වෙන්කරපු කාලය අවසන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වැඩිපුරත් දීලා තිබෙනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
එහෙම නම් බොහොම කනගාටුයි. ගරු ඇමතිතුමනි, මේ ආයතන විකුණන්න ඕනෑමද කියා ඔබතුමා නැවත සොයා බලන්න. ඔබතුමා එහෙම කරන්නේ නැහැයි කියන එක අපට විශ්වාසයි. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. ඔබතුමා අපේ මිත්‍රයකුගේ පුතෙක්; අපේ හිත මිත්‍රයෙක්; පෞද්ගලික මිත්‍රයෙක්. ඔය පැත්තේ තිබෙන අදහස් හා ප්‍රතිපත්ති මොනවා වුණත්, ඔබතුමා මුලින් දැරූ ප්‍රතිපත්ති මතම පිහිටා වැඩ කටයුතු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු සිසිර කුමාර අබේසේකර මන්ත්‍රීතුමා.

[අ.භා. 2.19]

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**
(மாண்புமிகு சிசிர குமார அபேசேகர)
(The Hon. Sisira Kumara Abeysekara)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

2017 අය වැය කාරක සභා අවස්ථාවේදී අද දිනට නියමිත ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අපේ හිටපු කථානායක, ගරු චමල් රාජපක්ෂ මැතිතුමා හම්බන්තොට වරාය ගැන යම් යම් දේවල් ප්‍රකාශ කළා. එතුමාගේ එම ප්‍රකාශයෙන් අපට හැඟුණේ, හම්බන්තොට වරාය හා මත්තල ගුවන් තොටුපොළ අපි අදියරෙන් අදියර විනාශයට පත් කරන බවට ලකුණු පහළ වෙලා තිබෙනවාය කියන එකයි. ගරු

මන්ත්‍රීතුමනි, එහෙම දෙයක් වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා ප්‍රකාශ කළා, 2014 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව හා 2015 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව ගැන. එතැනදීම ඔබතුමා කිව්වා, මේකේ මොකක් හෝ අභ්‍යන්තර දෙයක් තිබෙන්න ඕනෑය කියා. පොදු පාලනයක් ගෙනයන රජයෙන් කිසිසේත්ම ඒ විධියේ දෙයක් වෙන්නේ නැහැ. මොකද, අපි දන්නවා, මේ වරාය අනිවාර්යෙන් වියදම් කරලා ණය වෙලා හැදුවත්, රජයක් හැටියට මේවා වැඩිදියුණු කරන්න අපේ අගමැතිතුමාට හා ජනාධිපතිතුමාට අවශ්‍ය වෙලා තිබෙනවාය කියන එක. අපිට ඒ ගැන හිතන්න පුළුවන්.

දැනට සති දෙකකට කලින් අපි හම්බන්තොට ගිහින් අධීක්ෂණය කර බැලුවා. චීන සමාගමකට අක්කර 15,000ක් දීලා, එතැනට එන ආයෝජන ක්‍රම තුළින් මේ වරාය දියුණු කරන්නත්, මේ ගුවන් තොටුපොළ දියුණු කරන්නත් අවශ්‍ය කටයුතු දැන් කරගෙන යනවා. මේ රජය කවදාවත් කිසිම තැනක ඉදි කළ දෙයක් නැති කරන්න කටයුතු කරලා නැහැ. එහෙම ප්‍රතිපත්තියක් මේ රජයට නැහැ. මේ රජයේ එකම ප්‍රතිපත්තිය තමයි, කවුරු හැදුවත්, කවුරු කෙරුවත් භාගෙට ඒක නවත්වන්න හොඳ නැහැයි කියන එක. මොන වැරැද්ද කර තිබුණත් ඒවා නිවැරදි කරගෙන එම කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යෑමේ චේතනාව තමයි මේ යහ පාලන රජයට තිබෙන්නේ.

අපි ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධව ටිකක් සාකච්ඡා කරමු. ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන බලන විට 2012 සිට 2014 දක්වා කාලය තුළ වසරින් වසරට විශාල පාඩුවක් දරා ගෙන එන බවක් අපට පෙනෙනවා. මෙම පාඩුව හැම ආයතනයකම දකින්න තිබෙනවා. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව කියන මේ හැම ආයතනයකම හැම අවුරුද්දේම ආදායම ටිකෙන්-ටික අඩු වී ගිහින් ආදායම් නොලබන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. අපිට ඒක පෙනී යනවා. නමුත් අපට අවශ්‍ය වෙන්නේ, එකතුවෙලා මේවා දියුණු කරන්නයි. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, මේ රටේ තමයි කිසිම පරිපාලනයකින් තොරව ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක වෙන්නේ කියලා. නමුත් 2014 - 2015 කාල පරිච්ඡේදය දිහා බැලුවාම අපට පෙනෙනවා, වර්ධනයක් සිදුවී තිබෙන බව. මේ සම්බන්ධව නීති මාලාවක් සකස් කරමින් සිටිනවා. මෙහි යම්කිසි ප්‍රගතියක් තිබෙනවා. අපි නීත්‍යානුකූලව ටිකෙන්-ටික ප්‍රගතිය කරා ගමන් කරන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දඩ මුදල් සම්බන්ධවත් සඳහන් කළා. බීමත්කමින් රිය පැදවීම සම්බන්ධව දඩ මුදලක් අය කළාට කමක් නැහැ. ඒ වාගේම ඉරි කපන එකට, high speed යන එකට දඩ මුදලක් අය කරනවා. අහිංසක රියැදුරන් රුපියල් 25,000ක් හෝ 30,000ක් වැනි වැටුපක් තමයි ලබන්නේ. ඒ නිසා ඒ දඩ මුදල සංශෝධනය කරලා -දඩයක් නොගහන්න නොවෙයි- සාධාරණ දඩයකට යටත් කරන්නය කියලා රජයෙනුත්, ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. එහි සාධාරණත්වයක් තිබෙනවා.

ත්‍රී වීලර් ගැන කථා කරනකොට, අද අපේ රටේ දවසින්-දවස අපරාධ වැඩි වෙන්නේ ත්‍රී වීලර් නිසායි. පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ ත්‍රී වීලර් ධාවනය කරන රියැදුරන්ගේ වයස අනිවාර්යයෙන්ම අවුරුදු 40ට වැඩි වෙන්න ඕනෑ. අවුරුදු 40 කෙසේ වෙතත් අවුරුදු 30ක් කළාට කමක් නැහැ. අද නගරවල සිටින විට අපි දන්නවා, කොපමණ අපරාධ සිදු වෙනවාද කියලා. කොහෙන් හෝ රුපියල් ලක්ෂ දෙකක් හෝ රුපියල් ලක්ෂ තුනක් සොයා ගන්නවා. එහෙම නැත්නම් අරාබිකරයට ගිහින් රුපියල් ලක්ෂයක් හෝ රුපියල් ලක්ෂ දෙකක් සොයාගෙන එනවා. ඊට පස්සේ, finance companiesවලින් සියයට 90ක් ගෙවීමේ පහසුකම් ලබා දෙන නිසා ත්‍රී වීලර් රථයක් අරගෙන, බෑග් එකකුත් කරේ දමාගෙන ටවුමේ සැරිසරනවා. මේ ගොල්ලන්ගේ ආදායම රුපියල් 700යි. අද වෙනකොට ත්‍රී වීලර් රථ 15,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. මේ උදවිය තමයි මේ සමාජය කෙලෙසන්නේ. අපි දන්නවා, වෙන පළාතකට ගිහින් බැහැපු හැටියේ මත්පැන් බෝතලයක් ගන්න ඕනෑ නම්, ත්‍රී වීලර් පාර්ක් එකේ කෙනෙකුට තමයි කියන්නේ මත්පැන් බෝතලයක් සොයා දෙන්නය කියලා. ඒ ගොල්ලෝ ඒක සොයා දෙනවා. ඒ වාගේම ගංජා සුරුට්ටුවක් ගන්න ඕනෑ නම්, එතැනට ගිහින් තමයි කියන්නේ. ඒ වාගේම ගණිකා අංශය ගැනත් තොරතුරු සොයා ගන්නේ එතැනට ගිහින් තමයි. ඔවුන් ඒ විධියට නගරයේ ජීවත්වන එකෙන් අද විශාල විනාශයක් සිද්ධ වෙනවා. මේක අඩු වෙන්න ඕනෑ. එහෙම නම් අඩුම තරමේ වයස අවුරුදු 30කට හෝ 35කට හෝ වැඩි රියැදුරන්ට තමයි මේ අවස්ථාව ලබාදීම තමයි සුදුසු වෙන්නේ. අපි ගරු ඇමතිතුමාට කියනවා, මේකට මැදිහත්වෙලා මේ සම්බන්ධව මේ වැඩ කටයුතු කර දෙන්නය කියලා.

ජාතික ගමනාගමන කොමිසම ගැනත් යමක් කියන්න ඕනෑ. අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වුණත් කියන්න ඕනෑ, එතැන ලොකු වැරදි සහගත දේවල් සිද්ධවෙලා තිබෙන බව. අපි දන්නවා, තුවක්කුව ගැන. තුවක්කුව කියන්නේ මිනී මරන්න පුළුවන් ආයුධයක්. රජයේ නීති-රීති අනුව ගිනි අවියක් වුණත් තාත්තාගේ තුවක්කුව පුතාගේ නමට මාරු කරන්න පුළුවන්. නමුත් බස් රථයක් මිල දී ගන්න කෙනකුට ඒක තමන්ගේ දරුවාගේ නමටවත් මාරු කරන්න බැහැ. එහෙම මාරු කරන්න නම් රුපියල් ලක්ෂ ගණනක් ඉල්ලනවා. එතකොට ප්‍රජාතන්ත්‍රවාදී රජයේ තිබෙන මේ වැඩ කටයුතු මොනවාද? ගරු ඇමතිතුමනි, යම්කිසි කෙනෙක් බස් රථයක් මිල දී ගත්තත්, අනුන්ගේ නමට තියාගෙන ඒ බස් රථය ධාවනය කරනකොට විශාල වංචා, දූෂණ සිද්ධ වෙනවා. අද එවැනි දේවල් සිද්ධවෙලා තිබෙනවා. අවුරුද්දක්, දෙකක් ගියාම ඒ බස් රථය දෙන්නේ නැතිව පැහැරගෙන යන්න පුළුවන්. ඒ permit එකට වෙනම බස් රථයක අංකයක් ඇතුළත් කරලා තිබෙනවා. අපි මේවා දැකලා තිබෙනවා. මෙවැනි ක්‍රියාමාර්ගවලට NTC එක උදවු කරන එක නිවැරැදි දෙයක් නොවෙයි කියා මා හිතනවා. එවැනි අවස්ථාවලදී සෑහෙන්න දූෂණ ඇති වෙලා තිබෙනවා.

අද වනකොට සමහර තැන්වල මාර්ග බලපත්‍රයක් දෙනකොට ටෙන්ඩර් කැඳවලා, රුපියල් ලක්ෂ විසිපහක් හෝ රුපියල් ලක්ෂ තිහක් යනවා. බස් රථයකට රුපියල් 1,25,000ක ෆිනෑන්ස් වාරිකයක් තිබෙනවා නම්, ටෙන්ඩරයෙන් ගන්නා වාරිකය රුපියල් 1,75,000ක් වෙලා තිබෙනවා. එතකොට ඒ අයට වැරදි කරන්න සිද්ධ වෙනවා. බස් රථයේ seats සංඛ්‍යාවට සෙනඟ ගෙනයන්න කිව්වාම ආදායමක් ලබන්න බැරි නම්, ෆිනෑන්ස් එක ගෙවන්න බැරි නම්, එතැන හිර කර ගෙන ඉන්නවා නම් ඒ පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම වැරදි කරන්න සිද්ධ වෙනවා. එහෙම නම් මූලික වැරැද්ද සිද්ධවෙලාතිබෙන්නේ අපේ අමාත්‍යාංශවලින්. ඒවා සංශෝධනය කරන්න ඕනෑ. නිදහස ලබා දෙන්න. ඒ නිලධාරීන්ගේ හිතුමතේට වැඩ කරන්න ඉඩ දෙන්න එපා. හරිම ප්‍රශ්නයක් තමයි වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව පුළුවන් තරම් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරලා, NTC එකේ තිබෙන නිලධාරි දෝෂය තුරන් කරලා දෙන්නය කියා ඉල්ලනවා.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ, අපත් පිළිගන්නා හොඳ ඇමතිවරයෙක්. ඒ කාර්ය භාරය හරිහැටි කරලා, මේ ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කරන්න කටයුතු කරන්න. මුළු ලෝකයෙන්ම අඩුම බස් ගාස්තුවක් තිබෙන්නේ අපේ රටේ. ඒ නිසා බස් ගාස්තු වැඩි වුණාය කියා දඟලලා වැඩක් නැහැ. එක එක සභාපතිවරු

[ගරු සිසිර කුමාර අබේසේකර මහතා]

ගැන මේ සභාවේ සාකච්ඡාවට භාජන වුණා. ඒ ගොල්ලනුත් වංචනික උදවිය. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මට ඒ බව කෙළින්ම කියන්න පුළුවන්. ඒ උදවියගේ අදහස් උදහස් නැතිව තමුන්නාන්සේගේ අදහස් උදහස් අනුව රටේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා සාධාරණ ගමනාන්තයක් දක්වා යන්න ක්‍රමවේදයක් හදන්නය කියා අපි ඉල්ලනවා.

[අ.භා. 2.27]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පළමුවෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. පහුගිය දවස්වල යාල්දේවී දුම්රිය විශාල අනතුරකට භාජන වෙන්න ගියා. ඒ අවස්ථාවේ ආබාධිත දෙදරු පියෙක් තමයි ඒ සිදුවෙන්න ගිය විපතින් බේරා ගත්තේ. අපේ ප්‍රවාහන ඇමතිතුමා ඒ ගැන දන්නවා ඇති. මා හිතන හැටියට එයට යම්කිසි ඇගැයීමක් කළ යුතුයි. ඔහු අවුරුදු 47ක ආබාධිත පියෙක්. මේ වෙන්න ගිය විනාශය නවත්වන්න එතුමා කටයුතු කළා. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, එතුමා යම්කිසි ඇගැයීමකට ලක් කරන්න කියලා.

අනෙක් කාරණය මේකයි. මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ වස්කඩුව කියන ගමේ ඊයේ දුම්රිය හරස් මාර්ගයේදී වාහනයක් හැපිලා පස් දෙනෙක් ජීවිතක්ෂයට පත් වුණා. අද මා ඒ ගැනත් කනගාටුව ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ වාසය කරන කෙනෙකු හැටියටත්, අපේ ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙනුත්, ඊයේ සිදු වූ අනතුරු සම්බන්ධයෙන් ඒ පවුල්වල සියලු දෙනාටම මගේ කනගාටුව සහ ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දුම්රිය හරස් මාර්ගවලට ගේට්ටු දමන එක, එක පාරටම කරන්න පුළුවන් වැඩක් නොවෙයි. කාලයක් තිස්සේ හැම තැනකටම මේ ගේට්ටු දාන්න හුඟක් උත්සාහ ගත්තා. නමුත් ඒක ටිකෙන් ටික, ටිකෙන් ටික තමයි කෙරුණේ. මට දැන ගන්න ලැබිලා තිබෙන විධියට දුම්රිය බම්බු ගේට්ටුවලට සවි කරන්න ගෙනාපු "Bell and Light" හැටක් විතර තිබෙනවා. නමුත්, ඒවා තවම සවි කරලා නැහැ. කාලයක් තිස්සේ ඒවා ගෙනැත් තිබෙනවා. ඒවා තාක්ෂණ නිලධාරින්ට කියලා ඒවා සවි කරලා තිබුණා නම්, මෙවැනි අනතුරු යම්කිසි දුරකට හෝ නවත්වන්න පුළුන්කම තිබෙනවා.

දුම්රිය දෙපාර්තමේන්තුව ගැන කථා කරන කොට විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඉඩම් ගොඩක් තිබෙනවා. මම හිතන විධියට ලංකාවේ වැඩියෙන්ම ඉඩම් හිමි දෙපාර්තමේන්තුවක් තමයි දුම්රිය දෙපාර්තමේන්තුව. මට ලැබිලා තිබෙන ආරංචිය අනුව, දුම්රිය සාමාන්‍යාධිකාරිගේ ඉඩම් බලතල අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් ප්‍රවාහන අමාත්‍යාංශයට පවරා ගෙන දුම්රිය ඉඩම් බෙදා දීම ආරම්භ කර තිබෙනවාය කියනවා. ඒක ඇත්තද, බොරුද කියලා මම දන්නේ නැහැ. මට ලැබුණු ආරංචියයි මම කියන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

මේ ඉඩම් තාවකාලිකව පවරා ගන්නා ලෙස අපට නියෝගයක් කළා. එම නියෝගය අපට පැහැර හරින්න ක්‍රමයක් නැහැ. ඒක තාවකාලික ක්‍රියාවලියක් පමණයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

පාර්ලිමේන්තු පනතකින් හැර, ඒ දුම්රිය සාමාන්‍යාධිකාරීගේ බලතල වෙන කාටවත් පවරන්න බැහැ. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න. මොකද, අපට තිබෙන්නේ මේ දුම්රිය ඉඩම් ටික විතරයි. හදිසියේවත් මේ ඉඩම් පිටට දුන්නොත්, ඉදිරියේදී දුම්රිය මාර්ග expand කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, ඉඩම් නැහැ නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ගරු මන්ත්‍රීතුමනි, නීතිපතිතුමාගේත් උපදෙස් විමසලා තමයි අපි ඒ වැඩේ කළේ. විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවෙන් ඒ නියෝගය ආවාට පස්සේයි මේක සිද්ධ වුණේ. නීතිපතිතුමාගේ ඒ interpretation එකෙන් අපි බැඳිලා ඉන්නවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මටත් වඩා හොඳින් මේ ගැන දන්නවා. නමුත්, පාර්ලිමේන්තු පනතකින් නැතිව නීතිපතිතුමා කිව්වාය කියලා මේ ඉඩම් දෙන්න පුළුවන්ද කියන එක මම දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මොකද, මේවා අනාගත පරම්පරාවට තිබෙන ඉඩම්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ගරු මන්ත්‍රීතුමනි, නීතිපති උපදෙස් විමසලා තාවකාලිකවයි මේවා අරගෙන තිබෙන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

"තාවකාලික" අවසන් වෙනකොට මේ ඉඩම් ටික දීලා ඉවරයි. මම ඒ කරුණ කිව්වේ ඔබතුමාට දැනගන්නයි.

ඊට අමතරව, දුම්රිය දෙපාර්තමේන්තුව තුළ විශාල පළිගැනීම් සිදුවෙලා තිබෙනවා. ප්‍රධාන ඉංජිනේරුවාගේ සිට පහළම කම්කරුවා දක්වා තාඩන-පීඩනවලට ලක්වෙලා තිබෙනවා. දුම්රිය මාර්ග ඉංජිනේරුවරයා, වාණිජ අධිකාරිවරයා, ආරක්ෂක අධිකාරිවරයා කිසිදු හේතුවක් නැතිව තනතුරුවලින් ඉවත් කර තිබෙනවා. ඒ වෙනුවට කනිෂ්ඨ නිලධාරින් පත් කර තිබෙනවා. මේ ගැන ඇමතිතුමා දන්නවාද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. බොහෝ විට ඇමතිතුමා දන්නේ නැතිව ඇති. මේ සේවකයන්ගේ දුක කියන්න තවම කවුරුවත් ඉදිරිපත් වෙලා නැහැ.

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ තදබදය අඩු කරන්න දකුණු කළුතර සිට දකුණු පයාගල දක්වා කිලෝමීටර් 6ක් ද්විත්ව දුම්රිය මාර්ගයක් ඉදිකිරීමේ කටයුතු 2013දී ආරම්භ කළා. ඒක තවම අවසන් කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම, සීදුව-කටුනායක ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු තවමත් අවසන් කරලා නැහැ.

බෙල්ජියම් රටෙන් සහන ණය මුදලට ගෙනාපු යකඩ පාලම් තවම සවි කරන්න බැරි වෙලා තිබෙනවා. 2015 වෙන කොට සවි කරලා තිබෙන්නේ පාලම් තුනයි. අනෙක් පාලම් හය සවි කරන්න තව කාලයක් යයි. ඒවා සවි කරන්න තිබෙන්නේ, කොළඹ- නුවර සහ කොළඹ -මාතර මාර්ගවල. සවි කරන්න යන කොට බොහෝ දුරට ඒ පාලම් ටික දිරලා තියෙයි. ඒ නිසා, ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

හිටපු ජනාධිපතිතුමිය -චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය- කාලයේ M9 කියන දුම්රිය එන්ජින් දහයක් ප්‍රංශයෙන් ගෙනාවා. ඒවා ඉතාම හොඳ එන්ජින්. නමුත් යම් කාර්මික දෝෂ තිබුණා. ඒවායින් දැන් තුනයි භාවිතයට ගන්නේ. එක එන්ජිමක් ගිනි අරගෙන තිබෙනවා. ඉතිරි ඒවා හදන්න පුළුවන්. මම ප්‍රවාහන අමාත්‍යවරයා හැටියට හිටිය කාලයේ මොරටුව විශ්වවිද්‍යාලයේ සහයෝගය අරගෙන ඒ වැඩ කටයුතු කරන්න හැදුවා. ඒ "Alstom" කියන engine එකේ control system එක විතරයි හදන්න තිබෙන්නේ. මොනවා වුණත්, කවුරු විවේචනය කළත්, ඒ එන්ජිම ඉතාම හොඳ, බර අදින්න පුළුවන් එන්ජිමක් කියන එකත් මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දුම්රිය දෙපාර්තමේන්තුවට උපදේශක කමිටුවක් පත් කර තිබෙනවාය කියලා ආරංචියක් තිබෙනවා. ඒ උපදේශක කමිටුවට පත් කරලා තිබෙන්නේ ව්‍යාපාර කරන අය. විගණකාධිපතිතුමාත් දන්වලා තිබෙනවා, ඒ කමිටුවේ සිටින කෙනෙක් රුපියල් මිලියන හයක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවන්න තිබෙනවා කියලා. දුම්රිය දෙපාර්තමේන්තුවත් එක්ක කරපු ගනුදෙනුවලදී ඒ පුද්ගලයා රුපියල් මිලියන හයක් ගෙවන්න තිබෙනවා. විගණකාධිපති වාර්තාවේ පැහැදිලිව එය කියලා තිබෙනවා. හැබැයි, තවම ඒ සල්ලි ගෙවලා නැහැ. නමුත්, තවමත් උපදේශක කාරක සභාවේ ඒ පුද්ගලයා ඉන්නවා. යහපාලන ආණ්ඩුව හැටියට මෙය "අයහපත් දෙයක්" කියලා තමයි මම හිතන්නේ.

කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩි දියුණු කරන්න රුපියල් මිලියන 1,500ක් පසු ගිය වසරේ අය වැයේදී වෙන් වුණා. ඒක ඔබතුමා දන්නවා. මා දන්නා හැටියට දැනට ඒකෙන් රුපියල් මිලියන සියයක් පමණයි වැය කරලා තිබෙන්නේ. කැලණිවැලි දුම්රිය මාර්ගය හදන එක හුඟක් හොඳයි. රත්නපුර දක්වා ඒ මාර්ගය ගෙන යනවා කියලා මෙවර අය වැය යෝජනාවේත් තිබෙනවා. ඒක ඉතාම හොඳ ව්‍යාපෘතියක්. හැබැයි, ඒ මාර්ගයේ වංගු ගොඩක් තිබෙනවා. ඒ වංගු අඩු කරන්න ඕනෑ. වංගු අඩු කළේ නැත්නම් ගරු ඇමතිතුමනි, ඒ මාර්ගයේ speed කරලා යන්න බැහැ. එහෙම වුණොත්, දුම්රියට කලින් private buses යනවා. ඒ නිසා හුඟක් අය private buses වල යනවා. ඒ නිසා එම මාර්ගයේ වංගු අඩු කරන්න වෙනවා. නමුත් ඒක ලේසි දෙයක් නොවෙයි. මොකද, ඒ පදිංචිකරුවන්ට සෑහෙන වන්දි මුදලක් ගෙවන්න වෙන නිසා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඒ මාර්ගයේ අනවසර පදිංචිකරුවන් හයදහස් පන්සියයක් ඉන්නවා. දැන් අපි ඒ පිළිබඳ විශේෂ survey එකක් කර ගෙන යනවා. ඒ අයට ගෙවල් හදලා දීලා ඉවත් කරන්න ඕනෑ. එහෙම නොකළොත් double line එකක් දමන්න පුළුවන්කමක් නැහැ. ඒ සඳහා යම් කාලයක් ගත වනවා. නමුත් අපි ඒ වැඩ කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඔබතුමා කියන එක හරි. මම ඒක පිළිගන්නවා. ඒ අනවසර පදිංචිකරුවන් හයදහස් ගණනක් ඉන්නවා. ඒ අය ඉවත් කරන එක ලේසි නැහැ. ඉවත් කළොත් ඒ ඔක්කෝම පාරට බහියි. ඒ නිසා ඒක ලේසි නැහැ. ඒ ගොල්ලන්ට පදිංචියට තැන් දෙන්න වෙනවා. ඒ ගැනත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

Indian credit line එකෙන් ලැබුණු රුපියල් මිලියන හාරසියයක් ඉතිරි වෙලා තිබුණා. මා හිතන හැටියට ඒ රුපියල් මිලියන හාරසියය තවමත් තිබෙනවා. පසු ගිය කාලයේ Indian credit line එකෙන් railway engines ගෙනැල්ලා, දුම්රිය මාර්ගත් සුළු කොටසක් හදා ගත්තා. එයින් රුපියල් මිලියන හාරසියයක් ඉතිරි වෙලා තිබෙනවා. ඒ මුදල තවම ප්‍රයෝජනයට අරගෙන නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැයේ තිබෙන අඩු පාඩුකම් කිව්වා වාගේම, හොඳ යෝජනා ගැනත් අපි කියන්න එපායැ. දුම්රිය ගැන තිබෙන හොඳ කරුණු ටිකත් කියන්න ඕනෑ. එහිදී වෙයන්ගොඩ සිට පානදුර දක්වා විදුලි දුම්රියක් දැමීමට දැන් feasibility study එකක් කර ගෙන යනවා. ඒකට මුදල් ADB යටතේයි ලැබෙන්නේ. ඒක ඉතාම හොඳ යෝජනාවක්. අපේ කාලයේත් මේ feasibility study එක කළා. ඒ මාර්ගය පානදුර දක්වා පමණක් ගෙන යන්නේ නැතිව කළුතරටම ගෙනෙන්න කියලා ඒ කාලයේ මාත් යෝජනා කළා. මේ හොඳ යෝජනාව ඔබතුමාගේ සැලකිල්ලට ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

Megapolis transport plan එක යටතේ LRT එක සහ ඒකාබද්ධ ප්‍රවාහන මධ්‍යස්ථානය සම්බන්ධයෙන්අධ්‍යයනයක් කර ගෙන යනවා. මේ කාර්යයේදී CGR එක සහ ලංගමත් හවුල් කරගන්න කියලා මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව මාර්ගයක් ඉදි කිරීම අත්‍යවශ්‍යයි. මුදල් රුපියල් මිලියන 1000ක් වෙන් කර ගැනීම ගැනත් මම සන්තෝෂ වෙනවා. මොකද, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා දුම්රිය මාර්ගය අත්‍යවශ්‍ය දුම්රිය මාර්ගයක්. KV මාර්ගය ගැන මා තමුන්නාන්සේට කිව්වා. මා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

ලංගම ගැන කථා කරනවිට මා ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මොකද ඔබතුමා EPF, ETF ගෙව්වා නේ. ඒ කාලයේ ගෙවන්නට තිබුණා, රුපියල් මිලියන 5123ක්. ඒක සම්පූර්ණයෙන්ම ගෙවා තිබෙනවා. ඒ ගැන මගේ ස්තුතිය මා මේ අවස්ථාවේදී ඔබතුමාට පිරිනමනවා. මාත් පොඩ්ඩක් ඒ කාලයේ ඒකට දායකත්වය දුන්නා. ඒකත් මේ අවස්ථාවේදී මා මතක් කරන්නට ඕනෑ. සේවක අර්ථ සාධක අරමුදලට ශ්‍රී ලංකමය විසින් ගෙවිය යුතු සමුච්චිත හිඟ දායක මුදල් ගෙවීම සම්බන්ධව 2014.10.28 වන දින මා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. තමුන්නාන්සේලාත් දන්නවා ඇති, ලංගමය ඉඩම් අර ගෙන තිබුණා, වෙන වෙන ව්‍යාපෘතිවලට. කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාල ශික්ෂණ රෝහල සඳහා ලබා ගත් ශ්‍රී ලංගමයේ වෙරහැර ඉඩම අක්කර 47ක්. රුපියල් මිලියන 5374ක් වටිනවා. සාමාන්‍යයෙන් ඒ ගණනට තක්සේරු කර බලා තිබෙනවා. ජා ඇල, මහරගම, තලාතුඔය වාගේ හුඟක් තැන්වලින් ගත් ලංගමය සතු ඉඩම් තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

එකම ඉඩමක්වත් ලංගමයට අයිති ඒවා නොවෙයි. මොකද ඒවායේ අයිතිය ලංගමයට පවරා තිබුණේ නැහැ. වර්තමාන ජනාධිපතිතුමාට මම කියලා, මේ ළඟදී තමයි ඒ ටික ලංගමයට පවරාගත්තේ. ඒ ප්‍රශ්නය තිබුණා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවේ අපේක්ෂිත මුදල රුපියල් මිලියන 5789යි. මේ රුපියල් මිලියන 5789 ලබා දෙන්නය කියා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඔබතුමා ඒ ගැන ටිකක් සොයා බලන්නය කියලා මම සිටිනවා. ඒ වාගේම තව පොඩි ප්‍රශ්නයක් ගැන කියන්න තිබෙනවා. තමුන්නාන්සේත් මේ ගැන දන්නවා. අපි ශ්‍රී ලංගමය භාර ගන්නා අවස්ථාවේ දී ආයතනයේ රථ ඇණියේ බස්රථ 4000යි අඩු වෙලා තිබුණේ. එම බස්රථ දවල් 12 වනවිට repairs වලට ඇතුළට එනවා. ආදායම තිබුණේ මිලියන හතළිහත්, මිලියන පණහත් අතර ප්‍රමාණයක්. එම නිසා අපි තීරණය කළා, බස්රථ 2200ක් ගෙවීමේ පදනම මත මිල දී ගන්න. එම නිසා රුපියල් මිලියන 65 සිට 70 දක්වා එම ආදායම් මුදල වැඩි කරගන්න පුළුවන්කම ලැබුණා.

මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි, ඔබතුමා විපක්ෂ නායකවරයා වශයෙන් සිටි කාලයේ සභාව ආමන්ත්‍රණය කරමින් ඔබතුමා කිව්වා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තුළ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින් ඉලක්ක කර ගනිමින් දේශපාලන පළිගැනීම් සිදු කරන බව. මා දන්නා තරමින් ඔබතුමා එහෙම ප්‍රකාශයක් කළා. නමුත් අද වනතුරුත් මේ අගතියට පත් වූ සේවකයන්ට සාධාරණයක් ඉටු කරන්න එක්සත් ජාතික පාක්ෂිකයන්ගෙන් ඇමතිතුමාට තවමත් ඉඩ ලැබිලා නැහැ.

ඔබතුමා ළඟ සිටියත් මා එය කියන්නට ඕනෑ. තවම ඒ කටයුත්ත සිදු වෙලා නැහැ. ඒ වාගේම ශ්‍රී ලංගමය ප්‍රතිව්‍යුහගත කළ යුතු බවත්, සියලු තනතුරු සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ලබා දිය යුතු බවත් ආණ්ඩුව ප්‍රකාශ කර තිබෙනවා. එසේ වුවත් මහියංගනය සහ මහරගම ඩිපෝවලට ඩිපෝ කළමනාකරුවන් පත් කිරීමට ඉල්ලුම් පත් කැඳවීමෙන් පසුව, මහියංගන ඩිපෝවේ ඩිපෝ කළමනාකරු වශයෙන් ලියනගේ මහත්මයා පත්වුණා. මම හිතන විධියට අපේ ඇමතිතුමාත් හොඳට දන්නවා, ලියනගේ මහත්මයාව. මහරගම ඩිපෝවට පත් වුණු අයටත්, ලියනගේ මහත්මයාටත් අද වෙනතුරු එහි වැඩ භාර ගන්න ඉඩදීලා නැහැ. මේ මොහොත වන තුරුම ඒ අයට වැඩ භාර ගන්න ඉඩ දීලා නැහැ. මොකද ඒ කට්ටිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පක්ෂ අය නිසා. මේ ගැන විශේෂයෙන් සලකා බලන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා ලොකු ප්‍රශ්නවලට මැදිවෙලා සිටින බව මා දන්නවා. ඔබතුමා වැඩිකල් යන්න ඉස්සෙල්ලා මේ පැත්තට එයි කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඔබතුමා එන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

නැහැ. මම එන්නේ නැහැ. මා තමයි පළමුවෙන්ම ජනාධිපතිතුමාට කිව්වේ, මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂයත් එක්ක හවුල් ආණ්ඩුවකට එන්නේ නැහැ කියලා. අපේ ඇමතිතුමාගෙන් අහන්න.

ඒ ප්‍රතිපත්තියේ මම අදත් ඉන්නවා. හැබැයි, ඒ වෙනුවෙන් මම අද දුක් විඳිනවා. මොකද, වෙඩි වදින්නේ නැති කාර් හොයාගෙන මගේ වත්ත පරීක්ෂා කරන්න ආවානේ. ඒ කියපු කථාව නිසා වෙඩි වදින්නේ නැති කාර් හොයාගෙන පොලීසියෙන් 60ක් විතර මගේ වත්තට ආවා. ඇවිල්ලා මුළු වත්තම පීරුවා. ඒ, මම එක ප්‍රතිපත්තියක ඉන්න නිසයි. මම ඒ කාරණය ගැනත් මේ අවස්ථාවේ දී තමුන්නාන්සේට ප්‍රකාශ කරනවා. මේ කාරණය මෙතැනට අදාළ නැති වුණත් විශේෂයෙන් මම මේ ගැනත් කියන්න ඕනෑ. දැන් ත්‍රී වීලර් ගැන කථා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කෙටියෙන් කථා කර අවසන් කරන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

විනාඩියක් මට ලබා දෙන්න. ත්‍රී වීලර් එකකට රුපියල් 50,000ක් වැඩියෙන් බදු ගහලා තිබෙනවා. ත්‍රී වීලර් එකක මිල දැන් රුපියල් 50,000කින් වැඩියි. Finance facility ගන්න ගියාම සියයට 70 සිට සියයට 25 දක්වා අඩු කරලා තිබෙනවා. මේවා පොඩි මිනිහාගේ වාහන නේ. යතුරු පැදියට රුපියල් 30,000ක් වැඩි කරලා තිබෙනවා. මේ දෙකෙන්ම විශාල සංඛ්‍යාවක් - ලක්ෂ පහක් පමණ - අවුරුද්දකට ලියාපදිංචි වනවා. ඩීමෝ බට්ටා ගැනත් කියන්න ඕනෑ. ටොන් දෙකකට වඩා අඩු ට්‍රක් රථවලට රුපියල් ලක්ෂයක අවම බද්දක් නියම කිරීම කිසිසේත් ඇදහිය නොහැකියි. උදාහරණයක් වශයෙන් රුපියල් ලක්ෂ 9ට අළෙවි වුණු ඩීමෝ බට්ටා වැනි වාහනයක් බදු වැඩි වීමත් සමඟ රුපියල් ලක්ෂ 16ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. මේ ඩීමෝ බට්ටා එළවන්නේ ඔබතුමා සහ මමද? නැහැ. අහිංසක, දුප්පත් මිනිස්සු තමයි ඩීමෝ බට්ටා එළවන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. ඔබතුමා කාලය වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මේවා වැරදි ක්‍රියාවන්. මොකද, මේවා පොඩි මිනිහාගේ වාහන. ලොකු මිනිසුන්ගේ වාහන නොවෙයි. ලොකු මිනිසුන්ගේ වාහනවල මිල අඩු කරලා තිබෙනවා. Rolls-Royce එකක් ඕනෑ නම් දැන් ගෙනෙන්න පුළුවන්. Rolls-Royce එකක්, Mercedes-Benz ඕනෑ එකක් ගෙනෙන්න පුළුවන්.

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ඔබතුමාටත් ගෙනෙන්න පුළුවන් නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මට ගෙනෙන්න පුළුවන්. මම ඒ වාගේ පවුලක ඉපදිච්ච කෙනෙක්. ඒක මුළු ලංකාවම දන්නවා. ඒ නිසා තමයි තමුන්නාන්සේලා මගේ වත්ත පරීක්ෂා කරන්න එව්වේ. ඒ ගැන නොවෙයි මම කියන්නේ. මේ කටයුත්ත ඉතාම අසාධාරණයි නේ. දුප්පත් මිනිහා වෙනුවෙන් නේ අපි ඔක්කොම කථා කරන්නේ. අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ කථා කරන්නේත් දුප්පත් මිනිහා වෙනුවෙන් නේ. දැන් කෑ ගහනවා, ත්‍රී වීලර් එකෙන් මේ දූෂණ සිදු වෙනවා වැඩියි කියලා. ත්‍රී වීලර් එකෙන් විතරද මේ දූෂණ සිදු වෙන්නේ? නැහැ නේ. මේ රටේ දූෂණ සිදු වෙන්නේ ත්‍රී වීලර් එකෙන් විතරද? දැන් කිව්වා, ත්‍රී වීලර් එකෙන් මත් පැන් බෝතලය ගන්න යනවාය කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විනාඩි දෙකක් වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගණිකාවන් හොයන්න යනවා, කුඩු ගෙනෙන්න මේ ත්‍රී වීලර් එකෙන් යනවාය කියලා කිව්වා. මේවා මීට ඉස්සෙල්ලා සිදු වුණේ නැද්ද? [බාධා කිරීමක්] තමුන්නාන්සේ ඕවා කියන්න එපා. මොකද, තමුන්නාන්සේත් නැටවටට ගහන මිනිහෙක්. ඒ නිසා බොරු කියන්න එපා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ හොඳට ගහන මිනිහෙක්. මේවා ගහන මිනිස්සු ඔක්කොම අද මත් පැන් බෝතලය ගැන කථා කරනවා. මට නම් බොරුවට කථා කරන්න ඕනෑ නැහැ. මම නම් කාලක් ගහලා නිදා ගන්නේ. ඒ නිසා මට ඒ ගැන කථා කරන්න ඕනෑ නැහැ. නමුත් ඔය වාගේ බොරු කතන්දර කියන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේ අය වැයෙන් ගහලා තිබෙන්නේ පොඩි මිනිහාට. පොඩි මිනිහාට බදු ගහන එක නවත්වන්න. මොකද, ලොකු මිනිසුන්ට මෙවර අය වැයෙන් සහන දීලා තිබෙනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ අරක්කු බොන්නේ නැහැ නේ. තමුන්නාන්සේ විස්කි බොන්නේ. නමුත් පොඩි මිනිහා බොන්නේ අරක්කු. ඌට කාලක් ගහන්න - [බාධා කිරීමක්] ත්‍රී වීලර් එකෙන් විතරක් නොවෙයි, දූෂණ සිදු වෙන්නේ. ත්‍රී වීලර් එකෙනුත් යම්කිසි දෙයක් සිදු වෙනවා ඇති. මම නැහැ කියලා කියන්නේ නැහැ. [බාධා කිරීමක්] මෙගොල්ලන්ගේ පැටිකිරිය ගැනයි හොයන්න ඕනෑ, අසරණයන් ගැන නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

[අ.භා. 2.46]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින විශේෂයෙන්ම මාගේ අමාත්‍යාංශය පිළිබඳව කෙරෙන මේ විවාදයේදී කරුණු ඉදිරිපත් කළ සියලුම මන්ත්‍රීතුමන්ලාට, ඇමතිතුමන්ලාට මේ අවස්ථාවේ දී මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ගැන කියලා කථාව අවසන් කළ නිසා මම එතැනින් පටන් ගැනීම හොඳයි කියලා හිතනවා.

මා මෙම ඇමති ධූරය භාරගත් දිනයේ සිට මේ දක්වා කිසිදු හිඟවීමකින් තොරව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ගෙවලා තිබෙනවා; ETF ගෙවලා තිබෙනවා. එසේම රුපියල් බිලියන 11ක් පමණ තිබුණු හිඟ මුදල රුපියල් බිලියන 7.2ක් දක්වා අඩු කරලා විශාල මුදල් ප්‍රමාණයක් අර්ථසාධක වශයෙන් ගෙවලා තිබෙනවා. එසේ කටයුතු කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මා ඉතාම සන්තෝෂ වනවා. විශේෂයෙන්ම පාරිතෝෂික දීමනා පිළිබඳව නඩු 1,800 ගණනක් තිබුණා. ඒ සියලුම පාරිතෝෂික මුදල් ගෙවලා සේවකයන්ට සහන සලසා දීලා තිබෙනවා. ඒ වාගේම අමතර කොටස් සම්බන්ධයෙන් තිබුණු හිඟ මුදල් විශාල ප්‍රමාණයක් ගෙවලා තිබෙනවා. අමතර බස් රථ 273ක් repair කරලා තිබෙනවා. ඒ වාගේම, ticket machines තිබුණේ නැහැ. මේ නිසා හුඟාක් අයථා දේවල් සිදු වුණා. මේ වනකොට ticket machines 3800ක් අරගෙන තිබෙනවා; තවත් 600ක් ගන්න බලාපොරොත්තු වෙනවා.

ජනවාරි මාසය වනකොට හැම බස් රථයකටම ticket machine එකක් තිබෙන තත්ත්වයකට ගෙන ඒමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, සියලු ආදායම් පරිගණකගත කිරීම සඳහා පරිගණක යන්ත්‍ර 100ක් දැනට මිල ගෙන දී තිබෙනවා. පෙර ගෙවුම් පත් කාඩ් පතක් සැදීම සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනවා. GPS තාක්ෂණය මඟින් බස් නියාමනය කිරීමට අපි දැන් කටයුතු කරගෙන යනවා. මුදල් අමාත්‍යතුමා ඉතාම මිත්‍රශීලී ලෙස මා වෙත කුඩා බස් රථ 250ක් ගන්නත්, ලොකු බස් රථ 1000ක් ගැනීමටත් අවශ්‍ය මුදල් සපයා දෙන බවට පොරොන්දු වෙලා තිබෙනවා. ඒ වාගේම ඉවත් කළ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

බස් රථ 500ක් සඳහා නව එන්ජින් කට්ටල 500ක් ඉන්දියානු ණය සහන පදනම මත ලබා ගැනීමට කටයුතු සම්පාදනය කර තිබෙනවා.

ලංකාගමනා ගමන මණ්ඩලයේ තිබුණු ප්‍රශ්නයක් තමයි, සෑම රජයක්ම අවශ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව තැකීමක් නැතිව බඳවා ගැනීම් සිදු කිරීම. ඒ නිසා එය විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අනාගතයේදී එවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා දැනටමත් අපි අදාළ අංශ සමඟ සාකච්ඡා කර බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අවසානයි. ඉදිරියේදී බඳවා ගැනීමේ පටිපාටිය, උසස් කිරීමේ පටිපාටිය නීත්‍යානුකූල ලෙස නිසි ආකාරයෙන් කරලා අනාගතයේ නිසි පරිදි එහි පරිපාලනය ගෙන යාමට පුළුවන් වන ආකාරයේ වාතාවරණයක් අපි සකස් කරනවා. දැන් එක ලංගම බස් රථයකට සේවකයින් 6 දෙනෙක්, 7 දෙනෙක් පමණ ඉන්නවා. එය කිසිසේත් දරා ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම රවි කරුණානායක මුදල් ඇමතිතුමාටත්, අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා, ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය පණ ගැන්වීම සඳහා එතුමන්ලා බිලියන පහක පමණක් මුදලක් දුන්නු එක ගැන. ඒ අනුව සේවකයින් 3900ක පමණ ප්‍රමාණයකට විශාල වන්දි මුදලක් අරගෙන ඔවුන්ගේ කැමැත්තෙන් විශ්‍රාම යාමට ඉඩ දීලා තිබෙනවා.

දේශපාලන පළිගැනීම් ගැන කිව්වා. දේශපාලන පළිගැනීම් පිළිබඳව රජය මඟින් පත් කළ කමිටුවේ වාර්තාව දැන් සකස් වෙලා අවසානයි. දුම්රිය වාර්තාව දැනටමත් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. ලංගම වාර්තාව ලබන මාසය ඇතුළතදී ඉදිරිපත් කරනවා. එතැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පළිගැනීම්වලට ලක් වුණු අයත්, එක්සත් ජාතික පක්ෂයේ පළිගැනීම්වලට ලක් වුණු අයත් වශයෙන් සෑම පක්ෂයකම අයට ඉතාම ස්වාධීන සලසන රාජ්‍ය නිලධාරින් විසින් පරීක්ෂණ කරලා නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරි කාලයේදී මම ඒවා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ලංකා දුම්රිය සේවාවේ මානව සම්පත් පිළිබඳව තිබුණු අඩු පාඩුකම් නැති කරලා තිබෙනවා. අවශ්‍ය ප්‍රමාණයට දුම්රිය රියැදුරන් සිටියේ නැහැ. මම ආවායින් පසුව රියැදුරන් 125 දෙනෙක් බඳවා ගත්තා. දුම්රිය ස්ථානාධිපතිවරුන් 200ක් බඳවා ගත්තා. ගාඩ්වරුන් 200ක් බඳවා ගත්තා. මේවා සියල්ලම තරග විභාගවලින්, ඉතාම පාරදෘශ්‍යභාවයකින් යුතුවයි සිදු කළේ. ඒ වාගේම වෘත්තීය සමිති අතර ප්‍රශ්න රාශියක් තිබුණා. දෙන්න පුළුවන් උසස්වීම් සියල්ල ලබා දුන්නා. දේශපාලන පළිගැනීම් කමිටුවේ වැඩ කටයුතු අවසන් කළා. දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වඩාත් පුළුල් කරමින්, ත්‍රිකුණාමලයේ සිට පුත්තලම දක්වා ගල් අඟුරු ප්‍රවාහනය ආරම්භ කරලා විශාල ආදායමක් ලබා ගෙන පරිසර සංරක්ෂණයකුත් ඇති කළා.

අපේ හිටපු අමාත්‍ය කුමාර වෙල්ගම මැතිතුමා කිව්වා වාගේ, කොළඹ සහ තදාසන්න කලාපය තුළ දුම්රිය සේවාව වැඩිදියුණු කිරීමේ ශක්‍යතා අධ්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සමඟ වැඩ කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, electrification පිළිබඳව වැඩ කටයුතු කර ගෙන යනවා. කැලණිවැලි දුම්රිය මාර්ගය පුනරුත්ථාපන කටයුතු දැනටමත් පටන් ගෙන තිබෙනවා, stations හතරක. සිල්පර කොටන් 20000ක් පමණ දැනටමත් මිල දී ගෙන තිබෙනවා. තව මාසයකින් විතර ඒ සිල්පර කොටන් ලංකාවට ළඟා වීමට නියමිතයි. එතකොට අපට ඔය කළුතර ද්විත්ව මාර්ගයේත්, අනිකුත් දුම්රිය මාර්ගවලත් අඩුපාඩුකම් සපුරා ලන්නට පුළුවන් වෙනවා.

ඊළඟට, බෙල්ජියම් ණය ක්‍රමය යටතේ අපට ලැබුණු ඒ පාලම්වලින් දැනට පාලම් ගණනාවක් සවි කරලා තිබෙනවා. ඉතිරි පාලම් ඉතා ඉක්මනින්ම අපි සවි කර ගෙන යනවා. "ඇයි අපි චීනයට යන්නේ? ඇයි අපි මේ ඉන්දියාවට යන්නේ?" කියා සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇහුවා. අපට ඕනෑ තරම් සල්ලි තිබෙනවා නම් චීනයට යන්න ඕනෑත් නැහැ; ඉන්දියාවට යන්න ඕනෑත් නැහැ. අපට සල්ලි නැති නිසා තමයි චීනයෙන්, ඉන්දියාවෙන් ණය අරගෙන මේ වැඩ කටයුතු කරන්නේ. එහෙම නම් එතුමාට මේක අරගෙන කරන්නය කියන්න ඕනෑ. චීනයෙන්, ඉන්දියාවෙන් පිටරටවලින් සල්ලි ගන්නේ නැතිව කොයි රටෙන් අරගෙනද මේවා හදන්නේ? උතුරු මාර්ගය අපි හැදුවා.

ඉන්දියානු ණය සහනදායක ක්‍රමය යටතේ බලවේග කට්ටල 6ක්, දුම්රිය එන්ජින් 10ක්, උඩරට දුම්රිය මාර්ගය සඳහා එන්ජින් 12ක් හා මැදිරි, මඟී මැදිරි 160ක්, තෙල් ටැංකි 30ක්, container flat wagons 20ක් හා ආරක්ෂක දුම්රිය හරස් මාර්ග පද්ධති මිල දී ගැනීමට අපි දැන් කටයුතු කර ගෙන යනවා. මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ කටයුතු ගැනත් කිව්වා. එය පසු ගිය අපේ රජය මඟින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියක්.

එහි යම් යම් අඩු පාඩුකම් තිබුණත් එය ලබන වර්ෂයේ මැද වන විට අවසන් කිරීමට කටයුතු කරනවා. දැන් මෙහිදී කිව්වා signal lights සවි කර නැහැයි කියලා. ඒවා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කරන්න පුළුවන් කිව්වා. දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු හිඟයක් තිබෙනවා; තාක්ෂණ නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා. දැන් තිබෙන පඩි නඩිවලට තාක්ෂණ නිලධාරින් රාජ්‍ය සේවයට එන්නේ නැහැ; ඉංජිනේරුවරු එන්නේ නැහැ. ඒ නිසා අපි ඒ වැඩ පිටතින් කර ගත යුතුව තිබෙනවා. මේ වාගේ ප්‍රායෝගික දේවල් ගැන කල්පනා කරන්නේ නැතිව කථා කළාට වැඩක් නැහැ. අපි කොහොම හරි මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ ඒ කොටසේ වැඩ අවසන් කරලා, එම දුම්රිය මාර්ගය කතරගම දක්වා ගෙන යාමට තමයි කල්පනා කරන්නේ. ඒ වාගේම කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගයත් අපි ලබන වර්ෂයේදී පටන් ගැනීමට කටයුතු කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර තැන්වලින් අය විය යුතු මුදල් අය කර ගෙන නැහැයි කිව්වා. ඒක වැරදියි. අය විය යුතු මුදල් අය කර ගෙන තිබෙනවා. නමුත් යම් ආකාරයේ disputes තිබෙන ඒවා අපි බේරුම් අධිකරණවලට - arbitrationsවලට - යොමු කර තිබෙනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳව කථා කරනවා නම්, දශක ගණනාවක් තිස්සේ ලක්ෂ 60කට අධික ලිපිගොනු ක්‍රමවත්ව අසුරා තැබීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගොඩනැඟිල්ලක් තිබුණේ නැහැ. දැන් අපි ඒ ගොඩනැඟිල්ල හදලා ඉවරයි. දැන් තිබෙන්නේ රාක්ක ගහලා ඒවා තැන්පත් කරන්නයි. ඒ සඳහා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිදු වන අක්‍රමිකතාවන් වැළැක්වීම සඳහාත්, ජනතාවට වඩාත් සමීප සේවාවක් ලබා දීම සඳහාත් e-Motoring ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. ඒ පිළිබඳව Technical Evaluation Committee එකේ වැඩ කටයුතු අවසානයි. දැන් ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට - expression of interest සඳහා - අවස්ථාව දීලා දැනට යෝජනා හයක් ඇවිල්ලා තිබෙනවා. අපි ඉතා ඉක්මනින් ඒක evaluate කරලා ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳව "කෝප්" එකෙන් පෙන්වා දුන්නා, දීර්ඝ කාලයක් තිස්සේ මෙම

දෙපාර්තමේන්තුවේ රැඳී සිටිමින් ස්ථාන මාරු නොබලා සිටින නිසා දූෂණ වංචා වැඩියි කියලා. ඒ නිසා මම තීරණයක් අර ගෙන කියලා තිබෙනවා, අවුරුදු පහකට වැඩි කාලයක් මෙම දෙපාර්තමේන්තුවේ සිටින අය දෙපාර්තමේන්තුවෙන් පිටතට, එහෙම නැත්නම් ඈත ප්‍රදේශවලට මාරු කරලා යවලා, ඈත ප්‍රදේශවල සේවය කරන අය මෙහාට ගෙන්වන්න කියලා. ඒ වාගේම කෙළින්ම මෙම දෙපාර්තමේන්තුවට බඳවා ගත් අය 300ක් පමණ ඉන්නවා. ඒ අය රාජ්‍ය සේවයට අනුයුක්ත කිරීම සඳහා අවශ්‍ය කැබිනට් අවසරය ඉල්ලා තිබෙනවා. එතකොට අපට මේ ප්‍රශ්නය යම්තාක් දුරකට විසඳා ගන්න පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ online සේවාව ආරම්භ කර තිබෙනවා. ඒ ආයතනය සඳහා අලුතින් ඉඩ කඩම් ලබා දීලා අලුතින් ගොඩනැඟිලි සෑදීමේ වැඩ කටයුතු අපි කර ගෙන යනවා. ඒ වාගේම ලක්දිව ඉංජිනේරු ආයතනය පාඩු ලැබූ ආයතනයක්. දැන් එය ලාභ ලබනවා. දැන් එම ආයතනය බස් බොඩි සැකසීමෙන් ඔබ්බට යමින් දුම්රිය මාර්ග නඩත්තුවට අවශ්‍ය මෙවලම් කට්ටල් ඉතා අඩු මුදලකට නිෂ්පාදනය කර දුම්රිය දෙපාර්තමේන්තුවට ලබා දීමට කටයුතු කර තිබෙනවා. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්ව මාර්ග අනතුරු අවම කිරීම සඳහා නව නිර්මාණාත්මක වැඩ පිළිවෙළවල් රාශියක් ක්‍රියාත්මක කර තිබෙනවා.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිළිබඳව යම් යම් විවේචන ඇති වුණා. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් route permits ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම කියන්න ඕනෑ. මේ පිළිබඳව ඉතා පැහැදිලි නියාමනයක් ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ තිබෙනවා. ඒ පනත අනුව තමයි අපි ටෙන්ඩර් කරලා දෙන්නේ. ඒකට විරුද්ධවත් දැනට නඩු හතරක් උසාවියේ තිබෙනවා. ඒ නිසා කොයි විධියට ද route permits දෙන්න ඕනෑ කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරයි. ශ්‍රේෂ්ඨාධිකරණය කියන විධියට ඒවා ලබා දෙනවා මිසක් එයින් පරිබාහිරව ලබා දීමට පුළුවන්කමක් නැහැ. අපි වව්නියාව නගරයේ නවීන පහසුකම් සහිතව බස් නැවතුම්පොළ හදලා දෙවැනි අදියරේත් වැඩ නිම කර තිබෙනවා. ඉතා ඉක්මනින් එය ජනතා අයිතියට පවරා දෙනවා. යාපනය බස් නැවතුම්පොළ සෑදීම සඳහාත් අවශ්‍ය වැඩ කටයුතු කර ගෙන යනවා.

විශේෂයෙන්ම කටුනායක සහ රත්මලාන ගුවන් තොටුපොළවල් පරිපාලනය කරන්නේ ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමෙනුයි. ඔබතුමන්ලා දන්නවා, කටුනායක ගුවන් තොටුපොළේ අවුරුදු 28ක් පැරණි ධාවන පථය නවීකරණය කර තිබුණේ නැති බව. මේ ධාවන පථයට තව අවුරුද්දකට වැඩි කාලයක් අහස් යාත්‍රා බස්සන්න බැහැ. අන්තර් ජාතික නීති රීති අනුව එහෙම බස්සන්න අවසර දෙන්නේ නැහැ. තව අවුරුද්දක් ඇතුළත මේ ගුවන් පථය repair කළේ නැත්නම් කිසිම ගුවන් යානයක් ගොඩ බස්සන්න බැහැ. Insurance එකක් දෙන්නේ නැහැ. ඒ බරත් අපටයි කරගහන්න සිදු වුණේ.

ඒ සඳහා අපි රුපියල් මිලියන 7,500ක් වෙන් කරලා ඒ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව දැනටම ප්‍රදානය කරලා තිබෙනවා. දවසකට පැය 8ක් මෙම ධාවන පථය වසා තියලා ඒ තුළදී මේ වැඩ කටයුතු කරලා මාස තුනකින් මෙය නිම කිරීමට බලාපොරොත්තු වනවා. කටුනායක ගුවන් තොටුපොළ හදලා තිබෙන්නේ, ගුවන් මඟීන් මිලියන 6කට පමණ සේවය සැපයීම සඳහායි. නමුත්, දැනට ගුවන් මඟීන් මිලියන 9කට, මිලියන 10කට සේවය සපයනවා. ඉදිරියේදී, කටුනායක ගුවන් තොටුපොළට පැමිණෙන ගුවන් මඟීන් මිලියන 20 දක්වා වැඩි වේවි. මෙම අවස්ථාවට මුහුණ දීම සඳහා මෙම ගුවන් තොටුපොළේ දෙවැනි පර්යන්ත ගොඩනැඟිල්ල ජපානයේ ජයිකා ආයතනයෙන් රුපියල් බිලියන 68ක සහන ණයක් ලබා ගැනීමෙන් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු දැනට කරමින් පවතිනවා. දැනට පළමුවන apron එකේ ටෙන්ඩර් එක අපි අවසන් කරලා තිබෙනවා.

දෙවැනි අදියර අපි ලබන අවුරුද්දේ පෙබරවාරි මාසයේ අවසන් කරනවා. අපි මාර්තු මාසයේදී ඒ ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කටයුතු සිදු කරගෙන යනවා. ගුවන් තොටුපොළවල ආදායමේ වර්ධනයක් සිදු කරලා තිබෙනවා. අපි කටුනායක ගුවන් තොටුපොළෙන් හොයන සල්ලිවලින් මත්තල ගුවන් තොටුපොළ සඳහා රුපියල් බිලියන 2.5ක් පමණ ණය මුදල් වශයෙන් ගෙවනවා. මොකද, මත්තල ගුවන් තොටුපොළෙන් ආදායමක් ලැබෙන්නේ නැහැ. එම නිසා, පෞද්ගලික අංශයත්, රජයත් සමඟ එකතු වෙලා මත්තල ගුවන් තොටුපොළ යම් ආකාරයකට පාලනය කිරීම සඳහා, ණය බර පියවීම සඳහා ක්‍රමවේදයක් අපි දැන් සකස් කරමින් පවතිනවා.

සිවිල් ගුවන් සේවා අධිකාරිය පවත්වා ගෙන ගියේ වැඩි කුලී මුදලක් දුන් ගොඩනැඟිල්ලකයි. එම නිසා, සිවිල් ගුවන් සේවා අධිකාරියට කටුනායකට ආසන්නයේ ස්ථිර ගොඩනැඟිල්ලක් ලබා දීම සඳහා රුපියල් මිලියන 900ක පමණ වියදමකින් යුතුව ඒ ගොඩනැඟිල්ල සාදාගෙන යනවා. දැන්, එහි වැඩ කටයුතු බොහෝ දුරට අවසානයි. ලබන අවුරුද්දේදී අපි එය අවසන් කිරීමට බලාපොරොත්තු වනවා. ජාත්‍යන්තර ගුවන් ගමන් වර්ධනය සඳහා නව විදේශීය ගුවන් මෙහෙයුම් සමාගම් 5ක් සඳහා ගුවන් මෙහෙයුම් සහතික පත්‍ර නිකුත් කළා. ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තර ගුවන් ගමන් වඩාත් ශක්තිමත් කිරීම සඳහා මඩකලපු ගුවන් තොටුපොළ රුපියල් මිලියන 1,000ක පමණ වියදමින් ප්‍රතිසංස්කරණය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම වැඩ කටයුතු මගේ ආයතන මඟින් සිදු කරලා තිබෙනවා කියලා මම කියන්න කැමැතියි. දැන් මෙතැන ප්‍රශ්න කිහිපයක් මතු වුණා. එයින් එකක් තමයි ශ්‍රීලංගම සහ පෞද්ගලික බස් හිමියන් අතර ප්‍රශ්නය. මෙම එකාබද්ධ කාලසටහන ක්‍රියාත්මක කිරීමට අපි විවිධ වෙර වෑයම් දරනවා. නමුත්, දෙපාර්ශවයේම තිබෙන ප්‍රශ්න හා ගැටලු නිසා මේක කිරීමට අමාරුයි. කෙසේ හෝ මේ වර්ෂය තුළදී මේ කටයුත්ත කිරීමටයි අප බලාපොරොත්තු වන්නේ.

විශේෂයෙන්ම, ත්‍රී වීලර් පිළිබඳව කථා කළා. අපේ ගමනාගමන ක්ෂේත්‍රයේ තිබෙන අනෙකුත් ප්‍රතිපත්තිමය ප්‍රශ්න පිළිබඳව කථා කළා. මේ රටේ තිබෙන ත්‍රී වීලර් ප්‍රමාණය වැඩියි කියලා මම පිළිගන්නවා. ඒ පිළිබඳ යම් නියාමනයක් ඇති කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ පිළිබඳව මීට වඩා පුළුල් ලෙස සාකච්ඡා කළ යුතුයි කියලා මම යෝජනා කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, තව විනාඩි 5ක කාලයක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
හොඳයි. කථා කරන්නට ගොඩාක් කරුණු තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපි පෞද්ගලික අංශයේ බස් ප්‍රමාණය වැඩි කරන්න හොඳ නැහැ. මොකද, බොහෝ පෞද්ගලික බස් හිමියන් මෙම තරගකාරී වාතාවරණයට ඇවිල්ලා

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තිබෙන්නේ ඕනෑවට වැඩිය බස් තිබෙන නිසායි. බස් එකක් අබලන් වුණාම ඒ වෙනුවට බස් එකක් ගන්නවා මිසක්, අලුතෙන් බස් ගෙන ඒම නතර කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරන්න කැමැතියි. ත්‍රී වීලර් පිළිබඳවත් ඒ තත්ත්වයමයි. රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ නිර්ණායකයන් අප විසින් වෙනස් කළ යුතුයි. ඒ වාගේම low-floor buses පිළිබඳව වඩාත් අපි කල්පනා කරන්න ඕනෑ. දඩ මුදල් පිළිබඳව අද බොහෝ සේ කථා වුණා.

ඇත්ත වශයෙන්ම දඩ මුදල් ලබා ගැනීමෙන් බලාපොරොත්තු වුණේ, ආදායම් ලබා ගැනීම නොවෙයි. ආදායමක් ලැබෙන්නට පුළුවන්. නමුත්, අපි මේ රටේ සිදු වෙලා තිබෙන අනතුරු දිහා බැලුවොත්, වැඩියෙන්ම අනතුරු සිදු වෙලා තිබෙන්නේ වමෙන් ඉස්සර කිරීම නිසායි. ඒ පිළිබඳ අවශ්‍ය දත්ත ලේඛනගතව මා ළඟ තිබෙනවා. නමුත්, ඒවා ඔක්කෝම කියවන්න වෙලාවක් නැහැ. ඒ වාගේම බීමත්ව රිය පැදවීම් සිදු කරනවා.

අපි සොයා ගත්ත නිර්ණායකයන්ට අනුව බලන විට, මේ කාරණා නිසා බොහෝ මරණ සහ අනතුරු රාශියක් සිදු වෙලා තිබෙනවා. මෙවර අය වැය ලේඛනයේ ඇතුළත් කළා, දුම්රිය හරස් ගේට්ටුවකදී නොසැලකිලිමත් විධියට රියක් දැම්මොත් රුපියල් 25,000ක දඩයක් අය කරන්න ඕනෑ කියලා. දැන් බලන්න ඊයේ මොකද වුණේ? කුමාර වෙල්ගම මැතිතුමා කිව්ව ආකාරයට එතැන මොකද වුණේ? එතැන හිටපු ගේට්ටු මුරකරු යන්න එපා කියද්දිත් වාහනය දැම්මා. ඉතින්, රුපියල් 25,000ක් ගහන්නේ නැතිව පුළුවන්ද? රුපියල් 25,000ක් නොවෙයි, ලක්ෂ 10ක් ගහන්න ඕනෑ. එහෙම නැත්නම්, අවුරුදු 4කට, 5කට හිරේ යවන්න ඕනෑ. මොකද, අනතුරක් වුණාට පසුව අපි කනගාටුව ප්‍රකාශ කරනවා මිසක්, මෙවැනි අයට දැඩි දඬුවම් දීමේ ක්‍රියාවලියක් නැහැ. එම නිසා මම ඒක ඇතුළත් කළේ, අපේ සමාජ අවශ්‍යතාව ගැන කල්පනා කරලායි. බීමත්ව රිය පැදවීමේදී ඒකට නිදහසක් ලබා දෙන්න අපට පුළුවන්ද? එතකොට driving licence එකත් නැති කෙනෙකුට රිය පැදවීමට නිදහසක් අපිට ලබා දෙන්න පුළුවන්ද?

රක්ෂණ ආවරණයක් නැති කෙනෙකු මෙවැනි අනතුරකින් මැරුණොත් එයා වෙනුවෙන් වන්දි මුදලක් ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි මේ සියලු ක්ෂේත්‍ර ගැන කල්පනා කරලා තමයි මේ කටයුත්ත කළේ. නමුත්, දැන් සමහර බස් සංගම් විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. ඒවා සංගම් සංගම් අතර ප්‍රශ්න. නමුත්, මා කැමැතියි ඒ අය එක්ක සංවාදයකට එන්න. මා එක්ක සංවාදයකට එන්න කියලා මම කිව්වා. එහෙම ඇවිල්ලා සාකච්ඡා කරලා, ඒ අදහස් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න පුළුවන්. වමෙන් ඉස්සර කළොත් අය කරන දඩය වැඩියි කියලා කියනවා නම් අවුරුද්දක විතර පොඩි සහන කාලයක් දෙමු මිනිස්සු හැදෙනවාද කියලා බලන්න. එහෙම මිනිස්සු හැදිලා සිදු වන අනතුරු ගණන අඩු කරනවාද කියලා බලන්න පුළුවන්. ඒ විධියට අපේ රජය සංවාදයකට ඇවිල්ලා යම් සහනයක් දෙන්නට ලැහැස්ති බව මා ප්‍රකාශ කරන්න කැමැතියි.

අපි දන්නවා, මෝටර් සයිකල්, ත්‍රී වීලර්, කුඩා කාර් පාවිච්චිය දැන් වැඩි වෙලා තිබෙන බව. ඇත්ත වශයෙන්ම මීට වඩා පුළුල් වූ ප්‍රවාහන ක්ෂේත්‍රයක්, public transport සේවාවක් අපට අවශ්‍යයි. අපි ඒක වැඩිදියුණු කරන්න ඕනෑ. හැබැයි, ඒවා වැඩිදියුණු කරන කොට තුට්ටු දෙකට බස්වල යන්න පුළුවන්කමකුත් නැහැ. අද භාණ්ඩාගාරයෙන් මට විශාල ශක්තියක් ලබා දෙනවා. ලංකා ගමනාගමන මණ්ඩලය පවත්වා ගෙන යාමට හැම මාසයේම භාණ්ඩාගාරයෙන් මට රුපියල් බිලියන 1.3ක් ලබා දෙනවා. ඒ වාගේම දුම්රිය සේවයේ අවුරුද්දක පාඩුව බිලියන 6කට වැඩියි. නමුත්, ඒ මුදලුත් ලබා දෙනවා. ඒ නිසා මෙම රජය ගමනාගමන ක්ෂේත්‍රය සමාජ සුභසාධනයක් වශයෙන් සලකා තිබෙනවා. ඒක අපි ඉතාම අගය කරන්නට ඕනෑ. මොකද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි ආණ්ඩුවට ඇවිල්ලා ඉන්න එක ගැන ඔබතුමා -ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා- කිව්වා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි මේ ආණ්ඩුව තුළ ඉන්නේ මේ වාගේ සේවාවන් කරන්නයි. ලංගමයට සල්ලි ටික ගන්න, දුම්රිය සේවාවට අවශ්‍ය සල්ලි ටික ගන්න, අපේ සේවකයින් ආරක්ෂා කර ගන්න තමයි අපි ඉන්නේ. ඒ නිසා අද විශාල සේවාවක් මේ රටේ සිදු වෙනවා. එක පැත්තකටම යන්න දෙන්නේ නැතිව පුළුවන් තරම් දුරට සමාජවාදී, ජනහිතවාදී ප්‍රතිපත්ති මේ රජය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් අපිත් අත්වැල් බැඳගෙන ඉන්නවා. මේක යුගයේ අවශ්‍යතාවක්. මොකද, දෙපිරිසක් දෙපැත්තකට වෙලා ඉඳගෙන ගහගෙන මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්කමක් නැහැ.

ගරු කුමාර වෙල්ගම අපේ හිටපු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එතුමා ඉතා හොඳ යෝජනා ගණනාවක්ම කළා. අපි කරන වැඩ අගය කළා. මා හිතනවා, අන්න ඒ සංහිඳියාවයි අවශ්‍ය වන්නේ කියලා. විවේචනය කළාට කමක් නැහැ. අපි කරන හොඳ වැඩ, රජය කරන හොඳ වැඩ ගැනත් පෙන්වා දීම ගැන මා එතුමාට ඉතාම ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ ක්ෂේත්‍රය පහසු ක්ෂේත්‍රයක් නොවෙයි. ඉතාම අමාරු ක්ෂේත්‍රයක්. මේ අමාරු ක්ෂේත්‍රය කළමනාකරණය කරගෙන අපි ඉදිරියට යා යුතුයි. ඒ සඳහා හැමෝගේම සහයෝගය ලබා දෙන්නය කියා ඉල්ලා සිටිමින් මේ පිළිබඳව විවිධ අදහස් දැක්වූ සියලු දෙනාටම ස්තුතිය පුද කරනවා. විශේෂයෙන් අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ඇහුවා, "ඇයි, මේ චීන ජාතිකයන් ළඟට යන්නේ. ඇයි, මේ ඉන්දියන්කාරයින් ළඟට යන්නේ." කියලා. නැත්නම් කොහෙන්ද සල්ලි? ඉන්දියානු ණය සහනදායි ක්‍රමය යටතේ තමයි ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒ කාලයේ කෝච්චි ටික ගෙනාවේ; දුම්රිය රිය මැදිරි ටික ගෙනාවේ. එහෙම නැත්නම් තවමත් අපට කොට උඩ තමයි යන්න වෙන්නේ. ජේවීපී එක කියන විධියට වැඩ කරන්න ගියොත් කොට උඩ යනවා මිසක් මේ රට ඉදිරියට නම් ගෙන යන්න පුළුවන්කමක් නැහැ. මේ කථා ගැලරියට නම් හොඳයි. නමුත්, ප්‍රායෝගිකව ඔය කියන දේවල් කරන්න බැහැ. ගෝලීයකරණය වූ ලෝකය තුළ අනෙක් රටවලින් ආධාර අරගෙන අපි ඒවා හොඳින් පරිහරණය කරලා අපේ රට දියුණු කර ගන්න ඕනෑ බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

[පි.ව. 3.08]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. இம்முறை வரவு செலவுத் திட்டம் நாடாளு மன்றத்தில் சமர்ப்பிக்கப்பட்டதன் பின்னர் வெகுவாகப் பேசப்பட்டுவரும் ஒரு விடயமாக, போக்குவரத்து விதிகளை மீறும் வாகனப் போக்குவரத்துத் தொடர்பில் விதிக்கப்படு கின்ற அபராதங்களின் தொகை அதிகரிக்கப்பட்ட விடயமே காணப்படுகின்றது. இந்த விடயம் தொடர்பில் நாளாந்தம் பல கருத்துக்கள் எதிராகவும் சார்பாகவும் முன்வைக்கப்பட்டு

வருகின்றன. எனவே, இது தொடர்பில் ஓர் உறுதியான நிலைப்பாடு எட்டப்படுவது அவசியமாகும். வீதிப் போக்குவரத்துச் சட்டவிதிகளை மீறுவோருக்கு எதிராகக் கடுமையான நடவடிக்கைகள் எடுக்கப்படவேண்டியது அவசியமாகும். இந்த வருடத்தில் கடந்த ஒக்டோபர் மாதம் வரையில் எமது நாட்டில் ஏற்பட்டுள்ள வீதி விபத்துக்கள் காரணமாகச் சுமார் 2,300 பேர் வரையில் உயிரிழந்துள்ளனர் எனவும் கடந்த வருடம் இவ்வாறான விபத்துகள் காரணமாகச் சுமார் 2,500 பேர் வரையில் உயிரிழந்துள்ளனர் என்றும் தெரியவருகின்றது. அபராதத் தொகைகளை மாத்திரம் அதிகரிப்பதன்மூலம் இந்த விபத்துக்களைத் தடுக்கமுடியுமென எதிர்பார்த்து இந்த அபராதத் தொகையினை அதிகரிக்கின்ற நிலையில், இதனால் அந்த இலக்கை அடையமுடியுமா என்பது குறித்து ஒரு மீள்பரிசீலனைசெய்து, பின்னர் இது தொடர்பில் ஒரு சாதகமான நடவடிக்கையை எடுக்க முடியுமென நான் நம்புகின்றேன்.

அதேநேரம், இலங்கையில் பெரும்பாலான புகையிரத நிலையங்கள் தமிழ்மொழி பேசும் மக்கள் அதிகளவில் வாழும் பகுதிகளிலேயே அமைந்துள்ளன. இந்நிலையில், ஒரு புகையிரதம் புறப்படும் நேரம், அது செல்லும் இடம், எந்த மேடையில் அது தரித்து நிற்கின்றது, வெளியிடங்களிலிருந்து குறித்த புகையிரத நிலையத்திற்கு வந்துசேரும் புகையிரதம் எந்தப் புகையிரத நிலையத்திலிருந்து புறப்பட்டது, அது எத்தனையாம் மேடைக்கு என்ன நேரத்திற்கு வரும் என்ற விபரங்களையும் தாமதமாகப் புறப்படும் மற்றும் தாமதமாக வந்தடையும் புகையிரதங்களின் விபரங்களையும் பயணிகளும் பயணிகளை வழியனுப்ப வந்தவர்களும் தெரிந்திருக்க வேண்டியது அவசியமாகுமென்றே கருதுகின்றேன். இந்த வகையில் பார்க்கும்போது, நாட்டின் பிரதான புகையிரத நிலையமான கொழும்புக் கோட்டைப் புகையிரத நிலையம் முதற்கொண்டு பல புகையிரத நிலையங்களில் தமிழ்மொழி மூலமான அறிவிப்புகள் போதியளவில் இல்லை என்பதும், பல இடங்களில் அறவே இல்லை என்பதும் குறிப்பிடத்தக்கது. இதனால் தமிழ்மொழி மாத்திரம் தெரிந்த பல பயணிகள் பாரிய சிரமங்களை எதிர்நோக்கி வருவதால், இவ்விடயம் தொடர்பில் கௌரவ போக்குவரத்து அமைச்சர் அவர்கள் தேவையான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இதேநேரம், இன்றைய நிலையில் புகையிரதத் திணைக் களத்திற்கு அதிக வருமானத்தை ஈட்டித் தருகின்ற வடக்கு மாகாணத்திற்குரிய சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ள சாதாரண புகையிரதங்களில் மிகவும் பழமையான பெட்டிகளே அதிகமாக இணைக்கப்பட்டுள்ளன. இதில் சுத்தத்தை காண முடிவதில்லை. நுளம்புத் தொல்லைகளும் மூட்டைப் பூச்சிகளின் தொல்லைகளும் அதிகரித்திருப்பதால் அவற்றில் பயணம் செய்ய இயலாதுள்ளதாக பல பயணிகள் தொடர்ந்தும் முறையிட்டு வருகின்றனர். இதுகுறித்து உடனடியாக ஆராய்ந்து அந்தப் பயணிகளுக்குப் போதுமான வசதிகளை மேற்கொள்ள வேண்டும்.

வடக்கிற்கான புகையிரதச் சேவை ஆரம்பிக்கப்பட்ட ஆரம்ப காலத்தில் பளையிலிருந்து காங்கேசன்துறைக்கு ஒரு நகரப் புகையிரத சேவை மேற்கொள்ளப்பட்டிருந்தது. எனினும், அது தொடர்பில் போதியளவு பிரச்சாரங்கள் மேற்கொள்ளப் படாத நிலையில், பயணிகள் குறைவு காரணமாக அந்தச் சேவை இடைநிறுத்தப்பட்டது. எனினும், அச்சேவை நடத்தப்பட்டபோது அதன்மூலம் பாடசாலை மாணவர்கள், அரச ஊழியர்கள் என்போர் அதிக பயனை அடைந்தன ரென்பது குறிப்பிடத்தக்கது. தற்போது அந்தச் சேவையின் தேவை எமது மக்களிடையே உணரப்பட்டு வருகின்ற நிலையில், மீளவும் கிளிநொச்சிக்கும் காங்கேசன்துறைக்கு மிடையில் அதனை மேற்கொள்வது பயனுள்ளதாக அமையுமெனக் கருதுகின்றேன். இவ்வாறான ஒரு சேவை ஏற்கனவே ஆரம்ப காலத்திலிருந்தது என்பது குறிப்பிடத்தக்கது. எனவே இது தொடர்பில் ஆராய்ந்து கௌரவ அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரம், இலங்கை முழுவதுமாக 687 பாதுகாப்பற்ற புகையிரதக் கடவைகள் இருப்பதாக அறிகின்றேன். இந்தப் புகையிரதக் கடவைகளில் பணியாற்றுகின்ற பணியாளர்கள் தங்களது தொழில்சார் பிரச்சினைகள் மற்றும் ஊதியப் பிரச்சினைகளை முன்வைத்து கடந்த காலத்தில் பல தடவைகள் பணிப்புறக்கணிப்புப் போராட்டங்களில் ஈடுபட்டனர். இவ்வாறான நிலையில், ஒரு சில புகையிரதக் கடவைகளில் விபத்துக்களும் ஏற்பட்டு ஒரு சிலர் கொல்லப்பட்டதையும் நாம் அறிவோம். அந்த வகையில், இந்தப் பணியாளர்களது பிரச்சினைகளைத் தீர்ப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அதேநேரம் நாட்டில் குறிப்பாக வடக்கில் பல புகையிரதக் கடவைகள் பாதுகாப்பற்ற நிலையிலேயே இன்றும் காணப்படுகின்றன. இதனால் கடந்த காலங்களில் பல விபத்துக்கள் ஏற்பட்டு பலர் கொல்லப்பட்டுள்ளனர். எனவே, இந்தப் பாதுகாப்பற்ற கடவைகளில் பாதுகாப்பு ஏற்பாடுகளை மேற்கொள்வதற்குப் போக்குவரத்து அமைச்சு இப்போதாவது உரிய நடவடிக்கைகளை எடுத்துள்ளதாவென்பது பற்றி அறிய விரும்புகின்றேன்.

அடுத்ததாக, வடக்கு மாகாணத்திலுள்ள பேருந்துச் சாலைகளில் பல பிரச்சினைகள் மற்றும் தேவைகள் நிலவு கின்றன. அந்த வகையில், யாழ்ப்பாணச் சாலையை எடுத்துக்கொண்டால் அங்கு நிரந்தரமாக ஒரு பொது முகாமை யாளர் நியமிக்கப்பட வேண்டும். தற்போதைய நிலையில் புதிதாக மேலும் 10 பேரூந்துகளாவது அங்கு தேவைப்படு கின்றன. புதிதாக 30 சாரதிகள் மற்றும் 30 காப்பாளர்கள் தேவைப்படுகின்றனர். பதில் கடமை அடிப்படையிலுள்ள பணியாளர்களுக்கு பதவியுயர்வுகள் வழங்கப்பட வேண்டி யுள்ளது. மேலும், நிரந்தர நியமனங்கள் வழங்கப்படுவது தொடர்பில் அவதானம் எடுக்கப்பட வேண்டும். பருத்தித்துறை, முல்லைத்தீவு, மன்னார், வவுனியா, கிளிநொச்சி மற்றும் காரைநகர் போன்ற ஏனைய சாலைகளுக்கும் தலா 5 புதிய பேருந்துகள் வீதம் தேவைப்படுவதுடன், தலா 10 சாரதிகள், 10 காப்பாளர்கள் வீதமும் தேவைப்படுகின்றனர். அத்துடன் யாழ்ப்பாண சாலையில் நிலவும் ஏனைய தேவைகள் மற்றும் பிரச்சினைகளே வடக்கு பிராந்தியத்தின் ஏனைய சாலைகளிலும் காணப்படுகின்றன. எனவே, இவ்விடயங்கள் தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் தனது அவதானத்தில் எடுத்து உரிய நடவடிக்கைகளை மேற்கொள்ள முன்வரவேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன். அத்துடன் யாழ். சாலையின் மூலம் சேவைகள் நடத்தப்படுகின்ற பல வீதிகள் புனரமைக்கப்படவேண்டிய நிலையில் உள்ளன. இதனையும் சம்பந்தப்பட்ட அமைச்சர் கவனத்திற்கொள்ள வேண்டும்.

அடுத்ததாக, பலாலி விமான நிலையம் தொடர்பாக ஒரு விளக்கத்தை கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கலாமென நினைக்கின்றேன். துரதிருஷ்டவசமாக சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் இந்தச் சபையில் இல்லாவிட்டாலும், பதிவுக்காக அந்த கேள்வியை முன்வைக்கின்றேன். பலாலி விமான நிலைய விஸ்தரிப்பு தொடர்பில் பல்வேறு கருத்துகள் பலரால் முன்வைக்கப்பட்டு வருகின்றன. குறிப்பாக ஏற்கெனவே அதியுயர் பாதுகாப்பு வலயமாகப் பிரகடனப்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

படுத்தப்பட்ட நிலையில் எமது மக்களுக்குச் சொந்தமான குடியிருப்புக் காணிகள், விவசாயக் காணிகள், மீன்பிடித் துறைமுகங்கள் அடங்கலான வளமான கடற்கரைப் பகுதிகள் என்பன பலாலி விமான நிலையப் பகுதிக்குள் இருக்கின்ற நிலையில் அவை இதுவரையில் எமது மக்களின் பயன்பாட்டுக்குக் கையளிக்கப்படவில்லை. இந்த நிலையில் பலாலி விமான நிலைய விஸ்தரிப்புப் பணிகளுக்காக அந்தக் காணிகள் சுவீகரிக்கப்படுமென முன்பு ஒரு செய்தி வெளிவந்திருந்த நிலையில், தெல்லிப்பளை பிரதேச செயலகத்தில் நடைபெற்ற அபிவிருத்திக் குழுக் கூட்ட மொன்றின்போது, தமிழ் தேசியக் கூட்டமைப்பு நாடாளுமன்ற உறுப்பினர் கௌரவ மாவை. சேனாதிராஜா அவர்கள், "பலாலி விமான நிலைய விஸ்தரிப்புக்குப் பொது மக்களது காணிகள் சுவீகரிக்கப்படமாட்டாது" என்று தெரிவித்திருந்தார். இந்த நிலையில், பலாலி விமான நிலையம் விஸ்தரிக்கப் படவுள்ளதாகவும் அதற்கென எமது மக்களின் காணிகளில் 600 ஏக்கர் காணி சுவீகரிக்கப்படுமென்றும் கடந்த 19ஆம் திகதி ஊடகங்களில் செய்திகள் வெளிவந்தன. எனவே, இதன் உண்மைநிலை என்னவென்று போக்குவரத்து மற்றும் சிவில் விமானப் போக்குவரத்து அமைச்சர் கௌரவ நிமல் சிறிபால த சில்வா அவர்கள் தெளிவுபடுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சு தொடர்பில் சில விடயங்களை இங்கு முன்வைக்க விரும்புகின்றேன். கடந்தகால யுத்தம் காரணமாகப் பாரியளவில் பாதிக்கப்பட்டிருந்த காங்கேசன்துறை துறைமுகத்தைப் புனரமைக்கும் பணிகள் கடந்த 2013ஆம் ஆண்டு ஏப்ரல் மாதம் 19ஆம் திகதி இந்திய அரசின் உதவியுடன் ஆரம்பிக்கப்பட்டது. இத்துறைமுகம் அபிவிருத்தி செய்யப்பட்டு, உள்நாட்டு வர்த்தகத்துறை மற்றும் மீன்பிடித்துறையின் முன்னேற்றத்திற்கு பயன்படுத்தப்படு மென்றும் அதன்மூலம் பெருமளவிலான தொழில் வாய்ப்புகளை வழங்கமுடியுமென்றும் தெரிவிக்கப்பட்டே இந்த அபிவிருத்திப் பணிகள் முன்னெடுக்கப்பட்டன. இந்த நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டு இன்று மூன்று வருடங் களுக்கு மேலாகியும் காங்கேசன்துறைத் துறைமுகம் தொடர்பில், அதன் இலக்குகள் எனக் கூறப்பட்ட எதுவும் எட்டப்படாத நிலையே காணப்படுகின்றது. இத்துறைமுகப் பகுதிக்கு நேரடி விஜயம்செய்து, அது தொடர்பில் கௌரவ அமைச்சர் அர்ஜுன ரணதுங்க அவர்கள் ஆய்வு செய்திருந்ததும் குறிப்பிடத்தக்கது. எனவே, மேற்படி துறைமுகத்தின் இன்றைய நிலை என்ன என்பது குறித்தும் இதன்மூலமான பயன்களை எமது மக்கள் பெறக்கூடிய வாய்ப்புகள் கிட்டுமா என்பது குறித்தும் ஒலுவில் மற்றும் திருகோணமலைத் துறைமுகங் களின் எதிர்கால இலக்குகள் என்ன என்பது குறித்தும் கௌரவ அமைச்சர் அர்ஜுன ரணதுங்க அவர்களிடமிருந்து அறிய விரும்புகின்றேன்.

இறுதியாக, நான் இங்கு ஏற்கெனவே அவதானத்துக்குக் கொண்டுவந்திருந்தமைக்கு இணங்க, தற்பொழுது ஒலுவில் துறைமுகப் பகுதி தொடர்பில் அவதானங்கள் மேற்கொள் ளப்பட்டு வருகின்றன. அதற்காக கௌரவ அமைச்சர் அவர்க ளுக்கு எனது நன்றியைத் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 3.19]

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ පිළිබඳව විවාදයට ගැනෙන මේ අවස්ථාවේදී ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ වචන කිහිපයක් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලවකවානුව තුළදී සිවිල් ගුවන් සේවාව පිළිබඳ වැඩසටහන මේ ගරු සභාවට පැහැදිලි කරන්න මා බලාපොරොත්තු වෙනවා. පසුගිය රජයේ ජාතික සංවර්ධන උපාය මාර්ග යටතේ මූලික කේන්ද්‍රස්ථානයක් බවට නාවික හා ගුවන් සේවා කේන්ද්‍රස්ථානය පත් වුණා.

ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධනයට වාගේම ජාතික මට්ටමේ සංවර්ධනයටද භාජන වන සැලසුමට අනුව තමයි, එදා හම්බන්තොට වරාය, අධිවේගී මාර්ග, කර්මාන්තපුර, මත්තල ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සඳහා වැඩ කටයුතු ආරම්භ කළේ. වෙනදාට සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය එක අමාත්‍යාංශයක් හැටියට තිබුණත්, අද එයට ප්‍රවාහන අමාත්‍යාංශයත් එකතු කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් බොහෝ රටවල ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ තමයි සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය තිබෙන්නේ. ඒක වැදගත් කාරණයක්. නමුත් අපි විශේෂයෙන් මේ කාරණයත් දැන ගන්න කැමැතියි. සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සමාගම සහ සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) සමාගම නැත්තේ ඇයි කියන එකත් අපි මේ අවස්ථාවේ දැන ගන්න ආසයි. සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ මේ ගුවන් සමාගම් නැත්තේ, ඒ ගුවන් සමාගම් විකුණන්න බලාපොරොත්තු වෙන නිසාද කියන එක අද අපට පැහැදිලි නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික සංවර්ධන උපාය මාර්ගයක් යටතේ විශාල සැලැස්මක් තුළ තමයි මේ මත්තල ගුවන් තොටුපොළ හම්බන්තොට ප්‍රදේශයේ ඉදිවෙන්නේ. ඉස්සෙල්ලා කථා කරපු අපේ හිටපු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමා පැහැදිලි කළ ආකාරයට ඒක මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ සැලසුම් කරපු එකක් නොවෙයි. ඊට වසර ගණනාවකට ඉස්සෙල්ලා සැලසුම් කරපු සැලැස්මකට අනුව තමයි, හම්බන්තොට වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධනය කරන්නේ.

යුරෝපයේ ඉඳලා චීනයට යන නැව් මාර්ගය තිබෙන්නේ හම්බන්තොට වරායේ ඉඳලා කිලෝමීටර් 200ක් පමණ ආසන්නයෙන්. අපේ කොළඹ වරායට එන්නේ නැති නැව්වලට, හම්බන්තොට වරායෙන් සේවාවන් සැපයීමට හැකියාව ලැබෙයි කියන බලාපොරොත්තුව ඇතුව තමයි එදා ඒ සැලසුම් ක්‍රියාත්මක කළේ. ඒ තුළින් ඒ නැව්වලට පහසුකම් ලබා දෙන්න, bunkering සේවාවන් ලබාදෙන්න, ඒ නැව්වලට ආහාර ලබාදෙන්න හා සේවකයන් ප්‍රවාහනය කිරීම සඳහා තමයි ඒ ප්‍රදේශයේ ගුවන් තොටුපොළක් ඉදිකිරීමේ අවශ්‍යතාව මතුවුණේ.

වරායක් තිබෙන නිසාම එතැන ගුවන් තොටුපොළක් ඉදිකිරීම අදාළ වෙන්නේ නැහැ. චමල් රාජපක්ෂ මැතිතුමා වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයා වශයෙන් හිටපු කාලයේදී සැලසුම් කළේ ගුවන් තොටුපොළ වීරවල ආරම්භ කරන්නයි. එදා ඒ ප්‍රදේශයේ සිටි ජනතාවගේ ඉල්ලීම සහ පරිසරවේදීන්ගේ ඉල්ලීම් නිසා තමයි එය වෙනස් කරලා ගුවන් තොටුපොළ මත්තල ඉදිකරන්න සැලසුම් කළේ.

අපි මත්තල ගුවන් තොටුපොළ සංවර්ධනය කරන්නේ, ජාත්‍යන්තර වශයෙන් තවත් ගුවන් තොටුපොළක් මේ රටේ නැති නිසායි. ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හැටියට කටුනායක ගුවන් තොටුපොළ තිබුණත්, එහි තවත් ගුවන් පථයක් ඇති කරන්න හැකියාවක් නැහැ. කටුනායක ප්‍රදේශයේ සිටින ජනගහනය නිසාත්, BOI එක යටතේ කර්මාන්තපුර තිබෙන නිසාත්, ගුවන් හමුදා කඳවුරක් තිබෙන නිසාත් අපට තවත් ගුවන් පථයක් සංවර්ධනය කරන්න බැහැ. ඒ නිසා තමයි අපට මත්තල ගුවන් තොටුපොළේ අවශ්‍යතාව තිබෙන්නේ. මොකද, ඔබතුමන්ලා සියලුදෙනාම දන්නවා, 2001 වර්ෂයේ ත්‍රස්ත ප්‍රහාරයේදී අපේ ගුවන් තොටුපොළ සතියක් වසා තිබුණාය කියා.

එදා අපේ ගුවන් තොටුපොළට, අපේ රටට කිසිම කෙනෙකුට ගුවනින් එන්න බැරි වුණා. ඒ ගුවන් යානා සියල්ලම ඉන්දියාවට තමයි හරවා යවන්න සිදු වුණේ. එවැනි විශේෂ අවස්ථාවලදී, සුනාමිය වැනි ඕනෑම හදිසි අවස්ථාවකදී ගුවන් පථය කැඩී ගියොත් ඒ ගුවන් පථය පාවිච්චි කරන්න බැහැ. අද අපට තිබෙන එකම ගුවන් පථය මත්තල ගුවන් තොටුපොළ බවට පත්වෙලා තිබෙනවා. පසුගිය කාලයේ මත්තල ගුවන් තොටුපොළේ වී ගබඩා කර තිබියදීත්, හදිසි අවස්ථාවලදී එම ගුවන් තොටුපොළට ගුවන් යානා ගොඩ බස්සවන්න හැකියාවක් ලැබුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමාට ගහන්න ඕනෑ නිසා මත්තල ගුවන් තොටුපොළ සඳහා ඉදිරි වැඩ පිළිවෙළක් සැලසුම් කරන්නේ නැහැ. ඒකට තමයි කුහකකම කියන්නේ. නමුත් ඇත්ත කථාව තමයි, හදිසි අවස්ථාවලදී මත්තල ගුවන් තොටුපොළ මේ රටට ඉතාම වැදගත් වනවාය කියන එක.

ICAO ආයතනය ඒ ගුවන් තොටුපොළ හදා තිබෙන්නේ, අපේ කටුනායක ගුවන් තොටුපොළටවත් නැති Code F කියන ගුවන් පථයක් තිබෙන ගුවන් තොටුපොළක් ලෙසයි. ලෝකයේ තිබෙන නවීනතම විශාලම ගුවන් යානය වන A380 ගුවන් යානය ඒ ගුවන් තොටුපොළට ගොඩ බස්සවන්න හැකියාවක් තිබෙනවා.

අපේ ගරු අමාත්‍යතුමා අද කිව්වා, කටුනායක ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවාය කියලා; ගුවන් පථය resurface කරනවාය කියලා. එය ඉතාමත් වැදගත්. එදා කටුනායක ගුවන් තොටුපොළේ පළමුවන අදියර ලෙස ඒ terminal එක හදා අවසන් වුණාම, දෙවන අදියර 2017 වර්ෂයේ හෝ 2018 වර්ෂයේ ආරම්භ කරන්න නියමිතව තිබුණා. එය ආරම්භ කිරීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. එය ආරම්භ කළා වාගේම මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නය කියාත් ගරු අමාත්‍යතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මොකද, මේක තමයි අපට තිබෙන හොඳම අවස්ථාව, මත්තල ගුවන් තොටුපොළ අළෙවි කරන්න. අපට මත්තලට ගුවන් යානා ගෙන ඒමට තිබෙන හොඳම අවස්ථාව තමයි, මෙය. කටුනායක ගුවන් තොටුපොළ පැය අටක් විතර වසා තිබෙනවා නම්, ඒ කාලය තුළ සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සමාගමේ ගුවන් ගමන් නතර කරන්නේ නැතිව, ඒ ගුවන් ගමන් සියල්ලම මත්තල ගුවන් තොටුපොළට මාරු කරන්න පුළුවන්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගැන දන්වා තිබෙනවා. නමුත් ගුවන් සමාගම් කැමැති නැහැ. අවශ්‍ය යටිතල පහසුකම් -infrastructure- ඒ ප්‍රදේශයේ නැති නිසා, ගුවන් මඟීන්ට බැහැලා යන්න එන්න බැරි නිසා එය කරන්න බැහැයි කියා කිව්වා. අපි ඒ අයගෙන් ඒ ඉල්ලීම කරලායි තිබෙන්නේ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු අමාත්‍යතුමනි, මා කිව්වේ වෙනත් ගුවන් සමාගම් ගැන නොවෙයි. අපේ සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සමාගමට අවස්ථාවක් දෙන්න තිබුණා කියායි මා කිව්වේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සමාගමටත් කිව්වා. ඒ අයත් කැමැති නැහැ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

අපි ඉදිරියේදී එම ගුවන් තොටුපොළෙන් ප්‍රයෝජනයක් ගන්නවා නම් ඒ අවශ්‍ය පහසුකම් ලබාදෙන්න තිබුණා. අපි එදාත් පෙන්වා දුන්නා, ඒ අවශ්‍යතාවන් සැලසුවොත් -අවශ්‍ය ප්‍රවාහන පහසුකම්, සෞඛ්‍ය සඳහා අවශ්‍ය රෝහලක් ආදී සියල්ල හැදුවොත් - ඉදිරියේදී ඒ ගුවන් තොටුපොළ තුළින් විශාල ප්‍රයෝජනයක් ගන්න පුළුවන්ය කියා; ලාභයක් උපයන්න පුළුවන්ය කියා.

ගරු අමාත්‍යතුමනි, සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සමාගම ඔබතුමා යටතේ නැති නිසා ඔබතුමාට ඒ පිළිබඳව කෙළින්ම පියවරක් ගන්න බැරි වෙයි. නමුත් ඒ පිළිබඳව සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සමාගමෙන් ඉල්ලීමක් කළොත් හොඳයි. මොකද, ගුවන් වාර ගණනාවක් නැති වෙලා අපට විශාල පාඩුවක් සිදුවෙලා තිබෙනවා. ඒ නිසා ඒ සියල්ල මත්තලට මාරු කළොත් ඒ පාඩුවේ ප්‍රමාණය හෝ අඩු කරගන්න පුළුවන් වෙයි. ඒ වාගේම මත්තල ගුවන් තොටුපොළ අළෙවි කරන්නත් පුළුවන් වෙයි.

ගරු අමාත්‍යතුමනි, අනෙක් පැත්තෙන්, මත්තල ගුවන් තොටුපොළ පිහිටා තිබෙන ප්‍රදේශයට යාබදව පිහිටි පළාත්වලින්, විශේෂයෙන් ඔබතුමාගේ ප්‍රදේශය වන ඌව පළාත, සබරගමුව පළාත, මධ්‍යම පළාත හා දකුණු පළාත කියන පළාත්වලින් තමයි වැඩිම පිරිසක් මැද පෙරදිග රැකියාවලට යන්නේ.

ශ්‍රමිකයන්ගෙන් සියයට 45ක් 55ක් වාගේ පිරිසක් පිටරට යන්නේ ඒ ප්‍රදේශවලින්. ඒ වාගේම, නැඟෙනහිර ප්‍රදේශයෙනුත් සෑහෙන පිරිසක් යනවා. එදා මත්තල ගුවන් තොටුපොළේ ගුවන් සමාගම් කිහිපයක් ක්‍රියාත්මක වුණා, Air Dubai ඇතුළුව. ඌව, මධ්‍යම, නැඟෙනහිර වාගේ පළාත්වල ජනතාව කටුනායක ගුවන් තොටුපොළට එන්නේ අමාරුවෙන් ලොකු මුදලක් ගෙවලා. නමුත් මත්තල ගුවන් තොටුපොළ තිබුණා නම් ඒ අයට පහසුවක් වෙනවා.

ගරු අමාත්‍යතුමනි, අවසාන කාලයේ මේ ගුවන් තොටුපොළේ cargo load එකෙන් සියයට 90ක් තිබුණේ පිට රට යවන පලතුරු සහ එළවලු. දකුණ, බස්නාහිර, ඌව සහ මධ්‍යම වාගේ පළාත්වල අලුත් කෘෂි නිෂ්පාදන ඒ ගුවන් තොටුපොළින් මාලදිවයිනට, ඩුබායිවලට යවන්න අවස්ථාව ලැබුණා. ඇමෙරිකානු ඩොලර් මිලියන 210ක් වියදම් කරලා හදපු මේ ගුවන් තොටුපොළ නිකම්ම වහලා දානවාට වඩා, ඒකෙන් ප්‍රයෝජනයක් ගත්තා නම් හොඳයි කියලා මම හිතනවා.

මේ ගුවන් තොටුපොළේ තිබෙන වැදගත් කාරණය තමයි විශාල භූමි ප්‍රමාණයක පිහිටා තිබීම. ගරු ඇමතිතුමනි, එම නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, පෞද්ගලික අංශයට හෝ ආරාධනා කරලා -මම දන්නේ නැහැ ශ්‍රීලන්කන් ගුවන් සමාගම

[ගරු කනක හේරත් මහතා]

විකුණයිද කියලා- ඉංජිනේරු නඩත්තු අංශයක්, පුහුණු පාසලක් ආරම්භ කරලා අමතර කොටස් නිෂ්පාදනය කරන්න කියලා. මහා අමතර කොටස් නොවෙයි, පොඩි අමතර කොටස් නිෂ්පාදනය කරන්නේ පොඩි තැන්වල. ඒ සඳහා මෙතැන හොඳ අවස්ථාවක් තිබෙනවා.

ඊට අමතරව, aircraft scrap කරන තැනක්, aircraft dismantle කරන තැනක් -පරණ ගුවන් යානා ගලවන තැනක්- ඇති කරන්න පුළුවන්. ඒ වාගේ අවස්ථා ගොඩක් තිබෙනවා. එහෙම අවස්ථා තියෙද්දී මම දන්නේ නැහැ ඇයි මේ ගුවන් තොටුපොළ විකුණන්න කටයුතු කරන්නේ කියලා. මම ඊයේ රෑ සිවිල් ගුවන්සේවා පනත කියවලා බැලුවා, අපේ රටේ ගුවන් තොටුපොළක් විකුණන්න පුළුවන්ද කියලා. අග්‍රාමාත්‍යතුමා කියලා තිබුණා ගුවන් තොටුපොළ විකුණනවා කියලා. සිවිල් ගුවන්සේවා පනතේ 8වෙනි වගන්තිය යටතේ ගුවන් තොටුපොළක් ප්‍රායෝගිකව විකුණන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, මට තව විනාඩි දෙකයි තිබෙන්නේ. බාධා කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා, ඒ ප්‍රකාශය වැරදියි. අපි දීර්ඝ කාලීනව බදු දෙනවා මිසක් කිසිම දෙයක් විකුණන්නේ නැහැ. අපි විපක්ෂයට මේ බව පාර්ලිමේන්තුවේදී කිහිප වතාවක්ම මතක් කරලා තිබෙනවා. කිසිම ඉඩමක් අපි විකුණන්නේ නැහැ. හැම එකක්ම බදු දෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ඔව්, ඒක එහෙම වුණොත් හොඳයි. එහෙම නැතිව, ඒක ප්‍රායෝගිකව විකුණන්න බැහැ. සිවිල් ගුවන්සේවා පනතේ 9වෙනි වගන්තිය යටතේ එහෙම තිබෙනවා. එහෙම කළොත් ආරක්ෂාවට තර්ජනයක් වෙන්න පුළුවන්. කොටි ත්‍රස්තවාදීන් හෝ කවුරු ත්‍රස්තවාදී කණ්ඩායමක් ගුවන් තොටුපොළට රිංගා ගත්තොත් මුළු රටම ඉවරයි. ඒ නිසා ඒ පිළිබඳව සොයා බලන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අද මේ ගුවන් තොටුපොළ මේ ආකාරයෙන් විකුණන්න හෝ පුළුවන් වෙලා තිබෙන්නේ එදා අපි ඒ සඳහා ආයෝජනය කරලා තිබුණු නිසායි. ඇමෙරිකානු ඩොලර් මිලියන 210ක් වියදම් කරලා හදපු ගුවන් තොටුපොළ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.1කට විකුණන්න අද මේ රජයට පුළුවන්කම තිබෙනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයකු හැටියට අපේ ප්‍රතිපත්තිවලට අනුව ඒක විකිණීමට විරුද්ධ වෙන්න. යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරලා ලාභ ලබන්න පුළුවන් ගුවන් තොටුපොළක් බවට මෙය පත් කරන්න කියලා මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, අපේ ශ්‍රීලන්කන් ගුවන් සමාගම අද දින සාකච්ඡාවට අදාළ නැහැ. ඒක පසු ගිය කාලයේ පාඩු ලැබූ ආයතනයක්. බොහෝ දෙනා ඒ පිළිබඳව කථා කළා. එහි තිබෙන දූෂණ පිළිබඳව කථා කළා, වංචා පිළිබඳව කථා කළා. වසර දෙකක් ගත වුණත් තවම මේ අලාභය අඩු කර ගන්න බැරි වෙලා තිබෙනවා. ලෝකයේ ගුවන් සේවා සඳහා සාමාන්‍යයෙන් සියයට 60ක පමණ වියදමක් යන්නේ ඉන්ධන සඳහා. ඉන්ධන මිල සියයට 50කින් අඩු වන විටත් අපට මේ සමාගමේ අලාභය අඩු කර ගන්න බැරි වෙලා තිබෙනවා. මම හිතන විදියට මේ අධ්‍යක්ෂ මණ්ඩලය අසමත්. ඒ අය අසමත් නිසා තමයි මේ සමාගම විකුණන්න බලාපොරොත්තු වෙන්නේ. මේ ගුවන් සමාගම විකිණීම තුළිනුත් අලාභයක් ලබනවා. පසු ගිය කාලයේ ශ්‍රීලන්කන් ගුවන් සමාගම සඳහා ඒ-350 ගුවන් යානා 7ක් ඇණවුම් කරලා තිබුණා. ඒ contract එක නැවැත්වීම වෙනුවෙන් අද මිලියන 112ක් ගෙවන්න වෙලා තිබෙනවා.

එපමණක් නොවෙයි, ඊට අමතරව ඒ අය -AerCap කියන සමාගම- කියනවා, පරණ ඒ-330 වර්ගයේ ගුවන් යානා 4ක් තවදුරටත් තියාගන්න කියලා. ඒවායේ කාලය තව වසර හතරකට දීර්ඝ කරන්න කියනවා. මේ contract එක වෙනස් කළොත්, ඒ-330 කියන ළඟදී ලබාගත් ගුවන් යානාවට වඩා පරණ ගුවන් යානාවක් ලබාගන්නත් කියනවා. ඒ නිසා මේ පිළිබඳව නැවතත් හිතා බලන්න, ගරු ඇමතිතුමනි.

පසුගිය කාලයේ අපේ පස් අවුරුදු සැලැස්මක් තිබුණා. එය තුළින් බලාපොරොත්තු වුණේ අපේ ගුවන් සේවය ආසියානු රටවලට පමණක් ක්‍රියාත්මක කිරීම නොවෙයි. ඕස්ට්‍රේලියාවට වෙන්න පුළුවන්, යුරෝපා රටවලට වෙන්න පුළුවන් එවැනි දීර්ඝ ගුවන් සේවා ක්‍රියාත්මක කරන්නයි අපි බලාපොරොත්තු වුණේ. එදා පැරීසිය, රෝමය, මිලාන් නගරය වැනි ස්ථාන දක්වා අපේ ගුවන් ගමන් තිබුණා. නමුත්, අද ඒ සියල්ලක්ම ඉවත් කර තිබෙනවා. අද ලන්ඩන් දක්වා පමණයි යන්නේ. ඒ ගැන මේ අවස්ථාවේදී අපේ කනගාටුව පළ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු අමාත්‍යතුමනි, ආණ්ඩු වෙනස් වෙන්න පුළුවන්. ඒ වාගේම, ආණ්ඩුව ඇතුළේ ඉන්න අමාත්‍යවරුත් වෙනස් වෙනවා. නමුත් අපට තිබෙන අපේ ජාතික ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කරන්නේ නැති එකේ ප්‍රතිවිපාකවලට තමයි අද අපට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාවත් හරියට කටයුතු කරලා, ඒ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයකු, අමාත්‍යවරයකු හැටියට ඔබතුමා අපේ වෘත්තීය සමිති ආරක්ෂා කරයි කියලි අපි හිතනවා. පසුගිය සතියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගුවන් තොටු පොළ වෘත්තීය සමිතියේ සභාපතිවරයා වන මුහන්දිරම් මහත්මයාගේ වැඩ තහනම් කර තිබෙනවා. එතුමා කරපු එකම වැරැද්ද තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ලේකම්, ගරු ධර්මසිරි සේනානායක ඇමතිතුමාගේ පින්තූරයකට මල් මාලාවක් දමපු එක. ඔබතුමා ඒ ගැන හොයා බලන්න. ගරු ඇමතිතුමනි,

අපේ පක්ෂයට විශාල සේවාවක් කළ කෙනකු වන එතුමා නැවත සේවයේ පිහිටුවන්න කියන ඉල්ලීම ඔබතුමාගෙන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க )
(The Hon. Ashok Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මට කලින් කථා කරන්න තව කථිකයෝ ඉන්නවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එච්.එම්.එම්. හරීස් නියෝජ්‍ය ඇමතිතුමා, ගරු අර්ජුන රණතුංග අමාත්‍යතුමා, ගරු හරින් ප්‍රනාන්දු අමාත්‍යතුමා තමයි ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කරන්න ඉන්නේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු අර්ජුන රණතුංග අමාත්‍යතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, එහෙම නම් ගරු අර්ජුන රණතුංග අමාත්‍යතුමා කථා කරන්න.

[අ.භා. 3.37]

**ගරු අර්ජුන රණතුංග මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Ports and Shipping)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

පසු ගිය වසර දෙකක කාලය තුළ අපට තිබුණු ගැටලු සහ ප්‍රශ්න ගැන වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා හැටියට මුලින්ම මේ සභාව දැනුවත් කරන්න කැමැතියි. මම වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය භාර ගන්න කොට තිබුණු ප්‍රධානම ප්‍රශ්න තමයි, වරායේ තිබුණු දූෂණ සහ අනවශ්‍ය වියදම්. මේ හොරකම් නවත්වන්න, අනවශ්‍ය වියදම් අඩු කරන්න අප පසු ගිය වසර දෙක තිස්සේම විශේෂ අවධානයක් යොමු කළා. අද සැහෙන දුරට එය සාර්ථක වෙලා තිබෙනවා. මගේ සහෝදර නිශාන්ත මුතුහෙට්ටිගමගේ නියෝජ්‍ය ඇමතිතුමා මට ඒ සඳහා විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ වාගේම, ලේකම් ජයම්පති මැතිතුමා සහ සියලු සභාපතිවරුන්, අධ්‍යක්ෂ මණ්ඩලයත්, ප්‍රධාන නිලධාරිනුත්, අපට අමතක කරන්න බැරි සේවකයන් සියලුදෙනාමත් අප සමඟ එකතු වෙලා ඒ සහයෝගය ලබාදුන්නා.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ගැන අද මැති ඇමතිවරු කීප දෙනෙක්ම අදහස් දැක්වූවා. ඒ ගැන කියද්දී විශේෂයෙන්ම මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. අපේ චමල් රාජපක්ෂ හිටපු අමාත්‍යතුමා, මගේ පියාත් සමඟ එකට දේශපාලනය කළ මගේ පියාගේ හිත මිතුරු අමාත්‍යවරයෙක්. එතුමා කියපු කාරණා සියල්ලම මගේ අවධානයට ගන්නා බව මා එතුමාට කියන්න කැමැතියි.

කවුරු මොනවා කිව්වත්, අපි එකතු වෙලා ආණ්ඩුවක් හදපු එකෙන් මොන වාගේ දේවල් සිදු වුණාද කියා මා දැන් වගකීමෙන් යුතුව කියන්නම්. විශේෂයෙන්ම පසු ගිය කාලයේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, ජනාධිපතිවරණයේ දී එතුමාගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් සැහෙන සේවකයන් ප්‍රමාණයක් යොදවා තිබුණු බව අපි දැක්කා. මම අමාත්‍යවරයා හැටියට එනකොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති නොවුණා නම්, ඒ වාගේම තනි ආණ්ඩුවක් තිබුණා නම්, සමහර වෙලාවට ඒ සේවකයෝ සියලු දෙනාටම ගෙදර යන්න තිබුණා. හැබැයි, අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම ගරු අගමැතිතුමාත් සමඟ අපි සාකච්ඡා කරලා දේශපාලනයට යොදවා ගත් ඒ සියලු සේවකයින් දැනුවත් කරලා නැවත වරක් ඒ සියලු දෙනාටම රැකියා ලබා දෙන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම තමයි හම්බන්තොට වරායේ සේවකයෝ ප්‍රමාණයකුත් පසුගිය ආණ්ඩුව අන්තිම මොහොතේ දේශපාලනය සඳහා යොදවා ගෙන තිබුණා. නමුත්, ඒ ගොල්ලන්ට ස්ථිර රැකියාවන් ලබා දීලා තිබුණේ නැහැ.

අද වනකොට මේ ආණ්ඩුවෙන් සියලු දෙනාටම ස්ථිර රැකියා ලබා දීලා තිබෙනවා. ඒකට ප්‍රධානම හේතුව තමයි, මේ අය දිහා අපි දේශපාලන කෝණයකින් නොබැලීම. අපි මේ සේවකයන් සම්බන්ධයෙන් ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් සමඟ සාකච්ඡා කළා. රටේ අවශ්‍යතාවන් පිළිබඳව සලකා බලා, පක්ෂ භේදයකින් තොරව තීරණ ගන්නා නායකයන් දෙදෙනෙකු එක්ක වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විධියට මට වැඩ කරන්න හැකි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තිබෙන ණය පිළිබඳව මේ සභාවත්, මේ රටත් දැනුවත් කරන්න මා කැමැතියි. 2015 දෙසැම්බර් 31 දින අවසන් වන කොට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ණය ප්‍රමාණය රුපියල් මිලියන 233,149යි. මේ සියලුම ණය 2015 වර්ෂයට කලින් ගත් ඒවා. ඒ වාගේම මේ ණයෙන් සියයට 67ක් අපට ගෙවන්න වෙලා තිබෙන්නේ හම්බන්තොට වරාය වෙනුවෙනුයි. මේ සම්පූර්ණ ණය සඳහා 2015 වර්ෂයේදී ණය වාරික වශයෙන් රුපියල් මිලියන 10,851ක්ද, පොලිය වශයෙන් රුපියල් මිලියන 6,083ක්ද ගෙවා තිබෙනවා. ඒ ගණන් දෙකම එකතු කළාම රුපියල් මිලියන 16,934ක් වනවා. ඊට අමතරව 2016 වර්ෂයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගෙවිය යුතු ණය සහ පොලිය රුපියල් මිලියන 20,115ක් වනවා. අපට මේ ණය 2039 වර්ෂය වන තෙක් ගෙවන්න සිද්ධ වනවා.

කොළඹ වරායේ පර්යන්ත තුනක් තිබෙනවා. එකක්, ජය බහලු පර්යන්තය, ඒක තමයි ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත්ව තිබෙන පර්යන්තය. ඊට අමතරව SAGT සහ CICT කියලා පෞද්ගලික පර්යන්ත දෙකක් තිබෙනවා. මම අමාත්‍යවරයා හැටියට මුලින්ම යනකොට මේ පර්යන්තවල තිබුණු ප්‍රශ්න දිහා බලන කොට අපේ පර්යන්තයේ ප්‍රධානම ප්‍රශ්න කීපයක් තිබෙන බව මම දැක්කා. අද වන තෙක් අපි පාවිච්චි කරන මේ පර්යන්තවල තිබෙන ආම්පන්න ඉතාමත් පරණ ආම්පන්න බව මම දැක්කා.

විශේෂයෙන්ම මේ පර්යන්තයෙන් පැයකට හසුරුවන බහලු ප්‍රමාණය 15ත් - 18ත් අතර ප්‍රමාණයක් වුණා. හැබැයි, පසු ගිය කාලයේ පෞද්ගලික පර්යන්තවල මේ ප්‍රමාණය 30කට වැඩි වුණා. අපි සියලුම දෙනා සමඟ සාකච්ඡා කරලා අද වනකොට ඒ ප්‍රමාණය 27ත් - 30ත් අතරට ගෙනැල්ලා තිබෙනවා. ඒ කටයුත්ත තනිකරම කරලා තිබෙන්නේ අපේ නිලධාරින්ගේ සහ සේවකයින්ගේ කැප වීමෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තිබෙන ණය බර

[ගරු අර්ජුන රණතුංග මහතා]

හේතුවෙන් අපට සංවර්ධන කටයුතු හුඟක් දුරට නවත්වන්න සිදු වුණා. ඒ වාගේම අපි ඉටු කරපු කටයුතු කීපයක් සම්බන්ධයෙන්ම මම මේ ගරු සභාව දැනුවත් කළ යුතුයි. පසුගිය කාලයේ ගින්නෙන් විනාශ වූ CFS-1 ගුදම සඳහා රුපියල් මිලියන 110ක් වූ ඇස්තමේන්තුගත මුදලින් රුපියල් මිලියන 93ක් අපට ඉතිරි කර ගන්න පුළුවන් වුණා. ඒ අපේ සේවකයින්ගේ හැකියාවත් එක්කයි. ඒ වාගේම අපි අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 219ක වියදමකින් "හර්තාල්" නමින් හඳුන්වන පාලම පුළුල් කළා. අභ්‍යන්තර ප්‍රධාන මාර්ගය කිලෝමීටර් 1.4ක් සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීමට අපට හැකි වුණා. ඒ වාගේම බණ්ඩාරනායක ජැටි පාලමේ රුපියල් මිලියන 25ක් වැය කරමින් ජල ප්‍රවාහන පද්ධතිය අලුත්වැඩියා කර ගල් අතුරා තාර දැමීම සිදු කළා. ඒ වාගේම රුපියල් මිලියන 45.2ක් වැය කරමින් ජයබහළු පර්යන්තයේ R සහ S මාවත් ප්‍රතිසංස්කරණය කරන්න අපට හැකියාව ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරාය අධිකාරියේ ප්‍රධානතම ශක්තිය වන්නේ අපට තිබෙන මානව සම්පතයි. අද වන විට වරාය අධිකාරියේ ස්ථිර සේවක සංඛ්‍යාව 9,594ක් වනවා. ඒ කියන්නේ කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, ඔළුවිල්, කන්කසන්තුරේ කියන වාරායවල්වල සිටින සියලුම සේවක සංඛ්‍යාවයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත ආදායමෙන් සියයට 47ත් - 48ත් අතර ප්‍රමාණයක් ගෙවන්න සිදුවී තිබෙන්නේ සේවකයන්ගේ පඩි නඩි සහ අනෙකුත් පහසුකම් සඳහායි. 2015 ජනවාරි මාසයේදී අපට තිබුණා, මේ සේවකයන්ගේ පඩි වැඩි කරන්න. අවුරුදු තුනකට වතාවක් කරන පඩි වැඩිවීම. මූල්‍යමය තත්ත්වය මොන තරම් අමාරු වුණත් අපි 2015 ජනවාරි මාසයේදී සේවකයන්ගේ වැටුප සියයට 15කින් වැඩි කළා. ඊට අමතරව රුපියල් 9,000ක දීමනාවක් අපි ලබලා දුන්නා. මේ සඳහා අපට වාර්ෂිකව රුපියල් මිලියන 2,478ක් අතිරේකව වැය කරන්න සිදු වනවා. ඒ වාගේම අතිකාල දීමනා සඳහා - overtime - සඳහා රුපියල් මිලියන 438ක් වැය කිරීමට අපට සිදු වුණා. අපි තීරණය කළා, අපේ සේවකයන්ව දිරි ගන්වා ඒ තුළින් කාර්යක්ෂමතාව වැඩි කළොත් ඒ හරහා මේ මුදල අපට ලබා ගන්න පුළුවන් බව.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ රැකියාවක් ලබා ගැනීම සඳහා යොමු කරන ලද අයදුම්පත් 75,000කට අධික ප්‍රමාණයක් අද වනවිට මා ළඟ තිබෙනවා. මේ සියලු දෙනා මේ පිළිබඳව අවධානය යොමු කරන්නේ ඇයි? ඒ ලැබෙන පහසුකම් නිසායි. වෙනත් සමහර ආයතනවල සේවකයන්ට නැති පහසුකම් වරාය සේවකයන්ට ලබලා දීලා තිබුණා. ඒවා කිසිම දෙයක් කපා හරින්නට අපි පසු ගිය කාලයේ තීරණය කළේ නැහැ. ඒ වාගේම වරාය සේවකයන්ගේ වෛද්‍ය මධ්‍යස්ථානය අපි දියුණු කළා. ඒ වාගේම අපි ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කළා. අද වෙනකොට සේවකයන් එක්දහස් ගණනකට වැඩි සංඛ්‍යාවක් මෙම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයෙන් බෙහෙත් ලබා ගෙන තිබෙනවා. ඒ වාගේම නව මුරසේවා ක්‍රමයක් ඇති කළා. ඇඟිලි සලකුණු තැබීම වැනි නූතන කළමනාකරණ විධික්‍රම හඳුන්වා දුන්නා.

අපි දේශපාලන පළිගැනීම් කළේ නැහැ. ස්ථාන මාරුවීම් ලබා දීම, උසස්වීම් ලබා දීම, නිවාස ලබා දීම යන මේ සියල්ලක්ම ස්වාධීන කමිටු හරහා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2015 ජනවාරි 08 වැනිදා සිට 2016 නොවැම්බර් මාසයේ 23 වෙනිදා දක්වා උසස්වීම් 723ක් අපි ලබා දුන්නා. මට ඇහුණා, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, උසස්වීම් ලබලා දීලා නැහැ කියලා. දේශපාලන ක්‍රමවේදයක් නොමැතිව ස්වාධීන කමිටුවක් හරහා අපි මේ උසස්වීම් ලබලා දුන්නා. අවුරුදු 30ක් එකම තැන සිටි සමහර අයටත් අපි ඒ අවස්ථාව ලබා දුන්නා. ඒ වාගේම වරායේ සේවකයන්ට නිලධාරින් හා අපි හමුවීම සඳහා වෙනම දිනයක් අපි ලබලා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මීට පෙරත් සඳහන් කළ කාරණයක් තමයි පසු ගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් 573 දෙනෙකු සේවයෙන් නිදහස් කර තිබුණා කියන කාරණය. නමුත් ඔවුන්ගේ වැටුප් සහ අතිකාල දීමනා ද ගෙවා තිබුණා. ඒ නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරියට 2014 දෙසැම්බර් මාසයේදී පමණක් වූ පාඩුව රුපියල් මිලියන 41.1යි. මේ කාරණය ගැන තමයි මම ඉස්සෙල්ලා දැනුවත් කළේ. මේ සියලු දෙනාම රැකියාවෙන් ඉවත් කරන්න කියා තිබුණත් මගේ ඉල්ලීම මත අතිගරු ජනාධිපතිතුමාගෙත්, ගරු අගමැතිතුමාගෙත් මැදිහත්වීමෙන් මේ සේවකයන් රැකියාවේ තබා ගැනීමට කටයුතු කළා. විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා මොන දේ ප්‍රකාශ කළත්, එක පක්ෂයක ආණ්ඩුවක් තිබුණා නම්, සමහර විට මේ සියලු දෙනාටම ගෙදර යන්න සිද්ධ වෙනවා කියන එක මා ඉතාම වගකීමෙන් කියනවා. ඒ වාගේම 2007 වර්ෂයේ අවසාන වනතුරු තිබූ "පියපුතු පදනම" යටතේ වරායේ සේවය කළ සේවකයන්ගේ දරුවන් සෑහෙන ප්‍රමාණයක් රැකියාවේ ස්ථිර කරන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉංජිනේරුවන්ගේ රුපියල් 15,000ක දීමනාව පිළිබඳ ගැටලුවක් තිබුණා. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන අපි ඒ දීමනාවත් ලබලා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියන්න ඕනෑ, පසු ගිය ආණ්ඩු සමයේදී වරාය අධිකාරියට අභ්‍යාසලාභීන් විධියට 214 දෙනෙකු බඳවා ගෙන තිබෙන බව. සමහර අයට සුදුසුකම් නැහැ. මේ පිරිස පසු ගිය කාලයේ තනිකරම දේශපාලනයට යොදවා ගත් අය. විභාගයක් පවත්වා මේ සේවකයන් නැවත වරක් සේවයේ පිහිටුවීමේ වැඩපිළිවෙළක් අපි ආරම්භ කරලා තිබෙනවා.

දැන් වෙනකොට අපි කිහිප දෙනෙකුටම ස්ථිර රැකියා ලබාදී තිබෙනවා. ඒ වාගේම 2010 සිට ලොරි රියැදුරන් 63 දෙනෙකුට ලොකු ප්‍රශ්නයක් තිබුණා. කොන්ත්‍රාත් පදනම මත තමයි ඒ රියදුරන් 63දෙනාම රැකියාව කළේ. අපි ඒ සියලුම දෙනා ස්ථිර සේවකයන් හැටියට පත් කළා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය විකිණීම සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය ඔබතුමා දන්නවා. ඔබතුමාට ඒ පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මම ඒක ගැන කියන්නම්. මට පොඩි වෙලාවක් දෙන්න.

ඒ වාගේම තමයි ජාතික කණ්ඩායම් නියෝජනය කරන volleyball ක්‍රීඩක, ක්‍රීඩිකාවන්, netball ක්‍රීඩිකාවන් අවුරුදු 10කට ආසන්න කාලයක් කොන්ත්‍රාත් පදනම මතයි සිටියේ. අපි එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් 37දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මමත් ක්‍රීඩකයෙක් හැටියට කියන්න ලජ්ජයි, අපේ volleyball කණ්ඩායමේ නායකයා වරායේ සේවයේ කළේ security guard කෙනෙක් හැටියටයි. මෙන්න මේ වගේ තත්ත්වයක් තමයි පසු ගිය කාලයේ තිබුණේ. නමුත්, අද වෙනකොට ඔහු ක්‍රීඩා උපදේශකයෙකු හැටියට පත්කරලා එතැන වෙනස් ක්‍රමවේදයක් හදලා තිබෙනවා.

පසුගිය කාලයේ අපට වරායේ ඵලදායීතාව වැඩි කරගන්න අවශ්‍ය වෙලා තිබුණා. පැයකට සියයට 13 - 18 අතර තිබුණු ඵලදායීතාව, සියයට 28 - 30 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම ජය බහලු පර්යන්තය සඳහා 2015 දී ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබාගන්න අපට හැකියාව ලැබුණා. ඒ වාගේම තමයි පසු ගිය කාලයේ වරාය ප්‍රතිරූපයට විනාශකාරී දේවල් විශාල වශයෙන් සිදු වුණා. අපි පසු ගිය දේවල් භාර-භාර කියලා වැඩක් නැහැ. නමුත් කියන්න ඕනෑ, හම්බන්තොට වරායේ කරදිය මංගල්‍යයට රුපියල් මිලියන 113ක් වියදම් කරලා තිබුණා. ඒ වාගේම තෙල් ටැංකි විවෘත කිරීමේ උත්සවය සඳහා රුපියල් මිලියන 97ක් වියදම් කරලා තිබුණා. ඒ වාගේම වරාය අධිකාරිය වෙබ් අඩවිවලට සහ මාධ්‍යවේදීන්ට මාසිකව පඩි ගෙවලා තිබුණා. ඒ සියල්ලම අද වෙනකොට අත් හිටුවලා තිබෙනවා.

දකුණු ආසියාවේ තිබෙන හොඳම වඩු මඩුව තිබෙන්නේ වරාය අධිකාරියටයි. නමුත්, අවාසනාවකට වගේ පසු ගිය කාලයේ වරාය අධිකාරිය සතුව මෙවැනි වඩු මඩුවක් තිබියදීත් අවශ්‍ය භාණ්ඩ පිට ආයතනවලින් අරගෙන විශාල මුදලක් වියදම් කරලා, ඒ හරහා විශාල කොමිස් මුදලක් ලබාගෙන තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාගේ කාලයත් මට ලබාදී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
වරාය කුස්සිය මේ රටේ ඉතාමත් ජනප්‍රියයි. ඒ කෑම වේල පිළිබඳව මේ රටේ සෑම පුද්ගලයෙක්ම දන්නවා. අද වන විට වරායේ කුස්සියේ වියදම සියයට 20කින් පමණ අඩු කරන්න පුළුවන් වෙලා තිබෙනවා. අද ඒ සියල්ලටම මූලික වුණේ අපි සියලු දෙනාම අනෙකුත් දේවල් අමතක කරලා රටක් හැටියට තීරණ ගත් නිසයි.

වරායේ ලොරි ප්‍රශ්නයක් තිබෙනවා. වරායට ලොරි දාන්න එදා හිටපු සභාපතිවරු, එදා හිටපු දේශපාලනඥයන් මුදල් අරන් තිබෙනවා. නමුත්, අපි නිසි ක්‍රමවේදයකට අනුව කටයුතු කරලා, 2015 ජනවාරි සිට අගෝස්තු වන විට රුපියල් මිලියන 256.1ක ආදායමක් ලබාගෙන තිබෙනවා. ඒ වාගේම වරාය අධිකාරියට ව්‍යාපාරික සැලැස්මක් තිබුණේ නැහැ. ඒ ව්‍යාපාරික සැලැස්ම අපි නැවත වරක් හදලා තිබෙනවා. ඒ වාගේම අපි පළමු වරට ශුන්‍ය පාදක අය වැයක් - zero-based budget එකක් - අනුව වරාය අධිකාරිය වෙනම පාලනය කිරීමට එකතුවෙලා තිබෙනවා. ඒ වාගේම අද වන විට ත්‍රිකුණාමලය වරාය, ගාල්ල වරාය වෙන වෙනම ලාභ ලබන තත්ත්වයකට ගේන්න අපි සැලසුම් යොදවලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට අද වන විට ගාලු වරායේ ආදායම දෙගුණ වෙලා තිබෙනවා. ත්‍රිකුණාමලය වරාය ලාභ ලබන තත්ත්වයකට පත් කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම අද වන විට වරාය අධිකාරියේ හොරකම සෑහෙන දුරට අඩුවෙලා තිබෙනවා.

තමුන්නාන්සේලාට මතක ඇති, පසුගිය කාලයේ වෘත්තීය සමිති නායකයෝ කියලා කට්ටියක් එකතු වෙලා වරාය තුළ අනවශ්‍ය දෙයක් කරන්න හැදුවා. ඒ හරහා කරපු ක්‍රියාදාමයන් මම මතක් කරන්න ඕනෑ. ඒ සියලු දෙනාම එකතු වෙලා වරායට එන නැව් ටික පෞද්ගලික ආයතනවලට යවන්න ක්‍රමවේදයක් හදලා තිබුණා. සමහර වෘත්තීය සමිති නායකයෝ කියන පුද්ගලයන්ගේ දරුවෝ වැඩ කරන්නේ ඒ පෞද්ගලික සමාගම්වල. ඒ හරහා ඒ මිනිස්සු මොනවගේ මුදලක් ලබා ගත්තාද කියන එක මේ රටේ මහ ජනතාව දැනුවත් විය යුතුයි.

පෞද්ගලිකව මට කරපු දේවල් සම්බන්ධයෙන් අද වන විට මා නඩු පවරා තිබෙනවා. ඒ ගැන මා මේ අවස්ථාවේදී කියන්න කැමැති නැහැ. නමුත් අද වනවිට 'වෘත්තීය සමිති නායකයෝ' කියන කණ්ඩායම කොහේ වෙලා, සේවකයින් අපි ගැන විශ්වාසය තබලා ඉතාමත් හොඳට වැඩ කරනවා කියලා මා කියන්න ඕනෑ.

අද ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ඇහුවා, අලුත් ජැටිය ගැන. පසු ගිය කාලයේ යම් යම් ප්‍රශ්නවලට මුහුණ දෙන්න අපට සිදු වුණා. විශේෂයෙන්ම ජය බහලු පර්යන්තයට නැව් එන එක එන්න එන්න අඩු වුණා. ඒකට ප්‍රධාන හේතුව වුණේ මොකක්ද? අද ලෝකයේ භාවිතයට ගන්නේ විශාල නැව්. ඉස්සර තිබුණු පොඩි නැව් අද වන විට භාවිතයෙන් ඉවත් කරලා තිබෙනවා. මීටර් 350ට වඩා දිග විශාල නැව් තමයි දැන් තිබෙන්නේ. ඒවා නවත්වන්න මීටර් 16කට වැඩි ගැඹුරක් සහිත මුහුදු ප්‍රදේශයක් අවශ්‍යයි. ඒ නිසා ජය බහලු පර්යන්තයට එන නැව්වලට හුඟක් වෙලාවට CICT එකට යන්න සිදු වෙලා තිබෙනවා.

අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් කිව්වා, ඒ වාගේම අද විශාල කථාවක් තිබෙනවා, හම්බන්තොට වරාය විකුණනවා, නැඟෙනහිර ජැටිය විකුණනවා කියලා. මම තමුන්නාන්සේලාට වගකීමෙන් දෙයක් කියන්නම්. අද මේ යහපාලන ආණ්ඩුවේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක්, අගමැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක්. අපි අතර යම් යම් මතවාද තිබෙන්න පුළුවන්. නමුත් අපි හම්බන්තොට වරාය විකුණන්න තීරණය කරලා නැහැ. නමුත් අපි ආයෝජකයෙක් සමඟ සාකච්ඡා කරලා තීරණයක් අරගෙන තිබෙනවා, ගිවිසුමකට එළඹිලා ඒ වරායේ වැඩ පිළිවෙළ පිළිබඳව ඒ සමාගමත් එක්ක කටයුතු කරන්න. හැබැයි අද වෙනකල් තීරණයක් අරගෙන නැහැ-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Percentage එක මොකක්ද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
දැනට අපි සාකච්ඡා කරලා තිබෙන ආකාරයට ඒ ගොල්ලන් 80යි 20ක percentage එකක් තමයි ඉල්ලා තිබෙන්නේ. හැබැයි විමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මා කියන්න ඕනෑ, ඒ ගොල්ලන් ඉල්ලන හැම දෙයම අපි දෙන්නේ නැහැ කියලා. තමුන්නාන්සේලා මතක තබා ගන්න, මමත් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික පවුලකින් ආපු කෙනෙක් බව. අද වන විට ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් සමඟ අපි ක්‍රමවේදයක් හදලා තිබෙනවා, අපේ දේවල් විකුණන්නේ නැතුව සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යාමට. ඒ සඳහා සැලසුම් හදලා තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. මට කථා කරන්න ඉඩ දෙන්න කෝ. ඒ සඳහා අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි මුදල් ප්‍රශ්නය.

[ගරු අර්ජුන රණතුංග මහතා]

අපට හම්බන්තොට වරාය වෙනුවෙන් ණය ගෙවන්න තිබුණේ නැත්නම් නැඟෙනහිර පර්යන්තය - East Container Terminal එක - අපටම අරගෙන කරන්න තිබුණා. [බාධා කිරීමක්] ආදායම් වැඩි වෙලා නොවෙයි, මන්ත්‍රීතුමනි. දැන් ලොකු නැව් එන නිසා හුඟක් වෙලාවට ඒවා යන්නේ CICT පෞද්ගලික සමාගමට. ඒකේ තමයි විශාල ගැඹුරක් තිබෙන්නේ. අපේ අලුත් පර්යන්තයේ ඒ ගැඹුර තිබෙනවා. හම්බන්තොට වරායට ගෙවන ණය ඉවර වුණාම අපි බලාපොරොත්තු වෙනවා, - අපට ඩොලර් බිලියන 1.15ක මුදලක් ඒ ආයතනය ගෙවන්න ලැහැස්ති වෙලා තිබෙනවා. වරාය අධිකාරියේ තිබෙන ණය ප්‍රමාණය අඩු වුණොත් මමත්, නියෝජ්‍ය ඇමතිතුමාත් සාකච්ඡා කළා යෝජනා කරන්න-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ඔබතුමාට වගකීමෙන් කියනවා, හම්බන්තොට වරායෙන් සියයට 80ක් විකුණනවා, නැඟෙනහිර පර්යන්තයෙන් සියයට 80කුත් විකුණනවා කියලා. මම ඒක වගකීමෙන් කියනවා. ඇමතිතුමා හැටියට ඔබතුමා ඒකට එකඟ නැහැ. මා එය පිළිගන්නවා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මට පොඩ්ඩක් කථා කරන්න දෙන්න කෝ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ප්‍රතිශතය අඩු කරන්න ලොකු සටනක් කළා, Cabinet Paper එක ගත්ත වෙලාවේත්. අපි ඒක දන්නවා. හැබැයි ඔබතුමා මතක තබා ගන්න, ඒ ගැන තීරණය කරන්නේ ඔබතුමාවත්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාවත් නොවෙයි කියලා. ඒවා තීරණය කරන්නේ පාස්කරලිංගම්නුයි, චරිත රත්වත්තේයි. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒක විකුණනවා. ඔබතුමා මතක තබා ගන්න, ඒක විකුණනවා. හම්බන්තොට වරායෙන් සියයට 80ක් දෙනවා. ඒ වාගේම නැඟෙනහිර පර්යන්තයෙන් සියයට 80ක් දෙනවා. ඔබතුමා ඒක මතක තබා ගන්න. ඒක තීරණය කරලා ඉවරයි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ඔබතුමන්ලාට සමහර වෙලාවට තේරෙන්නේ නැහැ, Public-Private Partnership කියන්නේ මොකක්ද කියලා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමන්ලාට විතරයි තේරෙන්නේ. අපට මොකුත් තේරෙන්නේ නැහැ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මට කථා කරන්න දෙන්න කෝ. ඔබතුමාට මම බාධා කරන්නේ නැහැ නේ. ඔබතුමා වරාය ගැන කථා කරන්න එපා. ඔබතුමා කරපු ටික ගැන කථා කරන්න කෝ, ක්‍රීඩාවට. [බාධා කිරීමක්] ප්‍රශ්නයක් අහනවා නම් ඒ විධියට අහන්න. ක්‍රමවේදයක් ඇතුව අහන්න. [බාධා කිරීමක්] ඔබතුමා ආණ්ඩුව විවේචනය කරන්න කලින් ටිකක් කල්පනා කරන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා තමයි අද ආණ්ඩුවේ නායකයා. එක්සත් ජාතික පක්ෂයේ නායකයා තමයි ආණ්ඩුව කළමනාකරණය කරන පුද්ගලයා. [බාධා කිරීමක්] ඔබතුමන්ලා විවේචනය කරන්න. අපි කවදාවත් විවේචනය-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න බැරි නම්,-

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
කරුණාකර මට මේ වෙලාව ලබා දෙන්න. මට ඉතාම වැදගත්- [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා- [බාධා කිරීම්]

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, මා වගකීමක් ඇතුව තමුන්නාන්සේට දෙයක් කියන්නම්. තමුන්නාන්සේලාගේ අලුත්ම කාරණාව තමයි "හම්බන්තොට වරාය විකුණනවා" කියන එක. විකුණනවා කියන එකයි, පෞද්ගලික ආයතනයි ආණ්ඩුවයි එක්කහු වෙලා කරන ක්‍රියාදාමය ගත්තාම දෙකක්. දැන් බලන්න, පසු ගිය කාලයේ JCT, CICT සහ SAGT කියන පර්යන්ත විකුණනවා කිව්වාට, අපට සියයට 15ක අයිතියක් තියා ගෙන දීලා තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කවදාද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
පසුගිය කාලයේ. අපි එන්න ඉස්සෙල්ලා. මහින්ද මහත්තයාගේ කාලයේයි, ඊට ඉස්සෙල්ලයි. මම ඒ විස්තර ටික අරගෙන හරියට තමුන්නාන්සේලාට කියන්නම්.

අපි අද බලාපොරොත්තු වන්නේ, හම්බන්තොට ආයෝජනය හරි විධියට ක්‍රියාත්මක කරලා අපට එන ආදායම ලබා ගන්න. අපි තීරණය කළා, ඉස්සෙල්ලාම නැඟෙනහිර පර්යන්තය සියයට 51ක අයිතිය අපට තියාගෙන ක්‍රියාත්මක කරන්න. අපි ආයෝජකයන් කැඳවලා තිබෙනවා. එහිදී අපි කියලා තිබෙන්නේ, අඩුම වශයෙන් සියයට 15ක් අපට තිබිය යුතුයි කියලා. ඒ කියන්නේ, CICT සහ SAGT පර්යන්ත අදාළ විධියට තමයි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. නමුත්, මගේ එකඟ වීම නම් ඒක නොවෙයි. අපි සියලුදෙනාම බලන්නේ අපේ ආයතනවලින් වැඩි අයිතියක් රජයට ලබා ගන්න. එන ආයෝජකයෝ අපිට වැඩි ප්‍රමාණයක් දෙන්න කැමැති නම්, අපි තමයි ජයග්‍රහකයෝ වෙන්නේ.

හම්බන්තොට ප්‍රශ්නය ගැන තමුන්නාන්සේ කථා කළා. මේ වන කොට හම්බන්තොට ප්‍රශ්නය ගැන අපේ උප සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කරමින් ඉන්නවා. අපි බලාපොරොත්තු වෙන්නේ, අපෙන් ඉල්ලපු දේවල් නැති කර ගෙන අපට වැඩි අයිතියක් ලබා ගන්න. ඒ ක්‍රමවේදයට අපේ ජනාධිපතිතුමායි, අගමැතිතුමායි දෙදෙනාම එකඟ වෙලා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගේ චේතනාව ඉටු වෙනවා නම් ඉතාම හොඳයි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ඒක මගේ චේතනාව විතරක් නොවෙයි, ආණ්ඩුවේ චේතනාව බවට පත් කරනවා. ඒකයි තිබෙන වැදගත්කම. අද වන කොට ජනාධිපතිවරයෙකුයි අගමැතිවරයෙකුයි අපට ඉන්නවා. ඒ දෙදෙනාත් එක්ක කථා කරලා කටයුතු කරන්න පුළුවන්. හැබැයි, පසු ගිය කාලයේ තමුන්නාන්සේලාට ඒක කරන්න බැරි වුණා නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අගමැතිතුමා එක්ක බැහැ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
අපට පුළුවන්. අගමැතිතුමා එක්ක කථා කරලා තීරණ ගන්න මටත් පුළුවන්. හැබැයි, පසුගිය කාලයේ එහෙම බැහැ නේ. පසු ගිය ආණ්ඩුවේදී තමුන්නාන්සේලාට ඕනෑ දේ කරන්න හම්බ වුණේ නැහැ නේ. [බාධා කිරීමක්] ඒක මට කියන්න එපා. මමත් ඒ ආණ්ඩුවේ හිටපු කෙනෙක්. අපි දෙදෙනා ඒ ගැන පස්සේ කථා කරමු.

අපට නැඟෙනහිර පර්යන්තය මීටර් 1,200ක දිග ප්‍රමාණයකින් හදා ගන්න පුළුවන්. ඒ සඳහා ඩොලර් මිලියන 500ක් විතර අවශ්‍ය වනවා. අපට මූලික ප්‍රශ්නය විධියට තිබෙන්නේ ඒක. දැනට සාකච්ඡා කරගෙන යන්නේ ඒ සම්බන්ධවයි. මම ඉතාමත් වග කීමෙන් කියනවා, "අපට හම්බන්තොට වරාය වෙනුවෙන් ගෙවිය යුතු ණය මුදල තිබුණේ නැත්නම් මේ පර්යන්තය අපට සියයට 51ක අයිතිය තියාගෙන ලේසියෙන්ම ක්‍රියාත්මක කරන්න තිබුණා" කියා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Bond එකේ සල්ලි ටික තිබුණා නම් ඒක ගෙවන්න තිබුණා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ගරු මන්ත්‍රීතුමා, bond එකට ඉස්සෙල්ලා තව හුඟක් දේවල් තිබුණා. ඒවා ගැන කථා කරන්න එපා. [බාධා කිරීමක්] හෙජින් ගනු-දෙනුව කාලයේත් සෑහෙන ගණනක් ගියා. ඒවා ගැන අපි කථා කරන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා කියපු නිසායි මම මතක් කළේ. මාව ඒ කාලයට ගෙනියන්න එපා. මම පසු ගිය පාලන- [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපට ඔබතුමාත් එක්ක ගැටුමක් නැහැ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මගෙත් එක්ක ගැටුමක් නොවෙයි. ආණ්ඩුවත් එක්කයි. පසුගිය කාලයේ කළ විනාශ ගැන මම ඇඟිල්ලෙන් ඇන ඇන පෙන්වන කෙනෙක් නොවෙයි කියා මම තමුන්නාන්සේලාට කියනවා. අපි හදන්නේ කොහොම හරි මේක ගොඩ දා ගන්න. ඒකට තමයි අපි ආණ්ඩුවක් හදලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය කාලයේ අපේ ශ්‍රී ලංකා නැව් සංස්ථාවට ගල් අඟුරු අදින්න ඩොලර් මිලියන 80ක් දීලා නැව් දෙකක් ගෙන්වලා තිබෙනවා. ලෝකෙ ගල් අඟුරු නැති වී ගෙන යන කාලයේ අපේ ශ්‍රී ලංකා නැව් සංස්ථාවට ඩොලර් මිලියන 80ක ණයක් එක්ක නැව් දෙකක් ගෙනැල්ලා තිබෙනවා. අද වන කොට ඩොලර් මිලියන 35කටවත් ඒක විකුණන්න බැරි වෙලා තිබෙනවා. මේ හරහා විශාල මුදලක් අපතේ ගිහින් තිබෙනවා. මේ මුදල් අපට හම්බ කර ගන්න ලේසි නැහැ. ආණ්ඩුව පෞද්ගලික ආයතන එක්ක එක්කහු වෙලා යම් වැඩ පිළිවෙළක් කරන කොට, ඒක විකුණනවා කියන එක ඉතාමත් වැරදියි. මම තමුන්නාන්සේලාට ඉතාම වග කීමෙන් කියනවා, පසුගිය කාලයේ හම්බන්තොට වරාය සඳහා ලබා ගෙන තිබෙන සම්පූර්ණ ණය මුදල රුපියල් මිලියන 142,961යි. එනම්, ඇමෙරිකන් ඩොලර් මිලියන 1,347ක්; රුපියල් බිලියන 142ක්. එක් අවස්ථාවකදී ලබාගත් ණය මුදලේ පොලිය සියයට 8 ගණනෙත් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම හම්බන්තොට වරාය සඳහා ණය ලබා ගැනීමේදී අමුතු දේවල් සිදු වෙලා තිබෙනවා. ණය ගන්න කොට පොලිය සියයට 8 දක්වා යන්න හිටපු අමාත්‍යවරයාත් අනුමැතිය දීලා තිබෙනවා.

හම්බන්තොට වරායේ තෙල් ටැංකි ව්‍යාපෘතිය ඉතාම අසාර්ථක ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘතිය ගැන සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් ඇහුවා. මේ වන කොට එම තෙල් ටැංකි ව්‍යාපෘතියේ නඩුවක් පවතින නිසා මම ඒ ගැන දීර්ඝව සාකච්ඡා කරන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙන්නේ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව කාලය දෙන්න පුළුවන්ද? අද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කීප දෙනෙක් අඩුයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තව විනාඩි පහක් දෙමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව විනාඩි පහක් දෙන්නේ කාගේ වෙලාවෙන්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපට සවස 6.30න් පස්සේ කාලය ගන්න පුළුවන්.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉතාම වගකීමෙන් කියනවා, චීනයේ එක්සිම් බැංකුවට අමතරව ඉන්ධන මිලදී ගැනීම සඳහා ලංකාවේ HNB එකෙන් ඩොලර් මිලියන 28ක් ලබා ගෙන තිබෙන බව. එයින් මිලට ගත් MGO කියන ඉන්ධන තොගය අද වෙනකොටත් අපට විකුණා ගන්න බැරි වී තිබෙනවා. එම ඉන්ධන වර්ගය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රතික්ෂේප කරපු ඉන්ධන වර්ගයක්. එම ඉන්ධන තොගය හම්බන්තොට වරායට ගොඩබා තිබුණා. ඩොලර් 900කට මිලට ගත් එම ඉන්ධන තොගය අද වෙනකොට ඩොලර් 200කටවත් විකුණා ගන්න අපට බැරි වෙලා තිබෙනවා. මේ විධියට පසු ගිය කාලයේ ලොකු විනාශයක් කර තිබෙනවා. නමුත් මේ රටේ ආපසු කවදාවත් ඒ වාගේ ක්‍රමවේදයක් හැදෙන්නේ නැති වෙන ක්‍රමයක් තමයි අපි හදලා තිබෙන්නේ.

ඊළඟට, හම්බන්තොට වරායේ සේවය කරන සේවකයන් 280 දෙනෙකු අද වෙනකොට ස්ථිර සේවකයන් බවට පත් කර තිබෙනවා. ඒ අයව අවුරුදු ගණනක් දේශපාලනයට පාවිච්චි කළා. හැබැයි, කිසිම කෙනෙක් ඒ අයට ස්ථිර පදනමක් යටතේ රස්සාව දීලා තිබුණේ නැහැ, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි. අද වෙනකොට අපි එම කටයුතු ක්‍රියාත්මක කර ගෙන යනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, ඔය 10,000 කට්ටියද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
10,000 කට්ටිය 240ක් ඉන්නවා. සමහර අයට O/Level පවා නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ අයට කළේ මොකද?

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මොකුත් කරන්න බැහැ. විභාග කරපු 30 දෙනාට දුන්නා. කරපු නැති අයට දෙන්නේ නැහැ. මම ඒකත් කියන්න ඕනෑ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, ඔබතුමා හරි සැරයි නේ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මම සැරයි. මම හරි දේ කරන සැර මනුස්සයෙක්. ඒක මගේ ප්‍රතිපත්තිය. මට ඒක වෙනස් කරන්න බැහැ නේ. [බාධා කිරීමක්] මම හැම දාම කරන්නේ හරි දේ. ඒ නිසානේ මම මේ පැත්තේ ඉන්නේ. නැත්නම් මටත් ඔය පැත්තට වෙලා ඉන්න තිබුණා නේ. [බාධා කිරීමක්] නැහැ. මටත් ඔතැනට වෙලා ඉන්න තිබුණා. පූස් පැටියෙක් වාගේ කථා කරන්නේ නැතුව, අහගෙන ඉඳලා "ඔව්, සර්" කියන්න තිබුණා. නමුත් මම එහෙම කරන පුද්ගලයෙක් නොවෙන නිසා මම අද අලුත් ආණ්ඩුවක් යටතේ මේ පැත්තේ ඉන්නවා. [බාධා කිරීමක්] මම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික පවුලකින් ආපු කෙනෙක්. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආදරය කරන, ඒ වාගේම රටට වැඩියෙන් ආදරය කරන පුද්ගලයෙක්. මම ඒකත් විශේෂයෙන්ම කියන්න ඕනෑ.

2016 අගෝස්තු 04 වන දා වනවිට ශ්‍රී ලංකා නැව් සංස්ථාව ඇමෙරිකානු ඩොලර් මිලියන 3.3ක් ණය හා පොලී වාරිකය වශයෙන් ගෙවන්න සිද්ධ වෙලා තිබුණා. එහි සභාපතිතුමාත්, නිලධාරි මණ්ඩලයත් ඉතාම කැපවීමකින් සේවය කළ නිසා අද වෙනකොට නැව් සංස්ථාවේ ලාභය වැඩි කර තිබෙනවා. පසු ගිය කාලයේ ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 18ක් ගෙවන්න සිදු වුණා. නමුත් අද වෙනකොට එය විශාල ප්‍රමාණයකින් අඩු කර තිබෙනවා. ඒ අනුව ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකක් ගෙන්වීම සඳහා වැය කරන මුදල ඇමෙරිකානු ඩොලර් 11ට අඩු කර තිබෙනවා. Spot ගන්නකොට, 4.50ට ගිහින් තිබෙනවා. ඒ කියන්නේ මේකෙන්ම තේරෙනවා, පසුගිය කාලයේ මේ මුදල් එකඑක්කෙනාගේ සාක්කුවලට යන්න ඇතිය කියන එක. අද වෙනකොට අපි තීරණ ගන්නේ, කණ්ඩායමක් හැටියටයි. මේ තීරණ ගන්නේ එක පුද්ගලයෙක් නොවෙයි. ඇමතිවරයාත් නොවෙයි, නියෝජ්‍ය ඇමතිවරයාත් නොවෙයි. අපි මේ සියල්ලම තීරණය කරන්නේ එම අධ්‍යක්ෂ මණ්ඩලය එක්ක සාකච්ඡා කරලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වෙනකොට මෙම නැව්වල පුහුණුව ලැබීමට විශේෂයෙන්ම රජයේ විශ්වවිද්‍යාලවල ඉන්නා දරුවන්ට අවස්ථාව ලැබී තිබෙනවා. පසුගිය කාලයේ එම දරුවන්ට කිසිම අවස්ථාවක් ලබා දී තිබුණේ නැහැ. අද වෙනකොට පෞද්ගලික අංශයටත් අපි එම අවස්ථාව ලබා දෙනවා, රජයේ විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන දරුවන් අඩු වුණාම. නැත්නම් අපි හැම වේලාවේම එම අවස්ථාව ලබා දෙන්නේ, අපේ විශ්වවිද්‍යාලවල දරුවන්ටයි. අද වෙනකොට නාවිකයින් ලෙස 50 දෙනෙකු එහි පුහුණුව ලබනවා.

මම කලින් කිව්වා වාගේ ගල් අඟුරු ප්‍රවාහනය කිරීමේදී දින 180ක් වැනි පොඩි කාලයක් අපට තිබෙන්නේ. ඊට පසුව මුහුද රළුභාවයට පත් වෙන නිසා එම නැව් එම ස්ථානයට ගෙන යන්න බැරි වෙනවා. අද වෙනකොට අපි විශාල වෙනසක් සිදු කර තිබෙනවා. ඒ අනුව ගමන් වාර 38ක් සඳහා නෞකා 06ක් යොදවා ගන්න අපට සිදු වෙනවා. මේ සඳහා අපි 2014 වර්ෂයේදී සිංගප්පූරුවේ පීසීඑල් සමාගම සමඟ ගිවිසුමක් අත්සන් කළා. 2017 වර්ෂයේදී තමයි එම ගිවිසුමේ කාලය අවසන් වෙන්නේ. මම මුලින් කිව්වා වාගේ අද වෙනකොට විශාල ප්‍රමාණයකින් අපි වියදම් අඩු කර තිබෙනවා.

ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකු විධියට කටයුතු කළ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන වශයෙන් අපට උපදෙස් වගයක් දුන්නා. මේ ආණ්ඩුවේ කිසිම කෙනෙක් කවදාවත් කිව්වේ නැහැ, හම්බන්තොට වරාය හදපු එක වැරදියි කියා. මම එතුමාට ඒ ගැන කියන්න කැමැතියි. මේ රටේ හැම දෙනාම කියනවා, හම්බන්තොට වරාය හදපු එක හරි කියා. හැබැයි, එය හදපු විධිය වැරදියි. අද වෙනකොට එය හදපු සමාගම ඩොලර් මිලියන 750ක ලංසුවක් තමයි අපට දෙන්නේ. අපි ඩොලර් බිලියන 1.5ක් වියදම් කර තිබෙනවා. එතකොට අනෙක් මුදල්වලට මොකද වුණේ කියා කල්පනා කර බලන්න. පසුගිය කාලයේ ගරු අගමැතිතුමා චීනයේ

කළ සංචාරයේදී ආයතනයක් සමඟ සාකච්ඡා කර තිබුණා. ඒ අනුව අද වෙනකොට ඩොලර් බිලියන 1.15ක ලංසුවක් එක්ක අපට අවශ්‍ය සාකච්ඡා කරගෙන යනවා.

විශේෂයෙන්ම පසු ගිය කාලයේ දූපත් අතර මඟී ප්‍රවාහනය අපට ලබා දුන්නා. විශේෂයෙන්ම අපි දැක්කා, උතුරේ මඟී ප්‍රවාහනය කරන කොට ඉතාමත් පහත් තත්ත්වයේ බෝට්ටුවලින් මඟීන් ප්‍රවාහනය කරන බව. මේ සම්බන්ධයෙන් නාවික හමුදාව විශාල සේවයක් කළා. අද වන විට ඒ කටයුත්ත අපට ලබාදී තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, මුදල් ඇමතිතුමාත් අපට විශාල මුදලක් ලබා දීලා බෝට්ටු සෑදීමේ අංගනයක් හදලා, මේ ක්‍රියාදාමය එක ස්ථානයකට ගේන්න අවධානය යොමු කිරීම පිළිබඳව මා එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. මට නියමිත කාලය අවසාන නිසා විශේෂයෙන්ම නැවත වරක් කියන්න ඕනෑ, මගේ ආයතනවල ඉන්න ප්‍රධානීන්ටත්, ඒ වාගේම මගේ සහෝදර නිශාන්ත මුතුහෙට්ටිගම නියෝජ්‍ය ඇමතිතුමාටත්, මීට පෙර හිටපු එරික් ප්‍රසන්න වීරවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වන බව.

මම තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ, අපේ වරාය ගොඩගන්න තමුන්නාන්සේලාගේත් අදහස් තිබෙනවා නම්, ඒ යෝජනා අපට ඉදිරිපත් කරන්න කියලායි. ඒවා සාකච්ඡා කරන්න පුළුවන් ආණ්ඩුවක් අපි හදලා තිබෙන්නේ. එහෙම නැතිව, මේ ආයතන විකුණාගෙන කන්න ආපු ආණ්ඩුවක් නොවෙයි කියලා වගකීමකින් යුතුව කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සියලුම ලිපි ලේඛන හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

මට ලැබී තිබෙන කාලය අඩු නිසා මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී මා අදහස් දක්වනුයේ වරාය හා නාවික අමාත්‍යාංශය ලැබූ ප්‍රගතිය ගැන වූ අවංක සතුටින්. මේ වසර මා වරාය හා නාවික අමාත්‍ය ධූරයෙහි කටයුතු කරන දෙවැනි වසරයි. පළමු වසරේදී වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල, විශේෂයෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වංචා, දූෂණය සහ නාස්තිය අවම කිරීමට පියවර ගත්තා. මේ වසරේදී අපේ මූලික අරමුණ වුණේ එකී ආයතනවල ප්‍රශ්න සහ ගැටුම්කාරී තත්ත්වයන්ට කෙටි, මධ්‍යම සහ දිගුකාලීන විසඳුම් ලබාදීමයි. ඒ සඳහා නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාත්, අමාත්‍යාංශයේ ලේකම් එල්.පී. ජයම්පති මැතිතුමාත් අප අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනවල ප්‍රධානීන්, නිලධාරින් සහ සේවකයින් ලබා දුන් සහාය සහ කළ කැපකිරීම් මම අවංකවම අගය කරනවා. මේ වසර දෙකේදී අප ලැබූ ප්‍රගතිය ගැන නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා මේ සභාවට කරුණු දැක්වීමට අපේක්ෂාවෙන් සිටිනවා. අප මුහුණ දී තිබෙන අභියෝග සහ අපේ සාර්ථකත්වය පැහැදිලි කිරීම මගේ මූලික ඉලක්කය වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි සියලු දෙනාගේත් අපේක්ෂාව වුණේ පසු ගිය දශකයේදී විනාශ මුඛයට ඇද දමා තිබූ අපේ ආයතන දියුණු කිරීමයි. නාස්තිය, දූෂණය සහ අනවශ්‍ය වියදම් පිටු දැකීමයි. එය අපි මුලින්ම ආරම්භ කළේ අමාත්‍යාංශ මට්ටමිනුයි. මේ වන තෙක් මම කිසිම විටෙක අමාත්‍යාංශයේ මුදලින් විදේශ සංචාරවල යෙදී නැහැ. විදේශ සංචාර සඳහා මට ලැබෙන පෞද්ගලික ආරාධනාවලදී එම පුද්ගලයින් ගුවන් ප්‍රවේශ පත්‍ර ඇතුළුව සියලු පහසුකම් මට ලබා දෙනවා. එවැනි සංචාරවලදී අමාත්‍යාංශයේ කාර්යයන් කර ගැනීමට ද මට හැකි වුණා. මම එය සිදු කළේ, කැපවීම සහ කළමනාකරණය නිවැරදිව කළ හැකි නම් ආයතනයේ මුදල් ඉතිරි කර ගත හැකි බව පෙන්වා දීමටයි. පසු ගිය කාලයේ විනාශ වී ගිය ආයතන පද්ධතියට හුස්ම ලබා දීමට අපට හැකි වූයේ එම ක්‍රමවේදය දිගින් දිගටම ආරක්ෂා කළ නිසා බවද මා කියා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අමාත්‍යාංශයට අයත් ප්‍රධාන ව්‍යවසායක ආයතන දෙකක් වනවා. ඒ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා නැව් සංස්ථාවයි. මෙයින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කාර්යක්ෂමතාවෙන් යුත් ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීම ඉතාම අසීරු කරුණක් වුණා. එහිදී අපි මුහුණ දුන් ප්‍රධාන අභියෝග 5ක් තිබුණා. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධික ණය බර, උපකරණ, යටිතල පහසුකම් සහ මානව සම්පත යාවත්කාලීන නොකිරීම, ව්‍යාපාරික සැලැසුම්වල දුර්වලතා, නව ප්‍රවණතා හඳුනා නොගැනීම සහ හම්බන්තොට වරාය සුදු අලියෙකු වීම එම අභියෝග වනවා. මේ අභියෝග එකිනෙකට බැඳුණු අභියෝගයි. ඒවා වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කිරීමට වඩා එක්ව සාකච්ඡා කිරීමෙන් අපි මුහුණ දෙන අභියෝගය මෙන්ම එම අභියෝග ජය ගන්නා ආකාරය පැහැදිලිව තේරුම් ගත හැකියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ගිණුම් ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් මිලියන 233,149ක්. මේ ණය සියල්ලම 2015 වර්ෂයට පෙර ලබා ගත් ණයයි. එම ණය ප්‍රමාණයෙන් සියයට 67ක්ම හම්බන්තොට වරාය සඳහා ඉහළ පොලියට ලබා ගත් ණය වීමද විශේෂත්වයක්. මේ සම්පූර්ණ ණය සඳහා 2015 වර්ෂයේදී ණය වාරික වශයෙන් රුපියල් මිලියන 10,851ක් ද, පොලිය වශයෙන් රුපියල් මිලියන 6,083ක් ද ගෙවා තිබෙනවා. ඒ අනුව වසර තුළදී ගෙවා ඇති මුළු ණය හා පොලී ප්‍රමාණය රුපියල් මිලියන 16,934ක්. ඊට අමතරව 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගෙවිය යුතු ණය වාරිකය සහ පොලිය රුපියල් මිලියන 20,115ක් වනවා. මේ ණය 2039 වර්ෂය දක්වා ගෙවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිදු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගය වන්නේ කොළඹ වරායයි. කොළඹ වරාය කියන්නේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හදවතයි. එහි ජයබහලු පර්යන්තය, සමගි බහලු පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් බහලු හසුරුවන පර්යන්ත වනවා. ඊට අමතරව කොළඹ වරායේ SAGT පර්යන්තයත්, CICT පර්යන්තයත් පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබනවා. මෙකී පෞද්ගලික පර්යන්ත සමඟ සසඳන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව පසු ගිය ආණ්ඩු සමයේදී තිබුණේ ඉතාම පහළ මට්ටමකයි. ඒ අනුව පෞද්ගලික පර්යන්ත පැයකට හසුරුවන බහලු ප්‍රමාණය 30ත්, 33ත් අතර ප්‍රමාණයක් ගනිද්දී අපගේ පර්යන්තවල පැයකට හසුරුවන බහලු ප්‍රමාණය 15ත්, 18ත් අතර ප්‍රමාණයක් ගෙන තිබුණා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු උපකරණ පැරණි වීම, සේවක සේවිකාවන් නිසි පරිදි කළමනාකරණය නොකිරීම ඊට ප්‍රධාන වශයෙන්ම හේතු වුණා. මේ නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු පර්යන්තවල ඵලදායිතාව වැඩි කිරීමට නම් අප මුහුණ දෙන ගැටලුවලට ඉක්මන් විසඳුම් අවශ්‍ය බව අපි තේරුම් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මුහුණ දී තිබෙන අධික ණය බර හේතුවෙන් උපකරණ සහ පහසුකම් යාවත්කාලීන මහා පරිමාණයෙන් සිදු කිරීම අපහසු කරුණක්. නමුත්, අත්‍යවශ්‍ය යාවත්කාලීන කිරීම් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කර තිබෙනවා. ඒ යටතේ ගුදම් පහසුකම් වැඩි කිරීමට CFS - 1 ගුදම ගොඩ නැඟුවා. ඒ සඳහා අපි යොදා ගත්තේ වරායේ තාක්ෂණයයි; වරායේ ශ්‍රමයයි; වරායේ උපකරණයි. භාණ්ඩ වියදම පමණක් වැය වුණා. එයින් රුපියල් මිලියන 410ක් වූ ඇස්තමේන්තුගත මුදලින් රුපියල් මිලියන 95ක මුදලක් ඉතිරි කිරීමට අපට හැකි වුණා. එසේම වරායේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 219ක වියදමකින් "හර්තාල්" නමින් හඳුන්වන පාලම පුළුල් කෙරුණා. අභ්‍යන්තර ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර 1.4ක් සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරීමට ද හැකි වුණා. බණ්ඩාරනායක ජැටි පාලමේ රුපියල් මිලියන 25ක් වැය කරමින් ජල ප්‍රවාහන පද්ධතිය අලුත්වැඩියා කර ගල් අතුරා තාර දැමීම සිදු කෙරුණා. රුපියල් මිලියන 45.2ක් වැය කරමින් ජයබහලු පර්යන්තයේ R සහ S මාවත් ප්‍රතිසංස්කරණය කළා. තවදුරටත් මෙවැනි සංවර්ධන කටයුතු රාශියක් සිදු වෙමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධානතම ශක්තිය වන්නේ එම ආයතනය සතු මානව සම්පතයි. කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, ඔලුවිල්, කන්කසන්තුරේ යන වරායවල මුළු ස්ථිර සේවක සංඛ්‍යාව 9,594ක්. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත ආදායමෙන් සියයට 47ත්, 48ත් අතර ප්‍රමාණයක් මේ සේවකයින් වෙනුවෙන් වැය කරනවා. 2015 ජනවාරි මාසයේදී අපි මේ සේවකයින්ගේ වැටුප සියයට 15කින් වැඩි කර තවත් රුපියල් නවදාහක මාසික දීමනාවක් ලබා දුන්නා. ඒ සඳහා වාර්ෂිකව අතිරේකව දැරීමට සිදු වූ මුදල රුපියල් මිලියන 2,478ක්. එකී වැටුප් වැඩි කිරීමත් සමඟ මාසිකව ගෙවන සමස්ත අතිකාල දීමනා සඳහා තවත් රුපියල් මිලියන 438ක් වැය කිරීමට සිදු වුණා. එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සේවිකාවන් වෙනුවෙන් "දස මස්" ණය යෝජනා ක්‍රමය ද

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අර්ජුන රණතුංග මහතා]

අපි නැවත ක්‍රියාත්මක කළා. එහි පොලී ප්‍රතිශතය සියයට 4.2ක්. මෙම ණය යෝජනා ක්‍රමය මුල් අවස්ථාවේදී මූල්‍ය අර්බුද හේතුවෙන් නතර කිරීමට සිදු වුණා. නමුත්, පසුව එම ණය යෝජනා ක්‍රමය නැවත ආරම්භ කිරීමට අපට හැකි වූයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනුගමනය කළ සාර්ථක මූල්‍ය උපක්‍රම නිසා බව ද කිව යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරායේ සේවකයින්ට වැටුපට අමතරව ප්‍රසාද දීමනා, අතිකාල දීමනා, දිරි දීමනා, නිවාස, තුන්වේලටම කෑම, කෙටි ආහාර, තේ පැන්, නිල ඇඳුම්, රක්ෂණාවරණ ඇතුළු සියලු පහසුකම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලබා දෙනවා. වරායේ සේවකයෙක් ඉරිදා දිනක රාජකාරි කිරීමේදී පැයකට ගෙවන අතිකාල දීමනාව තුන් ගුණයකින් වැඩි වෙනවා. කෙසේ නමුත්, අපි කිසිම විටෙක සේවකයින් භුක්ති විඳින මේ වරප්‍රසාද අඩු කිරීමට කටයුතු කළේ නැහැ. ඒ වෙනුවට අපි කළේ සේවකයින් තුළ ආකල්ප වෙනසක් ඇති කිරීමයි. එය මානව සම්පත යාවත්කාලීන කිරීමේ මූලික ක්‍රමෝපාය වුණා. එමඟින් තමන් සේවය කරන ආයතනයේ ඵලදායිතාව වැඩි කිරීමට තමන්ගෙන් ඉටු විය යුතුකම් සහ වගකීම් ගැන මනා අවබෝධයක් සේවකයින් ලබා ගත්තා. එය අනාගතයට සුබ ලකුණක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරායේ රැකියාව ඇඟ වෙහෙසා කළ යුතු රැකියාවක්. ඔවුන් නිතර අසනීප වෙනවා. මේ නිසා සේවකයින්ගේ සුබසාධනය උදෙසා අපි ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කළා. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානය වැඩි දියුණු කළා. නව මුර සේවා ක්‍රමය, ඇඟිලි සලකුණු තැබීම වැනි නූතන කළමනාකරණ විධි ක්‍රම හඳුන්වා දුන්නා. අපි දේශපාලන පළිගැනීම් සිදු කළේ නැහැ. ස්ථාන මාරුවීම්, උසස්වීම් ලබා දීම් නිවාස ලබාදීම් සියල්ලම ස්වාධීන කමිටුවලින් සිදු කෙරුණා. 2015 ජනවාරි 8වැනිදා සිට 2016 නොවැම්බර් මාසයේ 23 වැනිදාට අප ලබා දුන් උසස්වීම් ගණන 723ක්. මීට පෙර එවැනි උසස්වීම් ලබා දුන්නේ 2007 වර්ෂයේදීයි. ඒ වන විට දක්ෂයාට ඉදිරියට ඒමේ අවස්ථාවක් තිබුණේ නැහැ. මේ අසාධාරණය සැලකිල්ලට ගනිමින් දක්ෂයාට ඉහළට එන්න අවස්ථාව අපි සලසා දුන්නා. එමෙන්ම වරාය සේවකයින් වෙනුවෙන් සෑම බ්‍රහස්පතින්දා දිනකම වෙනම මහජන දිනයක් ප්‍රකාශයට පත් කළා. අපි දොරවල් වසා තැබුවේ නැහැ. සේවකයින්ට තමන්ගේ ප්‍රශ්න සෘජුවම අමාත්‍යවරයා ලෙස මට යොමු කිරීමේ අවස්ථාව උදා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසු ගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ ඡන්ද ප්‍රචාරක කටයුතු සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් 573 දෙනෙකු නිදහස් කර තිබුණා. ඔවුන්ට වැටුප් මෙන්ම අතිකාල දීමනාත් ගෙවා තිබුණා. එයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට 2014 දෙසැම්බර් මාසයේදී පමණක් වූ පාඩුව රුපියල් මිලියන 41.1ක් වුණා. මේ හේතුවෙන් ඔවුන්ව සේවයෙන් ඉවත් කරන ලෙසට නිර්දේශ පවා ඉදිරිපත්ව තිබුණා. කෙසේ නමුත්, කැබිනට් මණ්ඩලය ජනාධිපතිතුමා සහ අගමැතිතුමා දැනුවත් කර ඔවුන් නැවත වරක් සේවයේ ස්ථාපිත කළා. ඒ සඳහා ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ලබා දුන් සහායට මම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශය භාර ගන්නා විට වසර 8ක් තිස්සේ නතර කර තිබූ "පිය පුතු පදනම" නැවත ඇති කර වරායේ සේවය කළ සේවක සේවිකාවන්ගේ දරුවන් 138කට ස්ථිර රැකියා ලබා දුන්නා. නොවිසඳුණු ගැටලුවක්ව තිබුණු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉංජිනේරුවරුන්ගේ රුපියල් 15,000ක දීමනාව ලබා දීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත පියවර ගත්තා. පසු ගිය ආණ්ඩු සමයේදී කිසිඳු පදනමකින් තොරව දේශපාලන හේතු මත හම්බන්තොට සහ කළුතර ප්‍රදේශයේ තරුණ තරුණියන් 214ක් අභ්‍යාසලාභීන් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුහුණුවකට යොමු කර තිබුණා. පසු ගිය ආණ්ඩුව ඔවුන් පක්ෂ දේශපාලන සඳහා යොදා ගත් නමුත් ඔවුන්ගේ අනාගතය ගැන සිතා තිබුණේ නැහැ. අද අපි විභාග පවත්වා එම තරුණ තරුණියන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ස්ථිර සේවයට යොමු කරමින් සිටිනවා. 2010 වසරේ සිට අසාධාරණයට ලක් වූ ලොරි රථ රියදුරන් 63දෙනෙකුට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සහිතව ස්ථිර පත්වීම් ලබා දීමට ද කටයුතු කළා. කොන්ත්‍රාත් පදනමේ සිටි ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 37කට ස්ථිර පත්වීම් ලබා දීමට ද අප කටයුතු කළා. ඊට අමතරව වැඩ සහායකවරුන් 463දෙනෙක් ද, කළමනාකාර සහකාර ශ්‍රේණිම් තනතුර සඳහා 28දෙනෙක් ද, ආරක්ෂක නියාමකවරුන් ලෙස 113දෙනෙක් ද, හෙද සහායක තනතුර සඳහා 7දෙනෙක් ද, වශයෙන් රැකියා 611ක් ප්‍රධාන වශයෙන්ම ලබා දීමට මේ දක්වා වූ කාලයේදී අපට හැකියාව ලැබී තිබෙනවා. නමුත්, අපි කිසිම විටෙක අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ගොස් රැකියා ලබා දීම සිදු කර නැහැ. ඒ වාගේම ආයතනයේ දියුණුවට කැප විය හැකි උගත් පිරිස් සුදුසුකම් මත ශ්‍රී ලංකා වරාය අධිකාරියට බඳවා ගැනීමට කටයුතු කළා. එය අපේ කළමනාකරණයේ විශේෂත්වයක් වුණා. රැකියා ලබා දීමේදී ආයතනයේ සුරක්ෂිතතාව සහ මූල්‍ය ස්ථාවරත්වය ගැන වඩාත් සැලකිලිමත් වුණා. ඉදිරියේදීත් මේ ප්‍රතිපත්තියේ සිටීමට අප කටයුතු කරනවා. එසේ නොවුණහොත්, අපට ආයතනය පවත්වාගෙන යන්නට හැකි වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද සේවකයින් සිටින්නේ තෘප්තිමත් බවින්. මේ හේතුවෙන්ම අද අපගේ ඵලදායිතාව පැයකට බහලු මෙහෙයුම් 13ත්, 18 සිට 28ත්, 30ත් දක්වා ඉහළ ගොස් තිබෙනවා. සේවකයින්ගේ කාර්යක්ෂමතාව ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තයට ISO 9001/2008 තත්ත්ව සහතිකය 205 වර්ෂයේදී ලබා ගැනීමට හැකි වුණා. එවැනි සහතිකයක් ලබා ගත් කොළඹ වරායේ එකම පර්යන්තය ද එය වනවා. එයම අපි ලැබූ විශාල ජයග්‍රහණයක්. එම ජයග්‍රහණය පිටුපස සේවකයින්ගේ කැප කිරීම් සේම කළමනාකරණයේදී පාලනාධිකාරිත්වය දැක්වූ සමත්කම් වූ බව මම විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසු ගිය ආණ්ඩු සමයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට ව්‍යාපාරික සැලැස්මක් තිබුණේ නැහැ. තිබුණේ පුද්ගල ප්‍රතිරූප ගොඩනැඟීමේ ක්‍රමයක්. ඒ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුදල් බොහෝ සේ නාස්ති කෙරුණා. හම්බන්තොට වරායේ කරදිය මංගල්‍යයට රුපියල් මිලියන 113ක් වියදම් කර තිබුණා. එම වරායේ තෙල් ටැංකි විවෘත කිරීමේ උත්සවයට වියදම් කර තිබූ මුදල රුපියල් මිලියන 79ක්. මාසිකව වැටුප් ගෙවමින් වෙබ් අඩවි හා මාධ්‍යවේදීන් නඩත්තු කර තිබුණා. දකුණු ආසියාවේ හොඳම වඩු මඩුව තිබෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියටයි. එසේ තිබියදීත් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය ගෘහ භාණ්ඩ පිටස්තර ආයතනවලින් ඉහළ මිලකට මිලදී ගත්තා. ඒ හරහා කොමිස් මුදල් බොහෝ පුද්ගලයින්ගේ සාක්කුවලට ගියා. වරාය කුස්සියට කෑම සැපයීමේදීත් මහා පරිමාණයේ වංචා දූෂණ සිදු වුණා. වරාය අමාත්‍යාංශය බාරගත්තාට පස්සේ ඒ සියලුම දෙයට තිත තැබීමට මම කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වරායේ උත්සවවලට අනවශ්‍ය ලෙස වියදම් කරන්නේ නැහැ. අද ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය සියලුම ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන්නේ වරාය වඩු මඩුවෙන්. වරාය කුස්සියට ආහාර සැපයීමේදී සියලුම ආහාරවල මිල සියයට 10ත්, 20ත් අතර ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකි වුණා. වරාය ලොරි ප්‍රවේශ පත්‍ර සහ වරාය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිසංවිධානය කිරීමෙන් 2015 ජනවාරි-අගෝස්තු කාලයට සාපේක්ෂව මේ වසරේදී මිලියන 256.1ක ආදායමක් ලබා ගැනීමට හැකි වුණා. වෙනදා මේ මුදල ගියේ වෙනත් අයගේ සාක්කුවලටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි ශ්‍රී ලංකා වරාය අධිකාරියට ව්‍යාපාරික සැලැස්මක් සකසා තිබෙනවා. එම අරමුණු ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පළමුවරට ශූන්‍යපාදක අය වැය ක්‍රමයක් (Zero based Budget) හඳුන්වා දුන්නා. ඊට සමගාමීව එක් එක් වරාය වෙන වෙනම පාලනය කිරීමට ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කර තිබෙනවා. එසේම අලුතින් නෞකා සේවා ආකර්ෂණය කර ගැනීමට මේ වන විට ඉන්දියාවේ නැඟෙනහිර කලාපයේ සිට මියන්මාරය දක්වා විශේෂ වට්ටමක් හඳුන්වා දුන්නා. ඒ මේ වසරේ පෙබරවාරි මාසයේ සිටයි. එහි ප්‍රතිඵලයක් ලෙස එම කලාපය ආශ්‍රිතව අපගේ ප්‍රතිඅපනයන බහළු මෙහෙයුම ගිය වසරට සාපේක්ෂව මේ වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලයේදී 20,200කින් හෙවත්, සියයට අටකින් වැඩි වී තිබෙනවා. ඊට අමතරව පසු ගිය වසරට සාපේක්ෂව මේ වන විට ගාල්ල වරායේ ලාභය දෙගුණ වී තිබෙනවා. ත්‍රිකුණාමලය වරාය වසර 10කට පසුව ලාභ ලබන තත්ත්වයට පත්ව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හොරකම් අඩු වන විට, දූෂණය අඩු වන විට එයින් නොසන්සුන් වන පිරිසක් සිටිනවා. ඒ තමයි වෘත්තීය සමිති නායකයින් යැයි කියා ගන්නා විවිධ අක්‍රමිකතාවන්ට සම්බන්ධ පිරිස. පසු ගිය ආණ්ඩු සමයේදී මේ පිරිස වරායේ මුදල් යහමින් තමන්ගේ සාක්කුවලට දමා ගත්තා. ඔවුන්ගේ පුත්තු සේවය කරන්නේ පෞද්ගලික පර්යන්තවල. මේ අයට අවශ්‍ය වරාය ව්‍යාකූල කිරීමටයි. ඒ සඳහා ඔවුන් පසු ගිය කාලයේදී විවිධ කඩාකප්පල්කාරී ක්‍රියා සිදු කළා. දැනුත් සිදු කරමින් සිටිනවා. මව් සංගම්වල ආශිර්වාදයක් නොමැතිව මේ වෘත්තීය සමිති නායකයින් යැයි කියා ගන්නා පිරිස ගෙන ගිය කඩාකප්පල්කාරී ක්‍රියාවලට සාර්ථකව මුහුණ දීමට අපට හැකි වුණා. වරායේ සේවක සේවිකාවන් සැබෑ තත්ත්වය තේරුම් ගැනීම එහිදී අපිට විශාල ශක්තියක් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරාය හා නාවික විෂය ලෝකයේ ශීඝ්‍රයෙන් දියුණුවන විෂයක්. දියුණු වන වේගයට ශ්‍රී ලංකා වරාය අධිකාරිය යාවත්කාලීන නොවුණහොත් එය ආයතනයේ පැවැත්මට බලපාන්න පුළුවන්. එවැනි තවත් එක් අභියෝගයක් අද අපි හඳුනා ගෙන තිබෙනවා. අද ලෝකයේ නෞකාවල විශාලත්වය දිනෙන් දින වැඩි වනවා. මීටර් 16ක් පමණ ගැඹුරු, මීටර් 350ට වඩා දිගින් වැඩි නෞකා පවා බහලු ප්‍රවාහනයට යොදා ගැනෙනවා. කෙසේ නමුත්, මීටර් 14.5කට වඩා ගැඹුරැති නෞකා හැසිරවීමේ හැකියාවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අද නැහැ. ඒ ජයබහලු පර්යන්තයේ උපරිම ගැඹුර මීටර් 14.5ක් වීම නිසායි. එමෙන්ම, මීටර් 340ට වඩා දිගින් වැඩි නෞකා හැසිරවීමට නොහැකි අවස්ථා ද අපට තිබෙනවා. ඒ එවැනි නෞකාවක බහලු පේළි ගණන 18කට වඩා වැඩි වන අවස්ථාවලදීයි. එවැනි නෞකා හැසිරවීමේ දොඹකර අප සතුව නැහැ. සාමාන්‍යයෙන් නෞකාවල ගැඹුර වැඩිවත්ම එහි බහලු පේළි ගණන 18ට වඩා වැඩිවීම ද ස්වාභාවිකව සිදු වනවා. මේ හේතුවෙන් මීටර් 14.5කට වඩා ගැඹුරැති, මීටර් 350කට වඩා දිග විශාල බහලුම් නෞකා අපේ පර්යන්තවලට එන්නේ නැහැ. ඒ නෞකා සියල්ලම පෞද්ගලික පර්යන්තයක් වූ සීඅයිසීටී පර්යන්තය කරා ඇදී යනවා. මේ තත්ත්වය මත මේ වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාලයේදී මීටර් 14.25ට වඩා ගැඹුරැති නෞකා ලෙස

ගත් විට නෞකා 168ක් ද, මීටර් 350ට වඩා ගැඹුරැති නෞකා ලෙස ගත් විට නෞකා 203ක් ද අපට අහිමි වුණා. එහිදී අහිමි වූ සම්පූර්ණ බහලු සංඛ්‍යාව හාරලක්ෂ විසිහත්දහස් අටසියඅසූඅටක් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පසු ගිය වසරේදී මෙහෙය වූ සමස්ත බහලු ප්‍රමාණය මිලියන 2.25ක්. නමුත්, ගැඹුරු පර්යන්තයක් අපට නොවීමෙන් මේ වසරේදී එම ප්‍රමාණය මිලියන දෙක දක්වා අඩු වනු ඇතැයි ශ්‍රී ලංකා වරාය අධිකාරිය වසර මුලදී ගණනය කර තිබුණා. ඒ අනුව අපට අහිමිවීමට තිබූ බහලු ප්‍රමාණය දෙලක්ෂ පනස්දාහක්. කෙසේ නමුත්, විවිධ ක්‍රමෝපාය අනුගමනය කරමින් එලෙස අහිමිවීමට තිබූ බහලු ප්‍රමාණය මේ වන විට එක්ලක්ෂ පනස්දහස දක්වා අඩු කරගෙන තිබෙනවා. ඒ අනුව වසර අවසානයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට මිලියන 2.1ක බහලු මෙහෙයවීමේ හැකියාව උදා වී තිබෙනවා. එම තත්ත්වය උදා කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇතැම් විට විස්මිත මෙහෙයුම් පවා සිදු කළා. ඊට එක් උදාහරණයක් මෙසේයි. සාමාන්‍යයෙන් ජයබහලු පර්යන්තයේ ගැඹුර වැඩි නැංගුරම් පොළේ දිග මීටර් 660ක් වනවා. නමුත් එක් අවස්ථාවකදී මීටර් 337ක් දිගින් යුත් නෞකා දෙකක් උපක්‍රමශීලීව එහි නැංගුරම්ලා හැසිරවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත් වුණා. එය අගය කළ යුතු විස්මිත මෙහෙයුමක් වුවත් පවතින ප්‍රශ්නය විසඳීමට එය දීර්ඝ කාලීන පිළිතුරක් නොවන බව ඉතා පැහැදිලිය. මේ නිසා මෙම ගැටලුවට ස්ථිරසාර විසඳුමක් අවශ්‍ය බව මා විශ්වාස කරනවා. ඒ සඳහා ඇති එකම විසඳුම නැඟෙනහිර පර්යන්තය බවද මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය ආසියානු සංවර්ධන බැංකුව යටතේ ක්‍රියාත්මක කෙරෙන්නක්. එහි සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක්. මීටර් 1,200ක දිගින් යුත් එහි පළමු මීටර් 440යේ වැඩ මේ වන විට අවසන් කර තිබෙනවා. පර්යන්තයේ ගැඹුර මීටර් 18ක්. කෙටි කාලීන ආර්ථික වාසි ලබා ගැනීම උදෙසා අපි මේ මීටර් 440 බහලු නොවන විශාල නෞකා හැසිරවීමට යොදා ගත්තා. මේ වර්ෂයේ එහි හසුරුවා ඇති නෞකා ගණන 43ක්. කෙසේ නමුත්, අපි ඉක්මනින්ම මෙහි බහලු හැසිරවීමට අවශ්‍ය උපකරණ සවි කළ යුතුයි. බහලු මෙහෙයුම් ආරම්භ කළ යුතුයි. අධික ණය බර හේතුවෙන් ඒ සඳහා වැය වන අති විශාල මුදල ආයෝජනය කිරීමේ හැකියාව ශ්‍රී ලංකා වරාය අධිකාරියට නැහැ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය තවදුරටත් ණය වුවහොත් වරාය සියලු සේවකයින්ගේ රැකියා සුරක්ෂිතතාවට බලපාන්න පුළුවන්. මේ හේතුවෙන් නැඟෙනහිර පර්යන්තයේ බහලු මෙහෙයුම් ආරම්භ කිරීමට යෝග්‍ය හවුල්කරුවකු තෝරා ගැනීම සඳහා අභිප්‍රායන් ප්‍රකාශ කිරීම කැඳවූවා. පසු ගිය සැප්තැම්බර් 20වැනිදා එය අවසන් කෙරුණා. ඉදිරිපත් වූ යෝජනා ඇගයීමට ලක් කිරීම මේ වන විට සිදු කෙරෙමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්පත් කිසිම විටක විකුණා දැමීමට අදහස් කරන්නේ නැහැ. සුදු අලියෙක් වූ හම්බන්තොට වරායවත් විකුණා දැමීමට අපි අදහස් කරන්නේ නැහැ. අපේ මූලික උපක්‍රමය වන්නේ හම්බන්තොට වරායේ මෙහෙයුම් ආරම්භ කිරීමට සුදුසු ආයෝජකයකුට එම වරාය බදුදීමයි. ඒ අනුව අගමැතිතුමා චීනයේ කළ සංචාරයක ප්‍රතිඵලයක් වශයෙන් අපට හම්බන්තොට වරාය සඳහා ලංසුවක් ලබා ගැනීමට හැකි වුණා. ඒ ලංසුව අපිට ලැබුණු දෙයක් නොවෙයි. අපි බොහොම අමාරුවෙන් ලබා ගත්ත දෙයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හම්බන්තොට වරායට ලංසු ඉදිරිපත් කිරීමට ඉදිරිපත් වුණේ ආයෝජකයින් දෙදෙනෙක් පමණයි. ඒ චීනයේම සමාගම් දෙකක්. එයින් එක් සමාගමකින් ලබා ගත් ලංසුව වුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 750ක් පමණයි. අනෙක් සමාගමෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,080ක ලංසුවක් ලබා ගත්තා. දැන් වැඩිම ලංසුව ලබා දුන් සමාගම සමඟ රටට හානියක් නොවන අයුරින් ගිවිසුම් අත්සන් කිරීම සඳහා මේ වන විට සාකච්ඡා කරමින් සිටිනවා. හම්බන්තොට වරාය සෑදීමේදී ව්‍යාපාරික සැලැස්මක් තිබී නැහැ. කර්මාන්තශාලා සඳහා ආයෝජකයින් පැමිණෙන බව පැවසුවත් ඒවා වචනවලට පමණක් සීමා වී තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හම්බන්තොට වරාය සඳහා ලබා ගත් සම්පූර්ණ ණය මුදල රුපියල් මිලියන එක්ලක්ෂ හතළිස්දෙදහස් නවසිය හැටඑකයි. එනම්, ඇමෙරිකානු ඩොලර් මිලියන එක්දහස් තුන්සිය හතළිස්හතක්. (රුපියල් බිලියන 142යි) මේ ණය ලබා ගැනීමේදී බන්කරින් සඳහා ලංකා බැංකුවෙන් ලබා ගත් රුපියල් මිලියන දෙදහස් පන්සිය හැත්තෑහතරක මුදල හැරෙන්නට සෙසු ණය සියල්ල ලබා ගෙන තිබෙන්නේ චීනයේ එක්සිම් බැංකුවෙන්. මේ ණය සියල්ලම අවස්ථා 7කදී ලබා ගෙන තිබෙන්නේත් ඉහළ පොලියකටයි. එක් අවස්ථාවකදී මේ පොලී ප්‍රතිශතය සියයට 8ද ඉක්මවා යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හම්බන්තොට වරාය සඳහා මේ ණය ලබා ගැනීමේදී සිදු වූ තවත් අභිරහසක් තිබෙනවා. එනම්, හම්බන්තොට වරායේ 1වන අදියර සඳහා රුපියල් මිලියන තිස්පන්දහස් තුන්සිය තිස්එකක ණය මුදල ලබා ගත්තේ ලයිබෝ ක්‍රමයටයි. ඒ යටතේ 2-4ක් පොලී ප්‍රතිශතයකින් එකී ණය මුදල පියවීමට අපට හැකියාව තිබුණා. නමුත්, වරාය අමාත්‍යවරයා ලෙස හිටපු ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් එම ප්‍රතිශතය සියයට 6.3ක ස්ථිර පොලී ප්‍රතිශතයක් ලෙස වෙනස් කළා. වෙනත් විධියකින් කියනවා නම්, සියයට 2-4ත් අතර වූ පොලී ප්‍රතිශතය සියයට 6.3 දක්වා ඉහළ දැමුවා. මෙය කාගේ වුවමනාවකට සිදු වුණාද කියලා අපි දන්නේ නැහැ. නමුත්, මේ නිසා අපිට ගෙවීමට සිදු වූ පොලී මුදල අති විශාලයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හම්බන්තොට වරායේ නැව්වලට තෙල් සැපයීම සහ තෙල් ටැංකි ව්‍යාපෘතියද අසාර්ථක ව්‍යාපෘතියක්. පසු ගිය ආණ්ඩු සමයේදී මේ ව්‍යාපෘතියට ණය ලබා ගැනීමේදී ශක්‍යතා අධ්‍යයනයක් පවා කර නැහැ. චීනයේ එක්සිම් බැංකුවට අමතරව ඉන්ධන මිලදී ගැනීම සඳහා ලංකාවේ HNB බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 28ක් ලබා ගෙන තිබෙනවා. මේ ණය ලබා ගැනීමට රේඛීය අමාත්‍යාංශයෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් අනුමැතියක් ලබා ගෙන නැහැ. මේ ණය මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 19ක් ගෙවීමට ඉතිරිව තිබෙනවා. එම ණය මුදලින් මිලට ගත් MGO ඉන්ධන තොගය අදටත් විකුණා ගැනීමේ හැකියාවක් නැහැ. මේ ඉන්ධන නෞකාවල එන්ජින් සඳහා යොදා ගන්නා ඒවා. එහි ඉල්ලුම අඩුයි. එසේම මේ ඉන්ධන තොගය ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රතික්ෂේප කළ ඉන්ධන වීමද විශේෂත්වයක්. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රතික්ෂේප කළ ඉන්ධන තොගයක් හම්බන්තොට වරායට ගොඩ බා මහා විශාල විනාශයක් කළ බව පෙනෙන්නට තිබෙනවා. කෙසේ නමුත්, මෙම ව්‍යාපාරය ද පෞද්ගලික අංශය සමඟ එක්ව ක්‍රියාත්මක කිරීමට මේ වන විට යෝජනා කැඳවා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද හම්බන්තොට වරාය ගැන ඒකාබද්ධ විපක්ෂය කඳුළු හෙලනවා. නොයෙකුත් කථා කියනවා. නමුත්, පසු ගිය ආණ්ඩු සමයේදී හම්බන්තොට වරායේ මෙහෙයුම් කිරීමට හම්බන්තොට මාගම්පුර වරාය කළමනාකරණ සමාගමට බඳවා ගෙන සිටි සේවකයින් 482කගේ රැකියා ස්ථිර කර තිබුණේ නැහැ. තමන්ගේ දේශපාලන අවශ්‍යතා ඉටු කර ගැනීමට මේ තරුණ පිරිස් යොදා ගෙන තිබුණා. අපි රට භාර ගන්නා අවස්ථාවේදී රැකියා අස්ථාවර බව හේතුවෙන් මේ තරුණ පිරිසගේ අනාගතය අවිනිශ්චිත තත්ත්වයකට පත්ව තිබුණා. නමුත්, ඔවුන්ගේ අනාගතය විනාශ වීමට ඉඩ දී බලා සිටීමේ හැකියාවක් අපට නැහැ. කොතරම් මූල්‍ය දුෂ්කරතා තිබුණත් අපි ඔවුන්ව ස්ථිර කිරීමට කටයුතු කළා. එය පළිගත් ලෙස යොදා ගනිමින් අපි ඔවුන්ව දේශපාලන වැඩවලට යොදා ගත්තේ නැහැ. ඔවුන්ව ඵලදායී ලෙස හම්බන්තොට වරායේ ප්‍රගමනයට යෙදෙව්වා. පසු ගිය ආණ්ඩුවේත්, අපේත් වෙනස එයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2020 වන විට ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධානතම බහලු මෙහෙයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම අපගේ ඉලක්කය වනවා. ඒ සඳහා කොළඹ වරාය උතුරින් වත්තල ජාඇල දක්වා ද, දකුණින් මොරටුව දක්වා ද පුළුල් කිරීමට සැලසුම් සකස් කර තිබෙනවා. කොළඹ වරාය ප්‍රතිඅපනයන මධ්‍යස්ථානයක් ලෙසත්, ගාලු වරාය සංචාරක වරායක් ලෙසත්, හම්බන්තොට වරාය කාර්මික වරායක් ලෙසත්, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරේ වරාය වාණිජ වරායන් ලෙසත් දියුණු කිරීමට අපේක්ෂා කරනවා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා ජාතික වරාය ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමට ද කටයුතු යොදා තිබෙනවා. ඒ සඳහා තාක්ෂණික සහාය ලැබෙන්නේ ආසියානු සංවර්ධන බැංකුවෙන්. කොළඹ වරාය ප්‍රවර්ධනය කළ හැකි අවස්ථා මේ යටතේ සොයා බැලෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කොළඹ වරායේ මෙහෙයුම් කරන පෞද්ගලික පර්යන්ත දෙකක් තිබෙනවා. මේ වන විට මේ පෞද්ගලික පර්යන්ත සමඟ එක්ව කොළඹ වරාය තනි වරායක් ලෙස ප්‍රවර්ධනය කරමින් සිටිනවා. එය අපේ නව දැක්ම ද වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද තනි වරායක් ලෙස කොළඹ වරාය සෑම අතකින්ම ධනාත්මක වර්ධනයක් ළඟා කරගෙන තිබෙනවා. ඒ අනුව මේ වසරේ මාස 8ක කාල පරිච්ඡේදයේදී නෞකා පැමිණීම සියයට 6 කින්ද, බහලු ධාරිතාවය සියයට 10.1කින්ද, නැව් බඩු ටොන් ප්‍රමාණය සියයට 11.4කින් ද වර්ධනය වී තිබෙනවා. එසේම, සියලුම වරායන් ගත් විට නෞකා පැමිණීම සියයට 6.6කින් ද, සමස්ත නැව් බඩු මෙහෙයුම් ප්‍රමාණය සියයට 12.1කින් ද වර්ධනය වී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අමාත්‍යාංශය යටතේ පවතින අනෙක් ප්‍රධානතම ආයතනය වන්නේ ශ්‍රී ලංකා නැව් සංස්ථාවයි. පසු ගිය ආණ්ඩු සමයේදී සිලෝන් ප්‍රින්සස් සහ සිලෝන් බ්‍රීස් නම් වූ නෞකා දෙකක් මේ සංස්ථාව චීනයෙන් මිලදී ගත්තා. ඒ ගල් අඟුරු ප්‍රවාහනය සඳහායි. මේ නෞකා දෙක මිලදී ගැනීමට පසු ගිය ආණ්ඩුව වැය කළ මුදල ඩොලර් මිලියන 80ක්. මහජන බැංකුවේ ණයක් ලෙස මේ මුදල නැව් සංස්ථාව ලබා ගෙන තිබුණා. කෙසේ නමුත්, එම මුදලට නෞකා දෙකක් නොව හතරක් මිලදී ගත හැකි බව මම විශ්වාස කරනවා. මෙලෙස අධික මිලකට නෞකා මිලදී ගැනීම හේතුවෙන් ශ්‍රී ලංකා නැව් සංස්ථාව මහජන බැංකුවට ගෙවිය යුතු ණය වාරිකයද ඉහළ අගයක් ගෙන තිබුණා. කෙසේ නමුත්, එම ණය වාරික ගෙවීමට

[ගරු අර්ජුන රණතුංග මහතා]

ප්‍රමාණවත් තරම් වූ ආදායමක් මේ නෞකාවලින් ශ්‍රී ලංකා නැව් සංස්ථාවට ලැබුණේ නැහැ. මේ හේතුවෙන් එක් නෞකාවකින් දෛනිකව සිදුවීමට තිබූ පාඩුව ඩොලර් 1,000ත්, 11,000ත් අතර ප්‍රමාණයක් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අගෝස්තු මස 04වැනිදා වන විට ශ්‍රී ලංකා නැව් සංස්ථාව මහජන බැංකුවට ගෙවීමට තිබුණු ණය හා පොලී වාරිකය ඇමෙරිකානු ඩොලර් මිලියන 3.3ක්. නමුත්, මහා භාණ්ඩාගාරය මැදිහත් කරගනිමින් ඇමෙරිකානු ඩොලර් 750,000ක් ගෙවීමට නැව් සංස්ථාව කටයුතු කළා. පසුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් ණය කොන්දේසි ලිහිල් කරගෙන ආදායම් මට්ටම අනුව ණය ගෙවීමට ශ්‍රී ලංකා නැව් සංස්ථාව අවස්ථාව උදා කර ගත්තා. එවැනි ක්‍රියාමාර්ග හේතුවෙන් අද වන විට මේ නෞකාවලින් දෛනිකව පාඩුව අවම කර ගැනීමට ශ්‍රී ලංකා නැව් සංස්ථාවට හැකි වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාම්පූර් ගල් අඟුරු බලාගාරය ක්‍රියාත්මක නොකිරීමත් සමඟ නැව්වලින් ගත හැකි ප්‍රයෝජන අඩු වී තිබෙනවා. එය ලංකා නැව් සංස්ථාවේ ආදායමට බරපතළ තර්ජනයක්. කෙසේ නමුත්, එම තර්ජනයට පිළියමක් ලෙස මේ වන විට වාරකන් කාලවලදී වෙනත් ව්‍යාපාර කටයුතු සඳහා තම නෞකා යෙදවීමට ශ්‍රී ලංකා නැව් සංස්ථාව කටයුතු කර තිබෙනවා. ඒ අනුව දකුණු කොරියාව, චීනය, හොංකොං සමඟ කටයුතු කරමින් වෙනත් භාණ්ඩ ප්‍රවාහනයට ලංකා නැව් සංස්ථාව කටයුතු කළා. එහිදී ශ්‍රී ලංකා නැව් සංස්ථාව පසු ගිය මාසයේ 30වැනිදා වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 1.02ක අතිරේක ආදායමක් මේ නෞකාවලින් ඉපයීමට සමත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නාවිකයින් ලෙස පුහුණු වීමේ අවස්ථාව අද අපේ රජයේ විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ට පහසුවෙන් ලැබෙන්නේ නැහැ. ඊට පිළියමක් ලෙස ලංකා නැව් සංස්ථාව සිය නෞකාවලදී නාවිකයන් ලෙස පුහුණු වීමේ අවස්ථාව ශ්‍රී ලාංකිකයන්ට උදාකර දී තිබෙනවා. රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම පුහුණුව ලබා දෙන්නේ සම්පූර්ණයෙන්ම නොමිලේ. මේ වන විට ආධුනික නැවියන් 50 දෙනෙකු මේ පුහුණුවීමේ නිරතව සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගල් අඟුරු ප්‍රවාහනය සම්බන්ධයෙන් ඇතිව තිබෙන නව ප්‍රවණතා එම වෙළෙඳාමෙන් ඉහළ ආදායමක් ලැබීමේ අවස්ථාව ද ශ්‍රී ලංකා නැව් සංස්ථාවට අහිමි වෙමින් පවතිනවා. ඒ ගැන මේ උත්තරීතර සභාව දැනුවත් කළ යුතු යැයි මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකා නැව් සංස්ථාව ලක්විජය විදුලි බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කිරීම ආරම්භ කරන්නේ 2010 වර්ෂයේදීයි. ඒ සඳහා විදුලිබල මණ්ඩලය සමඟ ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා නැව් සංස්ථාව වාර්ෂිකව ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2.2ක් ප්‍රවාහනය කළ යුතු වනවා. සාමාන්‍යයෙන් වාරකන් කාලවලදී ලංකාවට ගල් අඟුරු ප්‍රවාහනය කිරීමේ හැකියාවක් නැහැ. මේ නිසා දින 180ක් තුළදී ගල් අඟුරු මෙට්‍රික්ටොන් මිලියන 2.2ක් ප්‍රවාහනය කිරීමට ගමන් වාර 38ක් සඳහා නෞකා 6ක් පමණ යෙදවිය යුතුයි. මේ හේතුවෙන් ගල් අඟුරු ප්‍රවාහනය සඳහා පෞද්ගලික නෞකාවල සේවය ලබා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා නැව් සංස්ථාව 2014 වර්ෂයේදී සිංගප්පූරුවේ පීසීඑල් සමාගම සමඟ ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුම 2017 වර්ෂය දක්වා බලාත්මකයි. එම ගිවිසුමට අනුව දකුණු අප්‍රිකාවේ සිට මෙරටට ආනයනය කරන ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකක් සඳහා විදුලිබල මණ්ඩලය ඇමෙරිකානු ඩොලර් 18.63ක් සිංගප්පූරු සමාගමට ගෙවනු ලැබුවා. එහිදි ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකකින් ලංකා නැව් සංස්ථාවට හිමි වූ ආදායම ඇමෙරිකානු ඩොලර් 1.15ක්. කෙසේ නමුත්, 2015 වර්ෂයේදී විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය නව වෙළෙඳ පොළ ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ගල් අඟුරු ප්‍රවාහනය සඳහා අලුතින් මිල ගණන් කැඳවනු ලැබුවා. එහිදි ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකක් සඳහා ලැබුණු අඩුම ලංසුව වුණේ ඇමෙරිකානු ඩොලර් 11.5ක්. එම අගය මත ගල් අඟුරු ප්‍රවාහනය කිරීම ලංකා නැව් සංස්ථාවට වාසිදායක වන්නේ නැහැ. කෙසේ නමුත්, තම ප්‍රධානතම ආදායම් මාර්ගය වූ ගල් අඟුරු ප්‍රවාහනය අහිමි කර ගැනීමට ලංකා නැව් සංස්ථාවට නොහැකියි. ඒ අනුව සිංගප්පූරු සමාගමක් සමඟ සාකච්ඡා කර එම අගයට ගල් අඟුරු ප්‍රවාහනය කිරීම සඳහා ලංකා නැව් සංස්ථාව කටයුතු කළා. එහිදී ලංකා නැව් සංස්ථාවට ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකකින් ආදායම ලෙස ලැබෙනුයේ ඇමෙරිකානු ඩොලර් දශම 25ක් පමණයි. එම තත්ත්වය මත 2015 ඔක්තෝබර් මාසයේ සිට මේ දක්වා කාලයේදී ලංකා නැව් සංස්ථාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක පමණ ආදායමක් අහිමි වුණා. නමුත්, විදුලිබල මණ්ඩලයට ඇමෙරිකානු ඩොලර් මිලියන 26ක වාසියක් හිමිව තිබෙනවා. එය එක් අතකින් ජාතික ආර්ථිකයට ලැබුණු වාසියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකා නැව් සංස්ථාව අද මුහුණ දෙන තවත් ගැටලුවක් තිබෙනවා. රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 415ට අනුව රජයේ ආයතන විදේශයන්ගෙන් භාණ්ඩ ලංකාවට ගෙන ඒමේදී එය සිදු කළ යුත්තේ ලංකා නැව් සංස්ථාව හරහායි. නමුත් අදටත් ඇතැම් රාජ්‍ය ආයතන මෙම චක්‍රලේඛය නොසලකා හැර කටයුතු කරමින් සිටිනවා. එහිදී එම රාජ්‍ය ආයතන සැපයුම්කරුවන් හරහාම අතාර්කික නැව් ගාස්තු යටතේ භාණ්ඩ මෙරටට ආනයනය කරනවා. එය ලංකා නැව් සංස්ථාවේ ආදායමට බරපතළ තර්ජනයක් වාගේම ලංකාවේ විදේශ විනිමය පිට රටට ගලා යාමක්. මේ නිසා එම තත්ත්වය වහා නතර කළ යුතු යැයි මා යෝජනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ අමාත්‍යාංශය කටයුතු කරන්නේ ජාතික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්. දේශපාලන ජීවිතයේදී මට පක්ෂ, පාට වටින්නේ නැහැ. මට වටින්නේ රට. පෞද්ගලිකව අවාසිදායක වුණත් රට වෙනුවෙන් හොඳම දෙය කිරීම මගේ ප්‍රතිපත්තියයි. ඒ වාගේම, ආයතන මෙහෙයවීමේදී රට ප්‍රමුඛත්වයෙහිලා සැලකීම මගේ අරමුණ වනවා. රටට වඩා වැඩි යහපතක් සිදු වනවා නම්, අපේ ආයතනවලට වන අලාභය කළමනාකරණය කර ගැනීම අපේ දැක්ම වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අධික ණය බරක් තිබෙනවා. හම්බන්තොට වරාය සුදු අලියෙක්. නමුත් අපි කිසිම සේවකයකු රැකියාවලින් ඉවත් කළේ නැහැ. වරාය සංවර්ධනය අඩාල කළේ නැහැ. වෙළෙඳාම් අවස්ථා අහිමි කර ගත්තේ නැහැ. නව ලෝකයට ගැළපෙන පරිදි සියල්ල සමබර කර ගනිමින් අද වරාය විශාල ප්‍රගමනයක් ලබමින් සිටිනවා. ඒ වාගේම ලංකා නැව් සංස්ථාවේ නෞකාද අද ප්‍රගමනය කරා ගමන් කරමින් සිටිනවා. වැඩි මුදලට මිලදී ගත් එම නෞකා සංස්ථාවට බරක්. ගල් අඟුරු වෙළෙඳාමෙන් ලැබෙන ආදායම අඩු වීම බරපතළ මූල්‍ය ගැටලුවක්. නමුත් මේ සියලු ප්‍රශ්න හමුවේ අවම අවාසියක් වන සේ නෞකා වෙළෙඳාම කළමනාකරණය කර ගැනීමට ලංකා නැව් සංස්ථාව සමත්ව සිටිනවා. වරාය අමාත්‍යාංශය ලෙස අප ලැබූ ජයග්‍රහණයම එය වනවා. ෙමේ හේතුවෙන් ගල් අඟුරු ප්‍රවාහනය සඳහා පෞද්ගලික ් ප්‍රධානතම ආයතනය වන්නේ ශ්‍රී ලංකා නැව් සංස්ථාව, පසුගිය ආණ්ඩු සමයේදී සිලෝන් ප්‍රින්සස් සහ සිලෝන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වෙරළාසන්න මගී ප්‍රවාහනය අයත් වන්නේත් අපගේ අමාත්‍යාංශයටයි. ඒ අනුව මේ වසරේදී යාපන අර්ධද්වීපයේ ජැටි පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 50ක් වෙන් කළා. එම ප්‍රතිපාදන යටතේ කයිට්ස් දූපතෙහි වෙළඳ නාවික ලේකම් කාර්යාලයට අයත් ශාඛාවක් විවෘත කළා. අප අමාත්‍යාංශය යටතේ පාලනය වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය 2016 ජුනි මස දී ජාත්‍යන්තර සමුද්‍රීය ආයතනය (IMO) විසින් ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශයන්ට අනුකූලව කටයුතු පවත්වාගෙන යන බවට සහතික කිරීම සඳහා පවත්වනු ලබන විගණනය සාර්ථකව නිම කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නිශ්චිත ජයග්‍රාහී ඉලක්කයක් කරා එක් එක් ආයතන නිවැරදිව යොමු කිරීම එළැඹෙන වසරේදී අප අමාත්‍යාංශයේ ඉලක්කය වනවා. එහිදී ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධානතම බහලු මෙහෙයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරුණු ඉලක්කය වනවා. මෙරට නෞකා ආශ්‍රිත වෙළඳාමේදී වැඩි කොටසක් හිමි කර ගැනීම ලංකා නැව් සංස්ථාවේ ඉලක්කය වනවා. වෙරළාසන්න මගී ප්‍රවාහන සේවය විධිමත් කිරීම සහ තරගකාරී සහ කාර්යක්ෂම වරාය, නාවික සහ සමුද්‍රීය වෙළඳ පොළක් නිර්මාණය කිරීම වෙළඳ ලේකම් නාවික කාර්යාලයට පැවරුණු කාර්යයක්. එම ඉලක්කයන් සපුරා ගනිමින් නූතන ජාත්‍යන්තර වෙළඳාමෙහි පෙර අපරදිග යා කරන වරාය, නාවික සහ සමුද්‍රීය මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම අප අමාත්‍යාංශයේ මූලික දැක්ම හා කාර්යය වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අප මේ ගෙවමින් සිටින්නේ ජනපති-අගමැති ප්‍රමුඛ සම්මුතිවාදී යහ පාලන ආණ්ඩුවේ දෙවැනි වසරයි. ජාත්‍යන්තර ප්‍රජාව අපගේ ආණ්ඩුව කෙරෙහි තබා ඇති විශ්වාසය ප්‍රශංසනීය වනවා. ජාත්‍යන්තර වෙළඳාමෙහි නිරත ප්‍රකට සමාගම් ද අද ශ්‍රී ලංකාවේ ආයෝජනයට එක්වෙමින් සිටීම පැහැදිලිව දක්නට ලැබෙන කරුණක්. මෙම නව ප්‍රවණතාවල අස්වැන්න නෙළා ගනිමින් අපේ රටේ වරාය, නාවික සහ සමුද්‍රීය ක්ෂේත්‍රයෙහි තවදුරටත් දියුණුවක් ඇති කළ හැකි බව මා විශ්වාස කරනවා. ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමෙන් නොනැවතී සියලු පාර්ශ්වයන්ට මඟ පෙන්වීමට ද වරාය හා නාවික අමාත්‍යාංශය සූදානම් බවද අවධාරණය කරනවා. ශ්‍රී ලංකාවේ ආදර්ශවත් අමාත්‍යාංශය බවට පත් කරමින් මෙරට ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛ සන්නාමය බවට වරාය හා නාවික අමාත්‍යාංශය පත් කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට ඉදිරියේදීත් කැපවන බවද මා අවසාන වශයෙන් ප්‍රකාශ කරනවා.

[பி.ப. 4.10]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த உயரிய சபையில் இன்று பேசுவதற்கு வாய்ப்பை வழங்கிய மைக்காக எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்

கொள்கிறேன். நான் இச்சந்தர்ப்பத்தில் ஊடகத்துறை சம்பந்தமான எனது கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன். ஊடகத்துறை சம்பந்தமாகப் பேசுவதற்கான போதிய அனுபவமும் தகுதியும் எனக்கு இருக்கின்றது என்கிற அடிப்படையில் நான் சில கருத்துக்களை இங்கு ஆணித்தரமாக முன்வைக்க விரும்புகின்றேன். பல சவால்களுக்கு மத்தியிலும் - அடக்குமுறைகள், கொடுமைகளுக்கு மத்தியிலும் 30 வருடங்களுக்கு மேலாக ஓர் ஊடக நிறுவனத்தை நடத்தி வருபவன் என்ற அடிப்படையில் இந்தக் கருத்துக்களை முன்வைப்பதற்கு நான் பொருத்தமானவன் என்றே எண்ணுகின்றேன். நான் சார்ந்த ஊடக நிறுவனம் நேற்று, அதாவது, 27.11.2016 அன்று, 32 ஆவது ஆண்டில் காலடி எடுத்து வைத்திருக்கிறது என்ற செய்தியையும் இங்கு தெரிவிக்க விரும்புகின்றேன்.

இந்த நாடு வரலாற்றில் எப்போதும் எதிர்கொண்டிராத அளவுக்கு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷவின் கடந்த ஆட்சிக் காலத்தில் ஊடக அடக்குமுறையை, நெருக்குவாரங்களை அனுபவித்ததை எவரும் மறந்துவிட முடியாது. அவரது ஆட்சியைத் தூக்கி வீசிவிட வேண்டுமென்று இந்த நாட்டிலுள்ள பெரும்பான்மையான சிங்கள மக்களும் எண்ணத் தலைப்பட்டதற்கு அவர்களின் கருத்துச் சுதந்திரத்தை மறுதலித்த மஹிந்தவின் இந்தச் செயற்பாடும் காரணம் என்பதை யாரும் மறந்துவிடமுடியாது. அதேபோன்று, ஆட்சி மாற்றத்தை ஏற்படுத்தியதில் சிங்கள, தமிழ், ஆங்கில ஊடகங்களின் பங்கையும் யாரும் மறந்துவிடவோ மறுத்துவிடவோ முடியாது. அவையில்லாமல் இந்த ஆட்சி மாற்றம் நடந்திருக்கும் என்று எண்ணுவது சிறுமைத்தனம்!

எனினும், கடந்த சில மாதங்களாக ஊடகங்களுக்கு எதிராக அரச தலைவர்களிடமிருந்து, குறிப்பாக மேதகு ஜனாதிபதி அவர்கள், மாண்புமிகு பிரதமர் ஆகியோரிடமிருந்து காட்டமான கருத்துக்கள் வெளிப்படுவதைப் பார்க்கும்போது இவர்கள் பழையவை அனைத்தையும் மறந்துபோய் விட்டனரோ என்கிற எண்ணம் ஏற்படுகின்றது. அரச தலைவர்களுக்கு ஊடகங்களுடன் கருத்து முரண்பாடுகள் இருக்கலாம். அதுபற்றி அவர்கள் ஊடகவியலாளர்களுடனும் ஊடக ஆசிரியர்களுடனும் விரிவாக விவாதிக்கலாம். முரண்படும் விடயங்கள் குறித்துத் தமது விளக்கங்களை வழங்கலாம். அதைவிடுத்து, பகிரங்கமாக ஊடகங்களை விமர்சிப்பதும் காட்டமான கருத்துக்களைத் தெரிவிப்பதும், தேர்தல் காலங்களில் அரசு வழங்கிய வாக்குறுதிகளுக்கு மாறாக ஊடக சுதந்திரத்தில் இந்த அரசும் தலையீடுகளைச் செய்கிறது என்கிற தோற்றப்பாட்டையே ஏற்படுத்துகிறது.

நல்லாட்சி அரசின் காலத்தில் முழுமையான ஊடக சுதந்திரம் கிடைக்குமென்று தேர்தல் காலத்தில் மேடைக்கு மேடை முழங்கப்பட்டது. அதற்கேற்ப ஆட்சி மாற்றத்தின் பின்னர் ஊடகங்களின் மீதான கட்டுப்பாடுகள் தளர்த்தப்பட்டிருக்கின்றன, அச்சுறுத்தல்கள் குறைந்திருக்கின்றன என்பதை நாம் மறுப்பதற்கில்லை. ஆனால், வாக்குறுதியளித்தபடி முழுமையான ஊடக சுதந்திரம் உறுதிப்படுத்தப்பட்டிருக்கிறதா? என்றால், இல்லை. ஊடக நிறுவனங்களைத் தாக்கியவர்களும் ஊடகவியலாளர்களைக் கொன்று குவித்தவர்களும் இன்றும் சமூகத்தில் சுதந்திரமாக நடமாடித் திரியும்போது ஊடகவியலாளர் எப்படி முழுச் சுதந்திரத்துடன் செயற்பட முடியும்? அவர்களின் மனங்களிலிருந்து எப்படி அச்சம் விலகும்? ஊடகவியலாளர்களும் ஊடக நிறுவனங்களும் பாதுகாப்பாக இருப்பதாக உணர்த்தப்படாத வரையில் எப்படி முழுமையான ஊடக சுதந்திரம் நிலைநாட்டப்படும்?

காணாமல் ஆக்கப்பட்ட ஊடகவியலாளர் பிரகீத் எக்னெலிகொடவின் வழக்கையும் 'சண்டே லீடர்' ஆசிரியர் லசந்த விக்ரமதுங்கவின் வழக்கையும் இந்த நல்லாட்சி அரசு விசாரணைக்கு எடுத்துக்கொண்டுள்ளது; அது நல்ல விடயம். அந்த வழக்குகளில் குற்றவாளிகள் கண்டறியப்பட்டுத் தண்டிக்கப்பட வேண்டும். ஆனால், உலகின் கவனத்தை ஈர்த்த அந்த வழக்குகளில் மட்டும்தான் அரசு அக்கறையாக இருந்துகொண்டு மற்றைய சம்பவங்களைப் புறக்கணிப்பது ஏற்புடையதல்ல. லசந்த மற்றும் எக்னெலிகொட ஆகியோரின் வழக்குகளில் அரச படைகளும் அவர்களின் ஏவலாளிகளும் தான் தொடர்புபட்டிருக்கிறார்கள் என்று நீதிமன்றங்களில் வழங்கப்பட்டுவரும் சாட்சியங்களைப் பார்க்கும்போது, தமிழ் ஊடகவியலாளர்களின் படுகொலைகளின் பின்னணியிலும் அரச படைகளின் பலமான தொடர்புகள் இருக்கலாம் என்பதை மறுதலிக்கமுடியாது. கடந்த காலங்களில் ஊடகங்கள் மீதும் ஊடகவியலாளர்கள் மீதும் எத்தனையோ தாக்குதல்கள் நடந்திருக்க, இரண்டு வழக்குகளை மட்டும் விசாரிப்பது குற்றவாளிகளைக் கட்டுப்படுத்த உதவாது. அது மக்களையும் உலகத்தையும் ஏமாற்றுவதற்கான ஒரு நடவடிக்கையாக மட்டுமே பார்க்கப்படும். ஊடகவியலாளர்கள் மீது நடத்தப்பட்ட அனைத்துத் தாக்குதல்கள் குறித்தும் விசாரணைகள் நடத்தப்படவேண்டும். கொல்லப்பட்ட, கடத்தப்பட்ட ஊடகவியலாளர்கள் தொடர்பான அத்தனை வழக்குகளும் விசாரிக்கப்படவேண்டும். நீங்கள் உண்மையில் நல்லாட்சி செய்வதாகத்தான் மக்களுக்கு வாக்களித்தீர்கள்; பேருக்கு 'நல்லாட்சி' என்று சொல்லவில்லை என்று நான் கருதுகிறேன். ஆகவே, அவற்றையும் எடுத்து விசாரித்தால், இதனைவிடவும் பல உண்மைகள் வெளிவரக்கூடும்!

குறிப்பாக, தமிழ் ஊடகவியலாளர்களின் கொலைகளுக்குப் பின்னால் இருந்த அரச படைகளினதும் அவற்றின் ஒட்டுக் குழுக்களினதும் தொடர்புகள் வெளிக்கொண்டு வரப்படவேண்டும்; குற்றவாளிகள் தண்டிக்கப்படவேண்டும். இந்த அரசு பதவியேற்றது முதற்கொண்டு சமர்ப்பிக்கப்பட்ட ஒவ்வொரு வரவு செலவுத் திட்டத் விவாதத்தின்போதும் நான் இந்தக் கோரிக்கையை முன்வைக்கிறேன். ஆனால், அது நடைபெறுவதாக இல்லை. கொல்லப்பட்ட தமிழ் ஊடகவியலாளர்கள் குறித்தும் அவர்களின் குடும்பங்கள் குறித்தும் இந்த அரசு கிஞ்சித்தும் சிந்திப்பதாக இல்லை. இது கவலை தருகிறது; விசனத்தையும் கோபத்தையும் ஏற்படுத்துகிறது. அனைத்தையும் உடனடியாகச் செய்யமுடியாது என்று இந்த அரசு கருதினால், அவற்றை எப்போது செய்து முடிப்பது? என்ற கால அட்டவணையொன்றை அரசு அறிவிக்கவேண்டும். அப்போதுதான் மக்களுக்கு நம்பிக்கை வரும்; ஊடகவியலாளர்களுக்கு நம்பிக்கை வரும்; ஊடக நிறுவனங்கள் துணிந்து சுதந்திரமாகச் செயற்பட முன்வரும். இவையெல்லாம் இல்லாமல் முழுமையான ஊடக சுதந்திரம் என்பது வெறும் கண்துடைப்பு!

நான் ஊடகத்துறை சார்ந்து பேசும்போது, இன்னொரு விடயத்தையும் இங்கு சுட்டிக்காட்டியே ஆகவேண்டும். அது யாழ்ப்பாணத்துக்கும் கொழும்புக்குமான இடைவெளி. ஊடகங்களைப் பொறுத்தவரை அதற்கு இலங்கையில் இரண்டு மையங்கள்தான் உள்ளன. பாரம்பரியமாகவே கொழும்பு நகரம்தான் ஊடகங்கள் அனைத்தினதும் தலைமையகமாகவும் தளமாகவும் இருக்கின்றது. அதற்கு வெளியே முழு இலங்கையிலும் வளமான செழிப்பான ஊடகப் பாரம்பரியத்தைக் கொண்டிருப்பது யாழ்ப்பாணமே. தேசியப் பத்திரிகைகளுக்கு நிகராக, ஏன் அதற்கும் மேலாகச் சிறந்த செயற்பாட்டை யாழ்ப்பாண ஊடகக் கலாசாரம்தான் கொண்டிருக்கின்றது. கொழும்பிலிருக்கும் ஊடகங்கள்

[ගරු ඊ. සරවනපවන් මහතා]

எதிர்கொள்ளாத, எதிர்கொள்ளவே முடியாத பயங்கரங்களை யெல்லாம் யாழ்ப்பாணத்து ஊடகங்கள்தான் எதிர்கொண்டிருக் கின்றன. அரச பயங்கரவாதம் உள்ளிட்ட எல்லா வன்முறை களையும் அவைதான் கடந்த காலங்களில் எதிர்கொண்டிருக் கின்றன. ஆனால், அவைகுறித்து ஒரு விசாரணைகூட இந்த அரசால் முன்னெடுக்கப்படவில்லை. பதிலாக, தற்போது ஊடகங்களைக் குறைசொல்ல ஆரம்பித்திருக்கிறது இந்த அரசு.

இலங்கை வரலாற்றிலேயே முதன்முதலில் ஊடக நிறுவனம் ஒன்றுக்குள் புகுந்து அங்கிருப்பவர்களைச் சுட்டுக்கொன்று, சொத்துக்களுக்கெல்லாம் சேதம் விளைவித்த சம்பவம் 2006ஆம் ஆண்டு மே மாதம் 2ஆம் நாள், அதாவது சர்வதேச ஊடக சுதந்திர தினமான மே 3ஆம் திகதிக்கு முதல் நாள் இரவு நடைபெற்றது. யாழ்ப்பாணத்தின் 'உதயன்' பத்திரிகை அலுவலகத்திற்குள் நுழைந்த ஆயுததாரிகள் வெறியாட்டம் நடத்தி இரண்டு ஊழியர்களைச் சுட்டுக்கொன்றார்கள். மேலும், 3 பேரைக் காயப்படுத்தினார்கள்; கோடி ரூபாய் சொத்துக்களை நாசமாக்கினார்கள். இலங்கையின் ஊடக வரலாற்றையே அதிர்ச்சியால் புரட்டிப்போட்ட இந்தச் சம்பவம் குறித்து இதுவரையில் எந்த விசாரணையும் மேற்கொள்ளப்படவில்லை; இந்த அரசின் கீழும் நடவடிக்கை எடுக்கப்படவில்லை. அந்தத் தாக்குதல் இராணுவத்தினரின் ஆசீர்வாதத்துடனும் ஆதர வுடனும்தான் நடத்தப்பட்டதென்றாலும் அதனை நேரடியாகச் செய்தவர்களின் தலைவர் - தாக்குதலின் சூத்திரதாரி முன்னைய ஆட்சியில் அமைச்சராக இந்தச் சபையிலிருந்தார். இன்று நாடாளுமன்ற உறுப்பினராக அரசுக்கு வேண்டியவராகச் சுதந்திரமாகச் செயற்படுகின்றார். தான் செய்த கொலை களுக்காக, தான் ஊடக நிறுவனங்களைத் தாக்கியமைக்காகத் தன்மீது வழக்கு வரும், சிறையில் அடைக்கப்படுவோம் என்ற அச்சம் ஏதுமின்றி அவர் இங்கு அமர்ந்திருக்கும்போது, வெளியே ஊடகவியலாளர்களும் ஊடக நிறுவனங்களும் எப்படி முழுமையான சுதந்திரத்தை அனுபவிக்க முடியும்? அந்தக் குற்றவாளி அரசின் பங்காளிக் கூட்டணி ஒன்றிலேயே உப தலைவராக இருக்கும்போது ஊடகவியலாளர்கள் எப்படிச் சுதந்திரமாகச் செயற்படமுடியும்? நல்லாட்சி அரசின்கீழும் இப்படியான குற்றவாளிகள் பாதுகாக்கப்படுகின்றபோது ஊடகவியலாளர்களால் எப்படி முழுமையான சுதந்திரத்துடன் செயற்படமுடியும்? நீங்கள் குற்றவாளிகளைப் பாதுகாத்துக் கொண்டு நேர்மையான விசாரணையையும் நடத்துவீர் களென்று எதிர்பார்ப்பது முட்டாள்தனம்தான். மஹிந்த கருணாவைக் கழற்றிவிட்டதைப்போன்று இந்த நபரையும் நீங்கள் கழற்றிவிடும் ஒரு நிலை வரும்போதுதான் இவரைக் கைதுசெய்து வழக்குத் தாக்கல் செய்யக் காலம் வருமோ தெரியவில்லை. எல்லா ஆட்சிகளும் இப்படிப்பட்ட குற்றவாளி களுக்குச் சாதகமாக நடந்துகொள்ளும்போது ஊடகவிய லாளர்கள் சுய தணிக்கைக்குள் கட்டுண்டு கிடப்பதைத்தவிர வேறு என்ன வழிவகை இருக்கப்போகிறது? இப்போதும் அதுதான் நடந்துகொண்டிருக்கிறது. தாங்கள் விரும்புபவற்றை எழுதவோ பேசவோ முன்னர், ஒன்றுக்குப் பல தடவை யோசிக்க வேண்டியவர்களாகத்தான் ஊடகவியலாளர்கள் இருக்கின்றனர். அந்த நிலைமை மாறவேண்டுமென்றால் குற்றவாளிகள் அனைவரும் தண்டிக்கப்படவேண்டும். அந்த விடயத்தில் இந்த அரசாங்கம் நேர்மையுடன் செயற்பட வேண்டும்.

வடக்கில் பிரபல ஊடகவியலாளராக விளங்கிய நிமலராஜன் வீட்டிலேயே அவரது குடும்பத்தினர் முன்னிலை யில் படுகொலை செய்யப்பட்டார். இச்சம்பவம் தொடர்பாக ஈ.பீ.டி.பீ.யின் முக்கியஸ்தர் உட்பட மூவர் கைதுசெய்யப் பட்டனர் பின்பு அவர்கள் சட்ட மாஅதிபரின் சம்மதத்துடன் பிணையில் விடுவிக்கப்பட்டனர். இவ்வழக்கின் பிரதான எதிரியான ஈபீ.டி.பீ. உறுப்பினர் வெளிநாட்டுக்குத் தப்பி ஓடிவிட்டதாகக் கூறப்படுகின்றது. இன்றுவரை அவர் கைதுசெய்யப்படவோ அல்லது அவரைக் கைதுசெய்ய 'இன்டர்போல்' அமைப்பைக் கோரவோ நடவடிக்கை எடுக்கப் படவில்லை. நிமலராஜன் கொல்லப்பட்டு 16 ஆண்டுகள் கடந்துவிட்டபோதிலும் இன்றுவரை நீதி கிட்டவில்லை. கிழக்கின் ஊடகவியலாளர்களான சுகிர்தராஜன், நடேசன் போன்றோரின் கொலைகளுக்கும் நீதி கிடைக்கவில்லை. இதுபோன்ற ஏராளம் தமிழ் ஊடகவியலாளர்களின் குடும்பங்கள் நீதியை எதிர்பார்த்து ஏங்கி நிற்கின்றன. இந்த ஊடகவியலாளர்களின் குடும்பங்களுக்கு இழப்பீட்டு நிதிகூட கிடைக்கவில்லை. இந்த அரசாவது அதனைச் செய்யுமென்று அவர்கள் எதிர்பார்த்தார்கள். ஆனால், அரசு அதில் அக்கறை காட்டாமலிருப்பது பெரும் கவலைக்குரியது.

கடந்த 10 வருடங்களில் கொழும்பில் ஊடகவியலாளர்கள் கொல்லப்பட்டதற்கும் ஊடக நிறுவனங்கள் தாக்கப்பட்ட தற்கும் மேலாக வடக்கு, கிழக்கில் பல சம்பவங்கள் நடந்துள்ளன. ஆனால், இந்த அரசு அவற்றில் ஒன்று குறித்துகூட இதுவரையில் விசாரணை நடத்தியதில்லை. ஏன்? அவை தமிழ் ஊடகங்கள், அவர்கள் தமிழ் ஊடகவியலாளர்கள் என்கிற பாரபட்சமா? அல்லது வடக்கு, கிழக்கு ஒரு தனியான நாடு என்று இந்த ஆட்சியும் கருதுகின்றதா? இந்தப் பாரபட்சம்தான் கடந்த 60 ஆண்டுகளாக இந்த நாட்டைச் சீரழித்தது என்பதை இந்த அரசாங்கம் மறந்துவிடக்கூடாது. இந்த நாட்டில் துணிச்சலுடனும் நேர்மையுடனும் உண்மைகளை வெளியிட்ட, நியாயத்துக்காகக் குரல் கொடுத்த எத்தனையோ ஊடகவியலாளர்கள் நட்ட நடுவீதியில் பலர் பார்க்கப் படுகொலை செய்யப்பட்டனர்; பலர் காணாமற் போய்விட்டனர். பலரின் வீடுகள் தாக்கப்பட்டன; பலருக்குக் கொலை மிரட்டல்கள் விடுக்கப்பட்டன; பலர் கைது செய்யப்பட்டனர்; பலர் உயிர் பாதுகாப்புக் கருதி நாட்டை விட்டு வெளியேறிவிட்டனர். இப்படியான நிலையில் ஊடகவியலாளர்கள் மீதான வன்முறைகள் தொடர்பாக எவரும் இதுவரை தண்டிக்கப்படவில்லை. MTV, Lanka *e* News, 'உதயன்' போன்ற ஊடக நிறுவனங்கள் மீண்டும் மீண்டும் தாக்குதல்களுக்கு உட்படுத்தப்பட்டன. அவற்றுக்குப் பொருட் சேதங்களும் பணியாளர்களுக்கு உயிர்ச்சேதமும் விளைவிக்கப் பட்டன. ஆனால், இன்றுவரை இப்படியான வன்முறைகள் தொடர்பாக நீதி கிடைக்கவில்லை. இந்நிறுவனங்களுக்கு எவ்வித நட்டஈடுகளும் வழங்கப்பட வில்லை. ஆகவே, அவற்றின் சேதங்களை மதிப்பிட்டு, இழப்பீடுகளை அந்த நிறுவனங்களுக்கு வழங்குவதற்கு இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும்.

எனது இந்த உரையில் என்னால் தெரிவிக்கப்பட்டவை ஊடகவியலாளர்கள்மீது மேற்கொள்ளப்பட்ட அநீதிகளில் ஒரு சில மட்டுமே! இலங்கையில் வேறு பல ஊடகவியலாளர்களும் கொல்லப்பட்டனர் என்பதையும் பலவித துன்பங்களுக்கு உட்படுத்தப்பட்டனர் என்பதையும் உயிர் அச்சம் காரணமாக நாட்டைவிட்டு வெளியேறிவிட்டனர் என்பதையும் நான் இங்கு சுட்டிக்காட்டாமல் இருக்க முடியாது. அவர்களில் சிங்கள ஊடகவியலாளர்களும் அடங்குகிறார்கள். சுனந்த தேசப்பிரிய போன்ற பிரபல சிங்கள ஊடகவியலாளர்கள் நாட்டுக்கு திரும்பிவந்து தமது பணியை ஆற்றக்கூடிய வகையிலான முழு ஊடக சுதந்திரம் இந்த நாட்டில் ஏற்படுத்தப்பட வேண்டும். ஏற்கெனவே, நான் குறிப்பிட்டது போன்று சுதந்திரமாகக் கருத்துக்களை வெளியிடும் ஊடகங்கள் மீது தாக்குதல்கள் நடத்தப்படுவதும் அவை தொடர்பாக எவரும் கைது செய்யப்படாமையும் இந்த நாட்டில் ஊடக சுதந்திரத்தைக்

கொலை செய்யும் நடவடிக்கைகளாகும். இவற்றின் பின்னால் கடந்த காலங்களில் அரச சார்பு அதிகாரபீடங்கள் இருந்தன. இந்த அரசாங்கத்தின் கீழ் அத்தகைய எந்தவொரு ஆதரவும் இருக்கக்கூடாதென நான் வலியுறுத்த விரும்புகின்றேன். குற்றவாளிகள் உங்கள் கட்சியை அல்லது கூட்டணியைச் சேர்ந்தவர்களாக இருந்தாலும் அவர்கள் தண்டிக்கப்பட வேண்டும்.

நாட்டின் ஏனைய சேவைத்துறையினரைப் போலவே ஊடகவியலாளர்களும் நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் பணிபுரிகிறார்கள். இன்னும் சொல்லப்போனால் தமது உயிர்களைப் பணயம் வைத்துப் பணிபுரிகிறார்கள். ஏதோ செய்திகளை எடுத்துப் பிரசுரித்துவிட்டு அல்லது வெளிப்படுத்தி விட்டு அவர்கள் சொகுசாக வாழ்க்கை நடத்துவதாக எவரும் நினைப்பார்களானால், அது மிகவும் தவறான ஒரு விடயமாகும். அன்றாட வாழ்வில் அவர்களும் மற்றவர்களைப் போலவே கஷ்டங்களை அனுபவிக்கின்றார்கள். அவர்களுக்கும் குடும்பங்கள் இருக்கின்றன; பிள்ளைகள் இருக்கின்றார்கள்; குடும்பப் பொறுப்புகள் இருக்கின்றன. வீட்டுப் பிரச்சினை, போக்குவரத்துப் பிரச்சினை என்று நிறையப் பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். அவர்கள் வெளியிடும் செய்திகள், கட்டுரைகள், படங்கள் போன்றவற்றுக்காக எத்தனையோ விதமான பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள்; ஆபத்துக்களைச் சந்திக்கின்றார்கள். இரவு. பகல் பார்க்காமல் உழைக்கின்றார்கள். சிலர் பல வேளைகளில் சரியான நேரத்தில் சாப்பிடாமல் ஒரு பணிஸ், ஒரு வடையைச் சாப்பிட்டு தேநீர், கோப்பியை அருந்திவிட்டு கடமை புரிகின்றார்கள். சிலவேளைகளில் அதிகாரிகளின் கோபம், படையினரின் தாக்குதல், பொலிஸாருடன் முறுகல் என தம் வாழ்க்கையை எப்போதும் ஆபத்துக்குள்ளாக்குகிறார்கள். இவைகளைக் கவனித்து அவர்களுக்கும் உதவிகளை அளிக்க வேண்டும்.

சகல வசதிகளையும் செய்துகொடுத்து நிறைவான அரச சம்பளமும் பெறும் அதிகாரிகளுக்கு அரசு வாகன இறக்குமதிக்கான permit கொடுக்கிறது. ஆனால், உயிரைப் பணயம் வைத்து மக்களுக்காகப் பணியாற்றும் ஊடகவியலாளர்களுக்கு அத்தகைய ஒன்றைக் கொடுப்பதற்கு அரசு ஏன், சிந்திக்கவில்லை? அவர்களுக்கும் அத்தகைய வாகன permit வழங்குவதுபற்றி கௌரவ நிதி அமைச்சர் அவர்கள் பரிசீலிக்க வேண்டும். இந்த நாட்டின் ஜனநாயகத்தைத் தாங்கிநிற்கும் நான்காவது தூண்களும் இந்த ஆட்சி மாற்றத்தைச் சாதகமாக்கிய பங்காளிகளுமான ஊடகவியலாளர்களையும் இந்த அரசு தனது அங்கமாகக் கருத வேண்டும். இதுவரையில் அது அப்படிச் செய்ததில்லை; இனியாவது அப்படிச் செய்யவேண்டும். தீர்வையற்ற வாகன இறக்குமதிக்கான permit ஊடகவியலாளர்களுக்கும் கிடைக்குமானால் அவர்களில் பெரும்பாலானவர்கள் வாகனங்களைக் கொள்வனவு செய்யக்கூடியதாக இருக்கும். ஆபத்து நேரங்களில் குறைந்தபட்சம் ஓடித் தப்பவாவது அது அவர்களுக்கு உதவியாக இருக்கும்.

வடக்கிலிருந்து ஒரு தொகுதி ஊடகவியலாளர்களை ரயிலில் தென் பகுதிக்கு அழைத்து வந்து சுற்றிக்காட்டுவதும் தெற்கிலிருந்து ஒரு தொகுதி ஊடகவியலாளர்களை வடக்குக்கு அழைத்துச் சென்று சுற்றிக்காட்டுவதும் மட்டும் ஊடகவியலாளர்கள்மீது அரசு காட்டும் கரிசனையாகிவிடாது. இவையெல்லாம் ஒருசிலரின் நன்மைக்கான நகர்வுகளாக மட்டுமே இருக்கும். எனவே, ஊடகவியலாளர்களின் அக மற்றும் புற வளர்ச்சிக்காக ஒருங்கமைக்கப்பட்ட திட்டம் ஒன்று தயாரிக்கப்பட்டுச் செயற்படுத்தப்பட வேண்டியது அவசியமாகும்.

கடந்த காலங்களில் கொழும்பிலுள்ள ஊடகவியலாளர்களுக்கென்று வீடு வழங்கும் திட்டங்கள் செயற்படுத்தப்பட்டுள்ளன. கொழும்பு ஊடகவியலாளர்களுக்கு மட்டுமன்றி அதேபோன்ற திட்டங்கள் வெளியூர் ஊடகவியலாளர்களுக்கும் பயன்படும்படியாக நடைமுறைப்படுத்தப்படுவது அவசியம். மடிக் கணனிகளும் புகைப்படக் கருவிகளும் அவசியம்தான். அதேபோல் வீட்டு வசதி, வாகன வசதி போன்ற விடயங்களுக்கும் ஊடகவியலாளர்களுக்கு நிதி வசதிகள் செய்து கொடுக்கப்பட வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up your speech now.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
Please give me one more minute, Sir.

இன்னொரு விடயம். அதாவது நாடு முழுவதிலுமுள்ள ஊடகவியலாளர்கள் தமது பணிகளில் ஈடுபடும்போது தாக்குதலுக்கு உள்ளாவது, விபத்துகளில் சிக்குவது போன்றவற்றுக்குப் போதிய பாதுகாப்பு அளிக்கும் வகையில் ஏற்பாடுகள் செய்யப்பட வேண்டும். அவ்வாறான சம்பவங்களில் உயிர் இழக்க நேரிடுமானால் அவர்களுக்கு மிக இலகுவாக நிதி வசதிகள் கிடைக்கும் வகையில் காப்புறுதித் திட்டம் ஒன்றை அறிமுகப்படுத்த வேண்டும் என நான் கேட்டுக்கொள்கின்றேன். இன்று நாட்டில் நடப்பவை யாவும் நாளைய தினம் பத்திரிகைகளிலும் ஏனைய ஊடகங்களிலும் வெளிவந்து விடுகின்றன. அதற்காக உழைக்கின்ற, இரவு பகல் பாராது பணியாற்றுகின்ற ஊடகவியலாளர்களை நாம் மறந்துவிடக்கூடாது என்பதைக் கூறிவைக்க விரும்புகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Megapolis and Western Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ රටේ ප්‍රධානතම අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ විවාදයට ගැනෙන අවස්ථාවේදී කථා කිරීමට ලැබීම පිළිබඳව සතුටු වනවා. විශේෂයෙන්ම, ප්‍රවාහන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට වර්ෂ හයකට ආසන්න කාලයක් මා කටයුතු කළ බවත් සිහිපත් කරනවා. අද විවාදයට ගනු ලබන මෙම ප්‍රධාන අමාත්‍යාංශ දෙක සඳහා නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාගේත්, අර්ජුන රණතුංග අමාත්‍යතුමාගේත්, ඒ වාගේම මාගේ සහෝදර නියෝජ්‍ය අමාත්‍යවරුන් විධියට නිශාන්ත මුතුහෙට්ටිගමගේ ඇමතිතුමාගේත්, අශෝක් අබේසිංහ ඇමතිතුමාගේත් සහයෝගය, දායකත්වය ඇතිව, දැනට තිබෙන අභියෝග මනාව හඳුනා ගෙන ඉතාම සාර්ථකව කටයුතු කර ගෙන යන බව අපි බොහොම

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා අපේ සම්පූර්ණ සහයෝගය, දායකත්වය ඒ වෙනුවෙන් ලබාදීමට කටයුතු කරනවාය කියන එකත් සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ දිනවල සහ මෙම විවාදය තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රධාන කරුණු කිහිපයක් පිළිබඳව කථා බහට ලක් වෙලා තිබෙනවා. ඉන් එකක් ත්‍රිරෝද රථ සම්බන්ධවයි. මේ පිළිබඳව විවිධ විවේචන, විවිධ ගැටලුකාරි තත්ත්ව තිබුණත්, අද අපේ රටේ ජනතාවට සැලකිය යුතු සේවයක් මෙම ත්‍රිරෝද රථවලින් ලැබෙනවාය කියන කාරණයත් අපි සඳහන් කරන්න ඕනෑ. අපේ රටේ මාර්ගවල සිදුවන රිය අනතුරු ගත්තාම, රිය අනතුරක් වෙලා වාහනවල හැප්පුණු අය පාරේ දමලා ගියාම, ඒ සියයට පනහකටත් වැඩි පිරිසක් ත්‍රිරෝද රථයකින් තමයි රෝහලට ගෙන යන්නේ. ඒ ආකාරයේ දැවැන්ත සේවයක් මේ ක්ෂේත්‍රයෙන් සිදු වෙනවාය කියන තැන ඉඳගෙන අපි මේ ප්‍රශ්නය ගැන කථා කරන්න ඕනෑ.

මේවා නියාමනය සහ නීති පැනවීම පිළිබඳව මේ දිනවල කථා බහට ලක් වෙනවා.

2002 අවුරුද්දේ මම බස්නාහිර පළාතේ ප්‍රවාහන අමාත්‍යවරයා විධියට කටයුතු කළ කාලයේ, අපේ රටේ ත්‍රිරෝද රථ තිබුණේ එක්ලක්ෂ තිස්තුන්දහසයි. ඒ කාලයේ ඒ ත්‍රිරෝද රථ ප්‍රමාණයත් ප්‍රශ්නයක් වෙලායි තිබුණේ. ත්‍රිරෝද රථ වැඩිවීම ඉදිරියේදී ප්‍රශ්නයක් බවට පත් වෙයි කියලා එදා අපි දැක්කා. අද මේ ප්‍රශ්නය බාහිර අයට පමණක් නොවෙයි, අද මේ කර්මාන්තයේ යෙදී ඉන්න අයටත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අද නගරයක ත්‍රිරෝද රථ තිබිය යුතු ස්ථානයකට රථ 10ක් අවශ්‍ය නම්, අද එවැනි ස්ථානයක ත්‍රිරෝද රථ 30ක් තිබෙනවා. මේ නිසා ප්‍රශ්න, ගැටලු රාශියක් ඇති වන බව අපි 2002දී දැක්කා. ඒ කාරණය දැකලා, බස්නාහිර පළාතේ ප්‍රවාහන අමාත්‍යවරයා විධියට එදා මම ත්‍රිරෝද රථ සම්බන්ධයෙන් ප්‍රඥප්තියක් ගෙනාවා. 2003 පෙබරවාරි මස 20වැනි දින, අංක 1276/15 දරන ගැසට් පත්‍රයේ අඩංගු එම ප්‍රඥප්තියේ විශේෂ කරුණු මා **සභාගත*** කරනවා.

2002.12.03වැනි දින අංක 06 දරන මාර්ගස්ථ ප්‍රවාහන ත්‍රිරෝද රථ සේවා ප්‍රඥප්තිය අපි නීතිගත කළා. නමුත් ඒ අවස්ථාවේ පැමිණි විවිධ බලපෑම් නිසා, යම් යම් නීතිමය ක්‍රියා මාර්ග නිසා එය ක්‍රියාවට නංවන්න ලැබුණේ නැහැ. එහි ප්‍රතිඵලය ලෙස එදා එක්ලක්ෂ තිස්තුන්දහසක්ව තිබුණු ත්‍රිරෝද රථ ප්‍රමාණය අද එකොළොස්ලක්ෂ තුන්දහස දක්වා වැඩි වෙලා තිබෙනවා. මේක සමාජ ප්‍රශ්නයක් බවටත් පත් වෙලා තිබෙනවා. එම නිසා අපි යෝජනා කරන්නේ, 2002 වසරේදී අප ක්‍රියාත්මක කරන්න උත්සාහ දැරූ ඒ වැඩ පිළිවෙළ, ඒ නීතිමය තත්ත්වය ඉතාම කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය අනිවාර්යෙන්ම යොමු කළ යුතු බවයි. එසේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීමකුත් විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී කරනවා.

ඒ වාගේම මෝටර් රථ වාහන දඩ පිළිබඳව අද රටේ විවිධ කතාබහ තිබෙනවා. අපට මෙහි තිබෙන හොඳ සහ නරක පැති පිළිබඳව කථා කරන්න පුළුවන්. හැබැයි, මෙසේ දඩ පනවනවා නම් අපි යෝජනා කරන්නේ, මේ දඩවලින් ලැබෙන ආදායම අනතුරු නිවාරණය සඳහා යෙදවිය යුතු බවයි. ප්‍රවාහන

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අමාත්‍යාංශයෙන් වෙන්න පුළුවන්, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් වෙන්න පුළුවන්, මේ සම්බන්ධයෙන් යොදන ප්‍රමුඛතාව ගැන සෑහීමකට පත් වන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

අපේ රටේ මාර්ග අනතුරු නිසා අවුරුද්දකට 2,800ක් විතර මියයනවා. 5,000ක් විතර ආබාධිත වෙනවා. ඒ වාගේම, රටට ආර්ථික වශයෙන් වාර්ෂිකව රුපියල් බිලියන 30ක විතර පාඩුවක් සිද්ධ වෙනවා. ඒ පාඩුවට වඩා, ඉතාම වටිනා තරුණ ජීවිත නැති වෙනවා. අපේ ශ්‍රම බළකායට ක්‍රියාකාරී දායකත්වයක් ලබාදෙන්න පුළුවන් සියයට 80ක විතර පිරිසක් තමයි මේ රිය අනතුරුවලින් මිය යන්නේ. එම නිසා විශේෂයෙන් මේ සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේත්, මහා මාර්ග අමාත්‍යාංශයේත් වැඩි අවධානයක් යොමු විය යුතුව තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරුන් 500ක් විතර ඉන්නවා. නමුත් මේ මාර්ග අනතුරු සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ඉංජිනේරුවරුන් තුන් දෙනෙක් විතරයි. ඒ වාගේම, ඒ සඳහා යොදවන මුදල ප්‍රමාණවත්වන්නේ නැහැ. ලෝකයේ අනෙක් රටවල මේ සම්බන්ධව වැඩි ප්‍රතිපාදනයක් සහ වැඩි වැදගත්කමක් ලබා දීමට කටයුතු කරනවා. මාර්ග සැලසුම් කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කරනවා. මාර්ග සැලසුම් කර ඉදිකිරීමට පෙර වෙනම පර්යේෂණ කරනවා. නමුත් අපි එවැනි තත්ත්වයකට තවම පා තබා නැහැ. එම නිසා දඩ ගැසීමෙන් පමණක් මේ කටයුත්ත අවම කර ගන්නට බලාපොරොත්තු වෙනවා වාගේම, රිය අනතුරු ඇති නොවීම සඳහා දැනට වඩා වැඩි අවධානයකින් කටයුතු කිරීමේ කාලෝචිත අවශ්‍යතාවක් අනිවාර්යයෙන්ම රට හමුවේ තිබෙනවාය කියන එක අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

වර්තමානයේ අපේ රටේ ප්‍රවාහනය පිළිබඳව කථා කරනවිට, පොදු ප්‍රවාහන පද්ධතිය පිළිබඳව දැනට වඩා වැඩි විශේෂ අවධානයක් අනිවාර්යයෙන්ම යොමු විය යුතුව තිබෙනවා. මේ පිළිබඳ ඉතිහාසයත් එක්ක බැලුවාම, පසු ගිය දශක ගණනාව තිස්සේම, විශේෂයෙන්ම 1977 වන තෙක්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු කනක හේරත් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා.

***අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, (மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* THE HON. KANAKA HERATH *took the Chair.*

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහනය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අමාත්‍යාංශය විධියට ගත යුතු තීන්දු තීරණවලට අමතරව, රටක් විධියට ජාතික වශයෙන් ඉහළ මට්ටමින් ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේ කාලෝචිත අවශ්‍යතාවයක් තිබෙනවාය කියන එක අපි අවබෝධ කරගත යුතුව තිබෙනවා. එහෙම නොවුණොත් අපේ රටේ මාර්ග තදබදය නිසා රටට සිදුවන ආර්ථික හානිය අපට ඉදිරි කාලයේදී දරා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අද කොළඹ නගරයේ වාහනයක සාමාන්‍ය

වේගය පැයට කිලෝ මීටර් දහයයි දොළහයි. මීට අවුරුදු දහයකට දොළහකට පෙර පැයට කිලෝමීටර් දාහතක් හැටියට තිබුණු එක තමයි අද දහය දොළහ බවට පත්වෙලා තිබෙන්නේ. 2020 වන විට අනිවාර්යයෙන්ම මෙය පැයට කිලෝ මීටර් පහක් හයක් බවට පත් වෙනවා.

මේක තමයි යථාර්ථය. මේ සම්බන්ධව පැහැදිලි තීන්දුවක් ගැනීම සඳහා අපි මේ සංඛ්‍යා ලේඛන කීපයක් අරගෙන බලමු. පෞද්ගලික වාහන වැඩි වීම අද රටට ඔරොත්තු දෙන්නේ නැහැ. විශේෂයෙන්ම කොළඹ නගරයට 2005 අවුරුද්දේ පෞද්ගලික වාහන ආවේ 160,000යි. එම පෞද්ගලික වාහනවලින් 210,000ක් මගීන් ඇවිල්ලා තිබෙනවා. බස් රථ 11,000ක් ආවා. 520,000ක් මගීන් බස් රථවලින් ආවා. දුම්රියෙන් මගීන් 100,000ක් ආවා. ඒ අනුව දෛනිකව කොළඹ නගරයට පැමිණියේ ජනතාව 830,000යි.

2015 අවුරුද්දේ මොකක්ද වෙලා තිබෙන්නේ? 160,000ක් වුණු පෞද්ගලික වාහන 260,000 දක්වා වැඩිවෙලා තිබෙනවා. බස් රථ ප්‍රමාණය එම ප්‍රමාණයමයි. බස් රථවලින් පැමිණෙන මගීන් ප්‍රමාණය 20,000ක්, 25,000ක් දක්වා අඩුවෙලා 500,000ක් බවට පත්වෙලා තිබෙනවා. දුම්රියෙන් පැමිණි ලක්ෂයක ප්‍රමාණය ඒ ආකාරයෙන්ම තිබෙනවා. 910,000ක් විතර ජනතාවක් දෛනිකව කොළඹ නගරයට පැමිණෙනවා.

ඊළඟට, අපි නුවර සංඛ්‍යා ලේඛන අනුව ගත්තොත් 2008 අවුරුද්දේ නුවරට දවසකට පෞද්ගලික වාහන 56,000ක් ආවා. එම පෞද්ගලික වාහනවලින් මගීන් 86,000ක් ආවා. හැබැයි, 2015 අවුරුද්දේ 120,000ත්, 160,000ත් අතර මගීන් ප්‍රමාණයක් දෛනිකව පැමිණ තිබෙනවා. බස් රථ 5,000ත්, 4,500ත් අතර ප්‍රමාණයක් නුවර නගරයට පැමිණෙනවා. රටේ ජනතාව ප්‍රවාහන අවශ්‍යතාව වෙනුවෙන් පෞද්ගලික යැයි කියන්නා වූ වාහනයක් ප්‍රයෝජනයට ගැනීමට අනිවාර්යයෙන්ම පෙළඹෙන බව මේකෙන් ඉතාමත් හොඳින් පැහැදිලි වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මේ කටයුත්ත හොඳයි. නමුත් රටක් හැටියට අපට මේකට එකඟ වෙන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. පසු ගිය අවුරුදු 10 තුළ අපේ රටේ මාර්ග හදන්නට කටයුතු කළා. ඒක හොඳ වැඩක්. එය නරකයි කියලා නොවෙයි මා කියන්නේ. මාර්ග හදන්න රුපියල් බිලියන 1,600ක්, 1,700ක් විතර වියදම් කරලා තිබෙනවා. නමුත් පොදු ප්‍රවාහනය වෙනුවෙන් මේ අවුරුදු 10ටම රුපියල් බිලියන 250ක්, රුපියල් බිලියන 300ක් විතර තමයි වියදම් කරලා තිබෙන්නේ. ඒවා ප්‍රාග්ධනය නොවෙයි.

විශේෂයෙන්ම සහනාධාර වැනි දේවල් ලබා දීම සඳහා ලංගමය, දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා වර්තමානයේදී මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දුවක් ගත යුතුයි. මේ අවුරුද්දේත් අපි ඒ දෙයම සිදු කරලා තිබෙනවා. ඒ අනුව මාර්ග සංවර්ධනය වෙනුවෙන් දැවැන්ත මුදලක් ලබා දීමට අපි මේ අවුරුද්දේත් කටයුතු කළත්, පොදු ප්‍රවාහන පද්ධතිය ගත් විට බස් රථ, දුම්රිය වෙනුවෙන් ලබා දීපු ප්‍රතිපාදන මුදල සම්බන්ධයෙන් කොහෙත්ම සෑහීමකට පත් වෙන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේ පිළිබඳව අපි ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දුවක් ගත්තේ නැත්නම් රටේ ප්‍රවාහනය පිළිබඳව ගැටලුකාරී ප්‍රශ්න රාශියකට තව අවුරුදු කීපයක් යන කොට අනිවාර්යයෙන්ම අපට මුහුණ දෙන්න සිදු වනවා. එම නිසා බස්නාහිර පළාතේ අපේ ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වෙලා, මේ ප්‍රශ්න හඳුනාගෙන සැබෑ ලෙසම මේ ප්‍රශ්නවලට මුහුණ දීම සඳහා අද සැලසුම් සකස් කරමින් තිබෙනවාය කියන එකත් අපි ඉතාම සතුටින් සඳහන් කරන්න ඕනෑ.

මේ කරුණු පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කරලා, අපේ රටේ පොදු ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීමට පියවර ගත යුතුයි.

මාර්ග හැදුවාට රථ වාහන තදබදයට විසඳුමක් ලැබෙන්නේ නැහැ. මාර්ග හැදුවාට රථ වාහන අනතුරුවලට විසඳුමක් ලැබෙන්නේ නැහැ. මාර්ග තදබදය අඩු කර ගැනීම තුළින් වඩාත් කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ලබා දීම සඳහා අනිවාර්යයෙන්ම ප්‍රතිපත්තිමය වශයෙන් කටයුතු කළ යුතුයි. ඒ අනුව අපේ රටේ බස් රථ සේවාව සහ දුම්රිය සේවාව සම්බන්ධයෙන් නවීන තාක්ෂණය පාවිච්චි කරමින් නවීන කාල සටහන් හඳුන්වා දීම කළ යුතුයි. වර්තමානයේ අවශ්‍යතාවන්වලට අනුව නැවත මාර්ග ස්ථාපිත කරලා, තමන්ගේ පෞද්ගලික වාහනයෙන් ලබා ගන්නා සේවය හා සමානම සේවයක් පොදු ප්‍රවාහන පද්ධතියෙන්ද ලබා ගත හැකි මට්ටමට බස් රථවල සහ දුම්රියේ ගුණාත්මක භාවය ඉහළ මට්ටමකට ගෙන ආ යුතුයි. ඕනෑම කෙනෙකුට තමන්ගේ පෞද්ගලික වාහනයෙන් සිය ප්‍රවාහන අවශ්‍යතාව සපුරා ගන්නවා වෙනුවට ඊටත් වඩා වැඩි කාර්යක්ෂම සේවයක් ලබා දීමට මේ තුළින් කටයුතු කිරීමෙන් පමණයි මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් අපට ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

**ගරු දිළුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රජය බලයට පත් වන්න, මේ රටට, ජනතාවට පොරොන්දු රාශියක් දුන්නා. ඒ අතරින් ප්‍රධාන එකක් තමයි ප්‍රවාහනයට අදාළව දුන්න පොරොන්දුව. ඒ කාලයේ රූපවාහිනී දැන්වීම්වලින් ප්‍රචාරය වුණේ මෝටර් සයිකලයෙන් යන අයට තෙමෙන්නේ නැතිව යන්න කාර් එකක් දෙන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමා රුපියල් 50,000ට දුන්න බයිසිකලය නොමිලයේ දෙන්න, එවැනි වාහන සිහිනයක් තරුණයන් තුළ ඇති කරලා බලයට පත් වුණු රජයක්.

අපේ හිතවත් ඇමතිතුමා නොවෙයි, නමුත් සමහර ඇමතිවරුන් අද කථා කරන කොට අපට හිතෙනවා, මේ දේවල් කරන්න ආණ්ඩුවක් ඕනෑද කියලා. අපි ඉස්සර හිටපු පසු ගිය

[ගරු දිළුම් අමුණුගම මහතා]

රජයේ ඒ ඇමතිවරුත් හිටියා. අපි දන්නා විධියට නම්, වාහන වැඩි වන විට පාරවල් වැඩියෙන් හදන්න ඕනෑ; වාහන වැඩි වන විට කැඩුණු පාරවල් කාපට් කරන්න ඕනෑ; ගමේ පාරවල් වැඩියෙන් හදන්න ඕනෑ; අධිවේගී මාර්ග හදන්න ඕනෑ කියන මතයයි එම රජයේ තිබුණේ. පරණ රජයේ ප්‍රතිපත්තිය වුණේ ඒකයි. අර ලසන්ත අලගියවන්න ඇමතිතුමා කිව්වා වාගේ, දකුණු අධිවේගී මාර්ගය හැදුවේ නැත්නම් පැයට කිලෝ මීටර් 10ක වේගයෙන් තමයි අද දකුණු පළාතටත් යන්න වෙන්නේ.

හැබැයි, අද රජයේ ඇමතිවරු කළ කථා අනුව අපට පෙනෙන්නට තිබුණේ, ඒ අයගේ ප්‍රතිපත්තිය වන්නේ, වාහන වැඩි නම් වාහන අඩු කරන්න ඕනෑ කියන එකයි. පාරවල් හදන්න අවශ්‍ය නැහැ කියන එකයි. ත්‍රීවීලර් වැඩියි කියලා කියනවා, අපි දැක්කා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා, මේ රටේ පෞද්ගලික බස් රථ වැඩියි කියලා. එතුමා තවම ගමට ගිහිල්ලා නැද්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලාගේ අපේ ගම්වලත්, ජනාධිපතිතුමාගේ ගමේ පොළොන්නරුවේත්, අපේ මුතුහෙට්ටිගම මැතිතුමාගේ පළාතේත් හවස හයෙන් පස්සේ මිනිස්සුන්ට ගෙවල්වලට යන්න බස් රථ ධාවනය වන්නේ නැති ප්‍රදේශ ඕනෑ තරම් තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමහර ගම්වල පාසල් දරුවෝ කිලෝ මීටර් 25 -30 බයිසිකලය පැදගෙන එනවා. කොළඹ - නුවර පාරේ, බදුල්ල - කොළඹ පාරේ බස් රථ වැඩි වෙන්න පුළුවන්. නමුත් අද මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. ඒකට අද මේ රජයේ විසඳුම තමයි බස් රථ වැඩි නම් අඩු කරන එක. "පාරවල් හදන්න ඕනෑ නැහැ; සැලසුමක් ඕනෑ නැහැ; යන විධියකට පලයන්" කියලා ඉන්නවා. ඒකට ආණ්ඩුවක් ඕනෑ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ත්‍රිරෝද රථ ගැන කථා කළා. මේ රටේ රජයේ බස් රථ, පෞද්ගලික බස් රථ සහ දුම්රිය කියන අංශ තුනටම වැඩියෙන් මඟීන් එහා මෙහා කරන්නේ ත්‍රිරෝද රථවලිනුයි. ඒක තමයි සංඛ්‍යාලේඛනවල ඇත්ත තත්ත්වය. ඒකෙන් ශ්‍රම බලකාය නැති වෙනවාය කියනවා. ඒක ඇත්ත. එක්තරා දුරකට අපිත් ඒක පිළිගන්නවා. හැබැයි, අපි පිළිගන්න ඕනෑ මේ රටේ ජනතාවගෙන් විශාල සංඛ්‍යාවක් මේ ක්ෂේත්‍රය හරහා රටට බරක් නොවී, ආදායමක් උත්පාදනය කර ගෙන ඒ අයගේ දරු පවුල් ජීවත් කරවන බව. ඒකට විසඳුමක් සොයන්නේ නැතිව ත්‍රිරෝද රථයට රියදුරු බලපත්‍රය දෙන වයස් සීමාව වැඩි කරලා, නැත්නම් ලීසිං එක සියයට 25ක් කරලා ත්‍රිරෝද රථය ගන්න එක නතර කළාම ත්‍රිරෝද රථ රියදුරන් බිහි වන එක අඩු වෙයි; පාරේ ත්‍රිරෝද රථ අඩුවෙයි. හැබැයි, ගෙදරක බඩුවක්- මුට්ටුවක් පරෙස්සම් කර ගන්න බැරි වන කාලය වැඩි ඈතක නොවෙයි. වත්තක කෙසෙල් කැනක් පරෙස්සම් කර ගන්න ලැබෙන්නේ නැහැ. ගහක් කොළක් පරෙස්සම් කර ගන්න ලැබෙන්නේ නැහැ. අඩුම තරමින් ත්‍රිරෝද රථයක් දුවලා හරි ජීවත් වන ඒ තරුණයාට ඊළඟට සිදු වන්නේ කුඩු, ගංජා, කසිප්පු විකුණන්න, නැත්නම් සොරකම් කරන්නයි. ඒ නිසා මේ රජය දිගින් දිගටම ලබා දෙන විසඳුම් සහ තීන්දු කැකිල්ලේ රජ්ජුරුවන්ගේ තීන්දු බවයි අපට පෙනෙන්නේ.

පසුගිය කාලයේ අපි දැක්කා, ත්‍රිරෝද රථ වැඩි වුණාට, බස් රථ වැඩියි කිව්වාට, ඇමතිවරුන්ගේ - සියලු දෙනාගේම නොවෙයි- ප්‍රවාහන පහසුකම් මේ වන විට ඉතාම උසස් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඊයේ දිනය වන විට ඇමතිවරුන් සඳහා වාහන මිලදී ගන්න තව රුපියල් කෝටි 27ක පරිපූරක ඇස්තමේන්තුවක් දැම්මා. හෙට අනිද්දාට කවුරු හරි කියන්න බැරි නැහැ, පාරවල ඇමතිවරුන්ගේ වාහනත් වැඩියි, ඒ නිසා ඒවාත් අඩු කරන්නය කියලා. මේ සඳහා මුදල් වැය කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝච්චියට හැපුණු මෝටර් රථය ගැන ප්‍රවාහන ඇමතිතුමා ඉතාම දුකෙන් කථා කළා. අපටත් දුකයි. හැබැයි, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග දෙදහස් ගණනක් තිබෙනවාය කියනවා. මා දන්නා තරමට ඒවාට ගේට්ටු දමන්න රුපියල් කෝටි 27ක් වැය වෙන්න විධියක් නැහැ. නමුත් එතුමාවත්, වෙනත් ඇමතිවරයකුවත් ඒ සඳහා මේ පාර්ලිමේන්තුවට පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනෙන්න කථා කරනවා අපි දැක්කේ නැහැ. ඒ පරිපූරක ඇස්තමේන්තුව ගෙනෙන්න, අපිත් අත උස්සලා ඡන්දය දෙන්නම්. අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලට ගේට්ටු ටික දමන්න.

දුම්රිය ගේට්ටුවෙන් රිංගන කෙනෙකුට රුපියල් 25,000ක දඩයක් ගහන්න කථා කරනවා මිසක්, දුම්රිය ගේට්ටු සවි කරන්න අපේ ඇමතිවරුන්ට අදහසක් මතු වෙලා නැහැ. නමුත්, තමන්ගේ ප්‍රවාහන පහසුකම් ගැන කථා කරනවා.

අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, four-wheel drive වාහන නැත්නම් ඇට දිරනවා, ඒ පැත්තේ කඳු තිබෙන නිසා යන්න බැහැයි කියලා. හැබැයි, මේ යන තත්ත්වයේ හැටියට four-wheel drive වාහනවල ඇමතුමන්ලා යවලා, තව ටිකක් දවස් යනකොට ජනතාව ගොන් කරත්තයේ යවන තත්ත්වයක් තමයි මතු වෙන්නේ කියන කාරණය අපට මතක් කරන්න වෙනවා. අර සිහිනය මැව්වා විතරක් නොවෙයි, අද පෞද්ගලික ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තාමත්, හැම අතින්ම ඒ අයට පහර දෙනවා. වැරදි කරන්න ඉඩ දීලා දඩය අඩු කරන්න කියනවා නොවෙයි. නමුත් අපි නම් අහලා තිබෙන්නේ, ලෝකයේ රටවල දඩ නියම කරන්නේ ඒ රටේ ඒක පුද්ගල ආදායම අනුව කියලායි. හැබැයි, අද මේ ගහලා තිබෙන දඩ අනුව පෞද්ගලික බස් කොම්පැනි අයිතිකාරයෙකුට එක දඩයක් වැදුණොත්- අපි දන්නවා රියැදුරෙකුගේ දිනක වැටුප උපරිමයෙන්ම රුපියල් 1,500යි- රුපියල් 2,000යි කියලා. ඒ ලැබෙන වැටුපෙන් රුපියල් 25,000ක දඩයක් ගෙවන්න බැහැ. වැරැද්දක් කර හෝ නොකර දඩයකට අහු වුණොත්, පොලිස් නිලධාරියාගේ අනුමැතිය අනුව 25,000ක් ගෙවන්න වුණොත් ඒ බස් රථයේ මාසික ෆිනෑන්ස් වාරිකය ගෙවීමට තිබෙන මුදල් ඔහුට නැති වෙනවා. ඒ අනුව, එම බස් කොම්පැනිය දඩ දෙක, තුනකට අහු වුණොත් වැඩි කාලයක් යන්න කලින් ඒක වහලා දාන්න සිදු වනවා. ඒ විතරක් නොවෙයි ඩීසල් ෆිල්ටර් එකේ ඉඳලා, ටයර් එකේ ඉඳලා, ඇණ මුරිච්චියේ, brake fluid කෑන් එකට පවා VAT ගහනවා. කඩයකට ගිහිල්ලා තේ එකක් බිව්වොත් ඒකටත් VAT එක ගහනවා. ඒ වාගේම, අනෙක් පැත්තෙන් ආදායම් බදුවලින් පන්නනවා. දඩවලින් රුපියල් 25,000-රුපියල් 30,000 අය කර ගන්නවා. මෙමඟින්, කුඩා ව්‍යාපාර -කුඩා රැකියා- කරන අය පහතට දැමීමේ වැඩ පිළිවෙළක් මෙම රජය විසින් ක්‍රියාත්මක කරනු ලබනවා. මම හිතන්නේ නැහැ, ඒක චුවමනාවෙන් කරනවා කියලා. නමුත්, එහි අවසාන ප්‍රතිඵලය වන්නේ ඒකයි කියන කාරණය අපට කනගාටුවෙන් වුණත් කියන්න සිදු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මත්තල ගුවන් තොටුපොළ, හම්බන්තොට වරාය ගැන කථා කෙරුණා. පසු ගිය කාලයේ පැවැති මැතිවරණ වේදිකාවල මේ සම්බන්ධයෙන් කථා කළා. ඒකට ගරු ලසන්ත අලගියවන්න ඇමතිතුමාත් ඉන්නවා, ඒ අය සාක්ෂි දරනවා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන චෝදනාව අනුව මහින්ද රාජපක්ෂ මහත්තයා කරපු ලොකුම විනාශය වූයේ මේ රටට මත්තල ගුවන් තොටුපොළක් හදපු එකයි. ඒ වාගේම එතුමා මේ රටට කරපු ලොකුම වින්නැහිය වන්නේ, හම්බන්තොට වරාය හදපු එක බවයි ඒ අය කිව්වේ. තුන්වැනි චෝදනාව තමයි Colombo Port City ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. එතුමා මෙරටින් අක්කර 5,000ක් චීනයට විකුණනවා, මේ රට චීන කොලනියක් බවට පත් වෙනවා කියලා චෝදනා කළා. ඉතින්, මේවා තමයි

තිබුණු ප්‍රධාන චෝදනා. හැබැයි, දෙතුන් ගොල්ලොන්ම හවුල් වුණත් අද එක ව්‍යාපෘතියක් අලුතෙන් පටන් ගන්න බැරි වෙලා තිබෙනවා. වරාය විකුණන්න යනවාය කියද්දී අපේ අර්ජුන රණතුංග මැතිතුමා කිව්වා, වරාය විකුණන්නේ නැහැයි කියලා. අපි එතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු ඇමතිතුමනි, එහෙම කරන්න දෙන්න එපා. හැබැයි, අද යන්තමින් හරි ජාමේ බේරා ගන්න ඒවායේ පිහිට තමයි - හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ සහ Port City එකේ පිහිට තමයි- අද මේ රජයට පතන්න වෙලා තිබෙන්නේ කියන කාරණයත් අපට මතක් කරන්න වනවා. අර්ජුන රණතුංග මැතිතුමාත් මේවායේ තිබෙන ණය සහ ඒ වියදම් පිළිබඳව බොහොම පැහැදිලිව සඳහන් කළා. ඒක අපි දන්නවා. හැබැයි, විශේෂයෙන්ම අපි සංඛ්‍යාලේඛන අනුව ගත්තොත්- ගරු අමාත්‍යතුමනි, මෙම සංඛ්‍යාලේඛන වැරදි නම් මාව නිවැරදි කරන්න.- මත්තල ගුවන් තොටුපොළ සාදා නිම කරන්න රුපියල් බිලියන 27ක් ද, හම්බන්තොට වරාය සාදා නිම කරන්න රුපියල් බිලියන 43ක් ද, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය සඳහා රුපියල් බිලියන 35ක් සහ පිටත වටරවුම් මාර්ගය සඳහා රුපියල් බිලියන 40ක් ආදී වශයෙන් තමයි අපට පසු ගිය කාලයේ වැය වෙලා තිබෙන්නේ. මේ ගරු සභාවට ඉදිරිපත් කළ කෝප් වාර්තාවෙන් මහ බැංකුවේ සිදු වූ වංචාව ගැන සනාථ වුණා. ඒක අපි කියන දෙයක් නොවෙයි. "කෝප්" එකේ සභාපතිතුමා වන ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ඊයේ-පෙරේදා පාර්ලිමේන්තුවේදී ඒ වාර්තාව සහිත පොත් මිටියක් අපට බෙදුවා. ඒ අනුව බොහොම පැහැදිලියි, මේ වංචාව නිසා රුපියල් බිලියන 145ක් රජයට පාඩු වෙලා තිබෙනවා කියලා. මම ඉහත කියපු සියලුම ව්‍යාපෘති අවසාන කරන්න අපට වියදම් වෙලා තිබෙන්නෙත් රුපියල් බිලියන 145යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 5ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු දිළුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
මත්තල ගුවන් තොටුපොළ, හම්බන්තොට වරාය, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය, පිටත වටරවුම් මාර්ගය ඉදි කරන්න ගිය හා සමාන මුදලක් මේ බැඳුම්කර වංචාව නිසා අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා අපි කිසිසේත්ම පිළිගන්න සූදානම් නැහැ, මේ ව්‍යාපෘතිවලට ණය ගත්ත නිසායි මේවා පිටුපසට ගියේ කියන කාරණය. දැන්, three wheelers වැඩියි කියලා කියනවා. Three wheelers අඩු කරන්න යන්නේ නැතිව, මේ මුදල් උපයෝගී කරගෙන පාරවල් වැඩි කරන්න. අපි අර්ජුන රණතුංග ඇමතිතුමාට කියන්න කැමැතියි, හොඳම ආයෝජකතුමා අර්ජුන් මහේන්ද්‍රන් මහත්තයා කියලා. මොකද, එතුමාගේ අතේ රුපියල් බිලියන 145ක් තිබෙනවා. එතුමා ස්වර්ණවාහිනිය මිලදී ගන්න සූදානම් වෙනවා.

එතුමා පුවත් පතක් අලුතින් ආරම්භ කරන්න සූදානම් වෙනවා, නායකතුමා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා. ඒ නිසා වරාය සඳහා එතුමා ආයෝජකයකු හැටියට තෝරා ගැනීම ඔබතුමාට හොඳ විසඳුමක් වේවි කියන කාරණයත් මා මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන් පසු ගිය කාලයේ මත්තල ගුවන් තොටුපොළ තුළ වී දාලා තිබුණා. නමුත්, අපි සතුටු වෙනවා ගරු ඇමතිතුමා අද හෝ යම් දැක්මක් ඇතිව මේක විකුණන්නේ නැහැයි කියලා කියන එක ගැන. නමුත්, අපි දන්නේ නැහැ එතුමන්ලා කුමන තීරණයක් ගනීවිද කියා. අපි ඉල්ලීමක් කරනවා, මේක විකුණන්න එපා, වෙන නමක් භාවිත කරලා හෝ පවත්වාගෙන යන්නය කියා.

අනෙක් කාරණය තමයි, මේ පාර්ලිමේන්තුවට මේ වාගේ ප්‍රශ්න ගණනාවක් විසඳා ගන්න පුළුවන්කම තිබුණු රුපියල් බිලියන 145ක් වාගේ මුදලක් අහිමි කරපු, ඒ වංචාවට සම්බන්ධ ආයතනය පිළිබඳ කිසිම ක්‍රියා මාර්ගයක් නොගෙන සිටීම. අද දිනයේ ජනමාධ්‍ය සම්බන්ධයෙනුත් සාකච්ඡාවට ගැනෙන නිසා ඒ ගැනත් වචනයක් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමා සභාවේ නොමැති වුණත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, TNA එකේ ගරු සරවනපවන් මන්ත්‍රීතුමා සඳහන් කළා, මාධ්‍ය මර්දනයක් තවමත් සිද්ධ වෙනවා කියලා. හැබැයි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත් මතු කළ ආකාරයට පසුගිය කාලය ගත්තාම, CSN රූපවාහිනී නාලිකාවේ -ඒකේ අයිතිකාරයා කවුද, කින්ද මන්ද කියන එක පිළිබඳව නොවෙයි අපි කථා කරන්නේ- අයිතිකාරයා රාජපක්ෂ පවුලේ වීමේ පලියට සහ නොයෙකුත් කරුණු කාරණා මත පරීක්ෂණයක් නොකර, ඒක ඇවර කරන්න කටයුතු කළා. අපි දැක්කා, ශාන් වික්‍රමසිංහ මැතිතුමා - TNL එකේ සභාපතිතුමා - ප්‍රසිද්ධියේ මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා කිව්වා, "මේ කාල සීමාවේ මාධ්‍ය නිදහස තිබෙනවා" කියලා.

අද වන කොට CSN එක විතරක් නොවෙයි, ජනාධිපතිතුමාගේ කථාව විකෘති කෙරුවායි කියලා චෝදනා කරමින් "දෙරණ" නාලිකාව ඇවර කරන්නත් උත්සාහ කරනවා, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාය කියන නිලධාරියා. දිගින් දිගටම ලිපි යවනවා, තර්ජනය කරනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රැස්වීම් පෙන්නුවාට කමක් නැහැ, සෙනඟ පෙන්වන්න එපායි කියනවා, රැස්වීමේ කරන කථාව පෙන්නුවාට කමක් නැහැ, සෙනඟ ඉන්න පැත්ත පෙන්වන්න එපායි කියනවා. ජනාධිපතිතුමාටයි, අගමැතිතුමාටයි සියයට 70යි, අනෙක් අයට සියයට 40ක් පෙන්වන්න කියලා තර්ජනය කරනවා. එහෙම නොකරනවා නම් තහනම් කරන්න කටයුතු කරනවාය කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අධිකරණයේ කටයුතුවලට අභියෝග කරන්නේ නැහැ. නමුත්, ඔබතුමන්ලා දන්නවා, "lankaenews.com" කියන වෙබ් අඩවිය කිසිසේත් අපට සහය දීපු ආයතනයක් නොවෙයි කියන එක. ගරු ජනමාධ්‍ය ඇමතිතුමා එයට සාක්ෂි දරනවා ඇති. ඒ ආයතනය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයට සහ ඒ කාලයේ අපේ මැතිඇමතිවරුන්ට එරෙහිව පොදුවේ සහ පෞද්ගලිකව එළව එළවා මඩ ප්‍රහාර එල්ල කළ ආයතනයක්. නමුත්, ඒ කාල සීමාව තුළ ඒ සඳහා බලපෑමක් කළේ නැහැ. හැබැයි, ඒ ආයතන පාවිච්චි කරමින් එදා පැවැති රජයට ගහලා, අද නැවතත් ඒ ආයතන ඒ ප්‍රතිපත්තියම අනුගමනය කරන කොට උසාවි යන්න, Interpol එක හරහා ඒ අය අත්අඩංගුවට ගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, "lankanewsweb.com.today" කියන එක තහනම් කරලා තිබෙනවා. Facebook වෙබ් අඩවි රැසක් මේ වන කොට තහනම් කරගෙන යනවා. හඩ්සන් සමරසිංහ මැතිතුමා කරගෙන ගිය VIP රේඩියෝ වැඩසටහන දුරකථන ඇමතුම් දීලා තර්ජනය කරලා නතර කෙරුවා. මේ ආකාරයෙන් තමයි අද මාධ්‍ය මර්දනය ක්‍රියාත්මක වෙන්නේ.

අපි දැක්කා, පසු ගිය කාලයේ ප්‍රගීත් එක්නැලිගොඩ මහත්මයා අතුරුදන් වීම සම්බන්ධයෙන් බුද්ධි අංශයේ නිලධාරීන් ගෙන

[ගරු දිළුම් අමුණුගම මහතා]

ගොස් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තැබුවා. ඊයේ දිනය ගත්තාමත්, අද උතුරේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් රණ විරුවන් කරලා, යුද හමුදා සෙබළුන් ත්‍රස්තවාදීන් කර තිබෙන බවක් පෙනෙනවා. යුද හමුදා සෙබළුන් ත්‍රස්තවාදීන් කරලා ඇතුළට දමනවා. ඊයේ දිනයේ එල්ටීටීඊ රණ විරුවන් සඳහා උත්සව පවත්වන්න අවස්ථාව උදා කර තිබෙනවා.

අවසාන වශයෙන් මා තව කාරණයක් කියන්න කැමැතියි, අපේ ගරු මැතිඇමතිතුමන්ලාට නොවෙයි, මාධ්‍ය ආයතනවලට. ඒ අයගෙන් අපි අහන්න කැමැතියි, උතුර කියන්නේ අද වෙනම රටක්ද කියලා. ඊයේ දිනයේ සිදු වුණු සිදුවීම්, පසු ගිය සතිය තුළ සිදු වුණු සිදුවීම් අද වාර්තා නොකරන්නේ, උතුර එහෙම නැත්නම් අනුරාධපුරයෙන් එහා වෙනම රටක් හැටියටද මාධ්‍ය ආයතන සලකන්නේ කියන එක අපි අහන්න කැමැතියි. නැති නම් දකුණට මේවා වාර්තා කරන්න එපා කියලා ඒ අයට යම් වාරණයක් තිබෙනවාද කියන එකත් අපි අහනවා. අපි දැක්කා, ඊයේ දිනයේ පැවති රැස්වීම්, අපි දැක්කා ඒ පැවති සමරු උත්සව. "තවම මේ අය මැරිලා නැහැ. මේ අය ආපසු නැඟිටිනවා" කියලා ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කියනවා අපි දැක්කා. ඒ නිසා මේ මාධ්‍ය ආයතන වගකීමෙන් යුතුව වාර්තා කිරීමේ කාර්ය භාරය ඉෂ්ට කළ යුතුයි කාරණය මතක් කරමින් මට කාලය වෙන් කර දීම සම්බන්ධව ස්තුතිය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු එච්.එම්.එම්. හරීස් නියෝජ්‍ය අමාත්‍යතුමා.

[பி.ப. 4.58]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ் - விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)
(The Hon. H.M.M. Harees - Deputy Minister of Sports)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள், போக்கு வரத்து மற்றும் சிவில் விமான சேவைகள், பாராளுமன்ற மறுசீரமைப்பு, மற்றும் ஊடகத்துறை ஆகிய அமைச்சுக்களின் நிதி ஒதுக்கீடுகள் மீதான வரவு செலவுத் திட்டக் குழுநிலை விவாதங்களில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடை கின்றேன். உண்மையில் போக்குவரத்துத் துறையை எடுத்துக்கொண்டால், எமது நாடு வரலாற்றில் என்றுமில்லாத அளவுக்கு அதில் பெரும் முன்னேற்றம் அடைந்துள்ளது. அந்த வகையில் அதிவேகப் பாதைகளும் வேகமான ரயில் கட்டமைப்புக்களும் தாராளமான பஸ் போக்குவரத்து வசதிகளும் ஏற்படுத்தப்பட்டிருக்கின்றன.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிழக்கு மாகாண மானது, இந்த நாட்டின் பொருளாதார மேம்பாட்டுக்கான கைத்தொழில், விவசாயம், மீன்பிடி, சுற்றுலா, கனிய மணல் போன்ற பல்வேறு வளங்களைக் கொண்டுள்ளது. கடந்த 40 வருட கால யுத்தம், சுனாமி அனர்த்தம் போன்றவற்றால் இந்த மாகாணம் பாதிக்கப்பட்டுள்ள அதேநேரம், போக்குவரத்து வசதிகள் அங்கு மிகவும் பின்தங்கிய நிலையிலேயே காணப்படுகின்றன. அதிவேகப் பாதைகள் இல்லை. அதே போன்று ரயில் போக்குவரத்தை எடுத்துக்கொண்டால், கொழும்பிலிருந்து மட்டக்களப்பு நகர் வரையும்தான் ரயில் சேவை இருக்கின்றது. கிழக்கு மாகாணத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் சேவையை நீடிக்குமாறு கடந்த 50 வருட காலமாகப் பலமுறை வேண்டிக் கொண்டபோதிலும் இதுவரை அதற்கான நடவடிக்கை எடுக்கப்படவில்லை. குறிப்பாக மட்டக்களப்பிலிருந்து பொத்துவில்-அறுகம்பை சுற்றுலாநகர் வரை இந்த ரயில் சேவையை நீடிக்க வேண்டும் என்று அந்த மக்கள் வேண்டிக்கொள்கின்றனர்.

போக்குவரத்துத்துறை அமைச்சர் அவர்களும் பிரதி அமைச்சர் அவர்களும் இங்கு இருக்கின்ற இவ்வேளையில் அவர்களிடம் நான் ஒரு விடயத்தை வேண்டிக்கொள்ள விரும்புகின்றேன். அதாவது கிழக்கு மாகாணத்துக்கான இலங் கைப் போக்குவரத்துச் சபையின் தலைமைக் காரியாலயம் கடந்த 40 வருடங்களுக்கு மேலாக கல்முனை நகரில் இயங்கிக் கொண்டிருக்கின்றது. ஆனால், இதற்கான நிரந்தரக் கட்டிடம் இதுவரை அமைக்கப்படவில்லை. அதேவேளை அதற்கான காணிகளைத் தாராளமாக வழங்குவதற்குப் பிரதேச செயலகம் தயாராக இருக்கின்றது. ஆகவே, 2017 ஜனவரியிலாவது போதுமானவளவு நிதியை ஒதுக்கீடு செய்து அதற்கான நிரந்தரக் கட்டிடத்தை அமைத்துத்தரும்படி இந்த இடத்தில் கௌரவ அமைச்சர்களிடம் வேண்டிக்கொள்கின்றேன்.

වරාය හා නාවික කටයුතු අමාත්‍ය ගරු අර්ජුන රණතුංග මැතිතුමනි, ඔලුවිල් වරාය ප්‍රශ්නය ගැන ටිකක් කථා කරන්න ඕනෑ. මේ අවස්ථාවේදී ඔලුවිල් වරාය පිළිබඳ අලුත් ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා. බෝට්ටු ඇතුළු වෙන මාර්ගයේ පස් පිරිලා බෝට්ටු 600කට වැඩිය මුහුදට යන්න බැරුව හිර වෙලා තිබෙනවා. ඒ නිසා ධීවරයෝ සති දෙකක් තිස්සේ රැකියා නැති ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. මේ වරාය ගැන ගිය සතියේ මම ඔබතුමාට mobile phone එකෙන් කථා කළා. ඔබතුමාගේ Chief Engineerටත් කථා කළා. මේ නිසා ධීවරයන් 9,000කට වැඩි පිරිසකට රැකියා නැතුව දැන් ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා තිබෙනවා. දවස් දෙකකට කලින් ඒ ගොල්ලන් ගරු රවුෆ් හකීම් ඇමතිතුමා හා මා හම්බ වෙලා, මේ පිළිබඳව උද්ඝෝෂණයක් කරන්න ඕනෑ කියලා ඉල්ලා සිටියා. අපි දෙන්නාම මැදිහත් වෙලා ඒක නැවැත්තුවා. ඔබතුමාට කථා කරලා වහාම කටයුතු කරනවා කියලා අපි කිව්වා. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක්. ඔලුවිල් වරාය පාලනය කරන්නේ වරාය අධිකාරියයි. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා, මේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, පස් අයින් කරන යන්ත්‍රය -Dredger යන්ත්‍රය- වහාම යවන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ඒ වාගේම වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ ඒ වෙනුවෙන් කථා කිරීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. අද ප්‍රවාහන ක්ෂේත්‍රය දරුණු තැනකට ඇද වැටිලා තිබෙනවා. අපි එහෙම කියන්නේ මේ කාරණය නිසායි. මේ අය වැය තුළ තිබුණේ වැඩිම හරියක් බදු අය කිරීම්, දඩ ගැසීම් සහ ණය පියවා ගැනීම්. ඉදිරි දැක්මක්, ඉදිරි සංවර්ධනයක්, සංවර්ධනය වෙලා තිබුණු යම් යම් කාරණා නැවත සංවර්ධන ක්‍රියාවලියට යොදවා ගැනීමක් අපි දැක්කේ නැහැ. අය වැයේ දඩ ගැසීමේ කොටස නිසා මේ වෙද්දී රථ වාහන පාවිච්චි කරපු උදවිය -යාන-වාහන පාවිච්චි කරපු උදවිය - ඒවා තමන්ගේ ගෙවල්වල ඉබි යතුරු දාලා පැත්තකට කරලා තිබෙනවා. ඒ අයට අද වාහනය පාරට දා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

අද මම දැක්කා, නාරාහේන්පිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ -නාරාහේන්පිට RMV එකේ- විශාල තදබදයක් තිබෙන බව. දහ පහළොස්දාහක් විතර ජනතාව එහි රැඳී සිටියා. තමන්ගේ වාහනයේ ලියාපදිංචි අයිතිය වෙනත් අයිතිකරුවෙකුට තිබුණා නම් මේ මාසයේ 30වැනි දාට කලින් ඒක තමන්ගේ නමට හරවා ගැනීම සඳහා මහා කලබලයක් කරනවා. එහෙම වැඩ පිළිවෙළක් මේ අය වැයේ තිබුණේ නැහැ. නමුත් ඒක අර්ථකථනය කරලා ජනතාවට තේරුම් කරලා දෙන්න මුදල් ඇමතිවරයා හෝ ප්‍රවාහන අමාත්‍යාංශයේ කිසිදු පුද්ගලයෙකු මේ වෙන කල් කටයුතු කරලා නැහැ. රජයට කෙසේ හෝ වුවමනාව තිබෙන්නේ, බදු ගහලා, දඩ ගහලා, මිනිසුන් තළා පෙළා මේ රාජ්‍ය පාලනය කරන්නයි. මේ වාගේ දේවල්වලින් අපට පෙනෙන්නේ ඒකයි. මාධ්‍ය මර්දනය කරනවා. දේශපාලනඥයන් මර්දනය කරනවා. ඒ සියල්ල කරද්දී අහිංසක දුගී දුප්පත් ජනතාව මර්දනය කරන තැනට අද රජය ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහනය ක්ෂේත්‍රය ගැන කථා කරද්දී ඔබතුමාට මේ කාරණය කියන්න ඕනෑ. රුපියල් 20ට, 25ට තිබුණු දඩය රුපියල් 2,500 වුණාම, ඒ ගැන සාකච්ඡා කරන්න අපේ නිලධාරින් ගියාම, සංගම්වල උදවිය ගියාම ඒ අයට ටොෆියක්, බුල්ටෝ එකක් දීලා, ආණ්ඩුව කිසිම වග විභාගයක් නැතුව ඒ දඩය 25,000 දක්වා වර්ධනය කරන්න -වැඩි කරන්න- කටයුතු කරගෙන යනවා. අමාත්‍යතුමාට මේක නිවැරදි කර ගන්න කල් තියේවි. අපේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය ඇමතිතුමා මේ ස්ථානයේ ඉන්නවා. එතුමා මේවා අහගෙන ඉඳලා මේ ගැන කටයුතු කරයි. ඔබතුමන්ලාගේ ඉල්ලීමට මුදල් ඇමතිතුමා එහෙම කෙරුවාද කියලා කියන්න අපි දන්නේ නැහැ. නමුත් මා හිතන විධියට මේ කටයුත්ත අද රටට දැනෙමින් තිබෙනවා. බස් සංගම්වල උදවිය, කුඩා වාහන තියාගෙන පාසල් සේවයේ යෙදෙන උදවිය, ත්‍රිරෝද රථ රියැදුරන්, යතුරුපැදිකරුවන් ඇතුළු සියලුදෙන එය දැනී තිබෙනවා. සමහර තැනැත්තෙකුගේ යතුරුපැදියේ වටිනාකම රුපියල් හාරපන්දහසකට වැඩි වන්නේ නැහැ. එවැනි වටිනාකමින් යුත් යතුරුපැදිත් අද තිබෙනවා. බොහොම දුක් මහන්සියෙන් හම්බ කරගෙන, රුපියල් හත්අටදාහක් දීලා යතුරුපැදියක් ගත් මනුස්සයෙකුට ඉර කැපුවා, වමෙන් ගියා කියා, එහෙම නැත්නම් වෙනත් මොකක් හෝ හේතුවක් නිසා රුපියල් 25,000ක විතර දඩයක් ගැහුවාම මම හිතන්නේ ආණ්ඩුවට හරි සනීපයි! මේ විධියට ජනතාව තළා පෙළා බදු අය කරන එක ගැන විරෝධතාවක් මේ අය වැය සම්බන්ධයෙන් අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිවිල් ගුවන් සේවය ගැනත් අපි කථා කරන්න ඕනෑ. අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ අපට බොහොම ආසන්නව තිබෙන ගුවන් තොටුපොළ මඟින් ඒ ප්‍රදේශයට, රටට විශාල කාර්ය භාරයක්, විශාල සේවාවක් ඉටු වනවා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථා ලැබෙන වැඩ පිළිවෙළකුත් එතැන තිබුණා. එය නියමාකාරයෙන් කරගෙන ආවා. ඒ වැඩ පිළිවෙළ කරගෙන එද්දී මත්තලට තවත් ගුවන් තොටුපොළක් ඇති වුණාම අපි සතුටු වුණා, "අපට ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් දෙකක් තිබෙනවා. කුමක් හෝ හදිස්සියක් වුණාම ඒ ගුවන් තොටුපොළ පාවිච්චි කරන්න පුළුවන්" කියා. හැබැයි අගමැතිතුමාට තිබුණේ, "ඒ ගුවන් තොටුපොළ කිසි දෙයකට වැඩක් නැහැ. ඒක වුවමනා කරන්නේ වී ටිකක් ගබඩා කරන්න විතරයි. ඒ නිසා ඒක වැඩකට ගන්නේ නැහැ" කියන සංකල්පයයි. ඒ සංකල්පයේයි එතුමා සිටියේ. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද කටුනායක ගුවන් තොටුපොළේ ගුවන් පථය -runway- නඩත්තු කරන වෙලාවේ රජය ඒ ගුවන් සමාගම්වලට දැනුම් දෙනවා, ඒ ගුවන් සමාගම්වලට කථා කරලා කියනවා, "මෙහි මෙහෙයුම් කටයුතු සිදු වන්නේ රාත්‍රියේදී විතරයි, දිවා කාලයේදී මෙහෙයුම් කටයුතු සිදු වන්නේ නැහැ, ඒ නිසා මේ ගුවන් තොටුපොළ රාත්‍රියට ඇරලා දිවා කාලයේදී වහලා තබනවා" කියා. ඇයි එය මත්තලට ගෙන යන්න බැරි? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළත්, මීට ඉස්සර වෙලා කථා කරපු අපේ අමාත්‍යතුමා කිව්වා, "එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. ගුවන් සමාගම් ඒකට කැමැති නැහැ" කියා. අපි එය පිළිගන්නේ නැහැ. අපත් දන්නා උදවිය එහි සේවය කරනවා.

අපත් දන්නා උදවිය එහි ව්‍යාපාර කරනවා. අපි දන්නා විධියට දවල් කාලයේ කටුනායක ගුවන් තොටුපොළ පරිහරණය කරන්නේ, එහි දවල් කාලයට වැඩි හරියක් ගොඩ බස්වන්නේ අපේ රටේ ශ්‍රීලංකන් ගුවන් සේවයට අයිති යානායි. ඒ වාගේම මැද පෙරදිග කලාපයේ ගුවන් යානා තමයි එහි ගොඩ බස්වන්නේ; ඉන්දියානු ගුවන් යානා තමයි ගොඩ බස්වන්නේ. මත්තල ගුවන් තොටුපොළ ද, කටුනායක ගුවන් තොටුපොළ ද කියන එකේ ප්‍රශ්නයක්, ගැටලුවක් ඒවාට නැහැ.

අනෙකුත් දුරස්ථ ගමන් සඳහා යොදා ගන්නා ගුවන් යානාවලට නම් ඒ ගැටලුව එන්න පුළුවන්. පොඩි පිනි බෑමක් වුණත්, පොඩි මීදුමක් වැටුණත් කටුනායක ගුවන් තොටුපොළ වසා දමද්දී ප්‍රයෝජනයට ගන්න තිබුණු ගුවන් තොටු පොළයි, මත්තල ගුවන් තොටුපොළ. කටුනායකට ගුවන් යානා එන එක මාස තුනකට හතරකට නවත්වලා මත්තල ගුවන් තොටුපොළ ප්‍රයෝජනයට නොගත්තේ, එම මෙහෙයුම් කටයුතු මත්තල ගුවන් තොටුපොළට ගෙන ගියේ නැත්තේ, වී ගබඩා කරලා නවත්වන්න, වහන්න උත්සාහ කරපු මත්තල ගුවන් තොටුපොළට එකී මෙහෙයුම් කටයුතු ගෙන ගියොත් එහි ලකුණු ටික රාජපක්ෂවරුන්ට වැටෙනවා, එහි වුවමනාව මිනිසුන් දැනගන්නවා කියන පණිවුඩය රටට යන නිසාය කියන චෝදනාව මම තමුන්නාන්සේලාට කරනවා. ඒ චෝදනාව කරන ගමන් මම කියනවා, රටට ලැබෙන්න තිබෙන විශාල ධනස්කන්ධයක් ඔබතුමන්ලා මේ මාස තුනට අහිමි කරන බව. ඔය කියන වෙලාව තුළ එක මාසයකට ගුවන් යානා 200ක් විතර පැමිණෙනවා. මේ මාස තුනට ගුවන් යානා 600ක් විතර එන එක මේ වන විට නවත්වාගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහ පාලනය ගැන බොහොම උනන්දුවෙන් තමයි ඔබතුමන්ලා කටයුතු කරන්නේ; කථා

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

කරන්නේ. වැලිඅමුණ වාර්තාවෙන් ඒ ගුවන් සමාගමේ යම් යම් නිලධාරින්ට චෝදනා එද්දී ඒ නිලධාරින් ස්වෙච්ඡාවෙන අයින් වෙලා පැහැදිලිව කිව්වා, "ඒ අයට නිදහසේ පරීක්ෂණ කටයුතු කරගෙන යන්න අපි ඉවත් වෙනවා" කියා. හැබැයි එක්කෙනෙකු, දෙදෙනෙකු යහ පාලනය යැයි කියාගන්නා මේ ආණ්ඩුවට ඒ අයගේ තොරතුරු ටික ලබා දෙන්න අදටත් තම තනතුරුවල තබාගෙන ඉන්නවා. ප්‍රදීප් කැකුළාවල කියන නිලධාරියා වැලිඅමුණ වාර්තාවෙන් චෝදනා කරපු තැනක පසු ගිය රජය සමයේ සේවය කරපු පුද්ගලයෙක්. අද ඔබතුමන්ලා එතුමාගේ සේවය ලබා ගන්නවා. මෙන්න මේ විධියේ දේවල් සිද්ධ වන්න විධියක් නැහැ, යහ පාලනය මේ රටේ ක්‍රියාත්මක වනවා නම්.

යහ පාලනය යටතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ආණ්ඩුවට එකතු වූ පිරිසක් ඉන්නවා. එතුමන්ලා ඒ වෙලාවේ කිව්වේ මොකක්ද? පාක්ෂිකයන් රැකගන්න, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගෙන් පක්ෂයේ සභාපතිකම ගන්නවා කියලායි කිව්වේ. අද පාක්ෂිකයන් රැකිලා තිබෙනවාද? අද මිහින් ලංකා ගුවන් සමාගමේ සේවය කරපු අයට මොකක්ද කරලා තිබෙන්නේ? 300කට වැඩි ගණනක් සේවය කළා. අද නැවත පත්වීම් 100ක් විතර දීලා අරගෙන තිබෙනවා.

මොකක්ද දීලා තිබෙන තනතුර? [බාධා කිරීමක්] ඔබතුමාද ඒ නඩුව කථා කරන්නේ? ගරු මන්ත්‍රීතුමා, ඒ නිසා නොදන්නා දේවල් කථා නොකර ඉඳිමු. ඔබතුමා දැන ගත්තාම ඒක ප්‍රකාශ කරන්න.

මිහින් ලංකා ගුවන් සේවයට නඩු දාන්න හේතුව මොකක්ද? 100ක් අලුත් පත්වීම් දීලා, මිහින් ලංකා ගුවන් සේවයේ හිටපු සේවක සේවිකාවන්, නිලධාරින් අද මොන තත්ත්වයටද පත් වෙලා තිබෙන්නේ? අද ඒගොල්ලන් ගැන කවුද කථා කරන්නේ? මම යෝජනා කරනවා යහ පාලනය නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන්ට මේ පුද්ගලයන් වෙනුවෙන් කථා කරන්න කියලා. කථා කරලා මේ පුද්ගලයන්ට සාධාරණයක් ඉටු කරලා දෙන්න. ඒ අය රැකියාවට ආවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු කාලයට රැකියාව කරන්නත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයට සහ සම්මුතිවාදී ආණ්ඩුව කාලයේදී රැකියාව නොකරන්නත් නොවෙයි. ඒ අයගේ දරු මල්ලන්ට අද ජීවත් වන්නට බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා; දරුවන් පාසල් යවා ගන්නට බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා; රැකියාවේ අස්ථාවරත්වයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු කනක හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. KANAKA HERATH *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මිහින් ලංකා ගුවන් සේවයට අත්වුණු ඒ ඉරණම අනෙකුත් ආයතනවලටත් අත්වෙමින් පවතිනවා. වරාය හා නාවික කටයුතු ඇමතිතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ හිටපු අපේ ජ්‍යෙෂ්ඨම දේශපාලනඥයකුගේ පුතෙක්. ඇත්තටම ගරු අර්ජුන රණතුංග ඇමතිතුමාගේ පියා වරාය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන කාලයේ රැකියාවලට දාපු අය අද ත්‍රිකුණාමලයට හෝ වෙනත් වරායන්වලට දේශපාලනික හේතූන් මත මාරු කරලා යවා තිබෙනවා. යහ පාලනයෙන් අපි මේ වාගේ දේවල් බලාපොරොත්තු වෙන්නේ නැහැ. 2008 වර්ෂයේ ඉඳලා අපි වරායට දේශපාලන පත්වීම් කරලා නැහැ. ඒක අපි නොබියව කියනවා. කිසිම වෙලාවක ස්ථිර පත්වීමක් දේශපාලන පත්වීමක් විධියට දීලා නැහැ. ඔබතුමා කථා කරලා කිව්වා, ඔබතුමා ඒ කටයුත්ත කරලා නැහැ කියලා. නමුත් 2015න් පසුව ඔබතුමා ඒ කටයුත්ත කළා. ඔබතුමා ළඟ ඉන්නවා, අනිවාර්යයෙන්ම ගැසට් කරලා, බඳවා ගැනීමේ පටිපාටිය අනුව ගන්නට ඕනෑ වුණත් එසේ නොකර ගත් සේවකයින්. සහකාර ගබඩා පාලකවරයෙක් ඉන්නවා, මාධ්‍ය අංශයේ මාධ්‍ය සම්බන්ධීකාරකවරයෙක් ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඒ අය අරගෙන තිබෙන්නේ ගැසට් කරලා නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය කරලා නොවෙයි. ඒ වාගේම ඔබතුමා රියැදුරු පත්වීම් දීලා තිබෙනවා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ ඉන්න නායිකාවකගේ වුවමනාවට ඔබතුමා Mahapola Training Institute එකට තනතුරු 20ක්, 25ක් දීලා තිබෙනවා. ඒ අය කිසිම වැඩක්පලක් නැතිව රස්තියාදු වෙන තත්ත්වයට පත් කරලා, නිකම් පඩි දිදී තියා ගෙන ඉන්නවා. ඒ වාගේම ඔබතුමා ආරක්ෂක අංශයට 89 දෙනෙකුව අරගෙන තිබෙනවා, කම්කරුවන් 225ක් අරගෙන තිබෙනවා. මේවා ගැන කථා කරන විට-

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
අද වන විට අපට තිබෙන cadre එක තුළ තමයි අපි බඳවා ගැනීම් කරලා තිබෙන්නේ. මෙතුමා ත්‍රිකුණාමලයට මාරු කරපු ඒවා ගැන කිව්වා. තමුන්නාන්සේලා අමතක කරන්නට එපා, එතැන විනයක් තිබිය යුතු බව.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ඇමතිතුමා, ඔබතුමා point of Order එකට උත්තර දෙන්න.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
නැහැ, ඔබතුමා මට චෝදනාවක් කළා නේ. මට උත්තර දෙන්න ඉඩ දෙන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔබතුමා point of Order එකට උත්තර දෙන්න. මගේ කරුණු වැරදි නම් නිවැරදි කරන්න, ඒක විතරයි point of Order එක. [බාධා කිරීමක්] ඔබතුමාගේ කථාවේදී ඔබතුමා පැහැදිලි කරන්න.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මම කථා කරලා ඉවරයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
එහෙම නම් කරන්න දෙයක් නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා අමාත්‍යවරයා විධියට අපට උත්තරය විතරක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාගේ ප්‍රශ්නයකදී ගරු ඇමතිතුමාට මැදිහත් වීමේ හැකියාවක් තිබෙනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු සභාපතිතුමනි, අපි ඉල්ලන්නේ පිළිතුරක් විතරයි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
තමුන්නාන්සේට මම වගකීමකින් කියනවා අපි බඳවා ගැනීම් කර තිබෙන්නේ cadre එක තුළ නිවැරදි ක්‍රමවේදයට බව. නමුත්, පසුගිය කාලයේ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවෙන් අරගෙන තිබුණු අයවත් බේරා ගත්තේ මම. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තමුන්නාන්සේලා කැමැති වෙන්න ඕනෑ, මම වරාය හා නාවික කටයුතු ඇමතිවරයා වෙලා ඉන්න එකට. එහෙම නැත්නම් මහින්ද මහත්තයාගේ ඡන්දයට ගිය අය ඔක්කොම ගෙදර යවන්න තිබියේ. එහෙම කට්ටියක්ව තමයි අපි පරිස්සම් කර ගත්තේ. [බාධා කිරීමක්]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
අපි අකමැති නැහැ ඔබතුමා ඉන්නවාට. [බාධා කිරීමක්] ඒවා ස්ථිර පත්වීම් නොවෙයි. මම මේ කථා කරන්නේ ස්ථිර පත්වීම් ගැන.[බාධා කිරීමක්] නැහැ, නැහැ. රුපියල් 10,000ට - [බාධා කිරීමක්] ඒක හොඳයි, කවුද වැරදියි කිව්වේ? [බාධා කිරීමක්] නැහැ, නැහැ. අපි අසත්‍ය කියන්නේ නැහැ ගරු අමාත්‍යතුමනි.

තමුන්නාන්සේ යම් යම් තැන්වලට ස්ථාන මාරුවීම් ලබා දුන්න නිලධාරින් ඉන්න එක ගැනයි අප කිව්වේ. අපට සාක්ෂි ඇතිව ඒවා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒකයි අප කිව්වේ. එහෙම නැතිව වෙන දෙයක් නොවෙයි. තමුන්නාන්සේ ඒකට පිටින් ගිහින් කථා කරන්න එපා. Cadre එකට අනුව සේවකයන් බඳවා ගන්න එකේ වරදක් නැහැ. නමුත්, නීති - රීති මාලාවක් තිබෙනවා නේ. Cadre එක පුරවනවා නම්, පුවත් පත්වල දැන්වීම් පළ කරලා, ඒ අයගේ සුදුසුකම් පරීක්ෂා කර බලා පත් කරගන්න ඕනෑ. එහෙම නැතිව cadre එක හිස් වුණාය කියා තමන්ට ඕනෑ විධියට කටයුතු කරන්න බැහැ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මා ඔබතුමාට වග කීමකින් මේ කියන්නේ. සුදුසුකම් නැතිව කිසිම කෙනකු බඳවාගෙන නැහැ. පුවත් පත්වල දැන්වීම් පළ කරලා, interview කරලා තමයි බඳවාගෙන තිබෙන්නේ. එක වරක් අයදුම් පත් 15,000ක් ලැබුණා. එයින් 1,500ක් තේරුණා. ඒ 1,500ම ගත්තේ interview කරලා තමයි. එහෙම නැතිව මා ඕවාට අත ගහන්නේ නැහැ. හැබැයි මාරු කිරීම් කරනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
දේශපාලන පළිගැනීම්වලට මාරු වීම් කරලා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
නැහැ. අද වන තුරු කිසිම දේශපාලන පළිගැනීමක් කරලා නැහැ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මෙතැන තමුන්නාන්සේගේ තාත්තා දමපු සේවකයෝත් ඉන්නවා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මගේ තාත්තා දැම්මත් හොරා හොරාමයි. මගේ සහෝදරයා දැම්මත් හොරා හොරාමයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ජ්‍යෙෂ්ඨ නායකයෙකුට ඔබතුමා හොරා කියලා කියන්න එපා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මා හොරුන්ව තියාගන්නේ නැහැ. කරුණාකරලා හොරුන් ආරක්ෂා කරන්න කියලා ඔබතුමා මට කියන්න එපා. මහින්ද මහත්තයාගේ කාලයේ හොරුන් ආරක්ෂා කරන්න ඇති. නමුත් මගේ කාලයේ ඒක කරන්න බැහැ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
රෙජී රණතුංග, ප්‍රසන්න රණතුංග හොරුන් එක්ක ගනු-දෙනු කරන්නේ නැහැ. ඒ කීර්තිනාමය අප ළඟ තිබෙනවා. එම නිසා ඔබතුමා හොරුන් ආරක්ෂා කරන්න ගිහින් තාත්තාට හොරා කියලා කියන්න එපා. ඒක අසාධාරණයක්.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මා තාත්තාට හොරා කිව්වේ නැහැ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔබතුමා කිව්වේ හොරා නම් හොරා කියලා නේ. වැරැදියි නම් වැරැදියි.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ඕනෑම පුද්ගලයෙක් හොරකම් කළොත් හොරා තමයි. ඒක තමුන්නාන්සේ කළත් එකයි, වෙන කවුරු කළත් එකයි. තමුන්නාන්සේලා පසු ගිය කාලයේ හොරුන් එක්ක හිටපු අය, හොරු ආරක්ෂා කරන්න - [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හොරුන් එක්ක දැන් කවුද ඉන්නේ කියන එක රටම දන්නවා, ගරු ඇමතිතුමනි. රුපියල් බිලියන 150කට වග කියන්න ඕනෑ කවුද කියන එක ඔය "Mr. Clean"ලා කියපු - [බාධා කිරීමක්] දැන් රටම දන්නවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන්කර තිබෙන කාලය අවසාන වෙමින් එන්නේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මට නියමිත කාලය අවසාන වෙමින් එනවා, ගරු සභාපතිතුමනි. මට බාධා කරනවා නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ - [බාධා කිරීම්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please!

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ඇමතිතුමනි, කරුණාකර ඔබතුමාගේ ආවේගය පාලනය කරගන්න. [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අර්ජුන රණතුංග ඇමතිතුමනි, ඔය කථාව පොඩ්ඩක් නවත්වන්න. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඔය දේවල් කියන්න පුළුවන්. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාගේ කථාව අවසන් කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ඇමතිතුමනි, මා මේ කියන්නේ නාස්තිය, දූෂණය ගැනයි. තමුන්නාන්සේ දැන් රුපියල් ලක්ෂ දෙතුන් සියයක් වියදම් කරලා මොකක්ද ගහක් හදනවා. වරායේ කරන්න තිබෙන එකම රාජකාරිය ඕක වාගෙයි කථා කරන්නේ. ජනතාව වෙනුවෙන් මීට වඩා විශේෂ දෙයක් කරන්න තමුන්නාන්සේට පුළුවන්. ඔබතුමා කියනවා විශාලම ලී මඩුව ඔබතුමාටයි තිබෙන්නේ කියලා. ඒවායේ මොනවාද කෙරුණේ කියා පසු ගිය දවස්වල අපි දැක්කා. අපි කැමැති නැහැ, ඒවාට මඩ ගහන්න. තමුන්නාන්සේගේ කටයුත්ත තමුන්නාන්සේගේ පියාණන්ගේ විධියට, ඒ ආකාරයට කරන්න. ඒකේ වරදක් නැහැ. නමුත්, එතුමා දුන්න රැකියා සම්බන්ධයෙන් ඔය විධියට කටයුතු කරන්න එපා. ඒ තනතුරු දරපු අයගේ දරුවන් අද එදා වේල කන්න නැතිව ඉන්නවා. තමුන්නාන්සේ වෘත්තීය සමිති ගහලා පන්නලා තිබෙන්නේ. තමුන්නාන්සේ එහෙම කථා කරන්න එපා. වෘත්තීය සමිති වෘත්තීය ක්‍රියාමාර්ග ගනිද්දී, තමුන්නාන්සේ ඒ අයට සලකපු විධිය රටම දැක්කා. තමුන්නාන්සේ මෙහෙම කථා කරනවා නම් ගම්පහ දිස්ත්‍රික්කයෙන් බිහි වුණු නායකයෙක් වුණු තමුන්නාන්සේගේ ප්‍රතිපත්ති ගැන අපි කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, මා ගොනු කරගෙන ආ කාරණා ගැන කථා කරන්න මට අවස්ථාව ලබාදුන්නේ නැහැ, අපේ ගරු අමාත්‍යතුමා. මේ අය වැයේදී අපි මේ විරෝධතා දක්වනවා නොවෙයි. අප කවදාවත් එහෙම කරන්නේ නැහැ. "ගිය ආණ්ඩුවෙන් මෙහෙම වුණා, අපි කරන්නේ නැහැ"යි කියා සුද්දවන්ත කථා මෙතැන කියන්න එන්න එපා. තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ සුද්දෙට කරලා පෙන්වන්න. ඒකයි අපි ඉල්ලන්නේ. එහෙම නැතුව වෙන දෙයක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මට කථා කරන්න මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.23]

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Muthuhettigamage - Deputy Minister of Ports and Shipping Affairs)
ගරු සභාපතිතුමනි, මා නියෝජ්‍ය අමාත්‍ය ධුරය දරන වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය පිළිබඳව මෙතුමන්ලා දීර්ඝ වේලාවක් තිස්සේ සාකච්ඡා කළා. ඒ වාගේම ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය පිළිබඳවත් ඇමතිතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමන්ලාගෙන් අපට දීර්ඝ දේශනයන් අහන්න ලැබුණා.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අපේ විෂයය භාර ගරු අමාත්‍යතුමා කථා කළාට පසුවයි මට කථා කරන්න අවස්ථාව ලැබුණේ. ඉදිරිපත් කළ යුතු බොහෝ කාරණා එතුමා නිවැරදිව ඉදිරිපත් කළා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය දැන් කටයුතු කරන්නේ බරපතළ ගැටලු කීපයකට මුහුණ දීලා සිටින අවස්ථාවකයි.

හම්බන්තොට වරාය අපේ රටට අවශ්‍ය දෙයක්. දශක දෙකක් පමණ තිස්සේ මේ පිළිබඳව ශක්‍යතා වාර්තා හැදුවා. මේ කාරණය පිළිබඳව පැවතුණු රජයන් තුළ විවිධ උනන්දුවීම් තිබුණා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වරාය හා මහාමාර්ග ඇමතිතුමා වශයෙන් කටයුතු කරද්දී එතුමාගේ කටයුත්තක් විධියට

හම්බන්තොට "මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය" ඉදිකළා. එතුමාත් විශාල බලාපොරොත්තු ඇතුවයි මේ වරාය ඉදිකළේ. කොළඹ වරාය හැරුණාම ලංකාවේ තිබෙන සාර්ථකම වරාය විධියට මේ වරාය පත්වෙයි කියලා එතුමාගේ හදේ චිත්‍රයක් තිබුණා. නමුත් අපේ අවාසනාවට, ජාතියේ අවාසනාවට මේ වනකොට ඒකට කණ කොකා හඬලා තිබෙන්නේ. මොකද, අද හම්බන්තොට වරායේ විශාල ණය බරක් තිබෙන නිසා, එය ශ්‍රී ලංකා වරාය අධිකාරියට දරා ගන්න බැරි මට්ටමේ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

අපේ අර්ජුන රණතුංග අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, ඉංජිනේරුවරු, කළමනාකාර අධ්‍යක්ෂවරයා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාම සැලසුම් සකස් කරමින් විවිධ කටයුතු කළේ, මේ වරාය ලාභ ලබන එකක් නොවුණත්, පාඩුව අවම වන වරායක් බවට පත් කරගැනීමේ විශාල බලාපොරොත්තුවක් ඇතුවයි. මේ ප්‍රශ්නය ඔලුවිල්වලට ආවේ නැහැ, කන්කසන්තුරේට ආවේ නැහැ, ත්‍රිකුණාමලයට ආවේ නැහැ, කොළඹට ආවේ නැහැ. මේ ප්‍රශ්නය දකුණේ මාගම් රුහුණුපුරට ආ එක තමයි ප්‍රධාන ගැටලුව.

වරායක් හදලා අවුරුදු දෙකකින්, තුනකින් පාඩුව එන්න-එන්නම වැඩි වනවා නම්, ඒක විශාල ගැටලුවක්. දැන් අපට පාරක-තොටක යන්න බැහැ, උත්සවයකට යන්න බැහැ, අපෙන් අහන්නේ වරාය විකුණනවාද කියලායි. වරාය ගන්න එන කට්ටිය වාගේ අපෙන් අහනවා, මේ කාරණය. මේක මාධ්‍යවලින් වැරදි විධියට ප්‍රචාරය කරනවා. මේ වරාය ලාභදායී වරායක් බවට පත් කරන්න අවශ්‍ය සැලසුමයි අපි මේ හදන්නේ කියන කාරණය මා සිහිපත් කරන්න ඕනෑ. හැබැයි මේ වරාය විකුණන්නේ නැතිව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය තිබියදී, ජැටි සහ මුහුද පමණක් ආයෝජකයින්ට ලබා දෙන්නයි අපේ බලාපොරොත්තුව; අපේ වුවමනාව. අන්න ඒ කාරණය සිහිපත් කරමිනුයි මගේ කථාව පටන් ගන්නේ.

මේ අමාත්‍යාංශයේ විෂය පථයට ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වෙළඳ නාවික ලේකම් කාර්යාලය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, සීමාසහිත නාවික හා ගුවන් සේවා තොරතුරු පර්යේෂණ පුද්ගලික සමාගම, නාවික කටයුතු සංවර්ධන අරමුදල කියන මේ සියල්ල අයත් වනවා.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය සතුව දක්ෂ නිලධාරින් පිරිසක් ඉන්නවා. ඒ වාගේම අමතක කරන්න එපා, වරාය අධිකාරියේ කාර්මික අංශය තුළ සේවය කරන දක්ෂ පිරිසක් සිටින බව. ඒ වාගේම දක්ෂ වැඩ සහායකවරු පිරිසක් සිටිනවා. අපේ රටේ කොළඹ, ගාල්ල, හම්බන්තොට ත්‍රිකුණාමලය, ඔලුවිල්, කන්කසන්තුරේ, පේදුරුතුඩුව සහ මයිලඩි වශයෙන් වරායන් 8ක් තිබෙනවා. මෙයින් ඔලුවිල් වරාය අපට ගැටලුවක් වශයෙන් පවතිනවා. ඇත්තටම මම යෝජනා කරන්නේ එම වරාය ධීවර සංස්ථාවට භාරදෙන්න ඕනෑ වරායක් බවයි. ඒක සැබෑම ධීවර වරායක්. ඒ වරාය ධීවර අමාත්‍යාංශය භාර ගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, කොළඹ, ගාල්ල හම්බන්තොට, ත්‍රිකුණාමලය, කන්කසන්තුරේ වරායන් අපට විශේෂයි. අපි දැන් කොළඹ වරාය ලාභ ලබන වාණිජ කටයුතු කරන ආයතනයක් බවට පත් කරලා තිබෙනවා. ඒ වාගේම දැන් හම්බන්තොට වරායේ ණය ගෙවන්නේ කොළඹ වරායේ මැදිහත්වීමෙන්.

සමස්තයක් ලෙස ගත් කළ 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී වරාය අධිකාරියේ ප්‍රගතියක් තිබෙනවා. 2014 වර්ෂයේදී ළඟාවී ඇති නැව් ප්‍රමාණය 4,298යි. 2015දී 4,760යි. 2014 වර්ෂයේදී ගොඩබා ඇති බඩු ප්‍රමාණය මෙට්‍රික්ටොන් මිලියන 45යි. 2015දී මෙට්‍රික්ටොන් මිලියන 47යි. 2014දී නැව්ගත කරන ලද බඩු ප්‍රමාණය මෙට්‍රික්ටොන් මිලියන 29යි. 2015දී එය මෙට්‍රික්ටොන් මිලියන 31යි. ඒ අනුව 2014 වර්ෂයට වඩා 2015 වර්ෂය සාර්ථක වර්ෂයක් විධියට පෙන්නුම් කරනවා. 2016දීත් එවැනිම වර්ධනයක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ලංකා නැව් සංස්ථාව කියන්නේ නැව් එකක්වත් නැතිව ලාභ ලබමින් පවත්වාගෙන ආපු ආයතනයක්. නැව් සංස්ථාවේ ලාභය දැකපු අය, නැව් සංස්ථාවට බලෙන් නැව් දෙකක් පැටෙව්වා. මම හිතන හැටියට නැවක් නැතිව තිබුණු ලෝකයේ එකම නැව් සංස්ථාව ලංකා නැව් සංස්ථාවයි. මහජන බැංකුවෙන් ලබා ගත් ණය මුදලක් යොදවා ලබා ගත් ඒ නැව් දෙකේ වාරික ගෙවීමේ අවදානම දැන් නැව් සංස්ථාවට පැවරී තිබෙනවා. ඉදිරි කාලසීමාවේදී ඒ නැව් දෙකේ වාරික ගෙවීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ සඳහා භාණ්ඩාගාරයේ සහාය අපට අවශ්‍ය වෙනවා. ඒක අත්‍යවශ්‍ය කාරණයක්. මොකද, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු ගෙන ඒම එකී නැව් දෙක මඟින් මේ වෙනකොට ඉෂ්ට වෙන නිසා.

ගරු සභාපතිතුමනි, දිවයිනේ පිහිටි ආයතන කිහිපයකින් ශ්‍රී ලංකාවේ තරුණයන්ට නාවික කටයුතු පිළිබඳ විවිධ පාඨමාලා පවත්වා ගෙන යනවා. මෙම පාඨමාලා හදාරන අයට මුහුණ දීමට සිදුවී තිබෙන ප්‍රධාන ගැටලුව වනුයේ, පාඨමාලාව අවසානයේ නෞකා පුහුණුව ලබා ගැනීමට ඇති ගැටලුවයි. නැව් සංස්ථාව සතු නැව් දෙකෙන් එකී පුහුණුව ලබා දෙනවා. සැලසුම් සහගතව විධිමත්ව තවදුරටත් ඒ කාරණය කළ යුතුයි.

වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය ගැන කථා කරනවා නම්, රැකියා අවස්ථා වැඩි කිරීම උදෙසා උසස්භාවයේ වෘත්තීය නාවියන් බිහි කිරීම සඳහා මෙම ආයතනය විශාල සේවයක් ඉටු කරනවා. මුහුදු යාත්‍රිකයන්ට විදේශීය හා දේශීය නැව්වල රැකියා අවස්ථා ලබාගත හැකිවන පරිදි, උසස් තත්ත්වයේ සමුද්‍රීය අධ්‍යාපනය, පුහුණුව හා ප්‍රවණතාව ඇගැයීමෙන් සහතික ලබා දීම එම ආයතනයෙන් කෙරෙන ප්‍රධාන සේවාවක්. ශ්‍රී ලාංකික මුහුදු යාත්‍රිකයන් ජාත්‍යන්තර සමුද්‍රීය කර්මාන්තයට සරිලන තලයට උසස් කිරීම සඳහා ඉතා වැදගත් නියාමන කටයුත්තක් මෙම කාර්යාංශය මඟින් සිදු වෙනවා. ඉතාම තරගකාරී මට්ටමක පවතින වත්මන් සමුද්‍රීය කර්මාන්තයේ ඇති වන ඉහළ මට්ටමේ යාන්ත්‍රික තනතුරුවලට උසස් වීමට එම අමතර පුහුණුවීම් අවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
යම් පුද්ගලයෙක් වෙළෙඳ නෞකාවක රැකියාවට යෑමට මත්තෙන් ලියාපදිංචි විය යුතුයි. ඒ ආකාරයට 2015 වර්ෂයේ ලියාපදිංචි වී නැව්ගත වූ සංඛ්‍යාව 7,144කි.

විශේෂයෙන්ම ගාල්ල වරාය පිළිබඳව මා කරුණු කිහිපයක් ඉදිරිපත් කළ යුතුයි. මට වගකීමක් හැටියට ගරු ඇමතිතුමා භාර දීපු කාරණයක් ඒක. ගාල්ල වරාය සංවර්ධන කටයුතු ගැන පසු ගිය දශකය පුරා අපි සාකච්ඡා කළා. ඒ සඳහා යුනෙස්කෝ ආයතනයේ අනුමැතිය ලැබී තිබෙනවා. ලෝක උරුමයක් වන

[ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා]

ගාලු කොටුවට සමගාමීව ගාලු වරාය සංවර්ධනය කරන්න අනුමැතිය ලබා ගන්න හැකි වුණේ මේ වර්ෂයේදී. ජපන් ජයිකා ආධාර යටතේ ගාලු වරාය සංචාරක වරායක් හැටියට සංවර්ධනය කරන්නත්, වාණිජ කටයුතු පවත්වාගෙන යන්නත් අපි බලාපොරොත්තු වෙනවා. හම්බන්තොට වරාය හා කොළඹ වරාය අතර කේන්ද්‍රස්ථානයක් හැටියට තිබෙන ගාලු වරායේ සංවර්ධන කටයුතු ඉදිරි වසර තුළ ආරම්භ කරලා සාර්ථක සංචාරක වරායක් හැටියට පවත්වාගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. එය ඉතාම දැකුම්කලු ස්ථානයකයි පිහිටා තිබෙන්නේ. රුමස්සල කඳු වැටියෙන් විශාල කොටසක් ගාලු වරායට අයිති වෙනවා. ඒ නිසා එතැන පරිසර හිතකාමී හෝටල් සංකීර්ණයක් හදන්නත් අපි අනුමැතිය අපේක්ෂා කරනවා. ගාල්ල නගරයේ ඉදිවන අලංකාර පරිසර හිතකාමී සංචාරක මධ්‍යස්ථානයක් බවට එය පත්කර ගන්න හැකි වෙයි කියන විශ්වාසය මා පළ කරනවා. ගරු සභාපතිතුමනි, ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඇගයීම් වාර්තාව මා **සභාගත*** කරනවා.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් මා අතිගරු ජනාධිපතිතුමාගේත්, අග්‍රාමාත්‍යතුමාගේත්, මුදල් ඇමතිතුමාගේත් අවධානයට මා මෙම කාරණය යොමු කරනවා. මගේ ගරු අමාත්‍ය අර්ජුන රණතුංග මැතිතුමාත්, අමාත්‍යාංශ ලේකම්තුමාත්, වරාය අධිකාරියේ සභාපතිතුමන්ලා දෙපළ ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාත් එකතු වෙලා ගොඩ නගපු ඒ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න අපි කටයුතු කරනවා.

කිසිම ආකාරයක වංචාවක්, දූෂණයක් සිදු නොවනවා කියලා මා කියන්නේ නැහැ. නමුත් මේ ආයතනය වංචාව, දූෂණය බින්දුවටම අඩු වුණු ආයතනයක් බවට පත් කරන්න මේ අවුරුදු එකහමාර තුළ අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන, කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය තවදුරටත් වරාය අධිකාරිය සතු දේපළක් හැටියට පවත්වා ගන්න හැකියාව ලැබෙයි කියා මා විශ්වාස කරනවා. ඒ වාගේම වරාය අධිකාරියේ කටයුතු ඉදිරියටත් ශක්තිමත් කරනවා කියන කාරණය සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 5.40]

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ස්තුතියි.

ගරු සභාපතිතුමනි, 2017 වර්ෂය සඳහා වන අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ පිළිතුරු කථාව කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. 2017 වසර සඳහා මෙවර අය වැයෙන් අපේ අමාත්‍යාංශයට වෙන් කළ මුදල මිලියන 51,300ක් වෙනවා. මිලියන 51,300ක් කියන්නේ කෝටි 5,130ක්. එයින් පුනරාවර්තන වියදම් සඳහා මිලියන 17,392ක් - කෝටි 1,730ක්- හා ප්‍රාග්ධන වියදම් සඳහා කෝටි 3,332ක් වෙන් වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය ආයතන 09කින් සමන්විත වෙනවා. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, සිවිල් ගුවන් සේවා අධිකාරිය, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සහ සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම කියන ආයතන නවයෙන් සමන්විත මෙම අමාත්‍යාංශය සම්බන්ධව අද දිනයේදී මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් විසින් දක්වන ලද අදහස්වලට පිළිතුරු දීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තමයි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වැඩිම සේවක සංඛ්‍යාවක් සිටින ආයතනය. එහි සේවකයින් 36,700ක් සිටිනවා. බස් රථ 5,500ක් දෛනිකව ධාවනය වෙනවා. සමස්ත ජනතාවගෙන් ලක්ෂ 25ක් පමණ ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථවලින් ප්‍රවාහන පහසුකම් සපයා ගන්නවා. පසු ගිය රජයේ පාලන කාලයේ අවසන් කාල පරිච්ඡේදයේදී සේවකයින්ගේ අර්ථ සාධක අරමුදල් සඳහා කෝටි 1,070ක්, සේවක භාරකර අරමුදල් සඳහා කෝටි 45ක්, සේවක පාරිතෝෂික මුදල් සඳහා කෝටි 240ක් සහ අමතර කොටස්වලට ගෙවන්න තිබුණු මුදල් වශයෙන් කෝටි 1,470ක් පමණ ගෙවන්න තිබුණා. ඒවා පසු ගිය රජය අපට ලබා දුන් දායාදයි.

අපේ ගරු ඇමතිතුමා මෙම අමාත්‍ය ධුරය භාර ගත්තාට පසුව, අවුරුද්දක්-එකහමාරක් වැනි කෙටි කාලයක් තුළ එම සියලු මුදල් ගෙවීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ අනුව සේවකයන්ගේ පාරිතෝෂික මුදල් ලබා දීලා තිබෙනවා. නැවත සේවකයකු විශ්‍රාම යන අවස්ථාවේ විතරයි, පාරිතෝෂික මුදල් ලබා දෙන්න තිබෙන්නේ. අපි අර්ථ සාධක අරමුදල් සියයට 80ක්-90ක් පමණ බැර කර තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලබා දුන් එම ජයග්‍රහණය ගැනත්, සේවකයන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දීම ගැනත් අපි සන්තෝෂ වෙනවා.

ගරු සභාපතිතුමනි, එක බස් රථයකට සේවකයන් 07 දෙනෙකු බැගින් සිටින නිසා සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. ඒ අනුව සේවකයන් 3,850ක් පමණ විශ්‍රාම යන්න දැනට ඉල්ලුම් කරලා තිබෙනවා. එම සේවකයන්ගේ විශ්‍රාම වැටුප් -ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන වැටුප්- ගෙවීම දැන් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව දැනට වාර දෙකක් ගෙවා තිබෙනවා. තව එක වාරයක් ගෙව්වාම එම සේවකයන්ගේ අවශ්‍යතාව ඉෂ්ට වෙනවා.

දැනට යම් යම් තත්ත්වයන් නිසා රියැදුරන්ගේ සහ කොන්දොස්තරවරුන්ගේ යම් ඌනතාවක් තිබෙනවා. පසුගිය කාලයේ මුදල් බැඳපු රියැදුරන් 700 ගණනක ලැයිස්තුවක් තිබෙනවා. ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින එම අඩුපාඩුව පිරවීම සඳහා ලබන වසරේදී සේවකයන් බඳවා ගැනීමට අපට පුළුවන් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. අපේ ඇමතිතුමා කිව්වා වාගේ මෙවර අය වැයෙන් ලංකා ගමනගමන මණ්ඩලයට තනි දොර බස් රථ 250ක්, දොර දෙකේ බස් රථ 1,000ක් සහ පරණ බස් රථ නවීකරණය කිරීම සඳහා එන්ජින් කට්ටල 500ක් ලබා දෙන්න මුදල් ඇමතිවරයා අපට පොරොන්දු වී තිබෙනවා. අපි බස් ඇණිය වැඩි නොකර අවුරුදු 10-15 පරණ බස්

---
*** පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

රථ ඉවත් කරලා ඒ සඳහා එම බස් රථ යොදවන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව සෑම ඩිපෝවක් සඳහාම ඉදිරියේදී එම බස් රථ ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා.

අද වැඩිපුරම කථා කළේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න ගැනයි. මම හැම වේලාවේම කියන එකක් තමයි, අධ්‍යාපනය සහ සෞඛ්‍ය කියන ක්ෂේත්‍රයන් සේවාවන් වශයෙන් සපයනවා නම්, අපේ ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් සපයන සේවාවටත් රජයෙන් මුදල් දැරිය යුතුයි කියන එක. මෙම රජය හැම වසරකම අපට රුපියල් බිලියන 22-23ක් අතර මුදල් ප්‍රමාණයක් ලබා දෙනවා, ඒවා නඩත්තු කර පවත්වා ගෙන යෑම සඳහා. දුම්රිය දෙපාර්තමේන්තුවට රුපියල් බිලියන හතකට වැඩි මුදලක් ලබා දෙනවා. මොකද, බිලියන හතක පමණ පාඩුවක් දුම්රිය දෙපාර්තමේන්තුවේ තිබෙනවා.

දුම්රිය දෙපාර්තමේන්තුවට සේවකයන් 19,000ක් පමණ ඉන්නට ඕනෑ. නමුත් දැනට සිටින්නේ සේවකයන් 17,000ක් පමණයි. පසු ගිය කාලයේ දී සේවක බඳවා ගැනීම් සිදු වෙලා තිබුණා. ආදේශකයන් වශයෙන් 2,000ක් පමණ බඳවා ගෙන තිබුණා. මේ සියලු දෙනාම අනුමත cadre එකට අනුකූලව නොවෙයි බඳවා ගෙන තිබුණේ. ඔවුන් සම්බන්ධයෙන් සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ප්‍රශ්නයකුත් ඇහුවා. නමුත්, ඔවුන් ස්ථිර කරන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ cadre එකෙන් පිට ආදේශක සේවකයන් වශයෙන් අනවශ්‍ය සේවකයන් 2,000ක් පමණ බඳවා ගැනීම නිසා එය කිරීමට අපහසු වී තිබෙනවා. ඒ නිසා එය දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

නව රජය යටතේ ඇමතිතුමාගේ සංකල්පය මත දුම්රිය දෙපාර්තමේන්තුවට දුම්රිය එන්ජින් 12ක් ගෙන්වීම සඳහා අප දැන් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒ වාගේම, වායු සමනය කළ බලවේග කට්ටල හයක් ලබා ගැනීම සඳහාත් ටෙන්ඩර් කැඳවා තිබෙන අතර, ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ ඒවා ගෙන්වීමට අප බලාපොරොත්තු වනවා. ඒ වාගේම, දුම්රිය මැදිරි 160ක් ලබා ගැනීමට අදහස් කරනවා. පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව මාර්ග බවට පත් කරන්නත්, අලුත්ගම සිට ගාල්ල දක්වා ද්විත්ව මාර්ග බවට පත් කරන්නත් රුපියල් බිලියනයක් -රුපියල් මිලියන දහසක්- මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම කන්කසන්තුරේ, පොන්නාලේ හන්දිය දක්වා දුම්රිය මාර්ගය අලුතින් දීර්ඝ කරන්න; අලුත් දුම්රිය මාර්ගයක් හදන්න මූලික වැඩ පිළිවෙළ සඳහා මෙවර අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා.

සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම "මහව- වවුනියාව දුම්රිය මාර්ගය සෑදීමට වෙනත් සමාගම්වලට දෙන්නේ ඇයි කියලා එතුමා ප්‍රශ්න කළා. දැනට අපේ දුම්රිය මාර්ග නඩත්තු කිරීමේදී අපට සේවක හිඟයක් තිබෙනවා. දැනට මෙම මාර්ගයේ පැයට කිලෝමීටර් 60ක පමණ වේගයෙන් තමයි දුම්රිය ගමන් කරන්නේ. එම මාර්ගයේ තිබෙන්නේ යාන්ත්‍රික සංඥා පද්ධතියක්. එම මාර්ගයට විදුලි සංඥා පද්ධතියක් සවි කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. අපේ දෙපාර්තමේන්තුවේ සේවකයන්ගෙන් මේ කාර්ය කරන්න ගියොත්, දීර්ඝ කාලයක් මේ සඳහා ගත වෙනවා. ඒ නිසා මේ පිළිබඳව කල්පනා කරලා තමයි, එම දුම්රිය මාර්ග නඩත්තු කිරීමට සහ එම මාර්ගවල විදුලි සංඥා ක්‍රම ඇති කිරීමට එම සමාගම්වලට ලබා දීලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මාතර- බෙලිඅත්ත මාර්ගයේ විදුලි සංඥා පද්ධතියක් ඇති කිරීම සඳහා 2015 වසරේ දී අපේ දුම්රිය සේවකයන්ට භාර දුන්නත්, දැනට අවුරුදු එකහමාරක් ගතවී ඇතත් එය හරියට ඉෂ්ට කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ ආකාරයට ඵලදායිතාව විශාල ලෙස අඩුවී තිබීම නිසා තමයි, චීන සහ ඉන්දියන් සමාගම්වලට මේ කාර්ය කිරීම සඳහා ලබාදීමට බලාපොරොත්තු වන්නේ. අපේ දුම්රිය දෙපාර්තමේන්තුවට කිසිම පාඩුවක් වෙන්නේ නැති විධියට තමයි මේ වැඩ පිළිවෙළ අප සකස් කර ගෙන යන්නේ.

දුම්රිය කෞතුකාගාරයක් පිහිටුවීම ගැන ඇහුවා. දුම්රිය කෞතුකාගාරයක් දැනට කඩුගන්නාවේ තිබෙනවා. එම කෞතුකාගාරයේ තිබෙන පැරණි දුම්රිය දැන් විනාශ වෙමින් යනවා. මේ සඳහා අපේ දෙපාර්තමේන්තුවේ මුදල් සතයක්වත් වැය වන්නේ නැහැ. මහජන බැංකුව, මර්චන්ට් බැංකුව සහ පීපල්ස් ලීසිං සමාගම ආධාරයක් වශයෙන් රුපියල් මිලියන 300ක් ලබා දෙන්නට ක්‍රියා කරනවා. ඒ සඳහා අපේ දෙපාර්තමේන්තුවේ කිසිම මුදලක් වැය වෙන්නේ නැහැ. ඒක ප්‍රදානයක් වශයෙන් තමයි ලබා දෙන්න බලාපොරොත්තු වන්නේ. දුම්රිය කෞතුකාගාරයක අවශ්‍යතාව තිබෙනවා. මොකද, පැරණි දුම්රිය නැතිවී ගියොත් අපේ මතු පරපුරට මේවා බලා ගන්නට බැරි වෙනවා. ඒ නිසා, එම ප්‍රදානය යටතේ දුම්රිය කෞතුකාගාරයක් ඉදි කරන්නට අප බලාපොරොත්තු වනවා.

දිනකට ලක්ෂ හතරක්, පහක් අතර පිරිසක් දුම්රියෙන් ගමන් කරනවා. නමුත්, අපට දැනට තිබෙන්නේ දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල 159ක් පමණයි. සාමාන්‍යයෙන්, සතියකට දුම්රිය ගමන් වාර 2,500ක් පමණ කරනවා. ඒ නිසා දුම්රිය ප්‍රමාණයත් වැඩි කළ යුතුයි.

පානදුර සිට වේයන්ගොඩ දක්වා විදුලි දුම්රියක් යෙදවීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 600ක ණය මුදලක් අපට ලබා දෙනවා. ඒ පිළිබඳ ශක්‍යතා වාර්තා සකස් කරමින් පවතිනවා. මේ මාසයේ 30වැනිදා ඒ පිළිබඳව අපේ වැඩ මුළුවකුත් තිබෙනවා. ඒ නිසා, ඉදිරි වසර හතර තුළ දුම්රිය දෙපාර්තමේන්තුවේ විශේෂ දියුණුවක් ඇති වෙයි කියා අප බලාපොරොත්තු වනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අලුත් ගබඩා සංකීර්ණය දැන් හදලා අවසානයි. e-Motoring Project ක්‍රමය ඉදිරියේදී ස්ථාපිත කරන්නට අප බලාපොරොත්තු වනවා. ඒ වාගේම, කුරුණෑගල මෝටර් රථ ප්‍රවාහන කාර්යාලයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නැහැ. පරීක්ෂණ ධාවන පථය ඉඩ මදි නිසා, කුරුණෑගල ප්‍රදේශයේ මෝටර් රථ ප්‍රවාහන කාර්යාලයක් අලුතෙන් ආරම්භ කරන්නට අප බලාපොරොත්තු වනවා. ඒ වාගේම ඇමැතිතුමාගේ කථාවේ දී කිව්ව ආකාරයට, මෝටර් රථ ප්‍රවාහන කාර්යක්ෂමතාව ඇති කිරීම වෙනුවෙන් විශේෂ වැඩ පිළිවෙළක් අප සකස් කරලා තිබෙනවා. ඒ වාගේම, අයිතිය මාරු නොකළ වාහන සඳහා කාල සීමාවක් අප ලබා දීලා තිබෙනවා. ඒ කාල සීමාවත් දීර්ඝ කරන්න අවශ්‍ය වුණොත්, ඒ කාල සීමාව අප දීර්ඝ කරනවා. ඒ වාගේම මෙරටට ගෙන ආ ලියා පදිංචි නොකළ සමහර මෝටර් සයිකල් තිබෙනවා. ඒවා ලියා පදිංචි කිරීම සඳහාත් අපි සහන කාලයක් ලබා දී තිබෙනවා. ඒ සහන කාලය තුළ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළින් අනිවාර්යෙන්ම ඒ කාර්යන් දෙක ඉෂ්ට වෙයි කියා අප බලාපොරොත්තු වනවා.

ඒ වාගේම, අන්තර් පළාත් ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ යම් කිසි ප්‍රශ්න තිබෙනවාය කියා ගරු මන්ත්‍රීවරු කිව්වා. විශේෂයෙන්ම ඇමතිතුමාගේ නායකත්වය යටතේ එහි තිබෙන ප්‍රශ්න විසඳන්න අපි බලාපොරොත්තු වෙනවා. මාර්ග බලපත්‍ර පිළිබඳව තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මට තව ටික වෙලාවක් දෙන්න. මොකද, අපේ අමාත්‍යාංශය යටතේ

[ගරු අශෝක් අබේසිංහ මහතා]

ආයතන 9ක් තිබෙනවා. ඒවා ගැනත් කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, වෙලාව තව හුඟක් ඉතිරිවෙලා තිබෙන නිසා මට කාලය දෙන්න. විශේෂයෙන්ම ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව මාර්ග බලපත්‍ර ලබාදීම සිදු කළත්, දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කිහිපයක් තිබෙනවා. ඒවා අවසන් වුණාට පසුව එම කටයුත්තත් විධිමත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මෝටර් රථ අන්තර් පළාත් වෛද්‍ය සංගමය තිබෙනවා. ඒ වාගේම ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය තිබෙනවා. එම ආයතන මේ දිනවල විශාල වශයෙන් කාර්ය බහුල වෙලා තිබෙනවා. මොකද, මාර්ග දඬ මුදල් වැඩි කිරීම නිසා licence ගන්න එන පිරිස දෙගුණයක් බවට පත්වෙලා තිබෙන බව මට සියලුම ප්‍රාදේශීය කාර්යාලවලින් දැනගන්න ලැබුණා. මෙතෙක් වාහන එළවලා තිබෙන්නේ බලපත්‍ර - licence - නැතුවයි.

මට ඊයේ කුරුණෑගල කාර්යාලයෙන් කිව්වා, සාමාන්‍යයෙන් දවසකට රියදුරු බලපත්‍ර ගන්න එන්නේ 250ක වගේ පිරිසක් වුවත්, දැන් 500ක වගේ පිරිසක් එනවා කියලා. විශේෂයෙන්ම ලබන අවුරුද්ද වෙද්දී රියදුරු බලපත්‍ර අලුත් කිරීමට එන පිරිස තවත් වැඩි වෙන්න පුළුවන්. විශේෂයෙන්ම එහි සභාපතිතුමා පැවසුවා, ඔහුගේ කාර්ය මණ්ඩලය වැඩි කිරීම සඳහා, cadre revision එකක් කිරීම සඳහා වැඩ පිළිවෙළකුත් සකස් කර තිබෙනවා කියලා. ඒ සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය සභාවේ ප්‍රතිසංස්කරණ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම ත්‍රිරෝද රථ නියාමනය, ඒ වාගේම පාසල් ළමුන් ප්‍රවාහනය කිරීම නියාමනය මාර්ග අනතුරු පිළිබඳ ජාතික සභාවට අපි පවරලා තිබෙනවා. මොකද, ලංකාවේ පෞද්ගලික බස් රථ 21,000යි තිබෙන්නේ. ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ 5,500ක් තිබෙනවා. නමුත්, ළමුන් ප්‍රවාහනය කරන වාහන 45,000ක් තිබෙනවා. ඒ නිසා එම වාහන නියාමනය කළ යුතුයි. පාසල් ළමුන් ප්‍රවාහනය කරන කුඩා වාහන ලොකු වාහන බවට පත් කරන්න මෙවර අය වැයෙනුත් සියයට 50ක පොලී සහනාධාරයකුත් ලබාදීම සඳහා මුදලක් වෙන්කර තිබෙනවා. මාර්ග අනතුරු පිළිබඳ ජාතික සභාව ඒ සඳහාත් අවධානය යොමු කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම මේ වසරේ බස් රථ 59ක අලුත්වැඩියා කටයුතු නිමකර තිබෙනවා. පසු ගිය වසරවල බස් රථ 20යි, 25යි වසරකට අලුත්වැඩියා කළේ. මේ වසරේ දැනට බස් රථ 59ක වැඩ නිම කරලා තිබෙනවා. ඒකත් දැන් ලාභ ලබන ආයතනයක් බවට පත්කර තිබෙනවා.

ඊළඟට, අපේ ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම ගැනත් කිව යුතුයි. විශේෂයෙන්ම කටුනායක ගුවන් තොටුපළේ ධාවන පථය වසර 30කින් ප්‍රතිසංස්කරණය කරලා නැහැ. අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක් වියදම් කරලා ජනවාරි 5වැනිදා සිට අප්‍රේල් 8වැනිදා දක්වා කාලය තුළ ඒක ප්‍රතිසංස්කරණය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ පිළිබඳව අපේ ඇමතිතුමා ඔබතුමන්ලාව දැනුවත් කළා. ඒ වාගේම නව පර්යන්ත ගොඩනැගිල්ලේ දැනට ලක්ෂ 65ක - මිලියන 6.5ක - පමණ මගී ධාරිතාවක් තමයි තිබෙන්නේ. එහි මගී ධාරිතාව මිලියන 20 දක්වා වැඩි කිරීමට ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් වැය කරලා JICA සමාගමත් සමඟ එක්ව නවීකරණය කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරනවා. ගරු ඇමතිතුමාට සහ සභාපතිතුමාට ඒ පිළිබඳව ස්තුතිය පුදකරන්න ඕනෑ. ඒක හැදුවාට පස්සේ සිංගප්පූරුවට පමණයි අපේ ගුවන් තොටුපළ දෙවැනි වෙන්නේ. අපේ රටේ භූමි ප්‍රමාණය වගේ 20ගුණයක් විශාල ගුවන් කලාපයක් - airspace එකක් - ආවරණය කරමින් විශාල වැඩ කොටසක් සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් කරනවා. ඒ පිළිබඳව සිවිල් ගුවන්සේවා අධිකාරියේ සියලු දෙනාටම අපේ ස්තුතිය පුද කරනවා. අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අයත් ආයතන 9 අපේ රටේ ප්‍රවාහනය වෙනුවෙන් විශේෂ සේවාවක් කරනවා.

මේ වන විට අපේ රටේ වාහන තදබදය විශාල වශයෙන් තිබෙනවා. වාහන 62,00,000ක් පමණ වාහන අපේ රටේ ලියා පදිංචි වෙලා තිබෙනවා. දවසකට වාහන ලක්ෂ 35ක්, 40ක් වගේ ප්‍රමාණයක් මාර්ගවල ධාවනය වෙනවා. ගරු ලසන්ත අලගියවන්න ඇමතිතුමාත් ප්‍රකාශ කළා, සුඛෝපභෝගී බස්රථ සේවයක් ආරම්භ කිරීමේ ඇති වැදගත්කම ගැන. ඉස්සර පෞද්ගලික අංශයේ වැඩ කරන අය ගම්පහ, ඒ වාගේම පානදුර වගේ ප්‍රදේශවල ඉඳලා කොළඹට එද්දී හත් අටදෙනෙක්, දහදෙනෙක් එකතු වෙලා වෑන් රථයක් අරන් තමයි ආවේ. නමුත් දැන් වෙලා තිබෙන්නේ මෙකයි. ලීසිං සමාගම්වලින් වාහනයේ වටිනාකමින් සියයට 100ක්ම ලීසිං පහසුකම දෙන්න පටන්ගත් දවසේ සිට ඒ අය කුඩා වාහනයක් අරන් කොළඹට එනවා. 10දෙනෙක්, 20දෙනෙක් එකතු වෙලා එක වෑන් රථයකින් කොළඹට ආවත්, දැන් ඒ අය වාහන 10ක්, 20ක් අරගෙන කොළඹට එනවා. එම නිසා ඒ වාගේ ආසන්න නගරවල සිට කොළඹට සුඛෝපභෝගී බස් රථ යම් කිසි ප්‍රමාණයක් ධාවනයට යෙදුවොත්, ජනතාව පෞද්ගලික වාහනවලින් එන එක අඩුවෙයි කියා අපි හිතනවා. ඉදිරියේදී ඒ පිළිබඳවත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ලංකා ගමනාගමන මණ්ඩලයේ බොහෝ දෙනෙක් අපෙන් ඉල්ලීමක් කළා, කොට්ටාවේ සිට ආරම්භ වන පරිදිත් අධිවේගී මාර්ගයට බස් රථ යොදවන්න කියලා. දැන් අධිවේගී මාර්ගයෙන් දකුණු පළාතට යද්දී මහරගමින් තමයි බස් රථ ආරම්භ වෙන්නේ. එම නිසා කොට්ටාව ප්‍රදේශයේ සිටින අයටත් මහරගමට එන්න සිද්ධවෙලා තිබෙනවා. මහරගම ඉඩ නැති තත්ත්වයකුත් තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති රමාල් සිරිවර්ධන මහතා තීන්දුවක් අරගෙන තිබෙනවා, කොට්ටාවේ සිටත් බස් රථ ආරම්භ කරන්න. කොට්ටාවේ සිට ගමනාගමනය ආරම්භ වන බස් රථ ලබන මාර්තු මාසයේ සිට පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඊයේ පෙරේදා දුම්රිය අනතුරක් වැළැක්වීම පිළිබඳව හිටපු ඇමතිවරයෙක් කථා කළා.

එම දුම්රිය අනතුර වැළැක්වූ පවුලේ දැරියකට ගරු ඇමතිතුමාගේත්, දුම්රිය සාමාන්‍යාධිකාරිතුමාගේත් නිර්දේශය මත ආදේශක තනතුරක් ඉදිරියේදී ලබා දෙන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. අපි අනාරක්ෂිත දුම්රිය ගේට්ටු වෙනුවට Bell and Light System එක සහිත ගේට්ටු 200ක් 2017 වසරේ සවි කිරීමට බලාපොරොත්තු වනවා. ඒ වාගේම 2018 වසරේ තවත් ගේට්ටු 200ක් සවි කිරීමට බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා mike එක on කරන්නේ මට කථාව කෙටි කරන්න කියලා වෙන්න ඇති. කාලය තව පැය භාගයක් විතර තිබෙනවා නේද? ඔබතුමාට ඉක්මනින් ගෙදර යන්නද?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මම අපේ කාර්ය මණ්ඩලයට ස්තුතිය පුද කරමින් කථාව අවසන් කරන්නම්.

අපේ ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති රමාල් සිරිවර්ධන මැතිතුමා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලයට, දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරි ආරියරත්න මැතිතුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජගත් චන්ද්‍රසිරි මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ සභාපති හේමචන්ද්‍ර මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, ජාතික ප්‍රවාහන වෛද්‍ය සභාවේ සභාපති වන අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය පුෂ්පකුමාර මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා සමාගමේ සභාපති සමන් එදිරිවීර මැතිතුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති ආනන්ද විමලසේන මැතිතුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, ලක්දිව ඉංජිනේරු සමාගමේ රවි ගුණවර්ධන මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, මාර්ග අනතුරු පිළිබඳ ජාතික සභාවේ සභාපති ආචාර්ය කෝදාගොඩ මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයේ ලේකම් නිහාල් සෝමවීර මහතා ප්‍රමුඛ අතිරේක ලේකම්වරු ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතියක් පුද කරනවා අද පාර්ලිමේන්තුවට පැමිණ උදේ සිට අපට සහයෝගය දැක්වීම ගැන.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යතුමා මෙම අමාත්‍යාංශයේ කටයුතු හොඳින් ගෙන යන නිසා විවේචනය කරන්න විධියක් නැතුව අද විපක්ෂයේ මන්ත්‍රීවරු කාරක සභා අවස්ථාවේ හිටියේ නැහැ. දැන් දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරු, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු ගරු සභාවේ නැහැ. එතුමන්ලා නැත්තේ අපේ අමාත්‍යාංශය හොඳින් ගෙන යන නිසා, විවේචනය කරන්න දෙයක් නැතිවයි. එම නිසා අපේ ඇමතිතුමාටත්, අපේ නිලධාරි මණ්ඩලයටත් මම විශේෂයෙන් ස්තුතිවන්ත වනවා අපේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ඉතාම හොඳින් කර ගෙන යෑම පිළිබඳව. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අර්ජුන රණතුංග ඇමතිතුමා.

[අ.භා. 5.57]

**ගරු අර්ජුන රණතුංග මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Ports and Shipping)
ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරු කීපදෙනෙක් අපට ප්‍රශ්න වගයක් යොමු කළා. එම ප්‍රශ්නවලට පිළිතුරු දීමට මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

පළමුව මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා අපේ අමාත්‍යාංශය භාරව සිටි ඇමතිවරයෙක් වන ගරු චමල් රාජපක්ෂ මැතිතුමාට. එතුමා වරාය ගැන විශාල අත් දැකීම් තිබෙන කෙනෙක්. එතුමා අපට දුන් උපදෙස් ඉතාම ආදරයෙන් සහ ඕනෑකමින් භාර ගෙන ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන බව මා මතක් කරනවා. එතුමාත්, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් ඔලුවිල් වරාය ගැන ප්‍රශ්නයක් නැඟුවා. ඔලුවිල් වරායේ ප්‍රශ්නය තමයි, ඔලුවිල් වරාය හදපු වෙලාවේ දියකඩනය - breakwater එක - හරි විධියට නිර්මාණය කර නොතිබීම. ඒ නිසා තමයි මේ වන කොට එම ප්‍රදේශයේ ඉඩම් වතුරට යට වෙලා තිබෙන්නේ; මුහුද ගොඩ ගලලා තිබෙන්නේ. අද වන කොට ඩෙන්මාර්ක් රජයේ ප්‍රදානයක් හැටියට ශක්‍යතා වාර්තාවක් කැඳවලා තිබෙනවා. විශේෂඥ පිරිසක් විසින් අපට එම දියකඩනයේ තිබෙන ප්‍රශ්නය ගැන දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ දැනට ආරම්භ කර තිබෙනවා.

ඊළඟට කියන්න ඕනෑ, අපි හිටපු ධීවර අංශයේ ඒ කොටස අපි ධීවර අමාත්‍යාංශයට භාර දීලා තිබෙනවා. හම්බන්තොට වරායේ තිබුණු ප්‍රශ්න කීපයක් ගැනත් කිව්වා. ඒ ගැනත් අපි අවධානය යොමු කරන බව කියන්න ඕනෑ. ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා කන්කසන්තුරේ වරාය ගැන යම් සඳහනක් කළා. එතුමාට මම කියන්න කැමැතියි, කන්කසන්තුරේ වරායේ අපේ ව්‍යාපාර කටයුතු කරන්නේ කොහොමද කියලා අපි මාස කීපයකට ඉස්සෙල්ලා දෙවරක් ගිහිල්ලා නිරීක්ෂණය කළා. අපි අද වන කොට යම් යම් තීරණ අරගෙන තිබෙනවා. ලංකාවට හොර බඩු එන්නේ කන්කසන්තුරේ වරායෙනුයි. නාවික හමුදාව විසින් පසු ගිය කාලයේ විශේෂයෙන්ම මත් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අල්ලලා තිබෙනවා. අපි කල්පනා කරන්නේ, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන ලෙස ඉතාම සූක්ෂමව අදාළ වැටලීම් කරන අතරේ අපේ ව්‍යාපාර කටයුතු කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇහුවා, "නැඟෙනහිර පර්යන්තය සියයට 15ක්ද අපට තිබෙන්නේ?" කියලා. නැඟෙනහිර පර්යන්තය අපි ඉල්ලා තිබෙන්නේ අඩුම වශයෙන් සියයට 15ක්. වැඩිම වශයෙන් සියයට 15ක් නොවෙයි. ඒක නිවැරදි කළ යුතුයි. ඒ වාගේම JCT - Jaya Container Terminal - එක ගැඹුර නැති නිසා තමයි විශාල නැව් ප්‍රමාණයක් අඩු වෙලා තිබෙන්නේ. එතුමා උසස්වීම් ගැන අසා තිබුණා. අද වෙනකොට හත්සිය තිස් ගණනකට අප උසස් වීම් ලබා දී තිබෙනවා. ඒ උසස් වීම් කළේ දේශපාලන පළිගැනීම්වලට ලක්වෙච්ච අය සහ පසුගිය කාලයේ තනතුරු ලැබුණේ නැති අය සඳහායි. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇහුවා, "මීගමුව පැත්තේ රණතුංග වරායකුත් කරනවාද?" කියා. මට නම් එහෙම මානසිකත්වයක් නැහැ, මගේ නම ගහගන්න හෝ අපේ පවුලේ කිසිම කෙනෙකුගේ නම ගහගන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මැරුණායින් පස්සේ ගැහුවාට කමක් නැහැ.

**ගරු අර්ජුන රණතුංග මහතා**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
ඒත් ඕනෑ නැහැ. අපට අවශ්‍ය නැහැ. මොකටද නම් ගහන්නේ? වැඩය කරලා ගියා නම් ඇති. මිනිසුන්ගේ සිතේ තියෙනවා නම් ඇති. නම්වලින් ගහන්න අවශ්‍ය නැහැ. ඒකාබද්ධ විපක්ෂයේ ගරු ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමා කිසිම කරුණක් දන්නේ නැතිව කථා කළා. වෘත්තීය සමිති නායකයෝ ගැන කථා කළා. වෘත්තීය සමිති නායකයෝ කියා ගන්නා කණ්ඩායම තමයි පසුගිය කාලයේ වරාය තනිකර විනාශ කළේ. මම වගකීමකින් කියනවා, ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ නොවෙයි. මව් සංගම්වලින් කිසිම සහයෝගයක් නැතිව මේ ගොල්ලෝ ඒකාබද්ධ සංගමය කියා අලුතෙන් වෙනම එකක් හැදුවා. පසුගිය කාලයේ වරායේ වැඩිම ප්‍රමාණයක් හොරකම් කර

[ගරු අර්ජුන රණතුංග මහතා]

තිබෙන්නේ ප්‍රියත් බන්දුවික්‍රම මහත්මයා ඉන්නකොට වෘත්තීය සමිති නායකයෝ කියන පුද්ගලයෝ. ඒ ගොල්ලන්ව නිදොස් කරන්න හැදුවා.

මගේ කථාවේදී මා කිව්වා, "ආසියාවේ හොඳම වඩු මඩුව වරායේ තිබෙනවා" කියා. එතුමා ඒ ගැන දෝෂාරෝපණයක් කළා. අපි අද වෙනකොට ඒ වඩු මඩුවෙන් මුළු ආයතනවලටම බඩු අරගෙන දෙනවා. ඒකෙන් වෘත්තීය සමිති නායකයින් කියන අයට ගිය මුදල් නැවතිලා තිබෙනවා. හොරුන්ට කත් අදින මන්ත්‍රීවරයෙක් මෙතැන නැති නිසා වැඩියෙන් කථා කරන්නේ නැහැ. ඒකාබද්ධ විපක්ෂය කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ කරන පක්ෂයක් වෙන්නට ඇති. ඒ ගොල්ලන් මෙවැනි දේවල් කථා කරනවා නම්, ඒවාට උත්තර දෙනකොට ඉන්න ඕනෑය කියන එකත් ගරු සභාපතිතුමනි මම කියනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා ඉන්න නිසා මම මේ ගැන වැඩිය කථා කරන්න අවශ්‍ය නැහැ. මම සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වශයෙන් සිටින කාලයේ තමයි කටුනායක ගුවන් පථයත් නවීකරණය කිරීම ආරම්භ වුණේ. අපේ ගරු ඇමතිතුමා ඒක භාර ගත්තාට පස්සේ ඉතාමත් හොඳට කරගෙන යනවා. ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමා කිව්වා, "එන ගුවන් ගමන් සියල්ලම එහාට යවන්නට පුළුවන්" කියා. පස් කපලා පස් එහාට මෙහාට කරනවා වාගේ ලෙහෙසි නැහැ, කටුනායක ගිහිල්ලා මත්තලට ගුවන් යානා යැවීම. ඒවා මාස ගණන් අවුරුදු ගණන් තීරණ ගන්න ඕනෑ දේවල්. මේ ගැන මා ඉන්නකොටත් සාකච්ඡා කළා. ඒක ක්‍රියාත්මක කරන්න බැහැ කිව්වා. පස් එහාට මෙහාට ගෙනියන්න එතුමා පුරුදුවෙලා තිබෙනවා. එවැනි දේවල් හරි ලේසියි. එතුමාගේ දැනුම ගැන කනගාටුවට පත් වෙනවා. ඒ වගේම එතුමා මාරු කිරීම් ගැනත් කිව්වා. වැඩ තහනම් කිරීම් ගැනත් කිව්වා. මා ඉතාමත් වගකීමකින් කියනවා, ගරු සභාපතිතුමනි, මාත් මගේ නියෝජ්‍ය අමාත්‍යවරයාත් ඉන්නතුරු වැරදි කරන කිසිම කෙනෙකුට සමාවක් දෙන්නේ නැහැ කියා. මේ ගොල්ලෝ කියනවා, බීලා අහුවෙච්ච මිනිසුන්ට නැවත වරක් රක්ෂාව දෙන්න කියා; හොරකම් කරපු මිනිසුන්ට නැවත රක්ෂාව දෙන්න කියා. මොකද, පසුගිය කාලය තිස්සේම මේ ක්‍රමවේදයට හැදුණා. අද මේ ක්‍රමවේදයට භය වෙලා. අහුවෙච්ච මිනිස්සු ඒකාබද්ධ කණ්ඩායම ළඟට ගිහින් ඒ ගොල්ලන්ට කියා මේවා පාර්ලිමේන්තුවේදී කථා කරන්නට හදනවා. මා වගකීමකින් කියනවා, කවුරු හෝ මාරු කරනවා නම් රාජකාරි අවශ්‍යතාව මත තමයි මාරු කරන්නේ. වැඩ තහනම් කර තිබෙනවා නම්, ඕනෑම කෙනෙකුගේ වැඩ තහනම් කර තිබෙන්නේ, මේ වාගේ විෂමාචාර වැඩවලට සම්බන්ධ වෙච්ච අයයි. ගරු සභාපතිතුමනි, කිහිප දෙනෙකු ඇසූ ප්‍රශ්නවලට උත්තර දෙන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 6.03]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)

(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු සභාපතිතුමනි, මගේ නියෝජ්‍ය අමාත්‍යතුමා බොහෝ ප්‍රශ්නවලට උත්තර දුන්නා. නමුත් මග හැරී ගිය වැදගත් කරුණු කිහිපයක් තිබෙන නිසා ඒවාට පිළිතුරු දෙන්න අවස්ථාවක් ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා.

පළමුවෙන්ම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, එක්ස්පෝ රාජධානි දුම්රියවලින් අය වියයුතු මුදල් පිළිබඳව. එක සමාගමකින් අපට අය වන්නට තිබුණා. අනෙක් සමාගට අපි ගෙවන්නට තිබුණා. මේ දෙකම දැන් සමථයකට පත් කර අවසානයි. ඒ වාගේම මේ කාරණයත් මා විශේෂයෙන් කියන්නට ඕනෑ. දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා කිව්වා, මත්තල ගුවන් තොටුපළ ගැන. මත්තල ගුවන් තොටුපළ පවත්වාගෙන යන්නේ, හැම අවුරුද්දේම කටුනායකින් හම්බ කරන මුදල්වලින් බිලියන 2.5ක් ණය මුදලයි පොලියයි ගෙවලා.

මාසිකව තවත් මිලියන 70ක් පමණ පඩි නඩිවලට යනවා. සුමානයකට ගුවන් යානා දෙක තුනකට වැඩිය එන්නේ නැහැ. අපි ගුවන් යානාවලට යන්න කිව්වාට එතැනට යන්නේ නැහැ. මොකද, එතැනට ගිහිල්ලා බැහැලා කොහේ යන්නද? ඊට අවශ්‍ය වෙනත් පහසුකම් ඒ ස්ථානයේ නැහැ.

අපි මත්තල ගුවන් තොටු පොළ විකුණන්න බලාපොරොත්තුවක් නැහැ. රජය සමඟ එකතුවෙලා අපේ අයිතිය තියාගෙන වඩාත් ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා ආයෝජකයෙකු සෙවීමේ කටයුතුවල අපි නිරතවෙලා ඉන්න බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි. මත්තල ගුවන් තොටු පොළ විකිණීම අපි කිස්සේත්ම කරන්නේ නැති බවත් මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. ඉදිරියේදී පෞද්ගලික බස් රථ සහ ලංගම බස් රථ ගෙන්වීමේදී නිසි ප්‍රමිතියකින් යුතු බස් ගෙන්වීමට කටයුතු කරනවා. Seat වල ඉඩ කඩ, පහසුකම් පිළිබඳව නව පිරිවිතක් හදලා ඒ අනුව තමයි අපි ඒ බස් ගමනාගමනය සඳහා යොදවන්නේ. විශේෂයෙන්ම ශබ්ද දූෂණය සම්බන්ධව කියන්න ඕනෑ. Private buses ධාවනය කරනකොට සින්දු දානවා; නොයෙකුත් බයිලා දානවා. සමහර වෙලාවට මිනිසුන්ට මේක විශාල කරදරයක්. මේ පිළිබඳවත් අපි පාර්ලිමේන්තු කමිටුවේදී සාකච්ඡා කරලා, අවශ්‍ය නීති රීති ගෙන ඒමට කටයුතු කරන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

දඩ මුදල් අය කරන බවට වූ ආරංචිය පළ වුණා විතරයි අද හැම තැනම දිගු පෝලිම් දක්නට ලැබෙන බව ඔබතුමාත් දන්නවා, ගරු සභාපතිතුමනි. මොකද, කාලාන්තරයක් තිස්සේ insurance cover අරගෙන නැහැ. පොත නැතිව insurance cover ගන්න බැහැ. විවෘත කඩදාසි - open papers - තියාගෙන ඉන්නවා. ඒ නිසා මම හෙට විශේෂ කැබිනට් සන්දේශයක් ගෙන යනවා, දීර්ඝ කිරීමේ කාල සීමාව තවත් මාසයකින් දීර්ඝ කරන්න කියලා. මෝටර් රථ හිමියන්, මෝටර් සයිකල් හිමියන්, ත්‍රී වීලර් රථ හිමියන් මෙතෙක් කල් කරලා තිබෙන වැරැදිවලට දඬුවම් ලබා දෙන බවට අදහස ආ පමණින්ම ඔවුන් ක්‍රියාත්මක වෙලා නීත්‍යානුකූල ලෙස කටයුතු කිරීමට පෙළඹෙන බව දැන් මේකෙන්ම පෙනෙනවා නේද? ඒ කාරණයටත් අපි යම් කාල සීමාවක් ලබා දීමට කටයුතු කරන බව මා කියන්න කැමැතියි.

එසේම අපේ කුමාර වෙල්ගම මැතිතුමා කිව්වා, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේදී කෝච්චියට ගෙනාපු එන්ජින් පිළිබඳව. ඒ M-9 එන්ජින් හයක්, හතක් කොට උඩ. අපි ඒ ගැන හොයලා බැලුවා, ගරු සභාපතිතුමනි. ඒ එන්ජින් හදපු කොම්පැනියත් වහලා. ඉතින් අපි spare parts ගන්නේ කොහොමද? අපි නොයෙකුත් සමාගම් එක්ක සාකච්ඡා කරලා බැලුවා, ඒවා හදන්න පුළුවන්ද කියලා. නමුත් ඒවා හදන්න පුළුවන්කමක් නැහැ. තුනක් හදලා තිබෙනවා. නමුත් අනික් ඒවා හදන්න පුළුවන්කමක් නැහැ. මේ සම්බන්ධයෙන් යම් මුදලක් වියදම් කරලා, ඒවා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට පුළුවන්ද කියලා අපි තවමත් හොයනවා.

සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කිව්වා, "අපි ගත්ත machine එකක් නිකම් චීන ජාතිකයන්ට දීලා තිබෙනවා" කියලා. එහෙම දීලා නැහැ. ඒ අය ඉල්ලලා තිබෙනවා, දුම්රිය දෙපාර්තමේන්තුව වැඩ කරන්නේ නැති අවස්ථාවන්හිදී යම් මුදලක් ගෙවලා ඒ machine එක පාවිච්චි කරන්න. ඒකේ වැරැද්දක් තිබෙන බවක් නම් මට පෙනෙන්නේ නැහැ. ඊළඟට, bell and light system එක ගනිමු. සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කිව්වා, "මෙහි බොහොම දක්ෂ කාර්මික මණ්ඩලයක් සහ සේවක මණ්ඩලයක් ඉන්නවා. මේ ගොල්ලන්ගෙන් ප්‍රයෝජනයක් ගන්නේ නැත්තේ ඇයි?" කියලා. ඒ ගොල්ලන්ගෙන් අපි සම්පූර්ණ වශයෙන් ප්‍රයෝජන ගන්නවා. නමුත් ඒ අයට එක්තරා capacity එකක් තිබෙනවා. ඊට ඉහළින් ගිහිල්ලා වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. දැන් අපි 200කට ටෙන්ඩර් කරලා ආරක්ෂිත දුම්රිය ගේට්ටු සවි කිරීම සඳහා අවස්ථාව ලබා දීලා තිබෙනවා. තවත් දුම්රිය ගේට්ටු 200ක් සවි කිරීම සඳහා අවශ්‍ය මුදල් ලැබිලා තිබෙනවා. අවුරුදු තුනක් ඇතුළතදී බම්බු ගේට්ටු සියල්ලම ආරක්ෂිත ගේට්ටු බවට පත් කිරීමට අපි විසින් සකස් කරන ලද දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් තිබෙනවා.

අපේ චන්දිම වීරක්කොඩි ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා, දුම්රියෙන් වැඩියෙන් තෙල් ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන අපි දැන් යොදාගෙන යනවා. ඒ තුළින් අපේ ආදායම් මාර්ග වැඩි කර ගත හැකියි.

විශේෂයෙන්ම දුම්රිය ඉඩම් පිළිබඳව කියන්න ඕනෑ. දුම්රිය ඉඩම් රාශියක් තිබෙනවා. ඒක ඇත්ත. ගරු සභාපතිතුමනි, නමුත් මේ තිබෙන විශාල ඉඩම් ප්‍රමාණයෙන් අවුරුද්දකට ලැබෙන ආදායම රුපියල් මිලියන 120යි. මේ ඉඩම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට අරගෙන නැහැ. අනවසර පදිංචිකරුවන් වැඩියි. ඒ අය මුදල් ගෙවන්නේ නැහැ. දිනෙන් දින තවතවත් අනවසර ලෙස ඉඩම් අල්ලා ගන්නවා. ඒ නිසා මේ ඉඩම් වඩාත් ඵලදායී සේවාවන් සඳහා පාවිච්චි කිරීමට ඉතා හොඳ වැඩ පිළිවෙළක් දැන් අපි සකස් කර ගෙන යනවා.

දුම්රිය සාමාන්‍යාධිකාරිතුමාගේ බලතල ඉවත් කළේ අපි නොවෙයි. දුම්රිය පනත අනුව බලතල තිබෙන්නේ එතුමාටයි. නමුත් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ විභාග වන නඩුවකදී ඒ කොමිෂන් සභාවේ විනිශ්චයකරුවන් තිදෙනා විසින් නියෝගයක් දීලා තිබුණා, ඒ නඩුව අසා ඉවර වන තෙක් මේ දුම්රිය සාමාන්‍යාධිකාරිතුමාගේ සහ තව කෙනකුගේ බලය තාවකාලිකව ඉවත් කරන්න කියලා. එතකොට අපට ඒක ඉවත් නොකර ඉන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි ඒක ද්වේශ සහගතව හෝ, අපේ වුවමනාවට හෝ කළ දෙයක් නොවෙයි. අපට ලැබුණු නියෝගයක් අනුව තමයි ඒ විධියට බලතල ඉවත් කිරීම කළේ. ඒක තාවකාලික ඉවත් කිරීමක් පමණයි. ඒ නඩුව ඉවර වුණාට පස්සේ ඒ බලතල නැවත එතැනට යනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ පිළිබඳව වෘත්තීය සමිති නිකම් බොරුවට නටන්න හදනවා. ඒකට කිසිම පදනමක් නැහැ. අපි මේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම සිවිල් ගුවන් සේවා අංශය ගැනත් කියන්න කැමැතියි. 2016 ICAO Conference එක ලංකාවේ පැවැත්වූවා. නිමලසිරි මහත්මයා ඇතුළු කණ්ඩායම ඉතාම සාර්ථකව ඒක මෙහෙයවලා අන්තර් ජාතික වශයෙන් විශාල ප්‍රසිද්ධියක් හා ඒ පිළිබඳව ස්තුතියකුත් අපට ලැබුණු බව මම කියන්න ඕනෑ.

මගේ කථාව අවසන් කිරීමට පෙර රිය අනතුරු පිළිබඳවත් කියන්න ඕනෑ. රිය අනතුරු 2013 වර්ෂයේ 37,877යි; 2014 වර්ෂයේ 35,996යි; 2015 වර්ෂයේ 38,107යි; 2016.06.30 දක්වා 19,916යි. එතකොට average එක 38,000ක්, 40,000ක් වෙනවා. මේ අනුව දිනකට පුද්ගලයන් හයදෙනකු විතර මිය යනවා. මේ අනතුරුවලින් සියයට 80ක්ම සිදු වන්නේ නොසැලකිලිමත් රිය පැදවීම නිසායි. ජීවිත ඉතා වටිනවා. ඒ නිසා අපි මේ දඩ මුදල් වැඩි කර තිබෙන්නේ මුදල් අය කර ගැනීමේ පරමාර්ථයෙන් නොවෙයි, රියැදුරන් තුළ යහපත් චර්යාවක් පවත්වලා, ඒ තුළින් නීතිගරුක රියැදුරන් බවට පත් වෙලා අනතුරු ප්‍රමාණය අඩු කර ගන්න ඕනෑ නිසායි. මොකද, ජීවිතයක වටිනාකම අපට මුදලින් මනින්න පුළුවන්කමක් නැහැ.

ගරු සභාපතිතුමනි, මම මෙන්න මේ කරුණු ටික ප්‍රකාශ කරනවා. මේ වැඩ කටයුතු කර ගෙන යාමට විශේෂයෙන්ම මගේ නියෝජ්‍ය ඇමතිතුමා මට විශාල සහයෝගයක් දෙනවා. එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා සහයෝගය ලබා දීම ගැන මගේ නිලධාරීන් සියලු දෙනාටම එතුමා ස්තුති කළා. ලංකා ගමනාගමන මණ්ඩලය පරිහරණය කරන ලද ලොකු ඉඩම් 15ක් පමණ නිදහස් දීමනා පත්‍ර මඟින් ලංකා ගමනාගමන මණ්ඩලයට ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට මම ස්තුති කරනවා. ඒ නිසා තමයි EPF, ETF ප්‍රශ්නය විසඳා ගැනීමට අපට පුළුවන් වුණේ. ඒ වාගේම මේ කාරණයේදී ගරු අගමැතිතුමාත් ආර්ථික සංවර්ධන කමිටුවේදී මට විශාල සහයෝගයක් ලබා දුන්නා. මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා ගැනත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. එතුමා ලංගම සේවකයන්ගේ ප්‍රශ්නය පිළිබඳව ඉතා සානුකම්පිතව කල්පනා කරලා අවශ්‍ය සෑම අවස්ථාවකදීමෙ, පඩිනඩි ආදිය ගෙවීම සඳහා අවශ්‍ය මුදල් නිසි වේලාවට ලබා දෙනවා. මොන අමාරුකම් තිබුණත් ලංකා ගමනාගමන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම සඳහා රුපියල් බිලියන 5ක පමණ මුදලක් අපට ලබා දී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ නිසා අපේ මේ ජාතික රජය තුළින් ගමනාගමන ක්ෂේත්‍රයේ තිබුණු අඩුපාඩුකම් රාශියක් මඟහරවා ගෙන, තිබුණු ප්‍රශ්න රාශියක් විසඳා තිබෙනවා. මේ අවසානය නොවෙයි, අලුත් ගමනක ආරම්භය පමණයි. අපි මේ අවුරුද්දේ ඒ අලුත් ගමන යනවා. එහෙම ඉදිරියට ගිහිල්ලා වඩාත් සතුටුදායක ප්‍රවාහන සේවයක් ජනතාවට ලබා දීම සඳහා කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමනි, උත්තර දීමට බැරි වුණු කාරණා රාශියක් තිබෙනවා. ඒ නිසා මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එය හැන්සාඩගත කරන්න.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

2016 වසර තුළ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සිදු කළ මෙහෙවර

2015 වසරේ නව සම්මුතිවාදී රජය බිහිවීමත් සමඟ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා කැබිනට් අමාත්‍යවරයා වශයෙන් මටත් මාගේ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයටත් පැවරුණේ අභියෝගාත්මක විෂයය පථයකි. දුම්රිය සේවයත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයත් වැටී තිබූ ඛේදජනක තත්ත්වයෙන් ගොඩ ගෙන තෘප්තිමත් සේවාවක් ජනතාවට ලබා දීම මෙන්ම සේවක මහත්ම මහත්මීන්ගේ කාලාන්තරයක් තිස්සේ නොවිසඳුණු ප්‍රශ්න හා ගැටලු නිරාකරණය කිරීමේත් බරපතළ කාර්ය භාරයක් අප වෙත පැවරිණ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින් සඳහා මාසිකව අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු කාර්ය මණ්ඩල නිලධාරින්ගේ හා සේවකයන්ගේ වැටුපෙන් ගෙවනු ලබන මුදල් හා ආයතනයේ දායක මුදල් වසර ගණනාවක් තිස්සේ නොගෙවීම හේතුවෙන් සේවක කාර්ය මණ්ඩලය විශ්‍රාම යාමේ දී අපහසුතාවට පත් වන අතරම, රජයේ අරමුදලකට ලැබිය යුතු විශාල දායක මුදලක් නොලැබෙන තත්ත්වයකට ශ්‍රී ලංගම පත්ව තිබූ අතර, එය 2015 සැප්තැම්බර් වන විට රුපියල් බිලියන 11ක හිඟ මුදලක් දක්වා වර්ධනය වී තිබුණි. මෙය වැළැක්වීම සඳහා භාණ්ඩාගාරය මඟින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ප්‍රතිපූරණය කරනු ලබන මුදල්වලින් පසු ගිය වසරේ සිට සියලු සේවකයන්ගේ සේවා සේවක දායක මුදල E ගෙවීම් මඟින් ගෙවීමට කටයුතු කරන ලදී. 2016 වර්ෂය තුළ දී පමණක් රු. මිලියන 2,146.902ක මුදලක් අර්ථසාධක අරමුදල වෙත මේ සඳහා ගෙවා ඇත. ඒ අනුව අර්ථසාධක අරමුදලේ හිඟය රු.බිලියන 7.2 දක්වා අඩු වී ඇත. තවද, 2015 සැප්තැම්බර් මාසයේ සිට සියලු අර්ථසාධක මුදල් නිසි කලට ගෙවන ලදී.

විශ්‍රාම ගිය සේවකයන්ට ගෙවිය යුතු අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ඔවුන් වෙත නොලැබීම හේතුවෙන් විශාල සේවක සංඛ්‍යාවක් නඩු මඟට යොමු වී ඇති අතර, මෙමඟින් මාසිකව සුවිශාල අමතර මුදලක් නඩු වෙනුවෙන් හා ඒවායේ පරිපාලන කටයුතු සඳහා ද වැය කිරීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සිදුව ඇති බැවින්, එම තත්ත්වය වැළැක්වීමේ අරමුණින් අවම මුදල් ප්‍රමාණයක් ගෙවීමට පවතින ප්‍රාදේශීය කාර්යාල තෝරා ගනිමින්, එම මුදල් එකවර නිරවුල් කිරීමේ කටයුතු පසු ගිය මාස දෙකක කාලයක සිට ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට ඌව, නැඟෙනහිර, රජරට, නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලවලට අදාළව EPF නඩු සඳහා ගෙවීමට ඇති සම්පූර්ණ මුදල් ගෙවා අවසන් කිරීමට රුපියල් මිලියන 512.808ක මුදලක් ශ්‍රී ලංගම වෙත ලබා දී ඇති අතර, භාණ්ඩාගාරයෙන් ලබා දෙනු ලබන දායක මුදල් උපයෝගි කර ගනිමින් 2017 අප්‍රේල් මස වන විට, 2016 මැයි 01 දින දක්වා පවරා ඇති සියලු අර්ථ සාධක නඩු සඳහා මුදල් ගෙවා නිම කිරීමට සැලසුම් කර ඇත.

සංස්ථාපිත රාජ්‍ය ආයතන කාර්ය මණ්ඩලය විශ්‍රාම යෑමේදී ඔවුන්ට හිමි විශ්‍රාම පාරිතෝෂිකය එකවර ගෙවිය යුතු වුවද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මෙම මුදල් නොගෙවීම නිසා විශ්‍රාම ගිය ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ විශ්‍රාමික සේවක පිරිසක් ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇත. මෙය වැළැක්වීම අරමුණු කර ගනිමින් මවිසින් යොදන ලද වැඩ පිළිවෙළ අනුව නීතිමය ක්‍රියා මාර්ග ගෙන නොතිබූ කාර්ය මණ්ඩලය සඳහා රුපියල් මිලියන 265.968ක මුදලක්ද, නඩු කටයුතු සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ පැමිණිලි සඳහා රුපියල් මිලියන 460.653ක මුදලක්ද, දැනට අධිකරණ තීන්දු මත වාරික ගෙවීම් කරනු ලබන කාර්ය මණ්ඩල සේවකයින් වෙනුවෙන් එම අධිකරණ වෙත එකවර ගෙවීම සඳහා රුපියල් මිලියන 426.451ක මුදලක් ද ලබා දීමට කටයුතු කරන ලද අතර, ලබන වසරේ මාර්තු වන විට එලෙස හිඟ පාරිතෝෂික මුදල් සියල්ල නිරවුල් කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නිෂ්පාදකයන්ගෙන් ලබා ගන්නා ලද පෙරසවි ටයර් සැපයුම්කරුවන් සඳහා ගෙවීමට හිඟව තිබූ විශාල මුදලක් නිරවුල් කිරීම සඳහා මසකට රුපියල් මිලියන 40 බැගින් රුපියල් මිලියන 410ක මුදලක් ද අදාළ සැපයුම්කරුවන්ට ගෙවීමට ශ්‍රී ලංගම වෙත ලබා දෙන ලදී.

අමතර කොටස්කරුවන්ට පසු ගිය වර්ෂවලදී ගෙවීම් නොකිරීම නිසා විශාල මුදලක් ගෙවීමට හිඟව තිබූ අතර, සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත අමතර කොටස් ලබා නොදෙන තත්ත්වයකට පත්ව තිබූ අතර, අශෝක් ලේලන්ඩ් ආයතනය මඟින් 2014/2013 වර්ෂවල ශ්‍රී ලංගම වෙත ගෙන්වා තිබූ අමතර කොටස් ගබඩාවලින් නිදහස් නොකර, ඒ සඳහා ගබඩා නඩත්තු වියදම් සහ වටිනාකම් සඳහා අමතර පොලී සහ ගාස්තු වටිනාකමට එක් කරමින් පැවති අතර, එම ආයතනය සමඟ සාකච්ඡා කර එම මුදල් කොටස් වශයෙන් ගෙවීමට එකඟ කරවා ගෙන එම අමතර කොටස් නිදහස් කිරීමට කටයුතු කළ අතර, මෙලෙස අමතර කොටස් සඳහා හිඟව තිබූ මුදල් නිරවුල් කිරීම සඳහා රු. මිලියන 119.71ක මුදලක් මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර, භාණ්ඩාගාරයෙන් ලබා දෙන මුදල් කළමනාකරණය කරමින් ඉදිරි වසර තුළ දී මෙම ණය මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

විශ්‍රාම ගිය සේවකයන්ගේ අපහසුතා මඟහැරීම සඳහා අර්ථසාධක හා පාරිතෝෂික හිඟ මුදල් නිරවුල් කිරීමට ඉහත පරිදි කටයුතු කරන ලද අතර, සැපයුම්කරුවන්ගේ ණය මුදල් නිරවුල් කිරීමටද, සැලසුම් කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින අධික ණය බර අවම කිරීමට හැකි සියලු පියවර ගෙන ඇත.

එමෙන්ම, ශ්‍රී ලංගම බස් රථ ඇණිය වැඩි දියුණු කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලද දායක මුදල් කළමනාකරණය කරමින් රුපියල් මිලියන 88.431ක මුදලක් ඒ සඳහා ලබා දෙමින් අමතරව බස් රථ 273ක සංඛ්‍යාවක් මෙම වසර තුළ අලුත්වැඩියා කිරීම සිදු කර ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට බලවත් අඩුපාඩුවක්ව පැවැති ටිකට් මැෂින් නොමැති වීම මඟින් ඇති වී ඇති අපහසුතාව වළක්වා ගැනීමේ අරමුණින් රුපියල් මිලියන 115.0ක මුදලක් යොදවා ටිකට් මැෂින් 3,800ක් මේ වසර තුළ දී ලබා දෙන ලද අතර, වසර අවසානයට පෙර තවත් ටිකට් මැෂින් 600ක් මිල දී ගැනීමට සැලසුම් කර ඇත. ඒ සඳහා රු. මිලියන 18ක් ලබා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංගම සියලු බස් රථ සඳහා මේ වසර අවසන් වන විට ඉලෙක්ට්‍රොනික් ටිකට් මැෂින් සපයා දීමේ කාර්යය සම්පූර්ණ කරනු ඇත. නව ටිකට් මැෂින් මඟින් නවීන තාක්ෂණ ක්‍රමවේදයන් යටතේ සියලුම ආදායම් පරිගණකගත කිරීම සැලසුම් කර, ඒ සඳහා රුපියල් මිලියන 6.696ක මුදලක් යොදවා පරිගණක යන්ත්‍ර 50ක් මිලදී ගෙන ඇති අතර, ඉතිරි ඩිපෝ සඳහා අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට අවශ්‍ය තවත් පරිගණක යන්ත්‍ර 25ක් වසර අවසාන වන විට මිලදී ගැනීමට සැලසුම් කර මුදල් ලබා දී ඇත. එමෙන්ම සියලුම බස් රථ සඳහා පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය හඳුන්වා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර ඒ සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.

ඉහත සඳහන් කළ අයුරින් ශ්‍රී ලංගම පවතින අධික ණය බර උපරිම මූල්‍ය ශක්තිය යොදවා අවම කර ගැනීමට කටයුතු කරන ලද අතර, මඟී අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් උපරිම බස් රථ ප්‍රමාණය ධාවනය කිරීමට හැකි වන පරිදි බස් රථ අලුත්වැඩියා කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. එමෙන්ම, නව තාක්ෂණයට අනුව, මූල්‍ය පරිපාලන කටයුතු වඩාත් ක්‍රමවත්ව හා වේගවත් කිරීම අරමුණු කර ගනිමින් ඉලෙක්ට්‍රොනික් ටිකට් මැෂින් යන්ත්‍ර සම්පූර්ණ අවශ්‍යතාව සහ ඊට සමගාමීව කටයුතු පහසු කිරීම සඳහා පරිගණක යන්ත්‍ර මිල දී ගැනීමට ද මේ වසර තුළ දී කටයුතු කරනු ඇත.

ඉවත් කළ බස් රථ 500ක් සඳහා නව එන්ජින් කට්ටල 500ක් ඉන්දියානු ණය සහන පදනම මත ලබා ගැනීමටත් කටයුතු සම්පාදනය කර ඇත. තවද, පැරණි බස් රථ 1,000ක් අලුත්වැඩියා කටයුතු කිරීම සලකා බලන ලද අතර, ඒ සඳහා යන විශාල වියදම සැලකිල්ලට ගෙන ඒ වෙනුවට නව බස් රථ 1,000ක් මිල දී ගැනීම වඩාත් ලාභදායක බැව් පෙනී ගිය හෙයින් එම මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා දුම්රිය සේවාවේ තිබූ ප්‍රධාන ගැටලුවක් වූයේ දුම්රිය ධාවනය සඳහා අවශ්‍ය දුම්රිය රියැදුරන්, දුම්රිය ගාඩ්වරුන් ඇතුළු කාර්මික ක්ෂේත්‍රයේ පැවැති හිඟයත්, වසර ගණනාවක් තිස්සේ දුම්රිය සේවකයන්ට උසස්වීම් ලබා නොදීමත් නිසා ඇති වූ පරිපාලනමය ගැටලුය. මෙය විසඳීම සඳහා දුම්රිය රියැදුරන් 125කට අධික ප්‍රමාණයක්, දුම්රිය ස්ථානාධිපතිවරුන් 200කට අධික ප්‍රමාණයක් හා දුම්රිය ගාඩ්වරුන් 200කට අධික ප්‍රමාණයක් තරග විභාග මඟින් ඉතාමත් පාරදෘශ්‍ය ලෙස බඳවා ගත් බව සතුටින් ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කර උසස්වීම් ලබා දීමට අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කර තිබේ.

දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වඩාත් පුළුල් කරමින් ත්‍රිකුණාමලය සිට පුත්තලම දක්වා ගල් අඟුරු ප්‍රවාහනය කිරීම ද අරම්භ කොට විශාල ආදායමක් ලබා ගැනීමට හැකි වූ අතර, ඉදිරියේදී සිමෙන්ති, පිටි හා ඉන්ධන ප්‍රවාහනය කිරීම තුළින් දුම්රියට නව ආදායම් මාර්ග ලබා ගැනීමටත්, එමඟින් මාර්ග තදබදයට විසඳුම් ලබා දීමටත් පරිසර හානිය අවම කර ගැනීමටත් හැකි වීම ගැන අපට සතුටට පත් විය හැකිය.

දුම්රිය දෙපාර්තමේන්තුවේ සුවිශේෂී වූ කාර්යයන්වල එකතුවත් සමඟ දුම්රිය සේවාව 2015 වර්ෂය හා සසඳන විට මූල්‍ය හා මෙහෙයුම් කටයුතුවල මෙන්ම සමස්ත ආදායමේ හා මඟී ප්‍රවාහනයේ වර්ධනීය ප්‍රවණතාවක් 2016 මැද භාගය වන විට ළඟා කර ගැනීමට සමත් වී ඇත.

රටෙහි අගනුවර වන කොළඹ තදාසන්න කලාපය තුළ දුම්රිය සේවාව වැඩි දියුණු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් කිරීමට ආසියානු සංවර්ධන බැංකුව හා එක්ව වැඩ ආරම්භ කර ඇත. විදුලි දුම්රිය ශ්‍රී ලංකා දුම්රිය සේවයට හඳුන්වා දීමේ මූලික අරමුණ ඇතිව වේයන්ගොඩ, පානදුර අතර කොටසේ ශක්‍යතා අධ්‍යයනයද ආසියානු සංවර්ධන බැංකු අරමුදල යටතේ ඉටු වෙමින්පවතී. මහා භාණ්ඩාගාරය යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන යටතේ කැලණිවැලි දුම්රිය මාර්ගයේ දුම්රිය ස්ථාන පුනරුත්ථාපන කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

කැලණිවැලි දුම්රිය මාර්ගය හා දිවයිනේ වෙනත් දුම්රිය මාර්ග ඉඩම් අනවසරයෙන් අල්ලා ගෙන පදිංචිව සිටින පුද්ගලයන්ට විකල්ප ස්ථාන ලබා දී දුම්රිය මාර්ග නිසි ලෙස සකස් කිරීම සඳහා දැනටමත් මූලික පියවර ආරම්භ කොට ඇත. ඉන්දියානු සහන ණය ක්‍රමය යටතේ දුම්රිය එන්ජින් කට්ටල, දුම්රිය පෙට්ටි ඇතුළු දුම්රිය ගමනාගමනයට අවශ්‍ය භාණ්ඩ මිල දීගැනීමටත්, උඩරට දුම්රිය මාර්ගයේ ධාවනය සඳහා සුදුසු දුම්රිය එන්ජින්මිල දී ගැනීමටත් අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. මේ යටතේ මෑතකදී කැබිනට් මණ්ඩල අනුමැතිය යටතේ බලවේග කට්ටල 6ක්, දුම්රිය එන්ජින් 10ක්, උඩරට දුම්රිය මාර්ගය සඳහා එන්ජින් 12ක් හා මැදිරි, මඟී මැදිරි 160ක්, තෙල් ටැංකි 30ක්, කන්ටේනර් ප්ලැට් 20ක් හා ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග පද්ධති මිල දී ගැනීමට කටයුතු කර ඇති අතර, ඒ සමඟ දුම්රිය සේවාව තවත් කාර්යක්ෂම වනු ඇත. තවද දුම්රිය ඉඩම් හා ගොඩනැඟිලි වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩි ආදායමක් ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර ඇත.

දුම්රිය හා බස් ගමනාගමන ක්ෂේත්‍රයන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කරමින් වඩාත් ප්‍රශස්ත ගමනාගමන සේවාවක් ජනතාවට ලබා දීම සඳහා මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සමඟ අත්වැල් බැඳ ගනිමින් සිය දායකත්වය ලබා දීමට ද ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය කටයුතු කර ඇත.

ප්‍රවාහන ක්ෂේත්‍රයේ ශීඝ්‍ර දියුණුවක් සනිටුහන් වීමත් සමඟම මෝටර් වාහන ලියාපදිංචිය, නියාමනය, රියැදුරු බලපත්‍ර නිකුත් කිරීම, මාර්ග ආරක්ෂාව හා පරිසර හිතකාමී වාහන භාවිතය යනාදී කර්තව්‍යයන් ඉටු කිරීම උදෙසා නවීන තාක්ෂණය උපරිම ලෙස භාවිත කරමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වැදගත් කාර්ය භාරයක් අරඹා ඇත.

මෙහිදී නවීන තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කරමින් රියැදුරු බලපත්‍ර හා වාහන අංක තහඩු ලබා දීමේ ක්‍රියාවලිය සාර්ථකව ඉටු කර ඇත. දශක ගණනාවක් තිස්සේ ගොඩ ගැසී ඇති ලක්ෂ 60කට අධික ලිපිගොනු ක්‍රමවත්ව අසුරා තැබීම සඳහා ගොඩනැඟිල්ලක් ඉදි කිරීමේ කටයුතු අවසන් කොට ඇති අතර, මෙම ලිපිගොනු සියල්ලම පරිගණකගත කොට සුරක්ෂිත කිරීමේ වැඩ කටයුතු දැන් ආරම්භ කොට ඇත. මෝටර් රථ දෙපාර්තමේන්තුවේ සිදු වන අක්‍රමිකතාවන් වැළැක්වීම සඳහාත්, ජනතාවට වඩාත් සමීප සේවාවක් ලබා දීම සඳහාත් " ඊ-මොනිටරින්" සේවාව ක්‍රියාත්මක කිරීමේ මූලික අදියර දැන් ආරම්භ කොට තිබේ.

මාර්ගගත සම්බන්ධතාව (On Line) හා මාර්ගගත නොවන සම්බන්ධතාව (Off Line) මඟින් වේරහැර කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල හරහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සිදු වේ. අනෙකුත් කාර්යයන්වල වර්ධනයක් පෙන්නුම් කරන අතර පෙර වසරට සාපේක්ෂව රියැදුරු බලපත්‍ර සංශෝධනය කිරීමේ ප්‍රවණතාව අඩු මට්ටමක් පෙන්නුම් කරයි. පෞද්ගලික හා පොදු වාහන සංඛ්‍යාව අධික ලෙස වැඩි වීමත් සමඟ නාගරික හා අර්ධ නාගරික පෙදෙස්වල ඇති වන වායු දූෂණය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වායු විමෝචන නියාමන වැඩසටහන On Line කිරීම මත e-revenue licence ලබා ගැනීමේ පහසුකම ජනතාවට ලැබී ඇත. ඊ- මොනිටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රසම්පාදන ලේඛන සඳහා මේ වන විටත් අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පදන කමිටුව වෙතින් අනුමැතිය ලබා ගෙන ඇත.

රියැදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා ජනතාවට අත්වැලක් වීමට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ දිස්ත්‍රික් කාර්යාල නවීකරණය කොට "ඔන්ලයින්" සේවාව ආරම්භ කිරීම ද මෙම වසර තුළ සිදු වූ සුවිශේෂී කාර්යයකි.

ලක්දිව ඉංජිනේරු ආයතනය බස් බොඩි සැකසීමෙන් ඔබ්බට යමින් දුම්රිය මාර්ග නඩත්තුවට අවශ්‍ය මෙවලම් කට්ටල් ඉතා අඩු මුදලකට නිෂ්පාදනය කර දුම්රිය දොර්තමේන්තුවට ලබා දීමට කටයුතු කොට සිය සේවා ක්ෂේත්‍රය පුළුල් කර ඇත. තවද, සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම සාමාන්‍යයෙන් බස් රථයක් අලුත්වැඩියා කිරීමට ගත වන කාලය වන මාස 2 1/2ක කාලය මාස 1 1/2 දක්වා අඩු කර ගැනීමට මේ වසර තුළ කටයුතු කර ඇත.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්ව මාර්ග අනතුරු අවම කිරීම සඳහා නව නිර්මාණාත්මක වැඩ පිළිවෙළවල් රාශියක් ක්‍රියාත්මක කර තිබීම අතිශයින්ම ප්‍රශංසනීය වේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක ගැටලු නිරාකරණය කරමින් පෞද්ගලික බස් රථ ධාවකයන්ගේ ඉල්ලීම්වලට සවන් දෙමින් ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියේ වෙනස් විය යුතු යම් යම් කරුණු වෙනස් කරමින් කාලීන වශයෙන් නීත්‍යානුකූලව ඔවුනට සහනයක් ලබා දීමට කටයුතු කිරීමට හැකිවීම පිළිබඳව මම සතුටු වෙමි. තවද ඉතාමත් පාරදෘශ්‍යභාවයකින් යුතුව බස් රථ ධාවන අවසර පත්‍ර නිකුත් කිරීම සිදු කරන අතර, එමඟින් සැමට සාධාරණයක් ඉටු වී ඇත.

සහනදායී ගාස්තු ක්‍රමයක් යටතේ පාසල් සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක වන සිසු සැරිය හා ග්‍රාමීය ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් අඛණ්ඩව විශ්වසනීයව හා ලාභදායීව සැපයීම අරමුණු කර ගෙන ඇති කරන ලද ගැමිසැරිය හා නිසිසැරිය මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වේ. ත්‍රස්තවාදී ගිනිසිළු මැද තම දිවි පෙවෙත ගත කළ උතුරු පළාතට සංවර්ධනයේ අරුණලු උදා වීමත් සමඟ වවුනියා නගරයේ ගොඩ නඟන ලද නවීන පහසුකම් සහිත බස් නැවතුම්පොළෙහි දෙවන අදියරෙහි වැඩ නිම කර වසර අවසානයට පෙර ජනතා අයිතියට පවරා දීමට නියමිතය.

කටුනායක, රත්මලාන හා මත්තල ගුවන් තොටු පොළවල් පාලනය කිරීමට ඇති සී/ස ගුවන්තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, කටුනායක ගුවන් තොටුපොළේ වසර 28ක් පැරණි ගුවන් ධාවන පථය නවීකරණය කිරීමේ අභියෝගාත්මක කාර්යය භාර ගනිමින් ඒ සඳහා රුපියල් මිලියන 7,500ක් වෙන් කොට එය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව දැනටමත් ප්‍රදානය කොට ඇත.

ගුවන් මඟීන් මිලියන 06කට සේවය සැපයීම සඳහා ඉදි කරන ලද කටුනායක ගුවන් තොටුපොළ දැනට ගුවන් මඟීන් මිලියන 09කට සේවා පහසුකම් සපයයි. 2020 වසර වන විට පැමිණෙන ගුවන් මඟීන් මිලියන 20ක් දක්වා වැඩි වේයැයි උපකල්පනය කර තිබේ. මෙම අවශ්‍යතාවට මුහුණ දීම සඳහා කටුනායක ගුවන් තොටුපොළේ දෙවෙනි පර්යන්ත ගොඩනැඟිල්ල ජපානයේ ජයිකා ආයතනයෙන් රුපියල් බිලියන 68ක සහන ණයක් ලබා ගනිමින් ඉදි කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය මූලික ක්‍රියා මාර්ග ගෙන ඇති අතර, එහි පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් හා දෙවැනි අදියර 2017 අප්‍රේල් මාසයේදී ආරම්භ කිරීමටත් සැලසුම් කර තිබේ. මීට අමතරව නවීන තාක්ෂණ උපකරණ ලබා ගනිමින් ගුවන් තොටු පොළේ මෙහෙයුම් කටයුතු අන්තර් ජාතික තත්ත්වයට ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු කිරීමත්, ගුවන් ගමන් පාලකවරුන් ඇතුළු වෘත්තිකයින් සඳහා සුවිශේෂී පුහුණුවක් ලබා දීම තුළින් ගුවන් පාලන කටයුතු හා සේවාවන් ගුණාත්මකභාවය ඉහළ මට්ටමකට ගෙන ඒමට සමත් වී ඇති අතර, මනා පරිපාලනයක් තුළින් ගුවන් තොටු පොළ ආදායම වැඩි කර ගැනීමට කටයුතු කර තිබේ. මත්තල ගුවන් තොටු පොළ වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා විදේශ ආයෝජකයකු තෝරා හවුල් ව්‍යාපාරයක් වශයෙන් එය දියුණු කිරීමට පියවර ගනිමින් සිටී.

සිවිල් ගුවන් සේවා අධිකාරිය ශ්‍රී ලංකාව තුළ හා ඉන් අවට ගුවන් ගමන් විෂය පථය පිළිබඳව ජාතික වශයෙන් හා ජාත්‍යන්තරව පැවරුණු වගකීම් මනා ලෙස ඉටු කර ඇති අතර, විදේශ නියෝජිතයින් 500කට අධික පිරිසක් සහභාගී වෙමින් පැවැති ICAO සමුළුවක් ශ්‍රී ලංකාවේ පැවැත්වීමට කටයුතු කළ අතර, එයින් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර කීර්තියක් ද අත් විය. ජාත්‍යන්තර ගුවන් ගමන් වර්ධනය සඳහා නව විදේශීය ගුවන් මෙහෙයුම් සමාගම් 05ක් සඳහා ගුවන් මෙහෙයුම් සහතික නිකුත් කිරීමද මෙම වසරේදී සිදු කරන ලදි. තවද ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තර ගුවන් ගමන් වඩාත් ශක්තිමත් කිරීම සඳහා මඩකලපුව ගුවන් තොටුපොළ රුපියල් මිලියන 1,000ක පමණ වියදමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලද අතර, සිවිල් ගුවන් සේවා අධිකාරියේ නව පාලන ගොඩනැගිල්ල කටුනායක ගුවන් තොටුපොළ ආශ්‍රිතව ඉදි කිරීමට මෙම වර්ෂය තුළ ආරම්භ කරන ලදී. එහි කටයුතු 2017 වර්ෂයේදී නිම කිරීමට නියමිතය. සිවිල් ගුවන් සේවාවේ ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා ඉතා සුවිශේෂී පියවරයන් ලෙස ජාතික ආරක්ෂණ කමිටුව ප්‍රතිසංශෝධනය කිරීම හා එය නැවත නව මුහුණුවරකින් ආරම්භ කිරීම, සිවිල් ගුවන් සේවා ආරක්ෂාව පිළිබඳ නව ජාත්‍යන්තර ප්‍රමිතීන් ඇතළත් කිරීම සඳහා ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂක වැඩ පිළිවෙළ සමාලෝචනය කිරීම ආරම්භ කිරීම, සිවිල් ගුවන් සේවා අවිනිශ්චිත අවස්ථා කළමනාකරණ වැඩසටහන ආරම්භ කිරීම යනාදී කර්තව්‍යයන් පෙන්වා දිය හැක. තවද, සිවිල් ගුවන් ගමන් රට තුළ ප්‍රචලිත කිරීම සඳහා සිවිල් ගුවන් සේවාවට අදාළ ජාතික ප්‍රතිපත්තියක් දැනටමත් කෙටුම්පත් කර තිබේ. දැනට වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති ගුවන් තොටුපොළ ධාවන පථයේ අලුත්වැඩියා කටයුතු ජනවාරි 08වැනි දා සිට අප්‍රේල් 06 දක්වා දිනකට පැය 08 බැගින් ගුවන් තොටුපොළ වසා දමා සිදු කරනු ලබන අතර ඉන්පසු A380 ගුවන් යානා ද ගොඩ බැස්සීමට අපගේ ධාවන පථය සුදුසු මට්ටමකට පත් වනු ඇත.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

පසු ගිය වර්ෂය හා සසඳන කළ 2016 වර්ෂයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි මුළු වාණිජමය ගුවන් යානා සංචලන ආදායම 15%ද, මුළු මඟී සංචලන ආදායම 10%ද හා මුළු ගුවන් භාණ්ඩ සංචලන 12%ද වර්ධනයක් පෙන්නුම් කරයි. ඇමෙරිකානු ඩොලර් මිලියන 560ක ආයෝජනයක් සමඟින් මෙහි 02වන පර්යන්තය ඉදි කිරීමේ කටයුතු, පැකේජ 02ක් යටතේ සිදු වන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු මෙම වසරේ අවසන් කිරීමට නියමිතව ඇත. මෙමගින් මඟීන් හැසිරවීමේ ධාරිතාව වසරකට මිලියන 06 සිට 15 දක්වා වර්ධනය වනු ඇති අතර, අන්තර් මඟී ප්‍රදේශයෙහි සංක්‍රමණික අවකාශය වර්ග අඩි 6,000කින් ඉහළ නංවමින් අන්තර් මඟීන් හැසිරවීමේ ධාරිතාවද ඉහළ නංවනු ඇත.

මත්තල ගුවන් තොටුපොළ වෙත ගුවන් යානා ගෙන්වා ගැනීමේ අභියෝගයට මුහුණ දීමට සිදුව ඇත. මෙම ගුවන් තොටුපොළ ගුවන් සේවා ක්ෂේත්‍රයේ වඩාත් ඵලදායී ගුවන් තොටුපොළක් බවට පත් කිරීමට දේශීය හා විදේශීය ආයෝජකයන් සමග කටයුතු කිරීමට තීරණය කරන ලදී. ඒ සඳහා හඳුනා ගත් ආයෝජකයන් තෝරා ගැනීම දැනටමත් ආරම්භ කර ඇති අතර, ඒ අනුව සුදුසු ආයෝජකයකු තෝරා ගෙන මෙම ගුවන් තොටුපොළ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීමට අදහස් කෙරේ. දැනටමත් මෙම ගුවන් තොටුපොළ ඉදි කිරීම සඳහා ලබා ගත් ඇමෙරිකානු ඩොලර් මිලියන 190ක් වෙනුවෙන් වර්ෂයකට ණය වාරික හා පොලී වශයෙන් ශ්‍රී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම උපයන මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 16.7ක් ගෙවනු ලැබේ.

ඉදිරි වර්ෂය තුළ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වඩාත් ශක්තිමත් හා ජනතා සේවය සඳහා පූර්ණ වශයෙන් කැප වූ ආයතනයක් බවට පත් කිරීමටත්, දුම්රිය සේවාව නවීකරණය කරමින් සුරක්ෂිත හා ගුණාත්මක ගමනාගමන සේවාවක් ලබා දීමටත් රත්මලාන හා කටුනායක ගුවන් තොටුපොළවල් ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතියට ඔසවා තබමින් සංචාරක ක්ෂේත්‍රය හා අන්තර් ජාතික ගුවන් සේවාවන් සඳහා ප්‍රශස්ත මධ්‍යස්ථාන බවට පත් කිරීම අපගේ අරමුණයි.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුදල් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමුඛත්වයක් ලබා දීමෙන් කලට වේලාවට ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමාට විශේෂ ස්තුතියක් ප්‍රදානය කරන අතර, මෙවන් වූ අතිවිශාල කාර්යභාරයක් ඉටු කර ගැනීමට දායකත්වය සැපයූ ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් නිහාල් සෝමවීර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අනුබද්ධිත සියලුම ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල සේවක මහත්ම මහත්මීන්ටත්, මාගේ අමාත්‍යාංශයට සම්බන්ධ සියලුම වෘත්තීය සමිති නායකයින්ටත් මාගේ කෘතවේදී ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ස්තුතියි.

"122 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.909,384,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

122 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.1,878,700,000

"122 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.1,878,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

122 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.462,690,000

"122 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.462,690,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

122 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.247,000,000

"122 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.247,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

122 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**210 වන ශීර්ෂය. - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.203,147,000

"210 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.203,147,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

210 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.32,450,000

"210 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.32,450,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

210 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**211 වන ශීර්ෂය.- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.1,895,098,000

"211 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.1,895,098,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

211 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.106,100,000

"211 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.106,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

211 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 909,384,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,878,700,000

"தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,878,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 462,690,000

"தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 462,690,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 247,000,000

"தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 247,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 122, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 210.- தகவல் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 203,147,000

"தலைப்பு 210, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 203,147,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 210, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 32,450,000

"தலைப்பு 210, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 32,450,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 210, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 211.- அரசாங்க அச்சகத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,895,098,000

"தலைப்பு 211, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,895,098,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 211, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 106,100,000

"தலைப்பு 211, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 106,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 211, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 909,384,000, for Head 122, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 122, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 1, 878,700,000

Question, "That the sum of Rs. 1,878,700,000, for Head 122, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 122, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 462,690,000

Question, "That the sum of Rs. 462,690,000, for Head 122, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 122, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 247,000,000

Question, "That the sum of Rs. 247,000,000, for Head 122, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 122, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 210. - DEPARTMENT OF INFORMATION

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 203,147,000

Question, "That the sum of Rs. 203,147,000, for Head 210, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 210, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 32,450,000

Question, "That the sum of Rs. 32,450,000, for Head 210, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 210, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 211. - DEPARTMENT OF GOVERNMENT PRINTER

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 1,895,098,000

Question, "That the sum of Rs. 1,895,098,000, for Head 211, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 211, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 106,100,000

Question, "That the sum of Rs. 106,100,000, for Head 211, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 211, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

"114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 288,575,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 294,300,000

"114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 294,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 606,250,000

"114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 606,250,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 15,185,393,000

"114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 15,185,393,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

306 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 14,571,340,000

"306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 14,571,340,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 17,316,600,000

"306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 17,316,600,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

307 වන ශීර්ෂය.- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,916,429,000

"307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,916,429,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,120,200,000

"307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,120,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 288,575,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 294,300,000

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 294,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 606,250,000

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 606,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 15,185,393,000

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 15,185,393,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 306.- இலங்கை புகையிரதத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 14,571,340,000

"தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 14,571,340,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 17,316,600,000

"தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 17,316,600,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 307.- மோட்டார் வாகனப் போக்குவரத்துத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,916,429,000

"தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 1,916,429,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,120,200,000

"தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,120,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 288,575,000, for Head 114, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 114, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 294,300,000

Question, "That the sum of Rs. 294,300,000, for Head 114, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 114, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 606,250,000

Question, "That the sum of Rs. 606,250,000, for Head 114, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 114, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 15,185,393,000

Question, "That the sum of Rs. 15,185,393,000, for Head 114, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

HEAD 306.- DEPARTMENT OF SRI LANKA RAILWAYS

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 14,571,340,000

Question, "That the sum of Rs. 14,571,340,000 for Head 306, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 306, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 17,316,600,000

Question, "That the sum of Rs. 17,316,600,000 for Head 306, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 306, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 307.- DEPARTMENT OF MOTOR TRAFFIC

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 1,916,429,000

Question, "That the sum of Rs. 1,916,429,000 for Head 307, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 307, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,120,200,000

Question, "That the sum of Rs. 1,120,200,000 for Head 307, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 307, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු.255,255,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 17,000,000

"176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.17,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 2,090,700,000

"176 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.2,090,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

176 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 255,255,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 17,000,000

"தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 17,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,090,700,000

"தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 2,090,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 255,255,000, for Head 176, Programme 01, Recurrent Expenditure, be inserted in Schedule" put and agreed to.

Head 176, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 17,000,000

Question, "That the sum of Rs. 17,000,000, for Head 176, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 2,090,700,000

Question, "That the sum of Rs. 2,090,700,000, for Head 176, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
"කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය"යිද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***එකල්හි වේලාව අ. භා. 6.15 වූයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2016 නොවැම්බර් 29වන අඟහරුවාදා.***

*அப்பொழுது பி.ப. 6.15 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2016 நவம்பர் 29, செவ்வாய்க்கிழமை*

*It being 6.15 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Tuesday, 29th November, 2016.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.15ට, 2016 නොවැම්බර් 16 වන දින සභා සම්මතිය අනුව, 2016 නොවැම්බර් 29 වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப 6.15மணிக்கு பாராளுமன்றம், அதனது 2016 நவம்பர் 16 ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2016 நவம்பர் 29, செவ்வாய்க்கிழமை மு.ப.9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament Adjourned accordingly at 6.15 p.m. until 9.30 a.m. on Tuesday, 29th November, 2016 pursuant to the Resolution of Parliament of 16th November, 2016.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.